2017

මහජන බැංකුව

වාර්ෂික වාර්තාව

අසීමාන්තිකයි

නව යුගයක්...

PEOPLE'S BANK

The Bank of the People

අසීමාන්තිකයි

සියලු ජනව්‍යාප්තීන්ට හා සමාජ ආර්ථික කණ්ඩායම්වලට අයත්
විවිධ වෘත්තීන්හි නියැලි ස්වකීය ගනුදෙනුකරුවන්ගේ
මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් ගෙවූ අඩසිය වසකට වැඩි කාලය පුරා
මහජන බැංකුව අසමසම කීර්තිනාමයක් දිනා සිටින අතර
දේශීය බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයෙහි අද්විතීය ශක්‍යතාවන්
ගොඩනංවාගෙන ඇත. බැංකු කර්මාන්තයේ විශාලතම ගනුදෙනුකාර
ප්‍රවේශයට, විශාලතම ගනුදෙනුකාර තැන්පතු ගිණුම් සංඛ්‍යාවට සහ
විශාලතම මානව සම්පත් සංචිතයට හිමිකම් කියමින්,
එයින් අත්වන ප්‍රතිලාභ මත, ගනුදෙනුකරුවන්ට සැපයෙන සේවා,
ජාතිය වෙත කෙරෙන දායකත්වය හෝ අගය එකතු කිරීම ආදී
කවර හෝ අංශයක වේවා බැංකුව එහි පෙරමුණ ගෙන ක්‍රියාකරයි.
වර්තමානයේදී ඩිජිටල් තාක්ෂණයෙන් විප්ලවීය ඉදිරි පියවරකට
මුල පුරා ඇති බැංකු කර්මාන්තය තුළ අප බැංකුව අපගේ
පාර්ශ්වකාර භවතුන් සඳහා අසීමිත ප්‍රස්ථාවන් නිර්මාණය කර දී ඇත.

අපගේ සංකලිත වාර්තාකරණය පිළිබඳව යමක්

මහජන බැංකුව අඛණ්ඩව තෙවැනි වරටත් සිය සංකලිත වාර්ෂික වාර්තාව ඉදිරිපත්කර සිටින්නේ ඉමහත් සතුටිනි.

මෙම වාර්තාවෙන් බැංකුවේ කෙටි, මධ්‍යම හා දිගු කාලීන අගය නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරවූත්, සාකල්‍යවූත් විස්තරයක් ගෙන හැර දක්වා ඇත. බැංකුවේ උපායමාර්ගය, පාලනය හා ප්‍රාග්ධන කළමනාකරණය පිළිබඳව සවිස්තර විචාරයක් සහ 2017 වසර මුළුල්ලේ තරඟකාරී බැංකු කර්මාන්තය තුළ මූල්‍යමය, සමාජීය හා පාරිසරික කාර්යසාධනය පිළිබඳ සමබර සමාලෝචනයක් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇත. අවසන් වශයෙන් බැංකුව පිළිබඳව මෙන්ම එහි ක්‍රියාකාරකම් පිළිබඳව නිවැරදි තීරණ ගැනීම සම්බන්ධයෙන් යොමු කෙරෙන සියලුම ගැටලු සඳහා මෙම වාර්තාවෙන් විසඳුම් ඉදිරිපත් කෙරේ.

වාර්තාවේ ව්‍යුහය

2017 වාර්ෂික වාර්තාවේ, බැංකුවේ උපාය මාර්ගය, පාලනය, මූල්‍ය හා මූල්‍ය නොවන කාර්යසාධනය සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් තුළ ඉදිරි සැලසුම්, සමබර හා සාකල්‍ය ආකාරයකින් විග්‍රහ කෙරේ. 2017 ජනවාරි 1 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මාස 12ක කාල පරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ. එය මූල්‍යමය හා තිරසර වාර්තාකරණය සඳහා වන සාමාන්‍ය වාර්ෂික වාර්තාකරණ කාල චක්‍රය සමඟ අනුගත වේ. 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන බැංකුව විසින් අවසන් වශයෙන් පළ කරන ලද වාර්ෂික වාර්තාව http://www.peoplesbank.lk. දරන අපගේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. විෂය පථය හා එක් එක් අංශ සම්බන්ධයෙන් වාර්තාකරණයට අදාළ පූර්ව කාල වකවානුවල සැලකිය යුතු වෙනස්කම් සිදු නොවූ අතර පූර්ව වාර්තාකරණ වර්ෂ වලදී නිකුත් කළ වාර්ෂික වාර්තා සමඟ සැසඳීමේදී කිසිදු සඳහනක් පිළිබඳව නැවත සඳහන් කිරීමක් ද සිදුව නොමැත.

වාර්තාකරණ විෂයය සීමාව

මෙම වාර්තාව මගින් මහජන බැංකුවේ සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම සහ සීමා සහිත පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම යන බැංකුවේ පරිපාලිත සමාගම් තුනෙහි සමස්ත මෙහෙයුම් ආවරණය කෙරේ. මෙම වාර්ෂික වාර්තාවේ එකී සමාගම් සියල්ල සාමූහිකව "සමූහය" යනුවෙන් සඳහන් වනු ලබන අතර ඒවා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්කර ඇත. මහජන බැංකුව සහ එහි පරිපාලිත සමාගමක් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම එක්ව සමූහයේ ලාභ සහ වත්කම් වලින් 99% ක් සඳහා දායක වේ. මානව ප්‍රාග්ධනය, පාරිසරික කරුණු, පාරිභෝගික හා යටිතල පහසුකම් පිළිබඳ කරුණු "බැංකුව" තේමාව යටතේ සාකච්ඡාකර ඇත.

සාපේක්ෂ වැදගත්කම නිර්ණය කිරීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ පිටු අංක 123 සිට ආරම්භවන "අපගේ ආදර්ශය සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය" යන තේමාව යටතේ සාකච්ඡා කර ඇත.

බාහිර සහතිකකරණය

ස්වකීය මෙහෙයුම් හා සංයුක්ත වාර්තාකරණය පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් සමූහය විසින් පහත සඳහන් ආකාරයට අභ්‍යන්තර හා බාහිර වශයෙන් සහතිකකිරීමක් ලබාගනු ලැබේ.

මූලිකාංග

සංයුක්ත සහතිකකරණය

මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩලය, විගණකාධිපති, අර්නස්ට් ඇන්ඩ් යංග් – වරලත් ගණකාධිකාරී සමාගම, ශ්‍රී ලංකා

තිරසර වාර්තාකරණය

අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම,
වරලත් ගණකාධිකාරී සමාගම, ශ්‍රී ලංකා

සංයුක්ත පාලනය

විගණකාධිපති

අභ්‍යන්තර පාලන

අධ්‍යක්ෂ මණ්ඩලය, විගණකාධිපති

පූර්වාරක්ෂක මූලධර්මය

අපගේ සමාජීය හා පාරිසරික තිරසරබව සම්බන්ධයෙන් මෙම පූර්වාරක්ෂක මූලධර්මය අදාළ කරගනු ලැබේ. වගකිව යුතු සංයුක්ත පුරවැසියෙක් වශයෙන් අපගේ ක්‍රියාකාරිත්වය තුළින් සමාජයට මෙන්ම පරිසරයට සිදුවිය හැකි අවධානම් අවම කිරීම පිණිස අවශ්‍ය පියවර අප විසින් ගනු ලැබ ඇත. ඒ පිළිබඳ වැඩි විස්තර පිටු අංක 187 සිට - 191 දක්වා වූ ප්‍රජා ප්‍රාග්ධනය සහ ස්වාභාවික ප්‍රාග්ධනය යන තේමාව යටතේ දක්වා ඇත.

අනුකූලතාව

මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කර ඇත. 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ නියමයන් බැංකුව විසින් අනුගමනය කරඇත.

මෙම සංකලිත වාර්තාව සකස් කිරීමේදී ජාත්‍යන්තර සංකලිත වාර්තාකරණ කවුන්සිලයේ සංකලිත වාර්තාකරණ රාමුවේ මූලධර්ම මගින් අවශ්‍ය මඟ පෙන්වීම් ලබාගන්නා ලදී.

ගෝලීය වර්තාකරණ ආයතනයේ තිරසර වාර්තාකරන මාර්ගෝපදේශ G4 නිර්නායකය පදනම් කරගනිමින් අප විසින් සංකල්ප, මූලධර්ම සහ මාර්ගෝපදේශ සකස් කර ඇති අතර එහිදී "සන්දර්භයට-අනුගත වීම" යන විකල්පය අප විසින් තෝරාගන්නා ලදී. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (UNSDG) පිළිබඳවද අප විසින් නිසි සැලකිල්ලක් යොමුකර ඇත.

සංයුක්ත පාලනය පිළිබඳ කොටසේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව එක්ව නිකුත් කරන ලද සංයුක්ත පාලනය පිළිබඳ මනා පරිචයන් පිළිබඳ සංග්‍රහයට සහ 2007 අංක 11 දරන බැංකු පනතේ නියෝගයන්ට අදාළ වන පරිදි අපි ස්වේච්ඡාවෙන් අනුගතව ක්‍රියාකර ඇත්තෙමු.

අදහස් හා යෝජනා

මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව 2017 පිළිබඳව ඔබගේ අදහස් හා යෝජනා අප අතිශයින් අගය කරන අතර ඒ තුළින් අපගේ පාර්ශ්වකරුවන් සමඟ වඩාත් අන්තර්කරණවූත්, අර්ථවත්වූත් කාර්යභාරයක් ඉටුකිරීමට අපි කැපවී ක්‍රියා කරමු. ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරනු මැනවි.

කළමනාකරණ තොරතුරු දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, කොළඹ 02.
දූ.ක: +94 11 232 7841, +94 11 244 6316, +94 11 248 1481
විද්‍යුත් තැපෑල: info@peoplesbank.lk
වෙබ් අඩවිය: www.peoplesbank.lk

පටුන

04
→ අප ගැන යමක්

004 —— බැංකුව ගැන යමක්
005 —— සමූහය පිළිබඳව යමක්
008 —— සුවිශේෂී මංසලකුණු

12
→ වසරේ විශේෂිත තොරතුරු

012 —— මූල්‍ය විශේෂිත තොරතුරු
013 —— මූල්‍ය නොවන විශේෂිත තොරතුරු

14
→ සමාලෝචනයන්

014 —— සභාපතිතුමාගේ පණිවිඩය
018 —— ප්‍රධාන විධායක නිලධාරීගේ/ සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

21
→ පාලනය සහ නායකත්වය

021 —— අධ්‍යක්ෂ මණ්ඩලය
024 —— ආයතනික කළමනාකාරිත්වය
030 —— විධායක කළමනාකාරිත්වය
033 —— ආයතනික පාලනය
056 —— අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා
060 —— අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය
062 —— විගණකාධිපතිවරයාගේ වාර්තාව

63
→ අවදානම් කළමනාකරණය

101
→ ව්‍යාපාරික ආකෘතිය

102 —— මෙහෙයුම් පරිසරය
110 —— වටිනාකම් නිර්මාණය කිරීම
114 —— ඉලක්ක, උපායමාර්ග සහ පෙරදැක්ම
117 —— තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා අපගේ කැපවීම
120 —— ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය
123 —— ප්‍රමාණාත්මකතාව

125
→ වටිනාකම් ඇතිකිරීම හා ප්‍රාග්ධනය සැකසීම

126 —— මූල්‍ය ප්‍රාග්ධනය
- ප්‍රධාන ව්‍යාපාරික අංශයන්ගේ කාර්ය්‍ය සාධනය
- මූල්‍ය සමාලෝචන
- ඇතිකරගත් වටිනාකම් බෙදාහැරීම
- එකතු කල ආර්ථික වටිනාකම

151 —— නිෂ්පාදිත ප්‍රාග්ධනය
153 —— බුද්ධිමය ප්‍රාග්ධනය
157 —— මානව ප්‍රාග්ධනය
171 —— සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය
- ආයෝජක ප්‍රාග්ධනය
- පාරිභෝගික ප්‍රාග්ධනය
- ව්‍යාපාරික හවුල්කරුවන්
- ප්‍රජා ප්‍රාග්ධනය

189 —— ස්වභාවික ප්‍රාග්ධනය

192
→ වසරේ වැදගත් සිදුවීම්

195
→ මූල්‍ය වාර්තා

197 —— මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්
198 —— මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපති වාර්තාව
199 —— ආදායම් ප්‍රකාශය
200 —— විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය
201 —— මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
202 —— ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව
204 —— ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය - සමූහය
206 —— මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
207 —— මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

293
→ වෙනත් තොරතුරු

294 —— ආදායම් ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්)
295 —— මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්)
296 —— කාර්ය සාධන සමාලෝචනය 2008-2017
298 බාසල් III – ස්ථරය 3 යටතේ වෙළඳපල අධ්‍යයන හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය
310 —— තිරසාරත්ව වාර්තාව පිළිබඳ බාහිර සහතිකය
311 —— ගෝලීය වාර්තාකරණ ප්‍රවේශ අන්තර්ගත දර්ශකය "අනුකූලතා" විකල්පය: මූලික
314 —— මූල්‍ය/බැංකුකරණ යෙදුම් (පාරිභාෂික ශබ්ද මාලාව)

බැංකුව ගැන යමක්

මහජන බැංකුව 1961 අංක 29 දරණ මහජන බැංකු පනත යටතේ බලයලත් වාණිජ බැංකුවක් වශයෙන් ස්ථාපිත කරන ලද අතර එහි පරමාර්ථය වන්නේ බැංකු සේවා ග්‍රාමීය ආර්ථිකය කරා යොමු කිරීමයි. අද වන විට මහජන බැංකුව වත්කම් අංශයෙන් ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම බැංකුව බවට පත්ව ඇති අතර දිවයින පුරා විසිරී ඇති විශාලතම ශාඛා ජාලය තුළින් සෑම සමාජ ආර්ථික පසුබිමකම මෙන්ම ජන වර්ගයකම මිලියන 18ක් ඉක්මවූ ගණුදෙණුකරුවන් වෙත බැංකු සේවා සලසමින් සිටියි.

“මහජනතාවගේ බැංකුව” වශයෙන් මහජන බැංකුව අප ජාතික ආර්ථික සංවර්ධනයේ අනුකල පාර්ශ්වකරුවකු මෙන්ම ශක්තිමත් හා ස්ථාවර නායකත්වයේ ප්‍රතිමූර්තිය ලෙසින් ශ්‍රී ලාංකික ජනතාවගේ පරමාදර්ශය බවටද පත්ව සිටියි.

ස්වකීය නායකත්වය විඳහා පාමින් නූතන පාරිභෝගික හා වෙළඳපොළ ප්‍රවණතාවලට සමගාමීව බැංකුව ඩිජිටල්ගත කිරීම ආරම්භ කරන ලදී. එහි අරමුණ වන්නේ ඩිජිටල් බැංකුකරණයේ කටයුතුවල ජනතාවට අත්කර දීමත් ග්‍රාමීය ගොවි මහතුන්ගේ සිට රටේ ප්‍රමුඛතම ව්‍යාපාරික ආයතන දක්වා වූ පුළුල් ගනුදෙනුකාර පදනම තුළ සියලු පාර්ශ්වකරුවන් වෙත එකී ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීමත්ය.

මහජන බැංකුව රජය සතු ආයතනයක් වන අතර එය පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සහ සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම යන පරිපාලිත සමාගම් තුනෙන් සමන්විත වේ.

අපගේ දැක්ම

මූල්‍ය සේවා සැපයීම අතින් ශ්‍රී ලංකාවේ අසමසම, වෙළඳපොළ නියමුවා යන විරුදාවලිය ලැබීම අපගේ දැක්ම යි.

අපගේ මෙහෙවර

- පහසුවෙන් දැරිය හැකි, පහසුවෙන් ඉටු කරවා ගත හැකි මෙන්ම කාර්යක්ෂමව සපයා දෙනු ලබන මූල්‍ය සම්පාදන විසඳුම් ලබා දී,
- ජනජීවිතයේ දියුණුවටත්, ව්‍යවසාය සංවර්ධනයටත් දායකත්වය සැපයෙන පරිද්දෙන් මූල්‍ය සේවා සපයාදීමේ ව්‍යාපාරයේ නියැළී සිටීමත්,
- අප ගනුදෙනුකාරභවතුන්ට සැලකීමටත් ඔවුන් රැකගැනීමටත්, කුසලතා ප්‍රවර්ධනයට දිරිදෙමින් අපගේ මානව සම්පත් ප්‍රවර්ධනය කරමින් හා බලගැන්වීමටත්,
- තරඟකාරී අන්දමින් ලාභ උපයන අතරම, ජාතික ආර්ථික සංවර්ධනයට අපගේ දායකත්වය සැපයීමත්,
- අපගේ ව්‍යාපාර පරිචයන් අතින් නිරසාර බව රැකගනිමින්, අප බැංකු මෙහෙයුම් කටයුතු සපයා ප්‍රජාවන් වෙත ප්‍රතිඵලකාර ප්‍රදානය කිරීමත්,

අපගේ ‘මෙහෙවර’ ලෙසින් ඉටු කෙරේ.

අපගේ වටිනාකම්

- ජාතියේ හද ගැස්ම ලෙසින් ක්‍රියාත්මක වීමත්,
- ගනුදෙනුකාරභවතුන්ගේ අවශ්‍යතා කෙරෙහි මනා නැමියාවකින් යොමු වීමත්,
- කීර්තිනාමයේ ඒකාග්‍රතාව රැකගනිමින් වගවීමත්,
- අඛණ්ඩ උගැනුම් සංස්කෘතියක් පවත්වාගනිමින් කණ්ඩායම් හැඟීමෙන් සේවා සැපයීමත්,
- බලාත්මක වීම සහ විවිධතා ගරු කිරීමත්, අපගේ අගනාකම් වේ.

සමූහය පිළිබඳව යමක්

මහජන බැංකුව සහ එහි පරිපාලිත සමාගම් තුනෙන් සමන්විත මහජන බැංකු සමූහය ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ වඩාත් සමාජීය සහ ආර්ථික වශයෙන් බලපෑමක් එල්ල කළ හැකි ආයතන අතරින් එකක් වන අතර එහි අනුකල අංගයක්ද වේ. ශ්‍රී ලංකාව පුරා මිලියන 18ක් ඉක්ම වූ ගණුදෙණුකරුවන් සඳහා සේවා සලසමින් ස්ථාන 850ක් ඉක්ම වූ ශාඛා ජාලයකින් සමන්විත අප සමූහය මූල්‍ය සේවා සලසා දීම, රැකියා අවස්ථා උත්පාදනය සහ මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධන කිරීම තුළින් සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා සිය දායකත්වය ලබා දේ. දේශීය හා ජාත්‍යන්තර සම්මාන රැසක් දිනා සිටින අප සමූහය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ප්‍රගමනය සඳහා උත්ප්‍රේරකයක් සේ පවතිනු ඇත. එය එහි වාණිජමය ස්ථාවරත්වය සහ සමාජ අදාලත්වය පිළිබඳව සහතිකයක් වන්නේය.

සංවිධාන ව්‍යුහය

මහජන බැංකු සමූහය, මහජන බැංකුව සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම, පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම සහ සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම යන සමාගම් වලින් සමන්විත වේ. සමූහයේ විශාලතම දායකයා මහජන බැංකුව වන අතර සමූහයේ වත්කම් වලින් 91%ක් ද ඉපැයීම් වලින් 89% ක්ද බැංකුවේ දායකත්වය වේ.

	ගණුදෙණුකරුවන්	නිමැවුම් සහ සේවා	විශේෂිත කරුණු
මහජන බැංකුව	තනි පුද්ගලයන්, ක්ෂුද්‍ර ව්‍යවසායකයන්, කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාර, ආයතනික අංශය හා රජය	• පාරිභෝගික බැංකු සේවා • තොග බැංකු සේවා • ව්‍යවසාය බැංක සේවා • අන්තර්ජාතික බැංකු සේවා	වත්කම්: රු මිලියන 1,467,099 තැන්පතු: රු මිලියන 1,244,003 ශුද්ධ ලාභය: රු මිලියන 18,250 කාර්ය මණ්ඩලය: 8,454
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී	තනි පුද්ගලයන්, ක්ෂුද්‍ර ව්‍යවසායකයන්, කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාර	• ලීසින් හා කල්බදු පහසුකම් • ක්ෂුද්‍ර මූල්‍ය සේවා • තැන්පතු • ණය පහසුකම්	වත්කම්: රු මිලියන 167,467 තැන්පතු: රු මිලියන 64,736 ශුද්ධ ලාභය: රු මිලියන 4,368 කාර්ය මණ්ඩලය: 2,092
සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	තනි පුද්ගලයන්, ක්ෂුද්‍ර ව්‍යවසායකයන්, කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යාපාර	• මෙරටට පැමිණෙන සංචාරකයන් • මෙරටින් පිටවයන සංචාරකයන් • ගමනාන්ත කළමනාකරණය	වත්කම්: රු මිලියන 131 ශුද්ධ ලාභය: රු මිලියන 13.2 කාර්ය මණ්ඩලය: 25
පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී	තනි පුද්ගලයන්,ආයතනික අංශය	• ලීසින් හා කල්බදු පහසුකම් • තැන්පතු • වෙළඳ මූල්‍ය	වත්කම්: රු මිලියන 2,959 තැන්පතු: රු මිලියන 2,544 කාර්ය මණ්ඩලය: 128

අපගේ පැතිකඩ
– සංක්ෂිප්තව

නිමැවුම් ප්‍රාග්ධනය





- **කර්මාන්තයේ විශාලතම** බැංකුරණ ජාලය
  - බැංකු ශාඛා 737
  - බැංකුව සතු ATM යන්ත්‍ර 572ක් සහ වෙනත් යන්ත්‍ර 3,000කට ප්‍රවේශය
  - පාසල් ඉතුරුම් ඒකක 1,287
- සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කරන ලද **දිවයිනේ ප්‍රථම බැංකු ශාඛාව**
- තොරතුරු ආරක්ෂණය සඳහා ප්‍රමිති සහතිකය (ISO/IEC 27001:2013) ලද **දිවයිනේ ප්‍රථම රාජ්‍ය බැංකුව**
- සතියේ දින 7 පැය 24 පුරා විවෘත ස්වයං බැංකුකරණ ඒකක සංකල්පය හඳුන්වා දුන් **බැංකු කර්මාන්තයේ ප්‍රථමයා**

මානව ප්‍රාග්ධනය

මහජන

- බැංකු **කර්මාන්තයේ විශාලතම සේවායෝජකයා** ස්ථිර කාර්ය මණ්ඩලය පමණක් 8,454ක් වේ
- කාර්ය මණ්ඩලයෙන් 60%ක් කාන්තාවන් වේ. අව්වාදයෙන් **බැංකු කර්මාන්තයේ දැවැන්තයා**
- වසර 25කට අධික සේවා කාලයක් සහිත සේවක පිරිස 1,042 කි.
- වෘත්තියමය වශයෙන් සුදුසුකම් ලැබූ සේවක පිරිස 3,792කි.
- එක් සේවකයකුට:
  - ආදායම: රු. මිලියන 19.2 (2016ට සාපේක්ෂව 18.8% ක වර්ධනයකි)
  - ලාභය: රු. මිලියන 2.2 (2016ට සාපේක්ෂව 29.6%ක වර්ධනයකි)

ස්වාභාවික ප්‍රාග්ධනය

- හරිත ගොඩනැගිලි ප්‍රතිපත්තිය හඳුන්වාදෙන ලදී
- දිවයිනේ **ප්‍රථම** සම්පූර්ණයෙන් පරිසර හිතකාමී බැංකු ශාඛාව යාපනයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී



බැංකුව

සමාජීය හා සම්බන්ධතා ප්‍රාග්ධනය

ගණුදෙනුකාර භවතුන්

- බැංකු **කර්මාන්තයේ දැවැන්තම** ගණුදෙනුකාර පැතිකඩ
  - ගණුදෙනුකාර ගිණුම් සංඛ්‍යාව **මිලියන 18.6කි**
  - ගනුදෙනුකරුවන් ගණන ආසන්න වශයෙන් **මිලියන 14.4කි**
  - ගණුදෙනුකාර තෘප්තිය 91%කි

ව්‍යාපාරික හවුල්කරුවන්

- අනුගාමී බැංකු 26 සමඟ පමණක් පවතින සම්බන්ධතාව **වසර 20කට අධික වේ**
- ව්‍යාපාරික හවුල්කරුවන් **118කි**

ආයෝජකයන්

- 2017 දී රු. **බිලියන 23.3ක්** ගෙවන ලදී
- බදු/ලාභාංශ වශයෙන් ගෙවුණු **වසර දහය තුළ** රජයට සැපයූ දායකත්වය රු. බිලියන 150.2 ඉක්මවිය.



මූල්‍ය ප්‍රාග්ධනය

ඉහළ පෙළ/පහළ පෙළ

- දළ ආදායම - රු. බිලියන 190.0 **ඉක්මවිය**
- සමස්ත මෙහෙයුම් ආදායම **කර්මාන්තයේ ඉහළම** අගයක් වූ රු. බිලියන 79කට ලඟාවිය
- බදුපෙර ලාභය රු. බිලියන 29.9ක් විය. එය සමූහයේ **මෙතෙක් වාර්තා වූ ඉහළම** අගයයි.

තැන්පතු ඒකරාශිකරණය

- රු. ට්‍රිලියන 1.3 **ඉක්මවිය.** 16.6%ක වර්ධනයකි
- බලපත්‍රලාභී වාණිජ බැංකු අතර **ඉහළම** අගය වූ CASA 40%
- ඉතුරුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා

ගණුදෙනුකරුවන්ට දුන් අත්තිකාරම්

- රු ට්‍රිලියන 1.1 ඉක්මවිය
- දළ අක්‍රියණය අනුපාතිකය කර්මාන්තයේ **පහළම අගයන් අතර** සිටිමින් 1.9%ක් විය
- ප්‍රතිපාදන ආවරණය: 92.7%ක් විය. එය කර්මාන්තයේ **ඉහළම අගයන් අතර** විය
- බලපත්‍රලාභී වාණිජ බැංකු අතර -
  - කෘෂිකර්මාන්තයට **වැඩියෙන්ම නිරාවරණය වූ** බැංකු අතර පසුවීම
  - කුඩා හා මධ්‍යම ව්‍යවසායන් සඳහා **වැඩියෙන්ම ණය දෙන්නන්** අතර පසුවීම

පිළිගැනීම්

- බෑංකර් සඟරාව (එක්සත් රාජධානිය) මගින් පහත සඳහන් සමූහයේ මූලික ප්‍රාග්ධනය (Tier I) පදනම්කර ගනිමින් 2017 වසරේ **ලොව ඉහළම බැංකු 1000 අතර** ශ්‍රේණිගත කිරීම
  - ප්‍රාග්ධනය මත ලාභය: 43
  - වත්කම් මත ප්‍රතිලාභ: 160
  - වත්කම් ප්‍රමාණය : 785
  - මූලික ප්‍රාග්ධනය (Tier I): 956
- එෂියන් බෑංකර් සඟරාව විසින් 2017 වසරේ ආසියාවේ දැවැන්තම බැංකු අතර **400වන** ස්ථානයේ ශ්‍රේණිගත කිරීම

බුද්ධිමය ප්‍රාග්ධනය

- ජාතික ව්‍යාපාරික විශිෂ්ඨතා සම්මාන 2017 **"දිවයිනේ හොඳම බැංකුව"**
- ස්ලිම් නිල්සන් ජනතා මනාපයේ සම්මාන 2017 **"වසරේ ජනතා සේවා සන්නාමය" සහ "වසරේ ජනතා බැංකුකරණ සේවා සලසන්නා"**

සුවිශේෂී මංසළකුණු

1961 1961 ජූලි මස 1 වැනි දින මහජන බැංකුව උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. පළමු ශාඛාව කොළඹ ඩියුක් වීදියේ විවෘත කෙරිණි. මෙම වර්ෂය තුළදී, කොළඹ විදේශීය ශාඛාවට අතිරේකව පොළොන්නරුව, හිඟුරක්ගොඩ, හම්බන්තොට, අනුරාධපුරය, පුත්තලම, මාතලේ සහ මහනුවර යන ප්‍රදේශවල තවත් ශාඛා අටක් විවෘත කෙරිණි. **මුළු සේවක සංඛ්‍යාව 169 ක් විය.**

1962 ප්‍රධාන කාර්යාලය කොළඹ 2, යූනියන් පෙදෙසේ රත්නම් ගොඩනැගිල්ල වෙත ගෙන යන ලද අතර, තවත් ශාඛා 17ක් විවෘත කෙරිණි.

1963 බැංකුව සිය උකස්කරණ සේවාවන් ආරම්භ කළේය.

1964 සමුපකාර ග්‍රාමීය බැංකුකරණ යෝජනා ක්‍රමය ඇරඹිණි.

1965 බැංකුවේ ඇතැම් අංශ කොළඹ 2, චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල වෙත ගෙන යන ලදී. මුළු ශාඛා සංඛ්‍යාව 48 දක්වා වර්ධනය වූ අතර, හොරණ, කැකිරාව, පදවිය, මන්නාරම, ඇඹිලිපිටිය, කහටගස්දිගිලිය, රාගල හා තලවාකැලේ නව ශාඛා ද මෙයට ඇතුළත් විය.

1967 **කුඩා ගොවිපල අංශයට ණය දීමේ පුරෝගාමියා බවට පත්වෙමින් බැංකුව නව කෘෂිකාර්මික ණය යෝජනාක්‍රමයක් ආරම්භ කළේය.**

1970 අවිධිමත් අංශයේ ආර්ථික කටයුතු වෙනුවෙන් මූල්‍ය සම්පාදනය පිණිස "අතමාරු" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. ක්‍රමානුකූල ඉතිරි කරන්නන් ආකර්ෂණය කරගැනීම සඳහා ණය සබැඳි ඉතිරිකිරීමේ ක්‍රමයක් වන ආයෝජන ඉතුරුම් යෝජනාක්‍රමය දියත් කෙරිණ.

1971 **බැංකුවේ සිය වැනි ශාඛාව මරඳගහමුලදී විවෘත කෙරිණි.**

1973 **නිෂ්පාදන හා පරිභෝජන යන දෙආකාරයේම ණය පහසුකම් සැපයීම පිණිස විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනාක්‍රමයක් දියත් කරන ලදී.** සිංහල හා දෙමළ අළුත් අවුරුද්දේ චාරිත්‍ර, සිය අනන්‍යතාවට එක්කර ගනිමින් බැංකුව විසින් සුභ මොහොතින් බැංකුව සමඟ ගනුදෙනු කිරීමට ගනුදෙනුකාර භවතුන් දිරිගැන්වීම පිණිස 'ගනු දෙනු' පිළිවෙතට මුලපුරන ලදී.

1975 ආක්‍රමණශීලී ශාඛා ව්‍යාප්ති වැඩසටහනක් අපගේ මුළු ශාඛා සංඛ්‍යාව 158 දක්වා ගෙන ආවේය.

1977 **අපගේ දෙසිය වැනි ශාඛාව කොල්ලුපිටියේ දී විවෘත කෙරිණි.** ප්‍රධාන කාර්යාලය කොළඹ කොටුවේ ගොඩනැගිල්ලකට ගෙනයන ලදී. මුළු සේවක සංඛ්‍යාව 5,000 දක්වා ළඟා විය. ප්‍රථම ධීවර බැංකුව කොරලවැල්ලේ දී විවෘත කෙරිණ.

1981 අපගේ ශාඛා ජාලය ශාඛා 290 දක්වා වර්ධනය විය. දීර්ඝ කළ බාලවයස්කාර ඉතුරුම් යෝජනාක්‍රමය දියත් කෙරිණි.

1982 **බැංකුවේ තුන්සිය වැනි ශාඛාව ඉංගිරියේ දී විවෘත කෙරිණි.** මුළු සේවක සංඛ්‍යාව 10,000 තෙක් ළඟා විය.

1984 බැංකුවේ පරිපාලිත සමාගමක් වන පීපල්ස් මර්චන්ට් බැංකුව පිහිටුවන ලදී. කොම්පඤ්ඤවීදියේ පිහිටි අපගේ ශාඛාව, ජාත්‍යන්තර අංශය හා කොටුව විදේශීය ශාඛාව සමඟ ඒකාබද්ධ කෙරිණි.

1986 පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අපගේ ප්‍රධාන කාර්යාලයෙන් සහ තෝරාගත් නගර ශාඛාවලින් ආරම්භ වූ අතර, අදිසි ආලෝක (Black Light) ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. එමගින් ගනුදෙනුකාර භවතුන්ගේ සංසරණ කාලය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.

1987 අපගේ මූලස්ථාන ශාඛාව බැංකුවේ ප්‍රථම පූර්ණ ලෙස ස්වයංක්‍රීයව මෙහෙයවනු ලබන ශාඛාව බවට පත් විය. ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සහයෝගිත්වයෙන් ග්‍රාමීය විද්‍යුතනය වෙනුවෙන් විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

1989 සේවක අර්ථසාධක අරමුදල් ශේෂයට එරෙහිව නිවාස සඳහා අරමුදල් සම්පාදනය පිණිස කම්කරු අමාත්‍යාංශය අනුග්‍රහය දැක්වූ ණය යෝජනා ක්‍රමයකට බැංකුව සහභාගි විය. විදේශ රැකියා අපේක්ෂා කරන්නන් වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය හා සමග එක්ව යෝජනාක්‍රමයක් දියත් කරන ලදී. 1983 සිවිල් කෝලාහලයේ බලපෑමට ලක්වූවන් ට ණය ලබාදීම සඳහා ශ්‍රී ලංකා දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය (REPIA) විසින් දියත් කරන ලද ණය යෝජනාක්‍රමයකට බැංකුව සහභාගි විය. මෙම වසර තුළ දී ජනසවිය ආශ්‍රිත ණය යෝජනාක්‍රමයක්ද හඳුන්වා දෙනු ලැබිණි. ගනුදෙනු කළ හැකි ඉතුරුම් සහතික නිකුත් කිරීම ද බැංකුව මෙම වසරේදී ඇරඹුවේය.

1960s

1970s

1980s

1990 දායාද ඉතුරුම් තැන්පතු යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි. විසා ජාත්‍යන්තර හා සමඟ සම්බන්ධ වෙමින් පිපල්ස් විසා කාඩ්පත හඳුන්වා දෙන ලද අතර, ශාඛා 24ක් පූර්ණ ලෙස පරිගණකගත කරන ලදී.

1991 පළමුවැනි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM) අපගේ මූලස්ථාන ශාඛාවේ සවිකරන ලදී.

1992 **රජයේ ඇඟලුම් කම්හල් 200 වැඩසටහනට බැංකුව සහය විය.** "පිපල්ස් ඔටෝමේටඩ් බෑංකිං සිස්ටම්" නම් බැංකුව තුළම සකස් කරන ලද බැංකුකරණ යෙදවුම සක්‍රීය කිරීම ආරම්භ විය.

1993 රට පුරා බැංකු ශාඛා තුන්සිය නිහක් ක්‍රියාත්මකව පැවති අතර, ප්‍රධාන ශාඛා 35ක් පූර්ණ ස්වයංක්‍රීය ක්‍රියාකාරිත්වය සහිත විය. කාන්තාවන් වෙනුවෙන් ඉතිරිකිරීමේ යෝජනාක්‍රමයක් වන "වනිතා වාසනා" හඳුන්වාදීම සිදු විය.

1994 ස්වයංක්‍රීයකරණ වැඩසටහන යටතේ නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අටක් සවි කිරීම හා ශාඛා 160 ක් පරිගණකගත කිරීම සිදු කෙරිණි.

1995 රජයේ ගුරුවරුන්ගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා නව තැන්පතු ප්‍රචලිත ක්‍රමයක් හා ණය යෝජනාක්‍රමයක් වූ "ගුරුසෙත" අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීත්වය ඇතිව දියත් කරන ලදී.

1996 රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවයෙහි සේවක පිරිස් වෙනුවෙන් "සුව සෙවණ" ණය පැකේජය දියත් කෙරිණි. පාසල් ළමුන් වෙනුවෙන් නව තැන්පතු යෝජනාක්‍රමයක් වූ "සිසු උදාන" හඳුන්වාදීම සිදු විය. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය හා බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතිය යන ආසියානු බැංකුවෙන් අරමුදල් සම්පාදිත ණය යෝජනාක්‍රම දෙකට බැංකුව සහභාගි විය. බැංකුවට පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත සමාගම් වන සී/ස පිපල්ස් ලීසිං සමාගම සහ සී/ස පිපල්ස් ට්‍රැවල්ස් සමාගම මෙහෙයුම් ආරම්භ කළේය. විමධ්‍යගත පරිපාලනය ශක්තිමත් කිරීම හා ගනුදෙනුකාර හවතුන්ට වඩාත් හොඳ සේවයක් වෙනුවෙන් පහසුකම් සැලසීම පිණිස කලාප කාර්යාල විවෘත කරන ලදී.

1997 **ස්වයං රැකියා ව්‍යාපෘතිවලට සහාය පිණිස "සුරතුර" ණය යෝජනාක්‍රමය දියත් කෙරිණි.** ජාතික සංවර්ධන බැංකුව NDB විසින් අරමුදල් සම්පාදිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහායක ව්‍යාපෘතිය (SMEAP) යටතේ බැංකුව සිය ණය පහසුකම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් හා කර්මාන්ත වෙත ව්‍යාප්ත කළේය.

1998 පෙට් කාඩ්පත් හිමියන් 125,000 ට සේවා සපයමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 36 දක්වා වැඩි විය. ශාඛා 175ක් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීය තත්ත්වයට පත් කර තිබූ අතර, උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 188 දක්වා වැඩි විය. විගමනික ශ්‍රමිකයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ හවුල්ව "විදේශිකා" නමින් හැඳින්වෙන විශේෂ ණය හා ඉතුරුම් යෝජනාක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

1999 තම භාරයේ සිටින ලාබාලයන්ට ප්‍රතිලාභ සඳහා ඉතිරි කිරීමට දෙමව්පියන් හා භාරකරුවන් දිරිගන්වන තැන්පතු යෝජනාක්‍රමයක් වන "ඉසුරු උදාන" බැංකුව දියත් කළේය.

2000 ජනප්‍රිය ඉතුරුම් හා ණය යෝජනා ක්‍රමය දියත් කරන ලදී. ඇළුතින් හඳුන්වා දෙන ලද "ජය ශ්‍රී" දිනුම් ඇදීම තැන්පත්කරුවන්ට ආකර්ෂණීය ත්‍යාග ඉදිරිපත් කළේය. රට පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 74 තෙක් ව්‍යාප්ත විය. PABS ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සම්බන්ධ කිරීම සඳහා මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරුව හඳුන්වා දෙන ලදී.

2001 පෞද්ගලික බැංකු අංශයෙන් ඇතැම් අංශ ප්‍රධානීන් බඳවා ගැනීම මගින් බැංකුවේ ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායම ශක්තිමත් කරන ලදී. උපායමාර්ගික සැලැස්මක් දියත් කිරීම හරහා බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමට මුලපුරන ලදී. මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 90 තෙක් වර්ධනය විය.

2002 PABS හි ස්වයංක්‍රීයකරණය කරන ලද ශාඛා සංඛ්‍යාව 218 තෙක් ඉහළ නැඟි අතර, ශාඛා 119ක් මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරුවට සම්බන්ධ කෙරිණි. භාණ්ඩාගාර ස්වයංක්‍රියකරණ පැකේජයක් ක්‍රියාත්මක කරන ලදී.

2003 බැංකුවේ 11 වන ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි අශෝක ද සිල්වා මහතා 2003 පෙබරවාරි මස 1 වැනි දින වැඩ භාරගත්තේය. යොවුන් විධායක ඉතිරිකරන්නන්ගේ (YES) ගිණුම දියත් කරන ලදී. ප්‍රධාන කාර්යාල ඇතුළු තෝරාගත් ශාඛා 60ක මූලික වශයෙන් ක්‍රියාත්මකව අති නවීන බැංකුකරණ පැකේජයක් හා වෙළඳ සේවා විසඳුම් ස්ථාපනය කිරීම සඳහා බැංකුව මලයාසියාවේ සිල්වර් ලේක් සිස්ටම් SDV BUD සමඟ ගිවිසුමක් අත්සන් කළේය.

2004 ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර දියත් කරන ලද 2004-2008 සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මේ දෙවැනි අදියර ආසියානු සංවර්ධන බැංකුවේ යළි ප්‍රාග්ධනීකරණ සහාය මත පදනම් විය. **බැංකුව ප්‍රථම වතාවට BBB+ පොදු තත්ත්වාගණනය ෆිච් රේටිංස් ලංකා වෙතින් ලබා ගත්තේය.** මූලික බැංකුකරණ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

1990s

2000s

2005 බැංකුවේ 15 වැනි සභාපති වශයෙන් ආචාර්ය පී.ඒ. කිරිවන්දෙනිය මහතා 2005 දෙසැම්බර් මස මුලදී වැඩ භාර ගත්තේය. ඉන් සුළු කාලයකට පසුව රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව අතර අත්සන් තබන ලද ගිවිසුමකට අනුකූලව ශ්‍රී ලංකා රජය වෙතින් බැංකුවේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ආයෝජන ප්‍රථම වාරිකය ලෙස රුපියල් බිලියන 2 ක් ලැබිණි. මූලික බැංකුකරණ ව්‍යාපෘතිය ශාඛා ජාලය හරහා තවදුරටත් ව්‍යාප්ත කෙරිණි. 2004 දෙසැම්බර් මස සුනාමියෙන් පසු යළි ගොඩනැගීම සඳහා රජයෙන් ප්‍රදානය කරන ලද මූල්‍ය සහාය ගෙන ඒමේදී බැංකුව ප්‍රධාන අතරමැදියෙකු විය.

2006 **සිය පෙර තත්ත්වාගණන මට්ටමේ සිට ප්‍රගතියක් දක්වමින්, බැංකුව සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් A- තත්ත්වාගණනයක් ලබා ගත්තේය.** ශ්‍රී ලංකා අලෙවි ආයතනය විසින් සිදු කරන ලද සම්මාන ප්‍රදානයේ දී බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ 2006 POP සම්මානයෙන් මහජන බැංකුව පිදුම් ලැබුවේය. ශ්‍රී ලංකා රජයෙන් ලද දෙවැනි ප්‍රාග්ධන වාරිකය වූ රුපියල් බිලියනය 2006 වසර තුළදී ලැබිණි.

2007 බැංකුවේ 16 වැනි සභාපතිවරයා වූ ඩබ්ලිව් කරුණාජීව මහතා 2007 මැයි මස දී වැඩ භාර ගත්තේය. ෆිච් රේටිංස් වෙතින් ලද A- තත්ත්වාගණන මට්ටම වර්ෂය තුළ පවත්වා ගන්නා ලදී. ශ්‍රී ලංකා රජය තෙවැනි ප්‍රාග්ධන වාරිකය වූ රුපියල් බිලියන 1.5 බැංකුවට ලබා දුන්නේය. පිට පිට දෙවැනි වසරටත් වසරේ බැංකුකරණ හා මූල්‍ය සේවා සන්නාමය වෙනුවෙන් ජනතා සම්මානය මහජන බැංකුව විසින් දිනාගන්නා ලදී. 2007 වර්ෂය තුළදී මුළු තැන්පතුවල රුපියල් බිලියන 300 සීමාව බැංකුව විසින් ඉක්මවන ලදී.

2008 බැංකුවේ 12 වන ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි වශයෙන් එච්. වික්‍රමසිංහ මහතා වැඩ භාර ගත්තේය. ශ්‍රී ලංකා රජය රුපියල් බිලියන 1.5 ක හතරවැනි ප්‍රාග්ධන වාරිකය නිදහස් කළේය. වර්ෂයේ අවසානය වන විට බැංකුව 10.5% ප්‍රාග්ධන ප්‍රමාණවත් බව මට්ටමට ළඟා විය. තවද, රුපියල් බිලියන 2.5 ක බැංකුවේ ප්‍රථම ණයකර නිකුතුව මෙම වර්ෂයේ දී සිදු කරන ලදී. විදේශයන්හි සිට මිනිත්තු ගණනකින් මුදල් ප්‍රේෂණය කිරීම සඳහා, නවතම තාක්ෂණයේ සහාය ඇති වෙබ් අඩවි පාදක ප්‍රේෂණ නිපැයුමක් වූ පීපල්ස් ඊ රෙමිටන්ස් හඳුන්වා දීමත් සමග බැංකුවේ ප්‍රේෂණ සේවාවෙහි කැපී පෙනෙන දියුණුවක් ඇති විය. නව විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු නිපැයුම් දෙකක්, එනම් ළමුන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු, නිපැයුමක් වන "දු දරු එතෙර ඉසුර" හා "විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම" (SFIDA) දියත් කෙරිණි.

2009 බැංකුවේ 13 වැනි ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි පී.වී. පතිරණ මහතා 2009 ජනවාරි මස දී වැඩ භාර ගත්තේය. මෙම වර්ෂයේ දී බැංකුව රුපියල් බිලියන 2.5ක් සඳහා සිය දෙවැනි ණයකර නිකුතුව සිදු කළේය. ශාඛා 214ක් හා සේවා මධ්‍යස්ථාන 236ක් අන්තර් ජාලය මගින් සම්බන්ධ කරනු ලැබිණි. බැංකුව දිවයින පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 300ක් උපායමාර්ගික ලෙස ස්ථානගත කළේය. මුළු තැන්පතු රුපියල් බිලියන 400ක් විය. බදුවලටපෙර වාර්තාගත ඉහළම ලාභය වූ රුපියල් මිලියන 6.1 සාක්ෂාත් කරගන්නා ලදී. බැංකුවේ ඉතිහාසයේ ප්‍රථම වතාවට 2008 වාර්ෂික වාර්තාව වෙනුවෙන් දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ SAFA සම්මානයක් ලැබිණි.

2010 2010 ඔක්තෝබර් මස දී එච්.එස්. ධර්මසිරි මහතා බැංකුවේ 14 වැනි ප්‍රධාන විධායක නිළධාරි/සාමාන්‍යාධිකාරි ලෙස වැඩ භාර ගත්තේය. ශාඛා ජාලය හා සේවා මධ්‍යස්ථාන 679 දක්වා පුළුල් විය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 330 දක්වා වර්ධනය විය. 2010 ජූලි මාසයේ දී පීපල්ස් ඉන්ටනෑෂනල් වීසා හර කාඩ්පත දියත් කරන ලදී. බැංකුව, සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් AA- හා රැමි රේටිංස් වෙතින් AAA තත්ත්වාගණනයක් ලබා ගත්තේය. 2010 වර්ෂය තුළ දී මුළු තැන්පතු අගය රුපියල් බිලියන 462 ඉක්මවූයේය. බදුවලට පෙර වාර්තාගත ඉහළම ලාභය වූ රුපියල් මිලියන 8.7 අත් කරගන්නා ලදී. ගිව්යෝර්ක් නගරයේ පැවති සම්මාන උළෙලේදී මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් ARC ස්වර්ණ සම්මාන දෙකක් පිරිනමන ලදී. 2009 වාර්ෂික වාර්තාව වෙනුවෙන් රාජ්‍ය අංශය කාණ්ඩයේ ප්‍රථම ස්ථානය සඳහා SAFA සම්මානය දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනය වෙතින් බැංකුවට ලැබිණි.

2011 බැංකුවේ 15 වැනි ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී වශයෙන් එන්. වසන්ත කුමාර් මහතා 2011 පෙබරවාරි මස 22 වැනි දින එම ධූරයට පත් විය. 2011 ජූලි 1 වැනි දින බැංකුව සිය ස්වර්ණ ජුබිලිය උත්සවාකාරයෙන් සැමරුවේය. මුළු ශාඛා ජාලය 714ක් වූ අතර, දිවයිනේ සියලුම පෙදෙස් පාහේ ආවරණය කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටීම් 382 දක්වා වර්ධනය විය. AA (ස්ථාවර) උත්ශ්‍රේණිගත තත්ත්වාගණනයක් සී/ස ෆිච් රේටිංස් ලංකා වෙතින් බැංකුවට ලැබිණි. බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා ලැබිය යුතු දෑ පිළිවෙළින් රුපියල් බිලියන 663, රුපියල් බිලියන 539 හා රුපියල් බිලියන 478 ඉක්මවිය. බදුවලට පෙර වාර්තාගත ඉහළම ලාභය වූ රුපියල් බිලියන 15.3ක් හා බදුවලට පසු ලාභය රුපියල් බිලියන 10.2ක් අත්කර ගන්නා ලදී. බැංකුකරණ හා මූල්‍ය සේවා අංශයේ ශ්‍රී ලංකාවේ වඩාත්ම ජනප්‍රිය බැංකුව ලෙස ස්ලිම් නිල්සන් ජනතා සම්මානය, වසරේ සේවා සන්නාමය - ස්ලිම් නිල්සන් ජනතා සම්මානය දිනාගත් මහජන බැංකුව සේවා කාණ්ඩයේ ලෝකඩ සම්මානය ද 2011 ස්ලිම් සන්නාම විශිෂ්ටත්ව සම්මාන උළෙලේ දී දිනාගත්තේය.

2010s

2012 මුළු ශාඛා ජාලය 728 දක්වා ළඟා වූ අතර, දිවයිනේ සියලු පෙදෙස් ආවරණය කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පිහිටීම් 420 තෙක් වර්ධනය විය. සී.ස. ෆිච් රේටිංස් ලංකා වෙතින් AA + (ස්ථාවර) උත්ශ්‍රේණිගත තත්ත්වාග ණායක් බැංකුව ලබා ගත්තේය. බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය සහ ලැබිය යුතු දෑ පිළිවෙළින් රුපියල් බිලියන 873, රුපියල් බිලියන 683 හා රුපියල් බිලියන 660 ඉක්මවිය. 2012 ජාත්‍යන්තර වාර්ෂික වාර්තා සමාගම් (ARC) සම්මාන උළෙලේ දී බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව එක් සුපිරි සම්මානයක් (Grand Award) හා ස්වර්ණ සම්මාන තුනක් දිනා ගත්තේය.

2013 2013 පෙබරවාරි මාසයේ දී ගාමිණී එස්. සෙනරත් මහතා බැංකුවේ 17 වන සභාපති වශයෙන් වැඩ භාර ගත්තේය. **දිවයිනේ විවිධ ප්‍රදේශවල කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන 23ක් පිහිටුවන ලදී. වර්ෂය තුළ ගෝලීය වශයෙන් විසා බලයලත් වෙළඳුන් මිලියන 30 වැඩි සංඛ්‍යාවක් වෙත ප්‍රවේශය ඇතිව කාඩ් පත් මිලියන 1ක් වන වැදගත් අදියර පසු කරනු ලැබිණි.** සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල. සහ රේගු ගාස්තු ගෙවීම පිණිස මාර්ගගත තත්කාල ගෙවීම් පහසුකම, ආයතනික ගනුදෙනුකරුවන්ට ලබා දෙන ලදී. ජාතික පොදු ඒටීඑම් ස්විච් පද්ධතියට සම්බන්ධ කරනු ලැබූ පළමුවන බැංකුව බවට මහජන බැංකුව පත් විය. ඒටීඑම් පිහිටි ස්ථාන 460 දක්වා වැඩි වූ අතර ශාඛා ජාලය 735 දක්වා ව්‍යාප්ත විය. වසර තුළ දී බැංකුවේ සිවි වන ණයකර නිකුතුවේ දී රුපියල් බිලියන 5 වටිනා ණයකර නිකුත් කරන ලදී.

2014 බැංකුවේ වත්කම් පදනම රුපියල් ට්‍රිලියන එක ඉක්මවූයේ කර්මාන්තයෙහි දෙවැනි විශාලතම බැංකුව ලෙසය. **යුරෝපීය ගෝලීය බැංකුකරණ හා මූල්‍ය සම්මාන – ශ්‍රී ලංකාව 2014 ප්‍රදානයේ දී "2014 වසරේ බැංකුව" සම්මානය මෙන්ම 2014 ලෝක මූල්‍ය බැංකුකරණ සම්මාන ප්‍රදානයේ දී "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුකරණ සමූහය" හා "ශ්‍රී ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව" යන ත්‍රිත්ව ගෞරව සම්මාන බැංකුව තමන් සතුකර ගත්තේය.**

2015 **සිය ගනුදෙනුකාර භවතුන් වෙනුවෙන් අගය යෝජනා වැඩි කිරීම,** මෙහෙයුම් කාර්යක්ෂමතා උත්පාදනය හා අවදානම් කළමනාකරණ ධාරිතා ශක්තිමත් කිරීම යන අරමුණු ඇතිව බැංකුව උන්නතිකාමී සංඛ්‍යාකනය කිරීමේ මුල්පිරීමක් දියත් කළේය. ඒ අනුව ගනුදෙනුකාර භවතුන් හට ආරක්ෂාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම පිණිස බැංකුව සිය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ව්‍යවසාය ශක්තිය සහිත දෘඩාංග වේදිකාවක් බවට උත්ශ්‍රේණිගත කළේය. මූලික බැංකුකරණ පද්ධතිය, දත්ත ගබඩා කිරීමේ ධාරිතා සහ ගෙවීම් භාර ගැනීමේ (POS) යටිතල පහසුකම් උත්ශ්‍රේණිගත කිරීමට ද ආයෝජන සිදු කරන ලදී.

තිරසාර බව කෙරෙහි බැංකුව තුළ වන කැපවීම විදහා දක්වමින් හරිත බැංකුකරණ සංකල්පකයක් බැංකුව දියත් කළේය. එය බැංකුවේ 2016-2020 සඳහා වන උපායමාර්ගික සැලැස්මට සාර්ථක ලෙස ඒකාබද්ධ කර ඇති අතර, එමගින් බැංකුවේ වෙළඳපොළ තත්ත්වය තවදුරටත් ශක්තිමත් කර එහි පාර්ශ්වකරුවන්ට දිගුකාලීන අගය ලබා දීම අපේක්ෂිතය.

2016 **වර්ෂය තුළ දී සමූහය තැන්පතු සහ අත්තිකාරම් යන දෙවර්ගයටම අදාළව රුපියල් ට්‍රිලියන 1 වැදගත් අදියර සාක්ෂාත් කර ගත් අතර, එක් වර්ෂයක් තුළ රුපියල් ට්‍රිලියනයේ අසිරු ජයග්‍රහණ දෙකක් සාක්ෂාත් කරගත් එකම මූල්‍ය සේවා සමූහය මෙය විය.** ලෝක මූල්‍ය බැංකුකරණ සම්මාන ප්‍රදානයේ දී පිට පිට තෙවන වසරටත් "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුකරණ සමූහය" හා "ශ්‍රී ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව" සම්මාන බැංකුව වෙත පිරිනැමිණි. එය ආසියාවේ 387 වැනි විශාලතම බැංකුව ලෙස ද නම් කෙරිණ.

එහි සංඛ්‍යාංකනය කිරීමේ උද්‍යෝගිමත් වැඩසටහනට අනුව, පහසු මූල්‍ය විසඳුම් හා බාධා විරහිත බැංකුකරණය වෙනුවෙන් ගනුදෙනුකාර භවතුන් වෙතින් වැඩිවන ඉල්ලුමට සඵලදායක ලෙස විසඳුම් සපයමින් බැංකුව මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ Kiosks යන්ත්‍ර සහිත ස්වයං බැංකුකරණ මධ්‍යස්ථාන කොළඹ නගරයේ ස්ථාන හතක දියත් කළේය.

නව ගෝලීය ප්‍රවණතා අනුව යමින් සහ ගනුදෙනුකාර භවතුන්ගේ වේගයෙන් වෙනස්වන අභිලාෂයන්ට ගැලපෙන පරිදි බැංකුවේ විකාශය පිළිබිඹු කරමින් බැංකුව නව ලාංඡනයක් දියත් කළේය.

2017 2017 වසර තුළදී අප තම ජයග්‍රහණ රැසක් අත්කරගත් අතර සුවිශේෂී සංඛ්‍යාත්මක ගණනාවක් පසු කළේය. **සමස්ත මෙහෙයුම් ආදායම රු. බිලියන 79 පසුකළ අතර එය කර්මාන්තයේ ඉහළම අගයක් විය. ගෙවුණු දස වසරක කලය පුරා ජාතික ආර්ථික සංවර්ධනය සඳහා බදු, විශේෂ බදු හා ලාභාංශ වශයෙන් සලසාදුන් සංයුක්ත දායකත්වය රු. බිලියන 150.0 සීමාව පසුකර ඇත.** ඊට අමතරව, පසුගිය අට වසරක කාලය තුළ පළමු වරට රු. බිලියන 5.0ක නව ප්‍රාග්ධන යෙදවුමක් බැංකුවට හිමි විය.

සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම බැංකු ශාඛාව කොළඹ නගරයේ විවෘත කරමින් ද, තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා කීර්තිමත් ISO/IEC 27001:2013 ප්‍රමිති සහතිකය දිනා ගනිමින් ද ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ අංශයන්හි පළමු ස්ථාන රැසක් හිමිකර ගැනීමට බැංකුව සමත් වූ අතර තොරතුරු ආරක්ෂණය සහ සුරක්ෂාකරණය සම්බන්ධයෙන් පිරිනමන ලොව ඉහළම ප්‍රමිති සහතිය වන එම සහතිකය දිනූ ජාතියේ පළමු රාජ්‍ය බැංකුව අප බැංකුවයි.

ඒෂියන් බෑංකර් සඟරාවට අනුව ආසියාවේ විශාලතම බැංකු අතර 400වන කීර්තිමත් ස්ථානය හිමිකර ගනිමින් ද, ද බෑංකර් (එක්සත් රාජධානිය) සඟරාවට අනුව, ලොව ඉහළම බැංකු 1000 අතර සිටිමින්ද දේශීයව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද බැංකුව සම්මාන රැසක් දිනා ඇත. දේශීය වශයෙන් ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන ප්‍රදාන උළෙලේදී 2017 වසරේ "රටේ හොඳම බැංකුව" ලෙස සම්මානයට පාත්‍රවූ අතර ගෝලීය සන්නාම උපදේශන නියෝජිතායතනය විසින් ශ්‍රී ලංකාවේ දෙවන අගනාම සන්නාමය වශයෙන් පිළිගැනීමට ලක් විය. වසරක් පාසා 11වන වරටත් 2017 SLIM-Nielson ජනතා සම්මාන ප්‍රදාන උළෙලේදී අනන්‍ය වූ "වසරේ ජනතා සේවා සන්නාමය" සහ "වසරේ ජනතා බැංකුකරණ සේවා සලසන්නා" සම්මාන මහජන බැංකුව වෙත පිරිනමන ලදී.

මූල්‍ය විශ්ලේෂිත තොරතුරු

	බැංකුව			සමූහය		
	2017	2016	වෙනස %	**2017**	2016	වෙනස %
මෙහෙයුම් කාර්යසාධනය (රු.බිලියන)						
පොලි ආදායම්	149.2	110.0	35.7	173.8	129.7	34.0
ශුද්ධ පොලි ආදායම්	50.5	43.1	17.0	62.7	53.6	17.1
දළ ආදායම	162.2	122.1	32.9	190.2	144.7	31.4
වැට් බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය	32.2	26.2	22.6	37.3	31.6	18.0
බදු ගෙවීමට පෙර ලාභය	25.9	20.8	24.5	29.9	25.4	17.4
බදුකරණය	7.7	5.8	31.7	9.4	7.5	25.1
බදු ගෙවූ පසු ලාභය	18.2	15.0	21.7	20.5	18.0	14.2
ශ්‍රීලංකා රජයට ගෙවූ ලාභාංශ	5.2	8.2	-36.4	5.2	8.2	-36.4
රඳවාගත් ලාභය	13.0	6.8	91.8	15.3	9.8	56.8
මූල්‍ය තත්ත්වය (රු. බිලියන)						
මුළු වත්කම්	1,467.1	1,302.0	12.7	1,619.1	1,444.4	12.1
දළ ණය හා අත්තිකාරම්	1,074.2	950.8	13.0	1,209.1	1,076.4	12.3
මුළු තැන්පතු	1,244.0	1,077.8	15.4	1,305.6	1,119.8	16.6
කොටස්කරුවන්ගේ අරමුදල්	77.5	59.6	29.9	106.4	85.2	24.9
කාර්යසාධන අනුපාතික (%)						
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (බදු ගෙවීමට පෙර)	1.9	1.7	11.8	1.9	1.9	0.0
ස්කන්ධ මත ප්‍රතිලාභ	26.6	27.5	-3.3	21.4	22.7	-5.7
පිරිවැය/ආදායම් අනුපාතය	54.8	59.9	-8.5	56.6	60.8	-6.9
අක්‍රීය ණය අනුපාතිකය	1.9	1.9	0.0	2.0	1.9	5.3
ප්‍රතිපාදන ආවරණය	97.5	110.4	-11.7	92.7	110.1	-15.8
ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතිකය - දේශීය බැංකු ඒකකය	24.1	21.7	11.1			
අක්වෙරළ බැංකු ඒකකය	32.4	22.5	44.0			
ණය/තැන්පතු අනුපාතිකය	86.4	88.2	2.0	92.6	96.1	-3.6
මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාතිකය	10.8	9.8	10.2	11.5	11.1	3.6
සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාතිකය	13.5	12.1	11.6	13.7	13.0	5.4
කොටස් හිමිකාර අනුපාතික (රු.)						
කොටසක ඉපැයීම්	18,250	14,995	21.7	19,296	16,722	15.4
කොටසක ශුද්ධ වත්කම් අගය	77,457	59,649	29.9	106,443	85,191	24.9

මූල්‍ය නොවන විශේෂිත තොරතුරු

ගණුදෙනුකාර වටිනාකම්

	ගණුදෙනුකරුවන්ගේ ගිණුම් සංඛ්‍යාව	ගෙවූ පොළිය	පාරිභෝගික මධ්‍යස්ථාන	ATM යන්ත්‍ර
	(මිලියන)	(රු. මිලියන)		
2017	18.6	98,719	737	572
2016	17.9	66,846	737	506
වෙනස (%)	↗ 3.9	↗ 47.7	↙ 0.0	↗ 13.0

සේවක වටිනාකම්

	සේවක සංඛ්‍යාව	සේවකයන්ට ගෙවීම්	පුහුණුව සඳහා ආයෝජන	සාමාන්‍ය පුහුණු කාලය	එක් සේවකයකු සඳහා ලාභය
		(රු. මිලියන)	(රු. මිලියන)		(රු. මිලියන)
2017	8,454	15,425	72	23.6	2.2
2016	8,249	13,634	71	22.2	1.8
වෙනස (%)	↗ 2.5	↗ 13.1	↗ 1.4	↗ 6.3	↗ 19.9

ජාතික ආදායම් වෙත දායකත්වය

	රජයට ගෙවූ බදු	රාජ්‍යයට ගෙවූ ලාභාංශ	අඩු පහසුකම් සහිත ප්‍රදේශවලට ලබා දුන් ණය පහසුකම්
	(රු. මිලියන)	(රු. මිලියන)	(රු. මිලියන)
2017	14,804	5,220	94,184
2016	12,296	8,220	92,382
වෙනස (%)	↗ 20.4	↙ -36.5	↗ 2.0

ව්‍යාපාරික හවුල්කරුවන්

	සැපයුම්කරුවන්ට ගෙවීම්	ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව
	(රු. මිලියන)	
2017	10,481	662
2016	8,588	363
වෙනස (%)	↗ 22	↗ 82.4

ප්‍රජාව

	ආයතනික සමාජීය වගකීම් (CSR) වෙනුවෙන් වූ ආයෝජන
	(රු. මිලියන)
2017	56.3
2016	40.3
වෙනස (%)	↗ 39.7

සභාපතිතුමාගේ පණිවිඩය

"මිලියන 18ක් ඉක්මවූ ගනුදෙනුකාර තැන්පතු ගිණුම් සංඛ්‍යාවක් සහිත විශාලතම ගනුදෙනුකාර පදනම මත ගොඩනැගෙමින් වසරක් පාසා ඉහළම ගනුදෙනුකාර තැන්පතු ප්‍රමාණයක් දිනා ගැනීමට මෙන්ම කර්මාන්තයේ විශාලතම ශාඛා ජාලය ඔස්සේ දීප ව්‍යාප්තව බැංකු පහසුකම් සලසාදීමට බැංකුව සතු හැකියාව පසුගිය වසර ගණනාව මුළුල්ලේ බැංකුව අත්කරගත් සාර්ථකත්වය පිළිබඳ කදිම සාක්ෂියකි."

හිතවත් පාර්ශ්වකාරභවතුනි,

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ මූල්‍ය වර්ෂය සඳහා වන මහජන බැංකුවේ තෙවැනි සංකලිත වාර්ෂික වාර්තාව ඔබ වෙත පිරිනමනු ලබන්නේ හද පිරි සතුටිනි.

බැංකුවේ ප්‍රමුඛ කාර්යසාධන දර්ශක සියල්ල ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ ගෙවුණු 2017 වසර ඔබගේ බැංකුවට තවත් එක් කැපී පෙනෙන වර්ෂයක් විය. එකී වාර්තාගත කාර්සාධනය අතිශය අභියෝගාත්මක වසරක් තුළ අත්කරගැනීම හේතුකොට එහි ඇති වැදගත්කම වඩාත් කැපී පෙනේ.

2017 වසර පුරා ක්ෂුද්‍ර ආර්ථික තත්ත්වයන් ඉතා අභියෝගාත්මක වුවද, එම තත්ත්වයන් ඔරොත්තුදීමේ ශක්තියෙන් හෙබි විය. දළ දේශීය නිෂ්පාදිතය 3.7%ක සාමාන්‍ය වර්ධනයක් පෙන්විය. ශීර්ෂ උද්ධමනය වසර පුරා ඉහළ මට්ටමක පැවති අතර හර උද්ධමනය පහළයාමේ ප්‍රවනතාවක් පෙන්නුම්කරමින් ගෙවුණු දෙවසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යොදාගනු ලැබූ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයේ සඵලදායිත්වය විදහා දැක්විය. 2016 වර්ෂයේ පටන් ඉහළ අගයක පැවති පොළී අනුපාතික තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණු අතර මූල්‍ය වර්ෂයේ අවසන් අර්ධයට වඩා පළමු අර්ධයේ එම තත්ත්වය පැවතීමෙන් ආන්තික හා සමස්ත ඉපැයීම් කෙරෙහි යම් බලපෑමක් ඇති කරන ලදී.

ගෙවුණු වසර තුළ සිය ගමන්මගෙහි වැදගත් සංධිස්ථාන රැසක් සනිටුහන් කරමින්, ඔබගේ බැංකුවේ ඒකාබද්ධ මෙහෙයුම් ආදායම බැංකු ක්ෂේත්‍රයේ නව මංසලකුණක් සනිටුහන් කරමින් රු. බිලියන 79ක සීමාව පසු කළ අතර බදු පසු ලාභය රු. බිලියන 21කට ලඟා විය. ගණුදෙනුකාර තැන්පතු රු. ට්‍රිලියන 1.3 ඉක්මවූ අතර ගණුදෙනුකරුවන් විසින් ලබාගත් අත්තිකාරම් ප්‍රමාණය රු. ට්‍රිලියන 1.1කට ලඟාවෙමින් සමූහය මට්ටමේ වාර්තාගත කාර්යසාධනයක් පෙන්විය. වසර 2010 පටන් සිය කොටස්කරුවන් වෙත 20%ක් ඉක්මවූ හිමිකම් මත ප්‍රතිලාභ අඛණ්ඩව ඉපයූ එකම ආයතනය මහජන බැංකු සමූහය යි. ඊට අමතරව, අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාවක, 2017 වසර තුළ අත්තිකාරම් අංශයෙන් පෙර වසරට සාපේක්ෂව 13% වර්ධනයක් ලඟාකරගැනීමද, සාපේක්ෂ වශයෙන් ඉහළ ගුණාත්මක කළඹක් පවත්වාගැනීමද වාණිජ බැංකුවක් සේ මහජන බැංකුව ලද සැලකිය යුතු ජයග්‍රහණයකි.

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රමාණාත්මක ප්‍රාග්ධනයක්, ද්‍රවශීලතා ආවරණයක් හා තෝලනයක් සහිතව බාසල් III නියමයන් සියල්ලම ඔබගේ බැංකුව විසින් සාර්ථකව සපුරාලූ බව සඳහන් කරන්නේ මහත් අභිමානයෙනි.

2017 වසර තුළ රු. බිලියන 23කට ආසන්න මුදලක් බදු, විශේෂ බදු හා ලාභාංශ වශයෙන් ඒකාබද්ධ පදනමක් මත ශ්‍රී ලංකා රජයට ගෙවා ඇති මහජන බැංකු සමූහය රාජ්‍ය ආදායමේ ප්‍රධානතම කොටස්කරුවෙක් ලෙස තවදුරටත් පෙරමුණේ පසුවේ. එලෙසින් ගෙවුණු දස වසරක කාලය තුළ රාජ්‍ය ආදායම සඳහා සලසාදුන් සමස්ත දායකත්වය රු. බිලියන 150ක් තරම් වූ බොහෝ දෙනෙකුට උදම් ඇණිය නොහැකි ආකාරයේ ජයග්‍රහණයකි.

ඊට අමතරව, 2017 වර්ෂයේ ජූලි මාසයේදී ඔබගේ බැංකුවට මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයෙන් රු. බිලියන 5ක ප්‍රාග්ධන යෙදවුමක් ලැබුණි. 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේදී මහජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය හිමි විය. ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර එම කටයුතු නිම වීමෙන් අනතුරුව ප්‍රාග්ධන නියාමන කාර්යයන් සඳහා පහසුවෙන් ණයකර නිකුත් කිරීමට හැකියාව බැංකුවට හිමිවනු ඇත. එහිදී වඩාත් වැදගත් වන්නේ, ස්වකීය පරිපූර්ණ වර්ධන හැකියාව ලඟාකර ගැනීමට හැකි තත්ත්වයකට බැංකුව පත්වීම යි.

2017 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බේසල් III නියමයන් හඳුන්වාදීමත්, ණය ලබාදීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද නව නියමයන් සහ 2018 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 (SLFRS 9) හඳුන්වාදීමත් සමඟ බැංකු නියාමන ක්‍රියාවලිය තුළ සැලකිය යුතු වර්ධනයක් විද්‍යමාන විය. මෙකී නියාමනයන් සැලසුම් කරනු ලැබ ඇත්තේ දිගුකාලීන වශයෙන් සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා වන අතර මෙම අවස්ථාව වන විට බැංකු ක්ෂේත්‍රයේ අනෙකුත් ආයතන බොහෝමයක් මෙන් ඔබගේ බැංකුවට ද මෙම නියාමනයන්හි බලපෑම දැනෙමින් පවතී. එබැවින්, මෙම නියාමනයන් ක්‍රියාත්මක වීම ආරම්භ වීමත් සමඟ එම නියාමනයන්ට අනුකූලව ක්‍රියාකරනු ලබන බව සහතික කිරීම පිණිස යෝග්‍ය පියවර ගනු ලබනු ඇත.

2015 වසරේ පළමුවරට ආරම්භ වූ බැංකු කටයුතු ඩිජිටල්ගත කිරීමේ ක්‍රියාවලියේ කැපී පෙනෙන ප්‍රගමනයක් පෙන්විය. 2017 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ ප්‍රථම ඩිජිටල් බැංකු පහසුකම් සහිත බැංකු මධ්‍යස්ථානය අපි විවෘත කළෙමු. ඊට ඉතා කෙටි කාලයකට පසුව, කඩිනම් බැංකු මධ්‍යස්ථාන 30කට ආසන්න සංඛ්‍යාවක් සහ වර්ෂය අවසන් වන විට ස්වයං බැංකුකරණ ඒකක (SBUs) 100ක් ද ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාවේ බැංකු කර්මාන්තය තුළ ඩිජිටල් අංශයේ අප ලබා ඇති ප්‍රමුඛස්ථානය එමඟින් මැනවින් විදහා දැක්වේ. මෙතෙක් අප ලබා ඇති ප්‍රගතිය පිළිබඳව අපි සතුටු වන අතරම, අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභය උදෙසා එමෙන්ම පොදුවේ ආර්ථික ප්‍රගමනය උදෙසා අසීමිත බැංකුකරණ ප්‍රස්ථාවන් සලසාදීමේ අරමුණ පෙරදැරිව කිහිප ගුණයකින් වර්ධනය වන තත්ත්වයකට බැංකුව පත්කිරීම පිණිස අපගේ බැංකු කටයුතු ඩිජිටල්ගත කිරීමේ කාර්යයෙහි අපි අඛණ්ඩව නියුක්තව සිටිමු.

ශ්‍රී ලංකා රජය එහි කොටස්හිමියා වන සම්පූර්ණයෙන්ම රජය සතු රාජ්‍ය බැංකුවක් ලෙස මහජන බැංකුවේ උපායමාර්ගික න්‍යායපත්‍රය ජාතික සංවර්ධන න්‍යායපත්‍රය සමඟ සමීපව ගැලපෙන අතර එය එසේ වන්නේ අපගේ ජාතික සංවර්ධනය සඳහා අපි සක්‍රීය ලෙස දායක වීම හේතුවෙනි. ඊට අමතරව, ජනතා අභිලාශයන් පිළිබඳව අපගේ අවධානය නිතැතින් යොමුව පවතින අතර එම අභිලාශයන් අපගේ උපායමාර්ගික සැලසුමෙහි අන්තර්ගත කර ඇත. අපගේ ආකල්ප තුළ කිඳාබැස ඇති තිරසරබව පිළිබඳ ප්‍රතිපත්තියකින් හෙබි අප බැංකුව, අපගේ ජාතික ආර්ථික ප්‍රගමණය උදෙසා සිය දායකත්වය සලසන ගැමියාගේ සිට නගර වැසියා දක්වා, බාල වයස්කරුවන්ගේ සිට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දක්වා, ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගේ සිට විශාල සමාගම් දක්වා, කෘෂිකර්මාන්තයේ සිට යටිතල පහසුකම් අංශය දක්වා, ජාතික ව්‍යවසායන්ගේ සිට බහුජාතික ව්‍යවසායන් දක්වා, සහ ගෝලීය වශයෙන් විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙසෙන රාජ්‍යයන් දක්වා වූ ජන ව්‍යාප්තියකට අයත් අපගේ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වී කටයුතු කරයි.

වටිනාකම් නිර්මාණය කිරීම සහ තිරසර වර්ධනය උදෙසා ඔබගේ බැංකුවේ කැපවීම, බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛ දර්ශකවල ඉදිරියෙන්ම පසුවීම තුළින් මෙන්ම කොටස්කරුවන් සඳහා නිබඳවම ගෙවනු ලබන ලාභාංශ සහ ශක්තිමත් පාරිභෝගික සබඳතා තුළින් මැනවින් පිළිබිඹු වේ. මිලියන 18ක් ඉක්මවූ ගනුදෙනුකාර තැන්පතු ගිණුම් සංඛ්‍යාවක් සහිත විශාලතම ගනුදෙනුකාර පදනම මත ගොඩනැගෙමින් වසරක් පාසා ඉහළම ගනුදෙනුකාර තැන්පතු ප්‍රමාණයක් දිනා ගැනීමට මෙන්ම කර්මාන්තයේ විශාලතම ශාඛා ජාලය ඔස්සේ දීප ව්‍යාප්තව බැංකු පහසුකම් සලසාදීමට බැංකුව සතු හැකියාව පසුගිය වසර ගණනාව මුළුල්ලේ බැංකුව අත්කරගත් සාර්ථකත්වය පිළිබඳ කදිම සාක්ෂියකි. දැඩි අභියෝග හමුවේ සාර්ථකත්වයේ සහ කාර්යසාධනයේ නිම්වලලු තව තවත් පුළුල් කරමින් වසරින් වසර නව ඉහළ මානයන් කරා ලඟාවීමට අපට හැකියාව උදාකිරීම පිණිස නිබඳවම ක්‍රියා කරන කළමනාකාරිත්වයේ සහ 8,000කට අධික ශක්තිමත් සේවක පිරිසකගේ අප්‍රතිහත ධෛර්යය නොවන්නට එකී ජයග්‍රහණ කිසිවක් සැබෑ නොවනු ඇත. ආයතනික පාලනය හා අවදානම් කළමනාකරණ අංශයෙන් විශිෂ්ඨත්වයට පත්වීමේ අනවරත ක්‍රියාවලියක නිමග්නව සිටින අපි අදාළ නියාමන ආයතන සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ ඒකාබද්ධව ක්‍රියාකිරීම තුළින් පාරදෘශ්‍යභාවය තවදුරටත් ඉහළ නංවන්නෙමු. දේශීය වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන්ද ගෙවුනු වසර තුළ අප ලද සම්මාන සහ තිළිණ, බැංකුව ලද පිළිගැනීම බැංකුවේ ශක්තිය, ස්ථාවරත්වය සහ ආරම්භයේ පටන් බැංකුව විසින් ගොඩනගාගෙන ඇති වටිනාකම් පිළිබඳව ලබාදුන් පැහැදිලි සහතිකයකි. මෙම වාර්ෂික වාර්තාවේ බුද්ධිමය ප්‍රාග්ධනය කොටසේ මේ පිළිබඳව වැඩි විස්තර සඳහන්කර ඇත.

අනාගතය දෙස නෙත් යොමු කිරීමේදී, අපගේ දේශයේ වෙසෙන සියල්ලන්ටම ඩිජිටල්කරණය වූ බැංකු පහසුකම් සඳහා ප්‍රවේශය සලසමින් අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සුභ සිද්ධිය පිණිස තාක්ෂණික පරිවර්තනයක් උදෙසා අපි තව දුරටත් කැපවී ක්‍රියා කරන්නෙමු. ගෝලීය පුරවැසියන් වශයෙන් ස්වකීය නෛසර්ගික හැකියාවන් ඩිජිටල්කරණය වූ වේදිකාවක් මත ඔප් නංවා ගැනීමටත් ලොව කවර හෝ තැනකදී වුව තමන් වෙත එළඹෙන කවර හෝ අවස්ථාවන්ගෙන් ප්‍රශස්ථ ඵල නෙලා ගැනීමටත් හැකියාව සලසමින් ගෝලීය ඩිජිටල්කරණ ප්‍රජන්වයෙහි කොටස්කරුවෙකු වීමේ අවස්ථාව අපි අපගේ පාර්ශ්වකරුවන්ට සලසා දෙන්නෙමු.

ඒ අනුව පාරිභෝගික සේවා වැඩි දියුණුවට මඟ සැලසීම පමණක් නොව පිරිවැය කාර්යක්ෂම හා විශ්වසනීය තාක්ෂණික ක්‍රමවේද කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීම තළින් නව්‍යශීලී මූල්‍ය සේවා පාරිභෝගිකයන් වෙත ඉදිරිපත් කිරීමෙහි අපි අඛණ්ඩව නියුක්තව සිටිමු. හෙට දිනට ඔබින විසඳුම් මඟින් සෑම සමාජ ආර්ථික හා ජනවාර්ගික කණ්ඩායමකට ම අයත් අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ වූ අවශ්‍යතා සපුරාලීමට අවකාශ සලසාදෙනු ඇත.

මාගේ පණිවිඩය නිම කරමින්, කිසිදු විවාදයකින් තොරව අප සතු සුවිශාලතම ශක්තිය වන්නාවූ අප කෙරෙහි අඛණ්ඩව විශ්වාසය තබා පක්ෂපාතීභාවයෙන් යුතුව කටයුතු කිරීම පිළිබඳව අපගේ සියලුම ගනුදෙනුකාරභවතුන් වෙත මාගේ අවංක කෘතඥතාව පළකර සිටිමි. සියලු කල්හි සිය අචල සහයෝගය පළ කිරීම වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය කබීර් හෂීම් මැතිතුමාටත්, ගරු අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාටත් මාගේ කෘතඥතාව පළ කරන අතර මේ හා සම්බන්ධ සියලු කාර්යයන්හිදී සිය සහාය කඩිනමින් අප වෙත ලබාදීම වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමාටත්, නියෝජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාටත් මාගේ කෘතවේදීතාව පළ කරමි.

නියාමන ස්වභාවයේ කරුණු සම්බන්ධයෙන් ලබාදුන් සිය අගනා උපදේශන වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතද මාගේ කෘතඥතාව පළ කරමි.

නිබඳවම ලබාදුන් සහයෝගය සහ මඟ පෙන්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහෝදර අධ්‍යක්ෂකවරුන් වෙතද මම ස්තූතිවන්ත වන අතර ස්වකීය කැපවීම සහ අප්‍රතිහත ධෛර්යය තුළින් අති විශිෂ්ඨ ප්‍රතිඵල ලඟා කරගැනීම සඳහා දායකවීම වෙනුවෙන් කළමනාකාරිත්වය සහ කාර්යය මණ්ඩල සමාජිකයන් වෙත ද මාගේ හද පිරි කෘතඥතාව පළ කරමි. විශේෂයෙන්, සිය ආදර්ශවත් නායකත්වය සහ බැංකුව අද සිටින වත්මන් තත්ත්වය කරා බැංකුව ඔසවා තැබීමට දැක්වූ දායකත්වය වෙනුවෙන් අපගේ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි වසන්ත කුමාර් මහතා වෙත ස්තූතිය පළ කරමි.

අද දින අප ගොඩ නංවාගෙන ඇති අප ආයතනය පිළිබඳව මම බෙහෙවින්ම උද්ධාමයට පත්ව සිටිමි. එතකුදු වුවත්, අපගේ පාර්ශ්වකරුවන් සඳහා වඩාත් හොඳින් සේවය කිරීමේ අවස්ථා නිර්මාණය කිරීමේ හා ග්‍රහණය කරගැනීමේ කාර්යයයෙහි නිරත වෙමින් අපගේ පාර්ශ්වකරුවන්ගේ සුභ සිද්ධිය පිණිස තිරසර සංවර්ධනයක් ලඟාකර ගනිමින් බැංකුකරණ හා මූල්‍යසේවා ක්ෂේත්‍රයේ කිසිවකු මෙතෙක් පය නොගැසූ බිම් කරා ලඟාවීමට අපි අඛණ්ඩව ක්‍රියාකරන බැවින් මම අනාගතය දෙස සුභවාදීව නෙත් යොමු කරමි.

මූල්‍ය සේවා සඳහා ශ්‍රී ලංකාවේ අසමසම වෙළඳපොළ නියමුවා වශයෙන් පිළිගනු ලැබීම යන අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීම කරා අද අපි තවත් එක් පියවරක් තබා සිටිමු.



හේමසිරි ප්‍රනාන්දු
සභාපති

2018 මාර්තු 27

ශ්‍රී ලංකාවේ බැංකුකරණ හා මූල්‍ය සේවා කෙෂ්ත්‍රයේ ඩිජිටල්කරණ මාවතේ පෙරමුණ ගෙන සිටීම

දිවයිනේ පළමු සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කළ බැංකු ශාඛාව ද ඇතුළුව සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කළ ශාඛා සංඛ්‍යාව

2

කඩිනම්/පෝරම රහිත බැංකු මධ්‍යස්ථාන

28



දිවයිනේ වේගවත්වම ව්‍යාප්ත වූ ශාඛා ජාලාවකින් සමන්විත වේ.

මාස 12ක් තුළ ස්ථාපිත කළ ස්වයං බැංකු ඒකක ගණන 102

ISO/IEC 27001:2013

සිය තොරතුරු ආරක්ෂණය වෙනුවෙන් ජාත්‍යන්තර සහතිකයක් දිනූ ප්‍රථම හා එකම රාජ්‍ය බැංකුව

ISO/IEC 27001:2013 සහතිකපත්ලාභී

2017 වසරේදී පමණක් සිදුකළ අන්තර්ජාල බැංකු ගණුදෙනු වටිනාකම

රු. බිලියන 127.5ක් විය.

අපගේ විප්ලවීය ගමන නොනැවතී ඉදිරියටම යයි.

ප්‍රධාන විධායක නිලධාරීගේ/ සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

දිවයිනේ සමස්ත බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ පෙරමුණ ගෙන සිටීම ඇගයීමක් වශයෙන් දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද නිළිණ හා සහතිකපත් ගණනාවකින් අප බැංකුව පිදුම් ලබා ඇත. මහජන බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සාමූහික ප්‍රයත්නය සමඟ මුසු වූ සෑම දෙපාර්තමේන්තුවක්ම විසින් ජයග්‍රහණ වෙනුවෙන් ලබාදුන් අමිල දායකත්වය, මෙකී ජයග්‍රහණ සියල්ල පසුපස සිටි දැවැන්තම ශක්තියයි.

නව අවස්ථාවන්ගෙන් විපුල ඵල නෙලාගැනීම පිණිස අපගේ උපායමාර්ග විකාශනය කිරීමටත්, අපගේ ව්‍යාපාරික ආකෘතිය ප්‍රතිපිහිටුවීම සඳහාත් අපි ක්‍රියාකර ඇත්තෙමු. අප සමූහය තුළ පරිපූර්ණ ප්‍රගමණයක් ලඟාකර ගැනීම පිළිබඳව අවධානය යොමු කරමින් අපගේ සියලුම පාර්ශ්වකරුවන් වෙත අසීමිත අවස්ථාවන් උදාකරදීම පිණිස අප විසින් අපගේ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට ද, ගණුදෙනුකරුවන්ගේ සුව පහසුව වැඩි දියුණු කිරීමට ද, අපගේ උපායමාර්ගික ඩිජිටල්කරණ ක්‍රියාවලිය තවදුරටත් ව්‍යාප්ත කිරීමට ද කටයුතු කරනු ඇත. මෙකී ක්‍රියාමාර්ග සියල්ල මගින් ස්ථාවර පදනමක් මත වර්ෂයේ නිමාව සනිටුහන් කිරීමේ හැකියාව අපට උදාවී ඇත.

ආකර්ශනීය ගෙවුණු වසර

ගෙවුණ 2017 වසර අප සමූහයට සුවිශේෂී වසරක් වූ අතර එහිදී සංයුක්ත දළ ආදායම රු. බිලියන 190.2 දක්වා ඉහළ යමින් පෙර වසරට වඩා 31.4% ක වර්ධනයක් වාර්තා කළේය. සමස්ත මෙහෙයුම් ආදායම 15.2% වර්ධනයක් පෙන්වමින් කර්මාන්තයේ ඉහළම අගය වූ රු. බිලියන 78.8ක් වූ අතර අරමුදල් පාදක නොවන ආදායම ද 8.8%ක වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 16.4ක් දක්වා ඉහළ ගියේය. 2016 වර්ෂයේ රු. බිලියන 25.4ක් වූ බදු පෙර සංයුක්ත ලාභය සමඟ සැසඳීමේදී එම ලාභය 17.4%කින් ඉහළ ගොස් සමූහයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වූ රු. බිලියන 29.9 ක් ලෙස වාර්තා විය. සුළුලදායී පිරිවැය කළමනාකරණ උපායමාර්ග හේතුවෙන් මෙහෙයුම් වියදම් වර්ධනය 2017 වසරේදී 4.9%ක මට්ටමින් පවත්වාගැනීමට ද අපි සමත් වීමු.

බාසල් III නියමයන්ට අනුව අපගේ ප්‍රමුඛ දර්ශක කළමනාකරණය කරගැනීම පිණිස වත්කම් හා තැන්පතු වර්ධනය සීමා කිරීමට අපට සිදු විය. එබැවින්, පසුගිය වසරේ අවසන් කාර්තුව තුළ බාසල් III තුලිතකරණ නියමයන්ට අනුකූලව වත්කම් වර්ධනය වීම සීමා කිරීමට ද අපට සිදුවිය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ සමස්ත වත්කම් අගය දැඩි පාලනයක් යටතේ 12.1% ක ඉහළයාමක් පෙන්වමින් රු. ට්‍රිලියන 1.619ක් දක්වා වර්ධනය විය. එය ඉතා කෙටි කාලයක් තුළ ඔබගේ බැංකුව අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයකි.

2017 වසර අවසානයේදී තැන්පතු අගය පාලනයකට යටත්ව වුවද 16.6% කින් වර්ධනය වෙමින් රුපියල් ට්‍රිලියන 1.305ක සීමාවට ළඟාවිය එය අප බැංකුව කෙරෙහි ගණුදෙනුකරුවන් තුළ පවතින විශ්වාසය මැනවින් පිළිබිඹු කරන්නක් විය රුපියල් ට්‍රිලියනයකට වඩා වැඩි තැන්පතු වර්ධනයක් ලඟාකර ගත හැකි වීම සුවිශේෂී ජයග්‍රහණයක් වන අතර ඒසඳහා භූගෝලීය කලාප සියල්ලම පාහේ ආවරණය කරමින් පැතිර ඇති අපගේ ශාඛා ජාලයේ මෙන්ම සුළුලදායී අලෙවිකරණ ක්‍රියාවලියේ සහාය හිමිවිය.

පැවති අභියෝගාත්මක ආර්ථික වටපිටාව සහ රුපියල් ට්‍රිලියනයක් ඉක්මවූ වත්කම් පදනම හමුවේ වුවද බැංකු කර්මාන්තය තුළ අවම අනුපාත අගයන් අතර වූ 1.9%ක මට්ටමකින් අක්‍රීය ණය අනුපාතිකය රඳවා ගනිමින් අපගේ වත්කම් කළඹිහි ගුණාත්මක බව සාර්ථකව පවත්වා ගෙන යන ලදී.

ගෙවුනු වසර තුළ අත්කරගත් අද්විතීය කාර්යසාධනය මගින් පිළිබිඹු වන්නේ අභ්‍යන්තර ප්‍රාග්ධන සීමාවන් සහ අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන් යටතේ උද්ගතවන අභියෝග හමුවේ පවා කාර්යසාධනයේ ඉහළ කඩඉම් නිරන්තරයෙන් පසුකර යාමට අප සමූහය සතු ශක්තිය හා එළඹුමයි. දිවයිනේ සමස්ත බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ පෙරමුණ ගෙන සිටීම ඇගයීමක් වශයෙන් දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද නිළිණ හා සහතිකපත් ගණනාවකින් අප බැංකුව පිදුම් ලබා ඇත. මහජන බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සාමූහික ප්‍රයත්නය සමඟ මුසු වූ සෑම දෙපාර්තමේන්තුවක්ම විසින් ජයග්‍රහණ වෙනුවෙන් ලබාදුන් අමිල දායකත්වය, මෙකී ජයග්‍රහණ සියල්ල පසුපස සිටි දැවැන්තම ශක්තියයි.

ඩිජිටල්කරණයේ අප සතු නායකත්වය

අපගේ ඩිජිටල්කරණ න්‍යායපත්‍රයෙහි ක්‍රමික ප්‍රගතියක් අප විසින් සාක්ෂාත් කරගත් අතර ඒ තුළින් විද්‍යමාන වන්නේ බැංකු කර්මාන්තයේ වටපිටාව හැඩ ගස්වා ගනිමින්, ඉහළ වර්ධනයක් සලසා ගැනීම පිණිස අප විසින් දරනු ලබන අනවරත ප්‍රයත්නයයි ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ දිවයින පුරා සියලුම දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි කඩිනම් බැංකු මධ්‍යස්ථාන 30කට අසන්න සංඛ්‍යාවක් සහ ස්වයං බැංකු ඒකක 100කට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කරන ලදී.

එලෙසින් අප විසින් ශ්‍රී ලංකාවේ සුවිශාලතම ශාඛා ජාලය ගොඩ නැංවීමට අමතරව රටේ විශාලතම ස්වයං බැංකු ඒකක ජාලය ව්‍යාප්ත කිරීමට ද එකසේ කටයුතු කර ඇතවසර මුළුල්ලේ සතියේ දින 7 පැය 24 පුරා ක්‍රියාත්මක වන මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය සලසන මෙකී බැංකු ඒකක ගණුදෙණුකරුවන්ගේ - කර්මාන්තයේ බැංකු හා මූල්‍ය සේවා සපයන්නන්ගේ පවා - විවිධ වූ බැංකුකරණ අවශ්‍යතා ඉටුකර ගැනීමට අවකාශ සලසන අතර ලොව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වූ යාවත්කාලීන කළ බැංකු ගිණුම් පිළිබඳ විස්තර ලබාදෙමින් එම සේවාවන් සැලසීම සිදු කෙරේ.

ඩිජිටල්කරණය කළ බැංකු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම මගින් වසර 2020 වනවිට ඉහළින්ම ඩිජිටල්කරණය වූ බැංකුව බවට පත්වීම සහ සැමට සර්වත්‍ර ප්‍රවේශය සහතික කිරීම යන අංශයන්හි අප දිනා සිටින ජවසම්පන්න නායකත්වයෙහි ප්‍රබල ඉදිරි පිම්මක් තබනු ඇත. ඩිජිටල්කරණය මගින් ගණුදෙණුකරුවන් සමඟ ගැඹුරු වූද අනෝන්‍ය වශයෙන් ප්‍රතිලාභදායී වූ ද සබඳතා තහවුරු කරගැනීමටත්, මූල්‍ය අන්තර්කරණය අප දේශය තුළ මුලුමනින්ම යථාර්ථයක් බවට පත්කර ගැනීමටත් හැකිවනු ඇත

ජාතික සංවර්ධනය සහ මූල්‍ය අන්තර්කරණය අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුව වන මහජන බැංකුව අපගේ ජාතික ආර්ථික සංවර්ධනය සඳහා සහාය වීමේ සහ මූල්‍ය අන්තර්කරණය වෙනුවෙන් ක්‍රියා කිරීමේ ස්වකීය වගකීම පිළිබඳව අවබෝධයෙන් පසුවේ. ජාතියේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අඛණ්ඩව සහාය වන අපි බලශක්ති උත්පාදනය, ජල හා මාර්ග සංවර්ධනය ආදී විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් ලබාදෙමු. 2014 වසර අවසන් වනවිට මෙම අංශය සඳහා අප ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් බිලියන 100 ඉක්මවිය. ගෘහ මට්ටමින් සූර්යය බලශක්ති පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ රජයේ මූලාරම්භයක් වන "සූර්යය බල සංග්‍රාමය" සඳහා සහාය වීම වෙනුවෙන් දරනු ලබන ප්‍රයත්නයක් වශයෙන් අප විසින් පසුගිය වසර තුළ සූර්යය බල ණය යෝජනාක්‍රමයක් දියත් කරන ලදී. මහජනයා සඳහා මුදල් භාවිතා කිරීමකින් තොරව බස්රථ වල ගමන් කිරීමට හැකිවන පරිදි ප්‍රථම වරට හඳුන්වාදෙන ලද. "Peoples Travel Pass" කාඩ්පත හඳුන්වා දීම (පළමු ටච් ට්‍රැවල් කාඩ්පත) සඳහා මාර්ගසංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පෞද්ගලික බස් සංගමය සහ ඩයලොග් ආසියාටා සමාගම සමඟ එක්ව ක්‍රියා කළෙමු ඊට අමතරව මාධ්‍යවේදීන් සහ කලාශිල්පීන් විසින් ජාතිය වෙත සිදුකරනු ලබන අමිල සේවය අගයනු පිණිස ඔවුන් සඳහා විශේෂ ණය පහසුකම් හඳුන්වාදෙන ලදී.

අප දේශයේ අඩු වරප්‍රසාදලාභී ජන කොටස් බල ගැන්වීමේ මෙවලමක් ලෙස ශුද්ධ මූල්‍යනය උපයෝගී කරගනිමින් ඔවුන් වෙත සහන ණය පහසුකම් සලස්වාදෙන ලදී.

"ව්‍යවසායකත්ව මහිමය" - යන මැයෙන් ගණුදෙණුකරුවන් සඳහා දිවයින පුරා පවත්වනු ලබන පුහුණු හා අධ්‍යාපන වැඩමුළු හරහා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායක ගණුදෙණුකරුවන් 525 දෙනෙකු අප විසින් බලගන්වන ලදී. ඊට අමතරව අපගේ පුළුල් ව්‍යාප්තියක් සහිත ශාඛා ජාලය ඔස්සේ

නිශ්චිත කර්මාන්ත අංශ වෙත රජයේ අරමුදල් යොමු කිරීම සඳහා ප්‍රතිමූල්‍යයන යෝජනා ක්‍රම 11ක් සඳහා අපගේ දායකත්වය ලබාදෙන ලදී සමාලෝචිත වර්ෂය තුළ මෙකී මාර්ග ඔස්සේ රුපියල් මිලියන 867ක මුදලක් ලබාදීමට අපට හැකි වූ බව සතුටින් සඳහන් කරමි.

ගණුදෙණුකාර සංකේන්ද්‍රණය

අපගේ උපායමාර්ගික න්‍යායපත්‍රයේ හරය වන්නේ මිලියන 18ක් වන අපගේ ගණුදෙණුකාර ගිණුම්පිළිබඳව නිරන්තර අවධානය යොමු කිරීම යි. මක් නිසාදයත් ගණුදෙනුකරුවන්ගේ සාර්ථකත්වය අපගේ සාර්ථකත්වය පිණිස ද හේතුවන බව අපි අවබෝධ කරගෙන සිටින බැවින් ඔවුන් තුළ බැංකුව කෙරෙහි විශ්වාසය ගොඩනැගීම මූලික ප්‍රමුඛතාවකි. එබැවින් අපගේ ගණුදෙණුකරුවන් සඳහා අද්විතීය බැංකුකරණ අත්දැකීමක් ලබාදීමට අපි විශේෂයෙන් සැදී පැහැදී සිටිමු ඩිජිටල් බැංකුකරණය තුළින් අපගේ සේවා ප්‍රමිතීන් ඉහළ නැංවීමටත්, එකී සේවාවන්ට ප්‍රවේශය ඉහළ නංවා වඩා වැඩි සුවපහසුවක් සලසා දීමටත්. අපගේ සේවා සැපයුම් ශක්තිමත් කිරීමටත්, හෙටට ඔබින නිෂ්පාදන හඳුන්වා දෙමින් ගණුදෙණුකරුවන්ගේ පෞද්ගලිකත්වය සුරැකීමටත් අපට හැකිවනු ඇත ඊට අමතරව අද්විතීය පාරිභෝගික සේවාවක් සලසාදීම පිළිබඳව මනා පහුණුවක් අපගේ සේවකයන්ට ලබා දී ඇත.

ව්‍යවස්ථාපිත වගකීම සහ තිරසරබව පිළිබඳ අපගේ කැපවීම

සමාජයේ බැංකු සේවාවන් සපයන ආයතන අතර ප්‍රමුඛතම ආයතනයක් බවට අප බැංකු පත්ව ඇත. සංයුක්ත වගකීම පිළිබඳ අපගේ කැපවීම අපගේ බැංකුවේ තිරසරබව සඳහා ඉවහල්වන අතරම කර්මාන්තය තුළ අප සතු නායකත්වය, පාර්ශ්වකරුවන් සම්බන්ධකර ගනිමින් ක්‍රියාකිරීම සහ ප්‍රජා ආයෝජන ක්‍රියාකාරකම් තුළින් අපගේ දෛනික මෙහෙයුම් තුළට තිරසරබව අප විසින් කා වද්දා ඇත. අපගේ කාර්ය මණ්ඩලය මෙම කැපවීමෙහි හදවත බඳු වේ මූල්‍යමය, සාමාජීය සහ පාරිසරික කරුණු සාර්ථකව කළමනාකරණය කිරීමට බැංකුවට ඉවහල් වී ඇත්තේ ඔවුන්ගේ අප්‍රතිහත කැපවීමයි.

අඩු පහසුකම් සහිත ප්‍රදේශයන්හි පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, සංස්කෘතික උරුමය හා ඓතිහාසික වටිනාකම් සහිත ව්‍යාපෘති සඳහා ලබා දීම සහ ස්වභාවික විපත් ආදියෙහිදී සහනාධාර ලබාදීම ආදී ප්‍රජා මූලාරම්භයන් සඳහා අනුග්‍රහය දැක්වීම අඛණ්ඩව සිදු කළෙමු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 187 - 188 හි ප්‍රජා සංවර්ධන ප්‍රාග්ධනය යන මාතෘකාව යටතේ මෙම වැඩසටහන් සවිස්තරව දක්වා ඇත.

අපගේ සියලු ව්‍යාපාරික තීරණ හා බැංකු මෙහෙයුම් කටයුතු වලදී පරිසරය පිළිබඳව අපගේ අවධානය නිතැතින් යොමුවන අතර ණය ඇගයීම් පිළිබඳ යෝජනා සහ ඩිජිටල් බැංකු පහසුකම් යටතේ තිරසර බැංකුකරණ පරිචයන් ප්‍රවර්ධනය කිරීම ආදියෙහිද පාරිසරික ගැටලු පිළිබඳව නිසි අවධානයක් යොමුකරනු ඇත එලදායී පුහුණු හා සංවර්ධන වැඩසටහන් සහ හිතකර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම තුළින් අපගේ ශ්‍රම ප්‍රාග්ධනය සඳහා වටිනාකම් එකතු කිරීමෙහි අඛණ්ඩව නිරත වූනෙමු. තිරසරවූත්, යහපත්වූත් ප්‍රතිඵල ලාබදෙමින්ද අපගේ ව්‍යාපාරික කටයුතු වර්ධනය කරගැනීමෙන්ද අපගේ පාර්ශ්වකරුවන් වෙත වැඩි වටිනාකමක් ජනනය කළ හැකි විය අනුකූලතාව පවත්වා ගැනීම තුළින් අපගේ මෙහෙයුම්වලදී ඉහළ මට්ටමේ අවංකභාවයක් සහ පාරදෘශ්‍යභාවයක් අප විසින් පවත්වාගනු ලැබිය.

ඉදිරි දැක්ම

ඩිජිටල්කරණ එළඹුම සහ අද්විතීය සේවක පිරිස සමඟ සුසංයෝග වූ අපගේ සංයුක්ත උපායමාර්ගික සැලැස්ම අපගේ සාර්ථකත්වය පිළිබඳ නිල ලියවිල්ල වේ. ගණුදෙණුකරුවන් වෙත නිෂ්පාදන හා සේවා සැපයීමේදී ඩිජිටල්කරණය, තරඟකාරී වාසියක් ලබාගැනීමට නිසැකවම පහසුකම් සපයන්නෙකු වන අතර අපගේ සියලුම මෙහෙයුම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම, පාර්ශ්වකරුවන් සමඟ සක්‍රීය සම්බන්ධතාව සහ ඔවුන් සඳහා ඉහළනැංවූ වටිනාකම් සලසාදීම මගින් තිරසරබව ස්ථාපිත කිරීමට අපි ඉදිරියේදී කැපවෙමු.

ස්වයං බැංකු ඒකක විවෘත කිරීමටත්, ඩිජිටල් බැංකු මධ්‍යස්ථාන රටේ සෑම දිස්ත්‍රික්කයකම ස්ථාපිත කිරීමටත් අපි තවදුරටත් ක්‍රියා කරමු පත්‍රිකා රහිත බැංකු කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ හරිත මූලාරම්භන ක්‍රියාවට නැංවීම මගින් පාරිසරික තිරසරබව පිළිබඳ අපගේ අවධානය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

සංවර්ධන බැංකුකරණය සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අංශය කෙරෙහි එළඹෙන වර්ෂයේදී වැඩි අවධානයක් යොමුකරනු ලබන අතර, බැංකුවේ ඉතුරුම් ගිණුම් සහ ජංගම ගිණුම් අතර අනුපාතය වැඩි දියුණු කිරීම පිළිබඳව සහ සමූහයේ ඉදිරි සංවර්ධනයේ ගමන් මඟ එළි දක්වන 2020-2024 සමූහයේ නව උපාය මාර්ගික සැලැස්ම සම්පාදනය කිරීම පිළිබඳව ද අප විසින් අවධානය යොමු කරනු ඇත

කෘතඥතාව

ශක්තිමක් පදනමක් මත පිහිටි මහජන බැංකුව තිරසර වර්ධනයක් සාක්ෂාත්කර ගැනීමට සැරසී සිටියි අපගේ උපායමාර්ගය යහපත් වන අතර කළමනාකාරිත්වය ඒ පිළිබඳව අවධානය යොමු කර ඇත.

අප සමූහයේ දිගු කාලීන සාර්ථකත්වය පිළිබඳව අපි මහත් විශ්වාසයක් තබා සිටින මෙවන් මොහොතක ඒ සඳහා දැක්වූ සිය අමිල දායකත්වය සහ අචල නායකත්වය වෙනුවෙන් අපගේ සභාපති, හේමසිරි ප්‍රනාන්දු මහතාටත්, අධ්‍යක්ෂ මණ්ඩලයටත් මාගේ කෘතඥතාව පළ කරමි ලබාදුන් උපදේශන සහ මාර්ගෝපදේශ වෙනුවෙන් අප අධීක්ෂකයන් වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. මෙම සුවිශේෂී ජයග්‍රහණ වෙනුවෙන් පළකළ සිය කැපවීම සහ අප්‍රතිහත ධෛර්යය හා දායකත්වය වෙනුවෙන් කළමනාකාරිත්වය සහ කාර්යය මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පුද කරමි. අප කෙරෙහි විශ්වාසය තබා, පක්ෂපාතීව ක්‍රියාකළ අපගේ පාර්ශ්වකරුවන් සහ ගණුදෙණුකරුවන් වෙත මාගේ කෘතඥතාවය පළ කරමි.

අපගේ ගණුදෙණුකාරභවතුන්ගේ වෙනස්වන අවශ්‍යතා පිළිබඳව මහත් වූ අවබෝධයකින් යුතුව ක්‍රියා කරමින් තාක්ෂණ අංශයෙහි අපගේ ආයෝජනවල අපගේ පාර්ශ්වකරුවන් සමඟ වන දැඩි සබඳතාව හා ඒ සියල්ලටම වඩා වෙනස්වන ලෝකයට අනුව හැඩ ගැසීමටත් එම වෙනස්කම් සතුටින් යුතුව පිළිගැනීමටත් අප සතු හැකියාව මගින් අපගේ සෑම පාර්ශ්වකරුවෙකුටම ඉහළ වටිනාකමක් නිර්මාණය කිරීමේ අසීමිත අවස්ථා සලසාදෙමින් අඛණ්ඩව ඉදිරියටම යාමට අපට හැකියාව උදාවී ඇත. සර්ව සුභවාදී ලෙස අපි අනාගතය දෙස නෙත් යොමා සිටිමු.



එන් වසන්ත කුමාර්
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩලය

සිටගෙන (වමේ සිට දකුණට)
පෙලිමියන් පෙරේරා මයා - අධ්‍යක්ෂ, කේ.ඩී.එන්. රංජිත් අසෝක මයා - අධ්‍යක්ෂ, ආචාර්ය අමින්ද එම්. පෙරේරා මයා - අධ්‍යක්ෂ, ඒ.ඩී. ඇන්ටන් එස්. හේමන්ත මයා - අධ්‍යක්ෂ, කේ. රාජේන්ද්‍රන් මයා - අධ්‍යක්ෂ

අසුන්ගෙන (වමේ සිට දකුණට)
පේහාන් පී. අමරතුංග මයා - අධ්‍යක්ෂ, හේමසිරි ප්‍රනාන්දු මයා - සභාපති, පී.ඩී. චන්ද්‍රා ඒකනායක මෙනවිය - අධ්‍යක්ෂ

හේමසිරි ප්‍රනාන්දු මයා
සභාපති

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (ආර්ථික විද්‍යා)උපාධිය හිමිකර ගැනීමෙන් අනතුරුව හේමසිරි ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා නාවික හමුදාවට (ස්වේච්ඡා) එක් වූ අතර එහිදි ජාතික වෙඩි තැබීමේ ශූරතාව තෙවරක්ම දිනා ගැනීමටත්, 1982 වර්ෂයේ දී ආසියානු ක්‍රීඩා උළෙලේ දී ඩිප්ලෝමාවක් ද හිමිකර ගැනීමටත් සමත් විය.

අග්‍රාමාත්‍ය ලේකම් වශයෙන් 1994 දී රාජ්‍ය සේවයට එක්වූ හේමසිරි මහතා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, ගුවන් තොටුපල හා ගුවන්සේවා සමාගම සහ ස්වාධීන රූපවාහිනී ආදී ආයතනවල සභාපති වශයෙන් ද ක්‍රියාකරමින් විශිෂ්ඨ සේවාවක් ඉටු කළේය.

ජාතික ඔල්ම්පික් කමිටුවේ සභාපති ධූරය වැඩිම කලක් දැරූ ඒ මහතා ආසියානු ඔලිපික් කවුන්සිලයේ සහ පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සම්මේලනයේ උප-සභාපති යන ජාත්‍යන්තර තලයේ නිලතල දෙකක් දැරූ ප්‍රථම ආසියාතිකයා ද වන්නේය.

ශ්‍රී ලංකා දුම්රිය සේවය පිළිබඳව විශේෂිත ග්‍රන්ථ තුනක් රචනා කළ හේමසිරි මහතා දැනට ජාතික දුම්රිය කෞතුකාගාර කමිටුවේ සභාපති වශයෙන් ද කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශක තනතුරට දෙවරක් පත්කරනු ලැබූ ඔහු කිරිකිස්ථාන් ජනරජයේ ශ්‍රී ලංකා ගරු කොන්සල්වරයා වශයෙන්ද සේවය කරයි.

ජෙහාන් පී. අමරතුංග මයා
අධ්‍යක්ෂ

ජෙහාන් පී. අමරතුංග මහතා ශ්‍රී ලංකා එම්ටීඩී වෝකර්ස් පීඑල්සී සමාගමේ නියෝජ්‍ය සභාපති ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මෙන්ම එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයකු වන අමරතුංග මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආතනයේ අවසන් පරීක්ෂණයෙදී කුසලතා අනුපිළිවෙලින් පළමු ස්ථානයෙන් පිදුම් ලැබීය. අමරතුංග මහතා දැනට මහජන බැංකුව, පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (SLIIT), සහ සීමාසහිත ජැට් හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි. සීමාසහිත පිපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී සමාගමේ සභාපති ධූරයේද කටයුතු කරන අමරතුංග මහතා මූල්‍ය හා කළමනාකරණ ක්ෂේත්‍රයන්හි වසර 26කට අධික පළපුරුද්දක් සතු නිලධාරියෙකි.

සංස්ථා සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාරික ආයතන ගණනාවක උපදේශක හා අධ්‍යක්ෂ තනතුරුවල ක්‍රියාකර ඇති අමරතුංග මහතාගේ වෘත්තීය දිවියේ අත්කරගත් සැලකියයුතු ජයග්‍රහණ රාශියක් අතර 'Value for Money Accounting' මැයෙන් ඔහු විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ජාතික සම්මේලනය වෙත ඉදිරිපත් කරන ලද ලේඛණය ඔහුගේ වෘත්තියේ පරිනතභාවය පිළිබිඹු කරන්නකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාවේ සාමාජිකයකු වශයෙන්ද අමරතුංග මහතා සේවය කළේය.

පී.ඩී. චන්ද්‍රා ඒකනායක මෙනවිය
අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකාවක් වන ඒකනායක මෙනවිය 1984 වර්ෂයේ දී එම සේවයට බැඳුණි. 2015 මාර්තු මස 9 දින නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරියක ලෙස පත් කරන ලද අතර එම පත්කිරීමට ප්‍රථමව ආර්ථික කටයුතු අධ්‍යක්ෂ, රක්ෂණ පාලක, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් යන මහා භාණ්ඩාගාරයේ ජ්‍යේෂ්ඨ තනතුරු ඇය විසින් දරන ලදී.

කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී විශේෂ උපාධිය හදාරා ඇති ඒකනායක මහත්මිය ශ්‍රී ලංකා පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියද, සංවර්ධන සැලසුම්කරණ තාක්ෂණික ක්‍රම (ISS, The Hague), ජාත්‍යන්තර සබඳතා (BCIS, Colombo) සහ ආර්ථික සංවර්ධන (කොළඹ විශ්වවිද්‍යාලය) යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලබා ඇත. ආසියානු ප්‍රතිරක්ෂණ සංස්ථාවේ පාලක සභාවේ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස වර්ෂ 2002 සිට 2013 දක්වා ක්‍රියා කළ අතර වර්ෂ 2008 සිට 2013 දක්වා එහි උප-සභාපතිනිය ලෙස ද ක්‍රියා කළාය. NDB බැංකුවේ සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිතවරිය වශයෙන් ක්‍රියකර ඇති ඇය දැනට මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය වශයෙන් සේවය කරයි.

ෆෙලිෂියන් පෙරේරා මයා
අධ්‍යක්ෂ

2015 මාර්තු මාසයේ දී මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද ෆෙලිෂියන් පෙරේරා මහතා අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වේ. නිලනොලත් මහේස්ත්‍රාත්වරයකු/නීතිඥයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවිරුම් කොමසාරිස්වරයකු සහ ලියාපදිංචි සමාගම් ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කරයි. මහවැලි වෙන්චර් කැපිටල් සමාගමේ සභාපති වශයෙන් ද, වයඹ පළාත් වාණිජ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයක් වශයෙන් ද ඒ මහතා සේවය කර ඇත.

කේ. රාජේන්ද්‍රන් මයා
අධ්‍යක්ෂ

2015 අප්‍රේල් මස මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරන ලද රාජේන්ද්‍රන් මහතා ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය, බදුකරණය හා විගණනය සම්බන්ධයෙන් වසර 37කට අධික පළපුරුද්දක් ලබා ඇත.

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සහ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරන රාජේන්ද්‍රන් මහතා වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරිවරයෙක් ද වන අතර බ්‍රිතාන්‍ය කළමනාකරණ ආයතනයේ ද සාමාජිකත්වය දරයි. DMS සමූහ සමාගමේ සමූහ මූල්‍ය අධ්‍යක්ෂ වශයෙන් රාජේන්ද්‍රන් මහතා දැනට ක්‍රියා කරයි.

2000/2001 අතර කාලයේ රොටරි දිස්ත්‍රික් පාලක වශයෙන් සේවය කළ රාජේන්ද්‍රන් මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පාලක සභා සමාජිකයක් ද වේ.

ටී.ඩී. ඇන්ටන් එස්. හේමන්ත මයා
අධ්‍යක්ෂ

කෘෂිකාර්මික අධ්‍යාපන පසුබිමක් සහිත දක්ෂ ව්‍යවසායකයෙක් වන ඇන්ටන් හේමන්ත මහතා කෘෂි නිෂ්පාදන ඇසුරුම් කර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමට පෙර සැලකිය යුතු කාලයක් කෘෂි රසායන කර්මාන්තයේ සේවය කළේය. 1983 පටන් ප්ලාස්ටික් පටල නිෂ්ක්‍රාන්තිය, මුද්‍රනය හා ලැමිනේට් කිරීමේ නිෂ්පාදන කර්මාන්තයක් වන සෙල්මෝ පෞද්ගලික සමාගමේ හිමිකරු හා සභාපති වශයෙන් ක්‍රියා කරයි. ශ්‍රී ලංකා ලැමිනේටිකළ නම්‍යශීලි ඇසුරුම්කරණ සංගමයේ සභාපති ලෙස දැනට කටයුතු කරන ඒ මහතා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ඇසුරුම්කරණ පර්ෂදයේ නිටපු සභාපතිවරයා ද වේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ඇසුරුම්කරණය පිළිබඳ උපදේශකයෙක් ලෙස ද සේවය කළ හේමන්ත මහතා ස්විඩනයේ ඔරෙබ්‍රෝ නගරය කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ක්‍රිස්තියානි වාණිජ මණ්ඩලයේ (ICCC) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ද එකී වාණිජ මණ්ඩලයේ ආසියානු කලාපීය අධ්‍යක්ෂවරයා වශයෙන් ද කටයුතු කළේය.

ආචාර්ය අමින්ද එම්. පෙරේරා මයා
අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ජ්‍යේෂ්ඨ කතිකාචාර්යවරයෙක් වන ආචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා මහතා මාතලේ ශාන්ත තෝමස් විද්‍යාලයෙන් සිය මූලික අධ්‍යාපනය ලැබූ අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජවේදී පීඨයේ උසස් අධ්‍යාපනය හදාරා රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය හිමිකර ගත්තේය.

සිය පළමු විද්‍යාපති උපාධිය ලෙස ඉන්දියාවේ ඉන්දිරා ගාන්ධි ජාතික විවෘත විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර මූල්‍ය ක්ෂේත්‍රයේ ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධිය දිනාගත් ආචාර්ය පෙරේරා මහතා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් අලෙවිකරණ ක්ෂේත්‍රයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ සිය දෙවන විද්‍යාපති උපාධිය ද හිමිකර ගත්තේය. පාරිභෝගික චර්යාවන් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව එම විශ්වවිද්‍යාලයෙන්ම ඔහු හිමිකර ගත්තේය. 1998 වර්ෂයේදී ජර්මනියේ ක්ලාස්නොෆ් ඇකඩමිය විසින් පවත්වන ලද රාජ්‍ය නොවන සංවිධාන කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවද හැදෑරූ ඔහු කොරියාවේ KESEI විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද හිමිකර ගත්තේය.

සිය වෘත්තීය දිවිය තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක විවිධ තනතුරු දරමින් සේවයකර ඇති ආචාර්ය පෙරේරා මහතා දැනට සිවිල් ගුවන්සේවා අධිකාරියේ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලයේ සහ සී/ස ප්‍රයිඩ් ඔෆ් සිලෝන් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස ද ක්‍රියා කරයි. ඊට අමතරව, ඕස්ට්‍රේලියාවේ AKSAP ඉන්ටර්නැෂනල් ආයතනයේ ශ්‍රී ලංකා නියෝජිතයා වන්නේ ද ආචාර්ය පෙරේරා මහතා ය.

2015 නොවැම්බර් මාසයේදී ආචාර්ය පෙරේරා මහතා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

කේ.ඩී.එන්. රංජිත් අසෝක මයා
අධ්‍යක්ෂ

රන්ජිත් අසෝක මහතා දැනට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කරයි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යේෂ්ඨ නිලධාරියෙක් වන ඒ මහතා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වීමට පෙර මහා භාණ්ඩාරය නියෝජනය කරමින් ශ්‍රී ලංකා DFCC බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කර ඇත.

සිය දීර්ඝ සේවා කාලය තුළ රාජ්‍ය අංශයේ විධායක තනතුරු ගණනාවක් දරා ඇති අසෝක මහතා රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, මිනිස්බල හා රැකියා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු සහකාර අධ්‍යක්ෂ, මාතර දිස්ත්‍රික්කයේ මැදගම ප්‍රාදේශීය ලේකම්, රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් වශයෙන් කටයුතු කර ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන්ම ආර්ථික සංවර්ධනය පිළිබඳව සහ බලය බෙදීම හා පළාත් පාලන අධ්‍යයනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා දෙකක් ද,පශ්චාත්උපාධි කමනාකරණ ආයතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති (MBA) උපාධිය ද, ජපානයේ යෝකොහාමා ජාතික විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාපති (MSC) උපාධිය ද හිමිකර ගත්තේය.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ජ්‍යේෂ්ඨ උපදේශයෙක් ලෙස සේවයකර ඇති රන්පිත් අසෝක මහතා 2017 වසරේ නොවැම්බර් මාසයේ සිට මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබ ඇත.

ආයතනික කළමනාකාරිත්වය

අසුන්ගෙන වමේ සිට දකුණට

එම්.ඒ. බොනිෆස් සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකුකරණ මෙහෙයුම්, **එන්. වසන්ත කුමාර් මයා** - ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී,
සේ.බී. රාජපක්ෂ මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ, **පී.බී.ආර්.පී. ගුණවර්ධන මයා** - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ව්‍යාපාරික බැංකුකරණ

සිටගෙන වමේ සිට දකුණට

චාන්දනී වේරපිටිය මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - උපායමාර්ගික සැලසුම්කරණ සහ කාර්යසාධන කළමනාකරණ
එස්.ඒ.ආර්.එස්. සමරවීර මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්, **රොහාන් පතිරගේ මයා -** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
පී.පී.ආර්. ජයසිංහ මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - ක්‍රියාවලි කළමනාකරණ හා තත්ත්ව ආරක්ෂණ, **ක්ලයිව් ගොන්සේකා මයා -** ප්‍රධානී - භාණ්ඩාගාර හා ආයෝජන බැංකුකරණ,
බී. එම්. ප්‍රේමනාත් මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු සහය සේවා, **ලයනල් ගලගෙදර මයා -** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය,
පී.එස්.ඒ. එදිරිසිංහ මයා - ප්‍රධානී - තොරතුරු තාක්ෂණ, **සුනිල් වන්නිආරච්චි මයා -** නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම්, **ඩබ්ලියු.කේ.එස්.බී. නන්දන මයා -** ප්‍රධාන නීති නිලධාරී,
එස්. ප්‍රතාපසිංහ මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ජාත්‍යන්තර බැංකුකරණ,
ආර්. කොඩිතුවක්කු මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඩිජිටල්කරණ, **අරුණි ගුණතිලක මහත්මිය** -ප්‍රධානී ආයතනික බැංකුකරණය , **අසාම් ඒ. අහමට් මයා -** මූල්‍ය ප්‍රධානී,
ඊ.ඒ.ඩී.පේ. ප්‍රියශාන්ත මයා - ප්‍රධාන අභ්‍යන්තර විගණනක, **එම්.ඒ.ඩී.එම්. කරුණාරත්න මිය -** අතිරේක ප්‍රධාන නීති නිලධාරිනී

එන්. වසන්ත කුමාර් මයා
ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි

එන්. වසන්ත කුමාර් මහතා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙක් වන අතර වෘත්තීයමය භාණ්ඩාගාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙක් ද වේ. 2001 මාර්තු මාසයේ මහජන බැංකුවට එක්වූ ඒ මහතා ඊට පෙර වසර ගණනාවක් කොළඹ ANZ ග්‍රින්ඩ්ලේස් බැංකුවේ භාණ්ඩාගාරික වශයෙන් සේවය කළේය.

පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම, සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම, සී/ස පීපල්ස් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම, සී/ස පීපල්ස් ලීසින් හැව්ලොක් ප්‍රොපර්ටි සමාගම, ණය තොරතුරු කාර්යාංශය, ජාතික ගෙවීම් සභාව, සී/ස ලංකා මූල්‍ය සේවා කාර්යාංශය සහ බංග්ලාදේශයේ සීමාසහිත ලංකා ඵලායන්ස් ෆිනෑන්ස් සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයෙක් වශයෙන් ක්‍රියා කරන ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක සභා සාමාජිකයෙක් ද වේ.

වසන්ත කුමාර් මහතා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා ෆොරෙක්ස් සංගමයේ සභාපති ධුරයද හෙබවිය.

ජී.බී.ආර්.පී. ගුණවර්ධන මයා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -
ව්‍යාපාරික බැංකුකරණ

රසිත ගුණවර්ධන මහතා ජ්‍යෙෂ්ඨ මූල්‍ය නිලධාරියෙක් ලෙස මහජන බැංකුවේ සේවයට වර්ෂ 1987 දී එක්වූ අතර මේ දක්වා වසර 30ක සේවා කාලයක් සපුරා ඇත.

මූල්‍ය, කාර්යසාධන කළමනාකරණය, සංයුක්ත හා වාණිජ ණය, භාණ්ඩාගාර මෙහෙයුම්, ණය පාලනය සහ අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රවල හසල අත්දැකීම් ඔහු ලබා ඇත.

මහජන බැංකුවට සම්බන්ධවීමට පෙර ගුණවර්ධන මහතා සංචාරක හා හෝටල්, වැවිලි කළමනාකරණය සහ ඉදිකිරීම් ආදී ක්ෂේත්‍ර ආවරණය කරමින් රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම සේවා අත්දැකීම් ලබා තිබුණි.

රසිත ගුණවර්ධන මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (එක්සත් රාජධානිය) ආශ්‍රිත සාමාජිකයෙක් ද වේ.

කේ.බී. රාජපක්ෂ මයා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -
පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ

රාජපක්ෂ මහතා මහජන බැංකුවේ පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ, ක්‍රියාවලි කළමනාකරණ හා තත්ත්ව සහතිකකරණ සහ බැංකුව ඩිජිටල්ගත කිරීමේ කාර්යයන් භාරව ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා වේ. 1987 වර්ෂයේ දී කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස බැංකුවට බැඳුණු ඒ මහතා බැංකුවේ වසර 31ක සේවා අත්දැකීම් ලැබූ පරිනත නිලධාරියෙකි.

රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී දෙවන පෙළ ගෞරව උපාධියක් ලබා සිටින රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙක් ද වන අතර නීතිඥයෙක් මෙන්ම ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාධාරියෙක් සහ කැළණිය විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙක් ද වේ.

බැංකුවේ ශාඛා ජාලය තුළ විවිධ කළමනාකරණ මට්ටම්වල මෙන්ම ආයතනික බැංකුකරණ අංශයේ සේවය කිරීමෙන් පෘථුල අත්දැකීම් ලබා ඇති රාජපක්ෂ මහතා දැනට මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ වශයෙන් සේවය කරයි.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද සේවය කරන ඒ මහතා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ විකල්ප අධ්‍යක්ෂවරයෙක් ලෙස ද, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස ද, කෘෂිකාර්මික හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කරයි. රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ පාලක සභා සාමාජිකයෙක් ද වේ.

එම්.ඒ. බොනිෆස් සිල්වා මයා
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -
බැංකුකරණ මෙහෙයුම්

1987 වසරේදී බැංකුවේ සේවයට එක්වූ සිල්වා මහතා බැංකු මෙහෙයුම් පිළිබඳව හසල ඥානයක් සහ පෘථුල අත්දැකීම් සතු නිලධාරියෙකි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - බැංකු මෙහෙයුම් වශයෙන්, එක් එක් අංශයේ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම සඳහා වෙන් වෙන් වශයෙන් පත්කළ අංශ ප්‍රධානීන් යටතේ ක්‍රියාත්මක වන නාලිකා කළමනාකරණ අංශය, 737ක් වූ ශාඛා ජාලය සහ 500ක් ඉක්මවන ඒටීඑම් යන්ත්‍ර, සීඩීඑම් යන්ත්‍ර හා Kiosks යන්ත්‍ර ආදියෙන් සමන්විත අතිවේක ජාලයේ නියාමන අංශය, අලෙවිකරණ හා පර්යේෂණ අංශය සහ තොරතුරු තාක්ෂණ හා සහායක සේවා අංශය යන ප්‍රධාන අංශ හතරේ කාර්යයන් අධීක්ෂණය කිරීමේ වගකීම සිල්වා මහතා උසුලයි.

ශාඛා කළමනාකාර තනතුරේ පටන් ප්‍රාදේශීය කළමනාකාර දක්වාත්, කලාප සහකාර සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරේ සිට ඔහු දැනට දරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - බැංකු මෙහෙයුම් තනතුර දක්වා වූ විවිධ තනතුරු දරමින් ව්‍යාපාරික බැංකුකරණය කළමනාකරන කටයුතු හා සම්බන්ධ සියලුම මට්ටම්වල අත්දැකීම් රාශියක් සිල්වා මහතා ලබාගෙන ඇත.

ඔහු විශේෂඥතාව දක්වන විෂය ක්ෂේත්‍රය පිළිබඳව විස්තීර්ණ දේශීය හා විදේශීය පුහුණුව හා අත්දැකීම් ලබා ඇති අතර පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ (ශාස්ත්‍රවේදී) උපාධිධරයෙක් වේ. ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරණ ආයතනයේ සුදුසුකම් (AIB) ලබා ඇති සිල්වා මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබා ඇත.

චාන්දනී වේරපිටිය මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - උපායමාර්ගික සැලසුම්කරණ සහ කාර්යසාධන කළමනාකරණ

බැංකු කාර්යයන්හි කැපී පෙනෙන දායකත්වයක් ලබා ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී - උපායමාර්ගික සැලසුම්කරණ සහ කාර්යසාධන කළමනාකරණ තනතුර දරන චාන්දනී වේරපිටිය මහත්මිය විසින් සමස්ත බැංකු කාර්යයන් හි කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලබා ඇති ඇය කාරයශූර, ප්‍රතිඵල හඹායන, ජ්‍යෙෂ්ඨ බැංකුකරුවෙක් වන අතර ලිපි රචිකාවියක්/ප්‍රකාශිකාවක් වශයෙන් ද, ජාත්‍යන්තර බැංකු වැඩමුළු ආදියෙහි වැඩසටහන් ඉදිරිපත් කරන්නියක්/සාකච්ඡා මඩුලු සාමාජිකාවක් වශයෙන් ද කතිකාචාර්යවරියක් වශයෙන් ද වසර 31ක කාලයක් පුරා බොහෝ දුෂ්කර කාර්යයන් ඉටුකරමින් බැංකු කර්මාන්තයට විශාල දායකත්වයක් ලබා දී ඇත. සංයුක්ත

හා ආයතනික බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, ව්‍යාපෘති සඳහා ණයලබා දීම, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය, ව්‍යාපෘති ණයදීම් මහා පරිමාණ ණය ආපසු අයකරගැනීම, කල්බදු, ශාඛා මෙහෙයුම්, සහ නාලිකා කළමනාකරණය ඇතුළු විවිධ ක්‍රියාකාරකම් වලදී ඇය තම දායකත්වය ලබා දුන්නාය.

1985 වසරේදී ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ද සමඟ හිමිකරගැනීමෙන් අනතුරුව 1987 වර්ෂයේ කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස බැංකුවට එක්වූ වේරපිටිය මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාපති (කළමනාකරණ) උපාධිය වසර 2000 දී හිමිකර ගත්තාය. ප්‍රාදේශීය අලෙවි කළමනාකාරිණියක් හා විගණන/බදු අධීක්ෂකවරියක් ලෙස පෞද්ගලික අංශයේ සාර්ථකව සේවය කිරීමෙන් පසුව බැංකුවේ සේවයට එක්වූ ඇය දැනට කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව හදාරමින් සිටී.

ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ නියෝජ්‍ය සභාපති, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරියක සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ කම්ටු සාමාජිකාවක් ද ලෙස එතුමිය කටයුතු කර ඇත. තවද කාන්තා වාණිජ මණ්ඩලයේ (WCIC) සාමාජිකාවක් ද වශයෙන් කටයුතු කරන ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක සභාවේ සාමාජිකාවක් ලෙස ද කටයුතු කරයි.

එස්.ඒ.ආර්.එස්. සමරවීර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්

එස්.ඒ.ආර්.එස්. සමරවීර මහතා මානව සම්පත් ප්‍රධානී වශයෙන් සේවය කරයි. කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස බැංකුවේ සේවයට බැඳුණු සමරවීර මහතා බැංකු සේවයේ වසර 30 කට අධික දීර්ඝ සේවා පළපුරුද්දක් සතු නිලධාරියෙකි. එකී සේවා කාලය තුළ ශාඛා බැංකුකරණ, සංයුක්ත බැංකුකරණ, සංවර්ධන බැංකුකරණ හා ණය ආපසු අයකර ගැනීම් ආදී ක්ෂේත්‍ර ගණනාවක සේවය කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සමඟ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා සිටින ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද ලබා ඇත.

සමරවීර මහතා දේශීය හා විදේශීය වශයෙන් ලබා ඇති අත්දැකීම් අතර කළමනාකරණ සංවර්ධන, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය කළමනාකරණය, ව්‍යාපෘති පුණරුත්ථාපනය සහ උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය ආදී ක්ෂේත්‍ර ඇතුළත් වේ.

රොහාන් පතිරගේ මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

මහජන බැංකුවේ වසර 23කට අධික සේවා කාලයක් සපුරා ඇති පතිරගේ මහතා, කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී (LLB) උපාධිය ලබා සිටින අතර නවසීලන්තයේ මැසේ විශ්වවිද්‍යාලයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා සිටී. බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හිමිකරගෙන සිටින පතිරගේ මහතා දක්ෂ නීතිඥයෙක් ද වේ.

පිපල්ස් ලීසින් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම,සී/ස පීපල්ස් ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම, සී/ස පීපල්ස් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම සහ සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම යන ආයතනවල සමාගම් ලේකම්වරයා වශයෙන් ද ඒ මහතා ක්‍රියා කරයි.

ජී.පී.ආර්. ජයසිංහ මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී -
ක්‍රියාවලි කළමනාකරණ හා තත්ත්ව ආරක්ෂණ

1987 වර්ෂයේ කළමනාකරණ අභ්‍යාසලාභිනියක ලෙස මහජන බැංකුවේ සේවයට එක්වූ වේණුකා ජයසිංහ මහත්මිය බැංකු ක්ෂේත්‍රයේ වසර 30ක් ඉක්මවූ සේවා අත්දැකීම් ලබා ඇති නිලධාරිනියකි.

සිය වෘත්තීය දිවිය තුළ, ශාඛා කළමණාකාරිනී, ජ්‍යේෂ්ඨ කලාප කළමනාකාරිනී, ප්‍රාදේශීය කළමනාකාරිනී, සහකාර සාමාන්‍යාධිකාරිනී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී (සමූපකාර හා සංවර්ධන) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී (පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ) ආදී තනතුරු මට්ටම්වලින් ශාඛා බැංකුකරණ අංශය ආවරණය කරමින් සේවය කර ඇති ජයසිංහ මහත්මිය දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී (ක්‍රියාවලි කළමනාකරණ හා තත්ත්ව ආරක්ෂණ) වශයෙන් සේවය කරයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රථම පන්තියේ වාණිජවේදී විශේෂ උපාධිධාරිනියක වන වේණුකා ජයසිංහ මහත්මිය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරණ ආයතනයේ සුදුසුකම් (AIB) සපුරා ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ යාවජීව සාමාජිකාවක් ද වේ.

ක්ලයිව් ෆොන්සේකා මයා

ප්‍රධානී - භාණ්ඩාගාර හා ආයෝජන බැංකුකරණ

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය දරන ෆොන්සේකා මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ACI Dealing Certificate විභාගයේදී විශිෂ්ඨ සාමාර්ථයක් ලබා ඇති ඒ මහතා භාණ්ඩාගාර කළමනාකරණය සම්බන්ධයෙන් වසර 24කට අධික සේවා අත්දැකීම් සහිත නිලධාරියෙකි. තවද, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ඕස්ට්‍රේලියාව) සහතිකලත් සමාජිකත්වය ද ලබා ඇත.

ඇමරිකන් එක්ස්ප්‍රස් බැංකුවේ හා ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවේ සේවය කර අනතුරුව 2002 වර්ෂයේදී මහජන බැංකුවේ සේවයට එක් වූ ෆොන්සේකා මහතා 2011 වසරේ පටන් මහජන බැංකුවේ ජ්‍යේෂ්ඨ ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙක්ව සිටී.

බී.එම්. ප්‍රේමනාත් මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
බැංකුකරණ සහායක සේවා

මහජන බැංකුවේ වසර 30කට අධික සේවා කාලයක් සපුරා ඇති ප්‍රේමනාත් මහතා කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස 1987 බැංකුවේ සේවයට එක්වූ අතර ශාඛා කිහිපයක ශාඛා කළමනාකරු ලෙස සේවය කොට පසුව සහකාර ප්‍රාදේශීය කළමනාකාර සහ ප්‍රාදේශීය කළමනාකාර තනතුරුවලද සේවය කළේය.

ප්‍රේමනාත් මහතා දැනට සේවය කරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකුකරණ සහායක සේවා) තනතුර යටතට සැපයුම්, ප්‍රවාහන, ආරක්ෂක සේවා, නඩත්තු, ඉංජිනේරු කටයුතු, ගොඩනැගිලි ඉදිකිරීම් හා පරිගනක මුද්‍රණ කටයුතු ගැනෙන අතර එමඟින් ප්‍රසම්පාදන, සැපයුම්, ගබඩා හා

තොග පාලනය, ප්‍රවාහනය සහ ආරක්ෂක කාර්ය පටිපාටි පිලිබඳව මෙන්ම ඉදිකිරීම් හා නඩත්තු අංශ පිලිබඳව ද මනා පළපුරුද්දක් ලබා ගැනීමේ අවස්ථාව උදාවී ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිතව වාණිජවේදී උපාධිය මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර්මාධ්‍ය පරීක්ෂණය (AIB Intermediate) සමත්වී ඇති ප්‍රේමනාත් මහතා, සිය බැංකුකරණ වෘත්තීය දිවිය තුළ දේශීය හා විදේශීය වැඩසටහන් ගණනාවකටම සහභාගී වී ඇත.

ලයනල් ගලගෙදර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය

ලයනල් ගලගෙදර මහතා බැංකුවේ පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ අංශය භාරව ක්‍රියා කරයි. කළමනාකරණ අභ්‍යාසලාභියෙක් වශයෙන් බැංකුවේ සේවයට එක්වූ ගලගෙදර මහතා බැංකුවේ වසර 30කට අධික සේවා කාලයකට හිමිකම් කියයි. ඔහු සතු සේවා පළපුරුද්ද පාරිභෝගික බැංකුකරණය, සංයුක්ත බැංකුකරණය, ව්‍යාපෘති මූල්‍යනය, ණය පරිපාලනය හා ආපසු අයකර ගැනීම ආදී ක්ෂේත්‍ර ආවරණය කරයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙක් වන ඒ මහතා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධියද (LLB)ලබා සිටී. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් මෙන්ම නීතිඥයෙක් වශයෙන්ද ඔහු කටයුතු කරයි.

කී.එස්.ඒ. එදිරිසිංහ මහතා

ප්‍රධානී - තොරතුරු තාක්ෂණ

තොරතුරු තාක්ෂණ ප්‍රධානී වශයෙන් 2015 පෙබරවාරි මස 2 දින බැංකුවේ සේවයට එක් වූ එදිරිසිංහ මහතා වාණිජවේදී (ප්‍රධාන විෂය තොරතුරු පද්ධති) මූලික උපාධියද, ඕස්ට්‍රේලියාවේ වෙස්ටර්න් සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් වාණිජපති උපාධියද ලබා ඇත.

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 20ක් පමණ සේවය කර ඇති එදිරිසිංහ මහතා රක්ෂණ, බැංකු සහ විදුලිසංදේශ ඇතුළු විවිධ ව්‍යාපාරික අංශවල සිය දායකත්වය ලබාදී ඇත. මහජන බැංකුවට සම්බන්ධවීමට පෙර එදිරිසිංහ මහතා සිංගප්පූරුවේ සිටිබැංක් ලිමිටඩ්හි ව්‍යාපෘති කළමනාකරණ නිලධාරියෙක් වශයෙන් සේවය කළේය. සිය වෘත්තීය දිවිය තුළ සිටිබැංක් (ඔස්ට්‍රේලියාව, සිංගප්පූරුව), AON ලිමිටඩ් ඕස්ට්‍රේලියා, සී/ස ක්ලැරිටි ඉන්ටර්නැෂනල් සමාගම, සිංගප්පූරුව, සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම ආදී ප්‍රමුඛ පෙළේ සමාගම්වල විශ්ලේෂක, වැඩසටහන් සම්පාදක, සිට ප්‍රධාන තොරතුරු නිලධාරී දක්වා තනතුරු දරා ඇත.

සුනිල් වන්නිආරච්චි මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම්

සුනිල් වන්නිආරච්චි මහතා 1987 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙක් වශයෙන් මහජන බැංකුවේ සේවයට එක්වූ අතර, ශාඛා බැංකුකරණය, කුඩා හා මධ්‍යම කර්මාන්ත ණය දීම, ජාත්‍යන්තර බැංකුකරණය, වෙළඳ මූල්‍යයනය සහ කල්බදු ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක සේවය කර ඇත. විශේෂයෙන් ණයදීම හා අක්වෙරළ බැංකු කටයුතු සම්බන්ධයෙන් වන්නිආරච්චි මහතා අත්දැකීම් රාශියක් ලබා ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති ඔහු, එම උපාධිය ලබාගැනීමෙන් පසුව රසායන විද්‍යාව පිළිබඳ ප්‍රදර්ශක හා සහකාර කථිකාචාර්යවරයෙක් වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවයට එක්විය. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ සිය ශාස්ත්‍රපති උපාධිය ලබා ගත් ඒ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද ලබා ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ බැංකුකරුවන්ගේ වෙළඳ මූල්‍ය සංගමයේ පිළිවෙලින් සභාපති හා ජ්‍යෙෂ්ඨ උප-සභාපති වශයෙන් මැතක් වන තෙක් ක්‍රියාකළ අතර 2017 පෙබරවාරි 01 දින සිට වසර තුනක කාලයක් සඳහා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය ද උසුලයි.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ තාක්ෂණික ඇගයීම් කමිටුව ආදී බාහිර කමිටුවල හා ප්‍රසම්පාදන, විනය, මිල පිළිබඳ සම්මුති සාකච්ඡා, කාර්ය මණ්ඩල මාරුකිරීමේ සහ සේවක ගැටලු සඳහා සහන සැලසීමේ ආදී අභ්‍යන්තර කමිටුවල ද සේවය කරමින් ඒ මහතා සිය දැනුම, කුසලතා හා පළපුරුද්ද වර්ධනය කරගෙන ඇත.

ඩබ්ලියු.කේ.එස්.බී. නන්දන මහතා

ප්‍රධාන නීති නිලධාරී

නීතිඥ, ඩබ්ලියු.කේ.එස්.බී. නන්දන මහතා, කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී (L.L.B.) උපාධිධාරියෙකි. බැංකු ක්ෂේත්‍රයේ මෙන්ම නීති ක්ෂේත්‍රයේ ද වසර 39කට අධික සේවා පළපුරුද්දක් ලබා ඇති නන්දන මහතා සිය සේවා කාලය තුළ බැංකුවේ ජාත්‍යන්තර අංශයේ, ගාල්ල ප්‍රාදේශිකයේ, බස්නාහිර කලාප -1, විශේෂ වත්කම් ඒකකයේ සහ නීති දෙපාර්තමේන්තුවේ සේවය කර ඇත.

සමාගම් නීතිය, වාණිජ නීතිය සහ කම්කරු නීතිය පිළිබඳව හසල දැණුමක්ලබා ඇති නන්දන මහතා බැංකුකරණය හා ණය ආපසු අයකර ගැනීම පිළිබඳව මනා පලපුරුද්දක් සහිත වූවෙකි. සිය සේවා කාලය තුළ නන්දන මහතා විශේෂයෙන් කළමනාකරණය හා නායකත්ව සංවර්ධනය සහ ආසියාවේ නීති පද්ධති පිළිබඳව දේශීය මෙන්ම විදේශීය වැඩසටහන් ගණනාවකවට සම්බන්ධවී ඇත.

එස්. ප්‍රතාපසිංහ මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ජාත්‍යන්තර බැංකුකරණ

1990 වර්ෂයේදී මහජන බැංකුවේ සේවයට එක්වූ ශෝභානි ප්‍රතාපසිංහ මහත්මිය වසර 27කට අධික සේවා පළපුරුද්දක් ලබා ඇත. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් (ACMA/CGMA) වන ප්‍රතාපසිංහ මහත්මිය, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (FCMA) සාමාජිකාවකි. වෙස්ටර්න් සිඩ්නි (ඔස්ට්‍රේලියා) විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනපති (MBA) උපාධිය ලබා ඇති ඒ මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MAFE) උපාධිය ද ලබා ඇත.

කුඩා හා මධ්‍යම ව්‍යවසාය ව්‍යාපෘති මූල්‍යයනය, කළමනාකරණ/මූල්‍ය ගිණුම්කරණය, තොරතුරු කළමනාකරණය, කාර්යසාධන කළමනාකරණය, සංයුක්ත බැංකුකරණය, වාණිජ ණය සහ ජාත්‍යන්තර බැංකුකරණය යන ක්ෂේත්‍රවල පෘථුල අත්දැකීම් ලබා ඇත.

මහජන බැංකුවේ සේවයට එක්වීමට පෙර රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම සේවය කර ඇති

ප්‍රතාපසිංහ මහත්මිය, පිපල්ස් මර්චන්ට් බැංකුවේ සහ සී/ස ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ සේවය කිරීම තුළින් වෙළඳ බැංකුකරණය පිළිබඳ මනා දැනුමක් ලබාගෙන ඇත.

ආර්. කොඩිතුවක්කු මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ඩිජිටල්කරණ

රංජිත් කොඩිතුවක්කු මහතා සතු වසර 35ක් තරම් දිගු බැංකු සේවා කාලය තුළ ශාඛා බැංකුකරණය පාරිභෝගික බැංකුකරණය, වාණිජ බැංකුකරණය, සංයුක්ත බැංකුකරණය, අක්වෙරළ බැංකුකරණය, සහ ජාත්‍යන්තර බැංකුකරණය යන ක්ෂේත්‍රවල සේවය කරමින් අත්දැකීම් රාශියක් ලබා ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති (MBA) උපාධිය ලබා ඇති ඒ මහතා, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබා ඇත.

අරුණි ගුණතිලක මිය

ප්‍රධානී - ආයතනික බැංකුකරණ

වසර 24කට අධික කාලයක් ජාත්‍යන්තර හා ප්‍රාදේශීය වශයෙන් බැංකු කටයුතුවල නිරත වීම තුළින් අරුණී ගුණතිලක මහත්මිය සංයුක්ත බැංකුකරණය, වාණිජ බැංකුකරණය, කුඩා හා මධ්‍යම ව්‍යවසාය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය, සහ විගනනය යන අංශ පිළිබඳව හසල අත්දැකීම් ලබා ඇත. මහජන බැංකුවට එක්වීමට පූර්වාසන්නයෙන් ගුණතිලක මහත්මිය, සිංගප්පූරුවේ ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවේ වාණිජ බැංකුකරණ ණය අංශයේ ප්‍රධානී වශයෙන් සේවය කළ අතර ශ්‍රී ලංකා ස්ටැන්ඩඩ් චාර්ටඩ් බැංකුවේ අවදානම් පිළිබඳ ප්‍රධාන නිලධාරිනිය වශයෙන් ද සේවය කළාය. ගුණතිලක මහත්මිය එක්සත් ජනපදයේ හාවර්ඩ් නීති පාසලේ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියක වන අතර කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී (ගෞරව) උපාධිධාරිනියක් ද වේ.

බැංකු අංශයේ අවදානම් පිළිබඳ වෘත්තීයවේදීන්ගේ සංගමයේ ආරම්භක සාමාජිකාවක් වන ගුණතිලක මහත්මිය, කර්මාන්ත හා වාණිජ කාන්තා මණ්ඩලයේ විධායක කමිටු සාමාජිකාවක් වන අතර ලංකා වාණිජ මණ්ඩලයේ මූල්‍ය මෙහෙයුම් කමිටු සාමාජිකාවක් ද වේ. සිංගප්පූරු අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් වන ගුණතිලක මහත්මිය, සිංගප්පූරුවේ හාවර්ඩ් සමාජයේ විධායක කමිටුවේද ක්‍රියාකළ අතර කොළඹ ජාත්‍යන්තර පාසලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂිකාවකි. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ හා උපාධි අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යවරියක් ලෙස ද කටයුතු කළාය.

අසාමි ඒ. අහමට් මහතා

මූල්‍ය ප්‍රධානී

2017 වර්ෂයේ ජනවාරි මස මහජන බැංකුවේ සේවයට එක් වූ අහමට් මහතා සතුව උපායමාර්ගික මූල්‍ය කළමනාකරණය, විකල්ප ආයෝජන, සහ ව්‍යාපාර අවදානම් ආදී ක්ෂේත්‍රවල දේශීය හා විදේශීය වශයෙන් වසර 16ක් පුරා ලබාගත් බොහෝ අත්දැකීම් ඇති අතර ඔහුගේ පූර්වගාමී සේවා යෝජකයන් අතර අතිවිශාල බහු-ජාතික වෘත්තීය සේවා සම්පාදක ආයතන සහ සුපිරි ගණයේ අදාළ එක් එක් වෙළඳපොලවලට සේවා සපයන ප්‍රමුඛ පෙළේ ආයතන ඇතුළත් වේ. (එක්සත් රාජධානියේ)වරලත් සුරුකුම් හා ආයෝජන ආයතනයේ, (එක්සත් රාජධානියේ) වරලත් කළමනාකරණ ගණාකාධිකාරිවරුන්ගේ ආයතනයේ, (එක්සත් රාජධානියේ) සහතිකලත් ගණාකාධිකාරිවරුන්ගේ ආයතනයේ, (ඕස්ට්‍රේලියාවේ) සහතිකලත් වෘත්තියේ නියුතු ගණාකාධිකාරිවරුන්ගේ සංගමයේ, (එක්සත් රාජධානියේ) අවදානම් කළමනාකරණ ආයතනයේ සහ (එක්සත් රාජධානියේ) වරලත් ණය කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙක් වන අහමට් මහතා එම සාමාජිකත්වයන්ගෙන් සිය වෘත්තීය දිවිය වර්ණවත් කරගෙන ඇත.

ඊ.ඒ.ඩී.ජේ. ප්‍රියශාන්ත මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

ශ්‍රී ලංකා වරලත් ගණාකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් වන ජනිත ප්‍රියශාන්ත මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් මෙන්ම ඕස්ට්‍රේලියාවේ සහතිකලත් කළමනාකරණ ගණාකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහතිකලත් සාමාජිකයෙක් ද වන අතර දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ද සහිත වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙක් ද වේ.

1988 වර්ෂයේ අපනයන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සිය වෘත්තීය දිවිය ආරම්භ කළ ප්‍රියශාන්ත මහතා එම වර්ෂයේදීම විගණන පරීක්ෂකයෙක් වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවට බැඳුණි. 1991 වර්ෂයේදී රජයේ ගණකාධිකාරී සේවයට එක්වූ ඒ මහතා කළමනාකරණ අභ්‍යාසලාභියෙක් ලෙස 1994 වර්ෂයේදී බැංකුවේ සේවයට එක්වන තෙක්, රජයේ විවිධ දෙපාර්තමේන්තු කිහිපයක ගණකාධිකාරිවරයෙක් ලෙස සේවය කළේය. බැංකුවේ ශාඛා ජාලය තුළ වසර හයක් සේවය කිරීමෙන් අනතුරුව, 2000 වර්ෂයේදී ප්‍රියශාන්ත මහතා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට සම්බන්ධවූ අතර දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන් ආදියට එක්වෙමින් අභ්‍යන්තර විගණනය පිළිබඳ හසල අත්දැකීම් ලබා ඇත.

එම්.ඒ.ඩී.එම්. කරුණාරත්න මිය

අතිරේක ප්‍රධාන නීති නිලධාරිනී

බැංකුකරණය හා රක්ෂණය පිළිබඳ පශ්චාත් නීතිඥ ඩිප්ලෝමාවක් ලබා සිටින මුදිතා කරුණාරත්න මහත්මිය නීතිඥවරියක් ලෙස වසර 30කට අධික සේවා පළපුරුද්දක් ලබා ඇති අතර බැංකුකරණ නීති විෂය සඳහා න්‍යාගය ද (2007) නිමිකර ගත්තාය. නීතිඥවරියක් ලෙස දිවුරුම්දීමත් සමඟ අභාවප්‍රාප්ත ජනාධිපති නීතිඥ ජේ.ඊ.පී. දැරනියගල මහතාගේ නීතිඥ සමාගම සමඟ එක්වූ ඇය පසුව බ්‍රවුන්ස් සමූහ සමාගමේ සහකාර ප්‍රධාන නීති නිලධාරී හා සමාගම් ලේකම් තනතුරට පත් විය.

1992 දී සහකාර නීති නිලධාරිනියක ලෙස මහජන බැංකුවට බැඳුණු කරුණාරත්න මහත්මිය කළුතර හා ගාල්ල ප්‍රාදේශීය කාර්යාලවල, ප්‍රධාන කාර්යාලයේ - නීති දෙපාර්තමේන්තුවේ සහ ඉඩම් බේරුම්කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ලෙස සේවය කළාය. 2006 වසරේදී ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී ලෙස උසස්වීම් ලද කරුණාරත්න මහත්මිය ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනිය ලෙස ප්‍රධාන කාර්යාලයේ සහ උතුරු හා උතුරු-නැගෙනහිර පළාත් නීති දෙපාර්තමේන්තුවේ නෛතික කටයුතු අධීක්ෂණය කළාය.

අදාළ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ශ්‍රී ලංකාවේ බනිජතෙල් හා ගෑස් කර්මාන්තයේ නියාමන අධිකාරිය වන බනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ නීති හා ඉඩම් වශයෙන් 2007 වසරේදී සේවයට එක්වූ ඇය, එම අවදියේ බනිජතෙල් සම්පත් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ද කටයුතු කළාය. නීතිඥවරියක් ලෙස වසර 30කට අධික සේවා කාලය තුළ කරුණාරත්න මහත්මිය දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු ආදියට එක්වෙමින් හසල අත්දැකීම් ලබා ඇත.

විධායක කළමනාකාරීත්වය

ඉදිරි පෙළ වමේ සිට දකුණට

එස් ඩබ් ඒ ඩී එස් කල්යානී මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණ, **එච් සී ප්‍රනාන්දු මහතා** - සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාර පසුපෙළ සේවා
පී ආර් මදුරාවල මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - විගණන, **එන් සී මුදලිගේ මහත්මිය** - සහකාර සාමාන්‍යාධිකාරිණී - මානව සම්පත් සංවර්ධන
වී කේ නාරන්ගොඩ මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - ආයතනික බැංකුකරණය I, **ඒ එස් ලියනාරච්චි මහත්මිය** - සහකාර සාමාන්‍යාධිකාරිණී - ණය පාලන

පසු පෙළ වමේ සිට දකුණට

ඩී වයි එස් මෙන්ඩිස් මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - උපායමාර්ගික සැලසුම්කරණ සහ කාර්යසාධන කළමනාකරණ
පී ආර් එස් ජයතිස්ස මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් - පරිපාලන. **පී එස් පේ කුරුකුලසූරිය මහත්මිය** - සහකාර සාමාන්‍යාධිකාරිණී - ණය පරිපාලන - ශාඛා
කේ එන් සේනාරත්න මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - (ණය ඒකකය II) - ආයතනික බැංකු අංශය, **ටී ඩී ඩී ඉසෙඩ් ගුණවර්ධන මහතා** - සහකාර සාමාන්‍යාධිකාරී - විමර්ශන සහ විමසීම්

ඉදිරි පෙළ වමේ සිට දකුණට
පී එම් ආර් පී විජේරත්න මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරි, - අවදානම් කළමනාකරණ, **අයි ඩී එස් එස් ඉල්ලුක්කුඹුර මහතා** - සහකාර සාමාන්‍යාධිකාරි - පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණ
යූ එස් ගර්ටී මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - ණය, **ඒ එස් එම් වී කුමාරසිරි මහතා** - සහකාර සාමාන්‍යාධිකාරි - වෙළඳ මූල්‍ය
එල් විතාන මහතා - සහකාර සාමාන්‍යාධිකාරි - ව්‍යවසායකත්ව බැංකුකරණ, **එස් එන් බී එම් ඩබ් නාරායන මහතා** - සහකාර සාමාන්‍යාධිකාරි - කුඩා හා මධ්‍යම ව්‍යවසාය

පසු පෙළ වමේ සිට දකුණට
එන් ආර් විජේරත්න මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී, - එතෙර පාරිභෝගික සේවා සහ මූල්‍ය ආයතන, **යූ අලිමොහොමඩ් මහතා** - සහකාර සාමාන්‍යාධිකාරි - ණය අයකරගැනීම්
එම් කේ ඩී එස් ගුණරත්න මහතා - සහකාර සාමාන්‍යාධිකාරි - නාලිකා කළමනාකරණ (ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මෙහෙයුම්)
කේ ඩී කරුණාතිලක මහතා - සහකාර සාමාන්‍යාධිකාරි - නාලිකා කළමනාකරණ, (කලාප I) **පී ඒ කේ පතිරන මහත්මිය** - සහකාර සාමාන්‍යාධිකාරිණී - මූල්‍ය හා ගිණුම්

ඉදිරි පෙළ වමේ සිට දකුණට
කේ පේ විජේවර්ධන මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - කාඩිපත්, **ආර් පී එන් ප්‍රේමලාල් මහත්මිය** - නියෝජ්‍ය ප්‍රධානී, මූල්‍ය
එච් එල් එස් එස් සේනානායක මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - අනකූලතා, **ඒ දිසානායක මහතා** - ප්‍රධානී - යටිතල පහසුකම් හා මෙහෙයුම්
එම් බී ඒ කේ බී මුද්දුව මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරිණී - නාලිකා කළමනාකරණ, **ඒ යූ එල් ඒ අන්සාර් මහතා** - සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ හා පර්යේෂණ

පසු පෙළ වමේ සිට දකුණට
කේ ඒ නිහාල් මහතා - වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණය හා සේවා පාලන, **කේ ඩබ් එම් පේ සේනාධීර මහත්මිය** - නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී
වයි පී කේ තෙන්නකෝන් මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිණී **ටී පී එස් පී කුමාරසිරි මහතා** - වැඩබලන සහකාර සාමාන්‍යාධිකාරී - පීපල්ස් කාඩිපත් මධ්‍යස්ථානය
මේජර් ජෙනරාල් එල් බී ආර් මාර්ක් (විශ්‍රාමික) - ආරක්ෂක ප්‍රධානී.

ආයතනික පාලනය

"ආයතනික පාලනය යනු සමාගම් මෙහෙයවනු ලබන හා පාලනය කරනු ලබන ක්‍රමවේදයයි" (කැඩ්බරි වාර්තාව, 1992). බැංකුවේ තීරණ ගනු ලබන ප්‍රධාන අංශය වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් ම නියාමනය වූ කර්මාන්තයක් තුළ පාර්ශ්වකරුවන්ට දිගුකාලීන වටිනාකමක් ලබා දීමේ ලා අත්‍යවශ්‍ය සාධකයක් වන ආයතනික පාලනයේ ඉහළ ප්‍රමිති පවත්වා ගැනීම සඳහා කැප වී සිටී.

යහපත් ව්‍යාපාරික ආචාරධර්ම, නිවැරදි ප්‍රතිපත්ති සහ සඵලදායී හා කාර්යක්ෂම අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රශස්ත ආයතනික පාලනයෙහි ප්‍රමුඛ අංගයන් වේ. ගෝලීයකරණය, නියාමන රීති හා සීමා ලිහිල් කිරීම සහ තාක්ෂණික දියුණුව තුළින් සිදුවන ගතික වෙනස්වීම් කරණකොට, පාර්ශ්වකරුවන් සඳහා තිරසාර වටිනාකම් නිර්මාණය කිරීම පිණිස නවෝත්පාදනය හා උත්තනය ප්‍රවර්ධනය කිරීමට ප්‍රමාණවත් නම්‍යතාවක් පවත්වාගෙන යමින් අදාළ නීති හා නියාමනයන්ට අනුකූලතාව සහතික කිරීම අරමුණු කරගත් කාර්යශූර කාර්ය පද්ධති බැංකු විසින් ක්‍රියාවට නැංවීම අනිවාර්ය වේ.



60 සහ 61 පිටුවල පිළිවෙලින් පළවන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශනය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන සම්බන්ධයෙන් සිය සහතිකය ලබාදෙන විගණකාධිකාරිවරයා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලත් වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනතේ නියෝගය කෙරෙහි වන අනුකූලතා මට්ටම ද සහතික කරයි.

මහජන බැංකුවේ පාලන රාමුව පහත විස්තර කර ඇත:

ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩලයක් (අ.1 මූලධර්මය)

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන අතර, 22 සහ 23 පිටුවල විස්තර දැක්වෙන රාජ්‍ය සේවයේ දක්ෂ නිලධාරීන්, වෘත්තිකයන්, විද්වතුන් සහ ව්‍යවසායකයන්ගෙන් සැදුම්ලත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දසදෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. බැංකුවේ උපායමාර්ගික මෙහෙයුම සම්පාදනය කිරීමේ සහ උපායමාර්ගික අරමුණු සපුරා ගැනීම පහසු කිරීම සඳහා පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති හා ක්‍රියාවලි සැකසීමේ සාමූහික වගකීම ඔවුහු උසුලති.

උපායමාර්ගික අරමුණු සාක්ෂාත්කර ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ වගකීම ද අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන ආයතනික කළමනාකරණ කණ්ඩායම අධීක්ෂණය කිරීමේ වගකීම ද ඊට ඇතුළත් වේ.

පාලන ව්‍යුහය

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී විධායක කර්තව්‍යයන්හී මූලිකයා වන අතර, උපායමාර්ගික අරමුණු සම්බන්ධයෙන් ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. සිය අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥතාව සහිත පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වන පළපුරුදු ආයතනික කළමනාකාරිත්වයක සහාය ඔහුට හිමිවේ. 36 වැනි පිටුවේ දැක්වෙන විශේෂිත කාර්යයන් පිළිබඳ සාමූහික වගකීම ඉටුකිරීම පහසුකරවන පරිදි සංවිධාන ව්‍යුහයේ මුඛ්‍ය කාර්යභාරයන් කළමනාකරණ කමිටුව ඉටුකරයි.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවේ කාර්යයන් පහත සාරාංශ කර දක්වනු ලැබේ.

අනු කමිටුව	සංයුතිය සහ සහභාගි වන සෙසුපිරිස	අධීක්ෂණ වගකීම
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් • ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී	• ප්‍රතිපත්ති සම්පාදනය • මිනිස් බල සැලසුම් කිරීම • බඳවා ගැනීම්, සේවක ප්‍රතිලාභ, සේවා දීර්ඝ කිරීම් සහ ආයතනික හා විධායක කළමනාකරණය, සේවානියුක්ති ගිවිසුම් අනුමත කිරීම
අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් • ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී • නි.සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ)	• නියාමන අවශ්‍යතාවලට සහ කර්මාන්ත යහ භාවිතාවට අනුකූලව අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සම්පාදනය • බැංකුවේ අවදානම් නැඹුරුව නියාමනය කිරීම • අවදානම් දර්ශක සහ අවදානම් කළමනාකරණය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග අධීක්ෂණය
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් • ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී ආරාධනය මත සහභාගීවේ.	• ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පිරිස් තේරීමේ/පත්කිරීමේ ක්‍රියාපටිපාටිය අනුගමණය කිරීම • ඉහත තනතුරු වලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා තේරීම් නිර්ණායක නියම කිරීම • අතිරේක/නව විශේෂ ප්‍රාගුණ්‍ය අවශ්‍යතා සමාලෝචනය කිරීම
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් • ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී • ජේ.නි.සාමාන්‍යාධිකාරී (ව්‍යාපාරික බැංකුකරණ) • නි.සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) • භාණ්ඩාගාර සහ ආයෝජන බැංකුකරණ ප්‍රධානි	• මාර්ගෝපදේශ සැළකීම සහ ආයෝජන බැංකුකරණ ඒකකයේ කාර්යසාධන සමාලෝචනය, • ආයෝජන බැංකු ව්‍යූහය, කොටස් ගණුදෙනු සීමා, නව ආයෝජන නිපැයුම්, තැරැව්කරුවන් නිර්දේශ කිරීම්, හුවමාරු අවස්ථා සහ තොරතුරු තාක්ෂණ පද්ධති කාලීන සමාලෝචනය
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්	• අභියෝග හා තරඟය ජය ගැනීමේ උපායමාර්ග සැකසීම සහ බැංකුවේ තොරතුරු තාක්ෂණ උපායමාර්ගය මෙහෙයවීමේ ප්‍රතිපත්ති දිශානතින් සැපයීම
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් • නි.සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) නි.සාමාන්‍යාධිකාරී (අනුකූලතා) සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක ආරාධනය මත සහභාගිවේ.	• මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති සමාලෝචනය • මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම • ශාඛා ජාලය පුරා යහභාවිතයන් හා ධනාත්මක තත්ත්ව සහතිකය සන්නිවේදනය කිරීම සහ දිරිගැන්වීම
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් • ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී	• ණය ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කාලීනව සමාලෝචනය කිරීම • විශේෂිත කාණ්ඩවලට පවරන ලද සීමාවලට වැඩියෙන් සහ ඉහළින් ණය පහසුකම් සඳහා බලය පැවරීම
අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC)	• විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් • ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී • නි.සාමාන්‍යාධිකාරී (උපායමාර්ගික සැලසුම්කරණ හා කාර්යසාධන කළමනාකරණ)	• උපායමාර්ගින සැලැස්ම සම්පාදනය කිරීම හා කාලීනව සමාලෝචනය කිරීම • ව්‍යාපෘති මූලිකයන් විසින් උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සියලුම අනුකමිටුවල ලේකම් වශයෙන් ද කටයුතු කරයි.

තවද, බැංකුවේ මෙහෙයුම් සම්බන්ධයෙන් වැදගත් යැයි සැලකෙන කරුණු පිළිබඳව වඩාත් හොඳින් අවබෝධකර ගැනීම, අර්ථවත් සාකච්ඡාව සහ සුසංවාදය තුළින් දැනුවත් තීරණ ගැනීම පහසු කරවීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමුඛ කළමනාකාරවරුන්ගෙන් සමන්විත වන කළමනාකරණ කමිටු ස්ථාපනය කරනු ලැබ ඇත.

කළමනාකරණ කමිටු	සංයුතිය	පරමාර්ථය සහ කාර්යයන්
මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC)	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ අවදානම් කළමනාකරණ, පුද්ගල බැංකුකරණ, ආයතනික බැංකුකරණ, භාණ්ඩාගාර, විමර්ශන/විගණන, අනුකූලතා සහ මූල්‍ය යන දෙපාර්තමේන්තු වල ප්‍රමුඛ සාමාජිකයන්	අධ්‍යක්ෂ මාණ්ඩලිය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) නියෝග වලට අනුකූලව, ණය, වෙළඳපොල සහ මෙහෙයුම් ක්ෂේත්‍රවලට බලපාන සියලුම අවදානම් අනාවරණයන් සහ අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි අධීක්ෂණය හා සමාලෝචනය
වත්කම් හා බැරකම් කමිටුව (ALCO)	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ භාණ්ඩාගාර, ආයතනික බැංකුකරණ, පෞද්ගලික බැංකුකරණ, අවදානම් කළමනාකරණ, හා මූල්‍ය යන දෙපාර්තමේන්තු වල ප්‍රමුඛ සාමාජිකයන්	ද්‍රවශීලතාව පවත්වාගෙන යමින් ද, බැංකුවේ පූර්ණ නිශ්චිත අවදානම් නැඹුරුව තුළ වෙළෙඳපොල අවදානමට නිරාවරණය වීම කළමනාකරණය කර ගනිමින් බැංකුවේ ආර්ථික අරමුණු ප්‍රශස්තකරණය
විධායක ණය කමිටුව (ECC)	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ආයතනික බැංකුකරණය, පෞද්ගලික බැංකුකරණය, අවදානම් කළමනාකරණය, විමර්ශන, අයකර ගැනීම් සහ ශාඛා ණය අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල ප්‍රමුඛ සාමාජිකයන්	බැංකුවේ ණය දීමේ උපායමාර්ගය තුළ ලබාදුන් සියලුම ණය සඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අදාළ ණය ප්‍රතිපත්ති හා පටිපාටි සමාලෝචනය හා අනුමත කිරීම
අක්‍රීය අත්තිකාරම් (NPAs) අධීක්ෂණය පිළිබඳ විධායක කමිටුව	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ආයතනික බැංකුකරණ, පෞද්ගලික බැංකුකරණ, අයකර ගැනීම් සහ අවදානම් කළමනාකරණය, යන දෙපාර්තමේන්තුවල ප්‍රමුඛ සාමාජිකයන්	බැංකුවට සිදුවන ණය පාඩු වැළැක්වීම/අවම කිරීම සඳහා කාලෝචිත නිවැරදි කිරීමේ කාර්යයන් ආරම්භ කිරීම සඳහා බැංකුවේ අක්‍රීය අත්තිකාරම් (NPAs) සමාලෝචනය සහ අධීක්ෂණය
මානව සම්පත් මෙහෙයුම් කමිටුව	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ මානව සම්පත්, ආයතනික බැංකුකරණ, පෞද්ගලික බැංකුකරණ, සහ මූල්‍ය යන දෙපාර්තමේන්තුවල ප්‍රමුඛ සාමාජිකයන්	වන්දි පැකේජ සකස්කිරීම, සංවිධාන ව්‍යුහයේ වෙනස්කම්, නිපුණතා සංවර්ධනය හා කාර්ය මණ්ඩල උසස්වීම් සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට නිර්දේශ ඉදිරිපත් කිරීම

විධිමත් රැස්වීම් (අ.1.1 මූලධර්මය)

2017 වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් සංඛ්‍යාව

රැස්වීමේ නම	රැස්වීම් සංඛ්‍යාව
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	13
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)	4
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)	19
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)	9
අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	5
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව (BNC)	6
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC)	3
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)	1
අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC)	1

අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පහත සඳහන් පරිදි රැස්විය:

	අධ්‍යක්ෂ මණ්ඩලය	අධ්‍යක්ෂ මණ්ඩල විධායක නොවන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව
මුළු රැස්වීම් සංඛ්‍යාව	13	19	5	6	4	9	1	3	1
අධ්‍යක්ෂ මණ්ඩලය									
හේමසිරි ප්‍රනාන්දු මහතා - සභාපති	13	සා/නො	සා/නො	4	සා/නො	9	සා/නො	සා/නො	0
ජෙහාන් පී. අමරතුංග මහතා - අධ්‍යක්ෂ	11	සා/නො	5	5	4	සා/නො	1	3	1
පී.ඩී.සී. ඒකනායක මහතා - අධ්‍යක්ෂ	12	සා/නො	5	5	4	සා/නො	සා/නො	3	1
ෆෙලිෂියන් පෙරේරා මහතා - අධ්‍යක්ෂ	12	සා/නො	4	1/1	සා/නො	7	සා/නො	සා/නො	සා/නො
ක්‍රිෂ් රාජේන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ	13	18	සා/නො	1/1	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො
ඇන්ටන් හේමන්ත මහතා - අධ්‍යක්ෂ	9	13	සා/නො	1/1	සා/නො	6	සා/නො	සා/නො	සා/නො
අමින්ද පෙරේරා මහතා මහතා - අධ්‍යක්ෂ	13	19	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො
කේ.ඩී.එන්. රන්පිත් අසෝක මහතා - අධ්‍යක්ෂ	2/2	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො
එම්.එච්. ජමල්ඩීන් මහතා	5/7	සා/නො	සා/නො	සා/නො	0/1	සා/නො	සා/නො	සා/නො	සා/නො
චින්තක ලොකුහෙට්ටි මහතා	6/9	සා/නො	0/3	සා/නො	1/2	සා/නො	සා/නො	සා/නො	සා/නො
මොහාන් විජේසිංහ මහතා	6/8	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො	සා/නො
එන්. විසන්ත කුමාර් මහතා ප්‍ර.විධි./සාමාන්‍යාධිකාරී	13	17	4	5/5	සා/නො	9	1	2	0

*සා/නො - සාමාජිකයෙක් නොවේ

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ කාර්යයන්

- 2016-2020 උපායමාර්ගික සැලැස්මට අනුව බැංකු කටයුතු ඩිජිටල්කරණය
- ගණුදෙනුකරුවන් වෙත සම්පවීම තවදුරටත් ව්‍යාප්ත කිරීම හා සියලුම ගණුදෙනුකරුවන්ගේ යහපත පිණිස සතියේ දින හතේම පැය 24 පුරා ගණුදෙනු කිරීමේ පහසුව සලසා දීම සඳහා බැංකු ක්ෂේත්‍රයේ විප්ලවීය සංකල්පයක් වන ස්වයං බැංකු ඒකක ස්ථාපිත කිරීම/පළමුවෙන් හඳුන්වාදීම
- ප්‍රති-සන්නාමකරණය
- බැංකුවේ උපායමාර්ගික සැලැස්මට අනුගතව බැංකුවේ ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි, ප්‍රමුඛ ප්‍රමිතික සමාලෝචනය හා අනුමත කිරීම සහ අවශ්‍ය පරිදි ඒවා ප්‍රතිසංවිධානය කිරීම
- පහත සඳහන් කාර්යයන් සඳහා පහසුකම් සැලසීම පිණිස සාධාරණව අවශ්‍ය විය හැකි ක්‍රියාමාර්ග ගැනීම:
  - 2017 වර්ෂයේ ජූලි මාසයේ දී රු. බිලියන 5.0ක නව ප්‍රාග්ධනයක් සලසාගැනීම
  - 1961 අංක 29 දරන මහජන බැංකු පනතට යෝජිත සංශෝධන සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම

අධ්‍යක්ෂ මණ්ඩල වගකීම් (අ.1.2 මූලධර්මය)

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්වලට පහත සඳහන් වගකීම් ඇතුළත් වේ:

- පාර්ශ්වකරුවන් වෙනුවෙන් දිගුකාලීන අගය නිර්මාණය කිරීම සඳහා උපායමාර්ගික මගපෙන්වීම
- ව්‍යාපාර උපායමාර්ගය ක්‍රියාවට නැංවීමේදී කළමනාකාරිත්වයට මගපෙන්වීම සඳහා ශක්තිමත් පාලන ව්‍යුහයක් සහ යෝග්‍ය ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපනය කිරීම
- නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව පහසු කරවන්නාවූ ද වත්කම් නිති ආරක්ෂා කරන්නාවූ ද ප්‍රශස්ත අභ්‍යන්තර පාලන ක්‍රමයක් සහ ප්‍රශස්ත මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලින් ස්ථාපනය කිරීම
- ප්‍රශස්ත අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපනය කිරීම
- පාර්ශ්වකරුවන්ගේ බැඳියාවන් තුලනය කිරීම
- උපායමාර්ගික ඉලක්ක ප්‍රකාරව කාර්යසාධනය අධීක්ෂණය කිරීම
- ප්‍ර.විධි./සාමාන්‍යාධිකාරී ඇතුළු ප්‍රමුඛ කළමනාකරණ පිරිස් පත් කිරීම සහ ඉවත් කිරීම
- ප්‍ර.විධි.ගේ/සාමාන්‍යාධිකාරිගේ කාර්ය සාධනය අගැයීම

නීති වලට අනුකූලව කටයුතු කිරීම (අ.1.3 මූලධර්මය)

අදාළ නීතිවලට, ශ්‍රී ලංකා මහ බැංකු නියෝගවලට හා මාර්ගෝපදේශවලට සහ චර්යාධර්ම සංග්‍රහයන්ට අනුකූලතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අනුමත කරනු ලැබ ඇත. යම් අධ්‍යක්ෂවරයකුට අවශ්‍ය නම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්ගේ සම්බන්ධීකරණය තුළින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා විධිවිධානයක් ද ඊට ඇතුළත් වේ. ව්‍යවස්ථාපිත අනුකූලතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන වෘත්තීය උපදෙස් දලබා ගනී.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් වලට හා සේවා වලට ප්‍රවේශය (අ.1.4 මූලධර්මය)

නීතිඥවරයෙකු වන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවා සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත. මණ්ඩලීය ක්‍රියාපටිපාටි වලට අනුකූල වීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහතික කරන අතර නියාමනයන්ට අනුකූලවීම සඳහා පහසුකම් සලසයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සියලු ම අධ්‍යක්ෂ මණ්ඩලීය සහ අනුකමිටු රැස්වීම් වල ලේකම් වශයෙන් කටයුතු කරන අතර රැස්වීම් වල කාර්ය සටහන් ඔහු භාරයේ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ වගකීම් පහත සාරාංශ කර දැක්වේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනුකමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- මහජන බැංකු පනතට හා අදාළ ව්‍යවස්ථාවන්ට අනුකූලව රැස්වීම් වැඩ කටයුතු පැවැත්වීම
- අදාළ නීතිය සහ යහ භාවිතයට අනුකූලව අධ්‍යක්ෂවරුන්ගේ යුතුකම් හා වගකීම් සම්බන්ධයෙන් ඔවුන්ට සහාය වීම ඇතුළුව ආයතනික පාලනය සහ භාවිතය උපයෝගීකර ගැනීමට පහසුකම් සැලසීම
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරිත්වය සඳහා සන්නිවේදන හා තොරතුරු මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම
- නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සම්බන්ධ පාර්ශ්වයන් සහ සම්බන්ධ පාර්ශව ගනුදෙනු පිලිබඳ යෝග්‍ය අනාවරණයන් සහතික කිරීම
- අදාළ සියලු ම නීති හා නියාමනයන්ට බැංකුව අනුකූල වන බව සහතික කරමින්, මණ්ඩලයේ අදහස් විමසා මහජන බැංකු පනත සහ අනෙකුත් අදාළ නීති පිළිබඳ නෛතික උපදෙස් ලබා ගැනීම.

ස්වාධීන විනිශ්චය (අ.1.5 මූලධර්මය)

තම තමන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛයන් වන වෘත්තිකයන්, විද්වතුන්, රාජ්‍ය සේවකයින් සහ ව්‍යවසායකයින් යන අයගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. තමන් හමුවේ නැගෙන කරුණු සම්බන්ධයෙන් විවාදය පෝෂණය කරමින් ඔවුහු විවිධ නිපුණතා, අත්දැකීම් සහ අවබෝධයන් ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා වලට දායක වෙති. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ස්වල්ප දෙනෙකු මණ්ඩලීය තීරණ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගැනීමේ හැකියාව අවම කරමින් ඔවුහු උපාය මාර්ගය, කාර්යසාධනය, සම්පත් සහ ව්‍යාපාරය ගෙන යෑමේ ප්‍රමිතීන් පිළිබඳ කරුණුවලදී ස්වාධීන විනිශ්චය ක්‍රියාවේ යොදවති.

මණ්ඩලයේ සහ සමාගමේ කටයුතු සඳහා ප්‍රමාණවත් කාලය සහ උත්සාහය කැප කිරීම (අ.1.6 මූලධර්මය)

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනුකමිටු රැස්වීම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ට කල් වේලා ඇතිව දැනුම් දෙනු ලැබේ. අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා, සමාලෝචනය කිරීම සහ අවශ්‍ය නම් ඒ පිළිබඳ අමතර තොරතුරු හෝ පැහැදිලි කරගැනීම් සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දෙමින් රැස්වීමට සතියකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත ලැබීමට සලස්වනු ලැබේ. සුවිශේෂී තත්ත්වයන් යටතේ රැස්වීමට ආසන්නයේ එම පත්‍රිකා බෙදා හැරීම සඳහා විධිවිධාන සලසා තිබෙන නමුත් එය හැකිතාක් අවම කරනු ලැබේ.

අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව (අ.1.7 මූලධර්මය)

නියාමන වෙනස්කම් සහ රටේ ආර්ථිකය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ගෝලීය මෙන් ම දේශීය වශයෙන් ද මෙම අංශය කෙරෙහි බලපාන කාලීන සංවර්ධනයන් පිළිබඳ මනා අවබෝධයක් තිබීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂවරු අවබෝධ කරගෙන සිටිති. සමාලෝචිත වර්ෂය තුළ ඔවුහු නියාමන, මූල්‍ය වාර්තාකරණය සහ අභ්‍යන්තර පාලනය පිළිබඳ පුහුණු සැසිවලට සහභාගිවූහ. විමසුමට ලක් වන වර්ෂය තුළ දී ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය විසින් සංවිධාන කරන ලද සම්මන්ත්‍රණ වලට සහ ශ්‍රී ලංකා මහ බැංකුව සංවිධාන කළ අධ්‍යක්ෂ සංසද වලට ද ඔවුහු සහභාගි වූහ. තව ද, බැංකුවේ මෙහෙයුම්වලට අදාළව ව්‍යාපාර පරිසරය සම්බන්ධයෙන් ආයතනික කළමනාකාරිත්වය විසින් නිරන්තර ඉදිරිපත් කිරීම් ද සිදු කරනු ලැබේ.

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි අතර වගකීම් බෙදී යෑම (අ.2 මූලධර්මය)

සභාපතිගේ සහ ප්‍රධාන විධායක නිලධාරිගේ/සාමාන්‍යාධිකාරිගේ කාර්යභාරයන් එකිනෙකට වෙනස් වන අතර ඔවුන්ගේ කාර්යභාරයන් මහජන බැංකු පනතේ සහ ආයතන පාලනයේ ප්‍රශස්ත පරිචයන් පිලිබඳ සංග්‍රහයේ පැහැදිලිව අර්ථ නිරූපණය කර තිබේ. අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බවටත්, බැංකුවේ ප්‍රශස්ත ම යහපත උදෙසා ක්‍රියාත්මක වන බවටත් සහතික වෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවන සභාපති ස්වාධීන නොවන සහ විධායක නොවන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි. බැංකුවේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා තීරණ ගැනීමේ සහ කටයුතු කිරීමේ නිදහස අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු නොවන ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරි සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන බලතල ක්‍රියාවේ යෙදවීම සහ බැංකුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයට වගකියයි.

සභාපතිගේ කාර්යභාරය (අ.3 මූලධර්මය)

යහපත් ආයතනික පාලනය ප්‍රවර්ධනය වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම පහසු කරවමින් සහ ක්‍රමවත් භාවය සුරකිමින් සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි. සියලු ම අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී සභාපතිත්වය සහතික කිරීමේ සහ අධ්‍යක්ෂවරුන් අතර බල තුලනය පවත්වාගනිමින්, සැලකිල්ලට භාජන වන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ අදහස් තහවුරුකිරීමේ වගකීම ද ඔහු වෙත පැවරේ. සභාපති අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ අදහස් විමසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යායපත්‍රය තීරණය කරයි.

මූල්‍ය විචක්ෂණභාවය (අ.4 මූලධර්මය)

මූල්‍ය කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවයක් තිබේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති ජෙහාන් අමරතුංග මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකි. ඔහු සහ රාජේන්ද්‍රන් මහතා යන දෙදෙනා ම එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයන් වන අතර එම්.එච්. ජමල්ඩීන් මහතා එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අධි සාමාජිකයෙකි. ආචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ පීඨයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ කථිකාචාර්යවරයකි. ඊට අමතරව අනෙකුත්අධ්‍යක්ෂවරු ද සමාගම්වල අධ්‍යක්ෂ ධුර උසුලන සහ ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණයක් සහිත තම තමන්ගේ ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛතමයෝ වෙති.

අධ්‍යක්ෂ මණ්ඩලය තුලනය (අ.5 මූලධර්මය)

අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සපුරා සමන්විත වන අතර ඔවුන්ගෙන් තිදෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන්ය. විධායක නොවන අධ්‍යක්ෂවරු තම තමන්ගේ ක්ෂේත්‍ර තුළ ජ්‍යෙෂ්ඨ තනතුරු උසුලන වෘත්තිකයෝ, රාජ්‍ය සේවකයෝ, විද්වත්හු සහ ව්‍යවසායකයෝ වෙති. අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය නිගමනය කරනු ලබන්නේ 2007 අංක 11 දරන බැංකුකරණ පනත් නියෝගයේ නිශ්චිතව දැක්වෙන නිර්ණායක පදනම්කර ගනිමින්ය. ඒකච්ඡන්දයෙන් නිරාකරණය කළනොහැකි අධ්‍යක්ෂවරුන් විසින් මතු කරනු ලබන කරුණු අධ්‍යක්ෂ මණ්ඩලීය කාර්ය සටහන්වල ලේඛනගත කරනු ලැබේ.

අදාළ තොරතුරු සැපයීම (අ.6 මූලධර්මය)

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අනෙකුත් ලියවිලි රැස්වීමට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සලස්වනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී මතුවන කරුණු සම්බන්ධයෙන් සියලුම අධ්‍යක්ෂවරුන්ට විධිමත් ලෙස කරුණු දැනුම් දෙනු ලබන බවටත්, වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය යැයි සැලකේනම් අදාළ කරුණ සාකච්ඡාවට ගැනෙන විට ආයතනික කළමනාකාරිත්වයේ අදාළ සාමාජිකයින් එහි සිටින බවටත් සභාපති වගබලාගත යුතුය. ඊට අමතරව, අවශ්‍ය නම් වැඩිදුර විමසීම් සඳහා කළමනාකාරිත්වයට ප්‍රවේශය ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව පවතී.

තවද, උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, බාහිර පරිසරයේ වෙනස්කම් සහ ප්‍රවණතා, මූල්‍ය, සමාජීය සහ පාරිසරික කාර්යසාධනය සහ බැංකුවේ මෙහෙයුම්වලට අදාළ කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම පහසු කරවීම පිණිස ප්‍රතිපත්ති රාමුවල වෙනස්කම් සිදු කිරීම සඳහා වන නිර්දේශ ඇතුළු කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට හා අනු කමිටුවලට නිතිපතා කරුණු ඉදිරිපත් කිරීම් සිදු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සහ නැවත තේරී පත්වීම (අ.7 සහ අ.8 මූලධර්ම)

විෂයභාර අමාත්‍යවරයා විසින් මහජන බැංකු පනතට අනුකූලව උපරිම වශයෙන් අධ්‍යක්ෂවරුන් දස දෙනෙකු පත් කරනු ලබන අතර ඔවුන්ගෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ බැංකුව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂයපථය යටතේ පැවතුණි.

අධ්‍යක්ෂ ධුර සඳහා පත්කිරීම් අධ්‍යක්ෂවරුන් පිළිබඳ නිසි සහ යෝග්‍ය නිර්ණායක ඔස්සේ ඇගයීම සඳහා ශ්‍රී ලංකා මහබැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. 2007 අංක 11 දරන බැංකු පනතේ නියෝගවල විධිවිධානවලට අනුකූලව, වසර නවයක උපරිම කාලසීමාවකට යටත්ව, අවුරුදු 70 දක්වා වූ වයස් සීමාවක් දක්වා වසර තුනක කාලසීමාවකට පත්වීම් සිදු කරනු ලැබේ.

මණ්ඩලීය කාර්යසාධනය ඇගැයීම (අ.9 මූලධර්මය)

මණ්ඩලයේ වගකීම් සතුටුදායක ලෙස ඉටු කරනුලබන බව සහතික කිරීම සඳහා මණ්ඩලය වාර්ෂිකව සිය කාර්යසාධනය ඇගැයීමට ලක්කරයි. අදාළ සංග්‍රහයේ මණ්ඩලීය කාර්යසාධන ඇගයීම පිරික්සුම් ලැයිස්තුවේ විශේෂිතව දැක්වෙන නිර්ණායක ඇතුළත් වන සම්මත කාර්යසාධන ඇගයීම් ප්‍රශ්නාවලියක් එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සම්පූර්ණ කරනු ලැබේ. ලැබෙන ප්‍රතිචාර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඒකරාශී කොට අධ්‍යක්ෂමණ්ඩල රැස්වීමක දී ඒවා සාකච්ඡා කරනු ලැබේ.

මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරනු ලබන මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික තීරණය කරනු ලැබේ.

අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කිරීම (අ.10 මූලධර්මය)

අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සංග්‍රහයේ නිශ්චිතව දැක්වෙන තොරතුරු මේ වාර්ෂික වාර්තාව තුළ පහත දැක්වෙන පරිදි අනාවරණය කරනු ලැබේ:

- නම, සුදුසුකම්, විශේෂඥතාව, අදාළ ව්‍යාපාරික බැඳීම්, ප්‍රධාන පත්වීම් සහ ලුහුඬු පැතිකඩ 22 සිට 23 දක්වා පිටු වල
- අනුකමිටු වල සාමාජිකත්වය 35 වැනි පිටුවේ
- මණ්ඩලීය රැස්වීම්වලට සහ අනුකමිටු රැස්වීම්වලට පැමිණීම 37 වැනි පිටුව
- සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු 262 සිට 265 දක්වා පිටු වල

ප්‍රධාන විධායක නිලධාරි පිළිබඳ අගැයීම (අ.11 මූලධර්මය)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරිගේ/සාමාන්‍යාධිකාරිගේ කාර්යසාධනය වාර්ෂිකව තක්සේරු කරනු ලබයි. මූල්‍ය සහ මූල්‍ය නොවන ඉලක්ක ඇතුළු අගැයුම් නිර්ණායක,ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරිගේ අදහස් විමසා, බැංකුවේ කෙටි, මැද හා දිගුකාලීන අරමුණුවලට අනුකූලව වර්ෂය මුල දී නිශ්චය කරනු ලැබේ. මෙහෙයුම් පරිසරය සැලකිල්ලට ගනිමින් වර්ෂය අවසානයේ දී ඉලක්ක වලට අනුකූලව කාර්යසාධනය තක්සේරු කරනු ලැබේ. කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට වඩා පහළ අවස්ථාවල දී පැහැදිලි කිරීම් ලබා ගනු ලැබේ. මණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC) මේ ක්‍රියාවලියේ දී සහාය වේ.

අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක පාරිශ්‍රමික (ආ.1, ආ.2 සහ ආ.3 මූලධර්ම)

මුදල් අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකය තීරණය කරනු ලැබේ. කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඔහුගේ/ඇයගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට සම්බන්ධ නොවේ. මණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, එකඟ වූ නියම හා කොන්දේසි ඇතුළත සහ බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්ති සහ සාමූහික ගිවිසුම් වලට අනුකූලව ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගේ සහ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස්වල පාරිශ්‍රමික වලට හා ප්‍රතිලාභ වලට අදාළව මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරයි. පාරිශ්‍රමිකය ඉහළ කාර්යසාධනයක් ඇති, සුදුසුකම් ලත් සහ පළපුරුදු සේවකයින් බැංකුවට ආකර්ෂණයකර ගැනීමටත්, බැංකුවේ රඳවා ගැනීමට හා අභිප්‍රේරණය කිරීමටත් හැකි වන පරිදි සැලසුම්කරනු ලැබේ.

මණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සිය වගකීම් ඉටු කිරීමේ දී අවශ්‍ය යැයි සැලකෙන අවස්ථාවල දී බැංකුවෙන් පරිබාහිර ස්වාධීන උපදෙස් ලබා ගනී. පාරිශ්‍රමික ප්‍රතිපත්තිය ආවරණය කරන BHRRC වාර්තාව සහ එහි සභාපති සහ සාමාජික නාම ලේඛනය 57 වැනි පිටුවේ දැක්වේ. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට ගෙවන ලද මුළු පාරිශ්‍රමික 230 වැනි පිටුවේ දැක්වේ.

කොටස් හිමියන් සමග සම්බන්ධතා (ඇ.1 සහ ඇ.2 මූලධර්ම)

ශ්‍රී ලංකා රජය මහජන බැංකුවේ ප්‍රධාන කොටස්හිමියා ය. බැංකුව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනේ. රටේ සමාජ ආර්ථික සංවර්ධන ඉලක්කවලට අනුකූලතාව පවතින බව සහතික කිරීම සඳහා මණ්ඩලය අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරයි.

වාර්ෂික වාර්තාව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් මුද්‍රණය කර මුදල් අමාත්‍යාංශය මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ. මුදල් අමාත්‍යාංශයට අදාළ කරුණු සම්බන්ධයෙන් බැංකුව එම අමාත්‍යාංශය සමග එක්ව කටයුතු කරයි.

ප්‍රධාන සහ වැදගත් ගණුදෙනු (ඇ.3 මූලධර්මය)

සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු පිළිබඳව 268 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවල 45 වැනි සටහනේ අනාවරණය කරනු ලබන කරුණු හැරුණු විට බැංකුවේ හෝ ව්‍යාපාර සමූහයේ ශුද්ධ වත්කම් පදනම ප්‍රමාණාත්මකව වෙනස් කරන ගණුදෙනු නොවීය.

මූල්‍ය වාර්තාකරණය (ඇ.1 මූලධර්මය)

බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අනාගත අපේක්ෂා පිළිබඳ තුලනාත්මක සමාලෝචනයක් වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. තොරතුරු ඉදිරිපත් කිරීමේ දී වටහා ගැනීමේ පහසුව හා පැහැදිලි බව තීව්‍ර කිරීම සඳහා සවිස්තර කිරීම් මෙන්ම ඡායාරූප හා රූප සටහන් ද භාවිතා කරනු ලැබ ඇත. මේ වාර්තාවේ මෙන්ම, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය හා නියාමකයින් ඇතුළු අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද අනෙකුත් වාර්තා වලද අපේ කාර්යසාධනය පිළිබඳ සමතුලිත අදහසක් අපි ඉදිරිපත් කොට ඇත්තෙමු. වාර්ෂික වාර්තාවේදී මෙන්ම, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ අතුරු වාර්තා ප්‍රකාශනයේදී ද ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා බැංකුව සෑම ප්‍රයත්නයක්ම දරයි.

අදාළ සංග්‍රහය ප්‍රකාර අවශ්‍ය වන පහත දැක්වෙන අනාවරණයන් මේ වාර්තාවට ඇතුළත් වේ:

- 197 වැනි පිටුවේ සඳහන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් දැක්වෙන ප්‍රකාශයක් ද ඇතුළත් වේ.
- 198 පිටුවේ දැක්වෙන ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ ඔවුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් වේ.
- අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 60 සහ 61 පිටු වල දැක්වේ.
- කළමනාකරණ කතිකාව සහ විශ්ලේෂණය 102 සිට 194 දක්වා පිටුවල දැක්වේ.
- අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයේ අයිතම අංක 197 හි සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් දක්වා ඇත.
- 268 සිට 271 දක්වා පිටු වල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනයේ 45 වැනි සටහනේ සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු පිළිබඳව අනාවරණය කරනු ලැබේ.

අභ්‍යන්තර පාලනය සහ මාණ්ඩලීය විගණන කමිටුව (ඇ.2 සහ ඇ.3 මූලධර්ම)

කොටස්හිමියන්ගේ අපේක්ෂාවන් සහ බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අවදානම් කළමනාකරණය සහ ප්‍රශස්ත අභ්‍යන්තර පාලනය සඳහා යෝග්‍ය සහ ප්‍රමාණවත් ක්‍රියාවලින් සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ලා සිය වගකීම පිළිබඳව බැංකුව අවබෝධයෙන් පසුවේ. මාණ්ඩලීය විගණන කමිටුව බැංකුවේ අවදානම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන අතර මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් සිය වගකීම් ඉටු කිරීමේලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවේ. ඒ්වායේ කාර්යභාරයන් සහ වගකීම් කමිටු වාර්තාවේ 56 සහ 57 පිටු වල පිළිවෙලින් දැක්වේ.

මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහාය හිමිවේ. බැංකුව අවදානම් කළමනාකරණය කරන ආකාරය පිළිබඳ සවිස්තර වාර්තාවක් 63 සිට 100 දක්වා පිටු වල ඇතුළත් වේ. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මාණ්ඩලීය විගණන කමිටුවට සහාය ලබා දේ. අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව අභ්‍යන්තර පාදක පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායීත්වය සමාලෝචනය කරන අතර, ක්‍රමානුකූල පදනමකින් මාණ්ඩලීය විගණන කමිටුවට වාර්තා කරයි. මාණ්ඩලීය විගණන කමිටුවේ වගකීම් වලට එවැනි විගණනවල විෂය පථය සහ ප්‍රතිඵල සහ ඒ්වායේ ඵලදායීත්වය සමාලෝචනයට ලක් කිරීම ඇතුළත් වේ. බැංකුවේ බාහිර විගණනය සිදු කරන විගණකාධිපතිවරයා සමග සම්බන්ධීකරණය කාර්යයන්හිදී මාණ්ඩලීය විගණන කමිටුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

ව්‍යාපාරික චර්යා සහ ආචාරධර්ම සංග්‍රහය සහ ආයතනික පාලන වාර්තාව (ඇ.4 සහ ඇ.5 මූලධර්ම)

ව්‍යාපාරික චර්යා සහ ආචාරධර්ම සම්බන්ධයෙන් වන චර්යාධර්ම සංග්‍රහ දෙකක් බැංකුව සතුව ඇති අතර, එකක් අධ්‍යක්ෂවරුන්ට ද අනෙක සේවකයින්ට ද අදාළ වේ. මාණ්ඩලීය මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC), බැංකුවේ ක්‍රමයෙන් විකාශනය වන ව්‍යාපාරික මෙහෙයුම් සැලකිල්ලට ගෙන, එක් එක් සංග්‍රහයන් අදාළ සහ ප්‍රමාණවත් වන බව සහතික කිරීම සඳහා ඒවා ක්‍රමානුකූලව සමාලෝචනය කිරීමේ වගකීම උසුලයි. ව්‍යාපාරික චර්යා සහ ආචාරධර්ම සංග්‍රහයන්, ආයතනික පාලනය පිළිබඳ යහභාවිත සංග්‍රහයේ 1 වැනි උපලේඛනයේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

32 සිට 62 දක්වා පිටු වල දැක්වෙන මේ ආයතනික පාලන වාර්තාව, ඇ 5 මූලධර්මයේ නිශ්චිතව දැක්වෙන ආයතනික පාලනයේ යහභාවිත සංග්‍රහයට අනුකූල වීමේ ප්‍රමාණය අනාවරණය කිරීමේ අවශ්‍යතාව සපුරාලයි.

කොටස්හිමි සම්බන්ධතා (ඉ සහ ඊ මූලධර්ම)

මහජන බැංකුවේ ප්‍රධාන කොටස්හිමියා වන්නේ ශ්‍රී ලංකා රජය බැවින් සංග්‍රහයේ අදාළ විධිවිධාන මෙහිදී අදාළ නොවේ.

තිරසරවාර්තාකරණය (උ මූලධර්මය)

බැංකුව සම්බන්ධයෙන් තිරසර ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලය, සමාජීය හා පාරිසරික සංවර්ධනය සඳහා වන සිය දර්ශනය, අරමුණු හා උපායමාර්ගික ඉලක්ක ක්‍රියාවට නංවනු ලබන බවට වග බලාගැනීම පිණිස පාලන ව්‍යුහයක් සකස් කර ඇත. ඒ අනුව, සියලුම භූගෝලීය කලාප ඔස්සේ ක්‍රියාත්මක බැංකුවේ මෙහෙයුම් තුළ අතිශය වැදගත් වටිනාකම් ත්‍රිත්වයක් අන්තර්ගත කර තිබේ. බැංකුවේ තිරසර ව්‍යාපාරික මූලාරම්භණ, පහත දැක්වෙන පරිදි, සංග්‍රහයේ මූලධර්ම වලට අනුකූලව විස්තර කරනු ලැබේ.

1 වැනි මූලධර්මය - ආර්ථික තිරසරබව -මූල්‍ය සමාලෝචනය- පිටු අංක 126 සිට 150 දක්වා

2 වැනි මූලධර්මය - පරිසරය - පාරිසරික බලපෑම - පිටු අංක 189 සිට 191 දක්වා

3 වැනි මූලධර්මය - ශ්‍රම භාවිතාව - මානව ප්‍රාග්ධනය පිටු අංක 157 සිට 10 දක්වා

4 වැනි මූලධර්මය - සමාජය - සමාජ බලපෑම පිටු අංක 171

5 වැනි මූලධර්මය - නිෂ්පාදන වගකීම - ගණුදෙනුකාර ප්‍රාග්ධනය - පිටු අංක 175 සිට 184 දක්වා

6 වැනි මූලධර්මය - පාර්ශ්වකරුවන් හඳුනාගැනීම, අනුයුක්ත කර ගැනීම සහ ඵලදායී සන්නිවේදනය - පාර්ශ්වකාර අනුයුක්තතාව - පිටු 120 සිට 122 දක්වා

7 වැනි මූලධර්මය - වාර්තාකරණ ක්‍රියාවලියේ අංගයක් වශයෙන් තිරසර වාර්තාකරණය විධිමත්ව හා ක්‍රමවත්ව සිදුකිරීම - මෙම වාර්තාව ගැන යමක් - පිටු අංක 2

මහ බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු සඳහා වන ආයතනික යහ පාලනයට අදාළ 2007 අංක 11 දරන බැංකු පනත ප්‍රතිසම්පාදනය හා සංශෝධන

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**		
3.1 (i)	අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි බැංකුවේ සුරක්ෂිතතාව සහ ප්‍රශස්තභාවය ශක්තිමත් කර ඇත.		
අ.	උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් නියම කිරීම	බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික වටිනාකම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන අතර ඒවා 4 වන පිටුවේ දක්වා ඇත. MTI උපදේශකයින්ගේ සහභාගිත්වය ඇතිව සකස් කරන ලද 2015 සැප්තැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2016-2020 කාලසීමාව සඳහා වන උපායමාර්ගික සැලැස්මට මේවා ඇතුළත් කරනු ලැබ ඇත. අයවැය, ව්‍යූහගත රැස්වීම් සහ කාර්තුමය කාර්යසාධන සමාලෝචන රැස්වීම් මගින් කාර්යමණ්ඩලයේ සියලු මට්ටම්වල සාමාජිකයන් ඉලක්ක සහ අරමුණු පිළිබඳව දැනුවත්කර ඇත. මූල්‍ය ප්‍රධානී ඉදිරිපත් කරන ලද 2017 වසරට අදාළ බැංකුවේ අයවැයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණි. ආයතනික වටිනාකම් ඇතුළත් කළ ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහයේ මුද්‍රිත පිටපත් සියලු ම සේවකයින්ට ලබා දී ඇති	✓
ආ.	අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණය ඇතුළු සමස්ත ව්‍යාපාර උපාය මාර්ගය අනුමත කිරීම	2016-2020 පස් වස් ආයතනික උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සහ මාර්ගෝපදේශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන ලදී. BIRMC කමිටුව විසින් නිර්දේශ කරන ලදුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති අත්පොත හා කොටස් වෙළඳපොල වෙත නිරාවරණය වීම සඳහා වන අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තය ක්‍රියාවට නංවා ඇත. BIRMC කමිටුවේ මැදිහත්වීම මත, බැංකුවේ සමස්ත අවදානම් උපායමාර්ගයට අනුගතවන පරිදි ආයතනික උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කරන ලදී. එකී අවදානම් උපායමාර්ගයට අනුකූලව අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණයක් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවේ අන්තර්ගත වන පාලනය සහ අනුකූලතාව ද උපායමාර්ගික සැලැස්මට ඇතුළත් වේ. නිශ්චිත කාල රාමු ඇතුළත මැනිය හැකි ඉලක්ක ලබා දී එම්ඉලක්ක සපුරා ගැනීමට අනුව කාර්යසාධනය අගයනු ලැබේ.	✓
ඇ.	අවදානම් කළමනාකරණය	බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, අවදානම් නැඹුරුව අර්ථ නිරූපණය කිරීම, මූලික අවදානම් හඳුනා ගැනීම, පාලන ව්‍යූහයන් සකස් කිරීම සහ මූලික අවදානම් තක්සෙරු කිරීම, අධීක්ෂණය හා කළමනාකරණය සඳහා පද්ධතීන් ක්‍රියාවේ යෙදවීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ BIRMC කමිටුවට පැවරී තිබේ. පහත දැක්වෙන වාර්තාවල මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු ඇතුළත් වේ: • අවදානම් කළමනාකරණ වාර්තාව - පිටු අංක 63 සට 100 දක්වා • සංකලිත අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව - පිටු අංක 57 බැංකුවේ නව උපායමාර්ග, එවැනි නව උපායමාර්ග මගින් මතුවිය හැකි අවදානම්, සහ එවැනි අවදානම් අවමකිරීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකිවන පරිදි සුදුසු යාන්ත්‍රණයක් බැංකුව විසින් අරම්භ කරනු ඇත.	✓
ඈ.	සියලු පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය	සියලුම පාර්ශ්වකරුවන් ආවරණය වන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තියක් මණ්ඩලය අනුමත කර ඇත. • **කොටස් හිමියන්** - ශ්‍රී ලංකා රජය මහජන බැංකුවේ ප්‍රධාන කොටස්හිමියාය. බැංකුවේ සමාජ ආර්ථික පරමාර්ථ සම්බන්ධයෙන් අදාළ විෂය භාර අමාත්‍යාංශය සමඟ සන්නිවේදන කටයුතු පවත්වාගෙන යන අතර මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් වාරික වාර්තා සහ වාර්ෂික වාර්තාව මගින් මුදල් අමාත්‍යාංශය සමඟ සන්නිවේදනය පවත්වාගෙන යයි. වර්ෂය තුළ බැංකුවේ කාර්යසාධනය ගැන විස්තරාත්මක සහ තුලින සමාලෝචනයක් වාර්ෂික වාර්තාව සපයයි. • **ගනුදෙනුකරුවන්** - විශේෂිත ලිපි නුවමාරුව හැරුණු විට බැංකුව ප්‍රවත්පත්, වෙබ් අඩවිය සහ පත්‍රිකා මගින් ගනුදෙනුකරුවන් සමඟ සන්නිවේදනය කරයි. ඒ අනුව, බැංකුව ක්‍රමානුකූල පදනමකින් පොළි අනුපාත විනිමය අනුපාත සහ නිෂ්පාදිත සම්බන්ධ තොරතුරු සන්නිවේදනය කරයි. මූල්‍ය ප්‍රකාශන කාර්තුමය පදනමක් මත සියලු ප්‍රවත්පත්වල භාෂා තුනෙන් ම පළ කරනු ලැබේ. බැංකුවේ ගනුදෙනුකාර පැමිණිලි ප්‍රතිපත්තිය සියලු ශාඛාවල භාෂා තුනෙන් ම ප්‍රදර්ශනයට තබා ඇත. • **කාර්ය මණ්ඩලය** - තමන්ට අදාළ කරුණු සාකච්ඡා කිරීම සඳහා සේවකයින්ට කළමනාකාරිත්වයට විධිමත් ප්‍රවේශය සලසා තිබේ. සේවක වෘත්තීය සංගම් සහ කළමනාකාරිත්වය අතර නිතිපතා සංවාදයක් පැවැත් වේ.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ඉ.	අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධති	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිවල සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල (MIS) ප්‍රමාණවත් බව සහ ඍජු බව සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මේ කාර්යය ඉටු කිරීමෙහිලා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ බාහිර විගණකවරුන්ගේ වාර්තා සමාලෝචනය කරයි. වර්ෂය තුළ දී මේ වාර්තා වලින් මතු කරනු ලබන නිරීක්ෂණ වලට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර කමිටුව පසුව සමාලෝචනයට ලක් කර ඇත.	✓
ඊ.	ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs)	2010 අංක 3 දරන බැංකු පනතේ විනිශ්චයන් හා 2015.12.02 දිනැති අංක 02/17/550/0002/003 බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍ර.වි.නි., නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් හා සහකාර සාමාන්‍යාධිකාරිවරුන් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (KMPs) වශයෙන් අර්ථ නිරූපණය කර ඇත.	✓
උ.	අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ නිශ්චිත අධිකාරී බලතල සහ මූලික වගකීම්	අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිශ්චිතව වෙන් වූ කරුණු, හිමි බලතල සහ මූලික වගකීම් මහජන බැංකු පනතේ පැහැදිලිව නිර්වචනය කර ඇත. ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයන්ගේ අධිකාරී බලය සහ ප්‍රමුඛ වගකීම් ඔවුන්ගේ අදාළ රැකියා විස්තරවල දැක්වේ.	✓
ඌ.	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් බැංකුවේ කටයුතු අධීක්ෂණය	බැංකුවේ උපායමාර්ගික ඉලක්ක, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය, මානව සම්පත් සහ තමන්ට පැවරී ඇති වෙනත් යම් කරුණු පිළිබඳ ප්‍රගතිය මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ. සිය අධීක්ෂණය සඳහා පැවරී ඇති ක්ෂේත්‍ර සමාලෝචනයේ ලා අනු කමිටු අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.	✓
එ.	ස්ව පාලන භාවිතාවන්හි ඵලදායිතාව තක්සේරු කිරීම	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විසින් ස්වයං අගැයීම් ආකෘතියක් මගින් මණ්ඩලයේ සහ එහි අනුකමිටු වල ඵලදායිතාව වාර්ෂිකව තක්සේරු කරනු ලැබේ. 2017 ස්වයං අගැයීම 2018පෙබරවාරි මස සිදු කරන ලද අතර 2018 පෙබරවාරි මස 21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ ප්‍රතිචාර පිළිබඳව සභාපතිතුමා මණ්ඩලය සමඟ සාකච්ඡා කළේය. අවධානය යොමුවිය යුතු කරුණු සැලකිල්ලට ගනු ලැබූ අතර බැංකුවේ පාලන පරිචය වැඩිදුරටත් ශක්තිමත් කිරීම පිණිස මණ්ඩලය විසින් ගෙවුණු වසර තුළ ඒ පිළිබඳව පසු විපරම් කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.	✓
ඒ.	ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්ති සැලැස්ම	නම් කරන ලද අනුප්‍රාප්තිකයන් සහිත සහ ඔවුන්ගේ සූදානම සහතික කිරීම සඳහා වන සංවර්ධන සැලසුම් ඇතුළත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා නව අනුප්‍රාප්ති සැලැස්මක් උපාය මාර්ගික සැලසුම් ක්‍රියාමාර්ගය යටතේ මණ්ඩල පත්‍රිකා 09/2015 මගින් අනුමත කරන ලදී. අනුප්‍රාප්ති සැලැස්ම සකස් කරනු ලැබ ඇත්තේ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ සහකාර සාමාන්‍යාධිකාරීන් සඳහාය.	✓
ඔ.	ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ නිරතුරුව පැවැත්වෙන රැස්වීම්	කාර්යසාධනය, උපායමාර්ගය, ප්‍රතිපත්තිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය හමුවේ ඉදිරිපත් කරනු ලබන සිය විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ සාකච්ඡා වලට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් නිතිපතා සහභාගි වෙති. ඊට අමතරව, මෙහෙයුම් පරිසරය හෝ නියාමනයන් මෙහෙයවීමේ දී සිදුවන වෙනස්කම් පිළිබඳව ද ඔවුහු නිරන්තර පදනමකින් කරුණු ඉදිරිපත් කරති. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතර ඍජු සන්නිවේදන මාර්ග ස්ථාපනය කිරීමට මෙම රැස්වීම් උපකාරී වේ.	✓
ඕ.	නියාමන පරිසරය සහ නියාමක සමඟ ඵලදායී සම්බන්ධතාවක් පවත්වාගෙන යාම	අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් පත් කිරීමේ දී අදාළ සියලු නියාමන අවශ්‍යතා පූර්ණය කරනු ලැබේ. සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම පහසු වන පරිදි ඔවුන්ගේ දැනුම විධිමත් පරිදි යාවත්කාලීන කිරීම සහතික කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී නියාමන පරිසරයේ සංවර්ධනයන් පිළිබඳව ද ඔවුන් දැනුම්වත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සහ සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ රැස්වීම්වල දී අභ්‍යන්තර විගණන කමිටු සහ අවදානම් සහ අනුකූලතා ප්‍රධානීන් විසින් නියාමන සංවර්ධනයන් පිළිබඳ කරුණු ඔවුන්ට විස්තර කරදෙනු ලැබේ. ඉදිරි පියවරක් ලෙස, අනුකූලතා නිලධාරී විසින් ආයතන පාලනය පිළිබඳ නියාමන ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් හා නවතම මාර්ගෝපදේශ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවබෝධය හා දැනුම යාවත්කාලීන කරවීම පිණිස ඔවුන් වෙත ලබාදෙනු ලැබේ.	✓
ක.	බාහිර විගණකයින්ගේ සේවය ලබා ගැනීම	රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධිවිධාන සැලසී ඇති පරිදි, රජය සතු ව්‍යවසායක් වශයෙන්, බැංකුවේ බාහිර විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා ක්‍රියා කරයි. ආයතන පාලනයේ ප්‍රශස්ත පරිචය පිළිබඳ සංග්‍රහයේ 6.1(2) වගන්තිය, නිර්ණේය විෂයය, ප්‍රකාර මාණ්ඩලීය විගණන කමිටුව විසින් භාහිර විගණනකයින් පත්කිරීම හා ඔවුන්ගේ වැඩ අධීක්ෂණය පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.1 (ii)	සභාපති ස ප්‍ර.විනි./ සාමාන්‍යාධිකාරී පත් කිරීම සහ ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් පැහැදිලි කිරීම සහ අනුමත කිරීම	බලතුලනයක් පවත්වාගෙන යෑම සඳහා මහජන බැංකු පනත, සභාපතිගේ සහ ප්‍ර.විනි./සාමාන්‍යාධිකාරීගේ තනතුරු වෙන් කොට දක්වයි. ඒ අනුව සභාපතිගේ සහ ප්‍ර.විනි./සාමාන්‍යාධිකාරීගේ කාර්යයන් සහ වගකීම් පැහැදිලිව අර්ථ දක්වනු ලැබ ඇති අතර මේ නියෝගවල 3 (5) නියෝගය අනුව අනුමත කරනු ලැබ ඇත. විෂයය භාර අමාත්‍යවරයා විසින් සභාපති පත් කරනු ලැබ ඇති අතර ප්‍ර.විනි./සාමාන්‍යාධිකාරී පත් කරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.	✓
3.1 (iii)	අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාන්‍ය රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතා පදනමක් මත නියම කර ගනු ලැබේ. මණ්ඩලය හමුවේ ඉදිරිපත් වන කරුණු අධ්‍යක්ෂවරු ක්‍රියාශීලීව සාකච්ඡාවට භාජනය කරති. අධ්‍යක්ෂ මණ්ඩල සහ අනුකමිටු රැස්වීම්වල පැමිණීම 37 පිටුවේ දැක්වේ. චක්‍රලේඛ යෝජනා මගින් මණ්ඩල අනුමැතිය ලබා ගැනීම අධෛර්යමත් කරනු ලබන අතර විශේෂ අවස්ථාවල දී පමණක් එසේ කරනු ලැබේ. 2017 වසර තුළ චක්‍රලේඛ යෝජනා කිසිවක් සම්මත නොකරන ලදී.	✓
3.1 (iv)	අධ්‍යක්ෂවරුන් විසින් න්‍යාය පත්‍රයට යෝජනා ඇතුළත් කිරීමට අදාළ විධිවිධාන	රැස්වීම් පැවැත්වෙන දින නියම කරගනු ලබන අතර විධිමත් රැස්වීම් වල න්‍යාය පත්‍රයට යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි එක් එක් ලිත් වර්ෂය ආරම්භයේ දී ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලැබේ.	✓
3.1 (v)	රැස්වීම් පිළිබඳ දැනුම්දීම	පැමිණීම සහ යම් හදිසි යෝජනා ඇත්නම් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ට කාලය ලැබෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම්දීම, න්‍යාය පත්‍රය සහ මණ්ඩලීය පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් අතර බෙදා හරිනු ලැබේ.	✓
3.1 (vi)	අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම	අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීමේ ලේඛනයට අනුව, ඔවුන් සියලු දෙනාම 2017 වසර තුළ නියමිත රැස්වීම් සංඛ්‍යාවකට සහභාගි වී ඇත.	✓
3.1 (vii)	සමාගම් ලේකම් පත් කිරීම සහ ඔහුගේ වගකීම් නියම කිරීම	1988 අංක 30 දරන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධානවලට සහ එහි සංශෝධන වලට අනුකූලව, නීතිඥයකු වන රොහාන් පතිරගේ මහතා මණ්ඩල ලේකම් වශයෙන් පත් කරන ලදී. (මණ්ඩලීය පත්‍රිකා අංක 406/2010 රැස්වීම් අංක 13/2010) මණ්ඩලයේ ලේඛන කාර්ය සේවා සහ ව්‍යවස්ථාවන්හි හා අනෙකුත් නියාමනයන්හි විශේෂිතව දැක්වෙන කාර්යයන් ඉටු කිරීමේ වගකීම ඔහු වෙත පැවරී ඇත.	✓
3.1 (viii)	සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන්ට අධ්‍යක්ෂවරුන් සතු ප්‍රවේශය	අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි අනුගමනය කරනු ලබන බවටත් අදාළ රීති සහ රෙගුලාසි වලට අනුකූල වන බවටත් සහතික වනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවා ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට පූර්ණ ප්‍රවේශය තිබේ.	✓
3.1 (ix)	මණ්ඩලීය කාර්යසටහන් පවත්වාගෙන යාම	අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වා ගෙන යනු ලබන අතර පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා වලට සහ කාර්ය සටහන් වලට අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය තිබේ.	✓
3.1 (x)	කාර්යසටහන් ප්‍රමාණවත් පරිදි විස්තරාත්මක විය යුතු වීමේ සහ නියාමකයන්ට හා අධීක්ෂක බලධාරීන්ට යොමුවක් වශයෙන් තිබීමේ අවශ්‍යතාව	රැස්වීම්වල කාර්යසටහන් වල පහත සඳහන් කරුණු ඇතුළත් වේ: (අ) කරුණු සලකා බැලීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිත කරනු ලබන දත්ත හා තොරතුරු වල සාරාංශයක්; (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු; (ඇ) තොරතුරු සෙවීමේ සාකච්ඡා හා විවාදගත හෝ එකඟ නොවූ කරුණු; (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපාය මාර්ග සහ අදාළ නීති වලට හා රෙගුලාසි වලට අනුකූලතාව සම්බන්ධයෙන් අදාළ විධායකවරුන්ගේ සාක්ෂි හා සනාථ කිරීම්; (ඉ) බැංකුව නිරාවරණය වී ඇති අවදානම් සම්බන්ධ කරුණු සහ සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා ඇතුළු අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ සමාලෝචනයක්; (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයන්; සහ (උ) සියලු ම අධ්‍යක්ෂ මණ්ඩ අනුකමිටුවල වාර්තා.	✓
3.1 (xi)	ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන් සතු හැකියාව	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාපටිපාටිවලට අනුව, සිය වගකීම් ඉටු කිරීමේ දී අවශ්‍ය වෙතොත්, අධ්‍යක්ෂවරුන්ට වෘත්තීය උපදෙස් ලබා ගැනීමට පිණිස විධිවිධාන සලසා දී ඇත.අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් මේ කාර්යය සම්බන්ධීකරණය කරනු ලබයි.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.1 (xii)	බැඳියා ගැටුම සම්බන්ධයෙන් කටයුතු කිරීම	බඳවා ගැනීමේ දී හා වාර්ෂිකව අධ්‍යක්ෂවරුන්ගේ ලිඛිත ප්‍රකාශන ලබා ගනු ලැබේ. බැඳියා ගැටුමක් ඇති අවස්ථාවල දී අධ්‍යක්ෂවරු ඡන්දය දීමෙන්, අනුමැතිය දීමෙන් හෝ සකච්ඡාවලට සහභාගි වීමෙන් වැළකෙති. ඊට අමතරව, එවැනි අවස්ථා වලදී ගණපූරණය ගණන් ගැනීමේ දී එවැනි අධ්‍යක්ෂවරුන් පැමිණ සිටීම නොසලකා හරිනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රධාන පත්වීම්, 22 සහ 23 දක්වා පිටුවල දැක්වෙන ඔවුන් පිළිබඳ විස්තරවල ඇතුළත් වේ.	✓
3.1 (xiii)	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සඳහා වෙන්වන කරුණු විධිමත් ලෙස සකස් කිරීම	සිය අවධානය සඳහා වෙන් වූ කරුණු සහ බැංකුවේ මෙහෙයවීම හා පාලනය මණ්ඩලයේ පාලනය සහ අධිකාරිබලය යටතේ ස්ථාවරව පැවතීම සහතික කෙරෙන අධිකාරී බලය පැවරීමක් පිළිබඳ විධිමත් උපලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.	✓
3.1 (xiv)	නුඹුන්වත්බව පිළිබඳ ගැටලු ඇත්නම් මහබැංකුවට දැනුම් දීම	බැංකුවේ නුඹුන්වත්බව සැකයට භාජන වූ අවස්ථා නැත. බැංකුව බුන්වත් බවට හෝ සිය තැන්පත්කරුවන්ට සහ වෙනත් ණයහිමියන්ට ගෙවීම් අත්හිටුවීමට හෝ ආසන්නව සිටින්නේ නම් බැංකුකරණ අධිකෂණ අධ්‍යක්ෂවරයාට දැනුම්දීමේ අනුමත ක්‍රියාපටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු ය.	✓
3.1 (xv)	ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය	නියාමන අවශ්‍යතාවන්ට සහ බැංකුවේ නිර්වචනය වූ අවදානම් නැඹුරුවට අනුකූලතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවය සහ අනෙකුත් විචක්ෂණ ක්‍රියාමාර්ග අධීක්ෂණය කරනු ලැබේ. අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූලව බැංකුව කටයුතු කරයි.	✓
3.1 (xvi)	වාර්ෂික වාර්තාව තුළ ආයතනික පාලන වාර්තාව පළ කිරීම	මේ වාර්තාව, 33 සිට 62 දක්වා පිටුවල දැක්වෙන බැංකුවේ ආයතනික පාලන වාර්තාවේ කොටසක් වේ.	✓
3.1 (xvii)	අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගැයීම	අධ්‍යක්ෂවරු 2018 පෙබරවාරි මාසයේදී වාර්ෂික ස්වයං තක්සේරුව සම්පූර්ණ කරති. මේ වාර්තා, මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලැබේ.	✓
3.2	**අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය**		
3.2 (i)	අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව	මහජන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව දස දෙනෙකුගේ උපරිමයක් විය යුතු අතර බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අට දෙනෙකුගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන නියෝගයට අනුව සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7-13 අතර වේ.	✓
3.2 (ii)	අධ්‍යක්ෂවරයකුගේ සේවා කාලය	ශ්‍රී ලංකා මහ බැංකු නියෝග ප්‍රකාරව කිසිදු අධ්‍යක්ෂවරයෙකු වසර නවයක සේවා කාලයක් ඉක්මවා නැත. අධ්‍යක්ෂවරුන් පත්කිරීම හා ධුර කාල පිළිබඳ විස්තර 39 වන පිටුවේ දැක්වේ.	✓
3.2 (iii)	මාණ්ඩලීය තුලනය	මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.	✓
3.2 (iv)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්	සියලු අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්වේ. අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් වන අතර අධ්‍යක්ෂවරුන් පස්දෙනෙක් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් වෙති. 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වැනි වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් ඔවුන් පත් කරනු ලැබේ.	✓
3.2 (v)	විකල්ප ස්වාධීන අධ්‍යක්ෂවරුන්	විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමට මහජන බැංකු පනතේ විධිවිධාන නොමැත.	N/A
3.2 (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා නිර්ණායක	1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වැනි වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සියලුම අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ.	✓
3.2 (vii)	ගණපූරණයෙන් අඩකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු බව	සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන්නන්ය. මහජන බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ නියමිත ගණපූරණය පහකි.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.2 (viii)	වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ සන්නිවේදන සහ අනාවරණ කාණ්ඩවල ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හඳුනා ගැනීම	දැනට සිටින අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 8කි. කෙසේවුවද, සභාපති හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් නම් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය ආයතනික පාලන වාර්තාවේ 37 වැනි පිටුවේ දැක්වේ.	✓
3.2 (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් පිළිබඳ විධිමත් හා විනිවිදභාවයෙන් යුත් ක්‍රියාපටිපාටිය	අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම් සිදුකරනු ලබන්නේ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 8 වැනි වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා විසිනි. 2016 දී සහ 2017 දී විෂය භාර අමාත්‍යවරයා වූයේ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයායි.	✓
3.2 (x)	අනියම් පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යක්ෂවරුන් නැවත තෝරා පත් කිරීම	විෂය භාර අමාත්‍යවරයා විසින් ඔවුන් පත් කරන නිසා මෙය අදාළ නොවේ.	අ/නො
3.2 (xi)	අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීමට හෝ ඉල්ලා අස්වීමට හේතු දැනුම්දීම	විෂය භාර අමාත්‍යවරයාට ලිඛිත දැනුම්දීමකින් අධ්‍යක්ෂවරයෙකුට සිය ධූරයෙන් ඉල්ලා අස්වීමට මහජන බැංකු පනතේ 8 වැනි වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇත. ගැසට් නිවේදනයක් පළ කිරීමෙන් අධ්‍යක්ෂවරයෙකු ඉවත් කිරීමට ද අමාත්‍යවරයාට හැකිය. අධ්‍යක්ෂවරුන් ඉල්ලා අස්වීම/ඉවත් කිරීම පිළිබඳව නියාමන බලධාරීන්ට වහාම දැනුම්දෙනු ලැබේ.	✓
3.2 (xii)	බැංකුවක අධ්‍යක්ෂවරුන් හෝ සේවකයින් වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් වීමේ තහනම	අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ දී අමාත්‍යවරයා මේ අවශ්‍යතාව සැලකිල්ලට ගනී. බැංකුව වාර්ෂිකව අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගෙන ශ්‍රී ලංකා මහ බැංකුවට යවනු ලබන ප්‍රකාශය(4.1 වගන්තියට)අනුව යම් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස පත්කරනු, තෝරාපත්කර ගනු හෝ නම්කරනු ලැබ තිබේදැයි හඳුනාගැනීමේ ක්‍රමවේදයක් බැංකුව සතු වේ.	✓
3.3	**අධ්‍යක්ෂවරුන්ගේ හැකියාව සහ යෝග්‍යතාව තක්සේරු කිරීමේ නිර්ණායක**		
3.3 (i)	අධ්‍යක්ෂවරයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය	සියලුම අධ්‍යක්ෂවරුන් වයස අවුරුදු 70ට අඩු අය වේ.	✓
3.3 (ii)	අධ්‍යක්ෂවරුන්, සමාගම් 20 කට වැඩි සංඛ්‍යාවක සහ විශේෂිත ව්‍යාපාර ආයතන වශයෙන් වර්ගීකරණය වන සමාගම් 10 කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරුන් නොවිය යුතුය	කිසිදු අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ පරිපාලිත සමාගම් ඇතුළු සමාගම් 20 කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂධූරය දරන්නේ නැත.	✓
3.4	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරනු ලබන කළමනාකරණ කාර්යයන්**		
3.4 (i)	බලය පැවරීමේ ක්‍රියාමාර්ග අවබෝධ කරගැනීම සහ අධ්‍යයනය	මහජන බැංකු පනතේ 32 වන වගන්තිය යටතේ ස්වකීය බලතල බැංකුවේ කවර හෝ නිලධාරියෙකුට පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරී ඇති අතර අවස්ථාවෝචිත පරිදි එසේ පවරන ලද බලතල සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ප්‍රත්‍යාදිශ්ඨ කිරීමත් කළ හැකිය.	✓
3.4 (ii)	බලය පැවරීම සිය කටයුතු ඉටු කිරීමට මණ්ඩලයට අවහිර නොවන ප්‍රමාණයට විය යුතුය		
3.4 (iii)	බැංකුවේ මෙහෙයුම් වලට අදාළවීම සහතික කිරීම සඳහා බලය පැවරීමේ ක්‍රියාමාර්ග කලින් කලට සමාලෝචනය කිරීම	බැංකුවේ අවශ්‍යතා සම්බන්ධයෙන් පැවරූ බලතල තවදුරටත් අදාළව පවතින බව තහවුරු කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම බලතල කලින් කලට සමාලෝචනය කරනු ලැබේ.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.5	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා**		
3.5 (i)	කාර්යභාරයන් වෙන් කිරීම	නිරණ ගැනීම එක් පුද්ගලයෙකුට පැවරීමෙන් ඇති වන සීමාරහිත බලතල වැළැක්වෙන පරිදි සභාපතිගේ සහ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගේ කාර්යභාරයන් අතර පැහැදිලි වගකීම් බෙදීමක් සඳහා මහජන බැංකු පනත විධිවිධාන සලසයි.	✓
3.5 (ii)	විධායක නොවන සභාපති	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයකු වේ.	✓
	ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත් කිරීම	සභාපති බැංකුවේ වෙනත් පරිපාලිත සමාගමක සභාපතිවරයකු වශයෙන් කටයුතු කරන බැවින් ස්වාධීන යැයි නොසැලකේ. ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත් කිරීමට බැංකුව විසින් ක්‍රියාකරනු ඇත.	✗
3.5 (iii)	සභාපතිගේ සහ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගේ අනන්‍යතාව සහ මණ්ඩල සාමාජිකයන් සමඟ ඇති කවර හෝ සම්බන්ධතා අනාවරණය කිරීම	සභාපතිගේ සහ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගේ අනන්‍යතාව වාර්ෂික වාර්තාවේ 22 සහ 23 පිටුවල පිළිවෙළින් අනාවරණය කර ඇත. මණ්ඩලයට බැඳියා ප්‍රකාශන වාර්ෂිකව ලැබෙන අතර මණ්ඩල සාමාජිකයන් සහ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී අතර පවතින කවර හෝ සම්බන්ධතා හඳුනාගැනීම සඳහා ඒවා කෙරෙහි විශ්වාසය තබයි.	✓
3.5 (iv)	මාණ්ඩලිය ස්වයං තක්සේරු ක්‍රියාවලිය	මෙම අවශ්‍යතාවය සමඟ අනුකූල වන පරිදි ස්වයං තක්සේරු ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇත.	✓
3.5 (v)	න්‍යාය පත්‍රය පිළිබඳ වගකීම සභාපති සතු වන නමුත් සමාගම් ලේකම් වෙත එය පැවරිය හැකිය	මණ්ඩල ලේකම් විසින් සභාපතිගේ අදහස් විමසා මණ්ඩල රැස්වීම්වල න්‍යායපත්‍රය සකස් කරනු ලැබේ.	✓
3.5 (vi)	අධ්‍යක්ෂවරුන්ට විධිමත් පරිදි පැහැදිලි කිරීම් සිදුකරන බවටත් ප්‍රමාණවත් තොරතුරු සපයනු ලබන බවටත් සහතික වීම	මණ්ඩලය හමුවේ පැන නගින කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට ප්‍රමාණවත් පරිදි කරුණු හා තොරතුරු ලබා දෙන බවට සභාපති වගබලා ගනී. ඒ සඳහා පහත දැක්වෙන ක්‍රියාපටිපාටි සකස් කරනු ලැබ ඇත. ● මණ්ඩලයේ රැස්වීම්වලට දින හතකට පෙර මණ්ඩල පත්‍රිකා බෙදා හරිනු ලැබේ. ● කරුණු පැහැදිලි කිරීම් හා නිරවුල් කිරීම් සඳහා කළමනාකාරිත්ව කණ්ඩායමේ අදාළ සාමාජිකයෝ සූදානම්ව සිටිති. ● බැංකුවේ කාර්යසාධනය හා ස්ථාවරත්වය තක්සේරු කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි එකඟ වූ ආකෘතියක් අනුව විධිමත් පදනමක් මත කළමනාකාරිත්ව තොරතුරු සපයනු ලැබේ. ● බැංකුවේ වියදමින් අවශ්‍යතා පදනමක් මත ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකිය.	✓
3.5 (vii)	බැංකුවේ යහපත සඳහා සියලු ම අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියාශීලි සහභාගිත්වය හා ක්‍රියා කිරීමේදී මූලිකත්වය ගැනීම දිරිගැන්වීම	අවබෝධය ඇති කරවමින් සහ අනුකූලතාව ප්‍රවර්ධනය කරමින් ස්වයං ඇගයීම් ක්‍රියාවලියේදී මේ අවශ්‍යතාව සම්බන්ධයෙන් කටයුතුකරනු ලැබේ.	✓
3.5 (viii)	විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය තක්සේරු කරන ස්වයං ඇගයීම් ක්‍රියාවලිය	ස්වයං ඇගයීම් ක්‍රියාවලිය මගින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ආවරණය වේ.	✓
3.5 (ix)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ විධායක වගකීම් සෘජු අධීක්ෂණයෙන් වැළකීම	සභාපති ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හෝ වෙනත් යම් විධායක වගකීම් අධීක්ෂණයට සම්බන්ධ නොවේ.	✓
3.5 (x)	කොටස්හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනය සහතික කිරීම	ප්‍රධාන කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලැබේ.	✓
3.5 (xi)	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී දෛනික මෙහෙයුම් භාර ඉහළ මට්ටමේ විධායකය වශයෙන් කටයුතු කරයි.	බැංකුවේ දෛනික මෙහෙයුම් කාර්යයන් ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී වෙත පැවරේ.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.6	**මණ්ඩලය විසින් පත් කරනු ලබන කමිටු**		
3.6 (i)	අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ස්ථාපනය කිරීම,ඒවායේ වගකීම් සහ වාර්තාකරණය	බැංකුවේ ව්‍යාපාර අවශ්‍යතා සපුරාලීම සඳහා ලිඛිත යොමු නිර්දේශ සහිත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු අටක් පිහිටුවනු ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සියලු ම අනුකමිටුවල ලේකම් වශයෙන් කටයුතු කරන අතර කමිටුවේ සභාපතිගේ අධීක්ෂණය යටතේ කාර්ය සටහන් හා වාර්තා පවත්වා ගෙන යයි. මේ කමිටුවල වගකීම් සහ කාර්යභාරයන්ට අදාළ ඒවායේ වාර්තා වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ. • මාණ්ඩලීය විගණන කමිටුව 56 වැනි පිටුව • මාණ්ඩලීය නාමයෝජනා කමිටුව 58 වැනි පිටුව • මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව 57 වැනි පිටුව • මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව 57 වැනි පිටුව • මාණ්ඩලීය විධායක ණය කමිටුව 58 වැනි පිටුව • මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටුව 59 වැනි පිටුව • මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුව 59 වැනි පිටුව • මාණ්ඩලීය උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව 59 වැනි පිටුව	✓
3.6 (ii)	**විගණන කමිටුව**		
අ.	සභාපතිවරයා, ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද ලත් විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වීම	කමිටුවේ සභාපති ජෙහාන් පී. අමරතුංග මහතා, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. අමරතුංග මහතා බැංකුවේ වෙනත් පරිපාලිත සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන බැවින් ස්වාධීන යැයි නොසැලකේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නිටපු සභාපතිකයෙකු වන ඔහුට මූල්‍ය හා කළමනාකරණ ක්ෂේත්‍රවල අවුරුදු 26කට වැඩි අත්දැකීම් සහ ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිපුණතා හා පළපුරුද්ද ඇත.	✓
	මණ්ඩලීය විගණන කමිටුවේ සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතු ය	මණ්ඩලීය විගණන කමිටුවේ සභාපති වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු බැංකුව විසින් පත් කරනු ඇත.	✗
ආ.	කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සමන්විත වීම	සියළුම කමිටු සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.	✓
ඇ.	විගණන කමිටුවේ කාර්යයන්	විගණන කමිටුව පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරයි. (i) විගණකවරුන්ට වරින් වර නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම (ii) අදාළ විගණන ප්‍රමිතීන් යොදා ගැනීම 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 34 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. බාහිර විගණක වශයෙන් වෙනත් ඕනෑම සුදුසුකම් ලත් විගණකවරයකු ඔහු විසින් පත් කිරනු ලැබිය හැකි ය. එබැවින්, බාහිර විගණකවරයකු යොදවා ගැනීමේදී කමිටුව ඉටු කළ යුතු කාර්යභාරයක් නැත.	✓
ඈ.	බාහිර විගණකගේ ස්වාධීනත්වය හා විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලීන්හි ඵලදායීත්වය සමාලෝචනය හා අධීක්ෂණය	බැංකුවේ විගණක වන්නේ විගණකාධිපතිවරයා නිසා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔහුගේ ස්වාධීනත්වය සහ ඵලදායීත්වය තහවුරු කර තිබේ. බාහිර විගණක වශයෙන් අර්නස්ට් ඇන්ඩ් යංග් සමාග මේ ස්වාධීනත්වය සහ ශ්‍රී ලංකා විගණක ප්‍රමිතිවලට අනුකූලව බාහිර විගණනය ඔවුන් විසින් ඉටුකරනු ඇති බවට නියෝජනයන් ලබා ගැනීමෙන් අනතුරුව 2017 වර්ෂයේ බාහිර විගණනය ඉටුකිරීම සඳහා එකී සමාගම විගණකාධිපතිවරයා විසින් පත් නරන ලදී.	✓
ඉ.	බාහිර විගණකවරයකු විසින් විගණක නොවන සේවා සැපයීම	විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වන බැවින් මෙය පැන නොනගී.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ඊ.	විගණන විෂයපථය නියම කිරීම	විගණනයේ විෂයපථය හා ප්‍රමාණය විගණකාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබ ඇත.	✓
උ	බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය	බැංකුවේ මූල්‍ය ප්‍රකාශන වල සහ එහි වාර්ෂික වාර්තාවේ සහ ගිණුම්වල අනාවරණ කාර්යයන් සඳහා සකස් කරනු ලබන කාර්තුමය වාර්තා වලත්, ඒවායේ ඇතුළත් වන වැදගත් මූල්‍ය වාර්තාකරණ නිගමනවලත්, අවංකභාවය අධීක්ෂණය කිරීම සඳහා කමිටුව බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කරයි. මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර බැංකුවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් සහ කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීමේ දී කමිටුව පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරයි. (i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර (ii) ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සහ භාවිතයන්හි කවර හෝ වෙනස්කම් (iii) විගණනයෙන් පැන නගින මූලික ගැලපුම් (iv) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය සහ (v) අදාළ ගණකාධිකරණ ප්‍රමිතීන්ට හා අනෙකුත් නෛතික අවශ්‍යතාවන්ට අනුකූලතාව විගණන කමිටුව ඉහත සඳහන් කරුණු පිළිබඳ සිය නිර්දේශ මණ්ඩලයට ඉදිරිපත් කරයි.	✓
ඌ	අතුරු සහ අවසන් විගණන පිළිබඳව බාහිර විගණක සමඟ සාකච්ඡා කිරීම	විගණකාධිපතිවරයාගේ නියෝජිතවරියක් බැංකුවේ සිය කාර්යාලය පවත්ගෙනයන අතර කමිටුව නිරන්තරයෙන් අය හමුවී සාකච්ඡා කරයි. මාණ්ඩලීය විගණන කමිටු රැස්වීම් සඳහා ආරාධනය මත ඇය සහභාගී වේ.	✓
එ	කළමනාකරණ ලිපිය සහ බැංකුවේ ප්‍රතිචාරය සමාලෝචනය කිරීම	බාහිර විගණක විසින් නිකුත් කරන ලද කළමනාකරණ ලිපිය සහ ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය මණ්ඩලීය විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත.	✓
ඒ	අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කිරීම	අභ්‍යන්තර විගණන කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීම පැවරී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වන අතර ඒ සම්බන්ධයෙන් කමිටුව පහත සඳහන් කාර්යයන් ඉටු කරයි: • අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂයපථය, කාර්යභාරය හා සම්පත්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම හා ස්වකීය කාර්යය ඉටු කිරීමට අවශ්‍ය අධිකාරී බලය දෙපාර්තමේන්තුව සතු වන බවට සැහීමට පත්වීම • අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත නිසි ක්‍රියාමාර්ග ගනු ලබන බවට වගබලා ගැනීම • අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානිගේ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්යසාධන අගැයීම සමාලෝචනය කිරීම • අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානිගේ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බැහැරින් ලබා ගන්නා ලද සේවකයන්ගේ කවර හෝ පත්වීම් හෝ සේවය අවසන් කිරීම් නිර්දේශ කිරීම • ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත්කර ඇති බවට වගබලා ගැනීම • ඉල්ලාඅස්වීම් පිළිබඳව හේතු දැක්වීමට එසේ ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා බැහැරින් ලබා ගන්නා ලද සේවකයන්ට අවස්ථාව ලබා දීම. • විගණනය කිරීමේදී විගණකවරුන් හැකියාව, වෘත්තීමය සැලකිල්ල හා මධ්‍යස්ථබව පෙන්නුම් කරන බව හා ඔවුන් විගණනයට ලක් කෙරෙන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන බව තහවුරු කිරීම. 2017 වර්ෂය තුලදී අභ්‍යන්තර විගණක කටයුතු සඳහා බැහැරින් ලබා ගන්නා ලද සේවකයන් යොදා නොගැණුනි.	✓
ඔ	අභ්‍යන්තර විමර්ශන	එවැනි විමර්ශන කිසිවක් 2017 වර්ශයේදී පවත්වා නැත.	✓
ඕ	විගණන කමිටු රැස්වීම්වලට සහභාගි වූ අය	මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොමැති බැවින් මෙය අදාළ නොවේ.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ක	ප්‍රකාශිත අධිකාරී බලය, සම්පත් සහ තොරතුරු සඳහා ප්‍රවේශය	මාණ්ඩලීය විගණන කමිටුවේ නිර්ණේය විෂයය විගණන කමිටු වාර්තාවේ 56 වැනි පිටුවේ දැක්වේ. ඊට ඇතුළත් වන්නේ: (i) සිය යොමු නිර්දේශ සීමාව තුළ ඕනෑ ම කරුණක් විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරී බලය (ii) එසේ කිරීමට ඊට අවශ්‍ය සම්පත් (iii) තොරතුරුවලට පූර්ණ ප්‍රවේශය සහ (iv) බාහිර ව්‍යාත්තීය උපදෙස් ලබා ගැනීමේ සහ අවශ්‍ය නම්, අදාළ පළපුරුද්ද ඇති බාහිර පුද්ගලයන්ට පැමිණීමට ආරාධනා කිරීමේ බලය ය.	✓
ඛ	නිතිපතා පැවැත්වෙන රැස්වීම්	මාණ්ඩලීය විගණන කමිටුව කාර්තුමය පදනමක් මත නිතිපතා රැස්වේ. වසර තුළ දී රැස්වීම් හතරක් පවත්වන ලදී. සාකච්ඡා කිරීමට නියමිත කරුණු පිළිබඳව විගණන කමිටුවට විධිමත් ලෙස දැනුම් දෙනු ලබන අතර, එහි කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමන, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලබන රැස්වීම් කාර්ය සටහන්වල වාර්තා කරනු ලැබේ.	✓
ග	වාර්ෂික වාර්තාවේ අනාවරණය කිරීම	56 වැනි පිටුවේ දැක්වෙන විගණන කමිටු වාර්තාවට පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ. (i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර සහ (ii) වසර තුළදී පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව එවැනි රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පිළිබඳ විස්තර 37 වැනි පිටුවේ දැක්වේ.	✓
ඝ	රැස්වීම් කාර්යසටහන් පවත්වාගෙන යාම	අනුකමිටුවලද ලේකම් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, කමිටු රැස්වීම්වල වාර්තා සහ විස්තරාත්මක කාර්යසටහන් පවත්වාගෙන යයි.	✓
ඞ	කල්තබා අන්තරාය හැඟවීමේ ප්‍රතිපත්තිය සහ බාහිර විගණක සමග සබඳතා	මහජන බැංකුවේ අන්තරාය හැඟවීමේ ප්‍රතිපත්තිය අංක138/2013 දරන මණ්ඩලීය පත්‍රිකාවෙන් අනුමත කරන ලදී. මුල්‍ය වාර්තාකරණයේ, අභ්‍යන්තර පාලනයේ සිදුවිය හැකි සම්මතයට පටහැනි කරුණු හෝ වෙනත් කරුණු පිළිබඳව විශ්වාසයෙන් යුතුව සිය කනස්සල්ල පළ කිරීමට බැංකුවේ සේවකයෙකුට හැකිය. එවැනි කරුණු පිළිබඳව සාධාරණ හා ස්වාධීන විමර්ශනය සහ යෝග්‍ය පසු විපරම් කටයුතු සඳහා විධිමත් පරිදි විධිවිධාන සලසා ඇත. වැදගත් නිරීක්ෂණ පසු විපරම් කටයුතු සඳහා මණ්ඩලීය අභ්‍යන්තර විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. විගණකාධිපති සමග බැංකුවේ සම්බන්ධතා අධීක්ෂණය කිරීමේ ප්‍රමුඛ නියෝජිත ආයතනය වශයෙන් ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව කටයුතු කරයි.	✓
3.6 (iii)	**මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**		
අ.	අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි සහ බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සම්බන්ධයෙන් වන පාරිශ්‍රමික ප්‍රතිපත්තිය	අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික තීරණය කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසින් නියම කරනු ලැබ ඇති මාර්ගෝපදේශවලට අනුකූලවය. ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරිගේ පාරිශ්‍රමිකය නිගමනය කරනු ලබන්නේ සාමූහික හිවිසුම පදනම මත මාණ්ඩලීය මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව/මණ්ඩලය විසිනි. තමාට අදාළ කරුණු සාකච්ඡාවට භාජන වන අවස්ථාවල දී හැර ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි කමිටුවේ සියලුම රැස්වීම්වලට සහභාගිවේ. 57 වැනි පිටුවේ දැක්වෙන මණ්ඩලීය මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව ද බලන්න.	✓
ආ.	අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා නියමිත අරමුණු සහ ඉලක්ක	අධ්‍යක්ෂවරුන් සියලු දෙනාම විධායක නොවන නිසා මෙය අදාළ නැත. ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු සහ ඉලක්ක නියම කරනු ලබන්නේ උපාය මාර්ගික සැලැස්ම පදනම් කරගෙන මූලික කාර්යසාධන දර්ශක සම්බන්ධ කර ගනිමිනි.	✓
ඇ.	ප්‍ර.වි.නිලධාරිගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධන අගැයීම	නියමකළ අරමුණු හා ඉලක්කවලට එදිරිව ප්‍ර.වි.නිලධාරිගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ 2017 වර්ෂයේ කාර්යසාධනය අගැයීම මණ්ඩලය විසින් 2018 දෙවන කාර්තුවේදී සිදු කරනු ඇත.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ඈ.	තමාට අදාළ කරුණු සාකච්ඡා වන අවස්ථාවලදී හැර ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී කමිටුවේ සියලු ම රැස්වීම්වලට සහභාගි විය යුතුය.	ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී, තමාට අදාළ කරුණු සාකච්ඡාවට ගැනෙන අවස්ථාවල දී හැර කමිටු රැස්වීම් සියල්ලට ම සහභාගි විය යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු නිර්ණය විෂයය මගින් විධිවිධාන සලසා ඇත.	✓
3.6 (iv)	**නාම යෝජනා කමිටුව**		
	අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම	මහජන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව විෂයය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබේ. ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය පටිපාටියක්/යෝජනා ක්‍රමයක් ඇත.	✓
අ.	අධ්‍යක්ෂවරුන් නැවත තෝරා පත් කිරීම	විෂයභාර අමාත්‍යවරයා අධ්‍යක්ෂවරුන් පත් කරන නිසා පැහැ නොනගී.	✓
ආ.	ප්‍ර.වි.නි./ සාමාන්‍යාධිකාරී ඇතුළු ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට පත්කිරීම සඳහා යෝග්‍යතා නිර්ණායක	සාමාන්‍යාධිකාරී පත් කරනු ලබන්නේ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ බැංකුවේ පිළිගත් පටිපාටිය පදනම් කරගෙනය. අනෙකුත් ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට තෝරා ගනු ලැබීම හෝ උසස් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය අනුමත කළ උසස්වීම් යෝජනා ක්‍රමවල සඳහන් වේ.	✓
ඇ.	යෝග්‍ය හා සුදුසු නිලධාරීන්	3 (3) නියෝගයේ දැක්වෙන නිර්ණායකවල නිශ්චිතව දැක්වෙන පරිදි අධ්‍යක්ෂවරුන් එම ධූරය දැරීමට යෝග්‍ය හා සුදුසු පුද්ගලයින් බව සහතික කර ගැනීම සඳහා ඔවුන්ගෙන් චාර්ෂික ප්‍රකාශන ලබා ගන්නා අතර ව්‍යවස්ථාවල දැක්වෙන පරිදි ඒවා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යවනු ලැබේ.	✓
ඈ.	අනුප්‍රාප්ති සැලැස්ම සහ නව විශේෂඥතාව	අමතර/නව විශේෂඥතාවයේ අවශ්‍යතාව මණ්ඩලය හෝ එහි කමිටු විසින් හඳුනා ගනු ලැබිය හැකි අතර ඒ සම්බන්ධයෙන් සුදුසු කටයුතු ඉටු කරන මණ්ඩලීය නාමයෝජනා කමිටුවේ අවධානයට ඒවා යොමු කරනු ලැබේ. ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අනුප්‍රාප්ති සැලැස්මක් බැංකුව සකස් කර ඇත.	✓
ඉ	කමිටු සභාපති සහ වඩා යෝග්‍ය ලෙස අධ්‍යක්ෂවරුන් බහුතරය ස්වාධීන විය යුතුය. ආරාධනය මත ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීට රැස්වීම්වලට සහභාගිවිය හැකිය.	සභාපති සහ සාමාජිකයෝ විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති. යොමු නිර්දේශ පදනම මත, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී කමිටුවේ සාමාජිකයකු වෙයි. ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයක් කමිටුවට පත් කිරීමට බැංකුව විසින් කටයුතු කරනු ඇත	✗
3.6 (v)	**සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව/මණ්ඩලීය අවදානම් කළමනාකරණ කමිටුව**		
අ.	සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ සංයුතිය කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩලීය අවදානම් කළමනාකරණ කමිටුව මණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ	විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් හා අනුකූලතා) යන අයගෙන් කමිටුව සමන්විත වේ. ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම්, කීර්තිනාම සහ උපායමාර්ගික අවදානම් අධීක්ෂණය කරන අනෙකුත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට විධිමත් පදනමක් මත රැස්වීම්වලට සහභාගි වන ලෙස ආරාධනා කරනු ලැබේ. කමිටුවට පැවරී ඇති බලතල හා වගකීම් රාමුව තුළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ කමිටුව සමීපව කටයුතු කරයි.	✓
ආ.	අවදානම් තක්සේරුව	අවදානම් කළමනාකරණය හා තක්සේරුව සඳහා රාමුවක් සපයන කමිටුව විසින්, ණය අවදානම් කළමනාකරණය, වෙළඳපොළ අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති අනුමත කරනු ලැබ ඇත. ඒ අනුව, මාසික පදනමක් මත අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පූර්ව ස්ථාපිත අවදානම් දර්ශක (ආතති පරීක්ෂණ වාර්තාව) පිළිබඳ තොරතුරු සමාලෝචනය කරනු ලබන අතර යොමු නිර්දේශ ප්‍රකාරව සිය වගකීම් ඉටු කරමින් කාර්තුමය පදනමක් මත, මණ්ඩලීය සංකලිත අවදානම් කමිටුවේ සමාලෝචනය සඳහා සාරාංශයක් ඉදිරිපත් කරනු ලැබේ.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ඇ.	අවදානම් පිළිබඳ කළමනාකරණ මට්ටමේ කමිටු සමාලෝචනය	විශේෂිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචි ප්‍රකාශනයේ දැක්වෙන ගුණාත්මක සහ ප්‍රමාණාත්මක අවදානම් සීමාවන් තුළ ඒවා කළමනාකරණය කිරීමේ දී, කළමනාකරණ මට්ටමේ කමිටු වන වත්කම් සහ බැරකම් කමිටුවේ සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුවේ (ORMC) ප්‍රමාණවත්භාවය සහ ඵලදායිත්වය තක්සේරු කිරීම සඳහා එකී කමිටුවල වාර්තා කමිටුව විසින් සමාලෝචනයට ලක් කරනු ලැබේ. කළමනාකරණ මට්ටමේ සියලුම කමිටුවල වත්මන් නිර්ණය විෂයන්ට අනුව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සළුලදායිත්වය කමිටුව විසින් සමාලෝචනයට ලක් කරනු ලැබ ඇත.	✓
ඈ.	විචක්ෂණ මට්ටම් ඉක්මවන අවදානම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය	එක් එක් අවදානම් කාණ්ඩය යටතේ අනාවරණ මට්ටම්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මාසික පදනමක් මත, දැරිය හැකි මට්ටම් සමඟ අධීක්ෂණය කරනු ලබන අතර මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටු කාර්තුමය රැස්වීම්වල දී විස්තරාත්මකව සාකච්ඡා කරනු ලැබේ. බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කරනු ලබන විචක්ෂණ මට්ටම්වලට වඩා ඉහළ මට්ටම්වල එවැනි අවදානම් තිබෙන අවස්ථාවල දී විශේෂිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කමිටුව ක්ෂණික ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග ගනී.	✓
ඉ	රැස්වීම් පැවැත්වෙන වාර ගණන	කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වන අතර අවශ්‍ය නම් අමතර රැස්වීම් සඳහා ද දින යොදා ගනී. යාවත්කාල කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ඇතුළුව අවදානම් කළමනාකරණයේ සියලු ම අංශ න්‍යාය පත්‍රයට ඇතුළත්වේ. 2017 දී කමිටුව පස් වරක් රැස්විය.	✓
ඊ	විශේෂිත අවදානම් හඳුනාගැනීමට හෝ ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වූ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග	විශේෂිත අවදානම් හඳුනාගැනීමට අසමත් වීම සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සඳහා කමිටු සාමාජිකයින් සතු වගකීම මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ යොමු නිර්දේශවලට ඇතුළත්වේ. මේ සඳහා විධිමත් ලේඛනයක විනය ක්‍රියාපටිපාටි සකස් කරනු ලැබ ඇත.	✓
උ	අවදානම් තක්සේරු වාර්තාව මණ්ඩලයට ඉදිරිපත් කිරීම	සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරනු ලබන අවදානම් තක්සේරු වාර්තා, රැස්වීම් අවසන් වූ වහාම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.	✓
ඌ	අනුකූලතා කාර්යය	නීති, රෙගුලාසි, නියාමන, මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ ව්‍යාපාර මෙහෙයුම්වල සියලු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අනුමත ප්‍රතිපත්ති යන කරුණුවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීම සඳහා අනුකූලතා කාර්යයක් ස්ථාපනය කරනු ලැබ ඇත. මේ කාර්යයේ මූලිකත්වය දරන්නේ සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරන (ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු වන) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතා) විසිනි. මාසයක් හැර මාසයක අනුකූලතා තත්ත්වය දැක්වෙන ව්‍යවස්ථාපිත සහ අනිවාර්ය වාර්තාකරණ අවශ්‍යතා සම්බන්ධයෙන් අනුකූලතා නිලධාරියාගේ වාර්තාව මණ්ඩලය හා කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.	✓
3.7	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**		
3.7 (i)	නියෝගයට අනුව සම්බන්ධිත පාර්ශව	ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයට අනුව සම්බන්ධිත පාර්ශ්ව හඳුනාගැනීම සහතික කිරීම සඳහා මණ්ඩලය අනුමත කරන ලද ක්‍රියාවලියක් ක්‍රියාත්මකව පවතී. සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ තමන් උසුලන තනතුරු සම්බන්ධයෙන් මණ්ඩලයේ සියලු සාමාජිකයන් පත් කරනු ලබන අවස්ථාවේදී සහ ඉන් පසු වාර්ෂිකව ද මණ්ඩල ලේකම්ට ප්‍රකාශන සිදු කළ යුතුය. අදාළ ගනුදෙනු පිළිබඳ තොරතුරු දැනගත හැකි වන පරිදි මේ තොරතුරු මුදල් අංශයට සපයනු ලැබේ. වර්ෂය තුළ යම් වෙනසක් සිදු වුවහොත් අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ට වැඩිදුර ප්‍රකාශනයක් සිදු කළ යුතුය. සම්බන්ධිත පාර්ශ්වයන්ට ණය දීම සාකච්ඡා වන අවස්ථාවලදී කවර හෝ ආකාරයක බැදියා පිළිගැටුමක් සිදුවීම වැළැක්වීම සඳහා අධ්‍යක්ෂවරු එවැනි රැස්වීම්වලට සහභාගි වීමෙන් වැළකෙති.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.7 (ii)	නියෝගවලින් ආවරණයවන සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු	බැංකුවේ පරමාර්ථ සඳහා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ නිර්වචනයන් - (අ) ලබා දිය හැකි උපරිම ප්‍රමාණය පිළිබඳව මූල්‍ය මණ්ඩල නියෝගවල අර්ථ දක්වා ඇති කවර හෝ වර්ගයක පහසුකම් ප්‍රදානය කිරීම, (ආ) තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන වශයෙන් බැංකුවේ යම් බැරකම් ඇති කිරීම, (ඇ) බැංකුවට සැපයෙන හෝ බැංකුවෙන් ලබා ගැනෙන මූල්‍ය හෝ මූල්‍ය නොවන කිසියම් සේවා සැපයීම, (ඈ) එවැනි සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලබා දිය හැකි විභව්‍ය වශයෙන් හිමිවත්, රහස්‍ය හෝ වෙනත් අයුරින් සංවේදී තොරතුරු බෙදා ගැනීමට තුඩු දිය හැකි වාර්තාකරණයන් හා තොරතුරු ප්‍රවාහයන් බැංකුව සහ යම් සම්බන්ධිත පාර්ශ්වයන් අතර නිර්මාණය කිරීම හෝ පවත්වා ගෙන යාම, ඇතුළත් වේ.	✓
3.7 (iii)	විශේෂ ලෙස සැලකීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ ප්‍රශස්ත චර්යා සංග්‍රහයේ 2.14 වගන්තියට අනුව සම්බන්ධිත පාර්ශ්ව ගණුදෙනු වර්ග හඳුනාගැනීම සඳහාත්, බැංකුව සමඟ එවැනි ආකාරයේ ගණුදෙනු සිදු කරන බැංකුවේ සෙසු ගණුදෙනුකරුවන්ට සලකනු ලබන ආකාරයට වැඩි විශේෂයක්කොට සලකනු ලබන ගණුදෙනුවල බැංකුව නොයෙදෙන බව තහවුරු කිරීම සඳහාත් ලිඛිත ප්‍රතිපත්තියක් යොදාගනු ලැබ ඇත. එවැනි විශේෂයක්කොට සැලකීම් අධීක්ෂණය කිරීම සඳහා නිවාරණ හා හෙළිදරව්කර ගැනීමේ කාර්ය පටිපාටියක් ක්‍රියාවට නංවනු ඇත.	✗
3.7 (iv)	අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට පහසුකම් ප්‍රදානය කිරීම	අධ්‍යක්ෂවරයකුට හෝ අධ්‍යක්ෂවරුන්ගේ සමීප ඥාතීන්ට පහසුකම් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාපටිපාටියක් සකස් කර ඇත. අදාළ අධ්‍යක්ෂවරයා හැර අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් එවැනි ප්‍රතිලාභයකට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී එවැනි පහසුකමකට අනුමැතිය ලබාදිය යුතුය. එකී ප්‍රතිලාභ සුරක්ෂිත කෙරෙනුයේ මූල්‍ය මණ්ඩලය විසින් කලින් කලට නිගමනය කරනු ලැබිය හැකි සුරැකුමක් මගිනි.	✓
3.7 (v)	බැංකුවේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පසුව පත්කරනු ලබන පුද්ගලයින්ට හෝ පුද්ගල ආයතනවලට හෝ පුද්ගලයින්ගේ සමීප ඥාතීන්ට ප්‍රදානය කරනුලබන ණය පහසුකම්	බැංකුව තුළ එබඳු අවස්ථාවක් මෙතෙක් පැන නැඟී නැත. මේ රෙගුලාසියට අනුකූල වීම සඳහා ක්‍රියාමාර්ග සැකසී තිබේ. පත් කරනු ලබන අවස්ථාවේ දී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සියලුම අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන/දිවුරුම් ප්‍රකාශ ලබාගනී. මූල්‍ය මණ්ඩලය විසින් අර්ථ නිරූපණය කරනු ලැබ ඇති පරිදි අවශ්‍යතාව පැන නගින්නේ නම්, පත්වීම් දින සිට වසරක් තුළ අවශ්‍ය සුරැකුම ලබා ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව බැංකු සේවකයෝ දැනුවත්ව සිටිති.	✓
3.7 (vi)	බැංකු සේවකයන්ට හෝ ඔවුන්ගේ සමීප ඥාතීන්ට විශේෂිත ප්‍රතිලාභ හෝ පහසුකම්	1. බැංකුවේ සේවා නියුක්තිකයන් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ හැර 2. ඔවුන්ගේ සමීපඥාතීන් හෝ 3. බැංකු සේවකයන්ට හෝ සමීප ඥාතීන්ට එමඟින් සැලකියයුතු ප්‍රයෝජන අත්වන කවර හෝ ප්‍රතිලාභයක් සඳහා කිසිදු විශේෂකොට සැලකීමක්/පහසුකමක් ලබාදෙනු නොලැබේ. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් නිකුත්කර ඇත.	✓
3.7 (vii)	ණය පහසුකම් ප්‍රේෂණය මූල්‍ය මණ්ඩල අනුමැතියට යටත් වීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ ප්‍රශස්ත චර්යා සංග්‍රහයේ 2.14 ඌ වගන්තියට අනුව මේ සම්බන්ධයෙන් කාර්යපටිපාටියක් සකස්කරනු ලැබ ඇත.	✓

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
3.8	**අනාවරණයන්**		
3.8 (i)	වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පළ කිරීම	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලැබ ඇති ආකෘති සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය ගිණුම් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සකස් කොට ප්‍රකාශයට පත් කරනු ලැබේ.	✓
3.8 (ii)	වාර්ෂික වාර්තාවේ අනාවරණයන්		✓
අ.	වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ විශේෂිත අනාවරණයන් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව බවට ප්‍රකාශනයක් කිරීම	අනුකූලව කටයුතු කරන ලදී. 197 වැනි පිටුවේ දැක්වෙන මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීමෙහි මේ පිළිබඳ ප්‍රකාශනයක් ඇතුළත් වේ.	✓
ආ.	බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ මණ්ඩලයේ වාර්තාව	මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතික වීමක් සැපයෙන පරිදි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම්කරනු ලැබ ඇති බවත්, අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව බාහිර පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇති බවත් මණ්ඩලයේ පහත දැක්වෙන වාර්තා සනාථ කරයි: • 60 සහ 61 පිටුවල දැක්වෙන අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය • 197 පිටුවේ දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය	✓
ඇ.	අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායිත්වය පිළිබඳව බාහිර විගණකගේ සහතිකය	බැංකුව, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයන්හි ඵලදායීත්වය පිළිබඳව විගණකාධිපතිගෙන් සහතිකයක් ලබා ගෙන ඇති අතර එය සහ 60 සහ 61 පිටුවල පළ වේ.	✓
ඈ.	අධ්‍යක්ෂවරුන්ගේ නම්, යෝග්‍යතාව, සුදුසුකම, බැංකුව සමඟ ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවනු ලබන මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළත් අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර	අධ්‍යක්ෂවරුන් පිළිබඳ විස්තර 22 සහ 23 පිටුවල දැක්වේ. බැංකුව සමඟ ඇති ගිවිසුම්වලට අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම් පහත වගුවේ දැක්වේ.	✓

	ණය		තැන්පතු		වන්දි				
අධ්‍යක්ෂවරුන්ගේ ගණුදෙනු සාරාංශය	31.12.2017 දිනට ශේෂය	වර්ෂයේ පොළිය	31.12.2017 දිනට ශේෂය	වර්ෂයේ පොළිය	කෙටි කාලීන ප්‍රතිලාභ	පශ්චාත් රැකියා නියුක්ත ප්‍රතිලාභ	වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ	රැකියාව අවසන් කිරීමේ ප්‍රතිලාභ	කොටස් පාදක ගෙවීම්
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
එකතුව	2,251	290	4,163	152	4,640	–	–	–	–

බැංකුව විසින් ගෙවන ලද පාරිශ්‍රමික 230 පිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 12වන සටහනේ දැක්වේ.

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ඉ	එක් එක් කාණ්ඩයේ සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රදානය කරන ලද මුළු ණය පහසුකම් බැංකුවේ විධිමත් ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් වශයෙන්	එක් එක් කාණ්ඩයේ සම්බන්ධිත පාර්ශ්වයන්ට 2017 වසර තුළ දී ප්‍රදානය කරන ලද මුළු ශුද්ධ පහසුකම් ප්‍රමාණය බැංකුවේ විධිමත් ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් වශයෙන් පහත දැක්වේ.	✓

	රු. '000	%
ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට සහ ඔවුන්ගේ සමීප පවුලේ සාමාජිකයන්ට	15,354	0
පරිපාලිත සමාගම්වලට	11,966,796	15
ආශ්‍රිත සමාගම්වලට	–	–
රජයට හා රජයට සම්බන්ධ ආයතන වලට	765,679,038	987

වගන්තිය	මූලධර්මය	අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලව ක්‍රියාකර ඇත
ඊ	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට දෙන ලද පාරිශ්‍රමිකවල සහ ඔවුන් සමග කරන ලද ගනුදෙනුවල සමාහාර වටිනාකම්	2017 වසර තුළ බැංකුව විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට (ඔවුන්ගේ සමීප පවුල් සාමාජිකයන් ඇතුළු) ගෙවන ලද සහ ඔවුන් සමඟ කරන ලද ගනුදෙනුවල සමාහාර මුදල් ප්‍රමාණය පහත දැක්වේ.	✓

	රු. '000
කෙටි-කාලීන රැකියා නියුක්ත ප්‍රතිලාභ	151,965
පශ්චාත් රැකියා නියුක්ත ප්‍රතිලාභ	–
එකතුව	151,965

ඊට අමතරව, බැංකුවේ අනුමත ප්‍රතිලාභ සැලැස්මට අනුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට වාහන පාවිච්චිය ඇතුළු මූල්‍ය නොවන ප්‍රතිලාභ ගෙවනු ලැබ ඇත.

	රු. '000
ණය	13,855
අයිරා පහසුකම්	–
ණයකාඩ් පත්	1,499
තැන්පතු	99,888
ණයකර	–
ලබාගෙගත් පහසුකම්	–

උ	අනුකූලතාව පිළිබඳ බාහිර විගණකගේ සහතිකය	බැංකුව, ආයතනික පාලන නියෝගයට අනුකූලව විගණකාධිපතිවරයාගේ සහතිකය ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියලුම නිරීක්ෂණ මේ ආයතනික පාලන වාර්තාවේ අන්තර්ගත වී ඇති අතර කිසියම් නිර්දේශ සම්බන්ධයෙන් 2018 දී කටයුතු කරනු ලැබේ.	✓
ඌ	විවක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි. නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූලතාව සනාථ කරන වාර්තාව	විවක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූලතාව සම්බන්ධයෙන් පිළිබඳ පැහැදිලි විස්තර 197 පිටුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වේ. වසර තුලදී අනුකූලතාවයෙන් බැහැර වූ අවස්ථා කිසිවක් නොමැත.	✓
එ	අනනුකූලතා වාර්තාව	ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පෙන්වාදී ඇති බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතීන්හි හෝ අනනුකූලතාව පිළිබඳ ගැටලුකාරී අධීක්ෂණ ඌණතාවන් කිසිවක් නොවුණි.	✓

සටහන:

✓ *අනුකූලව කටයුතු කර ඇත*

× *අනුකූලව කටයුතු කර නැත*

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටු වාර්තාව (BAC)

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සම්බන්ධයෙන් වන 2017 අංක 11 දරන බැංකුකරණ පනත් නියෝගය, සංයුක්ත පාලනය, විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ මාණ්ඩල විගණන කමිටුව ස්ථාපනය කරන ලදී. අධ්‍යක්ෂ මාණ්ඩල විගණන කමිටුවේ කටයුතු පදනම් වූයේ කමිටුව ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගනු ලැබූ ප්‍රඥප්තිය මතය.

වර්ෂය අවසානයේ දී කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

- ජෙහාන් පී. අමරතුංග මහතා, සභාපති
- පී.ඩී. චන්ද්‍රා ඒකනායක මහත්මිය
- කේ'ඩී.එන්. රන්පිත් අසෝක මහතා

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙකි (2).

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විගණන කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කරයි. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) සහ සහකාර සාමාන්‍යාධිකාරි (අනුකූලතා) විගණන කමිටු රැස්වීම් වලට ආරාධනය මත සහභාගි වෙති. රජයේ විගණන අධිකාරි ද මේ රැස්වීම් වලට සහභාගි වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විශේෂයෙන් -

- ව්‍යවස්ථාව යටතේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවයට අනුකූලතාව සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම ද,
- අභ්‍යන්තර පාලනය සහ ව්‍යාපාර අවදානම් කළමනාකරණ පද්ධතිය පරීක්ෂා කිරීම ද,
- බාහිර සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් සමාලෝචනය ද,
- නීති හා රෙගුලාසිවලට සහ විශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූලතාව අධීක්ෂණය කිරීම සඳහා සකස් කර ඇති ක්‍රියාපටිපාටි සමාලෝචනය ද සිදු කරයි.

විමසුමට ලක්වන වර්ෂය තුළ දී කමිටුව පහත දැක්වෙන කාර්යයන් ඉටු කළේය:

අ. 2017 වසර සඳහා බැංකුවේ අවදානම් ක්ෂේත්‍ර සම්බන්ධ අවදානම් පැතිකඩ පදනම් කරගෙන සකස් කරන ලද වාර්ෂික විගණන සැලැස්ම අනුමත කිරීම

ආ. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) වගන්තිය ප්‍රකාරව 2016 වසර සඳහා නිකුත් කරන ලද කළමනාකරණ ලිපිය සහ විගණකාධිපති වාර්තාව හා ඊට ලද ප්‍රතිචාර සමාලෝචනය කිරීම

ඇ. 2017 වසර සඳහා බැංකුවේ කාර්තුමය මූල්‍ය සාධනය සමාලෝචනය කර මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

ඈ. 2015/16 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී සහ පසු විපරම් පරීක්ෂණවල දී මතු කරනු ලැබූ ගැටලු සමාලෝචනයට හා සාකච්ඡාවට භාජන කර නිවැරදි කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම

ඉ. අභ්‍යන්තර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වාරිකව සමාලෝචනය කිරීම

ඊ. තොරතුරු පද්ධති ක්‍රියාපටිපාටි සමාලෝචන සහ සුදුසු වෙනස්කම් නිර්දේශ කිරීම සහ ඒවා ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීම.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය තුළ රැස්වීම් හතරක් (04) පවත්වන ලදී. අභ්‍යන්තර විගණන වාර්තා, ඒවායේ නිරීක්ෂණය වූ ඌනතා, අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් දක්වන ලද ප්‍රතිචාර සමාලෝචනය කළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, නිරීක්ෂණය කරන ලද ඌනතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග අධීක්ෂණය කළේය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ වාර්තා මණ්ඩලයේ දැන ගැනීම සඳහා වාර්තා කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා විසින් සහ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ වාර්තාවේ විගණකාධිපතිවරයා විසින් මතු කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් 2017 වසර තුළ දී කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සලකා බැලිය.

විගණන පරමාර්ථය සඳහා විගණකාධිපතිවරයාට අවශ්‍ය වන සියලු තොරතුරු හා ලේඛන සැපයීමටත් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා ගණකාධිකාරණ ප්‍රමිතීන්ට අනුකූල වීමටත් මාණ්ඩලික විගණන කමිටුව සහතික විය. ප්‍රමාණවත් පාලනයක් සහ ක්‍රියාපටිපාටි නිසි පරිදි ක්‍රියාත්මකව පවතින බවත්, සියලු වැදගත් කරුණු වලදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තියට අනුකූල වූ බවත් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අදහසය.

ජෙහාන් පී. අමරතුංග
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු (BHRRC) වාර්තාව

විෂය පථය

මානව සම්පත් හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති සකස් කිරීමේත් මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් උපායමාර්ග ආරම්භ කර ක්‍රියාත්මක කිරීමේත් වගකීම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ වගකීම වේ. එම කමිටුව විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති නිතිපතා සමාලෝචනය කරනු ලබන බවටත්, සියලු අවස්ථාවන්හි දී ඒවාට අනුකූල වන බවටත් කමිටුව සහතික වේ.

බඳවාගැනීම්, වැටුප් තීරණය කිරීම සහ සේවකයන්ට අනෙකුත් ප්‍රතිලාභ යන කරුණු සම්බන්ධයෙන් කමිටුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. විධායක කළමනාකාරිත්වයේ සේවා දිර්ඝ කිරීම් සලකා බැලීමට හා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට ද කමිටුවට අධිකාරී බලය පැවරී තිබේ.

කමිටුව ආයතනික සහ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයින් සම්බන්ධ රැකියා ගිවිසුම් සමාලෝචනය භාරව සිටී.

සංයුතිය

යටත් පිරිසෙයින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි (ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි) යන අයගෙන් කමිටුව සමන්විතය. මාණ්ඩලීය මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ වර්තමාන සාමාජිකයින් මෙසේය:

- හේමසිරි ප්‍රනාන්දු මහතා - සභාපති
- ඇන්ටන් හේමන්ත මහතා
- එන්. වසන්තකුමාර් මහතා - ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වන අතර බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනය මත රැස්වීම්වලට සහභාගි විය හැකිය.

කමිටු රැස්වීම්

සිය විෂය පථය තුළ කරුණු සලකා බැලීම සහ මණ්ඩලයට වාර්තා කිරීම සඳහා කමිටුව මාස දෙකකට වරක් රැස් වේ. මාණ්ඩලීය මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ ගණපූරණය මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරිගෙන් සමන්විත වේ.

හේමසිරි ප්‍රනාන්දු
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටු (BIRMC) වාර්තාව

විෂය පථය

අධ්‍යක්ෂ මාණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට පැවරේ. ව්‍යාපාර ඒකකවල කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා රාමු අනුමත කිරීමේ සහ අවදානම් අධීක්ෂණය කිරීමේ වගකීම කමිටුවට පැවරී ඇත.

මණ්ඩලය විසින් නිගමනය කරනු ලබන සන්දර්භය තුළ අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම කමිටුව භාරයේ පවතී.

උචිත අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු භාවිත කරමින් ණය, වෙළඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් තක්සේරු කිරීමේ සහ මණ්ඩලයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම කමිටුවට පැවරේ.

අවදානම් කළමනාකරණයට අදාළ අනෙකුත් වගකීම් අතර ණය, මූල්‍ය, මෙහෙයුම් සහ නෛතික/අනුකූලතාව ක්‍රියාත්මක කිරීම සහ අවදානම් කළමනාකරණය පිළිබඳ සෝදිසි අධීක්ෂණය කිරීමත්, අවදානම් බලපෑම් අවම කිරීම සඳහා ක්ෂණික ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග ගැනීමත් කමිටුව ඉටු කරයි.

සංයුතිය

යටත් පිරිසෙයින් මාණ්ඩලීය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) යන අයගෙන් කමිටුව සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ වර්තමාන සාමාජිකයින් මෙසේය:

- ජෙහාන් පී. අමරතුංග මහතා - සභාපති
- පී.ඩී. චන්ද්‍රා ඒකනායක මිය
- කේ.ඩී.එන්. රන්පිත් අසෝක මහතා
- එන්. වසන්ත කුමාර් මහතා - ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියකුට ආරාධනය මත, කමිටු රැස්වීම් වලට සහභාගි විය හැකිය.

කමිටු රැස්වීම්

අවදානම් කළමනාකරණය සම්බන්ධ කාරණා සලකා බැලීම සඳහා කමිටුව කාර්තුමය වශයෙන් රැස්වන අතර මාණ්ඩලයට සිය නිර්දේශ ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ ගණපූරණය වන්නේ මණ්ඩලීය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු හා ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි ය.



ජෙහාන් පී. අමරතුංග
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) වාර්තාව

විෂය පථය

ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරීගේ සීමාව ඉක්මවන සියලු ණය යෝජනා මෙන්ම සහකාර සාමාන්‍යාධිකාරී ශ්‍රේණියෙන් ඉහළ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ණය යෝජනා අනුමත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවට අධිකාරී බලය පැවරී තිබේ.

ණය ප්‍රති උපලේඛනගත කිරීමේ යෝජනා සහ ඒකවාරික බේරුම් කිරීම් සලකා බැලීමට ද කමිටුවට බලය පැවරී තිබේ.

සංයුතිය

යටත් පිරිසෙයින් මාණ්ඩලික අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරීගෙන් කමිටුව සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ වර්තමාන සාමාජිකයන් මෙසේය:

- ආචාර්ය අමින්ද එම්. පෙරේරා - සභාපති
- ටී.ඩී. ඇන්ටන් එස්. හේමන්ත මහතා
- ක්‍රිෂ් රාජේන්ද්‍රන් මහතා
- එන්. වසන්තකුමාර් මහතා - ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරීන්ට ආරාධනය මත, රැස්වීම් වලට සහභාගි විය හැකිය.

කමිටු රැස්වීම්

කමිටුව අවම වශයෙන් මසකට දෙවරක්වත් රැස්වේ. මාණ්ඩලික විධායක ණය කමිටුවේ රැස්වීම් සඳහා නියමිත ගණපූරණය මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකි.

ආචාර්ය අමින්ද එම්. පෙරේරා
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මාණ්ඩල නාමයෝජනා කමිටු (BNC) වාර්තාව

විෂය පථය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ ප්‍ර.වි.නිලධාරියෙකු/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් තේරීමේ/පත් කිරීමේ ක්‍රියාපටිපාටියක් ක්‍රියාවේ යෙදවීමය.

ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු යෝජනාව සඳහා නිර්ණායක නියම කිරීම කමිටුව විසින් සිදු කරනු ලැබේ.

නව විශේෂඥ දැනුමේ අවශ්‍යතා සහ විශ්‍රාම යන ප්‍රධාන කළමනාකරණ පිරිස් සම්බන්ධයෙන් අනුප්‍රාප්ති ක්‍රියාපටිපාටි සලකා බැලීම සහ නිර්දේශ කිරීම ද කමිටුවේ වගකීම වේ.

සංයුතිය

යටත් පිරිසෙයින් මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් කමිටුව සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ වර්තමාන සාමාජිකයන් මෙසේය:

- හේමසිරි ප්‍රනාන්දු මහතා - සභාපති
- ජෙහාන් පී. අමරතුංග මහතා
- පී. ඩී. චන්ද්‍රා ඒකනායක මිය

ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී ආරාධනය මත, කමිටු රැස්වීමට සහභාගි වේ.

කමිටු රැස්වීම්

කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වී මණ්ඩලයට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ රැස්වීම් සඳහා නියමිත ගණපූරණය මාණ්ඩලික අධ්‍යක්ෂවරුන් තිදෙනෙකි.

හේමසිරි ප්‍රනාන්දු
සභාපති
මාණ්ඩලික නාමයෝජනා කමිටුව (BNC)

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකු කමිටු (BIBC) වාර්තාව

විෂය පථය

ආයෝජන බැංකුකරණ මාදිලිය සහ බැංකුවේ ආයෝජන බැංකුකරණ ඒකකයේ මෙහෙයුම් විධිමත් ලෙස සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකු කමිටුව ස්ථාපිතව ඇත. කොටස් වෙළඳාම් සීමා, නව ආයෝජන නිෂ්පාදිත සහ ව්‍යාපාර වස්තු තැරැව්කිරුවන්, වෙළඳ ක්‍රියාමාර්ග සහ තොරතුරු තාක්ෂණ පද්ධති උපයෝජනය සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට කමිටුවට අධිකාරි බලය පැවරී තිබේ.

සංයුතිය

අවම වශයෙන් මාණ්ඩලික අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන්, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාපාරික බැංකුකරණ), භාණ්ඩාගාර හා ආයෝජන ප්‍රධානී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) යන නිලධාරීන්ගෙන් කමිටුව සමන්විත වේ.

කමිටුවේ වර්තමාන සාමාජිකයන් මෙසේය:

- ජෙහාන් පී. අමරතුංග මහතා, සභාපති
- පී. ඩී. චන්ද්‍රා ඒකනායක මිය
- කේ.ඩී.එන්. රන්පිත් අසෝක මහතා
- එන්. වසන්ත කුමාර් මහතා - ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි
- පී.බී.ආර්.පී. ගුණවර්ධන මහතා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාපාරික බැංකුකරණ)
- ක්ලයිව් ෆොන්සේකා මහතා - භාණ්ඩාගාර හා ආයෝජන ප්‍රධානී

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියකුට ආරාධනය මත රැස්වීම්වලට සහභාගි විය හැකිය.

කමිටු රැස්වීම්

තමන් වෙත බලතල පැවරී ඇති කරුණු සාකච්ඡා කිරීම සඳහා කමිටුව කාර්තුමය වශයෙන් රැස් වේ. අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන කමිටුවේ රැස්වීම් සඳහා නියමිත ගණපූරණය මාණ්ඩලික අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් ඇතුළු සාමාජිකයන් තිදෙනෙකි.

ජෙහාන් පී. අමරතුංග
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය ආයෝජන බැංකු කමිටුව (BIBC)
2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු (BITC) වාර්තාව

විෂය පථය

තොරතුරු තාක්ෂණය මත විශ්වාසය තැබීමේ ප්‍රමාණය සහතික කිරීම සහ තොරතුරු තාක්ෂණ පාලනයේ වර්ධනය වන ඉල්ලුම් සම්බන්ධයෙන් බැංකුවට සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව ස්ථාපනය වී ඇත.

තොරතුරු තාක්ෂණය සඳහා සමස්ත උපාය මාර්ග සකස් කිරීම සහ ඉස්මතු වන ඉල්ලිම්වලට සරිලන සේවා සැපයීම සඳහා නවතම තාක්ෂණයන් මණ්ඩලයට නිර්දේශ කිරීම කමිටුවේ වගකීම වේ.

සංයුතිය

කමිටුව මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවේ වර්තමාන සාමාජිකයින් මෙසේය:

- හේමසිරි ප්‍රනාන්දු මහතා - සභාපති
- ජෙහාන් පී. අමරතුංග මහතා
- කේ.ඩී.එන්. රන්පිත් අසෝක මහතා

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරීන්ට ද ආරාධනය මත, රැස්වීම් වලට සහභාගි විය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවේ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි.

හේමසිරි ප්‍රනාන්දු
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)

2018 මාර්තු 27

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු (BSPRC) වාර්තාව

විෂය පථය

උපායමාර්ගික සැලැස්මේ සඳහන් අරමුණු බාධාවකින් තොරව ක්‍රියාවට නැංවීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව ස්ථාපිත කරන ලදී. සියලුම ව්‍යාපාරික ප්‍රධානීන්ගේ කාර්යසාධනය සමාලෝචනය කිරීමටත්, නියමිත කාල වකවානු ඇතුළත ව්‍යාපාරික ඉලක්ක සපුරාගැනීමට ඔවුන්ට සහාය වීමටත් කමිටුවට අධිකාරි බලය පවරා දී ඇත.

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම කමිටුව පත් කරනු ලැබිය යුතු අතර යටත් පිරිසෙයින් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්, ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි, නි.සාමාන්‍යාධිකාරි - උපායමාර්ගික සැලසුම් හා කාර්යසාධන කළනාකරණ යන නිලධාරීන්ගෙන් සමවිත යුතු ය.

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුවේ වත්මන් සාමාජිකයන් මෙසේය:

- හේමසිරි ප්‍රනාන්දු මහතා - සභාපති
- ජෙහාන් පී. අමරතුංග මහතා - අධ්‍යක්ෂ
- පී.ඩී. චන්ද්‍රා ඒකනායක මිය - අධ්‍යක්ෂ
- එන්. වසන්ත කුමාර් මහතා - ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරි
- චාන්දනී වේරපිටිය මිය - නි.සාමාන්‍යාධිකාරි (උපායමාර්ගික සැලසුම් හා කාර්යසාධන කළනාකරණ)

බැංකුවේ සෙසු නිලධාරීන්ට ද ආරාධනය මත, කමිටුවේ රැස්වීම්වලට සහභාගි විය හැකිය.

කමිටු රැස්වීම්

කමිටුව කාර්තුමය පදනමක් මත රැස්වෙන අතර අවශ්‍ය ගණපූර්ණය සාමාජිකයන් දෙදෙනෙකි.

හේමසිරි ප්‍රනාණ්ඩු මහතා
සභාපති
උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC)

2018 මාර්තු 27

අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

වගකීම

2007 අංක 11 දරන බැංකු පනතේ නියෝගය 3 (8) (ii) (ආ), වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහජන බැංකුවේ (බැංකුව) මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ මේ වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) බැංකුවේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල ප්‍රමාණවත් බව සහ ඵලදායිත්වය පිළිබඳ වගකීම උසුලයි. එකී ප්‍රමාණවත්භාවය සහ ඵලදායිත්වය සලකා බැලීමේ දී, බැංකු ව්‍යාපාරයේ දී කළමනාකරණයවූ පදනමක් මත අවදානම සමග ප්‍රතිලාභය තුලනය කිරීම අවශ්‍ය බවත් එබැවින් බැංකුවේ අවදානම් නැඹුරුව සමන්විත වන සීමාවන්ගෙන් හා දර්ශකයන්ගෙන් සිදුවන කිසියම් අපගමනයන් ඉස්මතු කොට දැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සැලසුම් කරනු ලබන බවත් මණ්ඩලය හඳුනාගනී. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තා පිළිබඳ සැළකිය යුතු සාවද්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් හෝ මූල්‍යමය පාඩු හෝ වංචා සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියට සැපයිය හැකි වන්නේ සාධාරණ සහතිකයක් පමණක් මිස නිරපේක්ෂ සහතිකයක් නොවේ.

බැංකුව මුහුණ දෙන සැළකිය යුතු අවදානම් හඳුනා ගැනීමේ, තක්සේරු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් බැංකුව ස්ථාපනයකර ඇති අතර, ව්‍යාපාර පරිසරයට හෝ නියාමන මාර්ගෝපදේශවලට වෙනස්වීම් සිදුවන අවස්ථා වලදී මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම ඊට ඇතුළත් වේ. ක්‍රියාවලිය මණ්ඩලය විසින් විධිමත්ව අධීක්ෂණය කරනු ලබන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති අභ්‍යන්තර පාලන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට අනුකූල ය. ඒ මාර්ගෝපදේශයේ දැක්වෙන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගැයීමේ මූලධර්ම සැළකිල්ලට ගනිමින් මණ්ඩලය මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන ඇගයීමට ලක්කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් සැපයීමට ක්‍රියාවට නංවා ඇති මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ප්‍රශස්ත හා ප්‍රමාණවත් වන බවත්, බැංකුවට පරිබාහිර කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්මවලට හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බවත් මණ්ඩලයේ අදහස් කරයි.

මෙකී අවදානම් අවම කිරීම හා පාලනය සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද සැලසුම් කිරීමේ දී, මෙහෙයවීමේ දී හා අධීක්ෂණය කිරීමේ දී මුහුණදීමට සිදුවන අවදානම් හඳුනාගැනීම සහ තක්සේරුකිරීම සම්බන්ධයෙන් අවදානම් හා පාලන පිළිබඳ මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමේ දී කළමනාකාරිත්වයේ සහාය මණ්ඩලයට හිමි වේ.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ ස්වරූපය හා එහි ඵලදායිතාව සමාලෝචනය කිරීමේ දී යොදා ගැනෙන ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය හා සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත් බව සහ සෘජු බව සමාලෝචනය කිරීමේ ලා ස්ථාපනය කරනු ලැබ ඇති ප්‍රමුඛ ක්‍රියාමාර්ග වලට පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල ඵලදායිත්වය තහවුරු කිරීමටත්, බැංකුවේ මෙහෙයුම් සංයුක්ත අරමුණුවලට, උපායමාර්ගවලට සහ වාර්ෂික අයවැයට මෙන්ම අනුමත ප්‍රතිපත්තිවලට හා ව්‍යාපාරික නියමයන්ට අනුකූල වන බවට සහතික කිරීමටත්, අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවීම සඳහා මණ්ඩලය විසින් විවිධ කමිටු ස්ථාපනය කරනු ලැබ ඇත.
- බැංකුවේ අභ්‍යන්තර විගණන කමිටුව, නියැදි සහ ප්‍රත්‍යාවර්ත ක්‍රියාපටිපාටි භාවිත කරමින් ප්‍රතිපත්තිවලට හා ක්‍රියාපටිපාටිවලට අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිත්වය අඛණ්ඩ පදනමක් මත පරීක්ෂාවට ලක් කරන අතර යම් අනනුකූලතාවක් සම්බන්ධයෙන් සැලකිය යුතු නිරීක්ෂණ අවධාරණයකර දක්වයි. මේ සියලුම ඒකක සහ ශාඛා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබන අතර ඒවායේ සංඛ්‍යාතය නිගමනය කරනු ලබන්නේ ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් සැපයීම සඳහා තක්සේරු කරනු ලබන අවදානම් මට්ටම මගිනි. වාර්ෂික විගණන සැලැස්ම මාණ්ඩලීය විගණන කමිටුව විසින් සමාලෝචනයකර අනුමත කරනු ලැබේ. සිය කාලීන රැස්වීම් වලදී සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ මාණ්ඩලීය විගණන කමිටුවට (BAC) ඉදිරිපත් කරනු ලැබේ.

- බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, නියාමන බලධාරීන් සහ කළමනාකාරිත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටලු සමාලෝචනයට ලක් කරන බැංකුවේ මාණ්ඩලීය විගණන කමිටුව අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායිත්වය තක්සේරු කරයි. එසේම අභ්‍යන්තර විගණන කාර්යයේ විෂයපථය හා ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් අභ්‍යන්තර විගණන කාර්යයද එය සමාලෝචනයට ලක් කරයි. මාණ්ඩලීය විගණන කමිටුවේ කාර්යසටහන් නිශ්චිත අතරමැදි කාල පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සභාගත කරනු ලැබේ. මාණ්ඩලීය විගණන කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර මාණ්ඩලීය විගණන කමිටු වාර්තාවේ දැක්වේ. (56 පිටුව බලන්න)

- අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමේ දී, බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයේ සැලකිය යුතු ගිණුම් හා හෙළිදරව්කිරීම් හා සම්බන්ධ සියලු කාර්ය පටිපාටි හා පාලන සමාලෝචනයට ලක් කිරීමත්, යාවත්කාලීන කිරීමත් අඛණ්ඩව සිදු කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මේ ක්‍රියාපටිපාටිවල හා පාලන ක්‍රමවේදයේ ව්‍යුහයේ යෝග්‍යතාව හා ඵලදායිතාව සත්‍යාපනය කිරීම අඛණ්ඩ පදනමක් මත දිගින් දිගටම සිදු කළේය.

- LKAS සහ SLFRS ප්‍රමිතිවලින් සමන්විත නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතයට ගැනීමේ දී අදාළ පිළිගැනීම, මිනුම්කිරීම, වර්ගීකරණය හා අනාවරණය පිළිබඳ නියාමයන්ට අනුකූලතාව දැක්වීමේ ක්‍රියාවලින්හි ප්‍රගතිශීලි වර්ධනයක් ලබමින් සිටින අතර, ණය හා අත්තිකාරම් අකර්මණ්‍ය වීම, ණයකාඩිපත් මෙහෙයුම්, කළමනාකරණ තොරතුරු පද්ධති සහ අවදානම් කළමනාකරණයට හා සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශ අනාවරණය සම්බන්ධයෙන් වන ක්‍රියාවලි වැඩිදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගනු ලැබේ. මෙම ඇගයීමට බැංකුවේ පරිපාලිත සමාගම් ඇතුළත් නොවුණි.

- 2018 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ආරම්භවන මූල්‍ය වාර්තාකරණ කාල පරිච්ඡේදයට අදාළවන පරිදි මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 - මූල්‍ය උපකරණ - යොදාගැනීම පිළිබඳව ද මණ්ඩලය නිසි සැලකිල්ල යොමුකර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 යටතේ අවදානම් සඳහා ප්‍රතිපාදන සැලසීමේදී දැනට භාවිත වන පදනම "සිදුවුණ පාඩු පදනම" වෙනුවට "අපේක්ෂිත ණය පාඩු පදනම" වශයෙන් වෙනස්වන බැවින් අවකරණය ගණනය කිරීම කෙරෙහි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති (SLFRS) අංක 9 යොදාගැනීම මගින් සංක්‍රමණික වෙනස කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු වන්නේදැයි ඇගයීමේ කටයුතු අවසන්කිරීමේ ක්‍රියාලියක බැංකුව නියුක්තව සිටී.

- 2017 මුදල් වර්ෂය තුළ දී අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් කරන ලද අදහස් දැක්වීම් සැළකිල්ලට ගන්නා ලද අතර යෝග්‍ය අවස්ථා වලදී ඒවා අදාළකර ගැනීමට පියවර ගනු ලැබිණ. තවද, එළඹෙන වසර තුළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගැනීම පිළිබඳ පාලනමය ලේඛන කටයුතු විධිමත් කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගෙන ඇත.

තහවුරු කිරීම

ඉහත කී ක්‍රියාකාරිත්වය තුළ, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සැලසුම් කරනු ලැබ ඇත්තේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ තහවුරුවක් ලබා දීම සඳහා වන බවත්, බැංකුවට පරිබාහිර කාර්යයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස්කරනු ලැබ ඇති බවත් මණ්ඩලය තහවුරු කරයි.

බාහිර විගණකවරුන් විසින් කරන ලද ප්‍රකාශනය සමාලෝචනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් වන අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ඉහත ප්‍රකාශනය බාහිර විගණකවරුන් විසින් සමාලෝචනය කරනු ලැබ ඇති අතර, බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ ව්‍යුහය හා එහි ඵලදායීතාව සමාලෝචනය කිරීමේ දී මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධයට එකී ප්‍රකාශනය අනුකූල නොවන්නේ යැයි විශ්වාස කිරීමට තුඩුදිය හැකි කිසිවක් තම අවධානයට යොමු නොවූ බව ඔවුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කර ඇත.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන්ගේ තහවුරු වාර්තාව වාර්ෂික වාර්තාවේ 62 වැනි පිටුවේ දැක්වේ.

මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කලේ,

ජෙහාන් පී.අමරතුංග,
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සභාපති

2018 මාර්තු 26

අභ්‍යන්තර පාලනය පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. BAF/D/PB/IC/2017

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 26 April 2018

මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරනු ලබන්නේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුලත් වන මහජන බැංකුවේ ("බැංකුවේ") අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය ("ප්‍රකාශනය") පිළිබඳ තහවුරුවකි. මේ තහවුරුව සිදු කිරීමේදී ප්‍රසිද්ධ වෘත්තියේ යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මට ලැබිණ.

කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් 2007 අංක 11 දරන බැංකු පනත් විධානයේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශ" ප්‍රකාරව ප්‍රකාශනය පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය වගකීමට බැඳේ.

මාගේ වගකීම සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 3050 ට අනුකූලතාව

මගේ වගකීම වන්නේ ඉටු කරන ලද කාර්යය පදනම් කරගෙන ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාවක් නිකුත් කිරීමය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකුව සඳහා වන තහවුරු වාර්තාව තහවුරු කිරීමේ කාර්යයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිය SLSAE 3050 ට අනුකූලව මම මගේ කාර්යය සිදු කළෙමි.

ඉටු කරන ලද කාර්යය සාරාංශය

මගේ කාර්යය සිදුකරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීම සඳහාය.

ඉටු කරන ලද ක්‍රියා පටිපාටීන්, නියෑදි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලින් සඳහා උපකාරී වන ලිපි ලේඛන වල පැවත්ම මත මූලික වශයෙන් සීමා වේ.

ප්‍රකාශනයෙන් සියළුම අවදානම් හා පාලනයන් අනාවරණය වන්නේදැයි ම විසින් සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටිය පිළිබඳ මතයක් පළකිරීම හෝ SLSAE 3050 අනුව අවශ්‍ය නොවේ. එසේම වාර්ෂික වාර්තාවේ අනාවරණය වන කිසියම් සැලකිය යුතු ගැටලු වල වැදගත් අභ්‍යන්තර පාලන පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විස්තර කරනු ලබන ක්‍රියාවලින්ගෙන් ඇත්ත වශයෙන්ම ගැටලුවලට පිළියම් යෙදෙන්නේ ද යන්න මා විසින් සලකා බැලීමත් SLSAE 3050 අනුව අවශ්‍ය නොවේ.

නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි පදනම් කරගෙන, වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශනය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා ඵලදායීත්වය සමාලෝචනයේ ලා අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කර ඇති ක්‍රියාවලිය සම්බන්ධයෙන් මගේ අවබෝධයට අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු කිසිවක් අපගේ අවධානයට ලක් වී නොමැත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

අවදානම් කළමනාකරණය

යම් නිශ්චිත තීරණයක හෝ කාර්යය නිමිත්තක ප්‍රතිවිපාකය අවිනිශ්චිත වන්නේ නම් එහි අවදානමක් තිබිය හැකි අතර එවැන්නකින් බැංකුවක් ස්වකීය පරමාර්ථ සපුරාගන්නා ආකාරය කෙරෙහි නියත බලපෑමක් ඇති කළහැකිය.

ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය බැංකුවක් වශයෙන් මහජන බැංකුව ස්වකීය ව්‍යාපාරික මෙහෙයුම් තුළ අනේකවිධ අවදානම්වලට පාත්‍ර වේ. එබැවින් ස්වකීය පාර්ශ්වකරුවන් සඳහා තිරසර වටිනාකම් උද්‍යාකරදීමට බැංකුවට හැකිවන පරිදි, එවැනි අවදානම් හඳුනාගැනීමට, තක්සේරු කිරීමට, අවම කිරීමට, අධීක්ෂණය කිරීමට සහ ඒ පිළිබඳව වාර්තා කිරීමට කාර්යක්ෂම අවදානම් කළමනාකරණ කාර්යය රාමුවක් ක්‍රියාවට නංවා ඇත. මහජන බැංකුව විසින් ක්‍රියාවට නංවා ඇති සංකලිත අවදානම් කළමනාකරණ ප්‍රවේශය බැංකුවේ අවදානම් හා වර්ධනය අතර මනා තුලනයක් පවත්වා ගැනීමට ඉවහල් වී ඇත.

අවදානම් කළමනාකරණයේ වැදගත් සිදුවීම්

ණය අවදානම

අක්‍රිය ණය අනුපාතිකය (දළ)



වෙළඳපල අවදානම

වෙනස්වන සුළු පොළී අනුපාතික සහ ශුද්ධ පොළී ආන්තිකය මත බලපෑම, උපරිම ශුද්ධ විවෘත තත්ත්වය (NOP), අවදානමට ලක්විය හැකි උපරිම අගය (VaR)

ශුද්ධ විවෘත තත්ත්වය (NOP) හා අවදානමට ලක්විය හැකි අගය (VaR)



ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීල වත්කම් නියාමයන් සපුරාලන ලදී. වත්කම් බැරකම් නොගැලපීම් කාර්යක්ෂමව කළමනාකරණය කරන ලදී.

එක් මාසයක කාලසීමාවක් දක්වා වත්කම් සහ බැරකම් කල්පිරීම් නොගැලපීම් පරතරය



මෙහෙයුම් අවදානම

ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද තුළින් මෙහෙයුම් අලාභ අවම කරගන්නා ලදී.

සමස්ත මෙහෙයුම් අලාභ



සේවක පිරිවැටුම 3.3 % ක් විය.

සේවක පිරිවැටුම



අනුකූලතා අවදානම

නියාමක විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව ක්‍රියාකරන ලදී.

නියාමන අවදානම

Basel III අවම ප්‍රාග්ධන නියාමනයන්ට සහ තෝලන අනුපාත රාමුවට අනුකූලව බැංකුව ක්‍රියාකළේය.

සමස්ත ප්‍රාග්ධනයේ I වන මට්ටමේ අනුපාතය



2013-2016 – Basel II
2017 – Basel III

සමස්ත ප්‍රාග්ධන අනුපාතය



2013-2016 – Basel II
2017 – Basel III

මහජන බැංකුවේ සංකලිත අවදානම් කළමනාකරණ රාමුව

මහජන බැංකුව ස්වකීය අවදානම් කළමනාකරණය පිණිස විස්තීර්ණ අවදානම් කළමනාකරණ කාර්යය රාමුවක් අනුගමනය කරයි. ඇතිවිය හැකියයි බැංකුව උපකල්පනය කරන අවදානම් වටහා ගැනීමේ වගකීම පැවරී ඇති බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි අවදානම් නිසිපරිදි කළමනාකරණය කරනු ලබන බවට වගබලා ගනී. මහජන බැංකුව තුළ උපයෝගී කරගනු ලබන කාර්යය රාමුව මඟින් විවිධ වර්ගවල අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම, සහ පාලනය කිරීම සිදුකරනු ලබන ආකාරය මෙන්ම යොදාඇති පාලන ව්‍යුහය පිලිබඳව විස්තර සපයයි.

අරමුණු

බැංකුවේ සංකලිත අවදානම් කළමනාකරණ රාමුවේ අරමුණු පහත දැක්වෙන පරිදිවේ:

- බැංකුවේ විවිධ වූ අවදානම් පාත්‍රතාව තක්සේරු කිරීම සහයෝග්‍ය පරිදි කළමනාකරණය කිරීම
- බැංකුවේ විවිධ අවදානම් පාත්‍රතාව අධීක්ෂණයකර, එම අවදානම් බැංකුවේ ප්‍රාග්ධනයට අදාළ කරගැනීම සඳහා සුදුසුදායී යාන්ත්‍රණයක් සකස් කිරීම
- විශේෂයෙන් අවදානම් කළමනාකරණයට සම්බන්ධ, අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලතාව අධීක්ෂණය කිරීම පිණිස ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
- අදාළ සියලු ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි පිළිබඳව බැංකුව තුළ ඵලදායී ආකාරයෙන් සන්නිවේදනය කිරීම
- ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපිතකර, ඒ සඳහා සහාය පළකිරීම.
- අවදානම් පිලිබඳ අදාළ තොරතුරු පාර්ශ්වකරුවන්ට, නියාමකවරුන්ට හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්ව වලට වාර්තා කිරීම

අවදානම් වර්ග

මහජන බැංකුවට අදාළ වන ප්‍රධාන අවදානම් වර්ග වන්නේ ණය අවදානම්, වෙළඳපොල අවදානම්, සහ මෙහෙයුම් අවදානම් ආදියයි. ඊට අමතරව, ද්‍රවශීලතා අවදානම්, අරමුදල් අවදානම්, අනුකූලතා අවදානම්, කීර්ති නාම අවදානම්, නෛතික අවදානම්, සහ උපායමාර්ගික අවදානම්, මෙහි ලා වැදගත් අවදානම් වර්ග වේ.

මහජන බැංකුවේ අවදානම් සමස්තය

මහජන බැංකුවේ අවදානම් සංගහනය පහත වගුවේ දක්වා ඇති පරිදි අන්තර් සම්බන්ධිත අවදානම් වර්ග සමූහයකින් සමන්විත වේ:



මහජන බැංකුවේ අවදානම් අභිරුචි කාර්ය රාමුව මගින් බැංකුව විසින් භාරගනු ලබන්නේ බැංකුවේ දැරියහැකි අවදානම් රාමුව ඇතුළත වූ යෝග්‍ය අවදානම් පමණක් බව තහවුරු කෙරේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දැරිය හැකි අවදානම් මට්ටම් පිළිබඳ තීරණ ගනු ලබයි. නියාමන විචලයයන්, සාර්ව ආර්ථික වටපිටාව, බැංකුවේ දැක්ම, මෙහෙවර හා හරයන්, පාර්ශ්වකාර අපේක්ෂාවන් සහ බැංකුවේ ව්‍යාපාරික මාදිලිය ආදිය බැංකුවේ අවදානම් අභිරුචිය කෙරෙහි දැඩිව බලපායි.



අවදානම් අභිරුචිය

සිය ව්‍යාපාරික අරමුණු සපුරා ගැනීමට කටයුතු කිරීමේදී බැංකුවට දැරියහැකි අවදානම් මට්ටම ඇතුළත බැංකුව විසින් භාරගැනීමට අපේක්ෂා කරන සමුච්චිත අවදානම්, අවදානම් අභිරුචිය මගින් ප්‍රකාශිත වේ. මෙකී අරමුණු අවම ප්‍රමාණාත්මක ප්‍රමිතික සහ ගුණාත්මක ප්‍රකාශන මගින් අර්ථ නිරූපණය කෙරේ.

දැරියහැකි අවදානම් මට්ටම යන්නෙන් නියාමන සංරෝධක හෝ පාර්ශ්වකරුවන් කෙරෙහි වන බැංකුවේ බැඳීම් උල්ලංඝනය වීමකින් තොරව බැංකුවට භාරගත හැකි උපරිම අවදානම් මට්ටම අදහස්වේ. මහජන බැංකුව තිරසර වර්ධනයක් හා ලාභදායිත්වයක් සඳහා පහසුකම් සලසමින්, විචක්ෂණශීලි අවදානම් අභිරුචියක් පවත්වාගෙන යයි. සමූහයේ එක් එක් සමාගම සඳහා වෙන්වූ අවදානම් අභිරුචියක් සම්පාදනය කර ඇති අතර මහජන බැංකුව සම්බන්ධයෙන් වන අවදානම් අභිරුචිය රු. මිලියන 500 ඉක්මවයි. බැංකුවේ අවදානම් අභිරුචිය වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන අතර ප්‍රතිකූල පරිස්පරයන් කිසිවක් වෙතොත්, ඒවා නිවැරදි කිරීමට වහා පියවර ගනු ලැබේ.

මහජන බැංකුවේ දැරිය හැකි අවදානම් මට්ටම් පහත දක්වා ඇත:

ණය අවදානම	ණය අවදානම් අභිරුචිය			2017 දෙසැම්බර් මස 31 දිනට පැවති තත්ත්වය	2016 දෙසැම්බර් මස 31 දිනට පැවති තත්ත්වය
	අධි අවදානම	මධ්‍යම අවදානම	අවම අවදානම		
අක්‍රියණය/මුළු අත්තිකාරම්	>10%	5%-10%	<5%	**1.91%**	1.92%
ප්‍රතිපාදන ආවරණය	<75%	75%-90%	>90%	**97.5%**	110.4%
ලාභාලාභ ගිණුමට අයකිරීම්	>15%	5%-15%	<5%	**10.62%**	9.06%
සංකේන්ද්‍රණයන් (HHI ක්‍රමය)	>0.25	0.25-0.15	<0.15	**0.19**	0.20
අයකර ගැනීම්	>2%	2%-4%	>4%	**30.76%**	22.85%
අයිරා අතිරික්තය	>20%	10%-20%	<10%	**14.98%**	10.92%
විදේශ නිරාවරණය (විදේශ බැංකු ඒකකය)	>15%	10%-15%	<10%	**0.62%**	0.30%

වෙළෙඳපොළ අවදානම	අනුමත සීමාව	2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය	2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂය
වි.වි. ශුද්ධ ආරම්භක තත්ත්වය	එ.ප. ඩොලර් +/- මිලියන 16	**අනුකූල විය**	අනුකූල විය
අවදානමේ දී අගය (VaR) (99% විශ්වාස මට්ටමේදී, දින 1)	එ.ප. ඩොලර් 250,000	**අනුකූල විය**	අනුකූල විය
සමුච්චිත පාඩු			
- වි.වි. වෙළඳාම	එ.ප. ඩොලර් 175,000	**අනුකූල විය**	අනුකූල විය
- FIS වෙළඳාම (උපලබ්ධි)	රු.මිලියන 25	**අනුකූල විය**	අනුකූල විය
(උපලබ්ධි නොවූ)	රු. මිලියන 500	**අනුකූල විය**	අනුකූල විය
ඉදිරි වි.වි. පරතර සීමාව	එ.ප. ඩොලර් 300 මාසික මිලියන	**අනුකූල විය**	අනුකූල විය
ශ්‍රී ලංකා රජයේ සුරැකුම් පත්			
- වෙළඳ	රු. බිලියන 150	**අනුකූල විය**	අනුකූල විය
- ආයෝජන	රු. බිලියන 155	**අනුකූල විය**	අනුකූල විය
- විකිණීම සඳහා පවතින	රු. බිලියන 10	**අනුකූල විය**	අනුකූල විය
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුමකර (SLDB)	එ.ප. ඩොලර් මිලියන 750	**අනුකූල විය**	අනුකූල විය
අන්තර් බැංකු ණය ගැනීම්	රු. බිලියන 170	**අනුකූල විය**	අනුකූල විය
දේශීය බැංකු ඒකක විදේශ විනිමය ණය ගැනීම්	එ.ප. ඩොලර් මිලියන 50	**අනුකූල විය**	අනුකූල විය
වෙළඳ කොටස් කළඹෙහි ආයෝජන වටිනාකම	රු. මිලියන 1,000	**අනුකූල විය**	අනුකූල විය
S&P SL20 දර්ශකය මත කොටස් %	අවම 25%	**අනුකූල විය**	අනුකූල විය
ගිල්ට් ඒකක භාර සීමාව	රු. බිලියන 2.5	**අනුකූල විය**	අනුකූල විය
ණයකර	රු. බිලියන 5	**අනුකූල විය**	අනුකූල විය
පොළිඅනුපාත අවදානම (DGap+VaR on Fwd Fx)	රු. බිලියන 7.5	**අනුකූල විය**	අනුකූල විය

මෙහෙයුම් අවදානම	මෙහෙයුම් අවදානම අභිරුචිය			2017 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය	2016 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය
	අධි අවදානම	මධ්‍යම අවදානම	අවම අවදානම		
මෙහෙයුම් පාඩු - අභ්‍යන්තර	>25	25-10	<10	**0**	12
මෙහෙයුම් පාඩු - බාහිර	>1,000	400-1,000	<400	**321**	236
මුළු මෙහෙයුම් වියදම්වලට සාපේක්ෂව මුළු මෙහෙයුම් පාඩු	>1.0%	0.5%-1.0%	<0.5%	**0.02%**	0.29%
පද්ධති උපයෝජ්‍යතාවය	<97.5%	97.5%-99.8%	>99.9%	**99.61%**	99.50%
සතුටුදායක මට්ටමට අඩු ශාඛා විගණන %	>15%	15%	Nil	**12%**	9%

අවදානම් පාලනය

සමූහයේ ව්‍යාපාරික මෙහෙයුම්වල විවිධත්වය, අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, මැනබැලීම, සමාහාරය, හා කළමනාකරණය කිරීම සහ සමූහයේ ව්‍යාපාර අංශ අතර ප්‍රාග්ධනය වෙන්කර දීම අවශ්‍ය බවට පත්කර ඇත. අවදානම් අධීක්ෂණය, අවදානම් අභිරුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ පවතින අවදානම් කළමනාකරණ ක්‍රියාවලින්හි හා ක්‍රියාපටිපාටිවල ඵලදායීත්වය සහතික කිරීම පිළිබඳ අග්‍රස්ථ වගකීම සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. පහත සටහනේ දැක්වෙන පරිදි අවදානම් කළමනාකරණය සම්බන්ධ වගකීම් ඉටු කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට, අනුකමිටුවල හා විධායක කමිටුවල සහාය හිමිවේ. එමඟින් පුළුල් අධීක්ෂණයක් හා අවදානම් හටගැනීම හා අවදානම් පාත්‍රතාව සඳහා අනුමැතිය ලබාදීම අතර වගකීම් හා කාර්යභාර පැහැදිලිව වෙන්කර දීමක් තහවුරු කරන අතර අධ්‍යක්ෂ මන්ඩලය හා එක් එක් අවදානම් කමිටු ස්වකීය අධිකාරී බලතල නියමයන්ට අනුව සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගනී.

මහජන බැංකුවේ අවදානම් පාලන කාර්යරාමුව පහත විස්තර කර ඇත:



කමිටුව	අරමුණු	නියෝජනය
මාණ්ඩලීය කමිටු		
මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	• සමූහයේ සියලු අවදානම් ආශ්‍රිත ක්ෂේත්‍රයන් පිළිබඳව ස්වාධීන අධීක්ෂණයක් සිදු කිරීම • අවදානම් අභිරුචි සීමා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සමාපිකයන් • සමූහයේ අවදානම් පාලනයේ, ප්‍රතිපත්ති හා ප්‍රමිතිවල ප්‍රමානවත් බව හා සඵලදායිත්වය තහවුරු කිරීම	**කමිටු සභාපති** අධ්‍යක්ෂ **සමාපිකයන්** අධ්‍යක්ෂවරු දෙදෙනෙක් ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී නි. සාමාන්‍යාධිකාරී (අ.ක.)
මාණ්ඩලීය විගණන කමිටුව (BAC)	• සමූහයේ අභ්‍යන්තර මූල්‍ය පාලන හා අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ඇගයීම • සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව අධීක්ෂණය කිරීම • සමූහයේ අභ්‍යන්තර විගණන කර්තව්‍යය ඇගයීම	**කමිටු සභාපති** අධ්‍යක්ෂ **සමාපිකයන්** අධ්‍යක්ෂවරු දෙදෙනෙක් නි. සාමාන්‍යාධිකාරී (අ.ක.) ආරාධනය මත ස/සාමාන්‍යාධිකාරී (අනුකූලතා) ආරාධනය මත ප්‍ර.අ.විග. ආරාධනය මත
මාණ්ඩලීය විධායක ණය කමිටුව (BECC)	• ණය ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි සකස් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලට සහාය වීම • ණය කළඹේ ගුණාත්මය අධීක්ෂණය කිරීම • ණය පාත්‍රතාව පිළිබඳ මාර්ගෝපදේශ ලබා දීම	**කමිටු සභාපති** අධ්‍යක්ෂ **සමාපිකයන්** අධ්‍යක්ෂවරු දෙදෙනෙක් ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී ජේ.නි. සාමාන්‍යාධිකාරී (ව්‍යා.බැං.) ආරාධනය මත ජේ.නි. සාමාන්‍යාධිකාරී (ව්‍යා.බැං.) ආරාධනය මත නි. සාමාන්‍යාධිකාරී (අ.ක.) ආරාධනය මත නි. සාමාන්‍යාධිකාරී (අයකරගැනීම්) ආරාධනය මත නි. සාමාන්‍යාධිකාරී (සිල්. බැං.) ආරාධනය මත
මාණ්ඩලීය ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC)	• බැංකුවේ ආයෝජන උපායමාර්ගය සුපරීක්ෂණය කිරීම • බැංකුවේ ආයෝජන කළඹ අධීක්ෂණය කිරීම	**කමිටු සභාපති** අධ්‍යක්ෂ **සමාපිකයන්** අධ්‍යක්ෂ ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී ප්‍රධානී භාණ්. හා ආ.බැ. නි. සාමාන්‍යාධිකාරී (අ.ක.) ආරාධනය මත
විධායක කමිටු		
වත්කම් හා බැරකම් කමිටුව (ALCO)	• බැංකුවේ ශේෂ පත්‍රය සමාලෝචනය හා කළමනාකරණය • ද්‍රවශීලතාව හා මූල්‍යයන අවදානම් කළමනාකරණය පිණිස ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම • වත්කම්/බැරකම් නිෂ්පාදන මිලකිරීම පිළිබඳ ප්‍රතිපත්ති තීරණ ගැනීම	**කමිටු සභාපති** ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී **සමාපිකයන්** ජේ.නි. සාමාන්‍යාධිකාරී (සිල්. බැං) ජේ.නි. සාමාන්‍යාධිකාරී (බැං. මෙහෙ.) ජේ.නි. සාමාන්‍යාධිකාරී (ව්‍යා.බැං.) ප්‍රධානී භාණ්. හා ආ.බැ. නි. සාමාන්‍යාධිකාරී (සිල්. බැං.) නි. සාමාන්‍යාධිකාරී (අයකරගැනීම්) නි. සාමාන්‍යාධිකාරී (අන්තර්ජාතික බැංකු) නි. සාමාන්‍යාධිකාරී (ඩිජිටල්කරණ) ආයතනික බැංකුකරණ ප්‍රධානී මූල්‍ය ප්‍රධානී නි. සාමාන්‍යාධිකාරී (ආ.ක.)
මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC)	• මෙහෙයුම් අවදානම් කළමනාකරණයට අදාළ කාර්යයන් අධීක්ෂණය හා සමාලෝචනය	**කමිටු සභාපති** ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී **සමාපිකයන්** ජේ.නි. සාමාන්‍යාධිකාරී (බැං. මෙහෙ.) ප්‍ර.අ.විග. මූල්‍ය ප්‍රධානී ස. සාමාන්‍යාධිකාරී (අ.ක.)

ආරක්ෂක පියවර තුන

මහජන බැංකුව ආරක්ෂක පියවර තුනකින් සැදුම්ලත් අවදානම් කළමනාකරණ ආකෘතියක් උපයෝගී කරගනී. ප්‍රථම ආරක්ෂක පියවරට අවදානම් හිමිකම ඇතුළත් වන අතර, අවදානම් හිමිකරුවන් වන සියලුම ව්‍යාපාරික අංශ සහ සේවා සැපයුම් යටිතල පහසුකම් ඝේත්‍ර ඊට අයත් වේ. අවදානම් සමාලෝචනය හා පාලනය හා සම්බන්ධ සියලු ස්වාධීන අවදානම් හා පාලන යටිතල පහසුකම් සැපයීම් කටයුතු දෙවන ආරක්ෂක පියවරට අයත් වේ. සමූහයේ විගණනය තෙවන ආරක්ෂක පියවරයි. අවදානම් සුරක්ෂාව තහවුරු කරමින්, පාලන ක්‍රමවේදයන්හි සඵලදායිත්වය සහතික කිරීම එමඟින් සිදුවේ. තෙවන ආරක්ෂක පියවර හා එහි පාදක සැලසුම් සිද්ධාන්තය සමූහයේ සියලුම ස්ථරවලට අදාළ වන අතර එක් එක් පියවර එකිනෙකට ස්වාධීන වන්නා සේම සෑම මට්ටමකදීම සැලසුම් සිද්ධාන්තයට අනුගතවීම සහතික කෙරෙන ව්‍යුහයන් පවත්වා ගැනීම පිලිබඳව වගවීම ද උසුලයි.



අවදානම් සංස්කෘතිය

සමස්ත බැංකුව තුළම අවදානම් හා ප්‍රතිලාභ කළමනාකරණය කෙරෙහි සාකල්‍ය ප්‍රවේශයක් දිරිගැන්වීම මඟින් ප්‍රත්‍යස්ථිතිය ශක්තිමත් කිරීම පිණිස ශක්තිමත් අවදානම් සංස්කෘතියක් සමස්ත ආයතනය තුළ ප්‍රවර්ධනය කිරීමට බැංකුව අපේක්ෂා කරයි. අවදානම්, ප්‍රාග්ධනය හා කීර්තිනාම පැතිකඩ සඵලදායී ලෙස කළමනාකරණය කිරීම ඊට අයත් වේ. අවදානම් කළමනාකරණය මෙන්ම ඒවා ඉහළයාම පිළිබඳ වගකීම සියලුම මට්ටම්වල සේවකයන් වගකිව යුතු අතර ශක්තිමත් අවදානම් සංස්කෘතියක් පිළිබිඹු කෙරෙන චර්යා රටාවක් ප්‍රදර්ශනය කිරීම සියලුම සේවකයන්ගෙන් අපේක්ෂා කෙරේ.

සමූහය තුළ අවදානම් සංස්කෘතිය ඔප් නංවන මූලධර්ම පහත දැක්වේ:

- සමූහය විසින් භාරගනු ලබන අවදානම් සඳහා නිශ්චිත අවදානම් අභිරුචියක් නිබීම.
- සමූහය විසින් භාරගනු ලබන සියලුම අවදානම් අවදානම්, කළමනාකරණ රාමුව ඇතුළත අනුමත කරනු ලැබිය යුතු අතර ඒ සඳහා ප්‍රමාණවත් පරිදි වන්දි ලබාදිය යුතුය.
- අවදානම් අඛණ්ඩව අධීක්ෂණයකර, කළමනාකරණය කරගත යුතුය.

පූර්වාරක්ෂක මූලධර්මය

පාරිසරික හා සාමාජීය තිරසාරකත්වය සම්බන්ධයෙන් සමස්ත සමූහය තුළ මෙම පූර්වාරක්ෂක මූලධර්මය අදාළ කරගනු ලැබේ. ස්වකීය ව්‍යාපාරික මෙහෙයුම්වල පාරිසරික හා සාමාජීය බලපෑම පිළිබඳව අවබෝධයෙන් පසුවන බැංකුව නව ව්‍යාපාරික කටයුතු හා මූලාරම්භයන් ආරම්භ කිරීමට පෙරාතුව සිය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුළින් එවැනි බලපෑම් තක්සේරු කිරීමට පියවර ගනී.

ආතති පරීක්ෂාව

ආතති පරීක්ෂාව යනු වත්කම් හා බැරකම් පැතිකඩ විවිධ මූල්‍ය තත්ත්වයන්ට ප්‍රතිචාර දක්වන ආකාරය නිශ්චය කිරීම සඳහා යොදාගනු ලබන ව්‍යපදේශ ශිල්පක්‍රමයකි. එසේම සමූහයේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා තක්සේරු ක්‍රියාවලියේ (ICAAP) අනුකළ අංගයක් ද වේ.

ඉපැයීම්, ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් ද ඇතුළු සිය අවදානම් පැතිකඩ සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි සාර්ව ආර්ථික හා වෙළඳපොළ විචල්‍යතාවල බලපෑම තක්සේරු කිරීම සඳහා ආතති පරීක්ෂාව භාවිත කිරීම සම්බන්ධයෙන් බැංකුව දැඩිව කැපවී සිටී. ආතති පරීක්ෂා ක්‍රියාදාමය තුළ වැදගත්වන සියලුම අවදානම් වර්ග අන්තර්ගත වේ.

මණ්ඩලීය සංකලිත සංයුක්ත අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමූහයේ ආතති පරීක්ෂණ ප්‍රතිපල සහ ඒවාට පාදක වන ප්‍රධාන උපකල්පන නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ. ව්‍යාපාර සමූහයේ ආතති පරීක්ෂණ ක්‍රියාවලියෙහි ප්‍රතිඵල ICAAP සඳහා ප්‍රාග්ධන සැලසුම්කරණය, උපායමාර්ගික සැලසුම්කරණය, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම. අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමග සන්නිවේදනය, නිර්දේශිත පරාමිතීන් ඇතුළත අවදානම් කළමනාකරණය ඇතුළුව ව්‍යාපාර ක්‍රියාවලීන් කිහිපයක ප්‍රධාන යෙදවුමක් බවට පත් වේ.

පහත දක්වා ඇත්තේ සමූහයේ ආතති පරීක්ෂණ ක්‍රියාවලියයි:



මහජන බැංකුවේ අදානම් කළමනාකරණ ක්‍රියාවලිය

පිළිගත් නිර්ණායකයන්ට අනුව සියලුම අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, සිදුකරනු ලබන බව තහවුරු කරීම පිණිස මහජන බැංකුව විස්තීර්ණ අවදානම් කළමනාකරණ රාමුවක් අනුගමනය කර, අවදානම් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනී, අවදානම් සම්බන්ධයෙන් දැනට ක්‍රියාවට නංවා ඇති වැඩපිළිවෙලෙහි සාර්ථක බව තක්සේරු කිරීම පිණිස සළුලදායී අධීක්ෂණ යාන්ත්‍රණයක් තුළින් සියලුම අවදානම් අධීක්ෂණය කර, එහි ප්‍රගතිය මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරනු ලැබේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පහත රූප සටහනෙහි දක්වා ඇත.

හඳුනාගැනීම

සමූහය මුහුණදෙන විමර්ෂණය කිරීම අවශ්‍ය වන ප්‍රමුඛ අවදානම් හඳුනාගැනීම මීට අයත් වේ. මාසිකව හෝ ත්‍රෛමාසිකව පැවැත්වෙන අවදානම් රැස්වීම් වලදී මෙම අවදානම හඳුනාගනු ලැබේ. ප්‍රමුඛ අවදානම් දර්ශක සහ අදාළ සීමාවන් මගින් සමූහයේ අවදානම් අභිරුචිය පුළුල්ව විග්‍රහ කෙරේ.

සමූහයේ එක් එක් සමාගම මුහුණදෙන ප්‍රමුඛ අවදානම් පහත වගුවේ දක්වා ඇත:

සමූහය/සමාගම	ප්‍රමුඛ අදානම් කාණ්ඩ								
	ණය අවදානම	වෙළඳපොල අවදානම	පොළී අනුපාතික අවදානම	ද්‍රවශීලතා අවදානම	අනුකූලතා අවදානම	උපාය මාර්ගික අවදානම	කීර්තිනාම අවදානම	සංකේන්ද්‍රණ අවදානම	රක්ෂණ අවදානම
මහජන බැංකුව	✓	✓	✓	✓	✓	✓	✓	✓	
පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	✓	✓	✓	✓	✓	✓	✓	✓	
පිපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී	✓	✓	✓	✓	✓	✓	✓	✓	
පිපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓

තක්සේරු කිරීම

එක් එක් හඳුනාගත් අවදානම් කාණ්ඩයේ වැදගත්කම ඇගයුම් මෙවලම් හා ශිල්පක්‍රම භාවිත කරමින් තක්සේරු කරනු ලැබේ. මණ්ඩලීය විගණන කමිටුව බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවත් සමග එක්ව සමූහයේ එක් එක් සමාගම්වල අවදානම් පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණවත් බව හා කාර්යක්ෂම බව කාලීනව පරීක්ෂාකර බලනු ලැබේ. එසේ කරනු ලබන්නේ එකී පාලන ක්‍රමවේද සමූහයේ අවදානම් ප්‍රමිතීන්ට සමපාත වන්නේ ද යන්න තහවුරු කර ගැනීමට ය. අවදානම්වල විභව්‍ය බලපෑම් තක්සේරු කිරීම සමස්ත සමූහයේ ආතති පරීක්ෂාවන් සමග ඒකාබද්ධකර ඇත. එමඟින් එවැනි අවදානමක් මතුවූ විට ඒවා දරාගැනීමට බැංකුව සතු හැකියාව ඇගයීමට ලක් කෙරේ. එකී පරීක්ෂණවල ප්‍රතිඵල මඟින් බැංකුවේ පවත්නා ප්‍රාග්ධනය, ද්‍රවශීලතා සංචිත, සහ මැඩපැවැත්වීමේ ක්‍රමවේද වලට සාපේක්ෂ පරීක්ෂණ පරාමිතීන්ට අනුකූලව මෙකී අවදානම් මතුවුවහොත් ඒවායේ බලපෑම දරාගැනීමට බැංකුව සතු හැකියාව පිළිබිඹු වේ.

මැඩපැවැත්වීම

අවදානම් මැඩපැවැත්වීම යනු යම් අවදානමකට පාත්‍රවීමේ ප්‍රමාණය සහ එම අවදානම නැවත නැවත මතුවීමේ අවකාශ ක්‍රමිකව අවම කිරීම යි. අවස්ථා ඉහළ නංවා අවදානම් අවම කිරීම සඳහා විකල්ප හා ක්‍රියාමාර්ග සම්පාදනය ඊට අයත් වේ. බැංකුවේ මණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් වාර්තා සමාලෝචනය කර, විශේෂිත ප්‍රවනතා වළක්වාලීමටත්, ආරක්ෂා කිරීමටත්, නිවැරදි කිරීමටත්, එවැනි අවදානම් නැවත හටගැනීමට ඇති හැකියාව අවම කිරීමටත් පියවර ගනී. ඊට අමතරව, හඳුනාගත් විභව්‍ය අවදානම් සීමා කිරීමටත්, අවම කිරීමටත් බැංකුව තවදුරටත් පියවර ගනී.

අධීක්ෂණය

අවදානම් අධීක්ෂණය හා පාලනයට, හඳුනාගත් අවදානම්, අවශේෂ අවදානම් හා නව අවදානම් පිළිබඳව වාර්තා පවත්වා ගැනීම අදාළ වේ. අවදානම් හඳුනාගැනීම හා ඒවා තක්සේරු කිරීම් ඇගයීම ක්‍රියාත්මක කිරීම් අධීක්ෂණය කිරීම ද ඊට අයත් වෙ. බැංකුවේ මණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් ක්‍රියාත්මක වන අවදානම් කළමනාකරණ ක්‍රමවේද සමීපව අධීක්ෂණයකර, නව අවදානම් වලට ගැලපෙන අයුරින් අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබයි. සමූහයේ එක් එක් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරීන් හා අවදානම් කළමනාකරණ අංශ විමසමින් අඛණ්ඩ පදනමකින් මෙම කාර්යය ඉටු කරනු ලැබේ. ඇතැම් අවදානම් කාණ්ඩවල සිදුවිය හැකි කවර හෝ අනපේක්ෂිත විශේෂ වෙනස්කමක් පිළිබඳව හෝ සමූහයේ අවදානම් අභිරුචිය ඉක්මවන හෝ ඉක්මවිය හැකි කවර හෝ පවත්නා හෝ විභව්‍ය අවදානමක් පිළිබඳව මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් මහජන බැංකුවේ ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාණ්ඩලීය විගණන කමිටුව වෙත දැනුම් දෙනු ලැබේ.

වාර්තාකරණය

ප්‍රධාන අවදානම් නිර්ණායක වලට අනුව, සමූහයේ එක් එක් ආයතනය විසින් අවදානම් කළමනාකරණය කොට, ඒ පිළිබඳව බැංකුවේ මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත ත්‍රෛමාසිකව වාර්තා කළ යුතු ය.

ණය අවදානම

පූර්විකාව

ණය අවදානම යනු ගනුදෙනුකරුවන් සහ ප්‍රතිපාර්ශ්වයන් සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අසමත් වීමෙන් අනාගතයේ ඇති විය හැකි අලාභයන්ය. ණය හා අත්තිකාරම්වලින් මෙන්ම මූල්‍ය ඇප, ණයවර ලිපි හා ගනුදෙනුකරුවන් වෙනුවෙන් නිකුත් කරන ලද හා සිදු කරන ලද ප්‍රතිග්‍රහණයන් යන කරුණුවලින් පැනනගින මේ ණය අවදානම මූල්‍ය ආයතනයක් වශයෙන් ව්‍යාපාර සමූහයේ මූලික අවදානමකි. ණය පැහැර හැරීමේ අවදානම; ප්‍රතිපාර්ශ්ව, ව්‍යාපාර අංශ හෝ භූගෝල විද්‍යාත්මක කලාප සංකේන්ද්‍රණය වීම වැනි විවිධ ස්වරූපවලින් ණය අවදානම ඇති විය හැකිය.

අරමුණු

- අවදානම් වත්කම් කළඹ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම තුළින් මනාව විවිධාංගිකරණය වූ කළඹක් පවත්වාගැනීම. මෙමඟින් කවර හෝ කර්මාන්තයකට හෝ අංශයකට හෝ එක් ගණුදෙනුකරුවකුට අසීමාන්තිකව අනාවරණය වීම අවම කරගැනීමට හැකි වේ.
- ප්‍රතිලාභ උපරිමවීම හා අවදානම්-ප්‍රතිලාභ ප්‍රශස්ත තුලනයක් ලඟා කරගැනීම.
- අක්‍රිය ණය අවම වීම සහ යහපත් තත්ත්වයේ ණය කළඹක්, පවත්වාගැනීම
- නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර ප්‍රතිපත්ති, හා වෙනත් අදාළ අභ්‍යන්තර මාර්ගෝපදේශ පදනම්කර ගනිමින් කවර හෝ කර්මාන්තයකට හෝ අංශයකට හෝ එක් ගණුදෙනුකරුවකුට හෝ නිරාවරණයවීම තහවුරු වීම.

ණය අවදානම් කළමනාකරණයට ප්‍රවේශය



අධ්‍යක්ෂමණ්ඩලය විසින් ණය අවදානම් කළමනාකරණ සහ සුපරීක්ෂණ වගකීම මණ්ඩලීය විධායක ණය කමිටුව වෙත පවරාදී ඇති අතර විධායක ණය කමිටුවේ වගකීම් අතර පහත වගකීම් ඇතුළත් වේ:

- මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව සහ ව්‍යාපාරික ඒකක විමසමින් ණය ප්‍රතිපත්ති සම්පාදනය හා යාවත්කාලීන කිරීම
- විශාල හා ඉහළ අවදානම් පාත්‍රතා, යෝග්‍ය ජ්‍යෙෂ්ඨතා මට්ටම්වලදී සමාලෝචනය කොට, අනුමත කරනු ලබන බව තහවුරු කිරීම පිණිස ණය අනුමත කිරීමේ ව්‍යුහයන් ස්ථාපිත කිරීම
- අනිසි අවදානම් සංකේන්ද්‍රණය වීමක් නොවන බව තහවුරු කිරීම පිණිස තනි පුද්ගල ණය පාත්‍රතා, හා සමස්ත ණය කළඹ පිළිබඳව කාලීන සමාලෝචන පැවැත්වීම
- ප්‍රතිපාදන ප්‍රමාණවත් බව තහවුරු කිරීම හා ඉහළ අවදානම් පාත්‍රතා කළමනාකරණය
- ණය අවදානම ප්‍රමාණානිකරණය ක්‍රමවේදයක් වශයෙන් අවදානම් ශ්‍රේණිගත කිරීමේ පද්ධති සකස් කිරීම හා පවත්වා ගැනීම, විවිධ මට්ටම්වල අවදානම් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීම හා අවශ්‍ය පාලන හා සුපරීක්ෂණ යොදා ගැනීම
- පූර්ව නිර්දිශ්ඨ සීමාව ඉක්මවන ණය යෝජනා අවහිර කිරීම හා ප්‍රතික්ෂේප කිරීම

ණය අවදානම කළමනාකරණය කිරීම

ශක්තිමත් අවදානම් ප්‍රතිපත්ති සහ පාලන රාමුව

ණය අවදානම් රාමුව මාණ්ඩලීය විධායක ණය කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සකස් කරනු ලබන අතර අලුතින් ඇතිවන යහ භාවිතයන් මෙන්ම ඉස්මතු වන අවදානම් පදනම් කරගෙන විධිමත් පරිදි සමාලෝචනය සහ යාවත්කාල කරනු ලැබේ. බැංකුවේ ණය සංස්කෘතිය සහ නිර්දිශ්ඨ ණය අභිරුචිය හා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග වලට අනුකූල විචක්ෂණශීලි සීමාවන් මනාව නිර්වචනය කරනු ලබන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මැනවින් නිර්වචනය වූ ණය ප්‍රතිපත්තියක් බැංකුව සතු වේ.

වගකීමෙන් යුත් ණය දීමේ සංස්කෘතිය

ඉහළ මට්ටමක අභ්‍යන්තර සන්නිවේදනයක් සහ විස්තීර්ණ පුහුණු වැඩසටහන් මගින් අවදානම් අවබෝධයක් සහ වගකීමෙන් යුත් ණය දීමේ සංස්කෘතියක් වර්ධනය කොට ආරක්ෂා කිරීමට සමූහය නිරතුරු උත්සාහ දරයි. වගකිව යුතු ණය දෙන ආයතනයක් ලෙස, බැංකුව සිය ගණුදෙනුකරුවන් වෙත අර්පණය කරනු ලබන ණය පිළිබඳව ප්‍රමිතිගත කරුණු පැහැදිලි කිරීම් ලබාදෙන අතර එසේ ණය අර්පණය කිරීමට හෝ ණය සීමාව වැඩිකිරීමට පෙර ගණුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව හොඳින් පරීක්ෂාකර බලයි.

අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් මගින් අනේකවිධ අවදානම් සාධක නියොජනය කරන අතර, ණය ආපසු ගෙවීම් පැහැර හැරීම් හා අලාභ සිදුවීමේ හැකියාව පුරෝකථනය කිරීම කරනු ලැබිය හැකි වේ. එය බැංකුවේ ගණුදෙනු වත්මන් බාසල් II ප්‍රමිතිගත ප්‍රවේශයේ සිට ඉදිරියේදී ඇතිවිය හැකි ණය අවදානම වෙනුවෙන් අයකළයුතු මූලධන ගාස්තු ගණනය කිරීමේ වැඩි දියුණු කළ ප්‍රවේශයක් දක්වා විතැන්වීමට පහසුකම් සලසනු ඇත.

වගකීම් වෙන් කිරීම

බංකුව ණය අවදානමට පාත්‍රකරවන සියලුම කටයුතු සම්බන්ධයෙන් අවසන් අධිකාරී බලය හා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. ණය අනුමත කිරීමේ සීමාවන් ණය කමිටු හා ව්‍යාපාරික අංශ වෙත ප්‍රති-පවරාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරී වෙත පවරාදී ඇත. පැහැදිලිව ප්‍රකාශිත හා අනුමත අවදානම් ප්‍රතිග්‍රහණ නිර්ණායක සහ විවිධ මට්ටම්වල දී ණය අනුමත කිරීමේ අධිකාරී බලය එක් එක් ව්‍යාපාරික අංශය සතුවේ. ණය පහසුකමක් ගෙවීමෙන් පසු ඇතිවන සැලකිය යුතු වෙනස්කම් (ණය කාලය, කොන්දේසි හෝ අතිරේක ඇප ව්‍යූහයේ වෙනස්කම් වැනි) සඳහා අනුමැතිය අවශ්‍යවේ. ණය තක්සේරු මාර්ගෝපදේශ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ නිපුණතා විශේෂීකරණය පහසු කරවීම සඳහා අනුමැතියට පෙර අවදානම් තක්සේරු කිරීම සහ අනුමැතියට පසු අධීක්ෂණය කිරීම පැහැදිලිව වෙන් කර දක්වා ඇත.

බැංකුව විසින් ණය අනුමත කිරීමේ අධිකාරී බලය එක් එක් නිලධාරියාගේ අදාළ ශ්‍රේණිය අනුව ඔවුන්ට පවරා දෙනු ලබන අතර ඒ පිළිබඳව කාලීන සමාලෝචන පවත්වනු ලැබේ.

අවදානම් ශ්‍රේණිගත කිරීමේ බන්ධනදායීන් හා විචක්ෂණ සීමා

නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව බැංකුව තම සමස්ත ජාලය ඔස්සේ එක් එක් බන්ධනදායීන් වෙත සිය ණය පාත්‍රතාව මැනීම හා තහවුරු කිරීම සිදු කරයි. ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ මූලික හා ප්‍රමුඛ අංගයක් වන්නේ යම් නිරාවරණ මට්ටමකට ඉහළින් වූ එක් එක් ණයගැතියාගේ සවිස්තර අවදානම් ශ්‍රේණිගත කිරීමයි. එසේ ශ්‍රේණිගත කිරීම විචක්ෂණ නිරාවරණ සීමාවන් සකසා ගැනීමටත්, යෝග්‍ය අවදානම් පාදක මිලක් තීරණය කිරීමටත් ඉවහල් වේ.

ණය-වටිනාකම තක්සේරු කිරීමටත්, ණයගැනීම් ශ්‍රේණිගත කිරීමටත්, බැංකුව විසින් අභ්‍යන්තර ඇගයීම් ක්‍රමවේද, ලකුණු කාඩ්පත් සහ බැංකුවේ ලකුණු නවයේ ශ්‍රේණිගත කිරීමේ විභාජනය යොදාගනු ලැබේ. විශාල තොග ණයගැනුම්කරුවන්, ආයතනික හා කුඩා හා මධ්‍යම පරිමාණ ණයගැනුම්කරුවන් ආදී විවිධ කාණ්ඩවලට අයත් වන ණයගැනුම්කරුවන් සඳහා විවිධ අවදානම් ශ්‍රේණිගතකිරීමේ ලකුණු කාඩ්පත් සැලසුම්කර ඇත. මෙම ශ්‍රේණිගතකිරීමේ ලකුණු කාඩ්පත් මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් කාලීනව සමාලෝචනයකර, සත්‍යාපනය කරනු ලැබේ.

ණය අවදානම අඩු කිරීම සහ අතිරේක ඇප කළමනාකරණය

කිසියම් ගිණුමකින්, ගණුදෙනුකරුවකුගෙන් හෝ කළඹකින් ඇතිවිය හැකි ණය අලාභ අවම කිරීම සඳහා බැංකුව විවිධ ක්‍රමවේද භාවිත කරයි.එම ක්‍රමවේද අතර ප්‍රතිව්‍යුහගත කිරීම, ඇප, ණය රක්ෂණය තුළින් ගිවිසුම්ගත වීම, ණය නියෝග හා ඇප ආදී මෙවලම් රාශියක් ඇතුළත් වේ. බැංකුවේ අතිරේක ඇප ප්‍රතිපත්තියට අනුව අතිරේක ඇප ලබාගැනීම සිදු කරනු ලැබේ. සමූහය විසින් ලබාගැනෙන මූලික අතිරේක ඇපවර්ගවලට අනෙකුත් දෑ අතර නිශ්චල හා චංචල දේපල උකස්, මුදල් තැන්පතු, යන්ත්‍ර හා පිරියත,තොග උකස්කර, පොත් ණය, ආයතන හා පුද්ගල ඇප ඇතුළත් වේ.

ණය අධීක්ෂණය සහ සමාලෝචනය

ණය අවදානම් තත්ත්වයන් අඛණ්ඩව හා සක්‍රීය ලෙස අධීක්ෂණය හා කළමනාකරණය කිරීම බැංකුවේ ණය අවදානම් පාලන ක්‍රියාවලියෙහි අනුකල අංගයක් වේ. ණය පාලන දෙපාර්තමේන්තුවේ සමීප සහයෝගය මත, ව්‍යාපාරික ඒකක විසින් මෙකී අධීක්ෂණ කටයුතු මූලිකව ඉටු කරනු ලබයි. ණයගැණුම්කරුවන් හා බැඳී පවතින ණය අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා අවශ්‍ය විශේෂඥ ඥානය හා පළපුරුද්ද ව්‍යාපාරික ඒකකවල එක් එක් ණය නිලධාරීන් සතුව පවතී. තමන්ට වෙන්වූ ණයගැණුම්කරුවන් සංඛ්‍යාවට අදාළව ණය අධීක්ෂණ කටයුතු අඛණ්ඩව ඉටු කිරීම එක් එක් ණය නිලධාරියා සතු වගකීම යි.

රු. 500,000.00/- ඉක්මවන සියලම ණය ගැණුම්කරුවන් අභ්‍යන්තර ණය ගැණුම්කාර අවදානම් ශ්‍රේණිගත කිරීමට හා මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්ෂික සමාලෝචනයට යටත් වේ. අයහපත් බවට පත්වන ණය හඳුනාගෙන, සමීපව අධීක්ෂණයට භාජනය කරනු ලබන අතර ඒවා පිළිබඳ ත්‍රෛමාසික වාර්තා ණය කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. අක්‍රීය වත්කම් මූලික අවස්ථාවේදීම හඳුනාගැනීම මගින් ඒ පිළිබඳව යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරිත්වයට අවකාශ උදාවේ.

හානිකරණය

මූලික ගිවිසුම් කොන්දේසි ප්‍රකාර යම් ණය මුදලක් මත අයවිය යුතු මුදල් අයකර ගැනීමට බැංකුවට නොහැකි වනු ඇති බවට වාස්තවික සාක්ෂි ඇති අවස්ථාවකදී යොදාගනු ලබන විස්තීර්ණ හානිකරණ ප්‍රතිපත්තියක් බැංකුව සතුවේ. ණය හානිකරණ ප්‍රතිපාදනය ශේෂ පත්‍රයේ ණය මුදලේ ඉදිරියට ගෙනා මුදල අඩුකිරීමක් ලෙස වාර්තා කෙරේ. ආදායම් ප්‍රකාශයේ පවා ණය හානිකරණය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සමූහයේ සියලුම පාත්‍රතාවන් සම්බන්ධයෙන් හානිකරණ තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ.

අක්‍රීය ණය (NPL) සහ ප්‍රතිපාදන ආවරණ අනුපාතය

	2017	2016	2015	2014	2013
අක්‍රීය ණය (රු. මිලියන)	**19,573**	17,337	19,144	20,942	33,435
ප්‍රතිපාදන ආවරණ අනුපාතය (%)	**97.5**	110.4	98.3	84.3	61.8

අක්‍රිය ණය අගය



කල් පිරීම අනුව ණය පහසුකම් විග්‍රහය



ප්‍රතිපාදන ආවරණ අනුපාතය



දළ ණය හා ලැබියයුතු මුදල්



ණය අවදානම් කාර්යසාධනය - 2017

පසුගිය වසර හා සැසඳීමේ දී 2017 දෙසැම්බර් මස අවසානය වන විට බැංකුවේ ශුද්ධ ණය හා අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 1,013 ක් දක්වා 13.7% කින් ප්‍රසාරණය විය. ශුද්ධ ණය හා අත්තිකාරම් ප්‍රමාණය බැංකුවේ ශේෂ පත්‍රයේ 69% ක් නියෝජනය කළේය. ණය කළඹ වර්ධනය ප්‍රධාන වශයෙන් බැංකුවේ දිගු-කාලීන ණය, අයිරා හා උකස් මඟින් මෙහෙයවන ලදි.

2017 වසර තුළදී ද වත්කම් ගුණාත්වය ඉහළ මට්ටමක පැවති අතර දළ අක්‍රීය ණය අනුපාතය 2016 වසරේ පැවති 1.9% මට්ටමේ පවත්වාගෙන යන ලදී. අත්තිකාරම් කළඹේ වර්ධනය හමුවේ 2015 වසරේ අගය වන 2.4% හා සැසඳීමේදී එය සැලකිය යුතු වර්ධනයක් විය. 2016 දී රු. බිලියන 950.9 ක් වූ දළ ණය හා අත්තිකාරම් ප්‍රමාණය හා සැසඳීමේදි 2017 වසරෙදී එම ප්‍රමාණය රු. බිලියන 1,074.2 මට්ටමට ලඟාවිය.

ආයතනික ගණුදෙනුකරුවන්ගේ අවදානම් තක්සේරුව



ණය පැහැර හැරීමේ අවදානම

ණය ගිවිසුමක ගිවිසුම්ගත බැඳීම් ඉෂ්ඨ කිරීමට ණයගැතියෙකු හෝ ප්‍රතිපාර්ශ්වකරුවකු අසමත් වීමෙන් පැනනැගිය හැකි අලාභ ණය පැහැර හැරීමේ අවදානම ලෙස හැඳින්විය හැක.

දැඩි ණය ඇගයීම්, පශ්චාත්-ණය අධීක්ෂණය තුළින් සහ ශක්තිමත් ආපසු අයකරගැනීමේ අනුපාතයක් ලගාකර ගැනීම මගින් ණය කළඹ යහපත් තත්ත්වයෙන් පවත්වා ගැනීමට බැංකුව සමත් විය. 2017 වසරේදී, මහජන බැංකුවේ දළ අක්‍රිය ණය අනුපාතය 1.9% ක් විය.

ණය පැහැර හැරීමේ අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතයෙන් බැංකුව සිය ණය පාත්‍රතාවන් සියල්ල සමීපව අධීක්ෂණය කරයි. අලාභ ඇතිවීමේ ඉහළ අවදානම සහිත ණය පාත්‍රතාවන් මුල් අවස්ථාවේදීම හඳුනාගැනීමේ ක්‍රියාවලි බැංකුව සතුවේ. එවැනි පාත්‍රතා පොදුවේ සෝදිසි ලැයිස්තුවක ඇතුළත් කර, ආපසු අයකරගැනීම් උපරිම කරගැනීම සඳහා සාර්ථකව කළමනාකරණය කරනු ලැබේ.

ණය පැහැර හැරීමේ අවදානම් විශ්ලේෂණය

දළ සහ ශුද්ධ අක්‍රිය ණය අනුපාත



නිෂ්පාදනයට අනුව හානිකරණ ප්‍රතිපාදනය - 2017



සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම් ඇති වන්නේ පුද්ගලයන්ට, කර්මාන්ත අංශයට, හෝ ප්‍රදේශවලට අසමාන ආකාරයකට ණය පහසුකම් ලබා දීමෙනි. රාජ්‍ය බැංකුවක් වීමේ ප්‍රතිඵලයක් ලෙස රජයේ සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව රජය සතු ව්‍යාපාර, උකස් හා නිවාස මූල්‍යනය ආදීයට නිරාවරණය වීමට මහජන බැංකුවට සිදුවී ඇත.

උකස් හා නිවාස ක්ෂේත්‍රයන්හි බැංකුව සලසා දී ඇති ණය පහසුකම් සුවිශාල ගණුදෙනුකරුවන් පරාසයක් තුළ විහිදී ඇති බැවින් සංකේන්ද්‍රණ අවදානම අවම වීම මෙන්ම මේ දක්වා සිදුව ඇති මූලධන අලාභය නොසැලකිය යුතු තරම් වේ. කෙසේවුවද, වෙනස්වන සාර්ව ආර්ථික තත්ත්වයන්ට සමගාමීව අවදානම් පාලන කාර්යපටිපාටි ප්‍රතිශෝධනය කිරීමට බැංකුව අඛණ්ඩව ක්‍රියා කරයි.

බැංකුව ණය සපයන රජය සතු ව්‍යාපාරික ආයතන අතරට ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය සහ පොහොර ආනයනය කරන සමාගම් දෙකක් ඇතුළත් වන අතර ශ්‍රී ලංකා රජයේ ප්‍රකට සහයෝගය ඒ සඳහා හිමිවේ. එබැවින් රජය සතු ව්‍යාපාරික ආයතන සඳහා ණය ලබාදීම සැලකිය යුතු අවදානමක් සේ නොසැලකේ.

විශාල ණය පාත්‍රතා සංකේන්ද්‍රණය

(2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 100 ඉක්මවූ)

	කර්මාන්ත අංශ සංඛ්‍යාව	පුද්ගල ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	සෘජු පාත්‍රතාව රු. මිලියන	වක්‍ර පාත්‍රතාව රු. මිලියන	එකතුව රු. මිලියන	ශේෂ පත්‍රයේ ප්‍රතිශතයක් ලෙස සෘජු පාත්‍රතාව
රාජ්‍ය ආයතන සහිතව	**18**	**264**	**456,997**	**194,447**	**651,444**	**45**
රාජ්‍ය ආයතන රහිතව	**17**	**232**	**133,781**	**69,399**	**203,180**	**13**

බැංකුවේ ඉහළම ගණුදෙනුකරුවන් 20 සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ තත්ත්වය

	ඉහළම 3 (%)	ඉහළම 5 (%)	ඉහළම 10 (%)	ඉහළම 20 (%)
රාජ්‍ය ආයතන සහිතව				
2016	46	54	68	82
2017	**39**	**47**	**63**	**76**
රාජ්‍ය ආයතන රහිතව				
2016	29	40	57	69
2017	**16**	**25**	**42**	**57**

සංකේන්ද්‍රණ අවදානම් කළමනාකරණය

සංකේන්ද්‍රණ අවදානම් අධීක්ෂණය හා පාලනය සඳහා බැංකුව හර්ෆින්ඩාල් - හර්ෂ්මන් දර්ශකය (HHI) සහ තනි ණයගැනුම්කාර සීමාව උපයෝගී කරගනු ලැබේ. රු. මිලියන 100 ඉක්මවන (සීමාව හෝ නිගය යන අගයන් දෙකෙන් වැඩි අගය) සියලුම (සෘජු හෝ අවිනිශ්චිත) පාත්‍රතාවන් සම්බන්ධයෙන් නාමය හා අංශය යන දෙඅංශයම පදනම්කර ගනිමින් HHI දර්ශකය ගණනය කරනු ලැබේ. මෙම අංශය, පහසුවෙන් හඳුනාගත හැකි කර්මාන්ත අංශ 16කට බැංකුව සිය ණය කළඹ කොටස් කර ඇත. එක් එක් සංකේන්ද්‍රණ මට්ටම් සඳහා වන දැරිය හැරිය හැකි සීමා පහත දක්වා ඇත:

ප්‍රමිතික	පහළ සංකේන්ද්‍රණය	මධ්‍යම සංකේන්ද්‍රණය	ඉහළ සංකේන්ද්‍රණය
HHI	< 0.15	0.15 – 0.25	> 0.25

මහජන බැංකුවේ 2017 මූල්‍ය වර්ෂයේ ත්‍රෛමාසික තත්ත්වය

	2017 මාර්තු 31	2017 ජූනි 30	2017 සැප්තැම්බර් 30	2017 දෙසැම්බර් 31
නාමික සංකේන්ද්‍රණය (රාජ්‍ය ආයතන සහිත)	**0.12**	**0.11**	**0.09**	**0.07**
නාමික සංකේන්ද්‍රණය (රාජ්‍ය ආයතන රහිත)	**0.04**	**0.03**	**0.02**	**0.02**
ආංශික සංකේන්ද්‍රණය (රාජ්‍ය ආයතන සහිත)	**0.21**	**0.21**	**0.20**	**0.19**
ආංශික සංකේන්ද්‍රණය (රාජ්‍ය ආයතන රහිත)	**0.12**	**0.14**	**0.14**	**0.12**

සංකේන්ද්‍රණ අවදානම් විශ්ලේෂණය

නිෂ්පාදනයට අනුව ණය කළඹ සංකේන්ද්‍රණය - 2017



අංශය අනුව ණය කළඹ සංකේන්ද්‍රණය - 2017



භූ කලාපීය සංකේන්ද්‍රණය - 2017



රජය සතු ව්‍යවසායන් ඇතුළුව ඉහළ ණය පාත්‍රතා සංකේන්ද්‍රණය - 2017



රජය සතු ව්‍යවසායන් හැර ඉහළ ණය පාත්‍රතා සංකේන්ද්‍රණය - 2017



ණය අවදානම් - ආතති පරීක්ෂාව

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්ව මට්ටම් කෙරෙහි පහත දැක්වෙන කරුණුවල විභව්‍ය බලපෑම මැනීම සඳහා ණය අවදානම සඳහා ආතති පරීක්ෂාව සිදු කර අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කරනු ලැබේ:

අක්‍රිය ණය ඉහළයාම	කම්පනයේ විශාලත්වය – 5%	කම්පනයේ විශාලත්වය – 10%	කම්පනයේ විශාලත්වය – 20%
සංශෝධිත මූලික ප්‍රාග්ධන අනුපාතය	10.45%	10.37%	10.23%
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාත	13.12%	13.05%	12.90%
අක්‍රිය ණය කාණ්ඩ තුළ අහිතකර සංචලනයන්	කම්පනයේ විශාලත්වය – 50%	කම්පනයේ විශාලත්වය – 80%	කම්පනයේ විශාලත්වය – 100%
සංශෝධිත මූලික ප්‍රාග්ධන අනුපාතය	10.43%	10.37%	10.34%
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාත	13.10%	13.04%	13.01%
බැංකුව තබාගෙන ඇති අතිරේක ඇපවල බලපත් විකුණුම් වටිනාකමේ අඩුවීම	කම්පනයේ විශාලත්වය – 5%	කම්පනයේ විශාලත්වය – 10%	කම්පනයේ විශාලත්වය – 15%
සංශෝධිත මූලික ප්‍රාග්ධන අනුපාතය	10.48%	10.44%	10.40%
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාත	13.15%	13.11%	13.08%
සක්‍රිය ණය අක්‍රිය ණයවලට වැටීම	කම්පනයේ විශාලත්වය – 1%	කම්පනයේ විශාලත්වය – 2%	කම්පනයේ විශාලත්වය – 3%
සංශෝධිත මූලික ප්‍රාග්ධන අනුපාතය	9.96%	9.39%	8.83%
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාත	12.63%	12.07%	11.50%
විශාල ණය ගැනුම්කරුවන් විසින් පැහැර හැරීම්	කම්පනයේ විශාලත්වය – 5%	කම්පනයේ විශාලත්වය – 7.5%	කම්පනයේ විශාලත්වය – 10%
සංශෝධිත මූලික ප්‍රාග්ධන අනුපාතය	10.08%	9.85%	9.63%
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාත	12.75%	12.53%	12.31%

වෙළඳපොල අවදානම

පූර්විකාව

වෙළඳපොළ අවදානම යනු පොලී අනුපාත, කොටස් මිල ගණන්, විදේශ විනිමය අනුපාත සහ වෙළඳ ද්‍රව්‍ය මිල ගණන් වැනි වෙළඳපොළ විචල්‍යයන්හි අහිතකර සංචලනයන් නිසා ඇති විය හැකි අලාභයන් ය. ප්‍රධාන වශයෙන් බැංකුවේ උකස් කටයුතු නිසා ඇතිවන පොලී අනුපාත අවදානම, විදේශ විනිමය අවදානම, සාමාන්‍ය කොටස් අවදානම සහ වෙළඳ ද්‍රව්‍ය අවදානම බැංකුවේ ප්‍රමුඛ වෙළඳපොළ අවදානම් වේ.

බැංකුවේ ප්‍රමුඛ වෙළඳපොළ අවදානම ප්‍රධාන වශයෙන් ම ඇති වන්නේ එහි වාණිජ හා වාණිජ නොවන ලේඛනවල පොලී අනුපාත අවදානම් සහ උකස් වෙළඳාමෙන් රතුන් මිලට ඇති පාත්‍රතාව යන කරුණු වලිනි. විදේශ විනිමය අවදානමට නිරාවරණය වීම මධ්‍යස්ථ මට්ටමකින් සිදුවන අතර එය ඇති වන්නේ බැංකුවේ හිමිකාරත්ව වෙළඳාම හා විදේශ විනිමය මගින් නිශ්චිත වන ගනුදෙනු මගිනි. බැංකුවේ සාමාන්‍ය කොටස් ආයෝජන ප්‍රමාණය ශේෂ පත්‍රයෙන් හුදෙක් 0.1% ක් පමණක් වන නිසා ස්කන්ධ අවදානමට නිරාවරණය වීම සීමාසහිත වේ.

අරමුණු

- වෙළඳපොළ අවදානම් කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ බැංකුවේ ව්‍යාපාරික ඒකකවල පූර්ව නිර්දේශිත අවදානම් අභිරුචිය ඇතුළත අවදානම-ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම.
- පිළිගත නොහැකි අලාභවලට පාත්‍රවීමෙන් බැංකුව වළක්වා ගැනීම.
- නිර්දේශිත අවදානම් අභිරුචිය ඇතුළත බැංකුව මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යන බව තහවුරු කිරීම.

මහජන බැංකුවේ වෙළඳපොළ අවදානම් පාත්‍රතාව

	2017		2016	
	වාණිජ ලේඛනය	**වාණිජ නොවන ලේඛනය**	වාණිජ ලේඛනය	වාණිජ නොවන ලේඛනය
	රු. මිලියන	**රු. මිලියන**	රු. මිලියන	රු. මිලියන
වත්කම්	**HFT**	**HTM**	HFT	HTM
භාණ්/බිල්පත්	**45,991**	**–**	35,696	–
භාණ්/බැඳුම්කර	**4,143**	**112,351**	8,487	96,172
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	**–**	**40,201**	–	41,416
ශ්‍රී ලංකා රජයේ බැඳුම්කර	**–**	**7,689**	–	7,689
වෙනත් ආයෝජන	**860**	**8,807**	851	6,749
බැරකම්				
ණයකර	**–**	**12,532**	–	12,532

වෙළඳපොළ අවදානම් කළමනාකරණයට ප්‍රවේශය

බැංකුවේ වෙළඳපොළ අවදානම් කළමනාකරණය, ප්‍රතිපත්ති හා අවදානම් අභිරුචි සීමා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම දරන මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව වෙළඳපොළ අවදානම් පාත්‍රතාව මාණ්ඩලීය මට්ටමින් අධීක්ෂණය කරයි.

විධායක මට්ටමකින් වෙළඳපොළ අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේ සහ බැංකුවේ වෙළඳපොළ අවදානම් පාත්‍රතාව නිර්දේශිත අවදානම් අභිරුචිය ඇතුළත පවතින බවට වගබලා ගැනීමේ වගකීම වත්කම් හා බැරකම් කමිටුවට (ALCO) පැවරී ඇත.වෙළඳපොළ අවදානම් තක්සේරුව, අධීක්ෂණය හා වාර්තාකරණය ඇතුළු බැංකුවේ දෛනික අවදානම් කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් වගකීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතු වේ.

බැංකුවේ භාණ්ඩාගාර ගනුදෙනු ඇගයීම හා අධීක්ෂණය භාණ්ඩාගාර ඉදිරිපෙල හා පසුපෙල කාර්යාල කටයුතු වලින් වෙන්ව ස්වාධීනව පවත්වාගැනීම පිණිස භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය (TMO) පිහිටවන ලදී. එම කාර්යාලය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබන අවදානම් සීමාවලට අනුකූලතාව තහවුරු කරයි.



වෙළඳපොළ අවදානම කළමනාකරණය

ප්‍රතිපත්ති

බැංකුවේ වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව තුළ වත්කම් බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තිය, භාණ්ඩාගාර කළමනාකරණ ප්‍රතිපත්තිය, විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා ආතති පරීක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය ආවරණය වේ. මෙකී ප්‍රතිපත්ති එක්ව සියලුම වෙළඳපොල ආශ්‍රිත අවදානම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ, අවමකිරීමේ, අධීක්ෂණය කිරීමේ, වාර්තාකිරීමේ, පටිපාටි සහ ශිල්පීය ක්‍රමවේද පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. කර්මාන්තයේ ප්‍රශස්ත පරිචයන් සැලකිල්ලට ගනු ලබන මෙකී ප්‍රතිපත්ති රාමුවට කාර්යභාර, වගකීම්, පටිපාටි හා අවදානම් තක්සේරුකරණ, අධීක්ෂණ, වාර්තාකරණ සහ පාලන කාර්යයන් ඇතුළත් වේ.

අවදානම් තක්සේරුව

වෙළඳපොල අවදානම තක්සේරු කිරීමට යොදාගන්නා මෙවලම් පරාසයට අවදානම මත වටිනාකම, කාල පරාස පරතරය, සංවේදිතා විශ්ලේෂණය, සහ ආතති පරීක්ෂාව ආදිය අතුළත් වේ. යොදාගනු ලබන තක්සේරු අනුපාතික හා ක්‍රමවේද ස්වාධීන සත්‍යාපනයට යටත් වේ.

වෙළඳපොල අවදානම් සීමා

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසුව සීමාවන් ඇගයීමට ලක්කර වත්කම් හා බැරකම් කමිටුවට නිර්දේශ කරනු ලැබේ. ඒ අනුව, විවෘත තත්ත්ව සීමා, ප්‍රතිපාර්ශ්වීය සීමා, සහ වෙළඳ නියෝජිත සීමා නිශ්චය කරනු ලැබේ. භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය එකී සීමාවන්ට එරෙහි තත්‍ය කාර්යසාධනය අධීක්ෂණයකර, ඒ පිළිබඳව වත්කම් හා බැරකම් කමිටුවට සති දෙකකට වරක් වාර්තා කරයි. සීමා අධීක්ෂණය කරනු ලබන්නේ නිමැවුම, අංශය, ණය ශ්‍රේණිය, හා භූකලාපය පදනම් කරගනිමින් වන අතර වත්කම් හා බැරකම් කමිටුව විසින් නිරතුරුව අධීක්ෂණය කරනු ලබන මෙකී සීමා අවශ්‍ය වේ නම්, විභව්‍ය වෙළඳපොල ගතික පදනම්කර ගනිමින් වඩා පටු සීමා බවට සංශෝධනය කරනු ලැබේ.

ක්‍රියාරම්භක අවස්ථා

අවදානම් අභිරුචි ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති මට්ටම් තුළ බැංකුවේ වෙළෙඳපොළ අවදානම් පාත්‍රතා පවතින බව සහතික කිරීම සඳහා නිශ්චිත කළමනාකරණ ක්‍රියාකාරකම් අවශ්‍ය කරවන අවදානම් සීමාවන් නිශ්චිතව දක්වනු ලැබේ.

පොලී අනුපාත අවදානම්

වෙළඳපොල පොළී අනුපාතික උච්ඡාවචනයන් හේතුවෙන් යම් ආයතනයක මූල්‍ය තත්ත්වය අහිතකර බලපෑමකට ලක්වන අවස්ථාවකදී පොලී අනුපාත අවදානම් හටගනී. එවැනි විචල්‍යයන් මගින් බැංකුවේ ශුද්ධ පොළී ආදායමට සහ වත්කම් හා බැරකම් වලට බලපෑමක් ඇති කරයි. බැංකුවේ ණය කළඹ, වෙළඳාම් සුරුකුම්පත් හා තැන්පතු බැරකම් මගින් බැංකුව පොළී අනුපාත අවදානමට පාත්‍ර වේ. මෙම අවදානම සීමා පැනවීම,හා පොළී පරතරයන් අධීක්ෂණය කිරීම, විවිධ පොළී සංවේදී වත්කම් හා බැරකම් කාණ්ඩ ගැලපුම මගින් පාලනය කළ යුතු වේ.

පොළී අනුපාතික අවදානමේ අනු-කාණ්ඩ පහත දක්වා ඇත:

- ප්‍රතිමිලකරණ අවදානම - ප්‍රතිමිලකරණ කාල පරාස වෙනස්කම් ඇති කරන බැංකුවේ වත්කම් හා බැරකම්වල වෙනස්වන කල්පිරීම් හේතුවෙන් පැනනගී.
- පදනම් අවදානම - බැංකුවේ පොත්වල හා ගම්‍යමාන අරමුදල් පිරිවැය මත තත්‍ය පොළී ආන්තිකය සහ අපේක්ෂිත පොළී ආන්තිකය අතර ඇති වෙනස්කම් මගින් පැනනගී.
- ප්‍රතිලාභ වක්‍ර අවදානම - බැංකුවේ ඉපැයීම්/වත්කම් අගයන් මත සෘණාත්මක බලපෑමක් ඇතිකරවන ප්‍රතිලාභ වක්‍රයේ විතැන්වීම් මගින් පැනනගී.

එක් වර්ෂයක් තුළ අවදානම මත ඉපැයීම් (ශුද්ධ බලපෑම 1%)

	මාස 1ක් දක්වා	මාස 1-3	මාස 3-6	මාස 6-12
ශුද්ධ වත්කම් (රු. මිලියන)	(66,426)	(93,759)	(49,448)	(409,538)
1% ක වෙනස්වීම මත පාඩුව (රු. මිලියන)	(27)	(156)	(185)	(3,072)

පොළී අනුපාත අවදානම් කළමනාකරණය

පොළී අනුපාත අවදානම සඳහා අවදානම් අභිරුචිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර අවදානම මත අගය (VaR) සහ අවදානම මත ඉපැයීම් සඳහා සමස්ත සීමා පැනවීම ද සිදු කරනු ලබයි.

පොළී අනුපාත අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංගවලට බැංකුකරණ හා වෙළඳ පොත්වල තිබිය හැකි සියලු පොළී අනුපාත අවදානම් හඳුනාගැනීම, නක්සේරු කිරීම, කළමනාකරණය හා වාර්තාකරණය සිදුකරනු ලබන බව තහවුරු කිරීම පිණිස වන අනුකූලතා හා කළමනාකරණ රාමුව අර්ථ නිරූපණය කෙරෙන ප්‍රතිපත්තිය ඇතුළත් වේ. අනුමත අවදානම් අභිරුචියට අනුගතව, බැංකුවේ පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීමේ වගකීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සතුවේ. ස්වාධීන ඒකකයක් වන භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය පොළී අනුපාත අවදානම අධීක්ෂණය කිරීමේ වගකීම උසුලයි.

පොළී අනුපාත අවදානම නක්සේරු කිරීම සඳහා යොදාගනු ලබන ශිල්පීයක්‍රම අතරට කාල පරාස පරතර විශ්ලේෂණය, අවදානම මත අඟය හා අවදානම මත ඉපැයීම ඇතුළත් වේ. කාලසීමා පරතරය සහ පොළී අනුපාත අවදානමට සමස්ත පාත්‍රතාව නිසැකකර ගැනීම සඳහා අනුපාත සංවේදී වත්කම් හා බැරකම්වල කල්පිරීමේ කාලසීමාව පදනම් කරගෙන ඒවා කාල ගොනුවලට වෙන් කොට දක්වනු ලැබේ.

බැංකුවේ වත්කම් හා බැරකම් කළඹෙහි ප්‍රති මිලකරණය සම්බන්ධ තීරණ ගැනීමේ වගකීම උසුලන වත්කම් හා බැරකම් කමිටුව, බැංකුවේ කල්පිරීම් නොගැලපීම් මෙන්ම වෙළඳපොළ පොළී අනුපාත ප්‍රවණතා අබණ්ඩව අධීක්ෂණය කිරීමේ වගකීම ද දරයි. බැංකුවේ ඉපැයුම් හා ප්‍රාග්ධනය කෙරෙහි වෙනස්වන ආර්ථික දර්ශකවල ඇති විය හැකි බලපෑම මැනීම සඳහා බැංකු සහ වෙළෙඳ ලේඛනයේ පොළී අනුපාත අවදානම් පාත්‍රතා පිළිබඳව ආනති පරීක්ෂාව ද බැංකුව සිදු කරයි.

එක් එක් විනිමය ඒකකය සම්බන්ධයෙන් කේවල පදනමක් මත ශ්‍රී ලංකා රුපියල් වලින් අවදානම් පාත්‍රතා ගණනය කරනු ලබන අතර එක් එක් විනිමය ඒකකය සඳහා එක් එක් කල්පිරීම් කාලපරාසයේ මුළු එකතුව ගණනය කිරීමෙන් අනතුරුව සියලුම විනිමය ඒකකවල සමස්ත එකතුව ගණනය කරනු ලැබේ. මුළු නැන්පතු බැරකමින් 25% ඉක්මවන පාත්‍රතාවක් දක්වන විනිමය ඒකක පිළිබඳව වෙන වෙනම වාර්තා කරනු ලැබේ.

පොළී අනුපාත අවදානම සෑම මාසයකම අධීක්ෂණය හා නක්සේරු කිරීමට ලක්කර, වත්කම් හා බැරකම් කමිටුවේදී සාකච්ඡාවට භාජනය කෙරේ.

වත්කම්, බැරකම්, කල්පිරීම් හා නොගැලපීම්

2017	**මාස 1ක් දක්වා රු. මිලියන**	**මාස 1-3 රු. මිලියන**	**මාස 3-6 රු. මිලියන**	**මාස 6-12 රු. මිලියන**	**අවු. 1-3 රු. මිලියන**	**අවු. 3-5 රු. මිලියන**	**අවු. 5 ට වැඩි රු. මිලියන**
අනුපාත සංවේදී වත්කම්	**200,122**	**115,808**	**131,423**	**209,181**	**130,426**	**171,780**	**323,791**
අනුපාත සංවේදී බැරකම්	**266,548**	**209,568**	**180,871**	**618,718**	**12,357**	**4,868**	**–**
කාල පරතරය	**(66,426)**	**(93,760)**	**(49,448)**	**(409,537)**	**118,069**	**166,912**	**323,791**
සමුච්චිත පරතරය	**(66,426)**	**(160,186)**	**(209,634)**	**(619,171)**	**(501,102)**	**(334,190)**	**(10,399)**

2016	මාස 1ක් දක්වා රු. මිලියන	මාස 1-3 රු. මිලියන	මාස 3-6 රු. මිලියන	මාස 6-12 රු. මිලියන	අවු. 1-3 රු. මිලියන	අවු. 3-5 රු. මිලියන	අවු. 5 ට වැඩි රු. මිලියන
අනුපාත සංවේදී වත්කම්	177,686	104,958	133,126	183,837	134,510	141,138	271,949
අනුපාත සංවේදී බැරකම්	240,390	229,975	127,125	560,707	11,328	2,084	–
කාල පරතරය	(62,704)	(125,017)	6,001	(376,870)	123,182	139,054	271,949
සමුච්චිත පරතරය	(62,704)	(187,721)	(181,720)	(558,590)	(435,408)	(296,354)	(24,405)

කාල පරතර විශ්ලේෂණයට අනුව 1%ක අහිතකර පොළී අනුපාත වෙනස හේතුවෙන් ස්කන්ධවල වෙළඳපොල අගය මත ඇතිවන බලපෑම



පොළී අනුපාත අවදානම් ආතති පරීක්ෂාව

	කම්පනයේ විශාලත්වය – 0.25%	කම්පනයේ විශාලත්වය – 0.50%	කම්පනයේ විශාලත්වය – 1.00%
2017			
ඉපැයුම්වලට බලපෑම (රු. මිලියන)	**1,680**	**3,359**	**6,718**
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය CAR (%)	**12.90**	**12.61**	**12.04**
2016			
ඉපැයුම්වලට බලපෑම (රු. මිලියන)	1,541	3,082	6,164
සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය CAR (%)	11.79	11.49	10.89

විදේශ විනිමය අවදානම

විදේශ විනිමය (FOREX) අවදානම යනු විනිමය අනුපාතවල අහිතකර උච්චාවචනයන් නිසා ඉපැයුම් සහ/හෝ ප්‍රාග්ධනය කෙරෙහි ඇති වියහැකි බලපෑම ය. විදේශ විනිමය අවදානමට බැංකුව නිරාවරණය වීම ඇති වන්නේ උදාහරණයක් වශයෙන් ආනයන/අපනයන ගනුදෙනු වල සහ ප්‍රේෂණ වැනි හිමිවත් වෙළඳාමෙන් සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් දැක්වෙන ගනුදෙනු සිදුකිරීමෙන්ය.

විදේශ විනිමය අවදානම් කළමනාකරණය

විදේශ විනිමය ගනුදෙනු දැඩි නියාමන රාමුවකින් පාලනය වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කිරීමේ යාන්ත්‍රණය සහ සීමාවන් නියම කරනු ලැබේ. අභ්‍යන්තර වශයෙන් බැංකුව, නියාමන සීමා සහ වත්කම් සහ බැරකම් කමිටුව විසින් අර්ථ දක්වන ලද සීමා ඇතුළත, පුද්ගල ව්‍යවහාර මුදල් පාත්‍රතා මෙන්ම සමාහාර පාත්‍රතා සඳහා විවෘත තත්ත්වයන් මත දැඩි පරිමා සීමාවන් ක්‍රියාත්මක කර ඇත. බැංකුවේ විදේශ විනිමය අවදානම කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සතුවන අතර අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්භාවය සහතික කිරීම සඳහා ඉදිරිපෙල, මධ්‍ය සහ පසුපෙල කාර්යාල අතර පැහැදිලි වගකීම් වෙන්කිරීමක් පවතී. මධ්‍යම කාර්යාලය විවෘත තත්ත්වය, වත්කම් බැරකම් කල්පිරීම් සහ ව්‍යවහාර මුදල් නිරාවරණයන් ස්වාධීනව අධීක්ෂණය කරයි.

විදේශ විනිමය අවදානමට නිරාවරණය වූ කළඹ පිළිබඳ අවදානම් මත අගය ගණනය කිරීම් සහ ආතති පරීක්ෂාව ද බැංකුව විසින් සිදු කරනු ලැබේ. බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (Finacle පදනම්ව) සහ බ්ලූම්බර්ග් පද්ධතිය විසින් සමගාමී VaR ගණනය කිරීම් සිදු කරනු ලැබේ. බැංකුවේ ලාභදායීත්වය සහ ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් කෙරෙහි ඇති වියහැකි බලපෑම මැනීම සඳහා අනුපාත කම්පන යොදා ගනිමින් ආතති පරීක්ෂාව සිදු කරනු ලැබේ.

2017 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය

	ශුද්ධ ආරම්භක තත්ත්වය	සමස්ත පාත්‍රතාව මිලියන
විදේශ විනිමය ඒකකය		
එ.ජ. ඩොලර්	**944**	**121,924**
යුරෝ	**14**	**5,143**
එක්සත් රාජධානි පවුම්	**-24**	**2,962**
ජපාන යෙන්	**-14**	**70**
සිංගප්පූරු ඩොලර්	**17**	**45**
වෙනත්	**8**	**2,108**
සමස්ත පාත්‍රතාව කොටස්කාර අරමුදලේ ප්‍රතිශතයක් ලෙස		**1.2%**



විනිමය අනුපාත අවදානම - ආතති පරීක්ෂාව

	කම්පනයේ විශාලත්වය – 5%	කම්පනයේ විශාලත්වය – 10%	කම්පනයේ විශාලත්වය – 15%
2017			
ඉපැයුම්වලට බලපෑම (රු. මිලියන)	**74**	**147**	**221**
සංශෝධිත සමස්ත CAR (%)	**13.18**	**13.17**	**13.15**
2016			
ඉපැයුම්වලට බලපෑම (රු. මිලියන)	72	144	216
සංශෝධිත සමස්ත CAR (%)	12.07	12.06	12.04

2017 වර්ෂය තුළ මාස අවසාන විදේශ විනිමය NOP සහ දෛනික VaR



ස්කන්ධ මිල අවදානම

ස්කන්ධ අවදානම ඇති වන්නේ සාමාන්‍ය කොටස් මිලගණන්වල වටිනාකමේ ඇතිවන අහිතකර උච්චාවචනයන්හි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය කොටස්වල සාධාරණ මිල පහළයාම නිසාවෙනි. බැංකු වදරන බැංකුවේ සාමාන්‍ය කොටස් අවදානම් නිරාවරණයන් මූලික වශයෙන් ඇතිවන්නේ එය සතු විකිණීමට තබා ඇති ආයෝජන ප්‍රමාණයෙන් වන අතර බැංකුව විසින් පරිපාලිත සමාගම්වල කර ඇති උපායමාර්ගික ආයෝජන ඊට ඇතුළත් නොවේ. සාමාන්‍ය කොටස්වල බැංකුවේ ආයෝජන සමස්ත ශේෂ පත්‍ර වත්කම්වලින් 0.1% ක් පමණක් (හෝ රු. මිලියන 1,474/-ක්) වූ නිසා සාමාන්‍ය කොටස් අවදානම් තත්ත්වය සාපේක්ෂ වශයෙන් සීමාසහිතය.

ස්කන්ධ අවදානම් කළමනාකරණය

ආයෝජන සම්බන්ධ සියලු ප්‍රතිපත්ති සකස්කිරීමේ සහ බැංකුවේ ආයෝජන අවදානම් නිර්දේශිත අවදානම් අභිරුචියට අනුකූලව කළමනාකරණය වන බව සහතික කිරීමේ වගකීම පැවරී ඇත්තේ මාණ්ඩලීය ආයෝජන කමිටුවටය. පරිමාව හා පාඩු නැවතුම් සීමාවන් ඇතුළුව සාමාන්‍ය කොටස් කළඹ නවීකරණය කිරීමේ මෙවලම් හා ශිල්පීය ක්‍රම, මණ්ඩලය අනුමත කළ ආයෝජන බැංකුකරණ ප්‍රතිපත්ති අත්පොතේ පැහැදිලි ව දක්වා තිබේ. කොටස් වෙලඳාම සඳහා අනුමත උපරිම ප්‍රමාණය රුපියල් බිලියන 1.0 ක් වන අතර සත්‍ය ප්‍රමාණය මේ සීමාවට වඩා බෙහෙවින් පහළය.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වෙළඳපොළ අවදානම් ඒකකය මගින්, යෝජිත සාමාන්‍ය කොටස් ගනුදෙනු, හානි තක්සේරු කිරීම් සහ සීමාවන් අනුව ප්‍රමාණයන් ස්වාධීනව අධීක්ෂණය කරනු ලැබේ. අලෙවි නොකරන ලද කොටස් අවදානම් රාමුව පිළිබඳ ස්වාධීන අධීක්ෂණ කාර්යය ද ඒකකයේ වගකීම වේ. ඒ අතර, කොටස් වෙළෙඳපොළ මිල සංචලනයන්, ආයතනවල කාර්යසාධනය මෙන්ම වඩා පුළුල් සාර්ව ආර්ථික තත්ත්වයන් ද ආයෝජන කමිටුව විසින් විධිමත් පදනමක් මත අධීක්ෂණය කරනු ලැබේ.

ස්කන්ධ අවදානමේ ආතති පරීක්ෂාව

	කම්පනයේ විශාලත්වය – 5% රු. මිලියන	කම්පනයේ විශාලත්වය – 10% රු. මිලියන	කම්පනයේ විශාලත්වය – 20% රු. මිලියන
අලෙවිය සඳහා තබා ඇති IS	17	34	68
AFS – OCC කෙරෙහි බලපෑම	40	81	161
සමස්ත බලපෑම	57	115	229

භාණ්ඩ අවදානම

මහජන බැංකුව භාණ්ඩ සමඟ සෘජුවම ගනුදෙනු නොකළත් රන් මිල උච්චාවචනයන් රන් භාණ්ඩ ඇපවල වටිනාකමට බලපාන බැවින් උකස් කාර්යය මගින් බැංකුව භාණ්ඩ අවදානමට ලක්වන බව ඉන් අදහස් වේ. උකස් ක්ෂේත්‍රයේ ප්‍රුරෝගාමිකයෙක් වශයෙන් බැංකුව උකස් සම්බන්ධයෙන් ශක්තිමත් වෙළඳපොල තත්ත්වයක් උසුලයි. කෙසේවුවද, සවිඥානක ප්‍රයත්න තුළින් 2017 වර්ෂයේ බැංකුවේ සමස්ත ණය ප්‍රමාණයෙන් උකස් පාත්‍රතාව 12% වූ පෙර වර්ෂය සමඟ සසඳන විට 13% දක්වා අඩු කර ගැනීමට බැංකුව සමත් විය.

2017 වර්ෂයේ රන් භාණ්ඩ මිල සංචලනය



රන් පවුමකට දෙන උකස් අත්තිකාරම



භාණ්ඩ අවදානම කළමනාකරණය

සිය භාන්ඩ අවදානම කළමනාකරණය කිරීම සඳහා අතිශය සුපරීක්ෂාකාරී ක්‍රියාවලියක් බැංකුව ක්‍රියාවට නංවා ඇත. ණය පිරිනැමීමට පෙර ගනු ලබන ආරක්ෂක පියවරයන්ට උකස් තබන භාන්ඩයේ රන් බර තක්සේරු කිරීම, ගණුදෙනු කරුවන් පිළිබඳව නිසි අවධානයෙන් පසුවීම, වටිනාකමට ලබාදෙන ණය අනුපාතික ඇගයීම තුලින් විචක්ෂණ ණය පවත්වාගැනීම, රන් මිල හා තරගකාරීන්ගේ අර්පණ අබණ්ඩව ඇගයීම, සහ සොරාගන්නා භාණ්ඩ වලින් ඇතිවන පාඩු සඳහා රක්ෂණාවරයක් ලබා ගැනීම ආදිය ඇතුළත් වේ.

ණය පිරිනැමීමට පසු ගනු ලබන ආරක්ෂක පියවරයන්ට උකස්කළ භාණ්ඩ පිළිබඳව නිරන්තර ස්වාධීන තක්සේරු කිරීම් සිදු කිරීම, 5%ක සාම්පලයක රන් බර දිනපතා සත්‍යායනය කිරීම, බේරානොගත් භාන්ඩ ක්‍රමිකව වෙන්දේසි කිරීම ඇතුළත් වේ.

2017 වසර සඳහා වෙළඳපොළ අවදානම් සමාලෝචනය

වෙළඳපොළ අවදානමට තුඩු දෙන විවිධ සාධක පාලනය කිරීම සඳහා දැඩි ප්‍රතිපත්ති හා පටිපාටි ක්‍රියාවේ යොදවා තිබීම මගින් සිය වෙළඳපොළ අවදානම් කළමනාකරණය කිරීමටත් අවමකර ගැනීමටත් බැංකුවට හැකි විය. වෘත්තීය මට්ටමකින් සමස්ත වෙළඳපොළ අවදානම් කළමනාකරණය කරගනිමින් 2017 වසර මුළුල්ලේම ක්‍රියාවට නංවා ඇති අනුමත සීමාවන්ට අනුගතව ක්‍රියා කිරීමට බැංකුවේ භාන්ඩාගාරය සමත් විය.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු අවශ්‍ය පරිදි හා අවස්ථාවල දී බැංකුවේ ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අසමත් වීම නිසා ඇති විය හැකි පිළිගත නොහැකි අලාභයන් වේ. මෙය සාමාන්‍යයෙන් ඇති වන්නේ බැංකුවේ සුරැකුම් හෝ දැඩි වත්කම් මුදල් බවට පරිවර්තනය කිරීමේදී ප්‍රාග්ධන සහ/හෝ ආදායම් පාඩුවකින් තොරව එසේ පරිවර්තනය කිරීමට නොහැකිවීම හේතුවෙනි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයේ අරමුණු

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ කල්පිරීම මත සිය අරමුදල් බැඳීම් ඉටුකිරීමට බැංකුවට සිදුවන විට එම බැඳීම් ඉටුකිරීමට, ද්‍රවශීලතා ආතතිය මැඩ පවත්වා ගැනීමට හා සිය අවදානම් අභිරුචිය ඇතුළත ද්‍රවශීලතාව හා මූල්‍යනය අවදානම් පාලනය කරගැනීමට බැංකුවට හැකි බව තහවුරු කිරීම යි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයට ප්‍රවේශය

බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ ඉලක්කය වන්නේ කාලෝචිත පදනමක් මත සිය ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය බැංකුව පවත්වාගෙන යෑම සහතික කිරීමය. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය අධීක්ෂණය කරන සහ අභ්‍යන්තර ඉලක්කවලට මෙන් ම නියාමන අවශ්‍යතා වලට අනුකූලතාව අබණ්ඩව අධීක්ෂණය කරන මූලික පාලන කම්ටුව වන්නේ වත්කම් හා බැරකම් කම්ටුවය. බැංකුවේ අරමුදල් සම්පාදනය හා ද්‍රවශීලතා තත්ත්වයන් නියමිත සීමාවන් තුළ දිනපතා කළමනාකරණය කිරීමේ වගකීම භාණ්ඩාගාර ප්‍රධානි වෙත පැවරී ඇති අතර මධ්‍ය කාර්යාලය අබණ්ඩ පදනමක් මත බැංකුවේ ද්‍රවශීලතාව ස්වාධීනව අධීක්ෂණය කරයි. මේ අතර, ප්‍රමුඛ ද්‍රවශීලතා දර්ශක අර්ථ දක්වන ලද රාමිතීන් තුළ පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, මාණ්ඩලික සංකලිත අවදානම් කළමනාකරණ කම්ටුව සහ වත්කම් සහ බැරකම් කම්ටුව ප්‍රමුඛ ද්‍රවශීලතා දර්ශක ක්‍රමානුකූලව සමාලෝචනය කරයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ මූලික අංග

ද්‍රවශීලතාව මැනීම

බැංකුව ප්‍රවාහය සහ තොගය යන ද්විත්ව ප්‍රවේශය මගින් ද්‍රවශීලතාව මනී. ප්‍රවාහ ක්‍රමයේදී වත්කම් හා බැරකම් කල්පිරීම පදනම් කරගෙන විවිධ කාලපරාසයන් තුළ ඇතුළට ගලා ඒම් සහ පිටතට ගලා යාම් අතර නොගැලපීම් විශ්ලේෂණය කිරීම මගින් ද්‍රවශීලතාව මනිනු ලැබේ. තොග ක්‍රමයේ දී ණය සහ තැන්පතු අනුපාතය, වගකීමට බැඳීම් අනුපාතය (අයිරාවල උපයෝජනය නොවූකොටස/උපයෝජනය නොවූ අන්තර් බැංකු මාර්ග), ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය සහ සමුච්චිත නොසිහුම් වැනි අනුපාත සමූහයක් අනුව ද්‍රවශීලතාව මනිනු ලැබේ.

විවිධාංගීකරණය වූ අරමුදල්කරණ පදනම

වෙළඳපොළ තත්ත්වයන්, නියාමන කරුණු සහ පොළි අනුපාත සංචලන ප්‍රවණතා මත පදනම්ව බැංකුව බහුවිධ ප්‍රභවයන්ගෙන් ද්‍රවශීලතාව හඳාරමින් විවිධාංගකරණය වූ අරමුදල්කරණ උපායමාර්ගයක් අනුගමනය කරයි. සමස්ත අරමුදල් සම්පාදනයෙන් 84.9% ක කොටසකින් සමන්විත වන තැන්පතු විශාලතම මූල්‍ය සම්පාදන ප්‍රභවය වන අතර අනෙකුත් ණය ගැනීම් (8.0%) සහ කොටස් හිමියන්ගේ අරමුදල් (5.2%) අනෙකුත් ප්‍රභවයන් වේ. තැන්පතු පදනමේ විසිරුණු ස්වභාවය සලකන විට තැන්පතු සංකේන්ද්‍රණය සාපේක්ෂ වශයෙන් අඩුය. අර්ධ ස්ථාවර අරමුදල් ප්‍රභවයක් වශයෙන් සැලකිය හැකි ඉහළ ඉතුරුම් සමානුපාතයක ප්‍රතිලාභ ද බැංකුව සතුය.

අවිනිශ්චිත අවස්ථා අරමුදල් සම්පාදන සැලැස්ම (CFP)

ආතති තත්ත්වයන්හි දී ද්‍රවශීලතා කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශය සපයන අවිනිශ්චිත අවස්ථා අරමුදල් සම්පාදන සැලැස්මක් බැංකුව සතුය. පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා ආරක්ෂා කිරීමත් ද්‍රවශීලතා අර්බුදයක් ඇති වුවහොත් වෙළඳපොළ විශ්වාසය පවත්වාගෙන යෑමත් සැලැස්මේ ඉලක්කය වේ. ක්‍රියාකාරිත්වය සඳහා විශේෂ කාර්යාරම්භක අවස්ථා සහ සමස්ත වත්කම් සහ බැරකම් කම්ටු කණ්ඩායමෙන් සහ අලෙවි හා පර්යේෂණ ප්‍රධානිගෙන් සමන්විත වන අවිනිශ්චිත අවස්ථා මූල්‍ය සම්පාදන සැලැස්මේ විස්තර හා වගකීම් එය පැහැදිලි කරයි. අවිනිශ්චිත අවස්ථා අරමුදල් සම්පාදන සැලැස්ම පහත දැක්වෙන අවස්ථාවල දී ක්‍රියාවට නැංවේ:

- ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය මාසයකට වැඩි කාලයක් 20% කට වඩා පහත වැටී තිබීම
- අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතයක් නොඩකවා දින හතකට වැඩි කාලයක් 25%කින් ඉහළ යෑම
- අක්‍රීය ණය අනුපාතය 50%කට වඩා ඉහළ යාම
- අපේක්ෂිත ප්‍රමාණයට වඩා තැන්පතු ආපසු ගැනීම්
- ඒකාබද්ධ AD අනුපාතය දින 15කට වැඩිකාලයක් 105% ඉක්මවා යෑම
- වෙළඳපොළ සහභාගිවන්නන් විසින් ඇරඹූ පහසුකම් ආපසු ගැනීම හෝ අපගේ ණයගැනිම්වලට වෙළෙඳපොළ අනුපාතයන්ට වඩා වැඩිපුර ගෙවනු ලබන මුදලක් නියම කිරීම
- ණය ප්‍රමාණ කිරීම ඒකක දෙකකට වඩා පහත වැටීම

ප්‍රමුඛ දර්ශක	සීමාව	2017 දෙසැම්බර් 31 දිනට තත්ත්වය
තැන්පතු ණය අනුපාතය - රු. (ශුද්ධ)	<83	81.4%
තැන්පතු ණය අනුපාතය - විදේශ විනිමය	<90%	131.7%
බැඳීම් අනුපාතය	<100%	14.6%
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය - දේශීය	20%	24.1%
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය - අක්වෙරළ	20%	32.0%

2017 වර්ෂයේ ද්‍රවශීලතා අවදානම් කාර්ය සාධනය

වසර තුළ දී බැංකුව, අවදානම් අභිරුචි ප්‍රකාශනය විසින් අර්ථ දක්වන ලද සීමාවන් තුළ සහ අදාළ සියලුම නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිය ද්‍රවශීලතා දර්ශක පවත්වාගෙන ගියේය. වත්කම් හා බැරකම් කල්පිරීම් විශ්ලේෂණයෙන් ද යහපත් ද්‍රවශීලතා තත්ත්වයක් පෙනී යයි. වත්කම් හා බැරකම්වල කල්පිරීම් පැතිකඩ පිළිබඳ විස්තර 283 පිටුවේ දැක්වේ.

විශ්ලේෂණ

තැන්පතු වලට අත්තිකාරම් ප්‍රතිශතය



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය - දේශීය බැංකුකරණ ඒකකය



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය - අක්වෙරළ බැංකුකරණ ඒකකය



තැන්පතු සංකේන්ද්‍රණය - 2017



තැන්පතු වර්ගීකරණය - 2017



අරමුදල් විවිධාංගීකරණය - 2017



තැන්පතු වලට අත්තිකාරම් ප්‍රතිශතය



සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය



ශුද්ධ ණය/මුළු වත්කම්



දුවශීල වත්කම් ආතති පරීක්ෂාව

දේශීය බැංකුකරණ ඒකකය	**2017 දෙසැම්බර් 31 දිනට ශේෂය**	කල්පිත තත්ත්වය 1	කල්පිත තත්ත්වය 2	කල්පිත තත්ත්වය 3
කම්පනයේ විශාලත්වය (%)		5	10	15
දුවශීල වත්කම්(රු. මිලියන)	**298,497**	298,497	298,497	298,497
මුළු බැරකම් (රු. මිලියන)	**1,240,226**	1,240,226	1,240,226	1,240,226
බැරකම් පහළයාම (රු. මිලියන)	–	62,011	124,023	186,034
ප්‍රතිශෝධිත දුවශීල බැරකම් (රු. මිලියන)	–	1,178,215	1,116,204	1,054,192
ප්‍රතිශෝධිත දුවශීල වත්කම්(රු. මිලියන)	–	236,486	174,475	112,463
කම්පනයට පසු දුවශීල වත්කම් අනුපාතය (%)	**24.07**	20.07	15.63	10.67

අක්වෙරළ බැංකුකරණ ඒකකය	**2017 දෙසැම්බර් 31 දිනට ශේෂය**	කල්පිත තත්ත්වය 1	කල්පිත තත්ත්වය 2	කල්පිත තත්ත්වය 3
කම්පනයේ විශාලත්වය (%)		5	10	15
දුවශීල වත්කම් (ඇ.ජ. ඩොලර් '000)	**242,692**	242,692	242,692	242,692
මුළු බැරකම් (ඇ.ජ. ඩොලර් '000)	**750,197**	750,197	750,197	750,197
බැරකම් පහළයාම (ඇ.ජ. ඩොලර් '000)	–	37,510	75,020	112,530
ප්‍රතිශෝධිත දුවශීල බැරකම් (ඇ.ජ. ඩොලර් '000)	–	712,687	675,178	637,668
ප්‍රතිශෝධිත දුවශීල වත්කම් (ඇ.ජ. ඩොලර් '000)	–	205,182	167,672	130,162
කම්පනයට පසු දුවශීල වත්කම් අනුපාතය (%)	**32.35**	28.79	24.83	20.41

2017 වසරේ දුවශීලතා අවදානම් සමාලෝචනය

2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය බැංකු ඒකකයේ හා අක්වෙරළ බැංකු ඒකකයේ ව්‍යවස්ථාපිත දුවශීලතා වත්කම් අනුපාතික, එම ඒකක දෙකටම නියමිත අනුපාතය වූ 20%ට ඉහළින් පහසුවෙන් පවත්වා ගනිමින් පිළිවෙලින් 24.1% හා 32.0% ක් විය. පසුගිය සෑම වසරක් තුලම නියමිත සියලුම නියාමන දුවශීලතා අනුපාතයන් බැංකුව විසින් පවත්වා ගන්නා ලදී.

බැංකුවේ තැන්පතු පදනමෙන් ස්ථාවර තැන්පතු නියෝජනය 57.6%ක් වූ අතර ඉතිරි කිරීමේ තැන්පතු 37.2%කින් ඒ සඳහා දායක විය. තැන්පතුවලින් 17%ක් ඉහළම තැන්පත්කරුවන් 20 දෙනාගේ තැන්පතුය.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලින්, පුද්ගලයින් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් නිසා ඇතිවන සෘජු හෝ වක්‍ර පාඩුව වේ. බාසල් II නිර්වචනය අනුව, මෙහෙයුම් අවදානමට නෛතික අවදානම ඇතුළත් වන නමුත් උපායමාර්ගික හා කීර්තිනාම අවදානම ඇතුළත් නොවේ. ස්වාභාවික ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළත්, නිෂ්පාදිත සහ ක්‍රියාවලි තුළත් මෙහෙයුම් අවදානම පවතී.

බැංකුව නිරාවරණය වන මෙහෙයුම් අවදානම් වන්නේ තාක්ෂණික අවදානම, පුද්ගල අවදානම, සහ නෛතික අවදානම යි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ අරමුණ වන්නේ:

- මෙහෙයුම් අසාර්ථකවීම මගින් උද්ගතවන පාඩු අවම කර ගැනීමත්, අවදානම් මගින් උද්ගතවිය හැකි සුවිශාල අලාභ මගහරවා ගැනීමත් ය
- අවදානම් පිරිවැය කාර්යක්ෂමව සමස්ත ව්‍යාපාරයම ආවරණය වන පරිදි කළමනාකරණය කිරීම සඳහා බහුවිධ කාර්යයන් හා ව්‍යාපාරික ඒකකවල මෙහෙයුම් අවදානම් පිළිබඳව පොදු වැටහීමක් සංවර්ධනය කිරීම
- බරපතල හා විනාශකාරී අවදානම්වලට සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට අභ්‍යන්තර ධාරිතා බිහිකිරීම හා වර්ධනය කිරීම
- අභ්‍යන්තර සම්පත් මනා කළමනාකරණය හා මෙහෙයුම් සඵලදායී අයුරින් පාලනය කිරීම තුළින් පිරිවැය ඉතුරුම් උදාකර ගැනීම

මෙහෙයුම් අවදානම් කළමනාකරණයට ප්‍රවේශය

බැංකුවේ මෙහෙයුම් කළමනාකරණ රාමුව මගින් විවිධ වර්ගවල මෙහෙයුම් අවදානම් පාත්‍රතාව කළමනාකරණය කිරීම සඳහා ස්ථාපිතව ඇති ප්‍රතිපත්ති, ව්‍යුහයන් සහ ක්‍රියාවලින් පැහැදිලි ව දක්වා ඇත. මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ සහාය ලබන අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්ති සකස් කිරීමේත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවේ ශක්තිමත්භාවය සහතික කිරීමේත් වගකීම උසුලයි. "පළමු ආරක්ෂක වළල්ල" ලෙස ක්‍රියාත්මක වන ශාඛා සහ ව්‍යාපාර ඒකක, ආරම්භක අවස්ථාවේ දී මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම සහ එකී අවදානම් අලාභ සිදුවීම් පිළිබඳව දත්ත ගබඩාවක් පවත්වා ගෙනයන ක්‍රමිකව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම සිදු කරයි. බැංකුව තුල මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීමට,

තක්සේරු කිරීමට සහ වාර්තා කිරීමට ව්‍යුහගත යාන්ත්‍රණ ස්ථාපිත කර ඇති අතර අභ්‍යන්තර විගණනය ද ක්‍රියාත්මකව පවතින මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලින්නි ඵලදායීත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ඉහළ කළමනාකාරිත්වයට කාලීනව තහවුරු කිරීම් ලබා දේ.



මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ව්‍යාපාර ඒකක සමඟ එක්ව ව්‍යාපාර ක්‍රියාවලින් හඳුනාගැනීම සහ මෙහෙයුම් අවදානම් ඇති විය හැකි ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා කටයුතු කරයි. ඒ හැරුණු විට සියලු ම ශාඛා හා ව්‍යාපාර ඒකක කාර්යමණ්ඩල මෙහෙයුම් අවදානම්වලට නිරාවරණයවීම් පිළිබඳ පුහුණුව ලබන අතර එකී අවදානම් සක්‍රීය ලෙස හඳුනාගැනීමේ සහ තක්සේරු කිරීමේ නියැළේ.

අවදානම් හා පාලන ස්වයං ඇගයීම (RCSA) සියලු ම ප්‍රධාන ව්‍යාපාර ඒකකවලට අදාළ ව සිදු කරනු ලබන අතර එමගින් අර්ථ දක්වන ලද මෙහෙයුම් අවදානම් පරාමිතීන් වලට නිරාවරණය වීම තක්සේරු කිරීමට ඒකකවලට හැකියාව ලැබේ. ඉන් ලැබෙන ප්‍රතිඵල අවදානම් කළමනාකරණයේ ඇති විය හැකි පරතරයක් හඳුනාගැනීම හා ඒ සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා භාවිත කරනු ලැබේ. පාඩු සිදුවීම් හා ආසන්න අහිමිවීම් මගින් ද අවදානම් හඳුනාගනු ලබන අතර ඒවා ඒකරාශී කොට ව්‍යාපාර ඒකක විසින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වරින් වර වාර්තා කරනු ලැබේ. දෙපාර්තමේන්තුව පාඩු සිදුවීම් පිළිබඳ දත්ත සමුදායක් පවත්වාගෙන යයි. බැංකුව ද නව නිෂ්පාදිත ක්‍රියාවලින් හා ක්‍රියාකාරකම් මගින් ඇති විය හැකි මෙහෙයුම් අවදානම් බලපෑම අබණ්ඩ පදනමක් මත තක්සේරු කරයි.

සීමාවන් සහ දැරිය හැකි මට්ටම්

අධ්‍යක්ෂ මණ්ඩලය, බැංකුවේ අවදානම් අභිරුචි ප්‍රකාශනය මඟින් මෙහෙයුම් අවදානම් දර්ශක සඳහා විශේෂිත සීමා හා දැරිය හැකි මට්ටම් අර්ථ දක්වා ඇත. ඒවාට ඇතුළත් වන්නේ අභ්‍යන්තර හා බාහිර පාඩු සිදුවීම් සංඛ්‍යාව, මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් වශයෙන් මෙහෙයුම් පාඩුවල සමස්ත වටිනාකම සහ සතුටුදායක මට්ටමට වඩා අඩු ඒවා වශයෙන් වර්ග කරන ලද ශාඛා විගණන ප්‍රතිශතය යන ඒවාය. මාණ්ඩලික සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිරන්තර වාර්තා කිරීම මඟින් අවශ්‍ය පරිදි ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග ගනු ලබන බව තහවුරු වේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රවේශය

	මෙහෙයුම් අවදානම් අභිරුචිය				
	ඉහළ අවදානම	මධ්‍යම අවදානම	පහළ අවදානම	**2017 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය**	2016 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය
මෙහෙයුම් අලාභ - අභ්‍යන්තර	>25	25 – 10	<10	**0**	12
මෙහෙයුම් අලාභ - බාහිර	>1,000	400 – 1,000	<400	**321**	236
මුළු මෙහෙයුම් වියදමට අනුව මුළු මෙහෙයුම් අලාභ	>1.0%	0.5% – 1.0%	<0.5%	**0.02**	0.29%
පද්ධති පැවැත්ම	<97.5%	97.5% – 99.8%	>99.9%	**99.61%**	99.50%
සතුටුදායක මට්ටමට වඩා අඩු යයි බැංකුවේ විගණන ප්‍රමාණකරනය කරන ලද ශාඛා ප්‍රතිශතය	>15%	15%	Nil	**12%**	9%

අවදානම් අවම කිරීම

බැංකුව තුළ ප්‍රශස්ත මෙහෙයුම් පරිසරයක් පවත්වාගෙන යෑම සඳහා අවදානම් අවම කිරීමේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මකව පවතී. ඒවාට පහත දැක්වෙන ඒවා ඇතුළත් වේ:

- මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි විස්තීර්ණ රාමුව
- ව්‍යාපාරික අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා ආපදාවලින් මිදීමේ සැලසුම් සහ අර්බුද කළමනාකරණ ක්‍රියාපටිපාටි
- වගකීම් වෙන් කිරීම
- රක්ෂණය මගින් අවදානම් පැවරීම (උදාහරණ වශයෙන් ස්වාභාවික ව්‍යසන/ගිනි සහ සොරකම් කරන ලද භාණ්ඩ උකස් කිරීම් නිසා භෞතික වත්කම්වලට හානි සිදුවීම වැනි)
- බාහිර සේවා සපයන පාර්ශ්ව තෝරාගැනීම හා අධීක්ෂණය සඳහා දැඩි නිර්ණායක අනුගමනය කිරීම
- අඛණ්ඩ කාර්යමණ්ඩල පුහුණුව තුළින් අවදානම් පිළිබඳ දැනුවත් සංස්කෘතියක් නිර්මාණය කිරීම
- නව නිෂ්පාදන හා සේවා හඳුන්වාදීමට පෙර ඇති විය හැකි මෙහෙයුම් අවදානම පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම
- ඊට අමතරව, බැංකුව විසින් බාසල් II මාර්ගෝපදේශවලට අනුකූලව නව මෙහෙයුම් අවදානම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දී ඇත. එය භාවිතකරන්නන්ට හිතකාමී අන්තර්ජාලය පාදකකරගත් යෙදවුමක් වන අතර එමගින් පවත්නා නැතිවූ දත්ත කළමනාකරණ පද්ධතිය සහ බැංකුවේ ඇතැම් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කරනු ලැබේ. මෙම පද්ධතිය මොඩ්‌යුල පහකින් සමන්විත වන අතර එමගින් සඵලදායී මෙහෙයුම් අවදානම් කළමනාකරණයක් සඳහා පහසුකම් සැලසේ. එකී මොඩ්‌යුල අතර සිද්ධි කළමනාකරණය, නිකුතු හා ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රමුඛ අවදානම් දර්ශක, අවදානම් පාලනය, සහ ස්වයං ඇගයීම හා වාර්තාකරණය ඇතුළත් වේ.

අවදානම් වාර්තාකරණය

අවදානම් සඳහා තුඩුදෙන මූල හේතු, ප්‍රවණතා සහ අවදානම් සිදුවන වාර ගණන ක්‍රමවත්ව හඳුනාගැනීම සඳහා ඉවහල් වන මෙහෙයුම් අවදානම් අලාභ සහ සිදුවන්නට ගිය පාඩු පිළිබඳ දත්ත සමුදායක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අතර සැලකිය යුතු පාඩු සිදුවීම්, ඉස්මතු වන ගැටලු සහ සමාලෝචන ක්‍රියාකාරිත්වය පිළිබඳව ත්‍රෛමාසික වාර්තා නිකුත් කිරීමද කරනු ලැබේ. එම තොරතුරු අවදානම් කමිටු වාර්තාවේ අන්තර්ගත කර අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. පාලන අසාර්ථකත්වයන් මෙහෙයුම් අවදානම් කමිටුවට වාර්තා කරනු ලබන අතර ඒවායේ ඇති විය හැකි බලපෑම් සහ සංඛ්‍යාතය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට යොමු කරනු ලැබේ.

මෙහෙයුම් අලාභ - ප්‍රවනතා 2013-2017

වර්ෂය	උකස් කිරීම් රු මිලියන	සාමාන්‍ය බැංකුකරණ රු මිලියන	එකතුව රු මිලියන
2013	80	36	116
2014	93	15	108
2015	36	67	103
2016	17	61	78
2017	**20**	**43**	**63**
එකතුව	246	222	468
සාමාන්‍යය	49	44	94



මෙහෙයුම් අලාභ සිදුවීම් (සංඛ්‍යාත්මකව) - 2017



මෙහෙයුම් අලාභ සිදුවීම් (වටිනාකම අනුව) - 2017



මෙහෙයුම් අලාභ සිදුවීම්

	2017				2016			
	සංඛ්‍යාව	**%**	**වටිනාකම රු. මිලියන**	**%**	සංඛ්‍යාව	%	වටිනාකම රු. මිලියන	%
අභ්‍යන්තර වංචා	**0**	**0**	**–**	**0**	12	3	10.3	13
බාහිර වංචා	**244**	**76**	**36.4**	**58**	236	68	52.3	67
සේවානියුක්ති පරිචයන් හා සේවා ස්ථාන ආරක්ෂාව	**0**	**0**	**–**	**0**	0	0	–	0
සේවාලාභී, නිෂ්පාදන හා ව්‍යාපාරික පරිචයන්	**0**	**0**	**–**	**0**	6	2	0.4	0
භෞතික වත්කම් හානි	**4**	**1**	**6.3**	**10**	9	3	1.1	1
ව්‍යාපාර ඇනහිටීම් හා පද්ධති අසමත් වීම්	**3**	**1**	**17.3**	**28**	4	1	0.6	1
ක්‍රියාත්මක කිරීම්, ඉටුකිරීම් හා ක්‍රියාවලි කළමනාකරණය	**70**	**22**	**2.8**	**4**	78	23	13.1	17
එකතුව	**321**	**100**	**62.8**	**100**	345	100	77.8	100

මෙහෙයුම් අලාභ වර්ගීකරණය

බාසල් II මගින් ප්‍රක්ෂේපිත බැංකු සහ මූල්‍ය ආයතන විසින් සිය අවධානයට ගතයුතු මෙහෙයුම් අවදානම් හතක් වේ.



අභ්‍යන්තර වංචා - අභ්‍යන්තර වංචා යනු යම් ආයතනයක අභ්‍යන්තරයේ සිදුවන එම ආයතනයේ සුභසිද්ධියට හානිවන වංචනික ක්‍රියාවන් වේ. වංචනික අභිප්‍රාය, බදු අනනුකූලතාව, වත්කම් අවභාවිතාව, ව්‍යාජ ලේඛන සකස් කිරීම, අල්ලස, ඕනැකමින් තම තනතුර වැරදියට සඳහන් කිරීම, හා සොරකම යන ක්‍රියාවන් මගින් අලාභ සිදුවිය හැක.

බාහිර වංචා - බාහිර වංචා යනු යම් තෙවන පාර්ශ්වයක් විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් වේ. ඒවාට සොරකම, පරිගණක පද්ධති තුළට වංචාවෙන් වැද දත්ත විනාශ කිරීම, අනවසර තොරතුරු ආදිය ලබාගැනීම ඇතුළත් වේ.

සේවානියුක්ති පරිචයන් හා සේවා ස්ථාන ආරක්ෂාව - සේවානියුක්ති, සෞඛ්‍යය හා ආරක්ෂාව පිලිබඳ නීති හා රෙගුලාසි අනුව ක්‍රියානොකිරීම, අයහපත් සේවක සබඳතා, අචාර සම්පන්න නොවන සේවය අවසන් කිරීම හා වෙනස්කොට සැලකීම ආදියේ හේතුවෙන් පැන නගින අලාභ මේ ගණයට අයත් වේ. මෙමඟින් ආයතනය සුවිශාල මූල්‍ය හා කීර්ති නාම අවදානමකට ලක් කෙරේ.

සේවාලාභී, නිමැවුම් හා ව්‍යාපාරික පරිචයන් - සේවාලාභීන්, වෘත්තිකයන් කෙරෙහි වන බැඳීම් ඉටුකිරීමට අභිප්‍රායකින් තොරව අපොහොසත්වීම සහ නොසැලකිලිමත් පරිචයන් හේතුවෙන් මෙවැනි අලාභ උද්ගත වේ. පොද්ගලිකත්ව හා භාරකාරත්ව උල්ලංඝනයන්, රහස්‍ය තොරතුරු අවභාවිතාව, වෙළඳපොල හැසිරවීම, මුදල් විශුද්ධිකරණය, අවසරනොලත් ක්‍රියාකාරකම්, සහ නිෂ්පාදන ඌණතා ආයතනයට නෛතික ක්‍රියාමාර්ගවල යොමුවීමට තුඩු දෙන ඉතා සුලබ ක්‍රියාවන් වේ.

භෞතික වත්කම් හානි ස්වාභාවික විපත්, ත්‍රස්තවාදය හා මිලේච්ඡත්වය හේතුවෙන් භෞතික වත්කම්වලට සිදුවන හානි නිසා හටගන්නා අලාභ වේ.

ව්‍යාපාර ඇනහිටීම් හා පද්ධති අසමත් වීම් - ව්‍යාපාර ඇනහිටීමට හා මූල්‍ය අලාභවලට හේතුවන පද්ධති (මෘදුකාංග හා දෘඩාංග) ක්‍රියාවිරහිතවීම, දුරකථන සන්නිවේදන ඇනහිටීම සහ විදුලිය බිඳවැටීම ආදිය මගින් පැන නගින අලාභ මීට අයත් වේ.

ක්‍රියාත්මක කිරීම්, ඉටුකිරීම් හා ක්‍රියාවලි කළමනාකරණය - දත්ත සැකසීමේදී, අවසන්නිවේදනය, කාලරාමු නොතැකීම, ගණකාධිකරණ වැරදි, සාවද්‍ය වාර්තා, සාවද්‍ය සේවාලාභී වාර්තා, නොසැලකිලිමත්කම මත සේවාලාභී වත්කම් අහිමිවීම, සහ වෙළඳුන් අතර ආරාවුල් ඇතුළු සේවා ඉටුකිරීමේ, ගණුදෙනු කිරීම් හෝ ක්‍රියාවලිවල අසාර්ථකවීම් හේතුවෙන් හටගන්නා අලාභ වේ.

2017 වසරේ මෙහෙයුම් අවදානම් සමාලෝචනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද සීමාවන්ට වඩා බෙහෙවින් අඩු අවදානම් දර්ශක සහිතව මෑත වර්ෂවල දී බැංකුවේ මෙහෙයුම් අවදානම් කාර්යසාධනය පැසසිය යුතු මට්ටමක පවතී. පසුගිය පස් වසර තුළ තථ්‍ය මෙහෙයුම් පාඩුවල සාමාන්‍යය රුපියල් මිලියන 94ක් පමණ වේ. පසුගිය වසර හා සැසඳීමේ දී 2017 දී මෙහෙයුම් පාඩු සිදුවීම් පරිමාව අනුව 6.9% කින් සහ වටිනාකම අනුව 19% කින් පහත වැටුණි.

සිදුවීම් සංඛ්‍යාව මෙන්ම වටිනාකම අනුව බාසල් II පාඩු සිදුවීම් එක් එක් වර්ගය යටතේ පසුගිය වර්ෂ දෙක තුළ මෙහෙයුම් පාඩු සැසඳීම පහත රූප සටහනින් දැක්වේ. බාහිර වංචාවලින් පැන නගින පාඩු සිදුවීම් ඉතාම වැදගත් මෙහෙයුම් පාඩු ප්‍රභවය වන අතර එය මූලික වශයෙන්ම ව්‍යාජ උකස් තැබීම සහ සොරකම් කරන ලද භාණ්ඩවලින් සමන්විත වේ. මේ වාර්තාවේ සාකච්ඡා වන පරිදි, උකස් තැබෙන රත්රන් වල ගුණාත්මකභාවය සහතික කිරීම සහ එවැනි භාණ්ඩ සඳහා රක්ෂණ ආවරණය ලබා ගැනීම සඳහා නිබෙන යාන්ත්‍රණයන් අපි ශක්තිමත් කොට ඇත්තෙමු.

2015 දී 5.3% ක් ලෙස හා 2016 දී 4.4% ක් ලෙස පැවති සේවක පිරිවැටුම 2017 දී 3.3% දක්වා පහත වැටී ඇති අතර එය යහපත් දර්ශකයකි.

තාක්ෂණ අවදානම

බැංකුවේ මෙහෙයුම් බොහෝකොට, තොරතුරු තාක්ෂණය මත රඳාපවතින බැවින් බැංකුව සහජයෙන්ම තාක්ෂණ අවදානමට මුහුණ දේ. මෙම තාක්ෂණ අවදානමට තොරතුරුවලට අනවසර ප්‍රවේශය හා සොරාගැනීම, පද්ධතිවල බිඳවැටීම් හා අසාර්ථකවීම්, යල්පිනූ තාක්ෂණය සහ ව්‍යාපාර පරිමාවට සහාය වීම සඳහා ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් ආදිය ඇතුළත් වේ.

බැංකුවේ සංකීර්ණ ක්‍රියාවලීන් පහසු කරවීම සහ තොරතුරු විශාල ප්‍රමාණයන් හැසිරවීම සඳහා තාක්ෂණය මත දැඩි සේ යැපීමට සිදුවී තිබීම නිසා, බැංකු අංශය සම්බන්ධයෙන් තාක්ෂණය, තරඟකාරිත්වයේ වාසිය සලසාදෙන මූලික ප්‍රභවයක් වන්නේය. එම කරුණ ඵලදායී තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක ඇති අතිශය වැදගත්කම තව තවත් අවධාරණය කරයි. බැංකුවේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ රාමුව අධීක්ෂණය කිරීමේ වගකීම මාණ්ඩලීය තොරතුරු තාක්ෂණ කමිටුවට පැවරී ඇති අතර, පද්ධති සංකලනය සහ නව මෘදුකාංග හා දෘඩාංග භාවිතාව සඳහා වන අවශ්‍යතා එම කමිටුව නිගමනය කරන අතර තොරතුරු තාක්ෂණ උපායමාර්ග, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ද නිර්දේශ කරයි.

අවදානම් දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණය ඒකකය සමග එක්ව බැංකුවේ මූලික තොරතුරු පද්ධතීන්හි ශක්තිමත් භාවය මැනීම ඉලක්ක කරගත්, ප්‍රමුඛ අවදානම් දර්ශක විධිමත් පරිදි සමාලෝචනය කරයි. උචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා කළමනාකාරිත්වයේ අවධානය යොමු කරවීම සඳහා සමගාමී අවදානම් ප්‍රවේශයන් අර්ථ නිරූපණය වී තිබේ.

තොරතුරු තාක්ෂණ අවදානම් දර්ශක පහත දැක්වෙන පරිදි වේ:

විදගත්කම	පද්ධති	උපයෝජ්‍යතාවය මුළු වැඩ කරන පැය ගණනේ ප්‍රතිශතයක් වශයෙන් සහ අවදානම් මට්ටම - 2017		සත්‍ය උපයෝජ්‍යතාවය
ඉතාම වැදගත් (මාර්ගගත තත්කාලීන පද්ධති)	මධ්‍යම ATM ස්විචය	≥ 99.9%	කොළ - අඩු අවදානම	100%
	හර බැංකුකරණ පද්ධතිය	99.8%-97.5% අතර	ලා කහ - මධ්‍යස්ථ අවදානම	
	SWIFT			
	ණය/හර කාඩ්පත් කළමනාකරණ පද්ධතිය	97.5% ට අඩු	රතු - අධි අවදානම	
මධ්‍යම ප්‍රමාණයේ තීරණාත්මක	පිළිබිඹුව ග්‍රහණය සහ ඉදිරිපත් කිරීමේ ක්‍රමය	≥ 97.5% 97.4%-95.0% අතර 95.0% ට අඩු අවදානම	කොළ - අඩු අවදානම ලා කහ - මධ්‍යස්ථ අවදානම රතු - අධි අවදානම	100%
	SMS බැංකුකරණ ක්‍රමය			
	අන්තර්ජාල ප්‍රේෂණ ක්‍රමය			
	අන්තර්ජාල බැංකුකරණ ක්‍රමය			
	Finacle (භාණ්ඩාගාරය)			
	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (කේවල)			99.61%
අඩු	IHRM පද්ධතිය	≥ 90.0%	කොළ - අඩු අවදානම	100%

සමස්තයක් වශයෙන් ගත් කල පද්ධතිවල උපයෝජ්‍යතාවය ඉහළ මට්ටමක පැවතිණි.

තාක්ෂණ අවදානම අවම කිරීම

දත්ත නැතිවීමේ අවදානම වළක්වාගැනීම පිණිස බැංකුව විසින් මැනවින් ස්ථාපිත තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහයක් පවත්වාගනු ලැබේ. ඒ සඳහා පරිගණක පද්ධතියෙන් වෙන්වූ වෙනත් ස්ථානයක උපස්ථ දත්ත ගබඩාවක් පවත්වාගනු ලැබේ.

- පද්ධතියට භාවිතකරන්නන්ගේ ප්‍රවේශය සත්‍යාවත් කිරීම සහ තොරතුරු ඇතුළත් කරනු ලබන මට්ටම්වලදී අවශ්‍ය නහවුරු කිරීම් හා සත්‍යායනය කිරීම් සක්‍රියකිරීම සඳහා මුරපද හා ප්‍රවේශ පාලන විධික්‍රම භාවිතය
- සර්වර් හා යුපීඑස් ගබඩාකර ඇති කාමරවල අධික රස්නය ග්‍රහනය කරගැනීම සඳහා ගිණි ආරක්ෂණ හා දුම් අනාවරකයන් සවිකර තිබීම
- ප්‍රාථමික ස්ථානයේ සිට මෙහෙයුම් කටයුතු කළ නොහැකි විට මෙහෙයුම් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ආපදා ප්‍රතිප්‍රාත්ති සැලැස්ම
- මූලික ආරක්ෂක ප්‍රමිති පදනම්කර ගනිමින් අවදානම් කළමනාකරණ කමිටුවට සෘජුවම වාර්තා කළ හැකිවන පරිදි තොරතුරු ආරක්ෂක නිලධාරී තනතුර තො.තා. දෙපාර්තමේන්තුවෙන් වෙන්ව වෙනම ස්ථාපිත කිරීම. තො.තා. අවදානම් අවම කරගැනීම පිණිස තොරතුරු ආරක්ෂක නිලධාරී විසින් අවදානම් අවම කරගැනීම, අධීක්ෂණය හා නිලධාරීන් පුහුණු කිරීම ආදිය ඉටු කරනු ලබයි.
- බැංකුවේ සමස්ත තොරතුරු තාක්ෂණ පද්ධතිය සඳහා තොරතුරු ආරක්ෂණය හා සුරක්ෂාව පිළිබඳ ලොව ඉහළම ප්‍රමිති සහතිකය වන ISO/IEC 27001:2013 ප්‍රමිති සහතිකය ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය (ISO) වෙතින් දිනා ගැනීමට මහජන බැංකුව සමත් විය. බැංකුවේ දැඩි තොරතුරු ආරක්ෂණ කළමනාකරණ වැඩපිළිවෙල සහ තොරතුරු ආරක්ෂණය හා සුරක්ෂාව පිළිබඳ ලොව ඉහළම ප්‍රමිතිවලට එහි අනුගතභාවය ඇගයනු වස් එකී ප්‍රමිති සහතිකය බැංකුවට පිරිනමන ලදී. මෙම ප්‍රමිති සහතිකය දිනාගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය බැංකුව මහජන බැංකුව යි.

පුද්ගල අවදානම

මානව සම්පත් හිඟය, යෝග්‍ය නොවන සේවක ක්‍රියාකාරිත්වය සහ සේවකයින් සම්බන්ධ නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීමට බැංකුව අසමත් වීම වැනි මානව සම්පත් ආශ්‍රිත කරුණුවලින් ඇති විය හැකි අවදානම වශයෙන් පුද්ගල අවදානම අර්ථ දැක්විය හැකිය. සේවක භාවිතයන්හි ඒකමතිකත්වය, ඵලදායී බඳවාගැනීමේ පරිචයන් සහ අපේ සේවකයින්ගේ වටිනාකම පිළිබඳ සාධකය වැඩි දියුණු කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය සහතික කරන විස්තීර්ණ මානව සම්පත් ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන් මගින් බැංකුවේ මානව සම්පත් සම්බන්ධ අවදානම් කළමනාකරණය කරනු ලැබේ.

පුහුණු කුසලතා සම්පන්න කාර්යමණ්ඩලයේ පිරිවැටුම නිපුනතාව හා ඵලදායීත්වය පිරිහී යාමට තුඩු දෙනු ඇති අතර එමඟින් බැංකුවේ තරගකාරිත්වයට බලපෑම් සිදුවේ. එබැවින්, සුදුසුකම්ලත්, කුසලතා පිරි සේවකයන් සේවයේ යෙදවීමටත්, ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයන් බැංකුව තුළ රඳවාගැනීමටත් ක්‍රියාකළ යුතු වේ. ආකර්ෂණීය ප්‍රතිලාභ අත්වන වැඩ පරිසරයක් තුළ ඉහළ මට්ටමක කාර්ය නියුක්තියක් සලසා දීම බැංකුව මුනුණ දෙන අභියෝගයකි.



නෛතික අවදානම

නෛතික අවදානම යනු අදාළ නීති හෝ රෙගුලාසිවලට අනුකූල නොවීම නිසා පැනවෙන දණ්ඩන, දඩ ආදියෙන් ඇතිවන අලාභ මෙන්ම කීර්තිනාම හානි වේ. ගිවිසුම් හෝ සාධනපත්‍ර බලාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉපැයීම්වලට සිදුවිය හැකි අලාභ ද ඊට අයත් වේ.

බැංකුවේ නෛතික අවදානම නීති අංශය විසින් කළමනාකරණය කරනු ලබන අතර, සේවාලාභීන් සමඟ ගිවිසුම්වලට එළඹීමේ දී නිසි අභ්‍යන්තර කාර්ය පටිපාටි අනුගමනය කරනු ලැබේ. බැංකුවේ නෛතික වශයෙන් බැඳීමක් ඇති කරන සියලුම ගිවිසුම්වලට අනුකූලතා සහ නීති අංශ විසින් අත්සන් කරනු ලැබීම සහතික කිරීමේ වගකීම ව්‍යාපාර ඒකකවලට පැවරේ.

කීර්තිනාම අවදානම

ආයතන සන්නාමයට අහිතකර ලෙස බලපාන යම් සිදුවීමක් හෝ සිද්ධියක් මගින් පැනනගින වක්‍ර අලාභ කීර්තිනාම අවදානම් ලෙස දැක්විය හැකිය. බැංකුව පිළිබඳව ඍණාත්මක සංජානනයක් හෝ ප්‍රචාරයක් මගින් පිරිවැය අධික නඩුකිම, ආදායම් අඩුවීම, සහ ගණුදෙනුකාර පදනම ක්ෂයවීම ආදියට හේතු වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුවක් වශයෙන් පුරා දශක පහකට අධික කාලයක් උත්කෘෂ්ඨ ජනප්‍රසාදයක් මහජන බැංකුව පවත්වා ගනිමින් සිටී. එහෙයින් බැංකුවේ කීර්තිනාමයට විය හැකි ඍණාත්මක බලපෑම ඉතා අල්ප වේ. යහපත් කීර්තිනාමය ගණුදෙනුකාර විශ්වාසය දිනා ගැනීමට ඉවහල් වන අතර එමගින් බැංකුවේ ඍජු අවංකභාවය, එහි කාර්ය මණ්ඩලයේ නිපුණතාව හා ඉහළ නිෂ්පාදන ගුණාත්මය විද්‍යමාන වේ.

බැංකුව තම කීර්තිනාම අවදානම පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක භාවිතයෙන් අධීක්ෂණය කරයි. ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි ඵලදායි ලෙසත්, කාර්යක්ෂම ලෙසත් විසඳාලීම සඳහා ගණුදෙනුකාර පැමිණිලි මෙහෙයුම් ඒකකයක් බැංකුව විසින් ස්ථාපිත කර ඇත. තවද, සිය දුක්ග හැවිලි ඉදිරිපත් කිරීම සඳහා ක්‍රමවේද ගණනාවක් ද ක්‍රියාවට නගා ඇත. ඒවා අතර බැංකුවේ වෙබ් අඩවිය, ඇමතුම් මධ්‍යස්ථානය, විද්‍යුත් තැපෑල හා ලිපි ආදිය ඇතුළත් වේ.

අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම යනු අදාළ නීති, රෙගුලාසි, චර්යා ධර්ම පද්ධති සහ යහ භාවිත ප්‍රමිතීන් ආදියට අනුකූල නොවීම නිසා ඇති වන මූල්‍ය පාඩුව හෝ බැංකුවේ කීර්තිනාමය අහිමි වීමය. බැංකුවේ කීර්තිනාමය පවත්වා ගැනීමත්, ඉහළ නැංවීමත් අනුකූලතාව මගින් අපේක්ෂා කෙරේ.

අදාළ නීති, රීති වලට සහ යහ භාවිතයන්ට සියලු ම සේවකයින් අනුකූල වීම සහතික කරන අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා පාලන රාමු බැංකුව ක්‍රියාත්මක කර තිබේ.

අනුකූලතා අවදානම් කළමනාකරණයේ අරමුණු

- බැංකුවේ කීර්තිනාමය වර්ධනය කරමින් එය ඉහළ නැංවීම
- ගනුදෙනුකාර විශ්වාසය හා විශ්වසනීයත්වය පවත්වා ගැනීම
- බැංකුවේ මෙහෙයුම් බාධාවකින් තොරව කාර්ක්ෂමව ඉටු කිරීම තහවුරු කිරීම
- සේවක අවංකභාවය සහතික කිරීම
- ඉහළම තත්ත්වයේ නිමැවුම් හා සේවා සලසා දීම
- බැංකුවේ ශක්තිය හා ස්ථාවරත්වය වර්ධනය කිරීම
- බැංකුවේ තිරසරබව සහතික කිරීම

අනුකූලතා අවදානම් කළමනාකරණය



අදාළ බාහිර නියාමන හා අභ්‍යන්තර මාර්ගෝපදේශ වලට බැංකුව අනුකූල වීම සහතික කිරීමේ අවසන් වගකීම් පැවරී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ය.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුකූලතා සම්බන්ධ කාර්යයන්හිදී මාණ්ඩලිය විගණන කමිටුව සහ මාණ්ඩලිය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව ඊට සහායවේ. සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත කෙළින්ම වගකියන අනුකූලතා ඒකකය, බැංකුවේ පූර්ණ අනුකූලතාව සහතික කරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට සහ අභ්‍යන්තර විගණන ඒකකයට අමතරව මේ ඒකකය බැංකුවේ සමස්ත අනුකූලතා මට්ටම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට තහවුරු කිරීම් සපයය යි.

අභයන්තර මනා පරිචයන්ට හා බාහිර නියාමනයන්ට බැංකුවේ අනුකූලතාව ලකුණු 5 ක ප්‍රමාණන කාඩ්පතක් මඟින් ඇගයීම තුලින් අනුකූලතා අවදානම තක්සේරු කෙරේ. එම ලකුණු කාඩ්පත මාණ්ඩලිය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කෙරනු ඇත.

බැංකුව කාර්යක්ෂම ලෙස සහ කර්මාන්තයට අදාළ රීති වලට සහ රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා අනුකූලතා අවදානම සොයා බැලීම සහ අවම කිරීම පිණිස බැංකුව සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතා තනතුරක් නිර්මාණය කර ඇති අතර අදාළ අනුකූලතා මට්ටම මාණ්ඩලිය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට වාර්තා කෙරේ. අනුකූලතා දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය දෙආකාර වේ එනම්, අනුගම්‍ය අනුකූලතා කාර්යයන් සහ අනුයාත අනුකූලතා කාර්යයන් යනුවෙනි.

අනුගම්‍ය අනුකූලතා කාර්යයන්

- නියාමන අවශ්‍යතාවන්ට අනුකූල නොවීමේ අවදානම තුරන් කිරීමට හෝ අවම කිරීමට මෙන්ම කීර්තිනාම අවදානමෙන් බැංකුව ආරක්ෂාකර ගැනීමට අනුකූලතා ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි සම්පාදනය කිරීම
- මනා පරිචයන් පැහැදිලිව දක්වමින් සියලුම සේවකයන් සඳහා ආචාරධර්ම පද්ධතියක් සකස් කොට, සෑම මට්ටමක දීම අනුකූලව ක්‍රියාකිරීම අධීක්ෂණය කිරීම හා ඒ බවට වගබලා ගැනීම
- බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු විසින් පිළිපැදිය යුතු ඔබගේ ගණුදෙනුකරුවන් පිළිබඳව දැනගන්න (KYC) යන නියාමනයට අනුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම
- පැහැදිලිව හා නිසිකල සිදුකරන සන්නිවේදනය සහ අන්‍යෝන්‍ය අවබෝධය පදනම් කරගනිමින්, නියාමකයන් සමග නිරන්තර අදහස් හුවමාරුවක් හා යහපත් සේවා සබඳතාවක් පවත්වා ගැනීම
- බැංකුව තුළ අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කිරීම
- බැංකුවට අදාළ සියලු නව නෛතික හා නියාමන අවශ්‍යතා අවබෝධ කර ගැනීම හා ඒවා ඵලදායක ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම
- අනුකූලතාව සම්බන්ධ ගැටලුවලට තුඩු දිය හැකි නව නියාමන අවශ්‍යතා, නීති සංශෝධන සහ වෙනත් කවර හෝ සංශෝධන අවධාරණය කරන කාලීන වාර්තා කළමනාකාරිත්වයට ඉදිරිපත් කිරීම
- බරපතල හෝ දැනට පවතින අනුකූලතා ගැටලු අවධාරණය කොට දැක්වීම සහ පිළිගත හැකි කාල රාමුවක් තුළ ඒවා නිවැරදි කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය සමග සුදුසු අවස්ථාවලදී කටයුතු කිරීම
- නීතිය අනුව අවශ්‍යවන අවස්ථාවල දී, මහ බැංකු මාර්ගෝපදේශවලට සහ නියෝගවලට බැංකුවේ අනුකූලතාව පිළිබඳ මාසික අනුකූලතා වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම
- කාර්තුමය අනුකූලතා වාර්තා සකස් කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී මාණ්ඩලිය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවට සහ
- බැංකුවේ අනුකූලතාව පිළිබඳ මාසික වාර්තා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම
- මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන නියෝග පදනම් කරගෙන සකස් කරනු ලබන ගනුදෙනුකාර ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීම
- බලපතුලත් වාණිජ බැංකු සඳහා සාමූහික පාලනය පිළිබඳ මහ බැංකු නියෝග පදනම් කරගත් බැංකුව සඳහා වන සාමූහික පාලනය පිළිබඳ යහභාවිත සංග්‍රහයක් සකස් කිරීම සහ ඊට අනුකූල වීම ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය පිළිබඳ වගකීම දැරීම
- ගනුදෙනු අධීක්ෂණය හා සැකකටයුතු ගනුදෙනු පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකයට (FIU) වෙත වාර්තා කිරීම සඳහා පද්ධති සකස් කොට ක්‍රියාත්මක කිරීමේ සහ
- සමස්ත බැංකු ජාලයේ පුහුණු අවශ්‍යතා සහතික කරන ඉගෙනුම් මොඩියුලයක් නිර්මාණය කිරීම හා මුදල් විශුද්ධිකරණය ඇතුළු අනෙකුත් අනුකූලතාවන් පිළිබඳව සේවක මණ්ඩලය පුහුණු කිරීම
- අනතුරු හැඟවීමේ ප්‍රතිපත්තියක් සහ චර්යා ධර්ම පද්ධතියක් ඇතුළුව, බැංකුව සඳහා අනුකූලතා අවදානම හා කීර්තිනාම අවදානම අවම කිරීමේ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් සියලු ප්‍රතිපත්ති සකස් කිරීම
- ගනුදෙනුකරුවන්ගේ යාවත්කාල කරන ලද ණය විස්තර පවත්වාගෙන යෑම සඳහා ණය තොරතුරු කාර්යාංශය සමග සම්බන්ධීකරණය කිරීම
- තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව බැංකුව කටයුතු කරන බව සහතික කිරීම පිණිස තොරතුරු දැනගැනීමේ පනතට අනුව බැංකුව විසින් පත්කරන ලද තොරතුරු නිලධාරියා ලෙස කටයුතු කිරීම

අනුයාත අනුකූලතා කාර්යයන්

- නියාමන, කීර්තිනාම සහ සදාචාරාත්මක කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට සහ කාර්ය මණ්ඩලයට උපදේශන සේවා සැපයීම
- අනුකූලතා මූලධර්ම හා අනුකූල වීමේ වැදගත්කම සියලු දෙනා විසින් ම පැහැදිලිව තේරුම් ගනු ලබන බව තහවුරු කරගනිමින්, අනුකූලතාව යනු බැංකුවේ සාර්ථකත්වය පහසු කරවන්නක්ය යන්න ප්‍රචලිත කිරීම
- නව නිෂ්පාදිත හා පද්ධති දේශීය නියාමන අවශ්‍යතාවන්ට සහ අභ්‍යන්තර අනුකූලතාවට හා සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා එකී නව නිෂ්පාදිත සහ පද්ධති සැලසුම් කිරීමේ දී හා ව්‍යුහගත කිරීමේ දී කල්තබා මැදිහත් වීම
- නියාමන රීතිවලට හා අභ්‍යන්තර අනුකූලතා ප්‍රමිතීන්ට අනුකූල වීම තක්සේරු කිරීම සඳහා තක්සේරු කිරීම් හා සමාලෝචනය කිරීම් නිසි කාලපරතරයන්ගෙන් යුතුව සිදු කරන බවට සහතික වීම
- අදාළ අභ්‍යන්තර හා බාහිර නියාමන සඳහා අනුකූලතාව තක්සේරු කිරීමට ඇගයීම් හා අධීක්ෂණ නිසි කාල පරාසයන් තුළ සිදුකරනු ලබන බවට වගබලා ගැනීම
- අදාළ අභ්‍යන්තර හා බාහිර කමිටු සම්බන්ධයෙන් අනුකූලතා කාර්යය නියෝජනය කිරීම
- අනුකූලතා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි කළමනාකාරිත්වයට හා කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පැහැදිලිව සන්නිවේදනය වන බව සහතික කිරීම
- අනුකූලතා ගැටලු සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමට විගණකවරුන්ට හැකි වන පරිදි ඔවුන්ට දේශීය නියාමන හා සදාචාරාත්මක අවශ්‍යතාවන් පිළිබඳ මනා හුරුවක් ඇති බව සහතික කිරීම සඳහා අභ්‍යන්තර මෙන්ම බාහිර බැංකු විගණන කාර්ය සමග සම්බන්ධීකරණය කිරීම

- විගණනවල ප්‍රතිඵලයක් වශයෙන් හඳුනාගනු ලබන අනුකූලතා දුර්වලතා සම්බන්ධ පසු විමසුම් ක්‍රියාමාර්ග ගැනීම
- විගණකවරුන් සමඟ සම්බන්ධීකරණය සහ අවදානම් පාදක තක්සේරුව පිළිබඳ අභිමුඛ අනුකූලතා විගණන සිදු කිරීම, හඳුනාගනු ලබන අවදානම් ක්ෂේත්‍ර වැඩි වන තරමට, නිතර නිතර විගණන කටයුතු සිදු කිරීම

අනුකූලතා වාර්තාකරණය

අනුකූලතා දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ මණ්ඩලයට මාසික අනුකූලතා වාර්තා ඉදිරිපත් කරන අතර, ව්‍යවස්ථාපිත හා අනිවාර්ය අවශ්‍යතා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු හා ශාඛා ප්‍රධානීන්ගෙන් ලැබෙන කාර්යය අවසන් කිරීම් (sign offs) අනුකූල නොවීමේ සිද්ධි සහ පවත්වන ලද යම් සේවක පුහුණුවීම් හා ශාඛා තක්සේරු කිරීම් ඒවාට ඇතුළත්වේ. ඒ අතරතුර, කාර්තුව තුළ පැන නගින යම් විශේෂ අනුකූලතා ආශ්‍රිත කරුණු පිළිබඳව ද මාණ්ඩලීය සංකලිත අවදානම් කළමනාකරණ කමිටුවේ සහ මාණ්ඩලීය විගණන කමිටුව වෙත කාර්තුමය වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණය වැළැක්වීම

ඉහළ යමින් පවතින මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදී මූල්‍යකරණ ප්‍රවණතා මර්දනය කිරීමට ද බැංකුව ක්‍රියාශීලී ලෙස කටයුතු කරයි. මුදල් විශුද්ධිකරණ විරෝධී, KYC සහ ගනුදෙනුකාර නිසි සුපරීක්ෂාව පිළිබඳ පුහුණුව ව්‍යුහගත වැඩසටහන් සහ ඉ-ඉගෙනුම් මොඩියුල මගින් අදාළ සියලු සේවකයින්ට ලබා දෙනු ලැබේ. අසාමාන්‍ය ලෙස විශාල සහ සැක කටයුතු ගනුදෙනු විශ්ලේෂණයට හා තක්සේරු කිරීමට ලක් කරනු ලබන අතර මූල්‍ය බුද්ධි අංශයට වාර්තා කරනු ලැබේ.

උපාය මාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම් යනු අහිතකර ව්‍යාපාරික තීරණ, අහිතකර ව්‍යාපාරික වටපිටාව සහ මෙහෙයුම් පරිසරය තුළ සිදුවන වෙනස්කම් වලට ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් ඉපයීම් වලට පැන නැඟිය හැකි අලාභයන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා විධායක කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද උපායමාර්ගික සැලැස්ම තුළින් සිය උපායමාර්ගික අවදානම් බැංකුව කළමනාකරගනී. විවිධ මට්ටම්වල දී පුළුල් පාර්ශ්වකාර සහභාගිත්වය ඇතිව ව්‍යාපාර ඒකක සමඟ නිරන්තර සාකච්ඡා තුළින් උපායමාර්ගික සැලැස්ම සම්පාදනය කරන ලදී. යම් අවදානමක් ඉස්මතු වුවහොත්, ඉපැයුම් කෙරෙහි ඉන් ඇතිවන අවදානම වැළැක්වීම හෝ අවම කිරීම සඳහා කළමනාකරණ ක්‍රියාකාරකම් කට්ටලයක් සකස්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය හා වත්කම් හා බැරකම් කමිටුව විසින් ව්‍යාපාරික කාර්යසාධනය මාසිකව අධීක්ෂණයට ලක් කරනු ලැබේ. තත්‍ය කාර්යසාධනය එක් එක් ව්‍යාපාරික ඒකකයේ අයවැය ඉලක්ක වලට එරෙහිව අධීක්ෂණය කොට, ව්‍යාපාරික වටපිටාවේ කවර හෝ වෙනසකට සරිලන පරිදි උපායමාර්ග යලි සකස් කරනු ලැබේ.

ඒ අනුව, මෙහෙයුම් පරිසරයේ ගතිකත්වයන්ට මුහුණ දීමට බැංකුවේ සූදානම සහතික කිරීම සඳහා සාර්ව ආර්ථික ප්‍රවණතා සහ මතුවෙමින් තිබෙන තර්ජන සහ අවස්ථා අඛණ්ඩව අධීක්ෂණයට ලක් කරනු ලැබේ.

උපායමාර්ගික අවදානම මැනීම හා තක්සේරුව සිදු කරනු ලබන්නේ බැංකුවේ විශාලත්වය, මෙහෙයුම්වල සංකීර්ණත්වය සහ නව්‍ය ලක්ෂණ, පාරිසරික විශ්ලේෂණය මෙන්ම ගනුදෙනුකාර පැතිකඩකරණය ඇතුළු සාධක පරාසයක් සැලකිල්ලට ලක් කරන ලකුණු කාඩ් පදනම් කරගත් ප්‍රවේශයක් භාවිත කරමිනි. කාඩ්පත අඩු වශයෙන් වාර්ෂික වශයෙන් යොදා ගනු ලබන අතර උපායමාර්ගික අවදානම අවම කිරීමේ දී ඇති විය හැකි වර්ධනයක් සඳහා ක්ෂේත්‍ර අවධාරණය කිරීම ද සිදු කරනු ලැබේ.

සමූහ අවදානම් කළමනාකරණය

අවදානම් පාත්‍රතාව හඳුනාගැනීම, තක්සේරු කිරීම හා අධීක්ෂණය සඳහා බැංකුවේ ප්‍රධාන පරිපාලිත සමාගම් වන පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, පිපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සී සහ පිපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී යන නියාමනය වූ ආයතන සතුව ව්‍යුහගත අවදානම් කළමනාකරණ රාමු ක්‍රියාත්මකව පවතී. මව් ආයතනය පහත සඳහන් ව්‍යුහයන් හා යාන්ත්‍රණයන් මගින් ව්‍යාපාර සමූහයේ ආයතනවල අවදානම් කළමනාකරණ අංග පිළිබඳ අධීක්ෂණය සිදු කරයි.

- ව්‍යාපාර සමූහයේ අවදානම් අභිරුචිය හා උපායමාර්ගය බැංකු මට්ටමෙන් සකස් වී ඇති අතර වාර්තාකරණ ව්‍යුහයන්, ක්‍රියාවලීන් සහ ප්‍රවේශ ලක්ෂ්‍යයන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබේ.
- බැංකුවේ පාත්‍රතාව රු. මිලියන 500 ඉක්මවන එක් එක් ව්‍යාපාර සමූහ ආයතනය සඳහා ප්‍රමුඛ අවදානම් දර්ශක, කාර්යාරම්භ මට්ටම් සහ ප්‍රවේශ ලක්ෂ්‍යයන් අර්ථ නිරූපණය කරනු ලැබේ.
- මහජන බැංකුවේ විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, පරිපාලිත සමාගම් තුළ ක්‍රියාත්මකව පවතින අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල ප්‍රමාණවත්භාවය කලින් කලට සමාලෝචනය කර සහතික කරයි.
- ඇතැම් අවස්ථා වලදී මව් ආයතනය පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවලට අධ්‍යක්ෂවරුන් නම් කරයි.
- මහජන බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා පීපල්ස් ලීසිං PLC සමාගමේ අධ්‍යක්ෂවරයෙකු හා අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයෙක් වේ.
- මහජන බැංකුවේ සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියාමනය වූ පරිපාලිත ආයතනවල අවදානම් පැතිකඩ කාලීනව සමාලෝචනය කරනු ලැබේ.
- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සමූහ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා වලට ප්‍රවේශය හිමි වේ.

2017 වර්ෂයේ අවදානම් කාණ්ඩ සඳහා සමූහයේ අවදානම් ශ්‍රේණිගත කිරීම් පහත දැක්වේ:

	අවදානම් පාත්‍රතාව					
	ණය අවදානම	වෙළඳපොල අවදානම	මෙහෙයුම් අවදානම	අනුකූලතා අවදානම	උපායමාර්ගික අවදානම	කීර්තිනාම අවදානම
මහජන බැංකුව	🟢	🟢	🟢	🟢	🟢	🟢
පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	🟡	🟢	🟢	🟢	🟡	🟢
පිපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී	🔴	🟢	🟢	🟢	🟡	🟡
පිපල්ස් ඉන්සුවරන්ස් පීඑල්සී	🟡	🟢	🟢	🟢	🟡	🟢

ප්‍රාග්ධන කළමනාකරණය

බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ රාමුව සැලසුම් කරනු ලැබ ඇත්තේ එහි නියාමන අවශ්‍යතා, වර්ධක අපේක්ෂා සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යෑම සහ අනපේක්ෂිත සිදුවීම්වලින් ආරක්ෂා වීම යන අරමුණු ඇතිවය. බාසල් II එකඟතාව ප්‍රකාරව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP), බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ සම්බන්ධයෙන් සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්වය තක්සේරු කිරීම සඳහා රාමුවක් ක්‍රියාත්මක කර තිබේ.

අභ්‍යන්තර ප්‍රාග්ධනය තක්සේරු කිරීම සඳහා බැංකුවේ ප්‍රවේශය ආරම්භ වන්නේ 1 වැනි ස්ථම්භය යටතේ වාර්තා වන ප්‍රාග්ධන සහ අවදානම් බරතැබූ වත්කම් සමගිනි. ආතති පරීක්ෂාව සහ තත්ත්ව විශ්ලේෂණය මගින් අවදානම් සහගත ස්වභාවයන්ගේ විභව බලපෑම මැනීමෙන් සක්‍රීය තීරණ ගැනීමට එය ඉඩ සලසයි. බාසල් III හි II වැනි ස්ථම්භය අවශ්‍යතා පිළිබිඹු වන පරිදි බැංකුවේ ආතති කළමනාකරණ රාමුව සකස් වී ඇති අතර අනෙකුත් දේවල් අතර, උපාය මාර්ගික සැලසුම්කරණය, අවදානම් නැමුරුව නිගමනය කිරීම, අවිනිශ්චිත අවස්ථා සැලසුම් වැඩි දියුණු කිරීම සහ ද්‍රවශීලතා කළමනාකරණය ඇතුළු ව්‍යාපාර ක්‍රියාවලින් කිහිපයකට එය උපකාරී වේ. ආතති පරීක්ෂාවේ ප්‍රතිඵල නිතිපතා සිදු වන පදනමක් මත මාණ්ඩලික සංකලිත අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

නියාමක ප්‍රාග්ධනය

බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතා හා තෝලන අනුපාත රාමු 2017 ජූලි 1 දින සිට ක්‍රියාත්මක පරිදි බැංකුව ක්‍රියාවට නංවන ලදී. 2017 දෙසැම්බර් අග වන විට, බැංකුවේ 1 වැනි තලයේ සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාතය කලින් වර්ෂයේ (බාසල් II අනුව) 9.8% සහ 12.1% හා සැසඳීමේ දී පිළිවෙලින් 10.8% ක් සහ 13.5% ක් විය.

ප්‍රාග්ධන හා ලාභාංශ කළමනාකරණය

පූර්ණ රාජ්‍ය අයිතිය සතු ආයතනයක් වශයෙන් කොටස් වෙළඳපොළවලට ප්‍රවේශය බැංකුව සතු නොවන අතර මහජන බැංකු පනතේ කොන්දේසි ප්‍රකාර ණය වෙළඳපොළට ප්‍රවේශය ද සීමාසහිතය. එබැවින් අනාගත වර්ධනය සඳහා මූල්‍ය සම්පාදනයේ දී සිය ප්‍රාග්ධන පදනම වර්ධනය කරගැනීම සඳහා සිය ප්‍රාග්ධන උත්පාදනය සහ රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලැබෙන මූල්‍ය දායකත්වයන් කෙරෙහි බැංකුව පූර්ණ විශ්වාසය තැබිය යුතුය.

ඒ අනුව, නියාමන පදනමක් මත බැංකුවේ 1 වැනි ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාතය 6.5% කට සහ බැංකුවේ අභ්‍යන්තර ගණනයන් අනුව 6% කට වඩා පහළ නොයන ප්‍රමාණයකට බැංකුවේ ලාභාංශ ගෙවීම් සීමා කිරීමට බැංකුව රාජ්‍ය භාණ්ඩාගාරය සමඟ අවිධිමත් එකඟත්වයකට එළඹ තිබේ. එසේම, 12% කට නොඅඩු (නියාමක පදනම) සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්ව අනුපාතයක් පවත්වාගෙන යෑමට ද බැංකුව උත්සාහ දරයි. 2017 ජූලි 1 වැනි දින සිට බලාත්මක බාසල් III ට අනුකූලතාව තහවුරු කිරීම සඳහා බැංකුව අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කොට ඇත.

ඉදිරි දැක්ම

- 2018 වසරේදී IFRS 9 ප්‍රතිපාදන ක්‍රමවේදය ක්‍රියාත්මකවීම ආරම්භ වූ විට, බැංකුවේ ලාභය කෙරෙහි වන බලපෑම සීමා වනු ඇත. ඒ මක් නිසාද යත් බැංකුවේ ප්‍රතිපාදන ප්‍රමාණවත් හා සාරානුකූල ව පැවති බැවින් ය.
- ණය අවදානම් කළමනාකරණය යටතේ පශ්චාත් ණය පිරිනැමීමේ සමාලෝචන කටයුතු ශක්තිමත් කිරීම සඳහා ණය සමාලෝචන ඒකකයක් ස්ථාපිත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හිමිවී ඇත. මෙම ඒකකයේ ප්‍රධානියා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ඇත. ප්‍රාදේශිය මට්ටමින් ප්‍රදානය කරනු ලබන ණය පිළිබඳව පශ්චාත් සමාලෝචන කටයුතු කරනු ඇත. ඊට අමතරව, මෙම ඒකකය විසින් අධ්‍යක්ෂ මණ්ඩල හා විධායක කමිටු අනුමැතිය හිමිවිය යුතු ණය සමාලෝචන කටයුතු ද ඉටු කරනු ඇත.

- සිල්ලර හා ආයතන බැංකුකරණ ඒකක සඳහා ණය සමුප්පාද ක්‍රමවේදයක් වෙනවෙනම හඳුන්වාදෙනු ඇත. සිල්ලර බැංකුකරණ ඒකකයේ ණය සමුප්පාද ක්‍රමවේදය සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර 2018 මැයි මාසයේදී ස්ථාපිත කිරීමට නියමිත ය. ආයතන බැංකුකරණ ණය සමුප්පාද ක්‍රමවේදය ද 2018 වසරේදී දියත් කරනු ඇත. මෙම පද්ධති මඟින් ණය වඩාත් හොඳින් කළමනාකරණය කිරීමටත්, කඩිනමින් අනුමැතිය ලබාදීමටත්, බැංකුවේ ඵලදායිත්වය වර්ධනය වීමටත් ඉවහල් වනු ඇත.
- ෆිනැකල් භාණ්ඩාගාර පද්ධතිය ළඟබෙන වසරේදී උත්ශ්‍රේණිගත කිරීමට නියමිත අතර, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් පුළුල් කිරීමට අතිරේක දුරකථන සම්බන්ධතා සවි කරනු ඇත. භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන ඇමතුම් පටිගත කරනු ඇති අතර එහි අධීක්ෂණ කටයුතු භාණ්ඩාගාර මධ්‍යම කාර්යාලය විසින් ඉටු කරනු ඇත.
- බැංකුවේ හා සමූහයේ අවදානම් අභිරුචිය අර්ථනිරූපනය කිරීමට අමතරව, බැංකුවේ හා කර්මාන්තයේ අවදානම් පරාමිතීන් සන්සන්දනය කරනු ලබන අවදානම් උපකරණ පුවරුවක් 2018 වසරේදී ස්ථාපිත කරනු ඇත.

ව්‍යාපාරික ආකෘතිය

102 / මෙහෙයුම් පරිසරය
110 / වටිනාකම් නිර්මාණය කිරීම
114 / ඉලක්ක, උපායමාර්ග සහ පෙරදැක්ම
117 / තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා අපගේ කැපවීම
120 / ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය
123 / ප්‍රමාණාත්මකතාව

මෙහෙයුම් පරිසරය

ගෝලීය ආර්ථිකය

2017 වසර තුළදී ගෝලීය ආර්ථික ක්‍රියාවලින් ස්ථාවර ලෙස පැවැති අතර ලෝක දළ දේශීය නිෂ්පාදිතයෙන් හතරෙන් තුනක්ම සඳහා දායකත්වය ජාතික ආර්ථිකයන් 120 ක් කෙරෙන් ලැබී ඇත. 2010 වසරේ සිට මේ දක්වාම ගෝලීය ආර්ථික වර්ධනය ආශ්‍රිතව දැකිය හැකි වූ නැගී ඒම මෙය විය. 2018 ජනවාරි මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සිය ලෝක ආර්ථික සමීක්ෂණයෙහි තක්සේරු කරන ආකාරයට 2017 ගෝලීය ආර්ථික වර්ධනය 3.7% ක් ලෙස පැවැති අතර වසර හතකට පසුව දැකිය හැකි වූ හොඳම ගෝලීය වර්ධනය ලෙස වාර්තා වන්නේ මෙයයි. මෙය, 2016 වසරේදී වාර්තා වූ 3.2% ක ගෝලීය ආර්ථික වර්ධනයට සියයට 0.5 කින් ඉහළයාමකි. විශේෂයෙන්ම ලොව දියුණු ආර්ථිකයන් ආශ්‍රිතව සිදු වූ ආයෝජන අවස්ථා ඉහළ යාම සහ ආසියානික කලාපයේ නිෂ්පාදන ප්‍රතිඵලවල ඉහළ යාම වැනි සාධකවලින් සහාය ලද මෙම වර්ධනය 2017 වසරේ අවසන් මාස කිහිපය තුළ ලෝක වෙළෙඳ කටයුතු ආශ්‍රිතව විද්‍යමාන විය.

අනාගත පෙරදැක්ම

2017 වසරේදී දැකිය හැකි වූ වාසිදායක හා සවිමත් ආර්ථික තත්ත්ව 2018 හා 2019 වසර දෙක තුළදීද එලෙසම පවතිනු ඇත යන උපකල්පනය මත එකී වර්ෂවල ගෝලීය වර්ධනය 3.9% ක් ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතරම නැගී එන ආර්ථිකයන්ද 2018 වසරේදී 4.9% කින් හා 2019 වසරේදී 5.0% කින් වර්ධනය වනු ඇති බව අනුමාන කෙරේ. ලොව ආර්ථික වර්ධනයෙන් අඩක්ම සඳහා දායකත්වය සපයන ආසියානු ආර්ථිකයන් 2018-19 අතර කාලය තුළ 6.5% කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර මෙය 2017 වසරේ වර්ධන තත්ත්වයටම සමාන වේ. චීනයේ ආර්ථික වර්ධනය සාමාන්‍ය වේගයකින් ඉහළ යනු ඇති බවටත්, ඉන්දියානු ආර්ථික වර්ධනය ආශ්‍රිත ඉහළ යාමක් දැකිය හැකි බවටත් ආසියාන්-5 කලාපීය රටවල ආර්ථිකයන් ස්ථාවර තත්ත්වයක පවතිනු ඇති බවටත් අපේක්ෂා කෙරේ.

නැගී එන ආර්ථිකයන් හි වර්ධනය 2018 වසරේදී 2.3% කින් ඉහළ යනු ඇති බවටත්, 2019 වසරේදී 2.2% කින් පහත බසිනු ඇති බවටත් මේ අතරම අනුමාන කෙරේ. 2018 වසර සඳහා එක්සත් ජනපද ආර්ථික වර්ධන ප්‍රක්ෂේපනය 2.3% සිට 2.7% දක්වාද, 2019 වසරේදී එය 1.9% සිට 2.5% දක්වාද පවතිනු ඇතැයි සමාලෝචනයට ලක්ව තිබේ. 2017 වසර තුළ අපේක්ෂා කළ තරමට වඩා සවිමත් ආර්ථික තත්ත්වයක් පැවතීම, බාහිර ඉල්ලුම ඉහළ යාම සහ බදු ප්‍රතිසංස්කරණවලින් සිදු වූ අපේක්ෂිත ක්ෂුද්‍ර ආර්ථික බලපෑම වැනි සාධක මත එම ප්‍රක්ෂේපනය පදනම් වේ. යුරෝපා කලාපීය බොහෝ ආර්ථිකයන්හි වර්ධන අනුපාත ඉහළ තත්ත්වයක ඇති බවට සලකුණු වන අතර විශේෂයෙන්ම ජර්මනිය, ඉතාලිය සහ නෙදර්ලන්තය වැනි රටවල් සඳහා මෙම කාරණය අදාළ වෙයි. ඒ රටවල දේශීය ආර්ථිකයන් සඳහා පවතින සවිමත් ඉල්ලුම හා ඉහළ බාහිර ඉල්ලුම මෙයින් පිළිබිඹු වේ.



මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
* අපේක්ෂිත කාර්යසාධනය

දේශීය ආර්ථිකය

1. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය

2016 වසරේ පළමු අර්ධය තුළ 3.7% ක් වශයෙන් වාර්තා වූ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2017 වසරේ එම කාලසීමාව තුළම 3.9% ක පමණ ඉහළ අගයකින් වර්ධනය වී තිබේ. නියඟ හා ජල ගැලීම් වැනි ස්වභාවික ව්‍යසන හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවලට එල්ල වූ බලපෑම නිසා සමස්ථ වර්ධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති වූ අතර මෙය ආර්ථිකයේ තවත් අංශ කෙරෙහි බලපෑමක් ඇති කර තිබේ.

කෙසේ වෙතත්, ආර්ථික ව්‍යාප්තියට ධනාත්මක දායකත්වයක් කර්මාන්ත හා සේවා ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු කෙරෙන් ලැබී ඇත. විශේෂයෙන්ම, ඉදිකිරීම්, පතල් හා පොළොව කැණීම් ආශ්‍රිත කටයුතුවල වර්ධනය ප්‍රධාන වශයෙන්ම කර්මාන්තයට අදාළ ව්‍යාපාරික කටයුතු කෙරෙහි උපකාර වී තිබේ. සේවාවන් අදාළ කටයුතු ප්‍රධාන වශයෙන්ම මූල්‍ය සේවා, තොග හා සිල්ලර වෙළෙඳ කටයුතු හා ප්‍රවාහන කර්මාන්තය ආදී අංශ මගින් තිරසාරත්වයට ලක් විය.

2017 වසරේ සිව්වන කාර්තුව තුළදී කෘෂිකාර්මික අංශයේ කාර්යසාධනය පෙරළියකට ලක් වෙමින් 7.2% ක ධනාත්මක වර්ධනයක් සනිටුහන් කළ අතර 2016 එම කාලයේම එහි වර්ධනය වාර්තා වූයේ ඍණාත්මක වේගයකිනි. මෙම කාල වකවානුව තුළ කාර්මික හා සේවා ක්‍රියාකාරකම් ආශ්‍රිතව පිලිවෙළින් 2.7% ක හා 3.2% ක ආර්ථික වර්ධන අනුපාතිකයක් වාර්තා වේ.

ආර්ථික කටයුතු	වර්ධන අනුපාතිකය (%)									
	2016					2017				
	1 කාර්තුව	2 කාර්තුව	3 කාර්තුව	4 කාර්තුව	වාර්ෂික	1 කාර්තුව	2 කාර්තුව	3 කාර්තුව	4 කාර්තුව	වාර්ෂික
කෘෂිකර්මාන්තය, වන සංවර්ධනය හා ධීවර කර්මාන්තය	-0.2	-5.7	-2	-8.4	-4.2	-3	-3.4	-3.2	7.1	-0.8
කර්මාන්ත	9.1	2	5.9	9.2	6.7	6.3	5.2	4.5	2.7	3.9
සේවා	3.7	3.6	4.8	4.6	4.2	3.7	4.5	4.2	3.2	3.2
දළ දේශීය නිෂ්පාදිතය	5.1	2.4	4.6	5.3	4.4	3.9	4.0	3.7	3.2	3.1

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව



2. උද්ධමනය

බදු සංශෝධන හා අභ්‍යන්තරික කාලගුණ තත්ත්ව නිසා සිදු වූ බලපෑම් සහ ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ වෙළෙඳ භාණ්ඩ මිල ඉහළ යාම වැනි හේතූන්නි සංයුක්ත බලපෑම හේතුවෙන් 2017 පළමු කාර්තුව තුළ පාරිභෝගික මිල උද්ධමනය ඉහළ මට්ටමක පැවතුණි.

2017 පළමු කාර්තුව තුළදී ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ශීර්ෂ උද්ධමනය ඉහළ මට්ටමක පැවැති අතර අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් සැපයුම් අංශයට එල්ල වූ බලපෑම සහ ඉහළ ගිය බදු සංශෝධන ආදිය ඊට හේතු විය. කෙසේ වෙතත්, සැපයුම් තත්ත්වයන් ආශ්‍රිත ඉහළ යාම් නිසා 2017 දෙවන කාර්තුව තුළදී උද්ධමනය මධ්‍යස්ථ මට්ටමකට පත් වුවද අහිතර කාලගුණික තත්ත්ව හේතුවෙන් 2017 අගෝස්තු මාසයේ සිට එම ප්‍රවණතාව නැවතත් කණපිට හැරවිණ.

හර උද්ධමනය කෙරෙහිද බදු සංශෝධනවල බලපෑම් එල්ල විය. කෙසේ වෙතත්, සාමාන්‍යයක් වශයෙන් සලකා බැලීමේදී ශීර්ෂ උද්ධමනය පහත මට්ටමක පැවැති අතර ඉන් පෙනී යන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යොදාගන්නා ලද මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් ඉල්ලුම නිසා සිදු වූ උද්ධමන බලපෑම් පාලිත මට්ටමක පැවැති බවයි. 2017 වසර අග භාගය වන විට ශීර්ෂ උද්ධමනය හා හර උද්ධමනය පහත බසින තත්ත්වයක් දැකිය හැකි විය.

මාසය		දෙසැම්බර් 2016	මාර්තු 2017	ජූනි 2017	සැප්තැම්බර් 2017	දෙසැම්බර් 2017
ශීර්ෂ උද්ධමනය						
(ගත වූ වසරට සාපේක්ෂ % වෙනස)	CCPI (2013=100)	4.5	**7.3**	**6.1**	**7.1**	**7.1**
	NCPI (2013=100)	4.2	**8.6**	**6.3**	**8.6**	**7.3**
හර උද්ධමනය (ගත වූ වසරට සාපේක්ෂ % වෙනස)	CCPI (2013=100)	5.8	**7.3**	**5.1**	**6.0**	**4.3**
	NCPI (2013=100)	6.7	**7.0**	**4.1**	**4.6**	**2.7**

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3. මූල්‍ය ප්‍රතිපත්තිය

මධ්‍ය කාලීන පදනමක් මත උද්ධමනය සියයට 5 ට ආසන්නව පවත්වා ගනු පිණිස 2017 වසර තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර එමගින් තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා සහාය දක්වන ලදි. මේ නිසා, උද්ධමනය ආශ්‍රිතව ඇති විය හැකි බවට අපේක්ෂිත බරපතල තත්ත්ව දරා ගනිමින් අතිරික්ත මුදල් සැපයුම පාලනය කර තබා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2017 මාර්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් ලක්ෂ්‍ය 25 කින් ඉහළ දමමින් සිය මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කර ගැනීමට පියවර ගන්නා ලදි. මේ අනුව, 2017 වසර අවසානය දක්වාම ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙලින් 7.25% සහ 8.75% වශයෙන් වාර්තා විය.

මෙවැනි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හේතුවෙන් අති විශාල මුදල් සැපයුමක් සිදු වීම පාලනය කිරීමට සහ වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය මුදල් වර්ධනය වීම අවශ්‍ය මට්ටමින් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද මෙම මූල්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට සහ රාජ්‍ය අයවැයෙහි දැක්වුණු ඉහළ මූල්‍ය අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන් 2017 වසරේ පළමු මාස නවය ඇතුළත වෙළෙඳපොල පොලී අනුපාතිකයන් බොහොමයක් ඉහළ නගිමින් පැවතිණි.



4. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව නවවෙනි වරටත් සවිමත් කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණය අරමුණු කරගනිමින් 2017 වසර තුළදී රජය විසින් මූල්‍ය ප්‍රතිපත්ති විධිවිධාන කිහිපයක්ම හඳුන්වා දෙන ලදි. බදුවලින් නිදහස් කිරීම් ඉවත් කරමින් සහ බදු පරිපාලනය ශක්තිමත් කරමින් ඍජු බදු එකතු කර ගැනීමේ ක්‍රියාවලිය පුළුල් කරමින් එතෙක් පැවැති ආදායම් බදු ව්‍යුහය සරල හා විධිමත් කිරීමේ අරමුණින් 2017 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුව විසින් නව දේශීය ආදායම් පනතක් බලාත්මක කරන ලදි.

2017 වසර තුළදී රාජ්‍ය මූල්‍යඒකාග්‍රතාව සවිමත් කිරීම වෙනුවෙන් අනුග මනය කරන ලද පියවරවල ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය ආදායමට දළ දේශීය නිෂ්පාදිත අනුපාතිකය ආශ්‍රිතව සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් දැකිය හැකි විය. 2016 පළමු මාස අට තුළ එය 10.8% ක් ලෙස වාර්තා වූ අතර 2017 එම

කාල සීමාවම තුළ එම අනුපාතිකය වාර්තා වී ඇත්තේ 11.3% ක් වශයෙනි. මීට අමතරව, ගත වූ වසරේ අදාළ කාලසීමාව සඳහා වාර්තා වූ 0.3% ක අනුපාතිකය හා සැසඳීමේදී 2017 වසර තුළ ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.2% ක් වශයෙන් වාරතා වන අතර ජංගම ගිණුම් හිඟය 0% සිට 0.8% දක්වා පහත බැස ඇත.

සමස්ථයක් වශයෙන් ගත් විට දශක කිහිපයකට පසුව 2017 වසරේදී ප්‍රාථමික මූල්‍ය ශේෂයෙහි සුළු අතිරික්තයක් පවත්වා ගැනීමට රජයට හැකි වී තිබේ. මූලික වශයෙන්ම ඊට හේතු වී ඇත්තේ ආදායම් එකතු කර ගැනීම ඉහළ යාමයි.



5. බාහිර අංශය

2017 වසර තුළ අපනය ආදායම් ඇ.එ.ජ. ඩොලර් බිලියන 11.4 ක් ලෙස වාර්තා වූ අතර මෙය මෙතෙක් වාර්තා වූ ඉහළම ආදායමද වේ. යුරෝපීය එකමුතුව විසින් ජී.එස්.පී. පහසුකම නැවත ශ්‍රී ලංකාවට ලබා දීම නිසා අපනයන ආදායම ඉහළ යාම, ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි ප්‍රධාන භාණ්ඩ සඳහා හිතකර මිල මට්ටමක් දැකිය හැකි වීම හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන ලද විදේශ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය වැනි කරුණු ඒ සඳහා විශාල ලෙස හේතු වී තිබේ. කෙසේ වෙතත්, නියඟ නිසා සිදු කරන්නට වූ ආනයන කටයුතු සහ රත්‍රං ආනයනය ඉහළ යාම නිසා වෙළෙඳ හිඟයෙහි ඉහළ යාමක් දැකිය හැක. සංචාරක කර්මාන්තයද ඇතුළත්ව සේවා අපනයන අංශයේ දැකිය හැකි වූ හිතකර තත්ත්වය වර්ධනය වූ අතර විදෙස් ශ්‍රමිකයන්ගේ මුදල් ප්‍රේෂණද මධ්‍යස්ථ ලෙස පැවතුණි.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොල වෙත ගලා ආ මුදල් සහ කොළඹ කොටස් වෙළෙපොල ආශ්‍රිතව මූල්‍ය ගිණුම වෙත මුදල් ගලා ඒම තිරසාර ලෙස සිදු වී ඇති අතර එමගින් තරමක් දුරට බාහිර ගිණුම් වෙත එල්ල වූ පීඩනය සමනය වී ඇත. විස්තිර්ණ ණය පහසුකම යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2017 දෙසැම්බර් මාසයේදී සිව්වන වාරිකය මුදාහැරීම සහ හම්බන්තොට වරාය බදු දීම නිසා ලැබුණු ආදායම ගෙවීම් තුලනය කිරීම සඳහා තවදුරටත් උපකාරී විය.

2017 දෙසැම්බර් අග වන විට දළ නිල සංචිත ඇ.එ.ජ. ඩොලර් බිලියන 7.8 දක්වා පමණ වර්ධනය වනු ඇති බවට තක්සේරු කර ඇති අතර 2017 දෙසැම්බර් 27 දිනට ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය 1.9% කින් පහත බැස තිබේ. පවතින වැඩිදියුණු කරන ලද මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ වඩා නම්‍යශීලී විදේශ විනිමය අනුපාත ක්‍රමයක් පවත්වා ගන්නා අතරම සැලකිය යුතු තරමින් විශාල ගෙවීම් තුලන අතිරික්තයක් වාර්තා කරමින් 2015 සහ 2016 වසරවලදී දළ නිල සංචිත ආශ්‍රිත පහත බැසීමේ ප්‍රවණතාව හා ගෙවීම් තුලන හිඟය අවසන් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළේය. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් වෙත මාරු වීමද මීට ඇතුළත් වේ.

6. ප්‍රාදේශීය සංවර්ධනය

2016 වසර සඳහා වූ නාමික ජාතික දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 11,839 ක් වූ අතර මෙය ගත වූ වසරට සාපේක්ෂව බැලීමේදී 8.11% ක වර්ධනයකි. කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිතව දැකිය හැකි වූ මන්දගාමී කාර්යසාධනය, කෘෂිකාර්මාන්තය ප්‍රධාන ආර්ථික කටයුත්ත බවට පත්ව ඇති පළාත්වල වර්ධන වේගය අඩු කිරීමට හේතු විය. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 39.7% ක් වෙත දායක වෙමින් සමස්ථ ආර්ථික ප්‍රගතිය වෙනුවෙන් බස්නාහිර පළාතෙන් දායකත්වයක් ලැබී ඇති නමුදු ප්‍රාදේශීය ආර්ථික පදනම් ව්‍යාප්ත වීමත් සමගින් අනෙකුත් ප්‍රදේශවලින් ඊට ලැබුණු දායකත්වයද ක්‍රමක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. දළ දේශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් ලැබී ඇත්තේ බස්නාහිර පළාතෙන් වන අතර ඊළඟට වයඹ හා මධ්‍යම පළාත් ඊට දායක වී ඇත.

	2015		2016	
	රු. බිලියන	කොටස් %	රු. බිලියන	කොටස් %
මධ්‍යම	1,161	10.6	1,248	10.5
නැගෙනහිර	625	5.7	681	5.8
උතුරු මැද	644	5.9	687	5.8
වයඹ	1,163	10.6	1,262	10.7
උතුරු	452	4.1	495	4.2
සබරගමුව	825	7.5	892	7.5
දකුණු	1,106	10.1	1,190	10.1
ඌව	611	5.6	687	5.8
බස්නාහිර	4,365	39.9	4,697	39.7
ශ්‍රී ලංකාව	10,952	100.0	11,839	100.0

පළාත් අනුව දළ දේශීය නිෂ්පාදිතයේ කොටස - 2015 හා 2016



අනාගත පෙරදැක්ම

ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යුහාත්මක වෙනස්කම්, ක්ෂුද්‍ර ආර්ථික ස්ථායීතාව හා මනා ප්‍රතිපත්ති ආදියෙහි සහායෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය මධ්‍ය කාලීනව ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2019 සහ 2022 අතර කාලයේදී ආසන්න වශයෙන් ඇ.ඒ.ජ. ඩොලර් බිලියන 15 ක පමණ බාහිර ණය මුදල් ප්‍රමාණයක් වෙනුවෙන් ගෙවීම් සිදු කරන්න ඇති නිසා සිය සංචිත ඉහළ නංවා ගැනීමට ශ්‍රී ලංකාවට සිදු වේ.

2018 අග භාගය වන විට දිවයිනේ විදේශ විනිමය සංචිත ආසන්න වශයෙන් ඇ.ඒ.ජ. ඩොලර් බිලියන 8.5 දක්වා ඉහළ නගිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන්ම ස්වාධීන බැඳුම්කර නිකුත් කිරීම හා හම්බන්තොට වරාය බදු දීම හරහා මෙය සිදු වෙතැයි සිතිය හැක. 2017 දී 2.3% ක් ලෙස වාර්තා වූ ජංගම ගිණුම් ආශ්‍රිත හිඟය 2018 වසරේදී තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර විදේශ මුදල් ප්‍රේෂණ වර්ධනය මන්දගාමී වීම හා සංචාරක කර්මාන්තයේ ආදායම් පහත බැසීම ඊට හේතු වනු ඇත.

විදේශ ණය සේවා ගෙවීම්, වෙළෙඳ හිඟය පුළුල් වීම, මැද පෙරදිග කලාපයෙන් එල්ල විය හැකි ආර්ථික පීඩනය, තෙල් මිල ඉහළ යාම, රට තුළට ගලා එන මුදල් ප්‍රේෂණ මන්දගාමී වීම සහ දැඩි ගෝලීය මූල්‍ය තත්ත්ව ආදී හේතු නිසා 2018 වසර තුළ ශ්‍රී ලංකා රුපියලේ අගය පීඩනයට ලක්ව පවතිනු ඇතැයි සැලකිය හැක. කෙසේ වෙතත්, 2018 වසරේදී ජීඑස්පී + ප්‍රතිලාභ නැවත ලැබීමේ සම්පූර්ණ බලපෑම, හම්බන්තොට වරාය බදු දීමෙන් ලැබෙන ලාභ හා ආදායම් සහ ස්වාධීන බැඳුම්කර නිකුත් කිරීම හේතුවෙන් මෙකී බරපතල තත්ත්වයන් තරමක් දුරට අඩුකර ගැනීමට හැකි වනු ඇත.

බැංකුකරණ අංශය

ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු අංශය දේශීය බැංකු 13 කින් සහ විදේශීය බැංකු 12 කින් සමන්විත වන අතර 2017 අවසානය වන විට රු. බිලියන 8,926 ක් වටිනා මුළු වත්කම් ප්‍රමාණයක් එය සතුව තිබිණ. 2017 වසර තුළ සාමූහිකව බැංකු ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 5,739 ක් දිවයින පුරා ක්‍රියාත්මක වී තිබේ. ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය නියාමනය හා අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වගකීම දරන අතර මීට අදාළ නෛතික රාමුව මූල්‍ය නීති පනත සහ බැංකු පනතෙන් සමන්විත වෙයි.

වත්කම් හා වගකීම්

2017 වසර තුළ බංකුකරණ අංශයේ වත්කම් ගත වූ වසර හා සැසඳීමේදී රු. බිලියන 10,293 දක්වා, එනම් 14% කින් ව්‍යාප්ත වී තිබේ. මෙම අංශයේ මුළු වත්කම් පදනමෙන් 72% ක්ම සඳහා දායක වී ඇති ප්‍රධාන මූලාශ්‍රය තැන්පතු වන අතර ගත වූ වසරට සාපේක්ෂව බැලීමේදී එය 18% ක වර්ධනයක් ලබා ගනිමින් රු. බිලියන 7,399 දක්වා ඉහළ ගොස් ඇත. 2017 වසර තුළ ණය හා අත්තිකාරම්ද ගත වූ වසර හා සැසඳීමේදී රු. බිලියන 6,319 දක්වා, එනම් 16% කින් ඉහළ ගොස් තිබේ.

සමස්ථ බැංකුකරණ අංශය සලකා බැලීමේදී වත්කම් ඇසුරින් 14% ක වෙළෙඳපොල කොටස් ප්‍රමාණයක් හිමිකර ගැනීමට මහජන බැංකුවට හැකි විය. මීට අමතරව, මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ කර්මාන්තයේ තැන්පතුවලින් 17% ක් ද, බැංකුකරණ අංශයේ ණය හා අත්තිකාරම්වලින් 16% ක් ද සඳහා හිමිකම් පෑමටද බංකුවට හැකි විය. ගත වූ වසරට සාපේක්ෂව බැලීමේදී 2017 වසර තුළ බැංකුවේ වත්කම් 13% කින්ද, තැන්පතු 15% කින් ද, ණය හා අත්තිකාරම් 14% කින් ද ඉහළ ගොස් ඇත.

මුළු වත්කම්



ණය හා අත්තිකාරම්



තැන්පතු



තැන්පතු

2017 වසර තුළ බංකුකරණ අංශයේ තැන්පතු ගත වූ වසර හා සැසඳීමේදී 18% ක වර්ධනයක් ලබා ගනිමින් රු. බිලියන 7.399 දක්වා ඉහළ ගොස් තිබේ. මෙහි විශාලතම සංඝටකය සමස්ථ තැන්පතු ප්‍රමාණයෙන් 64% ක් නියෝජනය කළ ස්ථාවර තැන්පතු වූ අතර 27% ක් නියෝජනය කළ ඉතුරුම් තැන්පතු දෙවැනි තැනට පත් විය. වර්ධනය වෙමින් පැවැති විශාලතම තැන්පතු කාණ්ඩය ස්ථාවර තැන්පතු වූ අතර එය ආශ්‍රිතව ගත වූ වසර හා සැසඳීමේදී රු. බිලියන 4,704 දක්වා, 23% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. 2017 වසර තුළ කර්මාන්තයේ සමස්ථ තැන්පතු පදනමින් 17% ක් සඳහා මහජන බැංකුව දායකත්වය ලබා දී ඇති අතර ගත වූ වසරට සාපේක්ෂව බලන කල තැන්පතු වර්ධන අනුපාතිකය 15% ලෙස පවත්වා ගනිමින් රු. බිලියන 1,244 ක් දක්වා ළඟා වී ඇත. මින් විශාලතම කොටස ස්ථාවර තැන්පතු වූ අතර බැංකුවේ සමස්ථ තැන්පතු පදනමින් 58% ක් ලෙස එය වාර්තා වෙයි. රු. බිලියන 717 ක් ලෙස පැවැති මෙය 21% ක වර්ධනයකි.

බැංකු ක්ෂේත්‍රයේ තැන්පතු



බැංකු කර්මාන්තය සහ මහජන බැංකුව - තැන්පතු සංයුතිය



බැංකු කර්මාන්තය හා මහජන බැංකුව - අක්‍රිය ණය ආවරණ අනුපාතිකය



වත්කම්වල ගුණාත්මකභාවය

අක්‍රිය ණය අනුපාතිකය ආශ්‍රයෙන් හඳුනා ගැනෙන බැංකුකරණ ක්ෂේත්‍රයේ වත්කම් ගුණාත්මකභාවය ගත වූ වසරේ පැවැති 2.6% සමග සැසඳීමේදී 2017 වසර තුළ 2.5% දක්වා වර්ධනය වී ඇත. මේ අතරම, 2016 වසරේදී 72% ක් ලෙස වාර්තා වූ මුළු ප්‍රතිපාදන ආවරණ අනුපාතිකය 70% දක්වා පහත බැසීමක් පෙන්නුම් කරයි.

ඉහළ වත්කම්වල ගුණාත්මකභාවයක් පවත්වා ගැනීමට මහජන බැංකුවට හැකි වී ඇති අතර අක්‍රිය ණය අනුපාතිකය 1.9% ට අඩුවෙන් පවත්වා ගැනීමට හැකි වී ඇත. මෙය කර්මාන්තයට අදාළ සාමාන්‍ය අනුපාතිකයට වඩා පහළ මට්ටමකි. 2016 දී 110% ක් ලෙස පැවැති මහජන බැංකුවේ අක්‍රිය ණය ආවරණ අනුපාතිකය 2017 වසරේදී කර්මාන්තයට අදාළ සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් පවතින්නේ වී නමුදු 98% දක්වා පහත බැස ඇත.

බැංකු කර්මාන්තය හා මහජන බැංකුව - අක්‍රිය ණය අනුපාතිකය



ලාභදායීතාව

බැංකු කර්මාන්තයේ ලාභදායීත්වය ගත වූ වසරට සාපේක්ෂව බැලීමේදී 2017 වසර තුළ බදුවලට පෙර ලාභය රු. බිලියන 195 දක්වා 18% කින් ඉහළ ගොස් ඇත. මීට බලපෑ ප්‍රධානතම හේතුව ලෙස දැක්විය හැක්කේ ගත වූ වසරට සාපේක්ෂව බැලීමේදී පොලි ආදායමේ 28% ක වර්ධනයක්ද, පොලි නොවන ආදායමේ 19% ක වර්ධනයක්ද සිදුව තිබීමයි. පොලි වියදම් ඉහළ යාම හේතුවෙන් ගත වූ වසර හා සැසඳීමේදී පොලි වියදම්ද රු. බිලියන 630 දක්වා කින් ඉහළ ගොස් ඇත. 2017 වසර තුළ මහජන බැංකුවේ බදුවලට පෙර ලාභය 24%කින් රු. බිලියන 26 දක්වා ඉහළ ගොස් ඇත. සාමාන්‍ය කොටස් මත ප්‍රතිලාභ අනුපාතිකය 2017 වසරේදී දැකිය හැකි වූ කර්මාන්ත සාමාන්‍යය වූ 17.6% ට වඩා ඉහළින්, 26.6% ක් ලස වාර්තා විය. මෙහි සමාලෝචනයට ලක් වන වර්ෂය තුළ 2.0% ක් වශයෙන් පැවැති කර්මාන්තයේ සාමාන්‍යයට වඩා සුළු වශයෙන් පහළින් බැංකුවේ වත්කම් මත ප්‍රතිලාභ අනුපතිකය 1.9% ක් ලෙස පැවතිණ. එසේම, 2017 වසරේදී බැංකුවේ පොලි ආන්තිකය 3.6% ක් වූ අතර මෙය කර්මාන්තයේ සාමාන්‍යය වූ 3.% ට වඩා තරමක් ඉහළ අගයකි.

බැංකු කර්මාන්තය සහ මහජන බැංකුව - බදුවලට පෙර ලාභය



බැංකුකරණ කර්මාන්තය හා මහජන බැංකුව - ස්කන්ධය මත ප්‍රතිලාභ



බැංකුකරණ කර්මාන්තය හා මහජන බැංකුව - පොළී ආන්තිකය



බැංකුකරණ කර්මාන්තය හා මහජන බැංකුව - වත්කම් මත ප්‍රතිලාභ



ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව

බාසල් III ප්‍රමිතීන්ට අනුව 2017 ජූලි 1 දින සිට බැංකුව විසින් 11.75% ට නොඅඩු මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගැනීම අවශ්‍ය වෙයි. එම ප්‍රමිතියට අනුකූලතාව දක්වමින් අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව ඉක්මවා යමින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය 13.5%ක් වශයෙන් පවත්වා ගැනීමට මහජන බැංකුව සමත් වී තිබේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය



වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය

උපායමාර්ගය නිර්ණය කර ගැනීම

අපගේ සමූහයේ වර්ධනය හා ලාභදායීතාව ඉලක්ක කරගත් සාර්ථක උපායමාර්ග පිහිටුවීමේදී අපට අදාළ ව්‍යාපාරික පරිසරයේ තරගකාරීත්වය මැනවින් වටහා ගැනීම අත්‍යවශ්‍ය කටයුත්තකි. මේ නිසා, අපගේ කර්මාන්තය සතු ආකර්ෂණීයභාවය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම උදෙසා අප විසින් බැංකුකරණ හා මූල්‍ය කර්මාන්තයේ විවිධ පැතිකඩ සමීප නිරීක්ෂණයට හා තක්සේරු කිරීම්වලට ලක් කිරීම සිදු කෙරේ. එහි කොටස් වශයෙන් අපටම ආවේණික වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය යොදා ගනිමින් මෙහෙයුම් පරිසරය තුළ උද්ගත වන අවදානම් හා අවස්ථා විස්තරාත්මක ලෙස ඇගයීමට ලක් කිරීමට අපි කටයුතු කරන්නෙමු. මේ අනුව, බැංකුවේ දැක්ම, මෙහෙවර හා වටිනාකම් සහ අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ද්‍රව්‍යමය සාධක සැලකිල්ලට ගනිමින් 2016-2020 සඳහා වන උපායමාර්ගික න්‍යායපත්‍රය සකස් කරන ලදී. මෙහි පිටු අංක 123 සහ 124 හි දැක්වෙන පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සාකච්ඡාව කෙරෙන් මීට අදාළ ද්‍රව්‍යමය මාතෘකා හඳුනාගන්නා ලදී.



ඉස්මතු විය හැකි අවදානම් හා අවස්ථා

ඉස්මතු විය හැකි අවදානම් හා අවස්ථා හඳුනාගනු පිණිස අප විසින් බාහිර පරිසරය විමර්ශනය කරනු ලැබෙන අතර එකී අවදානම් අවම කරමින් අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ලබා ගනු පිණිස කාර්යක්ෂම උපායමාර්ග ක්‍රියාත්මක කරනු ලැබේ. අපගේ තරගකාරීත්ව තත්ත්වය තිරසාර ලෙස පවත්වා ගනිමින් සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමට මග පාදන අප සමූහයේ උපායමාර්ගික න්‍යායපත්‍රයෙහි අත්‍යවශ්‍ය අංගයක් වශයෙන් මෙය හැඳින්විය හැකිය.

මූල්‍ය සේවා ඩිජිටල්කරණය

අන්තර්ජාලයේ වර්ධනයත් සමග අපගේ දෛනික ජීවිත හා නිරන්තරයෙන් බැඳී ඇති බහුමානීය ලෝකයක් වෙත අප යොමු වී තිබේ. මේ වන විට මෙම ඩිජිටල් පෙරළිය මූල්‍ය සේවා කර්මාන්තය වෙතද ව්‍යාප්ත වී ඇති අතර අති නවීන තාක්ෂණය, වැඩිදියුණු කරන ලද පාරිභෝගික සේවාව සහ අවම පිරිවැය ඇතුළත් විකල්ප පාරිභෝගික සේවාවන්හි නැඟී ඒමට එය විශාල ලෙස බලපා තිබේ. මූල්‍ය සේවා අංශයේ ඩිජිටල් පෙරළිය නිසා බැංකු සිය ගනුදෙනුකරුවන් හා කටයුතු කරන ආකාරය ශීඝ්‍ර වෙනසකට බඳුන් කරමින් ඇති අතරම තාක්ෂණය සාර්ථක ලෙස යොදා ගැනීම තුළින් පාරිභෝගික සේවා මට්ටම් වැඩිදියුණු කර ගැනීමට, අඩු පිරිවැයක් දරමින් සේවා ලබා දීමට සහ වඩා විශ්වසනීය හා කාර්යක්ෂම ක්‍රියාවලින් පවත්වා ගැනීමට සහාය ලැබේ.



උපායමාර්ගික ප්‍රතිචාර:
ඩිජිටල් බැංකු මධ්‍යස්ථාන පිහිටුවීම, ස්වයං-සේවා මාධ්‍ය, සමාජ මාධ්‍ය හරහා ගනුදෙනුකරුවන් හා සන්නිවේදන පැවැත්වීම සම ජංගම දුරකතන හා අන්තර්ජාලය පාදක කරගත් බැංකු පහසුකම් ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීම වැනි ක්‍රම හරහා නව තාක්ෂණික අවස්ථාවල ප්‍රයෝජන ලබා ගැනීමට අප සමූහය නිරන්තරයෙන් කටයුතු කරයි. පවතින වෙළෙඳපොල ආශ්‍රිත වර්ධන අවස්ථාවන්ට සහාය දැක්වීම හා නව වෙළෙඳපොල අවකාශ කරා යොමු වීම ඉහළ නැංවීම අරමුණු කරගෙන මූල්‍ය සේවාවන් සඳහා ඇති ඩිජිටල් බාධකය ඉවත් කිරීමේ උපක්‍රමයක් වශයෙන් මෙවැනි තාක්ෂණයන් භාවිත කිරීම සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිත ගනුදෙනුකරුවන් දැනුම්වත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

දින වෙනස් වන පාරිභෝගික අපේක්ෂාවන්

ඩිජිටල් බැංකුකරණ වෙළෙඳපොල ශීඝ්‍ර වෙනසකට බඳුන් වෙමින් පවතින අතර මෙම ඩිජිටල් පෙරළිය හේතුවෙන් සාම්ප්‍රදායික බැංකුකරණ අත්දැකීම නව ඩිජිටල් ලෝකයක් වෙත ප්‍රවිශ්ඨ කරනු ලැබ ඇත. මෙය, බැංකු සිය ගනුදෙනුකරුවන් හා කටයුතු කරන සහ ඔවුන් සතුටට පත් කරන ආකාරයේ දැවැන්ත පෙරළියකි. මේ අතරම මූල්‍ය සේවාවලට අදාළව පාරිභෝගික අපේක්ෂාවන්හි පෙර නොවූ විරූ වෙනස්කම් රැසකට මුහුණ පාන්නට බැංකුවට සිදු වන අතර පහසුව කෙරෙහි වැඩි වැඩියෙන් අවධානය යොමු කිරීම, ඩිජිටල් ප්‍රවේශයට සහ තම අවශ්‍යතාවන්ට සුවිශේෂයෙන් ගැලපෙන වටිනාකම එකතු කළ සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම ආදිය ඒ අතර වේ. ගෝලීය මට්ටමින් ගත් කල මෙම පරිවර්තනය ආශ්‍රිතව කැපී පෙනෙන වෙනසක් දැකිය හැකි අතර ගනුදෙනුකරුවන් අතරින් 75% කටත් අධික පිරිසක් සාම්ප්‍රදායික නොවන නව බැංකුකරණ මාධ්‍යවලට කැමැත්තක් දක්වන බව පෙනී යයි. මේ නිසාම, සිය සේවාවන් ඩිජිටල්කරණයට ලක් කිරීමේ පහසුව ගනුදෙනුකරුවන් වෙත උදා කිරීමට බැංකුවලට සිදු වේ.



උපායමාර්ගික ප්‍රතිචාර:
අප බැංකුව විසින් සැලසුම් කරන ලද ඩිජිටල්කරණ ව්‍යාපෘතියට අනුගත වන පරිදි අසීමිත ඩිජිටල් ඒකාබද්ධකරණයන්ට මග පාදන නව නාලිකා කෙටි කාලීන සහ මධ්‍ය කාලීන වශයෙන් හඳුන්වා දෙමින් පවතී. ඩිජිටල් බැංකු මධ්‍යස්ථාන, ස්වයං-සේවා පුවරු හා මුදල් තැන්පතු යන්ත්‍ර ආදිය මීට ඇතුළත් වනු ඇත. මීට අමතරව, ඩිජිටල් බැංකු සේවාවන්හි ප්‍රතිලාභ ජාතියට උදා කරමින් ඒ ආශ්‍රිත මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ඩිජිටල් බැංකු මධ්‍යස්ථාන ජාලයක් දියත් කරන ලදී.

යහපාලනය හා අවදානම් කළමනාකරණය වෙනුවෙන් දින දින වැඩි වන ඉල්ලුම

මූල්‍ය ස්ථායීතාව හා තිරසාර ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීම වෙනුවෙන් වන පුළුල් ඉලක්කවලට ගැලපෙන පරිදි වඩා විනිවිදභාවයෙන් ඉහළ හා කාර්යක්ෂම ආයතනික පාලනය හා අවදානම් කළමනාකරණ රාමු සඳහා අප පාර්ශ්වකරුවන් අතර ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී. මේ නිසා, ඔවුන් වෙනුවෙන් ඉටු කිරීමට බැඳී සිටින වගකීම්වලට අමතරව සමූහයේ ආයතනික උපායමාර්ගික දිශානතිය සාර්ථක ලෙස ඔවුන් හා සන්නිවේදනය කරමින් හා නිසි අවදානම් තක්සේරුකරණයක් සිදු කිරීම හා ඉහළම ආයතනික යහපාලන පරිචයන් යොදා ගනිමින් එකී අවදානම් අවම කිරීම සහතික කිරීමද අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සිදු කළ යුතු වෙයි.

උපායමාර්ගික ප්‍රතිචාර:
සමූහය තුළ විනිවිදභාවය සහ ස්ථායීතාව වැඩිදියුණු කරනු වස් අප විසින් අවදානම් කළමනාකරණ රාමු හා ආයතනික යහපාලනය සවිමත් කිරීමට පියවර ගෙන තිබේ.

තිරසාරතාව වෙනුවෙන් සිදු කරනු ලබන සලකාබැලීම්

පාරිසරික හා සමාජයීය වගකීම් සිය මූලික ව්‍යාපාරික ක්ෂේත්‍රවලට ඒකාබද්ධ කිරීම තුළින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම තුළ සුවිශේෂී භූමිකාවක් බැංකු විසින් ඉටු කරනු ලැබේ. ණය දීමට අදාළ තීරණවලදී පාරිසරික සාධක ඇතුළත් කර ගැනීම සහ පාරිසරික වශයෙන් වඩා හිතකර ව්‍යාපාරික කටයුතු දිරිමත් කරන නව නිපැයුම් සංවර්ධනය කිරීම ආදියද මීට ඇතුළත් වේ.

උපායමාර්ගික ප්‍රතිචාර:
මහජන බැංකුව විසින් 2016 වසරේදී හරිත බැංකු සංකල්පය දියත් කරන ලදී. මෙය, පාරිසරික වශයෙන් හිතකර ව්‍යාපාරික ව්‍යාපෘති වෙනුවෙන් සහන කොන්දේසි යටතේ ණය ලබා දීම හා ඩිජිටල් බැංකු සේවා ප්‍රවර්ධනය කරමින් අප ගනුදෙනුකරුවන් අතර හරිත බැංකු පුරුදු වර්ධනය කිරීම අරමුණු කරගත් බහුවිධ ක්‍රියාදාමයකි. හරිත බැංකු කටයුතු කෙරෙහි සැබෑ සවිඥානිකත්වයක් සහිත පුද්ගලයන් වෙනුවෙන් වන කඩදාසි භාවිතය අවම කරන ව්‍යාපෘතියක් වන Young Executive Saver Account (YES) සේවාව නැවත දියත් කිරීමටද අප බැංකුව කටයුතු කරන ලදී.

වටිනාකම නිර්මාණය හා ව්‍යාපාරික ආකෘතිය

ශ්‍රී ලංකාවේ බැංකු කර්මාන්තය තුළ විශාලතම පාරිභෝගික පදනම හිමි සහ සේවකයින් රැඳී සිටීමේ ප්‍රවණතාව ඉහළම තත්ත්වයෙන් පවතින දිවයිනේ පුරෝගාමී මූල්‍ය ආයතනය බවට පත් වීම සඳහා මහජන බැංකු සමූහය සුවිශාල ප්‍රයත්නයක් දරා තිබේ. මේ ගමනේදී අප ලබා ඇති අඛණ්ඩ දියුණුව සඳහා කර්මාන්තය තුළ අපට හිමි ස්ථිර නායකත්ව ස්ථානය, අඛණ්ඩ කොටස්හිමි ප්‍රතිලාභ සහ සවිමත් පාරිභෝගික සබඳතා ආදිය මොනවට සාක්ෂි දරයි.

මූල සේවාවන් ආශ්‍රිතව ගත් කළ කිසිදු තරගකාරිත්වයකින් නොසැලෙන වෙළෙඳපොල පුරෝගාමියා බවට පත් වීමේ අපගේ උපායමාර්ගික ඉලක්කය මත මෙම වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය රඳා පවතියි. අපගේ ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑම් මනාව තුලනය කර ගනිමින් පාර්ශ්වකරුවන් වෙනුවෙන් වටිනාකම් උත්පාදනය අපගේ අභිලාෂයයි. මූල්‍ය සේවා ලබා දෙමින් අපගේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම උදෙසා අප රඳා පවතින වැදගත් සම්පත් මෙම වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය මගින් පෙන්නුම් කෙරේ. විවිධ ප්‍රතිඵල මාලාවක්ම උදා කරනු පිණිස අප විසින් ප්‍රාග්ධන මාදිලි හයක් යොදා ගනු ලැබේ. මේ නිසා, නිරන්තරයෙන් වටිනාකම් ලබා දෙන බව සහතික කරනු වස අපි අපගේ ප්‍රාග්ධනයන් හා ක්‍රියාවලීන් කාර්යක්ෂම හා සාර්ථ අයුරින් කළමනාකරණය කරන්නෙමු.

බාහිර පරිසරය

ප්‍රාග්ධනයන්	ආදාන
මූල්‍ය ප්‍රාග්ධනය පිටු අංක 126 සිට 132 දක්වා	• කොටස් හිමියන්ගේ අරමුදල් **රු. බිලියන 106.4** • පාරිභෝගික තැන්පතු **රු. බිලියන 1,305.6**
බුද්ධිමය ප්‍රාග්ධනය පිටු අංක 153 සිට 156 දක්වා	• සන්නාම වටිනාකම • නියග දැනුම • සන්නාම සංවර්ධනය
නිෂ්පාදන ප්‍රාග්ධනය පිටු අංක 151 සිට 152 දක්වා	• ශාඛා - 737 • ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර - 572 • උපායමාර්ගික ව්‍යාපාරික ඒකක - 102
සමාජ හා සබඳතා ප්‍රාග්ධනය ආයෝජකයා, පාරිභෝගිකයා, ව්‍යාපාරික සහකරු සහ ප්‍රජාව පිටු අංක 171 සිට 188 දක්වා	• පාරිභෝගිකයන් මිලියන **18.6 ක්** • බලය පැවරූ නියෝජිතයන් **72 ක්** • සම්බන්ධ බැංකු **46 ක්** • ආයතනික සමාජ මෙහෙවර වැඩසටහන් වෙනුවෙන් **රු. මිලියන 56.3** • සැපයුම්කරුවන් **662** • ප්‍රජා කේන්ද්‍රීය සංවර්ධන ණය **51,375**
මානව ප්‍රාග්ධනය පිටු අංක 157 සිට 170 දක්වා	• සේවකයන් **8,454** • පුහුණු හා සංවර්ධන පිරිවැය **රු. මිලියන 72**
ස්වභාවික ප්‍රාග්ධනය පිටු අංක 189 සිට 191 දක්වා	• බලශක්ති පරිභෝජනය 2,194,500 kWh • ජල කළමනාකරණ ක්‍රියාදාම • විවෘත කළ YES ගිණුම් 342,327 • People's Green Pulse

දැක්ම හා මෙහෙවර

පාලන ව්‍යුහය

ප්‍රාථමික හා උපකාරී ක්‍රියාකාරකම්

අරමුදල් සම්පාදනය

තැන්පතු එක්රැස් කිරීම

ණය දීම

සිල්ලර
තොග
ව්‍යවසායක
කල්බදු

වෙනත් සේවා

ජාත්‍යන්තර බැංකු කටයුතු
භාණ්ඩාගාර සහ ආයෝජන බැංකු කටයුතු
ශාඛා මෙහෙයුම්
අලෙවිකරණ
මානව සම්පත් කළමනාකරණය
උපායමාර්ගික සැලසුම්කරණය
අවදානම් කළමනාකරණය හා අනුකූලතාව
මූල්‍ය හා කළමනාකරණය ගිණුම්කරණය
තොරතුරු තාක්ෂණය

ප්‍රතිදාන	ප්‍රතිඵල
• දළ ආදායම **රු. බිලියන 190.2** • බදුවලට පෙර ලාභය **රු. බිලියන 29.9** • මුළු අත්තිකාරම් වටිනාකම **රු. බිලියන 1,209.1**	ජාතික සංවර්ධනයට හා මූල්‍ය අන්තර්ග්‍රහණයට දායක වීම
• සේවකයෙකුට ලබා දුන් සාමාන්‍ය පුහුණු පැය - **පැය 24** • පාරිභෝගික තෘප්තිමත්භාවය **91%** • ශ්‍රී ලංකාවේ පළමු නවෝත්පාදන මධ්‍යස්ථානය විවෘත කරන ලදි	ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවලට සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීම උදෙසා අපගේ බෙදාහැරීම් නාලිකා වැඩි කිරීම හා නවෝත්පාදනාත්මක නිෂ්පාදන ලබා දීම
• නව උපායමාර්ක ව්‍යාපාරික ඒකක **99** • නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර **66** • ඩිජිටල් මධ්‍යස්ථාන **2**	ඩිජිටල් බැංකු ජාලය ව්‍යාප්ත කිරීම හා අතිශයින්ම සුරක්ෂිත හා ස්ථාවර තොරතුරු තාක්ෂණ අවකාශ ඇති බව සහතික කිරීම
• කොටස් මත ප්‍රතිලාභ **21.4%** • කොටසකට ඉපයීම **රු. 19,296** • සැපයුම්කවරුන්ට ගෙවීම් **රු. බිලියන 10.5** • ප්‍රජා කේන්ද්‍රීය සංවර්ධන ණය සඳහා **රු. බිලියන 10,480** • නව ගනුදෙනුකරුවන් **700,000** • ATM ආශ්‍රිත මූල්‍ය ගනුදෙනු **රු. මිලියන 48**	අප විසින් වැඩිදියුණු කරන ලද පාරිභෝගික අත්දැකීමක්, වටිනාකම එකතු කරන ලද සේවා, හිතකර ප්‍රතිලාභ ලබා දෙන අතරම තිරසාර ප්‍රජා බිහි කරනු ලැබ ඇත
• සේවක පුහුණු **පැය 199,956** • ප්‍රසූත නිවාඩු ලැබ නැවත සේවයට වාර්තා කිරීම් **100%** • සේවා කාල සාමාන්‍යය වර්ෂ 13	අපගේ නිපුණතා පිරිපුන් හා තරඟකාරී කාර්ය මණ්ඩලය හරහා අසමසම සේවාවක් සපයන්නෙමු
• 620tCO_2e මහින් කාබන් මුදාහැරීම අඩු කිරීම • උපකරණවලින් වායු විමෝචනය **86%** කින් අඩු කිරීම	පරිසරයට කෙරෙන බලපෑම අවම කරමින් පාරිසරික තිරසාරතාව වෙනුවෙන් කැප වන්නෙමු

ඉලක්ක, උපායමාර්ග හා ව්‍යාපාරික පෙරදැක්ම

අපගේ උපායමාර්ගය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට අඛණ්ඩ දායකත්වයක් සපයමින් මෙරට වැසියන් හට සවිමත් හා ස්ථාවර නායකත්වයේ ප්‍රතිරූපයක් බවට පත් වූ බැංකුවක් වශයෙන් අපගේ කැපවීම දෙආකාරය. එනම්, ජාතික ආර්ථික සංවර්ධනයට සහාය දැක්වීම හා අපගේ පාර්ශ්වකරුවන් සියලුම දෙනා වෙත අඛණ්ඩ වටිනාකමක් එකතු කිරීම වශයෙනි.

බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මගපෙන්වීම මෙන්ම සමස්ථ නිල ධූරාවලියේම සම්පූර්ණ සහයෝගය සහිතව බාහිර උපදේශන සේවා සමාගමක් විසින් සකස් කරන ලද 2016/2020 උපායමාර්ගික සැලැස්මට අනුව ස්ථාවර වර්ධනයක් ළඟාකර ගැනීමට අපට හැකි විය. ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරිගේ නායකත්වය යටතේ කාර්යාත්මක ක්ෂේත්‍ර 15 ක් ආශ්‍රිතව සාධනය කරගත යුතු උපායමාර්ගික ක්‍රියාදාම 67 ක් එම සැලැස්මට ඇතුළත් වේ. ව්‍යාපාරික ආචාර ධර්ම හා ආයතනික යහපාලන මූලධර්මවලට සවිමත් ලෙස අනුකූලතාව දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඍජුවම වාර්තා කරන කාර්යභාරයන් හතරක් දක්වා මෙම උපායමාර්ග පවරා තිබේ.

වසර තුළදී අදාළ උපායමාර්ගික ක්‍රියාදාමයන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට අපට හැකි වී ඇති අතර අපගේ උපායමාර්ගික න්‍යායපත්‍රයට අදාළව සවිමත් ප්‍රගතියක් වාර්තා කිරීමට එමගින් අපට හැකි වී තිබේ. බැංකුවේ උපායමාර්ග සැලසුම්කරණ හා කාර්යසාධන කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඉහත කී කාර්යාත්මක ක්ෂේත්‍ර 15 මෙහෙයවනු ලැබ ඇති අතර ඒ අනුව මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ සමස්ථ උපායමාර්ගික අරමුණුවලින් 78% ක් ළඟාකර ගැනීමට හැකියාව ලැබී ඇත.

උපායමාර්ග සැලසුම්කරණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා අප විසින් whistle blowing ප්‍රතිපත්තියක්, වෘත්තීය නිරීක්ෂණ යාන්ත්‍රණයක් සහ පසුප්‍රතිචාර ක්‍රියාවලියක් පිහිටුවා ඇත. මීට අමතරව, අපගේ උපායමාර්ගික සැලැස්ම සාර්ථක ලෙස සාක්ෂාත් කරගනු පිණිස ණය ඇගයීම් ආකෘතියක්, වෘත්තීමය වශයෙන් නිපුණතා පිරිපුන් සේවක බලකායක් සහ අති පුළුල් භූගෝලීය ආවරණයක්ද අප සතු වේ.

අප හට කටයුතු කරන්නට සිදු වන නිරන්තරයෙන් වෙනස් වන මෙහෙයුම් පරිසරය තුළ ඇති සාර්ව ආර්ථික වෙනස්කම්ද සැලකිල්ලට ගනිමින් අප විසින් අපගේ අභිනව උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට පියවර ගනු ලැබේ. අපගේ අරමුණ වන්නේ 2020 වසර වන විට ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම ඩිජිටල්කරණයට ලක් වූ බැංකුව බවට පත් වීමයි. අප රටේ සෑම දෙනා හටම ඩිජිටල් බැංකු සේවා වෙත ප්‍රවේශ වීමට අවස්ථා උදා කරමින් අපගේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් උපරිම තාක්ෂණික වෙනස්කම් සිදු කිරීමෙහි පෙරමුණ ගැනීම අපගේ අභිලාෂයයි. ඩිජිටල් පුරවැසියන් වශයෙන් ජීවිත් වීමට හා වැඩ කිරීමට හැකි වන පරිදි අපගේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් සත්‍ය වශයෙන්ම අපි මංපෙත් විවර කරන්නෙමු. මෙම ඩිජිටල්කරණය හේතුවෙන් අප නොසිතූ තරම් විශාල ඉලක්ක පිරිසක් වෙත ළඟා වීමටත්, "ජාතියේ බැංකු සහකරු" බවට පත් වීමේ අපගේ මූලධර්මය ක්‍රියාත්මක කිරීමට අපට හැකි වනු ඇත.

උපායමාර්ගික රාමුව සහ මෙහෙයවීම් සාධක

උපායමාර්ගික සැලසුම්කරණය සහ කාර්යසාධනය කළමනාකරණය යටතේ කළඹ කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, ආයෝජන ඇගයීම්, දැනුම කළමනාකරණය, ජීවන රටා කළමනාකරණය සහ යටිතලපහසුකම් කළමනාකරණය හරහා බැංකුවට අදාළ දැක්ම වෙනුවෙන් අපගේ ව්‍යාපාරික මෙහෙයුම් දියත් කිරීමේ වගකීම අප සතු වෙයි. 2016/2020. සඳහා වන බැංකුවේ උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී අප විසින් බැංකු කාර්යසාධනය, ව්‍යාපාරික ආකෘතිය සහ මෙහෙයුම් පරිසරය විෂයික සවිස්තර විශ්ලේෂණයක් සිදු කරන ලදි. එහි අරමුණ වූයේ උපායමාර්ගය, ව්‍යුහය, පද්ධති සහ උපායමාර්ගික තීරණ ආදිය හරහා බැංකුවේ අභ්‍යන්තර වටිනාකම් මෙහෙයවන සාධක අනුගත කිරීමයි. මෙම සැලැස්ම යටතේ සකස් කරන ලද උපායමාර්ගික ක්‍රියාදාම 67 ම බැංකුවේ දැක්ම හා මෙහෙවරට අනුකූල වේ. එකී ක්‍රියාදාම ප්‍රධාන විධායක නිලධාරි/කළමනාකාර අධ්‍යක්ෂගේ මෙහෙයවීම යටතේ බැංකුවේ කාර්යාත්මක ක්ෂේත්‍ර 15 විසින් ළඟාකරගත යුතු වේ.

මූල්‍ය සේවා සඳහා ශ්‍රී ලංකාවේ කිසිදු තරගයකට ලක් නොවන වෙළෙඳපොල පුරෝගාමියා බවට පත් වීම

අනුකූලතාව හා ආයතනික යහපාලනය	අභ්‍යන්තර විගණන
ණය හා අවදානම් පාලනය	උපයාමාර්ග සැලසුම්කරණය හා කාර්යසාධන කළමනාකරණය

ඩිජිටල්කරණය හා ඩිජිටල් ව්‍යාප්තිය

උපායමාර්ගික ස්ථිමිත

බැංකුවේ දැක්ම සාර්ථක කර ගනිමින් පාර්ශ්වකරුවන් සියලම දෙනා වෙත වටිනාකම් නිර්මාණය කිරීම වෙනුවෙන් අප විසින් උපායමාර්ගික ස්ථිමිත හතරක් වෙත ප්‍රමුඛතාව ලබා දෙනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා වෙළෙඳපොලේ පුරෝගාමියා බවට මහජන බැංකුව පත් වේ. මෙම උපායමාර්ගික ස්ථිමිත වන්නේ පාරිභෝගික කේන්ද්‍රීයතාව, මෙහෙයුම් විශිෂ්ටතාව, කාර්යක්ෂම සේවක ක්‍රියාකාරිත්වය සහ ආයතනික යහපාලනය යනාදියයි.

මූල්‍යසේවා ක්ෂේත්‍රයේ අසමසම වෙළඳපොළ නියමුවා වෙමින්

කොටස්හිමියන්ගේ කැමැත්ත ප්‍රවර්ධනය කිරීම තුළින් තිරසාර වෘද්ධිය පවත්වාගැනීම

ගනුදෙනුකරුවන් කෙරෙහි යොමුවීම

- ගනුදෙනුකාර කේන්ද්‍රීය බව
- ගනුදෙනු සබඳතා කළමනාකරණය
- මධ්‍යගත ඇමතුම් මධ්‍යස්ථානය
- අනන්‍ය විකුණුම් සේවා මාධ්‍ය
- ව්‍යාපාර නිමිකම පදනම් නව නිෂ්පාදිත සංවර්ධනය
- ආර්ථිකමය හැකියා වර්ධන නිෂ්පාදිත හඳුන්වාදීම
- වෘත්තීයගත කළ ගනුදෙනුකාර පරිභෝජ්‍ය නිෂ්පාදිත
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ශ්‍රේණිගත කිරීම
- සමස්ත වාණිජ ණයදීම්
- ස්වයංකෘත ආයතනමය බැංකුකරණ සේවා ඒකකය
- ණය ධාරාවේ ප්‍රවේගකාරී ප්‍රබෝධනය
- සබඳතා හා සංවර්ධන අංශය
- අර්ධ ස්මවංකෘත සහ මහා වෙළඳපොළ ණය කාඩ්පත්/ ගෙවීම් විසඳුම
- වත්මන් ණය ධාරා ප්‍රතියොමුව

ක්ෂේත්‍රයේ වෙළඳපොල නියමුවා බවට පත්වීමට වෙහෙසෙන අතරම, මෙරට වැඩිදෙනාගේ මනාපය හිමිකරගත් බැංකුව විශයෙන් අපගේ වෙළඳපොළ තරාතිරම ස්ථාපිත කරගනිමින් අප කරන සියළු කටයුතු වලදී ගනුදෙනුකාරභවතුන්ට ප්‍රමුඛස්ථානය ලබාදීමට අපි අදිටන් කරගෙන සිටිමු.

මෙහෙයුම් අනර්ඝත්වය

- ආමුඛ ප්‍රේෂණාදෘ ඇතුළු ගාස්තුමය ආදායම වැඩිකර ගැනීම අරභයා ප්‍රවේගකාරී අභිප්‍රේරණය
- ශාඛා හැඩතලය අදට ගැලපෙන අයුරින් ශෝභාමත් කිරීම
- අංකිත සේවා සපයුම ව්‍යාප්තිය/අනර්ඝත්වය
- ගනුදෙනු පියස ආශ්‍රිත පරීක්ෂණ සිදුකිරීම
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයට යොමු කිරීම/උනන්දු කරවීම
- නව පන්නයේ සේවා ධාරා/නාලිකා පිලිබඳ ගවේෂණය සහ කඩිනම් බැංකුකරණය හඳුන්වාදීම
- වාස්තු විද්‍යාත්මක ශාඛා සැලසුම් නිර්මාණය කර අනන්‍ය ආකෘතියක් සැකසීම
- නාලිකා සැපයුම් දාමය ගනුදෙනුකාරභවතාට ගැලපෙන පරිදි සැකසීම සහ මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රධාන ධාරාවට අනුරූප කිරීම
- සේවා සැපයුම් සංස්කෘතිය තවත වැඩි දියුණු කිරීම සහ කැපවූ නාලිකාමය සේවා තවත් වැඩිදියුණු කිරීම
- ශාඛා ගෘහභාණ්ඩ විසිත්ත කරන ප්‍රවර්ධන යාවත්කාලීන කිරීම්
- සන්නාම නිර්මාණශීලිත්වය අසමසම කිරීමට තරගයක් දීම
- ණය සැපයුම් ක්‍රියාවලිය ශූන්‍ය මට්ටමින් අවතීර්ණ වීම

ඩිජිටල් නාක්ෂණයේ පහසුකම් යොදාගනිමින් වඩා සරල වූත් නම්‍යශීලී වූත් මෙහෙයුම් ආකෘතියක් ගොඩනගා ගැනීම තුළින් ක්‍රියාවලි සැකසුම් සහ මෙහෙයුම් අතින් අනර්ඝ මට්ටමක් සාක්ෂාත් කරගැනීම අප ඉලක්කයයි.

සවිලදායී අන්දමින් සේවකයන් යොමකිරීම

- ඉලෙක්ට්‍රොනිකමය ක්‍රියාවලි මධ්‍යගත කිරීම
- සේවා උසස්වීම් සහ හැකියා ප්‍රවර්ධනය වෙත සබැඳි විද්‍යාත්මක ධාරිතා වර්ධන සැලසුම්
- මූලික ප්‍රගුණතා පාදක පුහුණු කිරීම් කෙරෙහි ආයෝජන
- හඳ බැඳගත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයක් නව බඳවාගැනීම් සැලසුම් සහ ක්‍රියාවලි වෘත්තීමය මට්ටමකට ගෙන ඒම
- සේවා ඇගයුම් දෙවැදෑරුම් ප්‍රමිතීන්ගෙන් තක්සේරුව
- සේවා ඇගයුම හා බැඳුණු ආකර්ෂණීය ප්‍රසාද හා දිරිදීම් ක්‍රම

අපගේ අරමුණවන්නේ අපේක්ෂිත ක්‍රමෝපායේ ප්‍රතිලාභ ගනුදෙනුකරුවන ලබාදීම සඳහා සේවකයින් පෙළඹවීමයි.

යහපාලනය

- මුඛ්‍ය කාර්යසාධන දර්ශක පදනම් කරගත් සේවා කළමනාකරණ ක්‍රම සහ සේවා ඉණිමග ක්‍රමෝපාය ප්‍රමාණාත්මකතා මිනුම ප්‍රජාසේවා සබඳතා කේන්ද්‍රීය ප්‍රතිපත්තිය
- තිරසාර බව කෙරෙහි කාර්ය මණ්ඩලය දැනුවත් කර තිබීම
- යහපාලනය පවත්වාගෙන යමින් පාලනය හිඩැස් හානිය අවම කිරීම
- නාක්ෂණ අනුකූලතා ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මේ හිඩැස යනාදී හානිය අවම කිරීමේ ක්‍රමවේද

නිවැරදි ව්‍යාපාර කටයුතු නිවැරදි ආකාරයෙන් කරන බවට සහතික කරමින්, වගකිව යුතු නායකත්වයක් සහ යහපාලනය පවතින සංස්කෘතියක් ප්‍රවර්ධනය කරනෙමු.

තිරසාර සංවර්ධන ඉලක්ක වෙනුවෙන් අපගේ දායකත්වය

තිරසාර සංවර්ධන ඉලක්ක යනුවෙන් අදහස් වන්නේ දරිද්‍රතාව තුරන් කිරීම, මිහිකත ආරක්ෂා කිරීම සහ ලොව සියලුම දෙනා නිදහස සහ සෞභාග්‍යය භුක්ති විඳින බව සහතික කිරීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් විසින් අනුගමනය කළ යුතු මගපෙන්වීම් හා ඉලක්ක මාලාවකි.

පුරවැසියන්ගේ මූලික අවශ්‍යතා ලබා දීම, ප්‍රගමණාත්මක ලෙස දරිද්‍රතාව තුරන් කිරීම, සියලුම ආකාරවල නොසලකා හැරීම් හා ආන්තිකකරණයන් හා අසමානතා තුරන් කිරීම සහ සමාජ යුක්තිය හා මානව ආරක්ෂාව මත පදනම් වූ සමාජයක් ස්ථාපිත කිරීම තුළින් වසර 2030 වන විට මෙම ඉලක්ක කරා ළඟා වීම ශ්‍රී ලංකා රජයේ අපේක්ෂාවයි. වගකීම්සහගත හා තිරසාර ආයතනික පුරවැසියෙකු වශයෙන් මහජන බැංකුවද තිරසාර ජාතියක් බිහි කිරීම වෙනුවෙන් ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් මෙම තිරසාර සංවර්ධන ඉලක්ක සිය මෙහෙයුම් තුළට ඒකාබද්ධ කර තිබේ.

1 ඉලක්කය

දරිද්‍රතාව තුරන් කිරීම

බැංකු සේවා ජාතික ආර්ථිකයේ බිම් මට්ටම කරාම ලබා දීමේ අපගේ සමාරම්භක අරමුණ පෙරදැරි කර ගනිමින් ආර්ථික වශයෙන් අඩු වරප්‍රසාදලාභී ප්‍රදේශවල පිහිටි අපගේ ශාඛා 158 හරහා එකී ප්‍රදේශවල ජනතාවට අරමුදල් ලබා දීම සඳහා අපි මේ වන විට සමුපකාර ආංශයේ සමාගම් හා අත්වැල් බැඳගෙන සිටින්නෙමු. මෙම අරමුදල් කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, පාරිභෝගික වෙළෙඳ කටයුතු, ධීවර කර්මාන්තය සහ විශේෂ ව්‍යාපෘති ඇතුළු අංශ රැසක් වෙත බෙදා හරිනු ලැබේ. එපමණක්ද නොව, දරිද්‍රතාව තුරන් කිරීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය, ස්වයං-රැකියා ප්‍රවර්ධන ක්‍රියාදාම ණය යෝජනා ක්‍රමය, The Awakening East RF PHASE II ආදී ව්‍යාපෘති හරහා ප්‍රතිමූල්‍ය පහසුකම්ද අපි සපයන්නෙමු.

2 ඉලක්කය

කුසගින්න තුරන් කිරීම

බැංකු කර්මාන්තයේ විශාලතම සේවක සංඛ්‍යාවක් සේවයට බඳවා ගැනීම තුළින් රැකියා අවස්ථා උදා කිරීම හරහා පුද්ගල ජීවිත නගා සිටුවීමට දායක වන අතර ඍජු වශයෙන් පුද්ගලයන් 8000 ක් සහ වක්‍රාකාරවලින් තවත් අති විශාල පිරිසක් වෙනුවෙන් අප රැකියා අවස්ථා ලබා දී ඇත.

3 ඉලක්කය

යහපත් සෞඛ්‍යය සහ ජනතාවගේ යහපැවැත්ම

ශ්‍රී ලාංකික ජාතියේ සෞඛ්‍යාරක්ෂණය සංවර්ධනය කිරීම වෙනුවෙන්ද අපි සහාය පළ කරන්නෙමු. විශේෂයෙන්ම, 2017 වසර තුළ ඩෙංගු රෝගය මර්ධනය කිරීම වෙනුවෙන් පමණක් අප විසින් රු. 282,710.00 ක් වැය කොට ඇත. මේ අතරම අපි අපගේ සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම සහතික කිරීම සඳහා වෛද්‍ය පහසුකම්ද ලබා දෙන්නෙමු.

4 ඉලක්කය

ගුණාත්මකභාවයෙන් ඉහළ අධ්‍යාපනය

බැංකු සේවකයන්ගේ සංවිධානය හරහා අරමුදල් ලබා දෙමින් සෑම වසරකදීම අපි අඩු වරප්‍රසාදලාභී දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීමට උපකාර කිරීම අරමුණු කරගත් විවිධ ආයතනික සමාජ මෙහෙවර වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන්නෙමු. එසේම, විශ්වවිද්‍යාල සිසුන් හට ලැප්ටොප් පරිගණක මිලදී ගැනීමට සහාය දක්වමින් විශේෂ ණය පහසුකම්ද අපි ලබා දෙන්නෙමු. මීට අමතරව, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස (උ/පෙළ) යන විභාග විශිෂ්ට ලෙස සමත් වන සිසු දරුවන් හට විවිධ ශිෂ්‍යත්ව ලබා දීමද අපි සිදු කරන්නෙමු.

5 ඉලක්කය

ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමානව සැලකීම

ශ්‍රම බලකාය තුළ විවිධත්වයට ගරු කිරීම අපි සෑම විටම සිදු කරන්නෙමු. මේ නිසා, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය හෝ වෙනත් කිසිදු එවැනි නිර්ණායකයක් පදනම් කරගෙන කිසිදු සේවකයෙකු අසාධාරණයට ලක් කිරීමට අපි කටයුතු නොකරන්නෙමු. 60% ක් වශයෙන් වාර්තා වන අපගේ කාන්තා සේවක පිරිස බැංකුකරණ කර්මාන්තය තුළ සේවයේ නියුතු ඉහළ කාන්තා සේවිකා පිරිස වන බව සඳහන් කරන්නේ අභිමානයෙනි. කළමනාකාරිත්වය තුළ කාන්තා නියෝජනයද සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී.

6 ඉලක්කය

පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව

වගකීම්සහගත ආයතනික සමාජ පුරවැසියෙකු වශයෙන් අපතේ යාම අවම කරමින් ජලය ආරක්ෂා කිරීම වෙනුවෙන් අප විසින් විධිවිධාන ගෙන ඇත.

7 ඉලක්කය

පහසුවෙන් ලබාගත හැකි හා පිරිසිදු බලශක්තිය

විදුලි බලයට විකල්පයක් වශයෙන් දේශීය නිවාසවල දෛනික බලශක්ති අවශ්‍යතා සපුරාගනු වස් සූර්ය බලශක්තිය යොදා ගැනීමේ වැදගත්කම ශ්‍රී ලංකා රජය විසින් මේ වන විට හඳුනාගෙන තිබේ. මේ අනුව, මහා භාණ්ඩාගාරය විසින් "රිවි බල සවි" නමින් සහණ ණය යෝජනා ක්‍රමයක් යෝජනා කොට ඇති අතර එහි අරමුණ වන්නේ විදුලි බලයෙන් සූර්ය බලශක්තිය කරා මාරු වීම සඳහා සූර්ය බලශක්ති පැනල මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය දේශීයයන් වෙත ලබා දීමයි.

මෙම අරමුණට සහාය දැක්වීමක් වශයෙන් අප විසින්ද සූර්ය කෝෂ පැනල ස්ථාපනය කිරීම සඳහා මූල්‍ය සහාය ලබා දීමේ ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. මෙය පාරිසරික වශයෙන් හිතකර ව්‍යාපෘතියකි.

8 ඉලක්කය

ඉහළ සේවා පරිසරය සහ ආර්ථික වර්ධනය

සමාජයේ සෑම කාණ්ඩයක්ම වෙත අප විසින් විවිධාංගීකරණය කරන ලද ණය යෝජනා ක්‍රම හඳුන්වා දී තිබේ. අපගේ ඉහාම වැදගත් ව්‍යාපාරික අංශය සුළු බැංකුකරණය,ව්‍යවසායික බැංකුකරණය හා ක්ෂුද්‍ර මූල්‍ය සේවාවලින් සමන්විත වෙයි.

කර්මාන්තයේ පුරෝගාමියෙකු මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ අංශය වෙත වැඩිම ණය ප්‍රමාණයක් ලබා දෙන මූල්‍ය ආයතනය වශයෙන් සියලු දෙනාට ලබාගත හැකි අනුපාතික පවත්වා ගනිමින් මූල්‍ය පහසුකම් ලබා දීම තුළින් දිවයින පුරාම ආර්ථික කටයුතු සංවර්ධනය කිරීමේ රජය සතු ජාතික න්‍යායපත්‍රයට සහාය දීම වෙනුවෙන් අපගේ මෙහෙයුම් සකසා තිබේ. ශ්‍රී ලාංකික ජාතියේ තිරසාර ආර්ථික වර්ධනය සඳහාද මෙමගින් සහායක් ලැබේ.

9 ඉලක්කය

කර්මාන්තය, නවෝත්පාදනය සහ යටිතලපහසුකම්

ගනුදෙනුකාර හවතුන් වෙත අසීමිත ඩිජිටල් බැංකු අත්දැකීමක් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ බැංකුකරණ හා මූල්‍ය සේවා ජාත්‍යන්තර මට්ටමේ ඩිජිටල් කරළියක් වෙත ඔසවා තැබීම සඳහා අපගේ ඩිජිටල්කරණ මෙහෙයුම් මගින් මග පෑදෙනු ඇත. 2020 වසර වන විට වැඩියෙන්ම ඩිජිටල්කරණයට ලක් වූ බැංකුව බවට පත් වීමේ ගමන් මගේදී ඩිජිටල් මධ්‍යස්ථාන ආරම්භ කිරීම බැංකුවක් වශයෙන් වැදගත් ඉදිරි පිම්මකි.

ශ්‍රී ලංකා රජය මෙන්ම තවත් වැදගත් රාජ්‍ය ආයතන රැසක් සඳහා ණය ලබා දෙන ප්‍රධානතම බැංකුවක් වශයෙන් ජාතික යටිතලපහසුකම් සංවර්ධනය වෙනුවෙන් අප ඉතාම වැදගත් දායකත්වයක් ලබා දෙමින් ඇත.

මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ අප විසින් මාර්ග සංවර්ධනය, විදුලිබල සංවර්ධන සහ වාරිමාර්ග ව්‍යාපෘති සඳහා රු. බිලියන 93.6 ක මුදලක් ලබා දී ඇති අතර මෙරට ජාතික යටිතලපහසුකම් සංවර්ධනය වෙනුවෙන් එමගින් සෘජුවම දායකත්වය ලබා දී ඇත.

10 ඉලක්කය

අසමානතා අඩු කිරීම

සමාජයේ සෑම මට්ටමක්ම වෙනුවෙන් මූල්‍ය සේවා ලබා දෙමින් අපගේ ගනුදෙනුකාර හවතුන්ගේ සමාජ-ආර්ථික අනාගත වර්ධනය ඉහළ නැංවීමටද අපි කටයුතු කළෙමු.

11 ඉලක්කය

තිරසාර නගර සහ ප්‍රජාවන්

අපි අපගේ ආයතනික සමාජ මෙහෙවර වැඩසටහන් හරහා තිරසාර ප්‍රජාවන් ගොඩ නැගීමට සහාය වන්නෙමු. 2017 වසර තුළ ආයතනික සමාජ මෙහෙවර වැඩසටහන් වෙනුවෙන් අප සිදු කළ ආයෝජන මෙහි පිටු අංක 187 හි දැක්වේ.

12 ඉලක්කය

වගකීම්සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය

අපගේ යාම් අවම කිරීම, ඊ-අපද්‍රව්‍ය හා කඩදාසි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම වැනි ක්‍රියාමාර්ග හරහා අපගේ මෙහෙයුම්වලින් සිදු විය හැකි සෘජු පාරිසරික බලපෑම අවම කිරීමට අපි කටයුතු කරන්නෙමු.

13 ඉලක්කය

පාරිසරික ක්‍රියාදායමය

අපගේ මෙහෙයුම් නිසා පරිසරයට මුදා හැරිය හැකි කාබන් ප්‍රමාණය අවම කිරීම සඳහා අපගේ සියලුම අංශ ආශ්‍රිතව කාබන් කළමනාකරණ සැලසුම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම ඇතුළත් තුන් අවුරුදු ව්‍යාපෘතියක් අප විසින් දියත් කර තිබේ.

14 ඉලක්කය

ජලජ ජීවිත සංරක්ෂණය

සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම සහ පරිසර සංරක්ෂණ ක්‍රියාකාරකම් හරහා ජලාශ්‍රිත ජීවී පද්ධති සංරක්ෂණය කිරීමටද අපි වක්‍රාකාරයෙන් සහාය දක්වන්නෙමු.

15 ඉලක්කය

මිහිමත දිවිය

ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම සහ පරිසර සංරක්ෂණ ක්‍රියාකාරකම් හරහා මිහිමත ජෛව පද්ධති සංරක්ෂණය කිරීමටද අපි සහාය දක්වන්නෙමු.

16 ඉලක්කය

සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන

සවිමත් ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක්, විචක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රමවේද යොදා ගැනීම සහ කාර්යක්ෂම හා සාර්ථක නිරීක්ෂණ පද්ධති ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික යහපාලනය පවත්වා ගැනීම සහතික කිරීමට අපි කටයුතු කරන්නෙමු. අපගේ ව්‍යාපාරික පරිචයන්හි විනිවිදභාවය පවත්වා ගැනීමට සහායක් ලැබෙන පරිදි විවිධ අක්‍රමිකතා වාර්තා කිරීමට උපකාරී වන whistle-blowing ප්‍රතිපත්තියක් අප සතු ය.

සේවකයන්ට තම දුක්ගැනවිලි ප්‍ර.වි.නි./ කළමනාකාර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමට ඉඩ සලසන විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීම අපගේ මීළඟ අරමුණකි.

17 ඉලක්කය

ඉලක්ක වෙනුවෙන් ඇතිකර ගන්නා හවුල්කාරිත්වයන්

රජයේ ආයතන, ජාත්‍යන්තර ආයතන සහ ලොව පුරා අපට සම්බන්ධ විය හැකි බැංකු සමග සුහදශීලී සබඳතාවක් පවත්වා ගැනීමට අපි කටයුතු කරන්නෙමු.

පාර්ශ්වකරුවන් සමග සබඳතා

ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය



නිර්මාණය කරනු ලබන වටිනාකම් අපේක්ෂිත තුලනයකින් යුතුව බෙදාහැරීම සඳහා අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ සාධාරණ අභිලාෂ සලකා බලමින් ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා අප විසින් විස්තීර්ණ ක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබේ. මේ නිසා, සෑම පාර්ශ්වකාර කණ්ඩායමක්ම සමග කටයුතු කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් අප සතුව පවතින අතර අපගේ ව්‍යාපාරික ආකෘතිය වැඩිදියුණු කිරීමටත්, නවෝත්පාදනය ඉහළ නැංවීමටත් මෙන්ම අපගේ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලිය සඳහා ප්‍රධාන ආදාන ලබා දීමටත් එමගින් හැකියාව ලැබේ.

පාර්ශ්වකරුවන් හඳුනාගැනීම

අපගේ බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම් සම්බන්ධයෙන් උනන්දුවක් ඇති ආයතන හෝ තනි පුද්ගලයන් වන අපගේ පාර්ශ්වකරුවන් අපගේ මෙහෙයුම්වල බලපෑමට ලක් වීමට මෙන්ම ඒ කෙරෙහි බලපෑමක් එල්ල කිරීමටද හැකියාව තිබේ. මේ අනුව අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ ගනුදෙනුකරුවන්, සේවකයන්, සේවක වෘත්තීය සමිති, ව්‍යාපාරික හවුල්කරුවන්, ආයෝජකයන්, දේශීය ප්‍රජා, රජය හා නියාමන ආයතන සහ අපගේ මෙහෙයුම් පරිසරයයි.

සම්බන්ධිත පාර්ශවයන් හඳුනාගැනීම සහ අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීම

පාර්ශ්වකරුවන් ප්‍රමුඛතාවන්ට ලක් කිරීම තුළින් ඔවුන් සමග අපට ඇති ක්‍රියාකාරිත්වය හඳුනාගැනීමට හැකියාව ලැබේ. ඒ ඒ පාර්ශ්වකාර කාණ්ඩය සතුව අපගේ මෙහෙයුම් වෙත බලපෑම් එල්ල කිරීමට ඇති බලය මෙන්ම අප සමූහයේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි ඔවුන් දක්වන උනන්දුව සැලකිල්ලට ගනිමින් ඔවුන්ගෙන් අපට ඇති සාපේක්ෂ වැදගත්කම මත පදනම්ව එය සිදු කරනු ලැබේ.

පාර්ශ්වකරුවන් සමග සබඳතා

පාර්ශ්වකරුවන් ප්‍රමුඛතාවට ලක් කිරීම සිදු කිරීමෙන් අතුරුව ඔවුන්ගේ අවශ්‍යතා, අභිලාෂ සහ අපේක්ෂා හඳුනාගැනීම සඳහා ඔවුන් හා දීර්ඝ කාලීන සංවාදයක නිරත වීමට අපි කටයුතු කරමු. අපගේ උපායමාර්ගික අරමුණු ආශ්‍රිත ස්ථීර වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී එකී තොරතුරු අතිශයින් වැදගත් වෙයි. අප සමූහයේ තිරසාර වර්ධනය කෙරෙහි දායක වෙමින් වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය උපරිම මට්ටමකට ගෙන ඒමට හේතු වන අංශ ආමන්ත්‍රණය කිරීම සඳහා වැදගත් තීරණ අප විසින් ගනු ලැබේ.

සවන්දීම හා තක්සේරු කිරීම

අපගේ පාර්ශ්වකරුවන් සතු විවිධ අභිලාෂ හා අපේක්ෂා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතිකර ගනු පිණිස ඔවුන් හා සමීපව කටයුතු කිරීම තුළින් හඳුනාගත් ගැටළු හා අනෙකුත් සලකා බැලිය යුතු කරුණු තක්සේරු කිරීමට අපි පියවර ගන්නෙමු. අපගේ තිරසාරතා ප්‍රතිඵල උදාකර ගැනීමට එය උපකාරී වෙයි.

ප්‍රධාන පාර්ශ්වකාර කාණ්ඩ සමඟ අප පවත්වන සබඳතා සහ වසර සඳහා හඳුනාගන්නා ලද අභිලාෂ පහත වගුවෙන් දැක්වේ:

සබඳතා පැවැත්වීමේ ක්‍රමය	සබඳතා පැවැත්වීමේ ශිෂ්‍රතාව	ඉස්මතු වූ ප්‍රධාන මාතෘකා	එකී කාරණා සඳහා අප සමාගම ප්‍රතිචාර දැක්වූ අයුරු
කොටස් හිමියන්			
වාර්ෂික මහා සභා රැස්වීම	වාර්ෂිකව	• ගතවූ මූල්‍ය වර්ෂයේ කාර්යසාධනය සමාලෝචනය කිරීම • මූල්‍ය තොරතුරු හා හෙළිදරව්වු කිරීම් • ඉපයීම් ආශ්‍රිත තිරසාර වර්ධනය • සාර්ථක ආයතනික පාලන පරිචයන් • අවදානම් කළමනාකරණය • ආයතනික තිරසාරතාව • අනාගත පෙරදැක්ම හා වර්ධන අවස්ථා • සමූහයට අදාළ ප්‍රවත් හා වත්මන් කාර්යයන් පිළිබඳ තොරතුරු හා යාවත්කාලීනයන්	වාර්ෂික වාර්තාව, කාර්තුමය මූල්‍ය ප්‍රකාශන ආදිය කොටස් හිමියන්ට ලබාගත හැකි පරිදි නිසි කලට ප්‍රකාශයට පත් කිරීම. අපගේ කාර්යසාධනය, අවදානම් කළමනාකරණය, වත්කම්වල ගුණාත්මකභාවය සහ තිරසාරතාව වැනි කාරණා සම්බන්ධ සවිස්තර තොරතුරු නිසි කලට ලබා දීම. වෙබ් අඩවිය කලින් කලට යාවත්කාලීන කිරීම සහ නවතම ආයතනික ප්‍රවත් සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා ආදිය නිකුත් කිරීම.
ගනුදෙනුකරුවන්			
සබඳතා කළමනාකරණය	සිදු කෙරෙමින් පවතී	• සේවා පහසුවෙන් ලබාගත හැකි බව • සේවාවන්හි ගුණාත්මකභාවය • පහසුව හා ප්‍රවේශය • නවෝත්පාදනයන් • තොරතුරුවල රහස්‍යභාවය	තොරතුරු ලබා දීම සඳහා අප විසින් පාරිභෝගික ඇමතුම් මධ්‍යස්ථානයක් සහ ආයතනික වෙබ් අඩවිය පිහිටුවා තිබේ. එසේම, පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා පුළුල් ජාලයක්ද අප විසින් පිහිටුවා තිබේ. පාරිභෝගිකයන් වෙත අති නවීන නිපැයුම් ලබා දීම සඳහා ඩිජිටල් ශාඛා සහ නවෝත්පාදනාත්මක මධ්‍යස්ථානයක්ද පිහිටුවා ඇත.
තෘප්තිමත්භාව සමීක්ෂණ	සිදු කෙරෙමින් පවතී		
ගනුදෙනුකාර ජාලගතකරණය	සිදු කෙරෙමින් පවතී		
ආයතනික වෙබ් අඩවිය	සිදු කෙරෙමින් පවතී		
සේවකයන්/වෘත්තිය සමිති			
කාර්යසාධන ඇගයීම්	වාර්ෂිකව	• විනිවිදභාවයෙන් යුතු, සාධාරණ හා ආකර්ෂණීය වැටුප් හා ගෙවීම් • නිපුණතා සංවර්ධන අවස්ථා • වෘත්තීය ප්‍රගතිය • සේවාස්ථාන සුරක්ෂිතතාව • ශ්‍රමිකයන්ගේ අභිමානය සුරැකීම	සේවකයන් සඳහා අඛණ්ඩ පුහුණුව ලබා දීම, වෙනස්වීම්වලට ලක් වන හා දිරිමත් කරන සුළු සේවා පරිසරයක් ලබා දීම, කර්මාන්තයේ සම්මතයන්ට ගැලපෙන ආකර්ෂණීය වැටුප්, ආයතනික වටිනාකම් අනුගමනය කිරීම සඳහා සේවකයින් පෙළඹවීම.
සාමූහික කේවල් කිරීම			
බහු මට්ටම් කාර්ය මණ්ඩලය රැස්වීම්	සිදු කෙරෙමින් පවතී		
කාර්ය මණ්ඩලය දිශානුගත කිරීම	සිදු කෙරෙමින් පවතී		
පුහුණු වැඩසහෙන්	සිදු කෙරෙමින් පවතී		
සමූහ අභ්‍යන්තර ජාලය හා විද්‍යුත් තැපෑල	සිදු කෙරෙමින් පවතී		

සබඳතා පැවැත්වීමේ ක්‍රමය	සබඳතා පැවැත්වීමේ ශ්‍රිෂ්ඨතාව	ඉස්මතු වූ ප්‍රධාන මාතෘකා	එකී කාරණා සඳහා අප සමාගම ප්‍රතිචාර දැක්වූ අයුරු
නියාමන/නෛතික ආයතන			
පරිශ්‍රය තුල සිදු වන ප්‍රවීක්ෂණය	සිදු කෙරෙමින් පවතී	• නියාමන අනුකූලතාව • ආයතනික පාලනය • අවදානම් කළමනාකරණය • තිරසාර ව්‍යාපාරික පරිචයන්	අදාළ තොරතුරු හා වාර්තා නිසි කලට ඉදිරිපත් කිරීම, අධිකාරීන් සමග විවෘත සංවාදයක් පවත්වා ගැනීම, කර්මාන්තයේ සංවර්ධනයට දායක වීම.
නියාමන වාර්තාකරණය	වාර්ෂිකව කාර්තුවකට වරක්, මාසිකව		
කර්මාන්ත ෆෝරම හා රැස්වීම්	සිදු කෙරෙමින් පවතී		
මාධ්‍ය නිවේදන	සිදු කෙරෙමින් පවතී		
සැපයුම්කරුවන්			
සැපයුම්කරුවන් පිළිබඳ සමීක්ෂණ	සිදු කෙරෙමින් පවතී	• ගනුදෙනු කටයුතුවල පහසුව • වටිනාකම් එකතු කිරීම හා සැපයුම්කරුවන් සංවර්ධනය • දීර්ඝ කාලීන සබඳතා • සේවාවන්හි ගුණාත්මකභාවය	අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ උදා කරන දීර්ඝ කාලීන සබඳතා ඇතිකර ගැනීම, තිරසාර හා ආචාර ධාර්මික පරිචයන් ප්‍රවර්ධනය කිරීම, නිසි කලට ගෙවීම් සිදු කිරීම, සැපයුම්කරුවන්ගේ පසුප්‍රතිචාර ලබා දීම, සේවා ප්‍රමිතීන් නිරීක්ෂණය කිරීම.
සැපයුම්කරුවන් සමග සබඳතා	සිදු කෙරෙමින් පවතී		
පරිශ්‍ර වෙත ගමන් කිරීම හා රැස්වීම්	සිදු කෙරෙමින් පවතී		
ප්‍රජාවන්			
ප්‍රජාවන් සමග කටයුතු කිරීම		• රුකියා අවස්ථා නිර්මාණය කිරීම • අනුග්‍රාහකත්ව හා සංවර්ධනය ක්‍රියාදාමයන්ට සහාය දැක්වීම • ව්‍යාපාරයේ ආර්ථික හා සමාජයීය බලපෑම්	අධ්‍යාපනය, සෞඛ්‍ය හා යටිතලපහසුකම් සංවර්ධනය තුළින් ප්‍රජාවන්හි ජීවන තත්ත්ව ඉහළ නැංවීම.
මූල්‍ය විනය වර්ධනය කිරීම අරමුණු කරගත් වැඩමුළු			
ප්‍රජා සමීක්ෂණ			

සමාලෝචනය සහ ප්‍රතිචාර දැක්වීම

නිරන්තරයෙන් ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාවලියක් වන පාර්ශ්වකරුවන් සමග සබඳතා පැවැත්වීම මගින් අප හට මෙහෙයුම් පරිසරය තුළ ඇති ප්‍රවණතාවලට පහසුවෙන් අනුගත වීමටත්, පාර්ශ්වකරුවන්ගේ අභිලාෂ හා අපේක්ෂාවන්ට සාර්ථක ලෙස ප්‍රතිචාර දැක්වීමටත් මග පාදයි. මේ නිසා මෙම ක්‍රියාවලිය නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කිරීම හා ප්‍රධාන සංවර්ධනයන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වයට වාර්තා කිරීම අප සමූහයේ තිරසාරතාව පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වේ.

සාපේක්ෂ වැදගත්කම

සාපේක්ෂ වැදගත්කම ඇගයීමේ ක්‍රියාවලිය



අපගේ ව්‍යාපාර සමූහයට සහ කොටස්කරුවන්ට බලපාන වැදගත් කරුණු අප විසින් හඳුනාගනු ලැබේ. කිසියම් කරුණක් වැදගත්වන බවට සලකණු ලබන්නේ එය අපගේ කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන වශයෙන් වූ වටිනාකම් ඇතිකිරීමේ ක්‍රියාවලියට සැලකිය යුතු ආකාරයෙන් වූ බලපෑමක් ඇතිකරන්නේනම් පමණකි.

වැදගත් කරුණු හඳුනාගැනීම සඳහා වැදගත්කම ඇගයීමේ දෑඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කෙරේ. එතෙකුදු වුවත් අපගේ ව්‍යාපාර සමූහයේ වටිනාකම් ඇතිකිරීමේ ක්‍රියාවලිය කෙරෙහි බලපෑහැකි ආකාරයේ වූ සියලුම කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ප්‍රායෝගිකව අපහසුවන බැවින් අප විසින් සලකා බලනුයේ වැදගත්යැයි හඟින කරුණු පමණකි.

කිසියම් කරුණක වැදගත්කම සලකා බලනුයේ එමගින් ව්‍යාපාර සමූහයේ වටිනාකම් ඇතිකිරීමේ ක්‍රියාවලියට සිදුවන බලපෑම මත පදනම්ව වන අතරම එවැනි කරුණක් සිදුවීමේ සම්භාවිතාවය මෙන්ම එම බලපෑමේ විශාලත්වය ද අනුවය. වැදගත්කම සලකා බලනු ලබන්නේ ව්‍යාපාර සමූහය සහ කොටස්කරුවන් ඒ පිළිබඳව දරන ආකල්පය මත වේ.

අපගේ ව්‍යාපාර සමූහයට වැදගත්වන ප්‍රස්තුතයන් හඳුනාගනු ලබන්නේ කොටස්කරුවන්ගේ කාර්ය නියුතුවීමේ ක්‍රියාවලිය ඔස්සේ වන අතර අනතුරුව GRI මාර්ගෝපදේශයන් මත පදනම්ව ඒවා ද්විමාන වැදගත්කම් න්‍යාසයකින් ඉදිරිපත් කෙරේ. උද්‍යෝගී මෙහෙයුම් පරිසරයක් අඛණ්ඩව පවත්වාගැනීමත් අපගේ කොටස්කරුවන්ගේ ප්‍රමුඛතාවයන්ට සහ අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයටත් මෙම වැදගත්කම් ලැයිස්තුව වාර්ෂිකව යාවත්කාලීන කෙරේ.

වාර්තාවේ අන්තර්ගතයන් තීරණය කිරීමේ ක්‍රියාවලියේ දී හඳුනාගත් වැදගත්කම් මාතෘකාවන්

		වැදගත් කරුණු	අනුරූපී GRI අවශ්‍යතාවය	අදාළවන උපායමාර්ගික අධාරකය	GRI දර්ශකය	පිටු යොමුව
ඉහා වැදගත්	1	මූල්‍ය කාර්යසාධනය	ආර්ථිකමය කාර්යසාධනය	මෙහෙයුම් විශිෂ්ටතාවය	EC – 1	173
	2	පාරිභෝගික අත්දැකීම	පාරිභෝගික පෞද්ගලිකත්වය	පාරිභෝගික කේන්ද්‍රියත්වය	PR 8	184
	3	කුසලතා හා කළමනාකරණය	රැකියා, කම්කරු කළමනාකරණය/සබඳතාවයන්, පුහුණුව හා සංවර්ධනය, පුරුෂයන්ට සහ කාන්තාවන්ට සමාන වැටුප් ශ්‍රම පරිචයන්, දුක්ගැනවිලි යාන්ත්‍රණය	ඵලදායී සේවක සහභාගිත්වය	LA 4 LA 9 LA 13 LA 16	163-167
	4	සේවක ඵලදායීතාවය		ඵලදායී සේවක සහභාගිත්වය		158
	5	මෙහෙයුම් කාර්යක්ෂමතාවය		මෙහෙයුම් විශිෂ්ටතාවය		126-132
	6	සමාජ-ආර්ථික බලපෑම්	වෙළඳපල පැවතීම, වක්‍ර ආර්ථික බලපෑම්	යහපත් පරිපාලනය	G4 – 8	179
	7	අවදානම සහ සංස්ථාපිත පරිපාලනය		යහපත් පරිපාලනය		33-100
	8	තාක්ෂණය		මෙහෙයුම් විශිෂ්ටතාවය		134
	9	අනුකූලතාවය	නිෂ්පාදන වගකීමේ අනුකූලතාවය	යහපත් පරිපාලනය	PR 4	178
මධ්‍යම කාලීන	10	අපගේ මෙහෙයුම්වල පාරිසරික බලපෑම්	ශක්තිය, භාණ්ඩ හා සේවාවන්	යහපත් පරිපාලනය	EN 27	190-191
	11	වගකීම් සහගත ණය දීම		යහපත් පරිපාලනය		179
	12	දූෂණ විරෝධී බව		යහපත් පරිපාලනය	SO 4 SO 5	168
වැදගත් මධ්‍යම කාලීන	13	මානව හිමිකම්	අසාධාරණ ලෙස නොසැලකීම, රැස්වීමේ සහ සාමූහිකව කේවල් කිරීමේ නිදහස	යහපත් පරිපාලනය	HR 03 HR 04	165-167
	14	සැපයුම්කරුගේ වටිනාකම		මෙහෙයුම් විශිෂ්ඨත්වය	G4 – 12	186
	15	වෙළඳපල සන්නිවේදනය	අලෙවි සන්නිවේදනයන් භාණ්ඩ හා සේවා ලේබල් කිරීම	පාරිභෝගික කේන්ද්‍රියත්වය	PR 3 PR 4	178

කොටස්කරුවන්ට තිබෙන වැදගත්කම
ඉතා ඉහළ
ඉහළ
මධ්‍යස්ථ
1,2,3,4,5,6,7,8,9
10,11,12
13,14,15
මධ්‍යස්ථ
ඉහළ
ඉතා ඉහළ
ආයතනයට තිබෙන වැදගත්කම

වටිනාකම් ඇතිකිරීම හා ප්‍රාග්ධනය සැකසීම

126 / මූල්‍ය ප්‍රාග්ධනය
151 / නිෂ්පාදිත ප්‍රාග්ධනය
153 / බුද්ධිමය ප්‍රාග්ධනය
157 / මානව ප්‍රාග්ධනය
171 / සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
189 / ස්වභාවික ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂීතාවයන්

දළ ආදායම
රු. බිලියන
190
ඉක්මවීම

පූර්ණ මෙහෙයුම් ආදායම,
කර්මාන්තමය වශයෙන් උපරිමයට පත්වීම

බැංකු සහ ව්‍යාපාර සමූහය යන දෙයාකාර මට්ටම් හි **බදු පෙර සහ බදු පසු ලාභය මෙතෙක් පැවති ඉහළම තත්ත්වයට පත්වීම**

පාරිභෝගික තැන්පතු වර්ධනය
16.6%ක
පාලිත තත්ත්වයට පත්වීම

පාරිභෝගික අත්තිකාරම් වර්ධනය
12.8%ක
පාලිත තත්ත්වයට පත්වීම

2010 වසරේ සිට නිකුත් කළ ව්‍යාපාරවස්තු මත වූ ලාභාංශයන් 20%ක් පවත්වාගත් **ශ්‍රී ලංකාවේ එකම මූල්‍ය ආයතනය**

අපගේ මූල්‍ය ප්‍රාග්ධනය වටිනාකම් ඇතිකිරීමේ ක්‍රියාවලිය



මූල්‍ය ප්‍රාග්ධන කළමනාකරණය

අපගේ මූල්‍ය ප්‍රාග්ධනය මගින් ලබන පෙළඹවීමෙන් ධරණීය වර්ධනයක් අත්කරගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ අප සිටින ස්ථානය පවත්වාගැනීමට අපි අනවරතව කටයුතු කරන්නෙමු. ලාභාංශ ඉපැයීම, ව්‍යවසාය පාලනය වර්ධනය කිරීම, ව්‍යාපාරවස්තු සහ ණය නිකුතුව ඉහළ නැංවීම මගින් අපගේ කොටස්කරුවන්ගේ වටිනාකම වර්ධනය කිරීම වෙනුවෙන් විචක්ෂණශීලී උපායමාර්ගයන් යොදාගනිමින් අපගේ මූල්‍ය ප්‍රාග්ධනය ඉහළ නැංවීමට අපි උත්සහ දරන්නෙමු.

2017 වසර අපගේ බැංකුවට සුවිශේෂී වසරක් වූයේ අපගේ දළ ආදායම පසුගිය වසරට වඩා 31.4%ක වර්ධනයක් ලබමින් රුපියල් බිලියන 190.2ක් වාර්තාවීමෙන් සහ සමස්ත මෙහෙයුම් ආදායම 15.2%කින් වර්ධනය වී රුපියල් බිලියන 78.8ක් වශයෙන් ක්ෂේත්‍රයේ ඉහළම තත්ත්වයට පත්වීමෙනි. මෙහෙයුම් ව්‍යවසායිනි වර්ධනය පසුගිය වසරට වඩා 4.9%ක් විය.

වසර තුළ අපගේ සුවිශේෂී කාර්යසාධනය මගින් දැක්වෙන්නේ අභියෝගයන් මධ්‍යයේ වුවද බැංකුව සතු වූ ශක්තිය සහ ඉහළ කාර්යසාධන තත්ත්වයක් සඳහා අපගේ නිබෙන ප්‍රබල ක්‍රියාකාරිත්වයයි. අපගේ සාර්ථකත්වය වෙනුවෙන් සෑම අංශයකම මහජන බැංකු කණ්ඩායම විසින් කරන ලද සාමූහික ප්‍රයත්නයේ දායකත්වය අපගේ සාර්ථකත්වයට හේතුවිය.

සමස්ත මෙහෙයුම් ආදායම

	2017 රු. බිලියන	2016 රු. බිලියන	2015 රු. බිලියන	2014 රු. බිලියන	2013 රු. බිලියන
සමස්ත මෙහෙයුම් ආදායම	**78.8**	68.4	67.6	54.3	55.6
- ශුද්ධ පොළී ආදායම	**62.7**	53.6	54.3	40.0	45.0
- පොළී නොවන ආදායම	**16.1**	14.8	13.3	14.3	10.6
NIM-%					
- ඒකාබද්ධ	**4.1%**	3.9%	4.5%	3.7%	4.5%
- බැංකුව	**3.6%**	3.5%	4.0%	3.1%	4.1%

2017 වසරේ දී බැංකුවේ සමස්ත මෙහෙයුම් ආදායම ක්ෂේත්‍රයේ ඉහළම තත්ත්වය වූ රුපියල් බිලියන 78.8ක් වූයේ 2016 වසරේ එම ආදායම වූ රුපියල් බිලියන 68.4 සමග සැසඳීමේ දී 15.2%ක වර්ධනයක් වාර්තා කරමිනි. ව්‍යාපාර සමූහයේ මෙහෙයුම් ආදායමෙන් 80%ක් බැංකුවේ මෙහෙයුම් ආදායමෙන් සමන්විත විය.



ශුද්ධ පොළී ආදායම

බැංකුවේ බැංකුකරණ මෙහෙයුම්වල ප්‍රධාන අංගයවන ශුද්ධ පොළී ආදායම සමස්ත මෙහෙයුම් ආදායමෙන් 80%ක් පමණ විය. ශුද්ධ පොළී ආදායම පසුගිය වසරට වඩා 17.1%කින් වර්ධනය වී 2017 වසරේ දී රුපියල් බිලියන 62.7ක් වූයේ 2016 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 53.6ට සාපේක්ෂ වශයෙනි. ශුද්ධ පොළී ආදායමේ එක් එක් අංගයන් පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

පොළී ආදායම

පොළී ආදායම 2017 වසරේ දී රුපියල් බිලියන 173.8ක් වශයෙන් 34.0% ක වර්ධනයක් විය. මේ සඳහා විශාල වශයෙන් හේතුවූයේ 12.8%කින් වැඩි වූ පාරිභෝගික අත්තිකාරම් සහ පොළී උත්පාදක වත්කම්වලින් ඉහළ සාමාන්‍යයක වූ ලැබීම්ය. 2016 වසරේ දී 10.2%ක් වූ පොළී උත්පාදක ලැබීම් සමග සසඳන කල සමාලෝචිත වසරේ දී එය 12.1%කින් ඉහළ යාමෙන් පසුගිය වසරට වඩා 18.0%ක වර්ධනයක් පෙන්වන ලදී. මෙම ඉහළ ලැබීම් සඳහා ප්‍රධාන වශයෙන්ම පාදක වූයේ 2017 මුදල් වර්ෂයේ පළමු අර්ධයෙහි පැවතුනු ඉහළ පොළී අනුපාත පරිසරයයි.

සමස්ත පොළී ආදායමෙන් 80%ක් පමණ පාරිභෝගික අත්තිකාරම්වලින් ලැබුණු අතර රජයේ සුරැකුම් ද ඇතුළත් අනෙකුත් ආයෝජනයන්ගෙන් ඉතිරි කොටස සමන්විත විය.

පොළී වියදම්

වාරික තැන්පතුවලින් 2017 වසර තුළ දී ප්‍රේරිත "ඉහළ වියදම" නිසාවෙන් පොළී වියදම 45.9%ක් වූ අධික වේගයකින් වර්ධනය විය. කෙසේ වෙතත් මෙය ඉහළ යන පොළී අනුපාත වටපිටාවක දී සාමාන්‍ය සංසිද්ධියකි. ඊට අමතර වශයෙන් පාරිභෝගික අත්තිකාරම්වලට සාපේක්ෂව වාරික තැන්පතුවල සිදු වූ වේගවත් නැවත මිලකිරීම් ද පොළී වියදම් ඉහළ යාමට බලපෑවේය. මෙසේ වූයේ ව්‍යාපාර සමූහයේ 90%කට අධික වාරික තැන්පතු වසරකට වඩා අඩු කල්පිරීමේ තත්ත්වයක් සහිත වීමයි.

සමස්ත පොළී වියදම්වලින් තැන්පතු සම්බන්ධයෙන් වූ වියදම 90%ක් පමණ වූ අතර ඉන් 50%ක් පමණ සමන්විත වූයේ වාරික තැන්පතුවලිනි.

අරමුදල් යෙදවීම් අංශයෙහි එකතුවෙන් 85%ක් තැන්පතු වූ අතර ඉන් 60% ක් ස්ථාවර තැන්පතු විය. 2017 වසර තුළ දී ජාල පදනමින් යුතු නව තැන්පතු සඳහා ව්‍යාපාර සමූහය විසින් සාර්ථකව රුපියල් බිලියන 185.8ක් යොදවන ලදී. ස්ථාවර තැන්පතු රුපියල් බිලියන 137.8කින් වර්ධනය වූ අතර එය තැන්පතු වර්ධනයෙන් හතරෙන් තුනක් විය.

2016 වසරේ දී 3.9%ක්ව පැවති ශුද්ධ පොළී සීමාව එම සීමාවන් සඳහා පීඩනයක් සහිත වූ වසරක් තුළ දී ව්‍යාපාර සමූහය විසින් සාර්ථක ලෙස 4.1% ක් දක්වා වර්ධනය කරන ලදී. මෙය සිදුවූයේ ව්‍යාපාර සමූහය මගින් අනුගමනය කළ කාර්යක්ෂමව මිල කිරීමේ උපායමාර්ගය මගිනි. බැංකුවේ මට්ටමින් 2016 දී පැවති 3.5%ක් වූ පොළී සීමාව 2017 දී 3.6%ක් දක්වා වර්ධනය විය. සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා ජංගම ගිණුම් ඉතිරිකිරීමේ ගිණුම්(CASA) අනුපාතය, පැවතුනු පොළී පීඩනයන් බැංකුවේ මට්ටමින් සෑහෙන ප්‍රමාණයක් සුමට කරන ලදී.



පොළී නොවන ආදායම්

ගාස්තු සහ කොමිස් ආදායමත් වෙළඳ ආදායම් සහ අනෙකුත් මෙහෙයුම් ආදියෙන් පොළී නොවන ආදායම සමන්විත වේ. බංකුවේ සහ ව්‍යාපාර සමූහයේ වැඩිමනත් වර්ධනය සඳහාවන ප්‍රධාන අවධානය යොමු කළයුතු ක්ෂේත්‍රයක් ලෙස මෙය පවතී.

වසර 2016 දී පැවති රුපියල් බිලියන 14.8 සමග සැසඳීමේ දී පොළී නොවන ආදායම 2017 වසරේ රුපියල් බිලියන 16.1ක් දක්වා 8.6%කින් වර්ධනය විය. මෙයින් ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 2016 වසරේ පැවති රුපියල් බිලියන 4.2 සමග සැසඳීමේ දී ශුද්ධ පොළී නොවන ආදායමෙන් තුනෙන් එකක් වශයෙන් රුපියල් බිලියන 5.5ක් දක්වා 32.5%කින් වර්ධනය විය. මෙම වර්ධනය විමට බලපෑ සංයුක්ත කරුණු අතර ජංගම සහ ජංගම නොවන තැන්පතුවලට අදාළවන තැන්පතු ගාස්තු සුමට කිරීමට හේතු වූ අභ්‍යන්තර ක්‍රියාවලින්හි සිදුකළ වර්ධනය, ඉහළ වෙළඳ මූල්‍ය පරිමාවන්, බැංකුවේ ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතය ඉහළ යාම සහ 2017 වසරේ දී ස්වයං බැංකුකරණ ක්‍රමවේදයන් පිළිබඳව වර්ධනය වූ ජනප්‍රියත්වය ද ඇතුළත් වේ.

සමස්ත පොළී නොවන ආදායමෙන් 20%ක් වූ ශුද්ධ ලාභයන් පසුගිය වසරේ පැවති රුපියල් බිලියන 2.8 සිට 2017 වසරේ දී 3.7%ක පසුබෑමක් සටහන් කරමින් රුපියල් බිලියන 2.7ක් විය. මීට මූලික වශයෙන්ම හේතුවූයේ සමාලෝචිත මුදල් වර්ෂය ඇතුළත අවම වශයෙන් මාස 6ක පමණ කාලයක් සඳහා විදේශ මුදල් වෙළඳාම සම්බන්ධයෙන් පනවන ලද නියාමන සීමාකිරීමය. සමස්ත වෙළඳ ආදායමෙන් සාමාන්‍යයෙන් 90%ක් වූ විදේශ විනිමය වෙළඳාම 2016 වසරේ පැවති රුපියල් බිලියන 2.6ක් වූ ප්‍රමාණය 18.0%කින් පහත වැටී රුපියල් මිලියන 2.1ක් විය.

වෙනත් මෙහෙයුම් ආදායම් 2016 වසරේ පැවති රුපියල් බිලියන 7.8ක ප්‍රමාණය 0.3%ක් වූ ඉතා සුළු වර්ධනයක් සහිතව රුපියල් බිලියන 7.9ක් විය. වෙනත් මෙහෙයුම් අදායම බැංකුවේ රක්ෂණ ව්‍යාපාරයෙන් උපයාගත් වාරික මුදලින් සහ අයහපත් ණය ආපසු අයකරගැනීම්වලින් ද සමන්විත වේ.

හානිවීම් ගාස්තු

පෙර වසරේ පැවති රුපියල් බිලියන 1.4ක් වූ හානිවීම් ගාස්තු සමග සැසඳීමේ දී 2017 වසරේ දී 221%ක වර්ධනයක් ලබමින් රුපියල් බිලියන 4.4ක් විය. පෙර වසරවල දී නිබුණු සුපරීක්ෂාකාරී සූදානම සහ වත්කම් තත්ත්වයන්හි මෙන්ම හානි ප්‍රතිපූර්ණ අනුපාතිකයන්හි ද පොදු වර්ධනය ද හේතුවෙන් 2016 වසරේ හානිවීම් ගාස්තු සාපේක්ෂව අවම විය.

වත්කම් තත්ත්වයන්හි අසතුටුදායක විමත් අපේක්ෂිත හානිවීම් අනුපාතයන් ඉහළ යාමත් යන කර්මාන්තයේ පොදු තත්ත්වයන් 2017 වසරේ ඉහළ ගාස්තු තත්ත්වයක් පෙන්නුම් කරයි. සමස්ත වර්ධන ප්‍රමාණයෙන් 90%කට වැඩි ප්‍රමාණයක් ආපසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවයන් සහ පැහැරහැරීම් මගින් සිදුවන හානි ප්‍රමාණයන් සාමූහික සුපරීක්ෂකත්වය මගින් වැළැක්වීම විදහාපායි. බැංකුවේ මට්ටමින්, සමස්ත ණය ප්‍රමාණයට අනුව දළ අක්‍රිය ණය ප්‍රමාණය අනුව වත්කම් තත්ත්වය මැනීමේ අගය 1.9%ක පවත්වාගත් අතර ව්‍යාපාර සමූහය මට්ටමින් එය 2016 දී වාර්තා වූ 1.9% සිට 2.0%ක් දක්වා වර්ධනය විය.

බැංකුව සහ ව්‍යාපාර සමූහය යන දෙයාකාරයෙන්ම පවත්වාගත් සූදානම්වීමේ ප්‍රතිපත්තිය දිගින්දිගටම සුපරීක්ෂාකාරී වීමෙන් ක්ෂේත්‍රයට අදාළව ආවරණ මට්ටම් 2017 මුදල් වර්ෂය අවසානයේ දී පිළිවෙලින් 97.5%ක් සහ 92.7%ක් වශයෙන් දැක්විනි.



වියදම් කළමනාකරණය

2016 වසරේ දී රුපියල් බිලියන 35.5ක් වූ සමස්ත මෙහෙයුම් වියදම් 2017 වසරේ දී 4.9%කින් වර්ධනය වී රුපියල් බිලියන 37.2ක් විය. දැනට ක්‍රියාත්මකව පවතින වියදම් කාර්යක්ෂමතාවන්හි ඵලදායිතාවය මෙයින් දැක්වේ.

සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම සමස්ත මෙහෙයුම් වියදමෙන් 50%ක් පමණ විය. බැංකුවේ කාර්ය මණ්ඩල වියදම වගකීම්/විශ්‍රාම සැලසුමට කළ දායකත්වය හැරුණු විට 2016 දී පැවති රුපියල් බිලියන 11.8ක ප්‍රමාණය 9.2%කින් වැඩි වී රුපියල් බිලියන 12.9ක් විය. මෙම වැඩිවීමට මූලික හේතුව වූයේ වසර 2017දී 7.0ක සාමාන්‍යයක් වූ උද්ධමන වර්ධනයයි.

අනෙකුත් මෙහෙයුම් වියදම්

වසර 2016 දී රුපියල් බිලියන 15.2ක ප්‍රමාණය සමග සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ දී අනෙකුත් මෙහෙයුම් වියදම් 18.9%කින් වැඩි වී රුපියල් බිලියන 18.1ක් වූයේය. දළ වශයෙන් මෙම වර්ධනයෙන් තුනෙන් එකක් පමණ නව ස්වයං බැංකුකරණ මධ්‍යස්ථානය දියත් කිරීම සහ ඊට අදාළ වූ දුරකථන සහ වෙළඳපල සහ ප්‍රවර්ධන වියදම් වේ.

ව්‍යාපාර සමූහයේ ආදායමට අනුව වියදම 2016හි පැවති 60.8%ක අගය 56.6% දක්වා වූ දියුණුවක් සටහන් කළේය. බැංකුව මට්ටමින් ආදායමට අනුව වූ වියදම් අනුපාතය 2016හි පැවති 59.9% සිට 2017දී 54.8%ක් වශයෙන් වර්ධනය විය. සැලකියයුතු මට්ටමේ ක්‍රියාවලි කාර්යක්ෂමතාවයක් සහ සේවක පලදායීතාව වර්ධනයට පහසුකම් ඇතිකළ බැංකුවේ ඩිජිටල්කරණ කාර්යය සමගින් කෙටිකාලීන සහ මධ්‍යකාලීන වශයෙන් වැඩිදුරටත් ප්‍රගමනයන් අපේක්ෂා කෙරේ.

එකතුකළ අගය මත බද්ද/ජාතිය ගොඩනැගීමේ බද්ද

2016 දී පැවති රුපියල් බිලියන 6.1ක ප්‍රමාණය 2017 වසරේ දී රුපියල් බිලියන 7.4ක් දක්වා 20%කින් වැඩිවිය.

ලාභදායීත්වය

ප්‍රධාන බැංකුකරණ මෙහෙයුම්වල වර්ධනයන් මූලික වශයෙන් උපකාර වීමෙන් ව්‍යාපාර සමූහයේ බදු පෙර ලාභය වශයෙන් 2016 වසරේ පැවති රුපියල් බිලියන 25.4 සමග සසඳන කල 17.4%ක වර්ධනයක් පෙන්නුම් කරමින් ව්‍යාපාර සමූහයේ මෙතෙක් ලද ඉහළම අගයක් වූ රුපියල් බිලියන 29.9ක් විය.

ව්‍යාපාරවස්තු මත ලැබීම් (ROE) 2016 දී පැවති 22.7% සමග සැසඳීමේ දී 21.4%ක් දක්වා අඩුවිය. බැංකුව මට්ටමින් ගත් කල පෙර වර්ෂයේ පැවති 27.5%ට සාපේක්ෂව 26.6%ක් වීම මගින් 2017 වසර කර්මාන්තයේ තවත් මංසලකුණක් තැබීය. ව්‍යාපාරවස්තු මත ලැබීම් ව්‍යාපාර සමූහය විසින් 2010 වසරේ සිට අඛණ්ඩව 20% සීමාවට ඉහළින් පවත්වාගෙන තිබෙන අතර එය සැලකිය යුතු තත්ත්වයකි.

සාමාන්‍ය වත්කම්වලට අනුව වූ බදු පෙර ලාභය අනුව මැනබැලීමේ දී වත්කම් මත ලැබීම් (ROA) 2017 වසරේ දී 1.9%ක් වශයෙන් පවත්වාගැනිනි.

වසර 2016 දී පැවති රුපියල් බිලියන 18.0ට සාපේක්ෂව පසුබදු ආදායම වසර 2017 දී රුපියල් බිලියන 20.5ක් දක්වා 14.2%කින් ඉහළ ගියේය.

ශේෂපත්‍ර විශ්ලේෂණයි

තැන්පතු වර්ධනය

	2017 රු. බිලියන	2016 රු. බිලියන	2015 රු. බිලියන	2014 රු. බිලියන	2013 රු. බිලියන
ජංගම හා ඉතුරුම් ගිණුම්	**525**	484	432	370	288
- කාලීන තැන්පතු	**771**	633	497	456	498
- වෙනත්	**9**	3	4	3	3
එකතුව	**1,306**	1,120	933	829	789
ජංගම හා ඉතුරුම් ගිණුම්	**40.2**	43.2	46.3	44.7	36.5
මුදල් ඒකක					
- දේශීය%	**90.6**	88.7	89.0	91.8	92.0
- විදේශීය%	**9.4**	11.3	11.0	8.2	8.0
එකතුව%	**100.0**	100.0	100.0	100.0	100.0

පෙර මුදල් වර්ෂය අවසානයේ දී රුපියල් බිලියන 1,120ක් වූ ව්‍යාපාර සමූහයේ පාරිභෝගික තැන්පතු ප්‍රමාණය 2017 වසර අවසානයේ දී රුපියල් බිලියන 1,305ක් වීමෙන් 16.6%ක වර්ධනයක් ලැබිය.

බැංකුවේ/ව්‍යාපාර සමූහයේ අරමුදලින් 85%ක පමණ ප්‍රමාණයක් වශයෙන් පැවතීමෙන් දිවයින පුරාම විසිරී තිබෙන ක්ෂේත්‍රයේ විශාලතම ශාඛා ජාලයෙන් ලැබී තිබෙන බැංකුවේ ශක්තිමත් තැන්පතු පදනම විද්‍යමාන වේ.

සමාලෝචිත වර්ෂය තුළ දී තැන්පතු පදනමෙහි රුපියල් බිලියන 185.9ක වර්ධනයක් ඇතිවූ අතර ඉන් රුපියල් බිලියන 137.8ක් වූ හතරෙන් තුනක ප්‍රමාණය ස්ථාවර තැන්පතු දායකත්වය විය. ඉහළ යන පොළී අනුපාතික පරිසරයක් තුළ මෙය අපේක්ෂිත ප්‍රතිපලයකි.

වසර තුළ පැවති පොළී අනුපාත පරිසරය මූර්තිමත් කරමින් 2016 දී පැවති ජංගම ගිණුම් ඉතිරිකිරීමේ ගිණුම් තත්ත්වය වූ 43.2% 2017 දී 40.2% වශයෙන් පහත වැටිනි. එළඹෙන වසරේ දී සිය ජංගම ගිණුම් ඉතිරිකිරීමේ ගිණුම් අනුපාතය වර්ධනය කරගැනීම සඳහා වූ පියවරයන් බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් සිටී.

සමස්ත තැන්පතු ප්‍රමාණයෙන් 90%ක ප්‍රමාණයක් දේශීය ජංගම තැන්පතු වේ. කෙටි කාලීන සහ මධ්‍ය කාලීන වශයෙන් විදේශ මුදල් තැන්පතු වර්ධනය කරගැනීම ප්‍රධාන අවධානය යොමුව තිබෙන තත්ත්වයක පවතී.

තැන්පතු



ජංගම සහ ඉතුරුම් තැන්පතු



මුදල් වර්ගය



පාරිභෝගික අත්තිකාරම් වර්ධනය

	2017 රු. බිලියන	2016 රු. බිලියන	2015 රු. බිලියන	2014 රු. බිලියන	2013 රු. බිලියන
සමස්ත අත්තිකාරම්(දළ)	**1,209**	1,076	933	782	773
වර්ගය අනුව					
- අයිරාවන්	**116**	58	86	72	67
- වෙළඳ මූල්‍ය	**141**	177	191	168	103
- උකස් ගැනීම්	**137**	114	104	114	197
- වාරික ණය	**700**	618	453	335	299
ලැබියයුතු ණය	**89**	84	79	77	79
වෙනත්	**26**	24	20	17	27
එකතුව	**1,209**	1,076	933	782	773
ක්ෂේත්‍රය අනුව					
කෘෂිකාර්මික	**125**	119	106	127	182
නිෂ්පාදන	**31**	21	14	11	13
සංචාරක	**15**	7	4	5	5
ප්‍රවාහන	**58**	26	15	16	16
ඉදිකිරීම්	**331**	278	210	156	132
යටිතල	**94**	147	199	167	131
වෙළඳුන්	**108**	110	102	92	76
නව ආර්ථිකය	**10**	10	–	10	8
වෙනත්	**438**	357	282	198	211
එකතුව	**1,209**	1,076	933	782	773

පසුගිය වසරේ පැවති දළ ණය ප්‍රමාණය වූ රුපියල් බිලියන 1,076ට සාපේක්ෂව 2017 වසරේ දී 12.3%ක පාලිත තත්ත්වයක් යටතේ රුපියල් බිලියන 1,209ක් විය. වසර තුළ සමස්ත පාරිභෝගික අත්තිකාරම්හි තුනෙන් එකක කොටසක් රන් පවුම් ආධාරක අත්තිකාරම්වලින් යුක්ත වේ. 2013 වසරේ දී 25%ක් වූ උකස් ගැනීම් ප්‍රමාණය 2017 වසරේ දී 13.0%ක් වශයෙන් පහත වැටිනි.

ක්ෂේත්‍රයන් අනුව වූ තත්ත්වය විවිධාකාර වූ අතර 2017 වසරේ සමස්ත පාරිභෝගික අත්තිකාරම් ප්‍රමාණයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා වූ ප්‍රමාණය 10.0%ක් පමණ විය. දේපළ උකස් කිරීමෙන් ලබාගත් නිවාස ඉදිකිරීම් කාර්යය සඳහා වූ අත්තිකාරම් ප්‍රමාණය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සමස්තයෙන් තුනෙන් දෙකොටසක් පමණ විය.

අනියෝගාත්මක වෙළඳපල තත්ත්වයන් තිබියදීත් අක්‍රිය ණය අනුපාතය 2016 දී පැවති 1.9% මට්ටමේම සාර්ථකව පවත්වා ගැනීමට හැකිවිනි.

අංශය අනුව ගනුදෙනුකාර අත්තිකාරම් - 2017



වර්ගය අනුව ගනුදෙනුකාර අත්තිකාරම් - 2017



නියාමන ප්‍රාග්ධනය

2017 ජූලි මාසයේ දී මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන 5.0ක ප්‍රාග්ධන නික්ෂේපනයක් බැංකුවට ලැබිණි. බැංකුවේ ශේෂ පත්‍රයේ මෙය අපේක්ෂිත ප්‍රාග්ධන විභජනය වශයෙන් සටහන් වේ. 2017 දෙසැම්බර් 31 දිනට ලැබෙනු ඇතැයි අපේක්ෂිත ප්‍රාග්ධන විභජනය ද ඇතුළුව නව ප්‍රාග්ධන නික්ෂේපනය මගින් බැංකුවේ සමස්ත ප්‍රාග්ධනය වර්ධනය වී තිබේ.

ප්‍රධාන කාර්යසාධන කාර්යයන්

- බාසල් III ස්ථරය I සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් 2017 දෙසැම්බර් 31 දින වනවිට පිළිවෙලින් 11.5%ක් සහ 13.7%ක් විය. 2016 අවසන දී බාසල් II යටතේ පිළිවෙලින් 11.1%ක් සහ 13.0%ක් විය. බැංකුවේ මට්ටමින් ස්ථරය I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් ද පිළිවෙලින් 10.8%ක් සහ 13.5%ක් වූ අතර 2016 වසර අවසන ස්ථරය I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් ද බාසල් II යටතේ පිළිවෙලින් 9.8%ක් සහ 12.1%ක් විනි.

- අනෙකුත් බාසල් III කාර්යයන්

අ. දින 30ක් මුළුල්ලේ සිදුවන ශුද්ධ මුදල් පිටතට ගලායාම මත පවතින උසස් තත්ත්වයේ ද්‍රවශීලි වත්කම් සමස්තය මගින් මනිනු ලබන ද්‍රවශීලතා ආවරණ අනුපාතය වසර පුරාවටම 90%කට ඉහළ අගයක දිගටම පවත්වාගනු ලැබිණි (අවම අවශ්‍යතාවය වුයේ 80%කි).

ආ. දළ අවදානම් අනාවරණය මත ස්ථරය I මගින් මනිනු ලබන පෙළඹවීම් අනුපාතය 2017 දෙසැම්බර් 31 දිනට 4.0% ඉක්මවා තිබුණු අතර වසරේ අවසන් කාලයේ දී පාලිත වත්කම් වර්ධනයේ ප්‍රමාණය එමගින් විද්‍යමාන වේ. 2018 ජනවාරි 1වැනි දින සිට ඉදිරියට එහි අවශ්‍යතාවය 4.0%ක් විය.

කොටස්හිමියන්ගේ වටිනාකම් ඇතිකිරීම

සෘජු බදු සහ වක්‍ර බදු ද, ලාභාංශ සහ විශේෂ අයබදු වශයෙන් වූ ගෙවීම් කිරීමෙන් බැංකුව රාජ්‍ය ආදායමෙහි වැදගත් දායකත්වයක් දරයි. පසුගිය වසර 10ක කාලයේ දී රුපියල් බිලියන 150.2කට අධික ආදායමක් රජයට ලබාදී තිබේ.

රජයට ලබාදුන් සමස්ත ආදායම් වටිනාකම් වශයෙන් 2016 වසරේ දී තිබුණු රුපියල් බිලියන 22.9 සමග සසඳන කල වර්ෂය තුළ දී එය රුපියල් බිලියන 23.3ක් විය. මෙම මුදලින් 90%කට අධික ප්‍රමාණයක් බැංකුව විසින් උපයාගත් මුදල්ය.

ව්‍යාපාර කාර්යයන් තුළින් ක්‍රමෝපාය සැලසීම

බැංකුව විසින් තම උපායමාර්ගික සැලසුම ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ එහි ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් තුන ඔස්සේය. ඒවානම් ශාඛා මගින් කෙරෙන බැංකු කටයුතු, සංස්ථාපිත බැංකු කටයුතු සහ මහා භාණ්ඩාගාරය වන අතර ඒ යටතේ සුවිශේෂී පාරිභෝගික කාණ්ඩයන් ඉලක්ක කරමින් උප ව්‍යාපාරික කාර්යයන් කිහිපයක් තිබේ. මෙම ව්‍යාපාරික කාර්යයන්ට මානව සම්පත් සංවර්ධනය, අලෙවිකරණය, තාක්ෂණය, අවදානම් කළමනාකරණය සහ වෙනත් ආකාරයේ අභ්‍යන්තර කාර්යයන්ගේ ආධාර උපකාර ලැබේ. බැංකු ක්ෂේත්‍රයේ පවතින පෙර නොවූවිරූ වේගවත් වෙනස්වීම් සහ තියුණු තරගකාරිත්වය ඉදිරියේ නොසැලී කටයුතු කිරීම සඳහා බැංකුවේ උපායමාර්ගික වැඩසටහන අනුව අපගේ බැංකුව තාක්ෂණික පදනමකින් යුක්ත වූ මූල්‍ය සේවාවන් සලසන ආයතනයක් තත්ත්වයට පත්කර තිබේ. එබැවින් ඉහත කී ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් තුන යටතේ අපගේ අභ්‍යන්තර ව්‍යුහයන් සමාලෝචිත වර්ෂය තුළ දී තවදුරටත් වර්ධනය කරන ලදී. මෙමගින් එක් එක් පාරිභෝගික කණ්ඩායමේ අනන්‍ය වූත් වෙනස් ආකාරයේ වූත් අවශ්‍යතාවයන් සහ අපේක්ෂාවන් සමග ඵලදායී වටිනාකම් තත්ත්වයක් ද සමගින් වඩාත් සමීපව කටයුතු කිරීමට බැංකුව සතුවන හැකියාව සමග එළැඹෙන වසරවල දී අපගේ පාරිභෝගිකයන්ට ප්‍රවර්ධන අවස්ථාවන් හඹායාමට හැකිවන ආකාරයේ සරු තෝතැන්නක් බවට අපගේ බැංකුව පත්වනු ඇත.

ව්‍යාපාරික කාර්යයන්



ශාඛා බැංකු කටයුතු

සිල්ලර බැංකු කටයුතු, ව්‍යවසාය බැංකු කටයුතු සහ ක්ෂුද්‍ර මූල්‍යය ද සමන්විත වූ මහජන බැංකුවේ ඉතා වැදගත් ව්‍යාපාර කාර්යය වන්නේ ශාඛා බැංකු කටයුතුය. ශුද්ධ ආදායම, වත්කම් සහ තැන්පතු වශයෙන් බැංකුවට ඉහළම දායකත්වයක් ලැබෙන්නේ ශාඛාවන්ගෙනි. අපගේ ශාඛා ජාලය දිවයින පුරා විසිරුණු ශාඛාවන් 737කින් සමන්විත වේ. මෙමගින් රාජ්‍ය බැංකුවක් වශයෙන් අපගේ ප්‍රධාන වගකීම් අතුරින් එකක් වන අපගේ මූල්‍ය අන්තර්ගතයන් ද ප්‍රවර්ධනය කරමින් අපගේ පුළුල් පාරිභෝගික පදනමට නවීනතම බැංකුකරණ සේවාවන් සැලසීම අපට හැකිවී තිබේ. ශාඛාවන් මගින් බැංකු කටයුතු සිදුකරන පාරිභෝගික පදනමේ වර්ධනය පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.

ශාඛාවන් මගින් බැංකු කටයුතු සිදුකරන ගනුදෙනුකාර ගිණුම්



2017 වසර සඳහා වූ කාර්යසාධන සුවිශේෂීතාවයන්

26% ශාඛාවන්හි ශුද්ධ ආදායම් වර්ධනය

58% ශාඛාවන්හි පසුබදු ලාභ වර්ධනය

19% තැන්පතුවල වර්ධනය

27% අත්තිකාරම් වර්ධනය

අන්තර්ජාල/ජංගම බැංකුකරණ කාර්යයන් සිදුකරන පාරිභෝගික සංඛ්‍යාව මිලියනයකට අධික වේ.

2017 වසරේ මෙහෙයුම් සුවිශේෂීතාවයන්

- පාරිභෝගිකයන්ට අසාමාන්‍ය අත්දැකීමක් විඳගැනීමට හැකිවන පරිදි වසර තුළ දී ශාඛාවන්හි පහසුකම් වැඩිවර්ධනය කරන ලදී. කොළඹ යෝක් වීදියේ සහ මහනුවර මුල්ගම්පොල ද විශිෂ්ට ඩිජිටල් මධ්‍යස්ථාන දෙකක් විවෘත කරන ලදී.

- එක් පියවරක් ඉදිරියට තබමින් දිවයින පුරා ස්වයං බැංකුකරණ කටයුතු ඒකකයන් (SBU) 102ක් පිහිටුවමින් "ඒකකයක් තුළ බැංකු කටයුතු කිරීම" (banking in a box) සංකල්පය අපි හඳුන්වාදුන්නෙමු. පාරිභෝගිකයන් සඳහා බැංකු කටයුතු කරන වේලාවන් ඵලදායී ලෙස පුළුල් කරමින් සතියේ දින 7 පුරාම දවසේ පැය 24 පුරාම තම බැංකු ගනුදෙනු සිදුකරගැනීමේ පහසුකම අපගේ පාරිභෝගිකයන්ට මෙම මධ්‍යස්ථාන මගින් අප විසින් ලබාදෙන ලදී. අපගේ ස්වයං බැංකුකරණ ඒකකයන්හි පිහිටුවා තිබෙන නවීන තාක්ෂණයෙන් යුතු ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර සහ කියොස්ක් මධ්‍යස්ථානයන් වෙතින් අපගේ පාරිභෝගිකයන්ට මෙන්ම සාමාන්‍ය මහජනතාවට ද මුදල් ආපසු ලබාගැනීම, මුදල් තැන්පත් කිරීම, බිල්පත් ගෙවීම, අරමුදල් හුවමාරු කිරීම, කාඩ්පත රහිතව මුදල් ආපසු ලබාගැනීම, ජංගම මුදල් යැවීම සහ තවත් බොහෝ කාර්යයන් අපහසුවකින් තොරව ඉටුකරගැනීමේ පහසුකම් සපයා තිබේ.



පාරිභෝගිකයන්ගේ අනන්‍යතා ලියකියවිලි ස්කෑන් කරමින් ඩිජිටල් අත්සන් ලබාගනිමින් සහ ඡායාරූප ලබාගනිමින් අති නවීන ආකාරයෙන් ගිණුමක් විවෘත කිරීම

- මුදල් ආපසු ලබාගැනීම්
- මුදල් තැන්පත් කිරීම්
- බිල්පත් ගෙවීම්
- අරමුදල් හුවමාරු කිරීම්
- කාඩ්පත් රහිතව මුදල් ආපසු ලබාගැනීම්
- ජංගම මුදල් යැවීම්

කාර්යසාධනය

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	2017	2016	වර්ධනය %
ශාඛා සංඛ්‍යාව	**737**	737	–
ශුද්ධ ලාභය (රුපියල් මිලියන)	**43,760**	34,730	26.0
බදු පසු ලාභය (රුපියල් මිලියන)	**6,053**	3,836	57.8
වත්කම් (රුපියල් මිලියන)	**674,353**	532,196	26.7
අත්තිකාරම් (රුපියල් මිලියන)	**637,831**	503,756	26.6
තැන්පතු (රුපියල් මිලියන)	**1,050,355**	885,790	18.6
අක්‍රිය ණය අනුපාතය (%)	**1.5**	1.4	7.1
වියදම් ආදායම් අනුපාතය (%)	**77.7**	79.2	1.9
මාර්ගගත/ජංගම බැංකුකරණ පාරිභෝගික සංඛ්‍යාව	**1,037,647**	774,272	34.0
ආර්ථික වරප්‍රසාද නොලත් ප්‍රදේශයන්හි ණයදීම් (රුපියල් මිලියන)	**94,184**	92,382	2.0

අත්තිකාරම් සහ තැන්පතු



ශුද්ධ පොළී ආදායම, අරමුදල් මත පදනම් නොවූ ආදායම සහ ශුද්ධ ආදායම



මූල්‍ය කාර්යසාධනය

බැංකුවේ සමස්ත කාර්යසාධනයට ශාඛා බැංකුකරණ කටයුතුවලින් ලැබෙන දායකත්වය

71% ශුද්ධ ආදායම

33% පසුබඳු ලාභය

45% වත්කම්

64% අත්තිකාරම්

87% තැන්පතු

බැංකුවේ ඉතාම වැදගත් අංශය වන ශාඛා බැංකුකරණය සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ ශුද්ධ ආදායමට 71%ක් වූ ඉහළම දායකත්වයක් සපයන ලදී. පසුබඳු ලාභ ප්‍රමාණය පසුගිය වසරට වඩා 57.8%ක වර්ධනයක් සහිතව රුපියල් මිලියන 6,053ක් වූ අතර එය බැංකුවේ පසුබඳු ආදායමෙන් 33%ක ප්‍රමාණයක් විය. වත්කම් ප්‍රමාණය ද 26.7%ක වර්ධනයක් සහිතව රුපියල් මිලියන 674,353ක් වූ අතර එය බැංකුවේ වත්කම් පදනමෙන් 45%ක දායකත්වයක් සපයන ලදී. සමස්ත අත්තිකාරම් ප්‍රමාණය පසුගිය වසරට වඩා 26.6%ක වර්ධනයක් සහිතව රුපියල් මිලියන 637,831ක් වූ අතර එය 2017 වර්ෂයේ බැංකුවේ සමස්ත අත්තිකාරම් ප්‍රමාණයෙන් 64%ක දායකත්වයකි.

මෙහෙයුම් සමාලෝචනය

ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රයේ ඓතිහාසික කඩඉමක් සනිටුහන් කරමින් අපගේ පාරිභෝගිකයන්ට සැබෑ ඩිජිටල්කරණ බැංකු කටයුතු අත්දැකීමක් ලබාදීම සඳහා අපගේ ඩිජිටල් කාර්යයන් පුළුල් කළෙමු. 56 වසරකට පෙර සිදුවූ අපගේ ආරම්භයේ සිටම අපගේ පාරිභෝගිකයන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා දිවයින පුරා විසිරී සිටින ඔවුන්ට ප්‍රායෝගික සහ පහසු මූල්‍ය සේවාවන් සැලසීමේ උපකාර කිරීම අප විසින් අඛණ්ඩව සිදුකර තිබේ. උසස් තාක්ෂණය ඔස්සේ පහසුකම් සැලසීම සඳහා ඓතිහාසික ඩිජිටල්කරණ කාර්යය ආරම්භ කිරීමට මහජන බැංකුව විසින් ගන්නා ලද උපායමාර්ගික තීරණයට අනුව ඩිජිටල් බැංකුකරණ සේවාවන් ක්‍රියාත්මක කරන ලදී.

අනාගත දැක්ම

අපගේ පාරිභෝගිකයන්ට ඩිජිටල් බැංකුකරණයේ පහසුකම් සහ කාර්යක්ෂමතාවය අත්විඳීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ වඩාත්ම ඩිජිටල්කරණය වූ බැංකුව බවට පත්වීමේ අපගේ උපායමාර්ගික න්‍යායපත්‍රය අපි ක්‍රියාත්මක කරන්නෙමු.

ජාතියට ඩිජිටල්කරණයේ ප්‍රයෝජනයන් විවරකර දුන් වඩාත්ම ඩිජිටල්කරණය කළ බැංකුකරු බවට පත්වීමට අප යන ගමනේ දී දිවයින පුරාම තවතවත් ස්වයං බැංකුකරණ ඒකකයන් ස්ථාපනය කරමින් ඉලෙක්ට්‍රොනික අංගෝපාංග ඔස්සේ වඩාත් සුවිශේෂී අතිනවීන ඩිජිටල් බැංකුකරණ සේවාවන් අපගේ පාරිභෝගිකයන් වෙත අපි සපයන්නෙමු.

i. සිල්ලර බැංකුකරණ කාර්යයන්

බැංකුවේ සිල්ලර බැංකුකරණ ව්‍යාපාරයට සම්බන්ධ පාරිභෝගිකයන් සංඛ්‍යාව මිලියන 18ක සීමාවට පැමිණි තිබෙන අතර එය ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රයේ විශාලතම පාරිභෝගික පදනම වේ. දිවයිනේ විශාලතම ශාඛා ජාලය සමගින් සියලුම මූල්‍ය සේවාවන් සලසමින් ආර්ථික කාර්යයන් අප විසින් ශක්තිමත් කරන්නෙමු. ඊට අමතර වශයෙන් විශේෂයෙන්ම අවශ්‍ය පමණ සේවා පහසුකම් නොලබන කණ්ඩායම් වන ශ්‍රී ලංකාවේ කාන්තාවන්, ජ්‍යේෂ්ඨ පුරවැසියන් සහ දරුවන් ද සවිබලගැන්වීම සඳහා වූ නවීන සේවා පහසුකම් කිහිපයක් පළමුවරට අප විසින් සාර්ථකව සලසා ඇත්තෙමු. සමාජයේ සියලුම කණ්ඩායම්හි ජීවිත කාලය පුරාවටම පහසුකම් සැලසීමට අපගේ සේවාවන් සැලසුම් කර තිබේ. ගතවූ මුදල් වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේ පූර්ණ පහසුකම් සහිත පළමුවන ශාඛාව අප විසින් පිහිටුවනු ලැබූ අතර රටේ විශාලතම ස්වයං බැංකු කටයුතු ජාලය පුළුල් කරන ලදී. නව ඔන්ලයින් පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව 2017 වසරේ දී 26,957ක් විය.

වසර තුළ දී සිල්ලර බැංකු සේවා තැන්පතු ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව 18.6%කින් වර්ධනය වී රුපියල් ට්‍රිලියන 1.1ක් වූ අතර සිල්ලර ණය 17.7%කින් ද ක්‍රෙඩිට් කාඩ්පත් ප්‍රමාණය 20.3%කින් ද උකස් පහසුකම් 19.3%කින් ද වර්ධනය විය.

ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්	2017	2016	වර්ධනය %
තැන්පතු (රුපියල් මිලියන)	**1,050,355**	885,790	18.6
සිල්ලර ණය (රුපියල් මිලියන)	**335,603**	285,211	17.7
උකස් කිරීම් (රුපියල් මිලියන)	**136,475**	114,423	19.3
ක්‍රෙඩිට් කාඩ් (රුපියල් මිලියන)	**2,212**	1,839	20.3

තැන්පතු සහ සිල්ලර ණය



පාරිභෝගික සබඳතා තත්ත්වය

පිටු අංක 178හි පාරිභෝගික ප්‍රාග්ධනය යටතේ විස්තරකර තිබෙන පරිදි අපගේ පාරිභෝගිකයන් සමග සම්පවීම සඳහා වූ විවිධාකාර ප්‍රවේශයන් අප සතුවේ. සමාලෝචිත වසරේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ඔස්සේ සිදුකළ ගනුදෙනු ප්‍රමාණය බිලියන 48 ඉක්මවූ අතර මෙම ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 396ක් විය.

අන්තර්ජාල බැංකු ගනුදෙනු

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	**2017**	2016	2015	2014
මූල්‍ය ගනුදෙනු සංඛ්‍යාව	**1,891,925**	1,129,914	358,982	254,030
මූල්‍ය ගනුදෙනුවල වටිනාකම (රුපියල් මිලියන)	**127,528**	83,453	48,798	24,640
මූල්‍ය නොවන ගනුදෙනු සංඛ්‍යාව	**3,689,524**	2,920,895	2,368,429	1,973,816

සේවා කාර්යයන්

ණය සේවාවන්

- වෘත්තිකයන් සඳහා වූ ණය
- වාහන ණය - පීපල්ස් ඔටෝ
- අධ්‍යාපන ණය - පීපල්ස් විස්ඩම්
- ගුරුවරුන් සඳහා වූ ණය ක්‍රමය - ගුරු සෙත
- හෙදියන් සඳහා වූ ණය ක්‍රමය - සුව සෙත
- පරිභෝජන ණය - පහසු
- රජයේ සේවක නිවාස ණය
- හමුදාවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය - දැය විරු ප්‍රණාම
- උකස්

තැන්පතු සේවාවන්

- බාල වයස්කාර ඉතුරුම් ඉසුරු උදාන, සිසු උදාන
- තරුණයන් සඳහා ඉතුරුම් - යස්
- කාන්තාවන්ගේ ඉතුරුම් - වනිතා වාසනා
- අනෙකුත් ඉතුරුම් - ජනජය, ISA, පරිණත, මුදරබා
- ස්ථිර තැන්පතු
- අණකර තැන්පතු
- විදේශ මුදල් තැන්පතු

අනෙකුත් සේවාවන්

- ඩෙබිට් සහ ක්‍රෙඩිට් කාඩ්පත්
- මුදල් තැන්පතු යන්ත්‍ර, ස්වයං සේවා කියොස්ක් මධ්‍යස්ථාන, පීපල්ස් නෙට් සහ පීපල්ස් මොබයිල් බැංකිං

උපායමාර්ගික සේවා සැපයුම්

අරමුණ	උපායමාර්ගය	2017 වසර සඳහා ජයග්‍රහණයන්
ධරණීය ඉපැයුම් වර්ධනය	වෙළඳපල තුළ තරගකාරීවෙමින් වෙනස්වන පාරිභෝගික අවශ්‍යතාවයන්ට විසඳුම් දීම සඳහා සේවාවන් වර්ධනය කිරීමේ කාර්යයන් සිදුකෙරෙමින් පැවතීම	පාරිභෝගිකයන් හට නවීන පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ මේ දක්වා වූ පළමුවන ඩිජිටල් ශාඛාව සහ නවීකරණ මධ්‍යස්ථානය විවෘත කිරීම, පසුගිය වසරට වඩා බැංකුවේ පෙරබදු ලාභය 24.5% කින් වර්ධනය විය.
තැන්පතු වර්ධනය	ප්‍රධාන වශයෙන්ම දිගු කාලීන අඩු වියදම් තැන්පතු මාර්ග යෙන් සමස්ත තැන්පතු ඉලක්කයන් ළඟාකරගැනීමේ පදනම මත සේවා කළමනාකරණය සහ වෙළඳපල උපායමාර්ග සංවර්ධනය කිරීම	18.6%ක තැන්පතු වර්ධනයක් අත්කරගන්නා ලදී
ණය වර්ධනය	ඉහළ ණය ප්‍රමිතියක් සහ වේගවත් සහ කාර්යක්ෂම පාරිභෝගික සේවාවන් සහතික කරමින් ඉහළ ලාභයක් ලබන අතරම ප්‍රාග්ධන ප්‍රමාණවත්බවේ අනුපාතය මත අවම භාරයක් ඇතිවන පරිදි පෞද්ගලික ණය පරිමාව ඉහළ නැංවීම	17.7%ක පෞද්ගලික ණය වර්ධනයක් සහ 19.3%ක උකස් අත්තිකාරම් වර්ධනයක් ඇතිකරගැනීම
යහපත් කාර්ය ප්‍රමිතිය	ලාභදායී සහ යහපත් ව්‍යාපාරික වර්ධනයක් ලබමින් අවදානම් ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගයන් ද සමගින් එක් එක් සේවා කාණ්ඩය වෙනුවෙන් ව්‍යාපාරික සැලසුම් සංවර්ධනය කිරීම	පෞද්ගලික ණය සඳහාවන NPL අනුපාතය 0.7% දක්වා අවම කරන ලදී.
මෙහෙයුම් විශිෂ්ඨත්වයට පත්වීම	සේවාවන් පිළිබඳව කාර්ය මණ්ඩලයේ දැනීම වර්ධනය කිරීම සහ සේවා ප්‍රමිතීන් වර්ධනය කිරීම පිළිබඳ පුහුණු කිරීම අඛණ්ඩව සිදුකිරීම	1,700කට අධික කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
මූල්‍ය විනය පෝෂණය කිරීම	අඩු සේවාලාභී පාරිභෝගික කණ්ඩායම් අතර ඉතිරි කිරීමේ පුරුද්ද සහ මූල්‍ය විනය පෝෂණය කිරීම	අඩු සේවාලාභී පාරිභෝගික කණ්ඩායම් සඳහා ප්‍රදානය කළ ණය ප්‍රමාණය රුපියල් බිලියන 94.2කින් වර්ධනය වීම
පාර්භෝගික කේන්ද්‍රීය නවීකරණය	ණය ක්‍රමයන් අඛණ්ඩව නියාමනය කිරීම සහ අගය වර්ධනය කිරීම	2017 දී දියත් කරන ලද නව ණය ක්‍රමයන්ට පහත කරුණු ඇතුළත් වේ. • රජයේ හෙදියන්ට/හෙද ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශේෂ ණය යෝජනා ක්‍රමයක් • ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් • යුනයිටඩ් මෝටර්ස් ආයතනය සමග ස්වයංක්‍රීය ණය ක්‍රමයක් පිළිබඳව උපායමාර්ගික ගිවිසුමකට එළැඹීම

ii. ව්‍යවසාය බැංකු කටයුතු

මහජන බැංකුවේ ව්‍යවසාය බැංකු කටයුතු අංශය මගින් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME), වාණිජ ව්‍යවසායකයින් සහ තෝරාගත් රාජ්‍ය නිමිකම් ව්‍යවසායකයින් සඳහා සේවාවන් සැලසේ. විශාල රාජ්‍ය බැංකු අතුරින් එකක් වශයෙන්, රජයේ ආර්ථික සංවර්ධන න්‍යායපත්‍රයට සමගාමීව ජාතියේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අප විසින් මූල්‍ය පහසුකම් සලසන්නෙමු.

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	2017	2016	වර්ධනය %
අත්තිකාරම් (රුපියල් මිලියන)	**161,343**	100,454	60.6
අක්‍රිය ණය (රුපියල් මිලියන)	**5,567**	4,134	34.7
පොළී ආදායම (රුපියල් මිලියන)	**14,032**	11,784	19.1
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධ්‍යයන සම්මන්ත්‍රණ සංඛ්‍යාව	**3**	4	
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අධ්‍යයන සම්මන්ත්‍රණයන් හි ප්‍රතිලාභීන් සංඛ්‍යාව	**525**	780	

ව්‍යවසාය බැංකු කටයුතු අත්තිකාරම්

රු. බිලියන



සේවා කාර්යය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකු කටයුතු

- ව්‍යාපාර ඇරඹීමේ ණය
- කාරක ප්‍රාග්ධන ණය
- විස්තීරණ ණය (ජය ඉසුරු, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, LOC, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන, CSDDLs, E-ෆ්‍රෙන්ඩ්ස්)

වාණිජ/රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන්

- ව්‍යාපාරික ණය (TOD, POD, කණ්ඩායම් ණය, මූල්‍ය සීමා ණය)
- වෙළඳ මූල්‍ය ණය

වෙනත්

- ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ක්‍රම
- සහනදායී අනුපාතයන් යටතේ සමූපකාර අංශයට ණය දීම

උපායමාර්ගික සේවා සැපයුම්

අරමුණ	උපායමාර්ගය	2017 වසරේ සාර්ථකත්වය
ධරණීය ණය වර්ධනය	බැංකුවේ සියලුම කාර්යයන් සම්බන්ධයෙන් පාරිභෝගික කේන්ද්‍රිය ප්‍රවේශයක් අනුගමනය කරමින් සේවකයන්ගේ පාරිභෝගික සබඳතා පලගැන්වීමේ කාර්යය පිළිබඳව ඔවුන්ගේ නිපුණතා වර්ධනය කරගැනීමට අඛණ්ඩ පුහුණුව ලබාදීම, සමස්ත බැංකු ක්‍රියාකාරකම්හි දී ක්‍රියාවලි කාර්යක්ෂමතාවය සහ පාරිභෝගික සේවා මට්ටම් වැඩිදියුණු කරමින් පාරිභෝගික සබඳතා ශක්තිමත් කිරීම. ණය කටයුතු පිළිබඳ නියාමන සහ සමාලෝචන කාර්යයන් දිගටම පවත්වාගැනීම සහ ගැලපෙන පසුවිපරමක් සහිත කාර්යක්ෂම අයකරගැනීම් ක්‍රමයක් පවත්වාගැනීම.	පසුගිය වසරට වඩා 61%ක වර්ධනයක් අත්කරගන්නා ලදී.
සමූපකාර අංශයට උපකාර කිරීම	ශක්තිමත් සබඳතා පවත්වාගන්නා අතරම සමූපකාර ක්ෂේත්‍රයේ ව්‍යවසායකත්ව කුසලතාවයන්, මූල්‍ය විනය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම ඇතිකිරීම.	සමූපකාර ක්ෂේත්‍රය සඳහා රුපියල් බිලියන 1.8ක් යොදවන ලදී.
පාරිභෝගික කේන්ද්‍රිය සේවා සැලසීම	පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සහතික කරනු පිණිස ඔවුන් සමග එක්ව කටයුතු කිරීම සහ ඔවුනට ගැලපෙන විසඳුම් සහ මූල්‍ය මාර්ගෝපදේශනය ලබාදීම.	සිල්ලර ණය උත්පාදක ක්‍රමය සහ සංස්ථාපිත ණය උත්පාදක ක්‍රමය ඔස්සේ ණය ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කරන ලදී.
පාරිභෝගිකයන්ට දැනුම ලබාදීම	දිවයින පුරා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වීම.	වසර තුළ දී සම්මන්ත්‍රණ තුනක් පවත්වන ලදී.
වගකීම් සහිත ව්‍යවහාරයන් ආදේශ කිරීම	වගකීමෙන් යුතු ණය දීම සඳහා ඔවුන්ගේ සමාජීය හා පාරිසරික බලපෑම් පිළිබඳ සියලු පහසුකම් තක්සේරු කිරීම. තක්සේරු කිරීමේ ප්‍රධාන ක්ෂේත්‍රයන් වශයෙන් අදාළ පාරිසරික සහ කම්කරු රෙගුලාසිවලට අනුකූල වීම, රැකියා උත්පාදනය, අමුද්‍රව්‍ය ආදේශනය කරගැනීම සහ අපනයන ආදේශනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූල වීම ඇතුළත් විය. අප විසින් සලසන ලද පහසුකම් වෙනුවෙන් පාරිභෝගිකයන්ගේ මූල්‍ය භාරය අප විසින් අවම කරන ලදී.	සියලුම වියදම් තක්සේරු කරන ලදී.

iii. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකු කටයුතු

සුළු හා මධ්‍ය පරිමාණ පාරිභෝගිකයන් සඳහා කැපවුණු සේවාවන් ව්‍යාප්ත කිරීම සඳහා වැදගත් ස්ථානයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන 23ක්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකු කටයුතු ඒකකය මගින් ක්‍රියාත්මක කෙරේ. මෙම මධ්‍යස්ථාන මගින් සුවිශේෂී සේවාවන් සැලසෙන අතර මෙම ක්ෂේත්‍රයට අදාළවන සුවිශේෂී මාර්ගෝපදේශ මෙන්ම අවදානම් සාධකයන් ද පෙන්වාදෙනු ලැබේ. අපගේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ව්‍යාපාරයට රුපියල් මිලියන 15 සිට රුපියල් මිලියන 750ක් දක්වා වූ ව්‍යාපාරයන් ඇතුළත් වේ. වසර 2017 අවසාන වනවිට පසුගිය වසරට වඩා 16.2%ක වර්ධනයක් පෙන්වමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය රුපියල් බිලියන 11.8ක් දක්වා වර්ධනය විය. මෙම මධ්‍යස්ථානයන් ඔස්සේ සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 5,774ක් වූ මුදලක් අප විසින් ලබාදුන් අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පාරිභෝගික සංඛ්‍යාව 6,699ක් විය. 69%ක් පමණ වූ ණය මුදල් ප්‍රමාණයක් පිටපළාත් ප්‍රදේශයන් වෙත ගෙවන ලදී.

පළාත් අනුව ලබාදුන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය



පළාත් අනුව අක්‍රීය ණය



iv සංවර්ධන බැංකු කටයුතු/ක්ෂුද්‍ර මූල්‍ය

සංවර්ධන මූල්‍ය/ක්ෂුද්‍ර ණය යනු ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සංවර්ධනයට උරදෙන ප්‍රධාන අංශයන්ගෙන් එකක් වේ. 2017 වසර අවසන දී සංවර්ධන බැංකු කටයුතු සහ ක්ෂුද්‍ර මූල්‍ය කාර්යයන්හි වටිනාකම රුපියල් මිලියන 10,681ක් වූ අතර ගෙවන ලද ණය මුදල්වල වටිනාකම රුපියල් මිලියන 7,230ක් විය.



2017 වසර තුළ දී සංවර්ධන/බැංකුකරණ/ක්ෂුද්‍ර මූල්‍ය ණය දීම්

2017 වසර අවසාන වනවිට ගෙවන ලද සංවර්ධන සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රමාණයෙන් 98%ක් පිටපළාත් ප්‍රදේශයන් සඳහා විනි.

දිස්ත්‍රික්කය	ණය සංඛ්‍යාව	වටිනාකම (රුපියල් මිලියන)
අම්පාර	2,663	388
අනුරාධපුර	1,606	745
බදුල්ල	1,705	860
මඩකලපුව	2,044	507
කොළඹ උතුර	109	26
කොළඹ පිටත	201	71
කොළඹ දකුණ	40	12
ගාල්ල	257	81
ගම්පහ	683	205
හම්බන්තොට	868	308
යාපනය	1,793	486
කළුතර	424	100
මහනුවර	598	150
කෑගල්ල	289	90
කුරුණෑගල	447	167
මාතලේ	602	154
මාතර	666	268
මොනරාගල	1,010	197
නුවරඑළිය	205	64
පොළොන්නරුව	843	1,533
පුත්තලම	184	59
රත්නපුර	476	94
ත්‍රිකුණාමලය	1,038	358
වන්නි	1,277	307
එකතුව	20,028	7,230

රජයේ අරමුදල් යෙදවීම සඳහා වූ මග

රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනයන්හි අරමුදල් විශේෂ කාර්යයන් සඳහා ද යෙදවීමේ මාර්ගයක් වශයෙන් කටයුතු කිරීමට අපගේ පුළුල් ව්‍යාපෘතිය මගින් අපට හැකි වී තිබේ. අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සෘජුවම සම්බලගැන්වීමට දායකවන පහත දැක්වෙන ණය යෝජනා ක්‍රමයන් සඳහා අප ප්‍රධාන භවුල්කරුවන් වන්නෙමු.

ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයන් යටතේ ප්‍රදානය කරන ලද ණය

යෝජනා ක්‍රමය/ණය	ක්ෂේත්‍රය	කාර්යය	2017 වසර තුළ වැයකළ ප්‍රමාණය (රුපියල් මිලියන)
දිළිඳුකම තුරන් කිරීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය (PAMP 11 RF)	කෘෂිකර්මය, කෘෂිකර්ම පාදක කර්මාන්ත, ගෘහ කර්මාන්ත, වෙළඳ සහ සේවා	ව්‍යාපාර ඇරඹීම සඳහා සහ දැනට තිබෙන ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා	9.76
සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය	ක්ෂුද්‍ර සහ සුළු මධ්‍යම ව්‍යවසායකයන්	ව්‍යාපාර ඇරඹීම සඳහා සහ දැනට තිබෙන ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා	325.73
ස්වයං රැකියා ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය II (SEPI-II)	පිළිගත් වෘත්තිය පුහුණු ආයතන වෙතින් සාමර්ථය ලබා පිටවන තරුණ ප්‍රජාවට ස්වයං රැකියා ව්‍යාපෘති ඇරඹීමට පුහුණු කිරීම	ව්‍යාපාර ඇරඹීම සඳහා සහ දැනට තිබෙන ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා	15.65
කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය	පොල් වගා කිරීම හා සංවර්ධනය කිරීම	අතුරු භෝග සහිතව අළුතින් මෙන්ම නැවත පොල්පැල සිටුවීම	69.63
ස්වශක්ති ණය යෝජනා ක්‍රමය	ක්ෂුද්‍ර සහ සුළු මධ්‍යම ව්‍යවසායකට අළුතින් එක්වන අයට සහ දැනට ආදායම් උපදවන කාර්යයන්හි නිරත එම ව්‍යවසායකයන්ට ද මූල්‍ය සහයෝගය ලබාදීම	ව්‍යාපාර ඇරඹීම සඳහා සහ දැනට තිබෙන ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා	443.20
කප්රුක නිපැයුම් දිරිය	පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි නියැළුණු ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ තත්ත්වය ඉහළ නැංවීම	ව්‍යාපාර ඇරඹීම සඳහා සහ දැනට තිබෙන ව්‍යාපාර පුළුල් කරගැනීම සඳහා	2.96

අනාගත දැක්ම

රජයේ ජාතික ආර්ථික න්‍යායපත්‍රයට සමගාමීව ආර්ථිකයේ වර්ධනයවන ක්ෂේත්‍රයන්හි අවස්ථාවන් අපි අනුගමනය කරන්නෙමු. අළුතින් බිහිවන වර්ධන අවස්ථාවන් ග්‍රහණය කරගන්නා අතරම වගකීම් සහගතව ණය දීමත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දියුණු කිරීමත් පිළිබඳව ද අපි අපගේ ඉහළ අවධානය දක්වන්නෙමු.

සංස්ථාපිත බැංකු කටයුතු

ප්‍රධාන කර්මාන්ත අංශයන්හි දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වීමට උපකාරී වෙමින් සංස්ථාපිත බැංකු කටයුතු ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධනයේ පෙරමුණෙහි දිගටම පසුවෙයි. දේශීය සංස්ථාපිත ව්‍යාපාරිකයන්, ජාත්‍යන්තර හා අක්වෙරළ සමාගම්, ආයෝජන මණ්ඩල ව්‍යාපාර සහ රාජ්‍ය හිමිකම් සහිත ව්‍යවසායන් ද ඇතුළත්වන මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා මූල්‍ය සේවාවන් සංස්ථාපිත බැංකු කටයුතු මගින් සැලසේ. මනා ලෙස තුලිත වූ ණය වර්ධනයක් පවත්වාගැනීම සඳහා අපගේ ගැඹුරු දේශීය දැනුම, සබඳතා කළමනාකරණ හැකියාවන් සහ විවිධ ක්ෂේත්‍රයන්හි අපගේ පරිපූර්ණ සේවා සහ පුළුල් අත්දැකීම් සම්භාරය ද අපට හැකියාව ලබාදී තිබේ. අපගේ පරිපූර්ණ සේවාවන් අතර ආනයන සහ අපනයන මූල්‍ය සම්පාදනය, බැඳුම්කර සහ ඇපකරයන්, ණය, ව්‍යුහගත වෙළඳ මූල්‍ය සම්පාදනය, ව්‍යාපෘති සහ යටිතල මූල්‍ය පහසුකම්, අත්කරගැනීම් සඳහා වූ මූල්‍ය සම්පාදනයන් සහ කාණ්ඩගත ව්‍යාපාර ණය ආදිය ඇතුළත් වේ. අපගේ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ පරිචයන් 1.5%ක NPL මට්ටමක් අත්කරගැනීමට අපට උපකාරී වී තිබෙන අතර එය කර්මාන්ත සාමාන්‍යයට වඩා අවම තත්ත්වයකි.

කාර්යසාධනය

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	2017	2016	වර්ධනය %
ශුද්ධ ආදායම (රුපියල් මිලියන)	**9,022**	8,752	3.1
බදු පසු ලාභය (රුපියල් මිලියන)	**4,013**	4,367	-8.1
වත්කම් (රුපියල් මිලියන)	**372,251**	402,397	-7.5
අත්තිකාරම් (රුපියල් මිලියන)	**354,524**	359,879	-1.5
තැන්පතු (රුපියල් මිලියන)	**162,130**	172,925	-6.2
අක්‍රීය ණය අනුපාතය (%)	**1.5**	1.4	-6.6
ආදායම් වියදම් අනුපාතය (%)	**36.7**	26.6	-27.5
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා දුන් ණය මුදල් (රුපියල් මිලියන)	**247,493**	296,567	-16.5

වත්කම්, තැන්පතු සහ අත්තිකාරම්



ශුද්ධ පොළී ආදායම, අරමුදල් මත පදනම් නොවූ ආදායම සහ ශුද්ධ ආදායම



මූල්‍ය කාර්යසාධනය

බැංකුවේ සමස්ත කාර්යසාධනය සඳහා වූ සංස්ථාපිත බැංකු කටයුතු දායකත්වය

15%	ශුද්ධ ආදායම
22%	බදු පසු ලාභය
25%	වත්කම්
36%	අත්තිකාරම්

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාපිත බැංකු කටයුතු අංශයෙහි වූ 25%ක වත්කම් ප්‍රමාණයක් සහ 30%ක මෙහෙයුම් ලාභාංශයක් ද සහිත වූ අතර එය බැංකුවේ කාර්යසාධනයෙහි ලා සැලකියයුතු දායකත්වයක් විය. දැඩි තරගකාරී පරිසරයක් මධ්‍යයේ දී වුවද 2017 වසරේ ශුද්ධ පොළී ආදායම 5.7%ක වර්ධනයක් සහිතව රුපියල් මිලියන 9,022ක් ද අරමුදල් පාදක නොවූ ආදායමේ 8.7%ක වර්ධනයක් ද වාර්තා විය.

මෙහෙයුම් සමාලෝචනය

අපගේ වර්ධනය රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘතීන් මගින් සැලසීම දිගටම පැවති තත්ත්වය වුවත් පෞද්ගලික අංශයට කළ ණය මුදල් ප්‍රදානයන්හි ද සැලකියයුතු වර්ධනයක් පැවතිනි. හවුල් ව්‍යාපාර ණය ඔස්සේ බිලූ චිප් සමාගම් සඳහා ණය මුදල් ප්‍රදානය කිරීම, ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය, ව්‍යුහගත වෙළඳ මූල්‍ය සම්පාදනය සහ ආනයන, අපනයන කාර්යයන් සඳහා මූල්‍ය සම්පාදනය යන ක්ෂේත්‍රයන්හි තරගකාරී මූල්‍ය සැපයුම්කරුවකු වශයෙන් අපි සාර්ථකව ස්ථාපනය වී සිටිමු. පෞද්ගලික අංශයට සපයන ලද ණය මුදල් ප්‍රමාණය වශයෙන් 2016 වසරේ වර්තා වූ රුපියල් බිලියන 70ක ප්‍රමාණය 50%ක සැලකියයුතු වර්ධනයක් සහිතව 2017 වසරේ දී රුපියල් බිලියන 107ක් වූ අතර එය පසුගිය වසරේ පැවති බැංකුවේ සමස්ත ණය මුදල් ප්‍රමාණය වශයෙන් පැවති 20%ක ප්‍රමාණය සමග සසඳන කල 30%ක් වශයෙන් වාර්තා විය.

අපගේ උපායමාර්ගය යොමු වී තිබෙන්නේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ප්‍රමුඛ මනාපය සහිත බැංකුකරුගේ තත්ත්වය ස්ථාපනය කරගැනීමයි. සමාලෝචිත මුදල් වර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති කිහිපයකට රුපියල් බිලියන 24ක ණය මුදල් සැපයීම තුළින් ඒ සඳහා වූ අපගේ සහාය අනවරතව දක්වන ලදී.

අපගේ ජනතාව අපගේ ව්‍යාපාරයේ පෙරමුණේම සිටින බැවින්, සේවාදායකයන්ගේ අවශ්‍යතා හඳුනාගැනීම, සේවා ප්‍රමිතීන්, ණය මුදල් අගැයීම සහ පහසුකම් ව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් වූ පරිපූර්ණ පුහුණු වැඩසටහන් අපගේ සංස්ථාපිත බැංකු කටයුතු කාර්ය මණ්ඩලය සඳහා අප විසින් ක්‍රියාත්මක කරන ලදී.

සේවාදායක අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම

අපගේ ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානය සේවාදායකයන් වන බැවින් ඔවුන්ගේ අත්දැකීම් ප්‍රවර්ධනය කිරීමට අපි කැප වී සිටින්නෙමු. එබැවින් අපගේ සේවාදායකයන්ට අනන්‍ය වූ ඔවුන්ගේ මූල්‍ය සම්පාදන අවශ්‍යතාවයන් සපුරාලන බවට සහතික වන අපි ඔවුන්ගේ ව්‍යාපාරික ජීවන චක්‍රයේ විවිධ වූ මට්ටම්හි දී ඔවුනට සහාය දක්වන්නෙමු. අපගේ සංස්ථාපිත සේවාදායකයන් සඳහා ක්ෂණිකව බැංකු කටයුතු ඉටුකරගැනීමේ පහසුකම් දැනට ක්‍රියාත්මක කරමින් පවතින අපගේ බැංකු කටයුතු ස්වයංක්‍රියකරණය කිරීමේ ක්‍රමවේදයන් මගින් සැලසෙනු ඇත. ඊට සමගාමීව සිදුකෙරෙන ක්‍රියාවලි සහ ලියකියවිලි කාර්යයන්හි සුසංවිධිතකරණය සහ සරල කිරීම මගින් වර්ධනය වූ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක්, වඩාත් අවම කාලයක් තුළ කටයුතු ඉටුකරගැනීමේ හැකියාව ද සමගින් පාරිභෝගිකයන් හට සැලසෙන පහසුකම් වර්ධනය කරනු ඇත. ඊට අමතර වශයෙන් පරිපූර්ණ කළමනාකරණ තොරතුරු ක්‍රම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම ඔස්සේ සේවාදායක සබඳතා ප්‍රතිචාරයන් එක්වරම වටහාගෙන ප්‍රවර්ධිත මිලකිරීම් තීරණයන් ගැනීමට සබඳතා කළමනාකරුවන්ට පහසුවනු ඇත. අප විසින් මිළඟට ක්‍රියාත්මක කිරීමට නිබෙන කාර්යය වන්නේ පාරිභෝගිකයන්ගේ ගනුදෙනු වියදම් අවම කරමින් ඔවුන්ගේ මුදල් භාවිතයේ උපරිම ප්‍රතිඵල භුක්ති විඳීමට ඔවුනට හැකිවනු ඇති මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදයයි. දිවයිනේ විශාලතම සහ ස්වංක්‍රියකරණය කරන ලද ශාඛා ජාලය සමගින් අපගේ සංස්ථාපිත සේවාදායකයන් හට අගය එකතුකළ සේවා පහසුකම් ඔස්සේ තරගකාරී ලෙස මූල්‍ය විසඳුම් සැලසීමේ තත්ත්වයට අපි ප්‍රශස්ථව පත්වී සිටින්නෙමු.

උපායමාර්ගික සේවා සැපයුම්

අරමුණ	උපායමාර්ගය	2017 වසරේ සාර්ථකත්වය
ධරණීය ණය වර්ධනය	ප්‍රශස්ථ ණය අගැයීම් ක්‍රියාවලීන් සහ අනවරත ණය නියාමනය සහ අවදානම් සාධක අගැයීම	සමස්ත ව්‍යවස්ථාපිත ණය ප්‍රමාණය වූ රුපියල් බිලියන 355ක ප්‍රමාණයෙන් 2017 වසර අවසන දී දළ NPL අනුපාතය 1.5%ක් වශයෙන් පැවතීම
සමතුලිත ණය ක්‍රමය	පෞද්ගලික අංශයේ සංස්ථාපිත සේවාදායකයන් ආකර්ෂණය කරගැනීම සඳහා වෙළඳපල සේවාවන් දියුණු කිරීම සහ ඒවාට අනුගත වීම	පෞද්ගලික අංශයට සළසන ලද ණයමුදල් ප්‍රමාණය 2017 වසරේ දී 30%කින් වර්ධනය වීම
පාරිභෝගික කේන්ද්‍රීය සේවාවන් සැලසීම	පාරිභෝගිකයන්ගේ ණය මුදල් සහ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් හඳුනාගෙන ඔවුනට අවශ්‍ය කෙරෙන සේවා ක්‍රමයන් සහ සේවාවන් සලසමින් පාරිභෝගිකයන් රඳවා තබාගැනීම	පාරිභෝගිකයන් රඳවාතබාගැනීම 100%ක් වීම
අරමුදල් නොයෙදූ ආදායම වර්ධනය කිරීම	පාරිභෝගිකයන් සඳහා අගය එකතුකළ සේවාවන් සැලසීමට අවධානය යොමු කිරීම	අරමුදල් නොයෙදූ පදනම මත වූ බැංකුවේ 23%ක ආදායමෙන් 9%ක දායකත්වයකට අරමුදල් නොයෙදූ ආදායම වර්ධනය වීම

අනාගත දැක්ම

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ප්‍රමුඛතා මනාපය සහිත බැංකුකරුගේ තත්ත්වයට පත්වීමටත් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධනයට උපකාර කිරීමටත් අපි අනවරතව කටයුතු කරන්නෙමු. අපගේ පුළුල් ශාඛා ජාලය සහ පූර්ණ සේවා පරාසයත් සමගින් සම්බන්ධ වූ අපගේ ස්වයංක්‍රියකරණ සහ ඩිජිටල්කරණ කාර්යයන් මගින් අපගේ සංස්ථාපිත සේවාදායකයන් හට අසමසම සේවාවක් සලසන අතර අපගේ සේවාදායකයන්ගේ සමස්ත ව්‍යාපාරික පෙළඹ පද්ධති ග්‍රහණය කරගැනීමට එමගින් අපට හැකිවනු ඇත.

i. බැංකු සහ මූල්‍ය ආයතන අතර ණයදීම

බැංකු සහ මූල්‍ය ආයතන වෙත ණයදීමේ අංශය මගින් රුපියල් මිලියන 1,500ක ආදායම ඉක්මවන සහ රුපියල් මිලියන 100ක ශුද්ධ වටිනාකම ඉක්මවන සියලුම ලැයිස්තුගත සමාගම්, බහුජාතික ආයතන, අක්වෙරළ බැංකු කටයුතු, රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් සහ සීමිත වගකීම් සහිත සමාගම් වෙත සේවාවන් සලසනු ලැබේ. රාජ්‍ය හිමිකම සහිත බැංකුවක් වීම හේතුවෙන් සංස්ථාපිත අංශයේ ප්‍රධාන කොටසක් රාජ්‍ය අංශයෙන් සැලසේ. එතෙකුදු වුවත් සමාලෝචිත වසරේ දී පෞද්ගලික අංශයට බැංකු කටයුතු පහසුකම් ක්‍රියාශීලීව ප්‍රවර්ධනය කරමින් අපගේ පෞද්ගලික අංශයේ ප්‍රමාණය පුළුල් කිරීමට අප විසින් අනවරතව ක්‍රියා කරන ලදී.

ii. අක්වෙරළ බැංකු කටයුතු ඒකකය

අක්වෙරළ බැංකු කටයුතු ඒකකය මගින් සැලසෙන සේවාවන් අතර නිර්දේශිත විදේශ මුදල් පාලිත වෙළඳ කටයුතු මූල්‍ය පහසුකම් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගම්, මූල්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිත රාජ්‍ය අංශයේ ආයතන සහ අක්වෙරළ ව්‍යාපාරික කටයුතු සඳහා වූ ණයවර සහ තැන්පතු පහසුකම් සැලසීම ආදිය ඇතුළත් වේ. සමාලෝචිත වර්ෂය තුළ දී ඇගළුම් සහ කර්මාන්ත අපනයනයන්, මහා පරිමාණ විදේශ ආයෝජන ව්‍යාපෘති සහ සංචාරක ව්‍යාපෘති ආදී ශ්‍රී ලංකාවෙන් පිටත කාර්යයන් සම්බන්ධයෙන් අක්වෙරළ බැංකු කටයුතු සඳහා ධනාත්මක ඉල්ලුමක් පැවතිනි. 2016 වසරේ දී මෙම අංශයෙන් ප්‍රදානය කළ පහසුකම්වල වටිනාකම වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 754 සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය තුළ එම මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 1,008ක් වශයෙන් 34%ක වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව ද 2016 වසරේ දී සපයන ලද 2684ට සාපේක්ෂව 3,097ක් විය.

සේවා කාර්යයන්

සේවා කාර්යය	විස්තරය
ආනයන මූල්‍ය	ලිඛිත ණයවර යටතේ දුටුවන බිල්පත් ගෙවීම, භාවිතිය ලිඛිත ණයවර පහසුකම් යටතේ වූ පිළිගැනුම් බිල්පත් ගෙවීම, එකතුකිරීමේ බිල්පත් පහසුකම් ගෙවීම සහ අත්තිකාරම් ගෙවීම් පහසුකම් ආදී වූ ආනයන මූල්‍ය පහසුකම් සැපයීම
අපනයන මූල්‍ය	ණයවර ලිපි, කෙටිකාලීන ණය, අපනයන භාරකාර ලදුපත් සහ දේශීය සහ විදේශීය මුදලින් කෙරෙන අයිරා පහසුකම් ආදී වූ පෙර නැවිගතකිරීම් පහසුකම් සැලසීම, ණයවර ලිපි යටතේ අපනයන ලියකියවිලි ප්‍රමන්ත්‍රණය, තහවුරු කළ ඇණවුම් සහ අපනයන ගිවිසුම් යටතේ අපනයන ලියකියවිලි මිලදීගැනීම සහ වට්ටම් ලබාදීම සහ එකතුකිරීමේ පදනම මත වූ අපනයන අත්තිකාරම් ආදී වූ පසු නැවිගතකිරීම් පහසුකම් සැලසීම.
කාරක ප්‍රාග්ධන මූල්‍ය සම්පාදනය	සේවාදායකයාගේ දෛනික මෙහෙයුම් කාර්යයන් සුමටව සිදුවන බව සහතික කිරීම සඳහා අයිරාවන්, බිල් වට්ටම්/සාකච්ඡා සහ පිළිවැටුම් ණය පහසුකම් ආදී වූ ණය පහසුකම් සැලසීම.
මුදල් කළමනාකරණ පහසුකම්	අපගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලයේ තරඟකාරී වාසිදායක තත්ත්වය ප්‍රයෝජනයට ගනිමින් පාරිභෝගිකයන්ගේ මුදල් එකතු කිරීම ව්‍යූහගත කිරීම සහ කළමනාකරණය කිරීම සහ අපගේ භාණ්ඩාගාර සේවා කටයුතු ඔස්සේ හොඳම ආයෝජන සේවාවන් සැලසීම.
ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය	අපගේ සේවාදායකයන් විසින් භාරගත් දේශීය සහ ගෝලීය මහාපරිමාණ වාණිජ හා යටිතල ව්‍යාපෘතීන් හැසිරවීම.
ව්‍යාපාර වස්තු සඳහා මූල්‍ය සම්පාදනය	ණයවර මූල්‍ය සම්පාදනය මගින් ප්‍රාග්ධන ව්‍යූහ මූල්‍ය සම්පාදනය කිරීම, අනෙකුත් සමාගම්වල කොටස් මිලදීගැනීම සඳහා මූල්‍ය සම්පාදනය කිරීම, වාණිජ පත්‍ර සහ මූලික පොදු පිරිනැමීම් සඳහා බැංකු ඇපකර නිකුත් කිරීම.
ව්‍යූහගත වාරික මූල්‍ය සම්පාදනය	ව්‍යාපාර පුළුල් කිරීම සහ වෙනත් අපේක්ෂිත ව්‍යාපාර කාර්යයන් සඳහා වාරික මූල්‍ය සේවාවන් සැලසීම.
සම්මිලිත වාරික මූල්‍ය සම්පාදනය	අක්වෙරළ ව්‍යාපාර කාර්යයන් ද ඇතුළුව ඉහළ අගයක් සහිත ව්‍යාපාරික යෝජනාවන් සඳහා දේශීය සහ ජාත්‍යන්තර බැංකු සමගින් සම්මිලිත වාරික ණය මූල්‍ය සම්පාදනය සහ ව්‍යාපෘති මූල්‍ය සම්පාදනය.
ඇපකර පහසුකම්	ලංසු බැඳුම්කර, ක්‍රියාකාරී බැඳුම්කර, අත්තිකාරම් ගෙවීම් බැඳුම්කර, රේගු බැඳුම්කර, මුදල් රඳවාතබාගැනීමේ බැඳුම්කර සහ ණයවර බැඳුම්කර ඇතුළුව දේශීය සහ ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම.
සංස්ථාපිත මූල්‍ය උපදේශන	තම අදාළ ව්‍යාපාරයන්හි ඉහළම කාර්යසාධන මට්ටම් සපුරාගැනීම සඳහා සේවාදායකයන්ට මාර්ගෝපදේශනයන් සහ යොමුකිරීම් සැලසීම.

iii. ජාත්‍යන්තර අංශය සහ විදේශීය පාරිභෝගික සේවාවන්

ආනයනික මූල්‍ය සම්පාදනය 28%කින් ද අපනයන මූල්‍ය සම්පාදනය ස්වසිද්ධිමය වශයෙන් 22%ක්ද වූ ප්‍රශංසනීය වර්ධනයක් සමගින් පසුගිය වසරට වඩා වූ කාර්යසාධනයක් 2017 වසරේදී ජාත්‍යන්තර අංශයන්හි දක්නට ලැබේ. සමාලෝචිත වර්ෂයේ ආනයන ආදායම ද 66%කින් වර්ධනය වී ඇමරිකානු ඩොලර් මිලියන 53ක් විය.

කාර්ය සාධනය

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	2017	2016	වර්ධනය %
ආනයන මූල්‍ය සම්පාදනය (ඇ.ඩො. මිලියන)	**4,392**	3,440	28
අපනයන මූල්‍ය සම්පාදනය (ඇ.ඩො. මිලියන)	**596**	487	22
ආනයන ආදායම (ඇ.ඩො. මිලියන)	**53**	32	6
ගාස්තු සහ කොමිස් ආදායම (ඇ.ඩො. මිලියන)	**16**	15	7
සාමාන්‍ය LC සැකසුම් කාලය (පැය)	**04**	04	–



බැංකුවේ අපනයන සමාගම් හවුල්කාරත්වයන් සහ නියෝජිතයන් මගින් විදේශීය පාරිභෝගික සේවා ඒකකය විසින් අන්තර්ජාතික ප්‍රේශණයන් ප්‍රවර්ධනය කෙරේ. ලෝකය පුරාම විසිරුණු විනිමය සමාගම් 75ක් සමග බැංකුව සම්බන්ධතා පවත්වන අතර ඉන් සමහරක කාර්ය මණ්ඩලය බැංකුවේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකාව තුළ වෙස්ටන් යූනියන් මුදල් හුවමාරු කිරීම සඳහාවන ප්‍රධාන බැංකුකරු මහජන බැංකුව වේ.

විදේශීය ඒකකය මගින් කරන ලද ප්‍රවර්ධන කාර්යයන්

වසර තුළ දී පහත දැක්වෙන ප්‍රවර්ධන කාර්යයන් සිදු කරන ලදි.

- මැදපෙරදිග සිටින ශ්‍රී ලාංකීය ජනතාව සම්බන්ධ වන "එතෙර ඉසුර" ගුවන්විදුලි වැඩසටහනට අනුග්‍රහකත්වය දැක්වීම.
- වෙස්ටන් යූනියන් මගින් ප්‍රේශණයන් ලබාගන්නා පුද්ගලයන් සඳහා වන "එතෙර මෙතෙර වාසනා රිවෝඩ්ස්" ක්‍රමය.
- "කැනඩා 2017 කම්යුනිටි අචුට්රීච් ට්‍රේඩ් ෆෙයා" සඳහා කැනේඩියානු සම්බන්ධීකාරකයකු ඔස්සේ අනුග්‍රාහකත්වය දැක්වීම.
- එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අල් අහලියා මනි එක්ස්චේන්ජ් බියුරෝව මගින් පැවැත්වූ 2016/17 ගිණුම් ඇරඹීමේ ව්‍යාපාරයට අනුග්‍රහකත්වය දැක්වීම.

iv. වෙළඳ සේවාවන්

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන්ගෙන් එකක්වන වෙළඳ සේවාවන් අන්‍යොන්‍ය සබඳතා සහිත සබඳතාවයන් 900කට අධික සංඛ්‍යාවක් සහිතව ජාතීන් 103කට අධික සංඛ්‍යාවකට සේවාවන් සැලසේ. ලොව පුරා විසිරි සිටින තම සේවාදායකයන්ට මෙම අංශය මගින් ඵලදායී සහ කාර්යක්ෂම සේවාවක් අනවරතව සිදු කෙරේ. අපනයන ක්ෂේත්‍රයට එමගින් සිදුකළ සේවය අගය කිරීමක් වශයෙන් ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය මගින් වසර 2016 දී මෙම අංශයට විශේෂ සම්මානයක් ප්‍රදානය කරන ලදි. GSP+ පහසුකම ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපනයන මූල්‍ය සම්පාදනය 95%කින් ඉහළ ගිය අතර ආනයන මූල්‍ය සම්පාදනය 37%කින් වර්ධනය විය.

අනාගත දැක්ම

අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය ඔස්සේ පාරිභෝගිකයන් හට වඩාත් යහපත් පහසුකම් සහ ප්‍රවේශයන් සලසමින් අපගේ වෙළඳපල ප්‍රමාණය වර්ධනය කරගැනීමට අපි දිගටම කටයුතු කරන්නෙමු. ආනයන ආදායම සහ ප්‍රේශණයන් වර්ධනය කරගැනීම සඳහා අපගේ පුළුල් අන්‍යොන්‍ය සබඳතා බැංකු කටයුතු ජාලය ද අපි ශක්තිමත් කරන්නෙමු.

භාණ්ඩාගාරය

භාණ්ඩාගාර අංශය FOREX වෙළඳ කාර්යයන්, මුදල් වෙළඳපල සහ ස්ථාවර ආදායම් සුරැකුම් කාර්යයන් හි ප්‍රධාන භූමිකාවක් සහිත වේ. බැංකුවේ ශේෂ පත්‍රය කළමනාකරණය, මූල්‍ය සම්පාදනය සහ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් පිළිබඳව මෙම ඒකකය වගකිවයුතු වේ. වෙළඳපල අවදානම් සාධක (විශේෂයෙන් පොළී අනුපාතය සහ විනිමය අනුපාතය අවදානම් සාධකයන්) කළමනාකරණය කිරීම සහ වත්කම් සහ වගකීම්වල අප්‍රකට සීමාවන් සහ නොගැළපීම් පිළිබඳව ද එය වැදගත් භූමිකාවක් ඉටු කරයි. ඊට අමතර වශයෙන්, අවශ්‍ය අරමුදල් සඳහා ප්‍රවේශවීම සහ ඒවා යෙදවීමද සම්බන්ධයෙන් අනෙකුත් අංශයන්ට උපකාර කරන අතරම මෙම ඒකකය බැංකුවේ මූල්‍ය ආරක්ෂාව සහ ස්ථායීතාවය ද පවත්වාගනී.

කාර්යසාධනය

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	2017	2016	වර්ධනය %
ශුද්ධ ආදායම (රුපියල් මිලියන)	**9,100**	9,752	-6.7
පසු බදු ලාභය (රුපියල් මිලියන)	**8,089**	5,492	47.2
වත්කම් (රුපියල් මිලියන)	**446,219**	388,746	14.8
විදේශ විනිමය ගනුදෙනු මත ලාභය (රුපියල් මිලියන)	**746**	896	-16.7

ශුද්ධ ආදායම සහ බදු පසු ලාභය



මූල්‍ය කාර්යසාධනය

බැංකුවට ශාඛාවන්ගේ දායකත්වය

15% ශුද්ධ ආදායම

45% පසුබදු ලාභය

30% වත්කම්

බැංකුවේ ශුද්ධ ආදායමෙන් 15%ක ද පසුබදු ලාභයෙන් 45%ක ද වත්කම්වලින් 30%ක ද දායකත්වයක් බැංකුවේ කාර්යසාධනයට සැලසෙන අංශයක් වන්නේ භාණ්ඩාගාර අංශයයි. ශුද්ධ ආදායමේ 6.7%ක පහත වැටීමක් පෙන්නුම් කළද සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර අංශයේ පසුබදු ලාභය 47.2%ක වර්ධනයක් ලබමින් රුපියල් මිලියන 8,089ක් විය. පසුගිය වසරට වඩා 14.8%ක වර්ධනයක් පෙන්නුම් කරමින් වත්කම්හි වටිනාකම රුපියල් මිලියන 446,219ක් වශයෙන් විය.

මෙහෙයුම් සමාලෝචනය

සේවාදායක ගණුදෙනු සහ හිමිකම් සහිත වෙළඳ කාර්යයන්ගෙන් සමන්විත FOREX මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ප්‍රධාන අවධානය දැනට සිටින සහ ඉදිරියේදී සම්බන්ධ විය හැකි ඉහළ සේවාදායක සහභාගිත්වයක් සහිතව එම ප්‍රමාණයේ වර්ධනයක් ඇතිකරගැනීමට යොමුකෙරේ. ඊට අමතරව, විදේශ මුදල් යෙදවීම සහ SLDB අංශය FOREX අංශය මගින් පාලනය කෙරිණි.

බැංකුවේ වර්ධනය න්‍යාය පත්‍රය සාර්ථක කරගනැහීමට හැකිවන පරිදි බැංකුව සතුව සෑහෙන පමණ ශ්‍රී ලංකා රුපියල් අරමුදලක් පවතින බව සහතික කරමින් වත්කම් සහ වගකීම් කළමනාකරණය වැදගත් භූමිකාවක් ඉටු කරයි.

ප්‍රාථමික වෙළඳ අංශය ශ්‍රී ලංකා රුපියල් රජයේ සුරැකුම් වෙළඳාම සහ ආයෝජනයන්හි අනවරතව පලදායී ලෙස නිරතවිය. ලබාගත් සහ ලබානොගත් ඉහළ වාසි මෙහි ප්‍රතිපල වශයෙන් සිදුවිය.

2017 වසරේ දී ආයෝජන බැංකු කටයුතු අංශය පහසුකම් නියෝජිත කාර්යයන් ආරම්භ කළ අතර එමගින් ගාස්තු ආදායම වර්ධනය විය. වැඩිමනත් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළ දී භාරකාරත්ව කාර්යයන් ද වර්ධනය කරන ලදී. බැංකුවේ ව්‍යාපාරවස්තු අංශය ආයෝජන බැංකු කටයුතු අංශය මගින් සාර්ථක කළමනාකරණය කිරීමෙන් බැංකුවේ සාමාන්‍ය ආදායම් ප්‍රමාණයට වඩා ප්‍රමාණයක් 2017 වසරේ දී අත්කරගැනීම උපකාරී විය.

උපායමාර්ගික සේවා සැපයුම්

අරමුණ	උපායමාර්ගය	සාර්ථකත්වය
ධරණීය වර්ධනය	නව පාරිභෝගික සබඳතා පවත්වාගැනීම සහ ගොඩනැගීම	භාණ්ඩාගාර කාර්යසාධනය පසුගිය වසරට වඩා ප්‍රවර්ධනය වීම
පාරිභෝගික කේන්ද්‍රීය සේවා සැලසීම	සේවාදායකයන් රඳවාගැනීම සහ ආකර්ශනය කරගැනීම සඳහා ගැලපෙන සේවා අංගයන් සහ සේවාවන් සැලසීම	පහසුකම් නියෝජිත සේවාව ආදී නව අංගයන් දියත් කරන ලදි.

අනාගත දැක්ම

ආදායම් ඒකාබද්ධ කිරීම, ජාත්‍යන්තර සබඳතා වැඩිදියුණු කරගැනීම සහ වාසිදායක මහා පරිමාණ ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි අඛණ්ඩ උත්සහයන්හි යෙදීමෙන් වර්ධනය සඳහාවන අවස්ථාවන් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, ජාත්‍යන්තර වෙළඳාම, සංචාරක කර්මාන්තය, අපනයනයන් සහ විදේශීය සෘජු ආයෝජනයන් වර්ධනය වීම අපේක්ෂිත අතර එය ධනාත්මක සාධකයකි. විනිමය පාලනය ලිහිල් කිරීම හේතුවෙන්, අනාගතයේදී භාණ්ඩාගාර මෙහෙයුම් කාර්යයන්හි අවස්ථාවන් සැලසෙනු ඇත. ඊට අමතරව ගෝලීය වෙළඳපල තත්ත්වයන් (FX සහ පොළී අනුපාතයන්) විචලනය වෙමින් ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් වෙළඳපල ප්‍රතිචාරාත්මක තත්වය වර්ධනය කිරීම කෙරෙහි භාණ්ඩාගාර අංශයේ අවධානය යොමු කෙරෙනු ඇත.

භාණ්ඩාගාර ක්‍රමය අප විසින් උසස් තත්වයට පත්කරනු ඇති අතරම ඵළඹෙන වසරේ දී අරමුදල් කළමනාකරණ සේවාවන් සැලසීමටත් ව්‍යාපාරවස්තු සහ ස්ථාවර ආදායම් අංශයන් සඳහා භාරකාර සේවාවන් සැලසීමටත් අපි අදහස් කරන්නෙමු.

පිපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී යනු බැංකුමය නොවන ශ්‍රී ලංකාවේ විශාලතම සහ ඉහළම ශ්‍රේණිගත තත්වයේ මූල්‍ය ආයතනය වේ. මෙම සමාගම 1995 අගොස්තු 22වැනි දින සංස්ථාගත කරනු ලැබුවේ සීමාසහිත වගකීම් සහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වන අතර මහජන බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධ ආයතනයක් ද වශයෙනි. ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම IPO ආයතනය වීම හේතුවෙන් 2011 නොවැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපලේ ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත කරන ලදී. වසර 2012 වසරේ දී මූල්‍ය ව්‍යාපාර බලපත්‍රය සමාගමට ලැබීමෙන් ලීසිං සමාගමක් වශයෙන් පැවති එහි තත්වය මූල්‍ය සමාගමක තත්වයට පත්වීමෙන් මූල්‍ය සේවා ක්ෂේත්‍රයෙහි සමාගමේ නියෝජනය ශක්තිමත් කිරීමට ඊට වැඩියෙන් අවස්ථාවන් සැලසිනි. කොළඹ කොටස් වෙළඳපලෙහි ලැයිස්තුගතව තිබෙන ඉහළම බිලූ චිප් සමාගම් 20කින් සමන්විත කොළඹ කොටස් වෙළඳපලේ S&P ශ්‍රී ලංකා 20 දර්ශකයට 2014 දෙසැම්බර් මාසයේ දී සමාගම ඇතුළත් කරන ලදී.

ලීසිං ක්ෂේත්‍රයේ වෙළඳපල පෙරටුගාමියා වශයෙන් අඛණ්ඩව අනුගාමී වසර 16ක් පුරා කටයුතු කරන සමාගම ශාඛා 103ක් සහ පිටත කාර්යාල 101ක් ඔස්සේ පාරිභෝගිකයා සමග සමීපව කටයුතු කරයි.

කාර්යසාධනය

ප්‍රධාන කාර්යසාධන දර්ශකය	2017	2016	වර්ධනය
ශුද්ධ ආදායම (රුපියල් මිලියන)	**17,937**	15,190	18.1
බදු පසු ලාභය (රුපියල් මිලියන)	**4,368**	4,507	-3.1
වත්කම් (රුපියල් මිලියන)	**167,467**	159,104	5.3
අත්තිකාරම් (රුපියල් මිලියන)	**139,107**	134,273	3.6
තැන්පතු (රුපියල් මිලියන)	**64,736**	42,414	52.6
අක්‍රිය ණය අනුපාතය (%)	**2.6**	1.5	1.1
වියදම් ආදායම් අනුපාතය (%)	**41.7**	43.6	-1.9
සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අනුපාතය (%)	**14.7**	13.7	1.0
හිමිකම් මත ප්‍රතිලාභය (%)	**15.2**	17.5	-2.3
පාරිභෝගික සංඛ්‍යාව	**326,408**	284,049	14.9
ශාඛා සංඛ්‍යාව	**103**	103	–
කොටසකට ලාභාංශ (රුපියල්)	**1.25**	1.25	–

මූල්‍ය කාර්යසාධනය

ව්‍යාපාර සමූහයේ සමස්ත කාර්යසාධනයට සමාගමේ දායකත්වය

- **17%** ශුද්ධ ආදායම
- **16%** බදු පසු ලාභය
- **10%** වත්කම්
- **12%** අත්තිකාරම්
- **5%** තැන්පතු

- ව්‍යාපාර සමූහයේ කාර්යසසාධනය වෙනුවෙන් පිපල්ස් ලීසිං සමාගම විසින් කරන ලද සැලකියයුතු දායකත්වය 17%ක ඒකාබද්ධ ශුද්ධ ආදායමක්, 16%ක ඒකාබද්ධ පසුබදු ලාභයක්, 9%ක ඒකාබද්ධ වත්කම් සහ 10%ක ව්‍යාපාර සමූහයේ අත්තිකාරම්වලින් ද සමන්විත වේ. සමාලෝචිත වර්ෂයේ දී පිපල්ස් ලීසිං සමාගමේ ශුද්ධ ආදායම 18.1%ක වර්ධනයක් සහිතව රුපියල් මිලියන 17,937ක් වූ අතර එහි තැන්පතුවල ඇති වූ 52.6%ක යෝධ වර්ධනයක් සහිතව රුපියල් මිලියන 64,736ක් විය. වත්කම් පදනම සමාගම් මට්ටමින් රුපියල් බිලියන 156ක් ද ව්‍යාපාර සමූහය මට්ටමින් රුපියල් බිලියන 167ක් ද ඉක්මවිය.

2017 වසර සඳහා මෙහෙයුම් සමාලෝචනය සහ පිළිගැනීම්

- මූල්‍ය ව්‍යාපාරයක් පවත්වාගෙනයාම සඳහා බංගලාදේශයේ 1993 මූල්‍ය ආයතන පනත යටතේ බංගලාදේශයේ සංස්ථාගත කරන ලද සමාගමක් වූ ලංකා ඵලයන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්හි සම්පූර්ණ හිමිකම් ලබා ගැනීමෙන් පිපල්ස් ලීසිං සමාගම පළමුවරට තම විදේශීය ව්‍යාපාරික පියවර තබන ලදී.
- රන් ණය සහ මුඇාරකා සේවා අංගයන් දියත් කරන ලදී.
- ඔන්ලයින් සේවාව ඔස්සේ ගනුදෙනු කටයුතු කිරීමේ පහසුකම පාරිභෝගිකයන්ට සලසනු පිණිස PLC ඔන්ලයින් නමැති ඇප් පහසුකම පිපල්ස් ලීසිං සමාගම විසින් සංවර්ධනය කරන ලදී.
- පිපල්ස් ලීසිං සමාගම විසින් සංවර්ධනය කරන ලද සෙල්ෆ්කෑෂ් නමැති නව සේවා අංගය රටවල් 19ක් අතුරින් මූල්‍ය ව්‍යාපාර අංශය සඳහා වූ ස්වර්ණ සම්මානය APICTA 2017 උළෙලේ දී දිනාගන්නා ලදී. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහාවන ඉතා විශිෂ්ට ප්‍රමිති සම්මානය ද එම ජාතික උළෙලේ දී මෙම සේවා අංගයට ප්‍රදානය කරන ලදී.

- 2016/17 වසර සඳහා වූ පිපල්ස් ලීසිං සමාගමේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිගේ එක්සලන්ස් ඉන් ඉන්ටෙග්‍රේටඩ් රිපෝටිං ඇවෝඩ්ස් 2017 උළෙලේ දී සම්මාන රැසක් මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය සංවිධානය කරන ලද වාර්ෂික වාර්තාව 2017 සම්මානය ද දිනාගන්නා ලදී.
- 2016/17 වසර සඳහා වූ බිස්නස් ටුඩේ ටොප් 30 ලැයිස්තුවේ 15වැනි ස්ථානයට පිපල්ස් ලීසිං සමාගම තෝරාගන්නා ලදී.
- ශ්‍රී ලංකාවේ ලංකා වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද බෙස්ට් කෝපරේට් සිටිසන්ස් සම්මාන උළෙලේ දී විශිෂ්ටතම සංස්ථාපිත පුද්ගලයන් දසදෙනා අතරට ද සමාගම පත්වන ලදී.
- ලෝක මානව සම්පත් සංවර්ධන කොංග්‍රසය සහ සේවය සන්නාමකරණ ආයතනය ද මගින් පිපල්ස් ලීසිං සමාගම ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සේවය සන්නාමයන්ගෙන් එකක් බවට ශ්‍රී ලංකා බෙස්ට් එම්ප්ලෝයර් බ්‍රෑන්ඩ්ස් ඇවෝඩ්ස් 2017 උළෙලේ දී පිළිගැනීමට ලක්විය. තවද ඒෂියාස් බෙස්ට් එම්ප්ලෝයර් බ්‍රෑන්ඩ් ඇවෝඩ්ස් 2017 උළෙලේ දී ද පිපල්ස් ලීසිං සමාගම ලෝක මානව සම්පත් සංවර්ධන ආයතනයේ සහ සේවය සන්නාමකරණ ආයතනයෙන් පිරිනැමෙන ආසියාවේ විශිෂ්ටතම සේවය සන්නාම සම්මානය දිනාගන්නා ලදී. 2016/17 SLITAD පිපල් ඩිවලොප්මන්ට් සම්මාන උළෙලේ දී ද පිපල්ස් ලීසිං සමාගම ස්වර්ණ සම්මානයක් දිනාගන්නා ලදී.

2017 වසරේ ප්‍රධාන කාර්යයන්

- සේවා අංගයන් පුළුල් කිරීම - රන් ණය සහ මුස්ලිම් සේවා අංගයක් වූ මුෂාරකා හඳුන්වාදීම
- සීමාවන් වැඩිකිරීම/පොළී ව්‍යාප්ත කිරීම
- වාසිදායක අරමුදල් සම්මිශ්‍රණයක් පවත්වාගැනීම
- වෙළඳපල ප්‍රමුඛයාගේ තත්ත්වය පවත්වාගැනීම

ධරණීයතාවය සඳහා වූ කැපවීම

පිපල්ස් ලීසිං සමාගම ධරණීයතාවය පවත්වාගැනීමට සහ තම කොටස්කරුවන්ගේ ඉහළ අගයක් ඇතිකිරීමට ද කැප වී සිටී. ව්‍යවසායකත්වයන් සහ මූල්‍ය අවබෝධය ගොඩනැගීම, අධ්‍යාපනය ඉහළ නැංවීම, පාරිසරික, භාරකාරත්වය, ආරක්ෂාකාරී මාර්ග භාවිතය සහ ප්‍රාදේශීය ප්‍රජාවන් බලගැන්වීම යන ක්ෂේත්‍රයන් පහ පිළිබඳව ද සමාගම අවධානය යොමු කරයි.

තම මෙහෙයුම් කාර්යන්හි තිබෙන ඍණාත්මක පාරිසරික බලපෑම් අවම කිරීම සහතික කරමින් පරිසරය සුරැකීම සඳහා ද සමාගම කැපවී සිටී. එක්සත් ජාතීන්ගේ ධරණීය සංවර්ධන ඉලක්කයන්ට ද සමාගම දායකත්වය සපයන අතරම ඒ සඳහා උපකාර කිරීම වෙනුවෙන් මහජන - පෞද්ගලික සහයෝගිතාවයන් සඳහා ද සූදානම්ව සිටී. පරිසරය පිළිබඳව සමාගම විසින් කරන කැපකිරීම අගය කිරීමක් වශයෙන් පිපල්ස් ලීසිං සමාගම කාබන් විනිර්මුක්ත ආයතනයක් වශයෙන් CarboNeutral.com විසින් 2016 වසරේ දී සහතික කරන ලදී.

අවිධිමත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික ප්‍රගමනය ඇතිකිරීම උදෙසා ද සමාගම විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. විශේෂයෙන්, වරප්‍රසාද නොලත් ප්‍රජාවන් අතර සිටින පාරිභෝගිකයන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ව්‍යූහගත පුහුණු වැඩසටහන් ඔස්සේ ප්‍රගමනය කිරීමෙහි ද සමාගම නියැලෙයි.

උපායමාර්ගික සේවා සැපයුම්

අරමුණ	උපායමාර්ගය	සාර්ථකත්වය
ධරණීය වර්ධනය	සීමාවන් පවත්වා ගැනීම, කාර්ය ප්‍රමිතීන් වර්ධනය කිරීම සහ නව සේවා අංග සංවර්ධනය කිරීම	• සීමාවන් වර්ධනය • කර්මාන්ත සාමාන්‍යයට පහළ මට්ටමක් වූ 3%ට අඩුවෙන් NP පවත්වාගැනීම • අනුගාමී වසර 16ක් මුළුල්ලේ වෙළඳපල ප්‍රමුඛයා වශයෙන් පැවතීම
යහපත් තත්ත්වයක් පවත්වා ගැනීම	සේවා අංග සංකලනය සමතුලිත කිරීම	• රන් ණය ආදී වූ නව කෙටි කාලීන ණය සේවා අංගයන් හඳුන්වා දීම
පාරිභෝගික කේන්ද්‍රීය සේවා අංගයන් සැලසීම	සේවා අංගයන් පුළුල් කිරීම සහ සමාගමේ තොරතුරු තාක්ෂණ යටිතලයන් ඉහළ නැංවීම	• රන් ණය, මුෂාරකා සහ වකාලා ආදී නව සේවා අංගයන් හඳුන්වා දීම • PLC ඔන්ලයින් ක්‍රමය දියත් කල අතර සංස්ථාපිත වෙබ් අඩවිය නවීකරණය කරන ලදි. • දෛනික මෙහෙයුම් කාර්යයන්හි සුමට බව පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතිය ප්‍රවර්ධනය කරන ලදි.

අනාගත දැක්ම

පිපල්ස් ලීසිං සමාගම සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත අරමුණු අතර 15%ක ලාභය වර්ධනයක්, වත්කම් පදනමේ 12%ක වර්ධනයක්, ණය සහ ආපසු අයකරගැනීම් පිළිබඳ පුහුණු කිරීම් පැවැත්වීම සහ වෙළඳපල අවශ්‍යතා මත පදනම් වූ නව සේවා අංගයන් හඳුන්වාදීම ඇතුළත් වේ. ශ්‍රී ලංකාව තුළ තමන්ගේ පෙරටුගාමී තත්ත්වය පිපල්ස් ලීසිං සමාගම දිගටම පවත්වාගනු ඇති අතර සේවා කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කරගැනීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතලයන් ඉහළ නංවනු ඇත. වැඩිමනත් වශයෙන්, එහි සේවා අංගයන් විවිධාංගීකරණය කිරීම සහ අවදානම් සාධකයන් අවම කිරීම සඳහා නව සේවා අංගයන් ද දියත් කරනු ඇත. ඉදිරි වර්ෂයේ දී බංග්ලාදේශයේ කෙරෙන තම මෙහෙයුම් කාර්යයන් ද සමාගම විසින් සංවර්ධනය කරනු ඇත.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂිතා

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ මේ දක්වා වූ **මුල්ම නවීකරණ මධ්‍යස්ථානය විවෘත කිරීම**

දේපළ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා රුපියල් බිලියන **2.3** ක් ආයෝජනය කිරීම

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) සඳහා ආයෝජන පසුගිය වසරට වඩා **149%** කින් වර්ධනය වීම

තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා වූ ආයෝජන පසුගිය වසරට වඩා **111%** කින් වර්ධනය වීම

අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය අගයන් ඇතිකිරීමේ ක්‍රියාවලිය

යෙදවුම්

- ශාඛා ජාලය
- තොරතුරු තාක්ෂණ පද්ධති
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර
- ඩිජිටල් ශාඛා
- ස්වයං සේවා කියොස්ක් මධ්‍යස්ථාන

ක්‍රියාවලිය

භෞතික යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණය සඳහා වූ ආයෝජන

නිමැවුම්

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 572ක් දක්වා වැඩි කිරීම
- කාර්යාල උපකරණ සහ සවිකිරීම් සඳහා ආයෝජනය කිරීම
- තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා ආයෝජනය කිරීම

ප්‍රතිඵලය

- ඩිජිටල් ශාඛා
- පාරිභෝගික පහසුව වර්ධනය වීම
- පාරිභෝගික සේවාව උසස් තත්ත්වයට පත්වීම

නිෂ්පාදිත ප්‍රාග්ධන සංඛ්‍යා දත්ත

	2017	2016	2015	2014	2013
ශාඛා සංඛ්‍යාව	**737**	737	740	739	735
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව	**572**	506	492	469	460
ශාඛා සංවර්ධනය සඳහා වූ ආයෝජන (රු. මිලියන)	**1,091**	1,176	1,128	216	593
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ ආයෝජන (රු. මිලියන)	**396**	21	3	2	5
තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා වූ ආයෝජන (රු. මිලියන)	**987**	397	692	133	162

නිෂ්පාදිත ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම

අපගේ බැංකුවේ වටිනාකම් ඇතිකිරීමේ ක්‍රියාවලියට උපකාරීවන අපගේ බැංකුවේ භෞතික යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ, පද්ධතිවලින් නිෂ්පාදිත ප්‍රාග්ධනය සමන්විත වේ. කාර්යක්ෂම නිෂ්පාදිත ප්‍රාග්ධනය අපගේ මෙහෙයුම්වල ඵලදායීතාවය වර්ධනය කරන අතර, එමඟින් අපගේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවයන් වෙත වඩාත් ඉහළ ප්‍රතිචාරයක් දැක්වීමට අපට හැකියාව ලැබේ. එය අපගේ කාබන් ඩයොක්සයිඩ් විමෝචනය ද අවම කිරීමට උපකාරී වේ. එබැවින් දිවයින පුරා විසිරී සිටින අපගේ පාරිභෝගිකයන්ට පරිපූර්ණ සහ පහසු සේවයක් සැලසීම සඳහා අපගේ භෞතික යටිතල පහසුකම් වර්ධනය කිරීමට අපි නිරතුරුවම ආයෝජනයන් කරන්නෙමු. සුමට මෙහෙයුම් ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා අපගේ තොරතුරු තාක්ෂණ පද්ධති ද අප විසින් වැඩිදියුණු කරමින් පවත්වාගනු ලැබේ.





අපගේ ශාඛා ජාලය

ශ්‍රී ලංකාව පුරා වූ අපගේ භෞතික යටිතල පහසුකම් ප්‍රමාණය ශාඛාවන් 737කින් ද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 572කින් ද සමන්විත වේ. ශාඛා යටිතල පහසුකම් සඳහා වූ අපගේ ආයෝජනයන් 2017 වසරේ දී රුපියල් මිලියන 1,091ක් දක්වා පසුගිය වසරට වඩා 7%කින් පහත වැටුනු අතර තොරතුරු තාක්ෂණ හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ ආයෝජනයන් පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් 111%කින් සහ 1,786%කින් වර්ධනය විය. ජාත්‍යන්තර ඩිජිටල්කරණ තත්ත්වයට සමාන තත්ත්වයේ පහසු සේවයක් අපගේ සියලුම පාරිභෝගිකයන් හට සැලසීම වෙනුවෙන් අපගේ ශාඛා ජාලය ඩිජිටල්කරණය කිරීමේ අපගේ ක්‍රමෝපාය පවත්වාගැනීම මින් පහැදිලි වේ. ශාඛාවන්හි තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සහ එමගින් පාරිභෝගික අත්දැකීම් උසස් කරලීම වෙනුවෙන් අපගේ ශාඛාවන් ප්‍රතිසංවිධානය කිරීමේ උත්සාහය පසුගිය වසරේ දී පූර්ණ ශක්තියෙන් යුතුව අඛණ්ඩව සිදු කෙරිණි. අපගේ නව සංස්ථාපිත සන්නාමය පිළිබිඹු කිරීම සඳහා අපගේ ශාඛාවන්හි බාහිර පෙනුමට නව පරිවර්තනයක් ඇති කරන ලදී. අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලියට සමගාමීව අප විසින් ඩිජිටල් ශාඛා 2ක් ද ස්වයං සේවා කියොස්ක් මධ්‍යස්ථාන 96ක් ද ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර 572ක් සහ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර 121ක් ද 300කට අධික වැදගත් ස්ථානයන්හි ස්ථාපිත කරන ලදී. දළ වශයෙන් 40%ක් පමණ වූ මුදල් ගනුදෙනු 2017 වසරේ දී ස්වයං සේවා මෙහෙයුම් ඔස්සේ සිදු කරන ලදී.

දේපළ, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සඳහා වූ ආයෝජනයන්

නිදහස් භුක්තිය සහිත ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, කාර්යාලීය උපකරණ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ සහ පරිගණක ආදී වූ දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආදිය ලබාගැනීම සඳහා 2017 වසරේ දී රුපියල් බිලියන 2.3ක් අප විසින් ආයෝජනය කරන ලදී.

අපගේ බැංකුව වේගවත්ව ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියට සමගාමීව අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම සහ උසස් කිරීම සඳහා ද සැලකියයුතු ආයෝජනයන් කරන ලදී.

තොරතුරු තාක්ෂණය

අපගේ තොරතුරු තාක්ෂණ අංශයේ මෙහෙයුම් කාර්යයන් ශක්තිමත් කරනු පිණිස ඩිජිටල්කරණ ක්‍රියාවලිය සමගින්ම ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ මේ දක්වා වූ මුල්ම නවීකරණ මධ්‍යස්ථානය අප විසින් දියත්කරන ලදී. ඩිජිටල් බැංකුකරණය සඳහා වන ලෝකයේ ඉතා උසස් තාක්ෂණයන් අන්තර්ගත කරමින් අප බැංකුවේ සියලුම මට්ටමේ පද්ධතීන් ඇතුළත්ව අපගේ සමස්ත මෙහෙයුම් මොඩලයන් ආවරණය වන පරිදි වූ මැනවින් සංවර්ධනය කළ ඩිජිටල් ක්‍රමයක් අප විසින් සපයනු ලැබේ. ජාත්‍යන්තර බැංකුකරණය තුළ විකාශනය වෙමින් පවතින ආකාරයේ තත්ත්වයට සමාන ලෙස, ඉතා උසස් ප්‍රමිතියෙන් යුතු සේවාවක් සැපයීමට මෙමගින් අපට පහසුකම් සැලසෙන අතර එමගින් අපව ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයට පමුණුවා තිබේ.

වඩාත් පහසුකම් සහිත වූ මොබයිල් බෑංකිං, පීපල්ස් නෙට් සහ පීපල්ස් පාම්-ටොප් ආදී වූ නවීන බැංකු පහසුකම් කිහිපයක් අප විසින් සලසනු ලැබේ. වැඩිමනක් වශයෙන් ඩයලොග්, මොබිටෙල් සහ එට්සලාට් ජංගම දුරකථන ජාලයන් සමඟ හවුල්ව ඇරඹූ පීපල්ස් මොබයිල් බෑංකිං සේවාව මගින් බැංකුවට පැමිණීමකින් තොරව බැංකු ගනුදෙනු කිරීම සහ බිල්පත් ගෙවීම් ආදිය තම ජංගම දුරකථනය පාවිච්චි කරමින් ඉටු කරගැනීමේ පහසුකම අපගේ පාරිභෝගිකයන් සඳහා සලසා තිබේ.

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ පළමුවන ඩිජිටල් මධ්‍යස්ථානය දියත් කිරීමට අමතර වශයෙන් ''පීපල්ස් ග්‍රීන් ප්ලස්'' නමැති අපගේ පරිසර සමතුලිතතා ආරක්ෂණ ප්‍රතිපත්තිය සමගින් ''හරිත අනාගතයක්'' සඳහා වූ අපගේ ඉලක්කය සපුරාගැනීමේ අරමුණ ජයගැනීම වෙනුවෙන් ශක්තිමත් ප්‍රගමනයක අපි යෙදී සිටින්නෙමු.

අනාගත දැක්ම

අපගේ ජාතියට ඩිජිටල් බැංකුකරණයේ ප්‍රතිලාභයන් අත්කරදීම සඳහා අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය පුළුල් කිරීමට අප විසින් අනවරතව කටයුතු කරනු ඇත. පාරිභෝගිකයන් හට සුමට ඩිජිටල් අත්දැකීමක් ලබාදීමට අපගේ උත්නතිකාමී ඩිජිටල්කරණ ක්‍රියාවලිය මගින් අපව බලගන්වනු ඇති අතරම එමගින් ශ්‍රී ලංකාවේ බැංකුකරණ සහ මූල්‍ය සේවාවන් ජාත්‍යන්තර ඩිජිටල්කරණ තත්ත්වයට සමාන වූ උසස් තත්ත්වයකට පත්කරනු ඇත. අපගේ ඉලක්කය වන්නේ ශ්‍රී ලංකාව තුළ වඩාත්ම උසස් මට්ටමින් ඩිජිටල්කරණය කළ බැංකුව බවට පත්වීමයි.

බුද්ධිමය ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂීතා

91% ක් වූ
පාරිභෝගික තෘප්තිය

3.5
ප්‍රබල සන්නාම දර්ශකය

1,042
වසර 25 කට වැඩි සේවා කාලයක් සහිත සේවකයන්

ශ්‍රී ලංකාවේ පළමු වරට ඩිජිටල් ශාඛාව දියත් කරන ලදී

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය අගයන් ඇතිකිරීමේ ක්‍රියාවලිය



බුද්ධිමය ප්‍රාග්ධන කළමනාකරණය

අප සමාගමේ බුද්ධිමය ප්‍රාග්ධනය අපගේ සන්නාමය, නිපැයුම් නවෝත්පාදනය, කර්මාන්තයේ දැනීම, තොරතුරු තාක්ෂණ පද්ධති, සම්මාන සහ ගෞරවයන්, අනුකූලතාවය, සංස්ථාපිත සංස්කෘතිය සහ ව්‍යාපාර ආචාරධර්මයන්ගෙන් සමන්විත වේ. අපගේ ආයතනික දැනුම සහ නව සේවා නවීකරණයන් වැඩිදියුණු කරගනිමින් අපගේ පාරිභෝගිකයන්ට අති නවීන තාක්ෂණයෙන් යුතු මූල්‍ය සේවාවක් සැලසීම සඳහා අපගේ සංස්ථාපිත සන්නාමය වර්ධනය කරගනිමින්, ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කරමින් අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය ප්‍රවර්ධනය කිරීමට අපි කැපවී සිටිමු.

සන්නාම හිමිකම

සන්නාම හිමිකම යනු එම සන්නාමය සම්බන්ධයෙන් පාරිභෝගිකයන් ලබන අත්දැකීම් තුළින් ඔවුන් ඒ පිළිබඳ දරන ප්‍රත්‍යක්ෂය මගින් තීරණය කරසිටින සන්නාමයේ වටිනාකමයි. වර්ධනය වූ වෙළඳපල කොටසක් ලැබීමට හේතුවන අයුරින් පාරිභෝගික ලැදියාව ඇතිකරගැනීම ඉහළ සන්නාම හිමිකම සඳහාවන ධනාත්මක හේතුවකි. වසර 56ක දීර්ඝ කාලයක් පුරා ජාතියට බැංකු කටයුතු සහ මූල්‍ය සේවාවන් සලසන අප රුපියල් ට්‍රිලියන එකක් ඉක්මවූ වත්කම් පදනමත් සහ රටේ වාණිජ බැංකුවක් සතුවන වැඩිම පාරිභෝගික පිරිසක් ද සහිත වූ ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතන අතරින් එකක් වේ. වසර 2017 දී සන්නාම හිමිකම් දර්ශකය 3.5ක් වශයෙන් ලබාගැනීම තුළින් බැංකුකරණ නිමයන්ට අනුකූලව අප ලබා තිබෙන ශක්තිමත් සන්නාම හිමිකම පිළිබිඹු කෙරේ. අඛණ්ඩව වසර දෙකක කාලයක් තුළ 3.5 කට අධික වූ සන්නාම හිමිකමක් අප විසින් පවත්වාගනු ලැබ තිබේ. මෙය ශක්තිමත් පාරිභෝගික ලැදියාව, පාරිභෝගික දැනුවත්භාවය, සැලකිලිමත්බව, සන්නාම සම්බන්ධය, මහජන බැංකුව සතු උසස් ප්‍රමිතිය ද පිළිබිඹු කරන්නකි. වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් 3.0 කට ඉහළ ලකුණු තත්ත්වයක් අප විසින් ලබාගෙන තිබීමෙන් අපගේ මිලියන 19 කට අධික පාරිභෝගික ප්‍රජාවගේ අප සතුව තිබෙන දැඩි බැඳීම සපථ වේ.

බැංකුකරණ සම්මතයන්			පෙර පැවති තාවකාලික වර්ධනය සමඟ A +/- 0.3 වෙනස වැදගත් තත්වයක් බවට සැළකේ.
ශක්තිමත් (>3)	මධ්‍යස්ථ (1-3)	දුර්වල (<1)	
ඉහළම 23%	ඊළඟ 44%	පහළම 32%	

මීට අමතර වශයෙන් වසර ගණනාවක් මුළුල්ලේ අප ලද සම්මානයන් හා පිළිගැනීම් අපගේ ශක්තිමත් සන්නාම වටිනාකම පිළිබඳ සාක්ෂි වේ. විශේෂයෙන් 2017 වසර සඳහා වූ "වසරේ සේවා සන්නාමය" සහ වසරේ බැංකු සේවා සපයන්නා" යන සම්මානයන් ස්ලිම් නිල්සන් පීපල්ස් සම්මාන උළෙලේ දී අඛණ්ඩව 11 වැනි වරටත් අප වෙත පිරිනැමුණු අතර ශ්‍රී ලාංකිකයන් අතර අප ලබා තිබෙන ශක්තිමත් සන්නාම හිමිකම එමගින් පිළිබිඹු වේ. ලෝක පූජිත "යුරෝපීය ජගත් බැංකුකරණ සහ මූල්‍ය සම්මාන 2017" උළෙලේ දී "වසරේ හොඳම බැංකුව 2017 - ශ්‍රී ලංකාව" යන විශිෂ්ඨ නාමය ද අප වෙත පිරිනමන ලදී.

සම්මානයන් සහ ගෞරවයන්

ලෝකයේ මූල්‍ය බැංකුකරණ සම්මානය 2017
හොඳම බැංකුකරණ ව්‍යාපාර සමූහය 2017 - ශ්‍රී ලංකාව
ශ්‍රී ලංකා විශිෂ්ටතම ධරණීය බැංකුව 2017 - ශ්‍රී ලංකාව

යුරෝපීය ජගත් බැංකුකරණ සහ මූල්‍ය සම්මානය - 2017
වසරේ හොඳම බැංකුව 2017 - ශ්‍රී ලංකාව
හොඳම CSR ක්‍රියාකාරකම් - ශ්‍රී ලංකාව

ස්ලිම් නිල්සන් ජනතා සම්මාන 2017
"වසරේ සේවා සන්නාමය"
අඛන්ඩ 11වැනි වසර සඳහා
"වසරේ බැංකු සේවා සපයන්නා"
අඛන්ඩ 11වැනි වසර සඳහා
"YES ඉතුරුම් ගිණුම"
ලෝකඩ සම්මානයෙන් පිදුම් ලැබීම

ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන 2017
පාරිසරික තිරසාරබව සඳහා වූ විශිෂ්ඨත්ව
කුසලතා සම්මානය වූ "බැංකු ක්ෂේත්‍රයේ ජයග්‍රාහක"
සම්මානය මහජන බැංකුවට හිමිවිය

සන්නාම සංවර්ධනය

බැංකුවේ පාරිභෝගික තෘප්තිමත්භාවයේ මට්ටම පිළිබඳව 2016 වසරේ දී පැවති 76% ක අගය සමග සැසඳීමේ දී 2017 වසරේ දී එය 91% ක් (අතිශයින්ම තෘප්තිමත්) වශයෙන් වර්ධනය වී තිබේ. මීට විශාල වශයෙන් හේතු වූයේ අපගේ පාරිභෝගිකයන්ට සුවිශේෂී සේවයක් සැලසීම සඳහා අප විසින් ක්‍රියාත්මක කළ නව ක්‍රමෝපායන් ය. විශේෂයෙන්ම අපගේ පාරිභෝගිකයන්ට දිවසේ පැය 24 පුරාම සතියේ සෑම දිනකම අවහිර බාධාවන්ගෙන් තොරව ගනුදෙනු කිරීමේ හැකියාව ඇතිකරමින් ක්‍රියාත්මකවන අපගේ ඩිජිටල්කරණ කාර්යයන් සහ නවීකරණය ද පාරිභෝගික සුවපහසුව සැලකියයුතු අයුරින් උසස් තත්ත්වයට පත්කර තිබේ. විවිධ ක්ෂේත්‍රයන්හි නිරතව සිටින විවිධ වයස් කාණ්ඩයන්ට අයත් පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සන්නාම විශේෂිත වූ ගිණුම් සහ ණය පහසුකම් කිහිපයක් ද අප විසින් හඳුන්වා දෙන ලදී. එසේම ලොව පුරාම රටවල් 103ක විසිරී සිටින 900ක් වූ අපගේ නියෝජිතයන්ගේ මාර්ගයෙන් මූල්‍ය සහ උපදේශන සේවාවන් සැලසීමෙන් ජාත්‍යන්තරව ව්‍යාපාර කාර්යයන්හි නිරතව සිටින අපගේ ව්‍යාපාරික සේවාදායකයන්ටත් අපගේ සේවය සලසන්නෙමු. සාමාන්‍යයෙන් අපගේ සේවාවන් පරිහරණය කිරීම සැලකිය යුතු අන්දමින් වර්ධනය වී ඇති අතර 2016 වසරේ දී සේවාවන් 1.8 ක් වූ එය 2017 වසරේ දී 3.0 ක් වී ඇත. මෙලෙස වැඩි වූ ප්‍රමාණයෙන් පෙනී යන්නේ අපගේ සේවාවන්ට සිදුකළ වැඩිදියුණු කිරීම් අපගේ පාරිභෝගිකයන් විසින් මැනවින් පිළිගෙන ඒවා වැළඳගෙන තිබෙන බවයි.

ශක්තිමත් සන්නාමයක් ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වාසය, සේවය, පහසුව හා තාක්ෂණය වැදගත් කාර්යභාරයක් ඉටුකරන බව අපගේ විශ්වාසයයි. අපගේ ඩිජිටල් බැංකුකරණ සේවාවන් ඔස්සේ මේ සියලු දේ අප විසින් සලසන්නේ එබැවිනි. ශ්‍රී ලංකා රජයෙන් ද අපට සහයෝගය දක්වන අතර එමගින් අපගේ බැංකුව මත වූ විශ්වාසය ඉහළ නැංවේ. "මහජනතාවගේ බැංකුව" වශයෙන් නිහතමානීව ගමන් ඇරඹූ අප ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික අභිවෘද්ධියට උපකාර කරන අතරම සියලුම තරාතිරම්වල ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වය උසස් මට්ටමකට පත්කරමින් ජාතියේ විශිෂ්ඨ බැංකුවක් බවට පත්ව තිබේ. ගෝලීය ප්‍රවණතාවන්ට අනුකූලව කටයුතු කරමින් ජනතාවගේ අපේක්ෂාවන් සපුරාලන පාරිභෝගික කේන්ද්‍රීය බැංකුවක් වශයෙන් අපගේ නවීකරණය කරන ලද අනන්‍යතාවය පිළිඹිබු කිරීම සඳහා අපගේ සංස්ථාපිත ලාංඡනය ද නැවත දියත් කරන ලදී. අපගේ පාරිභෝගිකයන්ගේ ජීවන තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන අපගේ ආකල්පයන් වූ පහසුකම්, විශ්වසනීයත්වය සහ රහස්‍යභාවය ආදිය මෙමගින් නැවත ආවරණය කෙරේ.

සංස්ථාපිත සංස්කෘතිය

"මහජනතාවගේ බැංකුව" සහ ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම රජයේ බැංකුව ද වශයෙන් අපගේ කොටස්කරුවන් වෙත ස්ථිරසාර වූත් ධරණීය වූත් වටිනාකම් ඇතිකිරීම අරමුණු කරගත් අගය මත පදනම් වූ සංස්කෘතියක අප පිහිටා සිටින්නෙමු. අපගේ සංස්ථාපිත වටිනාකම්වලට කිඳාබැස තිබෙන නවෝත්පාදන, අවංකත්ව, විශිෂ්ඨ සහ විශ්වාසය සහිත වූ සංස්කෘතියක් අප විසින් නිර්මාණය කරන්නෙමු.

අපගේ සංස්ථාපිත අනන්‍යතාවය ඔපවත් කරන වටිනාකම් වන්නේ ජනතාවගේ හදගැස්ම වීම, පාරිභෝගික කේන්ද්‍රීය වීම සහ ක්‍රියාශීලි වීම, අවංකත්වය සහ වගකිවයුතු බව, අනවරතව ඉගෙනීමේ සංස්කෘතිය සහ කණ්ඩායම් හැඟීම සහ බලගැන්වීම සහ විවිධත්වය ආදියයි. මෙම වටිනාකම් ආරම්භයේ පටන්ම අපගේ සේවකයන්ට කාවද්දන අතරම පුහුණු ප්‍රවර්ධන වැඩසටහන් ඔස්සේ ඒවා ඔපවත් කෙරේ.

යහපත් ආයතනිය පාලනයක් සහතික නෙරෙන පරිපාලන ව්‍යවහාරයන් වන ශක්තිමත් ව්‍යාපාරික ආචාර ධර්ම, යහපත් ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් ද ඵලදායී හා කාර්යක්ෂම නියාමන ක්‍රමවේදයන් ද මගින් අපගේ සංස්ථාපිත සංස්කෘතිය පෝෂණය කරනු ලැබේ.

විනෝදාත්මක සහ සංස්කෘතික වැඩසටහන් ඔස්සේ සේවකයන්ගේ විධිමත් සහ අවිධිමත් සහභාගිත්වය දිරිගන්වමින් විවෘත සන්නිවේදන සංස්කෘතියක් ද අපි පෝෂණය කරන්නෙමු.

ආයතනික දැනුම

බැංකු ක්ෂේත්‍රය පිළිබඳ 56 වසරකට අධික පළපුරුද්දක් අපට තිබෙන අතර කර්මාන්තය පිළිබඳ පුළුල් සහ විශේෂඥ දැනුමක් අප විසින් අත්කරගෙන තිබේ. අප ලබා තිබෙන දැනුම විශිෂ්ඨත්වයට පත්වීමේ පමණක් නොව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් බවට පත්වීමේ හැකියාව ද අපට ලබා දී තිබේ. අපගේ ඩිජිටල්කරණ කාර්යයන් අපට බොහෝ මංපෙත් විවරකර දී තිබෙන අතරම වෙළඳපලෙහි අපගේ බැංකුව පිළිබඳව තිබුණු ප්‍රතිඡ්ඡාවන් ද වෙනස්කර තිබේ.

ලේඛනගත නොකරන ලද පහසුවෙන් අනාවරණය කළ නොහැකි පුද්ගලානුබද්ධ ලෙස පවතින නිහඬ දැනුමක් ද අප සතු වේ. කාර්ය ශිල්පීය ක්‍රමයන් පිළිබඳ පළපුරුද්ද කාර්ය ක්‍රමවේදයන් සහ අභියෝගයන්ට මුහුණදීමේ දී මතු වූ ඇතැම් ගැටළු ආදිය ඔස්සේ ඇතිකරගත් දැනුම් සම්භාරය මීට ඇතුළත් වේ. වසර 25 කට අධික සේවා කාලයක් සහිත සේවකයන් 1,042 ක් සහිතව ඉතා පුළුල් වූ නිහඬ දැනුමක් අප අත්කරගෙන තිබෙන අතර එය බැංකුවේ අනවරත සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය අංගයකි.



මීට අමතරව අපගේ සේවකයන් විවිධ පසුබිම් සහ සුදුසුකම්වලින් සමන්විත වේ. ඔවුනගේ දැනුම් සම්භාරයේ විවිධත්වය අපගේ බැංකුවේ සාර්ථකත්වය සම්බන්ධයෙන් වූ වැදගත් සම්පතක් වේ. පහත වගුවේ දැක්වෙන පරිදි වූ විවිධ සුදුසුකම් සහිත සේවකයන් 3,792 ක් සිටී.

සුදුසුකම් මට්ටම	සේවක සංඛ්‍යාව
M.Sc./MBA/පශ්චාත් උපාධි	279
BA/B.sc.	1,301
CIMA/CFA/CMA/ICASL/බැංකුකරණය	1,860
නීති ක්ෂේත්‍රයේ සුදුසුකම් සහිත	76
තොරතුරු තාක්ෂණයේ සුදුසුකම් සහිත	195
ඩිප්ලොමා සහ වෙනත්	81
එකතුව	3,792

අපගේ ඩිජිටල්කරණ කාර්යය

ශ්‍රී ලංකාවේ ඉහළම ඩිජිටල්කරණ සහිත බැංකුව බවට පත්වීමේ අරමුණින් යුතුව වැදගත් ඩිජිටල්කරණ කාර්යය ඇරඹීම සඳහා වූ ක්‍රමෝපායික තීන්දුවක් මහජන බැංකුව විසින් 2015 වසරේ දී ගනු ලැබිණි. ඒ අනුව පහසුවෙන් වර්ධනය කළහැකි මෙන්ම අනාගතයේ අවශ්‍යතාවයන්ට අනුව පරිමාව පුළුල් කිරීමේ හැකියාව ද සහිත වූ ඉතා උසස් තාක්ෂණයෙන් යුතු වූ ක්‍රමයක් ඩිජිටල්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අප විසින් තෝරාගන්නා ලදී. ශ්‍රී ලංකාවේ එවැනි පළමු තාක්ෂණ ක්‍රමවේදය වූ එය බැංකු ක්ෂේත්‍රයේ පෙර නොවූවිරූ තරම් ප්‍රතිලාභයන් අපට අත්කර දී තිබේ. මෙම ඩිජිටල්කරණ ක්‍රියාවලිය විසින් ඉක්මන් සහ පහසු ඩිජිටල් බැංකු කාර්ය අත්දැකීම් සහිත වූ ගිණුමක් ඇරඹීම, ණය ඉල්ලුම් කිරීම, ජංගම බැංකු කටයුතු සහ අන්තර්ජාල බැංකු කටයුතු සිදු කිරීමට පහසුකම් සැලසීමෙන් බැංකුවේ සියලුම මෙහෙයුම් කාර්යයන් ඉහළ මට්ටමකට පරිවර්තනය වී තිබේ.

ගණුදෙනුකරුවන්ට ඉහළ පහසුකම් සැලසීමේ සහ උසස් තත්වයේ සේවාවන් සැපයීම ඔස්සේ ඔවුන් බලගැන්වීමට අපගේ තිබෙන කැපවීම මෙම ඩිජිටල්කරණ කාර්යය පිළිබඳව වූ හැඟීම අවදි කරන ලදී. ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රයේ විශාලතම පාරිභෝගික පදනම සහිත බැංකුව වශයෙන් නවීනතම ගෝලීය පාරිභෝගික වෙළඳපළ ප්‍රවණතාවන්ට ගැලපෙන පරිදි වූ ඩිජිටල්කරණ ක්‍රමවේදයන් දියත් කිරීමෙන් ක්ෂේත්‍රයේ අපගේ නායකත්වය අපි ප්‍රදර්ශනය කරමු. මහජන බැංකුවේ වොයිස් ඇප් (VOICE APP) ක්‍රමය මගින් පාරිභෝගිකයන්ගේ ඇන්ඩ්‍රොයිඩ් සහ වින්ඩෝස් ස්මාට් ජංගම දුරකථන මගින් අසමසම අත්දැකීමක් විඳගැනීමට ඔවුන්ට හැකිවන පරිදි අප විසින් ඇතිකරමින් තිබෙන බොහෝ ඇප් පහසුකම් අතර පළමුවැන්න වන අතර සරළ හඬ විධානයකින් තම ගිණුම් ශේෂය ජංගම දුරකථනය මගින් පරීක්ෂා කිරීමේ හැකියාව මෙමගින් ඔවුන්ට ලබා දී තිබේ.

තරුණ ප්‍රජාවට හරිත බැංකුකරණය හඳුන්වාදීමට අමතරව පාරිභෝගික පහසුව ඉහළ නංවනු පිණිස දවසේ පැය 24 පුරාම වසරේ දින 365 දීම ක්‍රියාත්මක වන, අතිනවීන ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATMs) මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDMs) සහ කියොස්ක් මධ්‍යස්ථාන ආදියෙන් සමන්විත ස්වයංක්‍රිය බැංකුකරණ මධ්‍යස්ථානයන් අප විසින් ස්ථාපිත කර තිබේ. අපගේ CDM යන්ත්‍ර මගින් මුදල් තැන්පත් කිරීම් සහ ශේෂ පිරික්සුම් කාර්යයන්ට අමතරව ඔබගේ වෙනත් උපයෝගිතා බිල්පත් ගෙවීමේ පහසුකම් ද සැලසේ. සාමාන්‍ය පහසුකම් වලට අතිරේකව කාඩ්පත් නොමැතිව මුදල් ආපසු ලබාගැනීමෙත් ක්‍රෙඩිට් කාඩ්පත් පාවිච්චි කරමින් අත්තිකාරම් මුදල් ලබාගැනීමෙත් පහසුකම් ATM යන්ත්‍ර මගින් සලසා දී තිබේ. ක්ෂණික යාවත්කාලීන වීම සහිතව ගිණුමෙන් සෘජුවම බිල්පත් ගෙවීමේ පහසුකම CDM යන්ත්‍ර සහ කියොස්ක් මධ්‍යස්ථාන මගින් සැලසේ. මෙම පහසුකම බැංකුවේ පාරිභෝගිකයන්ට මෙන්ම පාරිභෝගිකයන් නොවන අයට ද පාවිච්චි කිරීමේ හැකියාව සහිත වේ. දිවයින පුරාම ස්වයං බැංකුකරණ මධ්‍යස්ථාන 100 ක් පිහිටුවීමේ අරමුණ සහිතව මේ වනවිට ස්ථාන බොහොමයක ස්වයං බැංකුකරණ මධ්‍යස්ථාන පිහිටුවා තිබේ.

ශ්‍රී ලංකාවේ උපරිම ඩිජිටල්කරණයක් සහිත වූ බැංකුව බවට පත්වීමෙන් සියලුම දෙනාට ප්‍රවේශ විය හැකි තත්වයේ විශ්වීය සංඛ්‍යාත පරාසයක් අප සතුවනු ඇති බැවින් එමගින් පරිපූර්ණ වශයෙන් සියලුම මූල්‍ය සේවාවන් ඉටුකිරීමේ ශක්තිය අපට තිබේ. අපගේ උන්නතිගාමී ඩිජිටල්කරණ කාර්යය තුළින් අපගේ පාරිභෝගිකයන්ට අසමසම ඩිජිටල් අත්දැකීම් ලබාදෙන අතරම ශ්‍රී ලංකාවේ බැංකුකරණ සහ මූල්‍ය සේවාවන් ජාත්‍යන්තර ඩිජිටල් ක්‍රියාකාරකම්හි තත්ත්වයට උසස් කිරීමට ද අපව බලගන්වනු ඇත.

ඩිජිටල්කරණ ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා ඩිජිටල්කරණයේ සියලුම අංශයන් හා ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ අපගේ කාර්ය මණ්ඩලයට පෞද්ගලික පුහුණුවක් ලබාදෙන ලදී. ඩිජිටල් බැංකුකරණය ප්‍රධාන වශයෙන්ම තාක්ෂණ දැනුම සහිත තරුණ ප්‍රජාව සහ සහස්‍රක ප්‍රජාව සඳහා වන අතර පැරණි සහ නූතන ක්‍රමයන් දෙකම ක්‍රියාත්මකවන ශාඛාවන් පවත්වා ගනිමින් තාක්ෂණ දැනුම නොමැති පාරිභෝගිකයන්ට ද පරිගණක මගින් බැංකුකරණ කාර්යයන් කිරීමේ ඇති ප්‍රතිලාභ පිළිබඳව අධ්‍යාපනයක් ලබාදීම සිදුකෙරේ.

ව්‍යාපාරික ආචාර ධර්ම

ඉහළම තත්ත්වයේ ව්‍යාපාරික ආචාර ධර්මයන් සහ යහපත් ගුණාංගයන් අපි අනුගමනය කරන්නෙමු. අපගේ ආයතනයේ සියලුම මට්ටම් සඳහා ව්‍යාපාරික ආචාරධර්මයන් අන්තර්ගත කර තිබේ. සංස්ථාපිත පරිපාලන වාර්තාවේ 34 වැනි පිටුවේ විස්තර කර තිබෙන පරිදි පරිපූර්ණ පරිපාලන ව්‍යුහයත් අප සතුවේ.

නවෝත්පාදනය

අපගේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් වැඩිදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකාවේ මේ දක්වා වූ පළමුවැනි නවෝත්පාදන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ඩිජිටල් ක්‍රියාකාරකම්හි ප්‍රමුඛත්වය ගනිමින් අප විසින් දියත් කළෙමු. දිවයින පුරා විසිරි තිබෙන අපගේ ශාඛා ජාලය සමග කාර්යක්ෂමව සම්බන්ධ වීමේ මධ්‍යගත උපකාරයක් මෙම නවීකරණ මධ්‍යස්ථානයෙන් සැලසෙන අතරම එමගින් අපව බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයට පත්කරනු ඇත.

අනාගත දැක්ම

අපගේ පාරිභෝගිකයන්ට තවදුරටත් වටිනාකම් ඇතිකරගැනීමට හැකිවන පරිදි නවීනතම සහ වඩාත් පහසුකම් සහිත බැංකුකරණ විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා අපගේ සංස්ථාපිත සන්නාමය අපි තවදුරටත් ශක්තිමත් කරන්නෙමු. අපගේ බැංකුවේ හා පාරිභෝගිකයන්ගේ වේගවත් අභිවෘද්ධිය ඇතිකිරීම සඳහා අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය කවදුරටත් ඉදිරියට ගෙන යන්නෙමු. ප්‍රමුඛ පෙළේ රාජ්‍ය බැංකුවක් වශයෙන්, ඩිජිටල්කරණය සහිත වූ රාජ්‍ය බැංකුවක් අපගේ ආර්ථිකයට සහ අපගේ සියලුම කොටස්කරුවන්ට ප්‍රවර්ධනය වූ වටිනාකම් ලබාදෙනු ඇතැයි අපි දැඩිව විශ්වාස කරමු.

මානව ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂිතා

8,454
ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වූ සේවකයන්

525
ඇළුතින් බඳවාගැනීම්

60%
කාන්තා සේවිකාවන්

24
එක් සේවකයකු සඳහා පුහුණු පැය ගණන

සේවකයන්ට වටිනාකම් සැලසීම

බැංකුවේ උපායමාර්ගික සේවා පහසුකම් ධරණිය සහ ලාභදායී වර්ධනයක් සාක්ෂාත් කරගැනීමෙන් බැංකුවට ඉතා වැදගත්වන අපගේ කැපවීමෙන් යුතු සේවකයන්ට වඩාත් ඉහළ වටිනාකම් සැලසීමට අපි නිරන්තරයෙන් උත්සහ දරන්නෙමු.

අපගේ මානව ප්‍රාග්ධනය අගයන් ඇතිකිරීමේ ක්‍රියාවලිය

යෙදවුම්

පුහුණු සහ නිපුණ සේවකයන්/ සේවකයන්ගේ විවිධත්වය

හිතකර සේවා වටපිටාව

වැටුප් සහ ප්‍රතිලාභ

සොබ්‍ය සහ ආරක්ෂාව දුක් ගැහවිලි විසඳීම

ක්‍රියාවලිය

සේවක සබඳතා, නිපුණතා දියුණු කිරීම, සේවක සහභාගිත්වය

නිමැවුම

සේවක පුහුණු සහ වර්ධනය සඳහා රුපියල් මිලියන 72ක්

එක් සේවකයකු සඳහා සේවක පුහුණු පැය 24

එක් සේවකයකු සඳහා ආදායම රුපියල් මිලියන 15

ප්‍රතිඵල

දිගු සේවා කාලයක්

කැපවුණු සහ අභිප්‍රේරිත සේවකයන්

සේවක පිරිස බැංකුවේ දැක්මට පෙළගැස්වීම

සේවකයන්ගේ පෞද්ගලික දියුණුව

මානව සම්පත් සංඛ්‍යා දත්ත

	2017	2016	2015	2014	2013
පුරුෂ සේවක පිරිස	**3,402**	3,367	3,443	3,439	3,358
ස්ත්‍රී සේවක පිරිස	**5,052**	4,882	4,925	4,717	4,051
සමස්ථ සේවක පිරිස	**8,454**	8,249	8,368	8,156	7,409
එක් සේවකයකු සඳහා ලාභය (රු. '000)	**2,159**	1,818	1,505	1,743	1,011
එක් සේවකයකු සඳහා ආදායම (රු. '000)	**19,182**	14,804	12,368	11,817	16,258



මානව ප්‍රාග්ධන කළමණාකරණය

8,000කට අධික සේවක සංඛ්‍යාවකින් සමන්විත මහජන බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුවලින් එකක් වේ. අපගේ සාර්ථකත්වය ශක්තිමත්ව තිබෙන්නේ අපගේ සේවා සැලසීම වැදගත්වන අභිප්‍රේරිත සහ කාර්යබහුල සේවක කණ්ඩායම මගිනි. අපගේ බැංකුවට නිපුණතා සහිත පුද්ගලයන් ආකර්ෂණය කරගැනීමටත් ඔවුන්ගේ දියුණුවට උපකාර කිරීමටත් අපි උත්සහ දරන්නෙමු. එබැවින් ඍජුවම ගරුත්වය සහ කැපවීම මත පදනම් වූ ඉහළ කාර්යසාධනයක් සහිත ප්‍රබෝධවත් සේවා පරිසරයක් අපි පෝෂණය කරන්නේමු.

සමාන අවස්ථාවන් සලසන සේවායෝජකයෙකු වශයෙන් ස්ත්‍රී, පුරුෂ භාවය, ජනවර්ගය, ජාතිය, ආගම සහ වයස ආදී වශයෙන් විවිධාකාර වූ ශ්‍රම බලකායක් අපි අභිවර්ධනය කරන්නෙමු. ව්‍යවස්ථාපිත වත්කමක් වූ මෙම විවිධත්වය අපගේ ආයතනික සංස්කෘතිය සාරවත් කර තිබේ. ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයේ ඉහළම කාන්තා නියෝජනයන් සහිත බැංකු වලින් එකක් වන අතර, 2017 දී එය 60% ප්‍රමාණයකින් සමන්විත වීම පිළිබඳව අපගේ බැංකුව ආඩම්බර වේ. බඳවාගැනීම් ඔස්සේ නිපුණතාවයන් ද අභ්‍යන්තර සංවර්ධනය ද උසස් කිරීම් සහ පුහුණු කිරීම් ආදියෙහි ආයෝජනයන් කිරීමෙන් අපගේ ආයතනය අප විසින් ශක්තිමත් කර තිබේ. ඉදිරි වසර කිහිපයේ දී අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වූ වඩාත් ශක්තිමත් තත්වයකට අපගේ බැංකුව ඔසවා තබමින් මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීම සඳහා බඳවාගැනීම්, සංවර්ධනය සහ පුහුණුව ආදියෙහි 2017 වසරේ දී සැලකිය යුතු ආයෝජනයක් කර තිබේ.

මානව සම්පත් (HR) ක්‍රමෝපාය

විශිෂ්ඨතම පුද්ගලයන් බඳවාගෙන ඔවුන්ගේ දියුණුව සලසා එම විශිෂ්ඨත්වයන් අපගේ ක්ෂේත්‍රයට යෙදවීම අපගේ ඉලක්කය වේ. සංස්ථාපිත ක්‍රමෝපායට සරිලන අපගේ මානව සම්පත් ක්‍රමෝපාය අනුපිළිවෙල සැලසුම් කිරීම, පරිමා සැලසුම් කිරීම සහ කාර්යසාධන කළමණාකරණය නමැති ක්‍රමෝපායික ස්ථම්භයන් මත පදනම් වේ. උන්නතිකාමී සහ නිපුණ තරුණ පුද්ගලයින් ආකර්ෂණය කරගැනීමේ සහ අපගේ බැංකුවේ නායකත්ව තනතුරු දැරීම සඳහා පුහුණු කිරීමේ අපගේ හැකියාව මත පදනම්ව අපගේ ක්‍රමෝපායේ ඵලදායිතාවය අප විසින් ප්‍රමාණාත්මක කරනු ලැබේ. නිපුණතා සහිත විවිධත්වයෙන් යුතු සේවකයින් සංචිතයක් ආකර්ෂණය කරගැනීමට සහ රඳවා ගැනීම අප සතු හැකියාව අපගේ සාර්ථක ක්‍රමෝපාය සැලසීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රබල ජනප්‍රියතාවයත් සහිත සේව්‍යයා වශයෙන් කීර්තිනාමයක් සතු කරගැනීම පිළිබඳව වූ ප්‍රබල සාක්ෂියක් වේ.

මානව සම්පත් පාලනය

අපගේ සේවක වටිනාකම් තීරණය කිරීම සිදු කරනු ලබන්නේ ඵලදායි සහ විනිවිදභාවයෙන් යුක්ත වූ මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාවලින් මගිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මානව හිමිකම් සහ වටිනාකම් ගරුකිරීමේ සංස්කෘතියක් පෝෂණය කරන ආචාරධර්ම පද්ධතියක් බැංකුව මගින් ක්‍රියාත්මක කෙරේ. එබැවින් බැංකුවේ සමස්ථ මානව සම්පත් ප්‍රතිපත්තියට අනුකූලව වෘත්තිය සමිති සමග යහපත් සහ සම්බන්ධතාවයත් පවත්වා ගැනීමට බැංකුව දැඩිව උත්සහ දරයි. තවද ළමයින් සේවයේ යෙදවීම හෝ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම අප විසින් නොකරන අතරම අපගේ ව්‍යාපාර මෙහෙයුම කාර්යයන්හි අපගේ සේවා ස්ථානයන්හි හිරිහැර කිරීම් හෝ වෙනස් ආකාරයෙන් සැලකිම් කිසිවක් නැත. බැංකුවේ මානව සම්පත් ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවක් වන මානව සම්පත් සහ වැටුප් ගෙවීමේ කමිටුව වෙත පවරා දී තිබේ. බැංකුවේ මානව සම්පත් අංශය මගින් අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන අතර වරින් වරට ඒ පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයට වර්තා කරයි.

අපගේ මානව සම්පත් පාලන ව්‍යුහය



මහජන බැංකු කණ්ඩායම

2017 මුදල් වර්ෂය අවසන දී අපගේ කණ්ඩායම 8,454ක සේවක පිරිසකගෙන් සමන්විත විය. ඊට පෙර මුදල් වර්ශය සමඟ සසඳන කළ මෙය 205ක වර්ධනයකි.

මහජන බැංකු කණ්ඩායමේ විස්තරයක් පහත දැක්වේ.

රැකියා ගිවිසුම හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව සමස්ථ සේවක සංඛ්‍යාව

	2017			2016		
සංඛ්‍යාව	**පුරුෂ**	**ස්ත්‍රී**	**එකතුව**	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ස්ථිර කාර්ය මණ්ඩලය	**2,931**	**4,622**	**7,553**	2,771	4,370	7,141
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	**471**	**430**	**901**	596	512	1,108
එකතුව	**3,402**	**5,052**	**8,454**	3,367	4,882	8,249

රැකියා ගිවිසුම සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සම්පූර්ණ සේවක සංඛ්‍යාව



ස්ත්‍රී පුරුෂ භාවය අනුව සම්පූර්ණ සේවක සංඛ්‍යාව - 2017



සේවක වර්ගය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සමස්ත ස්ථිර සේවක සංඛ්‍යාව

	2017					2016				
රැකියා ප්‍රභේදය	**පුරුෂ සංඛ්‍යාව**	**ස්ත්‍රී සංඛ්‍යාව**	**සම්පූර්ණ සංඛ්‍යාව**	**පුරුෂ %**	**ස්ත්‍රී %**	පුරුෂ සංඛ්‍යාව	ස්ත්‍රී සංඛ්‍යාව	සම්පූර්ණ සංඛ්‍යාව	පුරුෂ %	ස්ත්‍රී %
සංස්ථාපිත කළමනාකරණ	**11**	**3**	**14**	**0.1**	**0.0**	11	5	16	0.2	0.0
විධායක කළමනාකරණ	**13**	**17**	**30**	**0.2**	**0.2**	15	15	30	0.2	0.2
නිලධාරීන් (3-III - I ශ්‍රේණිය)	**1,271**	**2,143**	**3,414**	**16.8**	**28.4**	1,218	1,793	3,011	17.1	25.1
කාර්ය මණ්ඩල සහකාර ශ්‍රේණිය	**916**	**1,899**	**2,815**	**12.1**	**25.1**	1,057	2,221	3,278	14.8	31.1
අනෙකුත් ප්‍රභේදයන්	**720**	**560**	**1,280**	**9.5**	**7.4**	470	336	806	6.6	4.7
එකතුව	**2,931**	**4,622**	**7,553**	**38.8**	**61.2**	2,771	4,370	7,141	38.8	61.2

2017 වසරේ දී අංශ අනුව සමස්ථ සේවක සංඛ්‍යාව

	සේවක සංඛ්‍යාව		
	ස්ථිර	කොන්ත්‍රාත්	එකතුව
ශාඛාවන්	**5,597**	**556**	**6,153**
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල	**797**	**134**	**931**
භාණ්ඩාගාරය සහ ප්‍රාථමික වෙළඳ ඒකකය	**30**	**5**	**35**
සංස්ථාපිත සහ අක්වෙරළ බැංකු ඒකකය	**164**	**22**	**186**
එතෙර පාරිභෝගික සේවා අංශය	**86**	**5**	**91**
පීපල්ස් කාඩ් මධ්‍යස්ථානය	**35**	**17**	**52**
ප්‍රධාන කාර්යාලය	**844**	**162**	**1,006**
එකතුව	**7,553**	**901**	**8,454**

2017 වසරේ දී භූගෝලීය ව්‍යාප්තිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව සමස්ථ සේවක සංඛ්‍යාව

	පුරුෂ		ස්ත්‍රී		එකතුව		එකතුව %	
	2017	2016	2017	2016	2017	2016	2017	2016
බස්නාහිර	**1,270**	1,248	**2,055**	2,026	**3,325**	3,274	**39.3**	39.7
දකුණ	**322**	320	**563**	519	**885**	839	**10.5**	10.2
මධ්‍යම	**343**	341	**546**	532	**889**	873	**10.5**	10.6
උතුර	**191**	188	**216**	215	**407**	403	**4.8**	4.9
උතුරු - මධ්‍යම	**247**	239	**323**	299	**570**	538	**6.7**	6.5
ඌව	**229**	215	**287**	262	**516**	477	**6.1**	5.8
සබරගමුව	**216**	206	**356**	338	**572**	544	**6.8**	6.6
වයඹ	**271**	288	**401**	393	**672**	681	**7.9**	8.3
නැගෙනහිර	**313**	322	**305**	298	**618**	620	**7.3**	7.5
එකතුව	**3,402**	3,367	**5,052**	4,882	**8,454**	8,249	**100**	100

පළාත සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සමස්ථ සේවක සංඛ්‍යාව - 2017



වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සමස්ථ සේවක සංඛ්‍යාව

වයස	2017			2016		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
56 >	**364**	**236**	**600**	488	269	757
46 - 55	**782**	**733**	**1,515**	747	719	1,466
26 - 45	**2,106**	**3,836**	**5,942**	1,948	3,430	5,378
18 - 25	**150**	**247**	**397**	175	473	648
එකතුව	**3,402**	**5,052**	**8,454**	3,358	4,891	8,249

සේවය කළ වසර ගණන මත පදනම් වූ සේවක සංඛ්‍යාව - 2017



සේවය කළ වසර ගණන සහ සේවක වර්ගය අනුව සමස්ථ සේවක සංඛ්‍යාව 2017

වර්ගය	සේවය කළ වසර සංඛ්‍යාව						
	<2	3-10	11-20	21-30	31-35	>36	එකතුව
සංස්ථාපිත කළමනාකරණය	4	1	1	6	6	2	14
විධායක කළමනාකරණය	2	–	3	14	10	3	30
නිලධාරීන් (3-III – I ශ්‍රේණිය)	129	1,229	663	1,020	28	345	3,414
කාර්ය මණ්ඩල සහයක ශ්‍රේණිය	932	1,734	36	104	–	9	2,815
අනෙකුත් වර්ගයන්	638	11	109	489	4	29	1,280
කළමනාකරණ ප්‍රහුණුවන්නන්	184	–	–	–	–	–	184
පාරිභෝගික සේවා සහකරුවන්	102	3	–	–	–	–	105
අනෙකතුත් ගිවිසුම්ගත සේවකයන්	601	3	–	–	–	–	604
එකතුව	**2,592**	**2,981**	**812**	**1,633**	**48**	**388**	**8,454**

බඳවා ගැනීම

අපගේ සාර්ථකත්වයට අත්‍යවශ්‍යවන සුදුසුකම් ලත් සහ නිපුණතා සහිත පුද්ගලයන් අපගේ බැංකුවට බඳවා ගැනීමට අපි කැපවී සිටිමු. අපගේ බැංකුවට අවශ්‍ය කරන මානව සම්පත් සපුරාගැනීම සඳහා අවශ්‍ය නිපුණතා හා ශක්‍යතා සහිත නිවැරදි අයදුම්කරු බඳවා ගැනීම සඳහා විධිමත් බඳවා ගැනීම් ප්‍රතිපත්තියක් සකසා තිබේ. ඉහළ කීර්තියක් සහිත රාජ්‍ය බැංකුවක් වශයෙන් බැංකු ක්ෂේත්‍රයේ තරුණ සහ උන්නතිගාමී කුසලතාවය ආකර්ශනය කරගැනීම සහ රඳවා තබාගැනීමට අපට හැකිවී තිබේ. ඊට අනුකූලව අපගේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා සමාලෝචිත වසර තුළ දී සේවකයන් 525ක් බඳවා ගන්නා ලදී. අලුතින් බඳවාගත් සේවක සංඛ්‍යාවෙන් 25 % ක් වයස අවුරුදු 25 ට අඩු අය වන අතර, ඉන් 74% ක් වයස අවුරුදු 26-45 ත් වයස් කාණ්ඩයට අයත් වේ.

බැංකුවේ මධ්‍ය කාලීන උපායමාර්ගය මත පදනම්ව කළමනාකරණ ප්‍රහුණුවන්නන් සහ පාරිභෝගික සේවා සහකරුවන් සෑම වසර තුනකට වරක් බඳවා ගැනේ. සියලුම බඳවා ගැනීම් රාජ්‍ය ආයතන රෙගුලාසිවලට අනුකූලව හැකියාව මැන බැලීමේ පරීක්ෂණයන් සහ විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් මගින් විනිවිදතාවයෙන් යුතුව සිදුකරනු ලැබේ. අපගේ ශාඛාවන් පිහිටි ප්‍රදේශයන් තුළින් රැකියාවට බඳවාගැනීමට අප ප්‍රමුඛත්වය දෙන අතර අපගේ පුළුල්ව පැතිරුණු ශාඛා ජාලය මගින් පහසුකම් සැලසේ. ඒ අනුව 2017 වසරේ දී අලුතින් බඳවාගත් පිරිස අතුරින් 75% ක් පිටපළාත්වලින් තෝරාගන්නා ලදී. තෝරාගත් අයදුම්කරුවන් වසරක පරිවාස කාලයක් සම්පූර්ණ කිරීම අනිවාර්ය වන අතර, ඉන් අනතුරුව ඔවුන් ස්ථිර සේවක මණ්ඩලයට අනුයුක්ත කෙරේ. වසර තුළ දී බඳවාගත් පිරිසෙන් 54% ක් කාන්තාවන් බව සඳහන් කිරීම වැදගත් වන්නේ එමගින් අපගේ අපක්ෂපාතී හා සාධාරණ බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය පැහැදිලි වන බැවිනි.

2017 වසර සඳහා

වයස් කාණ්ඩය	සේවකයන් සංඛ්‍යාව		
	සම්පූර්ණ සංඛ්‍යාව	පුරුෂ සංඛ්‍යාව	ස්ත්‍රී සංඛ්‍යාව
අවුරුදු 18-25	**133**	**76**	**57**
අවුරුදු 26-45	**386**	**159**	**227**
අවුරුදු 46-55	**3**	**2**	**1**
අවුරුදු 56	**3**	**2**	**1**
එකතුව	**525**	**239**	**286**

2017 වසර සඳහා බඳවාගැනීම් - කළාපය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව

කළාපය	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ %	ස්ත්‍රී %
අනුරාධපුරය	14	19	33	42	58
බදුල්ල	13	24	37	35	65
මඩකලපුව	3	2	5	60	40
කොළඹ	76	54	130	58	42
ගම්පහ	12	5	17	71	29
ගාල්ල	3	11	14	21	79
යාපනය	1	3	4	25	75
මහනුවර	6	2	8	75	25
කළුතර	3	4	7	43	57
කුරුණෑගල	4	5	9	44	56
කෑගල්ල	8	8	16	50	50
මාතර	7	16	23	30	70
මාතලේ	1	6	7	14	86
නුවරඑළිය	16	23	39	41	59
රත්නපුරය	16	24	40	40	60
අම්පාර	9	2	11	82	18
ත්‍රිකුණාමලය	3	6	9	33	67
පොළොන්නරුව	11	16	27	41	59
මොණරාගල	11	14	25	44	56
පුත්තලම	1	10	11	9	91
වන්නි	6	3	9	67	33
හම්බන්තොට	15	29	44	34	66
එකතුව	**239**	**286**	**525**	**46**	**54**

2017 නව බඳවා ගැනීම්



දේශීය වශයෙන් බඳවාගත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ප්‍රතිශතය

බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සියල්ලම සපුරාගනු ලැබ ඇත්තේ ශ්‍රී ලාංකික පුරුවැසියන්ගෙනි.

කළාපය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව බඳවා ගැනීම් - 2017



A – අනුරාධපුරය දිස්ත්‍රික්කය
B – බදුල්ල දිස්ත්‍රික්කය
C – මඩකලපුව දිස්ත්‍රික්කය
D – කොළඹ දිස්ත්‍රික්කය
E – ගම්පහ දිස්ත්‍රික්කය
F – ගාල්ල දිස්ත්‍රික්කය
G – යාපනය දිස්ත්‍රික්කය
H – මහනුවර දිස්ත්‍රික්කය
I – කළුතර දිස්ත්‍රික්කය
J – කුරුණෑගල දිස්ත්‍රික්කය
K – කෑගල්ල දිස්ත්‍රික්කය
L – මාතර දිස්ත්‍රික්කය
M – මාතලේ දිස්ත්‍රික්කය
N – නුවරඑළිය දිස්ත්‍රික්කය
O – රත්නපුර දිස්ත්‍රික්කය
P – අම්පාර දිස්ත්‍රික්කය
Q – ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
R – පොළොන්නරුව දිස්ත්‍රික්කය
S – මොණරාගල දිස්ත්‍රික්කය
T – පුත්තලම දිස්ත්‍රික්කය
U – වන්නි දිස්ත්‍රික්කය
V – හම්බන්තොට දිස්ත්‍රික්කය

ප්‍රසූත නිවාඩු

වර්ෂය තුළදී සේවිකාවන් 230 දෙනෙකු ප්‍රසූත නිවාඩු ලබාගත් අතර නැවත සේවයට පැමිණීම මෙන්ම ඔවුන් සේවයේ රැඳී සිටීමේ තත්ත්වයද පසුගිය සිව් වසරක කාලය පුරා සිත්ගන්නා ලෙස 100% ක් විය.

	2017	2016	2015	2014
ප්‍රසූත නිවාඩු හිමිකම් සහිත සේවිකාවන් සංඛ්‍යාව	**3,702**	3,690	3,430	3,093
ප්‍රසූත නිවාඩු ලබාගත් සේවිකාවන් සංඛ්‍යාව	**230**	536	566	773
ප්‍රසූත නිවාඩුවෙන් පසුව සේවයට පැමිණි සේවිකාවන් සංඛ්‍යාව	**230**	536	566	773
නැවත සේවයට පැමිණීම (%)	**100**	100	100	100

(විවාහක ස්ථිර සේවයන් හට පමණක් හිමිකම් ලැබේ.)

කාර්ය සාධනය ඇගයීම

පූර්වයෙන් තීරණය කරන ලද නිර්නායකයන් යොදා ගැනීම මගින් සියලුම සේවකයන්ව වාර්ෂිකව ඇගයීමට ලක්කරනු ලැබේ. 2016-2020 උපායමාර්ගික සැලසුමට අනුකූලව දෙයාකාර වූ නව කාර්යසාධන ඇගයීම් ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. විධායක සහ සංස්ථාපිත කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය අදාළ සේවකයන්ගේ සහ ඉහළ නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන් යුතුව මූලික කාර්යසාධන දර්ශකයන් මත පදනම්ව ඇගයීමට ලක් කෙරේ. වැඩිදියුණු කරන ලද කාර්ය සාධන ඇගයීම් ක්‍රමය ඉදිරි කාලයේ අනෙකුත් ශ්‍රේණීන් සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක කිරීමට බැංකුව අදහස් කරයි.

ඔවුන්ගේ වෘත්තීය ප්‍රගමණ ක්‍රියාවලියේ දී නවතවත් වෘත්තීය සුදුසුකම් ඉහළ නංවාගැනීමට ද අපගේ සේවකයන් දිරිමත් කරනු ලැබේ. අභ්‍යන්තර උසස්වීම් ප්‍රදානය කිරීමේ දී මෙම සුදුසුකම් සලකා බලනු ලැබේ.

පුහුණුව හා සංවර්ධනය

නිපුණතා සහිත පුද්ගලයන් රඳවා තබාගැනීමටත් ධරණිය වූ තරගකාරී වාසිදායක තත්වයක් සහතික කිරීමටත් අත්‍යවශ්‍ය පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් බැංකුව සතුවේ. පැය 199, 956 ක් වූ සම්පූර්ණ සම්පූර්ණ පුහුණුවීමේ කාලයක් (2016 දී පැය 183,460 ක්) 2017 දී අපගේ සේවකයන්ට සපයන ලදී . බැංකුවේ උපායමාර්ගික සැලසුමට ගැලපෙන පරිදි, එක් එක් ව්‍යාපාර අංශයේ අවශ්‍යතාවය මත පදනම්ව සේවකයන්ගේ පුහුණු කිරීමේ පැය ගණන වාර්ෂිකව තීරණය කරනු ලැබේ. සේවකයන්ගේ නිපුණතා හා දක්ෂතා සැලකිල්ලට ගනිමින් නිඩැස් විශ්ලේෂණයක් සිදුකර අවශ්‍යතා හඳුනාගන්නා ලදී. අභ්‍යන්තර වශයෙන් හෝ බාහිර වශයෙන් අදාළ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කෙරේ. එක් එක් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කාලය හා වියදම් ව්‍යුහය මත පදනම්ව සම්පත් සපයනු ලැබේ. පුහුණු වැඩසටහන් නිමවීමෙන් අනතුරුව සේවකයන් වෙතින් ප්‍රතිචාර ලබාගැනීම සඳහා පසු ක්‍රියාත්මක කිරීම ඇගයීමක් කෙරේ. දිවයින පුරා ක්‍රියාත්මකවන කුඩා මධ්‍යස්ථාන 24 කින් සහයෝගය ලබන, කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා වෙන්කෙරුණු මධ්‍යස්ථානයක් කොළඹ නගරයේ පිහිටුවා තිබේ.

රැකියාව අතරතුර පුහුණුව, අභ්‍යන්තරව කෙරෙන පුහුණුව, බාහිරව කෙරෙන පුහුණුව හා විදේශීය පුහුණුව ආදී වූ පුහුණු කිරීම් ආකාර කිපයකින් පුහුණු කිරීම් වැඩසටහන් සමන්විත වේ.

පුහුණු වැඩසටහන්වල විෂය පථය

විදේශීය සංස්ථාපිත පුහුණුවීම්, සම්මේලනයන්, වැඩමුළු හා සම්මන්ත්‍රණයන් වෙතින් ලබාගත් දැණුම ප්‍රයෝජනයට ගනිමින් වෙළඳපොල තරගකාරිත්වය සහතික කරනු පිණිස, බැංකු කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳ ගෝලීය ව්‍යවහාරයන් ඔවුන්ට ලබාදීම අරමුණු කොට පිළිගත් විදේශීය ආයතනයන්හි පුහුණු සැසිවාරයන්ට සහභාගිවීමට හැකියාව ලැබෙන පරිදි අපගේ සේවකයන්ට විදේශීය පුහුණුව ලබාගැනීමේ අවස්ථාව සලසා තිබේ,

කළමනාකරණ පුහුණුවන්නන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා වන අභිප්‍රේරණ වැඩසටහන්, පෙළඹවීමේ සහ කණ්ඩායම් සංවිධාන සැසි, බැංකු කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳ පළපුරුද්ද සහිත වෘත්තිකයන්ගේ පළපුරුද්ද බෙදාගැනීමේ කාර්යයන්ට ඇතුළත් වේ. පළපුරුද්ද සහ විශේෂඥතාවය සහිත සේවක මණ්ඩල සාමාජිකයන්ගේ මෙන්ම අවශ්‍ය අවස්ථාවන්හි දී බාහිර පුහුණුකරුවන්ගේ සහාය ද බැංකුව සාමාන්‍යයෙන් උපයෝගී කරගනී.

ක්ෂේත්‍රයේ විශිෂ්ට ව්‍යවහාරයන් සහභාගිවන්නන්ට හුරු කිරීමක් නව දැනුම සහ නිපුණතා පිළිබඳව ඔවුන් යාවත්කාලීන කිරීමේ ද අරමුණින් යුතුව පිළිගත් වෘත්තීය ආයතනයක් මගින් පවත්වනු ලබන පුහුණු කිරීමේ වැඩසටහන් ද බාහිර පුහුණුවට අයත් වේ.

වසර	පුහුණු කිරීමේ වියදම රු. මිලියන	පුහුණු කිරීමේ පැය ගණන	එක් සේවකයකු පුහුණු කිරීමේ පැය ගණනේ සාමාන්‍යය
2013	41	163,696	22.1
2014	68	183,340	22.5
2015	66	180,849	21.6
2016	71	183,460	22.2
2017	**72**	**199,956**	**23.6**

සාමාන්‍යයෙන් එක් සේවකයකුට පැය 24ක පුහුණු කාලයක් සහිතව 2017 දී සම්පූර්ණ පුහුණු කිරීම් 199,956ක් ආවරණය කරන ලදී. කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා 2017 වසරේදී රුපියල් මිලියන 72ක් බැංකුව විසින් ආයෝජනය කරන ලදී.

2017 වසරේ පුහුණුකිරීම් වැඩසටහන් සංඛ්‍යාව

පුහුණු කිරීමේ ස්වභාවය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිවූවන් සංඛ්‍යාව	පුහුණු පැය ගණන
අභ්‍යන්තර පුහුණු වැඩසටහන්	411	22,534	185,530
බාහිර පුහුණු වැඩසටහන්	185	931	12,618
විදේශීය පුහුණුව	17	41	1,808
එකතුව	**613**	**23,506**	**199,956**

සේවක ප්‍රභේදය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණු පැය ගණන - 2017

සේවක ප්‍රභේදය	පුහුණු කිරීම් පැය ගණන	
	පුරුෂ	ස්ත්‍රී
සංස්ථාපිත කළමනාකරණ	23	49
විධායක කළමනාකරණ	21	28
නිලධාරීන් (3-iii-1 ශ්‍රේණිය)	29	28
කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය	19	19
කළමනාකරණ පුහුණුවන්නන්	151	150
පාරිභෝගික සේවා සහකරුවන් සහ වෙනත්	16	16

පුහුණු පැය ගණන - 2017



A – ආයතනික කළමනාකාරිත්වය
B – විධායක කළමනාකාරිත්වය
C – නිලධාරීන් (3-iii-1 ශ්‍රේණිය)
D – කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය
E – කළමනාකරණ පුහුණුවන්නන්
F – පාරිභෝගික සේවා සහකරුවන්

පුරුෂ ස්ත්‍රී

විවිධත්වය සහ සමාන අවස්ථාවන්

අපගේ මානව සම්පත් ක්‍රමවේදයේ ප්‍රමුඛස්ථානයක්ම අපගේ ජනතාවගේ විවිධත්වය සම්මිශ්‍රණය දිගටම පවතී. ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය සහ සමාජීය පසුබිම ද වශයෙන් අපගේ ශ්‍රම බලකාය විවිධාකාර වේ. සමාන අවස්ථාවක් සලසන සේවකයෙකු වශයෙන් අප විසින් සේවා ස්ථානයේ විවිධත්වය දිරිමත් කරන අතර එමගින් ඵලදායී ශ්‍රම බලකායක් ප්‍රවර්ධනය කෙරෙන නවීන චින්තනයක් ඇතිවීමට හැකියාව සහිත වටපිටාවක් ඇතිවේ.

ස්ත්‍රී සහ පුරුෂ සේවකයින් අතර මූලික වැටුප් සහ වේතන අනුපාතය - 2017

	ස්ත්‍රී	පුරුෂ
සංස්ථාපිත කළමනාකරණ	1	0.99
විධායක කළමනාකරණ	1	0.96
නිලධාරීන් (3-iii-1 ශ්‍රේණිය)	1	1.07
කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය	1	1.03
පාරිභෝගික සේවා සහකරුවන් සහ වෙනත්	1	0.90

ස්ත්‍රී/පුරුෂ මූලික වැටුප් සහ වේතන අනුපාතය සේවක ප්‍රභේදය සහ අපගේ බැංකුවේ වැදගත් මෙහෙයුම් ස්ථානයන්ට අනුව ද 1:1 ක් වේ. ඊට හේතු වන්නේ අපගේ බැංකුවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත අගතියක් සිදු නොවන බැවිනි. පසුගිය වසර හතර පුරාම මාතෘ නිවාඩු ලබාගත් කාන්තා කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම තම අනුමත නිවාඩු අවසානයේ දී නැවත සුපුරුදු පරිදි සේවයට වාර්තා කිරීම මගින් කාන්තා කාර්ය මණ්ඩලයට අපගේ බැංකුවේ සමාන ලෙස සැලකීම පිළිබඳව කදිම සාක්ෂි සපයයි. කෙසේ වෙතත් බැංකුවේ සේවක මණ්ඩලයේ එක් ශ්‍රේණියකට අදාල විවිධ සේවා කාලයන් මත මෙම ප්‍රතිශතය වෙනස් විය හැකිය.

ස්ත්‍රී පුරුෂ භාවය හා රැකියා ප්‍රභේදය මත පදනම් වූ සේවක සංඛ්‍යාව



A – ආයතනික කළමනාකාරිත්වය
B – විධායක කළමනාකාරිත්වය
C – නිලධාරීන් (3-iii-1 ශ්‍රේණිය)
D – කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය
E – අනෙකුත් ප්‍රභේදයන්
F – ආයතනික සහ විධායක කළමනාකාරිත්වය - කොන්ත්‍රාත් පදනම
G – කළමනාකරණ පුහුණුවන්නන්
H – ගනුදෙනුකාර සේවා සහකරුවන්
I – අනෙකුත් කොන්ත්‍රාත් සේවකයින්

පුරුෂ ස්ත්‍රී

අසාධාරණ වෙනස්කම් රහිතවීම

ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස හෝ සමාජීය පසුබිම මත පදනම්ව ශාරීරික හෝ වාචික හිරිහැර කිරීම් සහ අසාධාරණ කම්වලින් තොර වූ සේවා ස්ථානයක් පවත්වාගැනීමට අපි කැපවී සිටින්නෙමු. එබැවින් ඉහත දැක්වූ කිසිදු කරුණක් මත අසාධාරණව කිසිදු සැලකීමකින් තොර වූ ප්‍රතිපත්තියකින් අප විසින් දැඩිවම අනුගමනය කරන අතරම සේවකයන් බඳවා ගැනීම, ප්‍රධානයන් කිරීම, පිළිගැනීම සහ උසස්වීම් දීමේ දී එම පිළිවෙතට එකඟව කටයුතු කෙරේ. විශේෂයෙන්ම බැංකු ක්ෂේත්‍රයේ ඉහළම කාන්තා සේවිකා පිරිසක් අප සමග සේවය කරයි. අපගේ අසාධාරණ සැලකීමෙන් තොර වූ ආයතනික සංස්කෘතිය පිළිබඳව මෙය බලවත් සාක්ෂියකි. අදාළ වසර තුළ දී අසාධාරණ ලෙස සැලකීමක් පිළිබඳව වූ කිසිදු වාර්තාවීමක් අප බැංකුවෙහි සිදුවී නොමැත.

වෘත්තිමය සෞඛ්‍ය සහ ආරක්ෂාව

අපගේ ආයතනයේ සෑම අංශයකම සේවකයන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව මුල්තැන්හිලා සැලකීම සහ විසඳුම් සැලසීම මගින් අපගේ සියලුම සේවකයන් හට ආරක්ෂාකාරී සේවා වටපිටාවක් අප විසින් සහතික කර තිබේ. සේවකයන්ට හට එවැනි තත්ත්වයක් ඇතිවූ බවට වසර තුළ දී වාර්තාවීමක් සිදු නොවිණි.

සෞඛ්‍යය හා ආරක්ෂාව සම්බන්ධයෙන් 2017 සඳහා කරන ලද වියදම්

සෞඛ්‍යය හා ආරක්ෂක වියදම්	රු. මිලියන
වෛද්‍ය කටයුතු වියදම්	1,413
ගිනි සහ ආරක්ෂණ	2
එකතුව	1,415

සේවක තෘප්තිය

සේවක මණ්ඩලය සහභාගී වූ සමීක්ෂණ ප්‍රතිපල

කාර්ය මණ්ඩලය සහභාගී වූ සමීක්ෂණයන්හි ප්‍රධාන අවශ්‍යතාවයක් වූයේ ආයතනයේ සාර්ථකත්වය සඳහා දායක වීමට සේවකයන් කෙතරම් ප්‍රමාණයකට අභිප්‍රේරණය වී තිබේදැයි සහ සංස්ථාපිත ඉලක්කයන් ජයගැනීමට වැදගත්වන කාර්යයන් සපුරාගැනීම සඳහා ඔවුන්ගේ උත්සාහයෙන් ස්වේච්ඡාවෙන් ඉටු කිරීමට ඔවුන් කැමැත්තෙන් ඉදිරිපත් වන්නේදැයි නිශ්චිතව අවබෝධ කරගැනීමයි. කාර්ය මණ්ඩලය සහභාගිවන සමීක්ෂණයන් වාර්ෂිකව සිදුකරන අතර, ඒ සඳහා ප්‍රධාන කාර්යාලයේ තෝරාගත් අංශයන් සහ සියලුම කළාපයන් නියෝජනය වන පරිදි සේවකයන් තෝරාගැනීම සඳහා සරලව අහඹු ලෙස සේවක නියැදියක් තෝරාගැනීමේ ක්‍රමවේදයක් උපයෝගී කරගනී. කාර්ය මණ්ඩල සමීක්ෂණයන් සඳහා වසර තුළ දී සේවකයන් 156ක් ඵලෙස තෝරාගන්නා ලදී.

තනතුරු	පුරුෂ	ස්ත්‍රී	එකතුව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	–	1	1
සහකාර සාමාන්‍යාධිකාරී	–	1	1
ප්‍රධාන කළමනාකරු	2	–	2
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	2	5	7
කළමනාකරු	9	6	15
නියෝජ්‍ය කළමනාකරු	12	14	26
සහකාර කළමනාකරු	9	10	19
සේවක මණ්ඩල සහකාර	28	31	59
ලේකම් සහ සම්බන්ධ ශ්‍රේණි	–	14	14
කාර්යාල සහායක සහ ඊට පහළ	12	–	12
එකතුව	**74**	**82**	**156**

වේතන සහ ප්‍රතිලාභයන්

සේවකයන්ගේ කාරය සාධනය මත පදනම්ව, ඔවුන් තෘප්තිමත්වන ආකාරයේ වැටුප් ව්‍යුහයක් අපි පවත්වාගෙන යන්නෙමු. සියලුම රාජ්‍ය බැංකුවලට අදාළ සාමූහික ගිවිසුමක් ඔස්සේ සෑම වසර තුනකටම වරක් වෘත්තීය සමිති සමග සාකච්ඡාකර අනන්‍ය වශයෙන් එකඟවන ආකාරයට සේවකයන්ගේ වැටුප් සහ කාර්ය මණ්ඩල දීමනා ආදිය තීරණය කෙරේ. ශ්‍රී ලංකා සාප්පු සහ කාර්යාල සේවක පනත මගින් සේවකයන්ගේ වැටුප් සහ වේතන පාලනය කිරීම සඳහා වන ව්‍යුහයක් සලසා නොමැති බැවින් අපගේ සේවකයන්ගේ වැටුප් හා වේතන, වෘත්තීය සමිති සමග කරන කතිකාවත් සහ මුදල් අමාත්‍යාංශය සමඟ කරන සාකච්ඡා මත පදනම්ව තීරණය කෙරේ. ප්‍රධාන කළමනාකරු දක්වා ඇති ප්‍රභේදය දක්වා වූ සේවක ප්‍රභේදයන් සාමූහික විසඳුම් මගින් නියෝජනය කෙරේ. මෙම ප්‍රභේයන්ගේ වැටුප් පරිමාවන්හි විනිවිදභාවය එමගින් සහතික වේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ (සහකාර සාමාන්‍යාධිකාරී සහ ඊට ඉහළ) වැටුප් ක්ෂේත්‍රයේ සම්මතයන් මත පදනම් වේ.

අපගේ බැංකුවේ ප්‍රතිපත්තිය සැකසී තිබෙන්නේ ඉහළ කාර්යසාධනයක් සහිත සේවකයන් රඳවාතබාගන්නා අකාරයටය. පුරුෂ සහ ස්ත්‍රී සේවක සේවිකාවන්ට සමානව ගෙවීමේ ප්‍රතිපත්තියක් අපි අනුගමනය කරන්නෙමු . අපගේ සේවකයන් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලේ (ETF) ද දායකත්වයට හිමිකම් ලබයි . වාර්තා කෙරෙන වසරේ දී භාරකාර අරමුදලට රුපියල් මිලියන 223ක් වූ දායක මුදලක් ද අර්ථ සාධක අරමුදලට රුපියල් මිලියන 1,495 ක් ද ගෙවන ලදී.

සියලුම ස්ථිර සේවකයන්ට ඔවුන්ගේ සේවක ප්‍රභේදයන් මත පදනම්ව වෙනත් බොහෝ වරප්‍රසාදයන් සලසනු ලැබේ. කොන්ත්‍රාත් සහ පුහුණුවන සේවකයන්ට ඇතැම් වරප්‍රසාද ප්‍රදානය නොකෙරේ. සේවකයන්ට සලසා තිබෙන වරප්‍රසාදයන්ට ප්‍රසාද දීමනා, ඇතැම් ශ්‍රේණින් සඳහා ගමන් වියදම්, නිවාඩු නිකේතන පහසුකම්, මරණ පාරිතෝෂික, ප්‍රසූත නිවාඩු සහ විශ්‍රාම ප්‍රතිලාභ ආදිය ඇතුළත් වේ.

සේවකයන් ඉවත්ව යාම

සේවකයන් ඉවත්ව යාම පිළිබඳව සතුටුදායක තත්වයක් අපි පවත්වාගන්නෙමු. 2017 වසරේ දී ඉවත්ව ගිය සම්පූර්ණ සේවක සංඛ්‍යාව 309 ක් වූ අතර ඉන් 67%ක් පුරුෂ සේවකයන් වේ. ඉවත්වගිය ඉහළම සේවකයන් වසර 56 ට වැඩි ප්‍රභේදයේ වූ අතර, එම සංඛ්‍යාව 240 කි. කළාපිය වශයෙන් ඉවත්වගිය ඉහළම සේවක සංඛ්‍යාව වූ සේවකයන් 127 ක් කොළඹින් වාර්තා වූ අතර එය සම්පූර්ණ සංඛ්‍යාවෙන් 46%කි.

වයස් ප්‍රභේදය සහ ස්ත්‍රී පුරුෂ සමාණතාවය අනුව සේවක ඉවත්වයාම

වයස් ප්‍රභේදය	සම්පූර්ණ සංඛ්‍යාව	පුරුෂ	ස්ත්‍රී
වසර 18 - 25	6	2	4
වසර 26 - 35	33	14	19
වසර 36 - 45	16	9	7
වසර 46 - 55	14	11	3
වසර 56 +	240	168	72
එකතුව	**309**	**204**	**105**

වයස් කාණ්ඩය, ස්ත්‍රී පුරුෂ භාවය සහ සේවක ප්‍රභේදය අනුව සේවක ඉවත්වයාම - 2017

රැකියා ප්‍රභේදය	වසර 18-25		වසර 26-35		වසර 36-45		වසර 46-55		වසර 56 සහ ඊට වැඩි	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
සංස්ථාපිත කළමනාකරණ	–	–	–	–	–	–	–	–	–	2
විධායක කළමනාකරණ	–	–	–	–	–	–	–	–	2	–
නිලධාරීන් (3-iii-1 ශ්‍රේණිය)	–	–	2	6	3	6	2	2	132	69
කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය	–	–	2	5	–	–	–	–	3	–
අනෙකුත් ප්‍රභේදයන්	–	–	1	–	–	–	8	1	31	1
කළමනාකරණ පුහුණුවන්නන්	–	2	3	3	–	–	–	–	–	–
පාරිභෝගික සේවා සහකරුවන්	–	1	2	2	–	–	–	–	–	–
වෙනත් කොන්ත්‍රාත් සේවකයින්	2	1	4	3	6	1	1	–	–	–
එකතුව	**2**	**4**	**14**	**19**	**9**	**7**	**11**	**3**	**168**	**72**

කලාපය අනුව සේවක ඉවත්වීම් - 2017



කළාපය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවක ඉවත්වයාම්

කළාපය	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ %	ස්ත්‍රී %
අම්පාර	2	1	**3**	67	33
අනුරාධපුරය	8	1	**9**	89	11
බදුල්ල	7	1	**8**	88	13
මඩකලපුව	10	–	**10**	100	0
කොළඹ	81	55	**136**	60	40
ගාල්ල	10	3	**13**	77	23
ගම්පහ	6	6	**12**	50	50
හම්බන්තොට	3	–	**3**	100	0
යාපනය	4	–	**4**	100	0
කළුතර	5	2	**7**	71	29
මහනුවර	9	6	**15**	60	40
කෑගල්ල	4	4	**8**	50	50
කුරුණෑගල	14	7	**21**	67	33
මාතලේ	8	3	**11**	73	27
මාතර	6	2	**8**	75	25
මොණරාගල	4	3	**7**	57	43
නුවරඑළිය	8	1	**9**	89	11
පොළොන්නරුව	6	3	**9**	67	33
පුත්තලම	1	1	**2**	50	50
රත්නපුරය	7	2	**9**	78	22
ත්‍රිකුණාමලය	1	1	**2**	50	50
වව්නි	–	3	**3**	0	100
එකතුව	**204**	**105**	**309**	**66**	**34**

දුක්ගැනවිලි නිරාකරණය කිරීම

තම රාජකාරී කටයුතු සම්බන්ධයෙන් සේවකයන්ට මුහුණ පෑමට සිදුවන අපහසුතාවයන් ඔස්සේ පැන නැගෙන සේවක දුක්ගැනවිලි පිළිබඳව විසඳුම් දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පැහැදිලි සහ විනිවිද භාවයෙන් යුතු ව්‍යුහයක් අප සතුවේ. එබැවින් ඕනෑම කරුණක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටියක් අප සලසා තිබේ. අපගේ සේවකයන්ට සාධාරණවත් යුක්තිසහගතවත් කලට වේලාවට කටයුතු ඉටුකෙරෙන විධිමත් ක්‍රියාවලියක් අප විසින් සහතික කෙරේ.

කිසියම් දුක්ගැනවිල්ලක් ඇතිවුණු විටෙක දී අදාළ පුද්ගලයා එය තමන්ගේ ආසන්නතම අධීක්ෂක වෙත ඉදිරිපත් කළ යුතු ය. තවදුරටත් ගැටළුව විසඳී නොමැතිනම් එය මානව සම්පත් අංශය වෙත යොමු කළ හැකි ය. සේවකයන්ගේ ගැටළු/දුක්ගැනවිලි ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි වෙත යොමුකර විසඳුම් ලබාදීම සඳහන්වන විශේෂ ගැලපීමක් සහිත නව යාන්ත්‍රණයක් වසර 2017 දී බැංකුව විසින් හඳුන්වා දෙන ලදී.

සංස්ථාපිත කළමනාකරණ සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් මගින් දුක්ගැනවිලි/ගැටළු සමාලෝචනය කෙරේ. කමිටුවේ සමාලෝචන ප්‍රතිපල මත පදනම්ව ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි විසින් දුක්ගැනවිලි/ගැටළුවලට සහනය සලසනු ලැබේ. වසර තුළ දී දුක්ගැනවිලි 18 ක් ඉදිරිපත් කෙරුණු අතර, ඒවා පිළිබඳ නිවැරදි කිරීමේ පියවර ගනු ලැබිණි. මෙලෙස වාර්තා වුණු කරුණු වලට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විනයානුකූල තීරණයන්ය.

සාමූහික කේවල් කිරීම

සේවක වෘත්තීය සමිති සමග විධිමත් සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් බැංකුව සතුව තිබෙන අතර ඔවුන්ගේ දුක්ගැනවිලිවලට සවන්දීම සඳහා දොරටු විවෘතව තැබීමේ ප්‍රතිපත්තියක් බැංකුව පවත්වාගනී. ප්‍රධාන කළමනාකරුවන් දක්වා සිටින කාර්ය මණ්ඩල සාමාජිකයන් සාමූහික ගිවිසුම් මගින් ආවරණය කෙරෙන අතර එම ප්‍රමාණය බැංකුවේ සමස්ථ සේවක සංඛ්‍යාවෙන් 94.96%ක් වේ. රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස සම්බන්ධයෙන් බැංකුවේ මෙහෙයුම් කාර්යයන් මිගින් සිදුවෙතැයි හඳුනාගත් සීමාකිරීම් නොමැත.

කිසියම් වූ ආකාරයක කම්කරු කටයුත්තකින් පැන නැගුනු වැඩකටයුතු අවුල් කිරීමේ ප්‍රධාන ගැටළුවක් ඇති වූ බවක් වසර තුළ දී වාර්තා වී නොමැත.

සේවක වෘත්තීය සමිතිය	සේවක සංඛ්‍යාව
ලංකා බැංකු සේවකයන් වෘත්තීය සමිතිය	6,742
නිලධාරීන්ගේ සංගමය	445
ශ්‍රී ලංකා නිදහස් බැංකු සේවක සංගමය	76
ජාතික සේවක සංගමය	717
සමස්ත ලංකා බැංකු සේවක වෘත්තීය සමිතිය	48
එකතුව	**8,028**

මෙහෙයුම් කාර්යයන් වෙනස්වීම් පිළිබඳව අවම දැන්වීම් කාලපරාසය

මෙහෙයුම් කාර්යයන් කෙරෙන කිසියම් වෙනස් කිරීම් සහ එමගින් ඇතිවිය හැකි බලපෑම් ද පිළිබඳව සෘහෙන කල්වේලා ඇතිව සේවකයන්ට දැනුම්දෙනු ලැබේ. එම වෙනස්කම් මගින් කාර්ය මණ්ඩලයේ චිත්ත ධෛර්යයට ඇතිවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම මගින් සැලකියයුතු දායකත්වයක් ලැබේ. මෙහෙයුම් කාර්යයන්හි වෙනස්කම් ඇතිකිරීම් පිළිබඳව දැනුම් දියයුතු අවම කාලසීමාවන් පහත දැක්වේ.

වෙනස්වීමේ ස්වභාවය	දැන්වීමේ කාලසීමාව
ස්ථාන මාරුවීම්	සති 2
ඉල්ලා අස්වීම්	මාස 1
විශ්‍රාම ගැනීම්	මාස 6
සේවය අවසන් කිරීම්	මාස 1-3

ආචාරධර්ම පද්ධතිය

එක් එක් සේවා ස්ථානයට අදාළවන්නාවූ නීති, රෙගුලාසි සහ මගපෙන්වීමේ නියමයන් ද අන්තර්ගත ආචාරධර්ම පද්ධතිය බැංකුවේ සියලුම සේවකයන්ට අදාළ වේ.

බැංකුවේ ප්‍රධාන ආචාරධර්ම පද්ධති නම්-

- සංස්ථාපිත පරිපාලන පද්ධතිය
- විනය පද්ධතිය
- දූෂණ අක්‍රමිකතා දැනුම්දීමේ ප්‍රතිපත්තිය
- පාරිභෝගික ප්‍රඥප්තිය
- සේවකයන් සඳහා ආචාරධර්ම පද්ධතිය

සංස්ථාපිත පරිපාලන පද්ධතිය

ව්‍යාපාර සමූහයේ සාරධර්ම සහ හැසිරීම් විලාසය මෙහි අන්තර්ගතවන අතර ව්‍යාපාර සමූහයේ සදාචාරාත්මක හැසිරීම සහ අවංකත්වය සහතික කිරීම සඳහා සියලුම සේවකයන්, පරිපාලනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉඟියක් මෙමගින් ලබාදේ.

විනය පද්ධතිය

විශමාචාරය යනුවෙන් අර්ථකතනය කෙරෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන අතර මෙමගින් විධිමත් විනයානුකූල ක්‍රියාපිළිවෙල පැහැදිලි කරයි.

දූෂණ අක්‍රමිකතා දැනුම්දීමේ ප්‍රතිපත්තිය

දූෂණ අක්‍රමිකතා දැනුම්දීමේ ප්‍රතිපත්තිය යනු දූෂණය කිසිදු ආකාරයකින් ඉවසීමක් නොකරන බැංකුවේ ප්‍රතිපත්තිය මූර්තිමත් කරන, විශමාචාරය සහ දූෂණයට එරෙහිවූ වැඩිමනක් ක්‍රමවේදයකි. එවැනි කරුණු පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා බැංකුව විසින් අධ්‍යක්ෂවරයකු පත්කර තිබේ. පහත දැක්වෙන කරුණු තම ආසන්නතම අධීක්ෂණ නිලධාරියාට හෝ විගණන කමිටුවට සෘජුවම හෝ වාර්තා කිරීමට සේවකයකු හැකිය. සේවයකයාගේ ආරක්ෂාව සැලසීමට නිර්නාමිකත්ය සහතික කෙරේ.

- විනය පද්ධතිය කඩකිරීම
- නෛතික/නියාමන වගකීම්වලට අනුකූලවීමට අපොහොසත් වීම
- සාධාරණ යුක්තිය ඉටුනොවීම
- මූල්‍යමය අවභාවිතාවන්
- තොරතුරු සැඟවීම

පාරිභෝගික ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියම කරන ලද පරිදි වූ මහජන බැංකුවේ පාරිභෝගික ප්‍රඥප්තිය මගින් පාරිභෝගිකයන්ගේ අයිතීන් සුරක්ෂිත කෙරේ.

සේවකයන් සඳහා ආචාරධර්ම පද්ධතිය

ව්‍යාපාර සමූහයේ සියලුම සේවකයන් ආචාරධර්ම පද්ධතියට අනුගත වියයුතු අතර ව්‍යාපාර සමූහයේ රැකියාවට බැඳීමේ දී එයට අත්සන් කළයුතු වේ.

මෙයට සේවකයන්ගේ පහත දැක්වෙන කරුණු අඩංගු වේ.

- වගකීම්
- හැසිරීම්
- රහස්‍යභාවය
- බැදියා අතර පිළිගැටුම්
- බැංකුවේ අභ්‍යන්තර ගනුදෙනු වලට රහසිගතව සම්බන්ධවීම
- පිටස්තර රැකියාවන්
- තරඟකාරිත්වය සහ සාධාරණව සැලකීම
- අල්ලස සහ දූෂණය
- පාරිභෝගික සේවා සහ පැමිණිලි
- පිරිසිදු බව
- අනුකූලතාවය
- වත්කම් ආරක්ෂා කිරීම සහ පාවිච්චිය
- පරිගනක පද්ධතිය පරිහරණය කිරීම

දූෂණ විරෝධී බව

පූර්ව ක්‍රියාකාරී අභ්‍යන්තර විගණන අංශය, පරීක්ෂණ සහ විමර්ශන අංශය අවදානම් කළමනාකරණ ඒකකය සහ ශාඛාවන්හි සේවයේ යොදවා සිටින අභ්‍යන්තර විගණන නිලධාරීන් මගින් පහසුකම් සැලසීම ඔස්සේ බැංකුව තුළ දැඩි දූෂණ විරෝධී සංස්කෘතියක් අපි පවත්වාගන්නෙමු. දූෂණය සහ වංචනික හැසිරීම් වැලැක්වීම සහ නතර කිරීම සම්බන්ධ පුහුණුවක් පරීක්ෂණ සහ විමර්ශන අංශය සහ අභ්‍යන්තර විගණන අංශය මගින් සියලුම සේවයකන්ට ලබාදේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් ද පවතින අතර සියලුම සේවකයන්ට එ පිළිබඳව අවබෝධය ලබාදී තිබේ. වසර තුළ දී දූෂණ විරෝධී තත්වය පිළිබඳව පැය 15,808 ක පුහුණු කාලයක සේවකයන්ට ලබාදෙන ලදී.

වෙනසේ ස්වභාවය	සංඛ්‍යාව	%
ආයතනයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත් පිළිබඳව දැනුවත් කළ පරිපාලන අංශයේ සමස්ථ සාමාජික සංඛ්‍යාව සහ ප්‍රතිශතය	සියලුම සේවකයන්	100
ආයතනයේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත් පිළිබඳව දැනුවත් කළ සමස්ථ සාමාජික සංඛ්‍යාව සහ ප්‍රතිශතය	සියලුම සේවකයන්	100
දූෂණ විරෝධී කටයුතු පිළිබඳව පුහුණුව ලබන ලද සමස්ත සේවක සංඛ්‍යාව සහ ප්‍රතිශතය	1976	23
තහවුරු කළ දූෂණ සිද්ධි සම්පූර්ණ සංඛ්‍යාව සහ ස්වභාවය	185	N/A
දූෂණය සම්බන්ධයෙන් සේවයෙන් පහකළ සහ විනයානුකූල දඬුවම් ලැබූ සමස්ථ තහවුරු කළ සිද්ධි සංඛ්‍යාව	146	N/A

සේවක පැවැත්ම ප්‍රවර්ධනය කිරීම

අපගේ සේවකයන්ගේ යහ පැවැත්ම අපගේ පාරිභෝගිකයන්ගේ අත්දැකීම් සෘජුවම පෝෂණය කිරීමෙන් බැංකුව ලබන ලාභදායී තත්ත්වය සහතික කෙරෙන බව අපි දනිමු. එබැවින්, කාර්ය මණ්ඩල සහභාගිත්වය සහිත ක්‍රියාකාරම් ක්‍රියාත්මක කරමින්, සෞඛ්‍යමය ජීවන රාටාවක් සඳහා දිරිමත් කරමින්, ප්‍රතිලාභ රැසක් සලසමින් සහ ආරක්ෂාකාරී රැකියා පරිසරයක් ඇතිකරමින් සේවයක යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට අපි උත්සහ කරන්නෙමු. අපගේ සේවකයන්ගේ යහපත සඳහා වූ ක්‍රීඩා වැඩසටහන් ද සුපුරුදු ලෙස පවත්වන්නෙමු.

කාර්ය මණ්ඩල සහභාගිත්වය

සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අභිප්‍රේරණ මට්ටම, උසස් කිරීම සඳහා කාර්ය මණ්ඩල සහභාගිත්වය සහිත වැඩසටහන් වාර්ෂිකව පැවැත්වේ. 2017 වසරේදී පහත දැක්වෙන ක්‍රියාකාරකම් පවත්වන ලදී.

ලේ දන්දීමේ ව්‍යාපාරය

බැංකුවේ 56 වැනි සංවත්සරය සැමරීම සඳහා කොළඹ පිහිටි මහජන බැංකු කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ආයතනයේ දී ලේ දන්දීමේ ව්‍යාපාරයක් සිදුකරන ලදී. මහජන බැංකුවේ සුබසාධන අංශය සහ මහජන බැංකුවේ ක්‍රීඩා සමාජය විසින් සංවිධානය කරන ලද මෙම ව්‍යාපෘතියට බොහෝ සේවකයන් ස්වේච්ඡාවෙන් සහභාගි විය.

පොසොන් බොදු ගී උත්සවය

පොසොන් පොහොය දිනයේ අනුරාධපුරයේ රුවන්වැලිසෑය අභියස දී පොසොන් බැති ගී උත්සවය බැංකුව විසින් අනුගාමී 12වැනි වසරටත් සංවිධානය කරන ලදී.

මහජන බැංකු කලා කවයේ සාමාජිකයන් මෙන්ම උතුරුමැද, මධ්‍යම, ඌව, වයඹ සහ උතුරු පළාත්වල කාර්ය මණ්ඩලය ද මෙම උත්සවයට සහභාගි විය.

රුවන්වැලි මහ සෑයේ විහාරාධිපති, පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි, රජයේ නිලධාරීන් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි, සංස්ථාපිත සහ විධායක කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය ද උත්සවයට සහභාගි විය.

මහජන බැංකු සේවක ඇගයීම් සම්මාන උළෙල 2016

2016 වසරේ මහජන බැංකුවේ ඇගයීම් සම්මාන උළෙලේදී බැංකුවේ ඉහළම ජයග්‍රහකයන්ට විශිෂ්ඨ ආරාධිතයන් විශාල පරිසක් මධ්‍යයේ දී සම්මානයට පාත්‍ර කරන ලදී. මෙම මහෝත්සවය අත්තිඩිය රිගල් ලේක්සයිඩ් හෝටලයේ දී පවත්වන ලදී.

මෙම සම්මාන උළෙල වාර්ෂිකව පවත්වනු ලබන්නේ මහජන බැංකුවේ කලාප කාර්යාල, ශාඛා කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන සහ සියලුම උපායමාර්ගික ව්‍යාපාර ඒකකයන්හි අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සාමාජිකයන් අගය කිරීමට සහ අභිප්‍රේරණය කිරීමටත්ය. ඊට අනුකූලව, බැංකුවේ ප්‍රගමනය වෙනුවෙන් සපයන ලද ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ලෝකඩ, රිදී සහ රන් සම්මාන ප්‍රදානය කරන ලදී.

මහජන බැංකු වර්ණ රාත්‍රිය 2017

මහජන බැංකුවේ වර්ණ රාත්‍රිය අනුගාමී 15 වැනි වසරටත් කොළඹ සිනමන් ලේක්සයිට් හෝටලයේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

මහජන බැංකුවේ ක්‍රීඩා සමාජය මගින් සංවිධානය කළ මෙම උළෙලේදී කැපී පෙනෙන ජයග්‍රහනයන් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 168 දෙනෙකුට ගෞරවය පුදු කරන ලදී. විශ්‍රාමික ක්‍රීඩක ක්‍රීඩිකාවන් කිහිප දෙනෙකු විශේෂ සම්මානයන්ගෙන් පිදුම් ලැබිය. මෙම උළෙල සජීවීකරණයන්ගෙන්, විචිත්‍ර නර්තන අංගයන්ගෙන් සහ සංගීතයෙන්ද උත්කර්ෂවත් විය.

වාර්ෂික නත්තල් කැරොල්

මහජන බැංකුවේ ක්‍රිස්තියානි සංසඳය මගින් අනුගාමී 39 වැනි වසරටත් වාර්ෂික නත්තල් කැරොල් උත්සවය කොළඹ පිහිටි මහජන බැංකුවේ කාර්ය මණ්ඩල පුහුණු විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මෙම උත්සවයට කොළඹ, ගම්පහ, පුත්තලම, කළුතර සහ වන්නි ශාඛාවන්හි කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් සහභාගි විය.

ජාතික කියවීමේ මාසය සැමරීම

ශ්‍රී ලාංකීය සංස්කෘතය සහ සාරධර්මයන් ප්‍රවර්ධනය කිරීමෙහි ලා අපගේ කැපවීම ප්‍රදර්ශනය කරමින් මහජන බැංකු කලා කවය ඔක්තෝබර් මාසයේදී ජාතික කියවීමේ මාසය අනුස්මරණය කිරීම සඳහා පොත් ප්‍රදර්ශනයක් සහ වෙළඳපොලක් පැවැත්විය. මෙහි අරමුණ වූයේ බැංකුවේ සාමාජිකයන් අතර කියවීමේ පුරුද්දක් ඇතිකිරීමයි.

ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සේවක මණ්ඩල සාමාජිකයන් සහ පාරිභෝගිකයන් විශාල පිරිසක් මෙම උත්සවයට අනුග්‍රහකත්ව දැක්වීය. බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී ඇතුළු සංස්ථාපිත සහ විධායක කළමනාකාරීත්වයේ සාමාජිකයන්ද මෙම අවස්ථාවට සහභාගි විය.

අන්තර් ශාඛා/අංශ දැනුම මිනුම

සංස්ථාපිත බැංකු කටයුතු අංශය මගින් 14 වැනි අනුගාමී වසරටත් සංවිධානය කරන ලද අන්තර් ශාඛා/අංශ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන බොරැලැස්ගමු ගෝල්ඩන් රෝස් උත්සව ශාලාවේදී පැවැත්විනි. මෙම තරඟය සඳහා විවිධ ශාඛා සහ අංශයන් නියෝජනය කරමින් කණ්ඩායම් 88ක් සහභාගි විය. 2017 වසර සඳහා ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී කුසලානය දිනාගනිමින් එහි ජයග්‍රහකයා වූයේ කොළඹ පිටත කලාපීය ප්‍රධාන කාර්යාලයේ කණ්ඩායමයි.

බැංකු කටයුතු පාලනය කෙරෙන නූතන කරුණු පිළිබඳව තම විශේෂඥභාවය ප්‍රදර්ශනය කිරීමට හැකිවන මෙම තරඟයේ අරමුණ වන්නේ බැංකු සහ මූල්‍ය කටයුතු පිළිබඳව සේවකයන්ගේ දැනුම වර්ධනය කිරීමයි. බැංකුව විසින් කරගෙන යනු ලබන ඩිජිටල්කරණ ක්‍රියාවලියට පරිවර්තනය වීමේ කාර්යයට සේවකයන්ට සක්‍රීයව සහභාගිවීම සඳහා බලගැන්වීම ද මෙමගින් සිදුවේ.

ප්‍රධාන කාර්යාලයේ ව්‍යවසාය බැංකු කටයුතු අංශය සහ නුවරඑළියේ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ කණ්ඩායම් 1 වන සහ 2 වන අනුශූරතාවයන්ද කොළඹ උතුර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලයේ සන්නිවේදන කළමනාකරණ අංශය පිළිවෙලින් 3 වැනි සහ 4 වැනි අනුශූරතාවයන් ද දිනාගන්නා ලදී.

අනාගත දැක්ම

අපගේ මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය අප විසින් දිගටම දියුණු කරන අතරම වඩාත් ඉහළ ජනප්‍රියත්වයක් සහිත ශ්‍රී ලංකාවේ සේවායෝජක තත්වයට පත්වීම අපගේ අරමුණයි. කැපී පෙනෙන සේවක කණ්ඩායමක් අප සතුවන අතර ඔවුන් මෙම ක්ෂේත්‍රයේ විශිෂ්ඨතමයන් ද වන්නේය.

සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂිතා

මිලියන **18.6**
පාරිභෝගික ගිණුම්

118
ව්‍යාපාරික හවුල්කරුවන්

රු. මිලියන **56.3**
ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන ලදී.

අපගේ පාරිභෝගිකයන්, ව්‍යාපාරික හවුල්කරුවන්, ආයෝජකයන් සහ සමාජයට මෙන්ම පරිසරයටද වටිනාකම් සැලසීම

අපගේ බැංකුවේ සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය ප්‍රධාන වශයෙන්ම අපගේ ආයෝජකයන්, පාරිභෝගිකයන්, ව්‍යාපාරිකයන්, හවුල්කරුවන් සහ ප්‍රජාව සමගින් අභිවර්ධනය කළ සබඳතාවයන්ගෙන් සමන්විත වේ. අපගේ කොටස්කරුවන්ට වැඩි වර්ධනය වූ වටිනාකම් උත්පාදනය කිරීම පිණිස අප දිගින් දිගටම උත්සහ දරන්නේ එය අපගේ අඛණ්ඩ සාර්ථකත්වයට වැදගත් බැවිනි. සිමාරහිත අවස්ථාවන් සැලසීමට

අපගේ සාමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය වටිනාකම් ඇතිකිරීමේ ක්‍රියාවලිය

යෙදවුම්

- තොරතුරු තාක්ෂණයට ආයෝජනය කිරීම්
- දේශීය සැපයුම්කරුවන්
- ව්‍යාපාරික හවුල්කරුවන්
- නිමැවුම් සහ සේවාවන්
- සංස්ථාපිත සමාජ වගකීම්
- ව්‍යාපෘති සඳහා ආයෝජනය
- නියාමන අනුකූලතාවය

ක්‍රියාවලිය

තොරතුරු තාක්ෂණ යටිතලයන්
පාරිභෝගික අගය වැඩිකිරීම
නිමැවුම් නවීකරණය
ව්‍යාපාරික ආචාරධර්ම
අනුකූලතාවය සහ පාලනය

නිමැවුම්

- වැඩිදියුණු කළ පාරිභෝගික අත්දැකීම්
- දේශීය සැපයුම්කරුවන්ට ගෙවීම් රු. බිලියන 10.5
- CSR ව්‍යාපෘති රු.මිලියන 56.3 ක් ආයෝජනය කිරීම
- ඩිජිටල්කරණය කළ ශාඛා
- රු. මිලියන 5,220 ක ලාභාංශ ගෙවීම

ප්‍රතිඵලය

- පාරිභෝගික ලැදියාව
- ශක්තිමත් ව්‍යාපාරික හවුල්කාරත්වය
- පාරිභෝගිකයන් සඳහා වැඩිදියුණු කළ සේවා මධ්‍යස්ථානයන්
- වගකීම් සහිත සංස්ථාපිත පුරවැසිභාවයන්

ආයෝජක ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂිතා

කොටස් හිමියන්ට
ගෙවන ලද ලාභාංශය
රු. මිලියන **5,220**

හිමිකම් මත ප්‍රතිලාභය
26.6% **කින් වැඩිවීම**

ආයෝජන ප්‍රාග්ධන සංඛ්‍යාදත්ත

	2017	2016	2015	2014	2013
ලාභාංශ ගෙවීම් (රුපියල් මිලියන)	**5,220**	8,220	3,220	6,220	4,720
කොටසකට අදායම (රුපියල්)	**18,250**	14,995	12,598	14,219	7,488
ලාභාංශ ගෙවීමේ අනුපාතය (%)	**28.6**	54.8	25.6	43.7	63.0
වත්කම් මත ප්‍රතිලාභය (%)	**1.9**	1.7	1.8	1.8	1.1
හිමිකම් මත ප්‍රතිලාභය (%)	**26.6**	27.5	27.1	35.5	22.8

ලාභාංශ ගෙවීමේ අනුපාතය සහ ස්කන්ධය මත ප්‍රතිලාභය



කොටසක අදායම



ආයෝජක ප්‍රාග්ධන කළමනාකරණය

ආයෝජකයන් යනු අනාගත මුල්‍ය ආදායම් අපේක්ෂාවෙන් යුතුව ප්‍රාග්ධනය ආයෝජනය කරන කොටස්කරුවන් වේ. ඔවුන් අපගේ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය වන ප්‍රාග්ධනය සපයන බැවින් අපගේ ආයෝජකයන් අපගේ වටිනාකම් ඇති කිරීමේ ක්‍රියාවලියට අත්‍යවශ්‍ය වේ. එබැවින් අපගේ ව්‍යාපාරයන් වර්ධනය කරගනිමින් සාර්ථක වුත් සරණීය වුත් ආදායම් තුලින් හැකි පරිදි උපරිම ආදායමක් ඔවුනට ලබාදීමට අපි නිරන්තරව උත්සහ දරන්නෙමු. අපගේ මෙහෙයුම් කාර්යයන්ගේ ඉහළ මට්ටමේ සෘජුබව සහ විනිවිද පෙනෙන ස්වභාවය ද පවත්වාගන්නෙමු.

කොටස් හිමියන්ගේ පැතිකඩ

අපගේ ප්‍රධානතම කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය කොටස් හිමිකමෙන් 92.27% ක හිමිකම දරන අතර ඉතිරි 7.73% සමුපකාර සමිති විසින් දරනු ලැබේ.

සෘජු ආර්ථික වටිනාකම් උත්පාදනය සහ බෙදාහැරීම

පසුගිය වසර 5 තුළ දී ශ්‍රී ලාංකීය ආර්ථිකයන්ට බැංකුව මගින් දෙන ලද දායකත්වය පහත වගුවෙහි දැක්වේ:

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 රු. '000	2015 රු. '000	2014 රු. '000	2013 රු. '000
ආදායම් ප්‍රභවයන්					
පොළිය	**149,184,471**	109,970,256	92,485,979	84,479,961	110,440,562
විනිමය	**2,119,499**	2,572,743	3,050,646	1,598,506	1,418,430
කොමිස් සහ ගාස්තු	**5,132,907**	3,948,052	3,712,146	3,820,242	3,478,015
ප්‍රාග්ධන ලාභ	**125,763**	531,921	305,011	1,042,108	396,910
වෙනත්	**5,602,657**	5,091,388	4,095,182	5,436,664	10,135,606
එකතුව	**162,165,297**	122,114,360	103,648,964	96,377,482	125,869,523
ආදායම යෙදවීම					
තැන්පත් කරුවන්ට පොළි වශයෙන්	**98,718,636**	66,845,869	48,731,974	54,362,126	73,791,102
සේවකයන්ට වැටුප් වශයෙන්	**15,425,116**	13,633,514	17,377,025	14,005,555	12,384,396
නිමැවුම් සහ සේවා සැපයීමට	**10,491,130**	8,588,379	7,160,999	7,414,998	7,719,560
මූල්‍ය වත්කම්වල ශුද්ධ හානිකරණ අලාභ	**2,678,366**	1,246,748	3,739,914	(1,430,440)	13,716,320
රජයට - බදු, විශේෂ බදු සහ ලාභාංශ	**20,513,116**	20,515,560	16,834,192	14,125,646	10,039,483
ප්‍රජාවට	**56,317**	40,269	39,461	24,675	14,735
වර්ධනය සඳහා රඳවාගැනිම්	**14,282,615**	11,244,022	9,765,398	7,874,923	8,203,927
එකතුව	**162,165,297**	122,114,360	103,648,964	96,377,482	125,869,523

සටහන: ඉහත දැක්වෙන සංඛ්‍යා දත්තයන් උපුටාගන්නා ලද්දේ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් (SLFRS/LKAS) මත පදනම්ව පිළියෙල කරන ලද විගණනය කළ මූල්‍ය ප්‍රකාශනයන්ගෙනි.

තැන්පත්කරුවන් සඳහා වටිනාකම් ඇති කිරීම

රු. බිලියන



සේවකයන් සඳහා වටිනාකම් ඇතිකිරීම

රු. බිලියන



රජය වෙනුවෙන් වටිනාකම් ඇතිකිරීම

රු. බිලියන



එකතු කළ ආර්ථික වටිනාකම් (EVA)

එකතු කළ ආර්ථික වටිනාකම් යනු සමාගමේ කොටස්හිමියන් සඳහා අවශ්‍ය වන ප්‍රතිලාභ ඉක්මවා ලද සත්‍ය ආර්ථික ලාභය හෝ ඇති කළ වටිනාකමයි. ප්‍රාග්ධනය කාර්යක්ෂම ලෙස පාවිච්චි කිරීම සහ ඉහළ ලාභයක් ලැබීම ඔස්සේ අපගේ කොටස්හිමියන්ට ඉහළ ම වටිනාකමක් ලබාදීම සඳහා අපි කැපවී සිටින්නෙමු. වසර 2017 දී ඇති කළ එකතු කළ ආර්ථික වටිනාකම රුපියල් බිලියන 34.9 ක් වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	**2017 රු. '000**	2016 Rs. '000	Change %
ආයෝජනය කළ හිමිකම්			
කොටස්හිමියන්ගේ අරමුදල්	**77,456,726**	59,648,856	29.9
එකතුකළා: ණය අලාභයන්/හානිකරණ සඳහා සමුච්චිත ප්‍රතිපාදන	**61,604,938**	60,295,848	2.2
එකතුව	**139,061,664**	119,944,704	15.9
ඉපයීම්			
බදු පසු ආදායම්	**18,249,777**	14,994,691	21.7
එකතුකළා: ණය අලාභයන් සහ වෙන්කිරීම/හානිකරණ සඳහා ප්‍රතිපාදන	**2,678,366**	1,246,748	114.8
අඩුකළා: අත්හැර දැමූ ණය	**(104,512)**	(103,986)	0.5
එකතුව	**20,823,631**	16,137,453	29.0
හිමිකම් පිරිවැය (මාස 12 ක බරකළ සාමාන්‍ය භාණ්ඩාගාරික බිල්පත්+අවදානම් වාරිකය 2% මත පදනම්ව)	**10.9%**	12.2%	
සාමාන්‍ය හිමිකම් පිරිවැය	**14,115,847**	14,005,160	0.8
එකතුකළ ආර්ථික වටිනාකම්	**34,939,478**	30,142,613	15.9

ලාභාංශ ගෙවීම සහ ලාභාංශ ප්‍රතිපත්තිය

අපගේ ලාභාංශ ප්‍රතිපත්තියට අනුව කොටස් හිමියන්ට මෙන්ම අපට ද සාධාරණවන ලෙස ලාභාංශ බෙදනු ලැබේ. 2017 වසරේ කරන ලද ලාභාංශ ගෙවීම් රුපියල් මිලියන 5,220 කි. ලාභාංශ බෙදීම සහ රඳවාගැනීම් අතර ප්‍රශස්ත තුලනයක් පවත්වාගනිමින් අපගේ කොටස්හිමියන් සඳහා ධනය උපරිම කිරීම අපි සහතික කරන්නෙමු.



අනාගත දැක්ම

ධරණීය සහ ස්ථිරසාර වර්ධන මට්ටම් ඔස්සේ කොටස්හිමියන්ගේ ධනය ඉපදවීම අපි අනවරතව සිදු කරන්නෙමු. අප මෙය සිදුකරන්නේ පාලනය වර්ධනය කරන අතරම වර්ධිත ලාභයක් උත්පාදනය සහ ආකර්ෂණීය මූල්‍ය ආදායම් සැලසීම මගිනි.

පාරිභෝගික ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂිතා

700,000
නව පාරිභෝගිකයන්

75,000 කට අධික
පාරිභෝගික පිරිසක් දැනුවත් කරන ලදී

අපගේ ස්වයංක්‍රීය ටෙලර්යන්ත්‍ර මගින්
මිලියන **48** කට අධික
මූල්‍ය ගනුදෙනු

අපගේ ස්වයංක්‍රීය ටෙලර්යන්ත්‍ර මගින්
රු. බිලියන **396** කට අධික
ගනුදෙනු

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන
737 ක්

පාරිභෝගික ප්‍රාග්ධන සංඛ්‍යාදත්ත

	2017	2016	2015	2014	2013
පාරිභෝගික ගිනුම් සංඛ්‍යාව (මිලියන)	**18.6**	17.9	16.7	16.1	15.3
ශාඛා සංඛ්‍යාව	**737**	737	740	739	735
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව	**572**	506	492	469	460
පාරිභෝගික තැන්පතු (රු. මිලියන)	**1,244,003**	1,072,812	899,238	793,342	762,249
ගෙවන ලද පොළී (රු. මිලියන)	**98,719**	66,846	48,732	54,362	73,791
පාරිභෝගික අත්තිකාරම් (දළ) (රු. මිලියන)	**1,074,248**	950,824	829,234	685,310	681,467

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව



පාරිභෝගික ප්‍රාග්ධනය කළමනාකරණය

අපගේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව වූ විශ්වාසය සහ අවබෝධය මත පදනම්ව දිගු කාලීන පාරිභෝගික සබඳතා අපි ගොඩනගන්නෙමු. එබැවින් පාරිභෝගික වටිනාකම් වර්ධනය කෙරෙන නව්‍යතාවයෙන් යුතු ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සේවාවන් සැලසුම්කර ඔවුන්ට එම සේවාවන් සැලසීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව ගැඹුරු අවබෝධය අපගේ මූල්‍ය විශේෂඥතාවය සමඟ මුසුකර කටයුතු කරන්නෙමු. අපගේ පාරිභෝගික සබඳතා තුළ ආයෝජනය කිරීම, නවීකරණය, ඩිජිටල්කරණය සහ මෙහෙයුම් සහ සේවා විශිෂ්ඨත්වය සමගින් මහජන බැංකුව විශේෂිත බවට පත් වී ඇත.

අපගේ පාරිභෝගික විශ්ලේෂණය

දිවයින පුරා විසිරී තිබෙන අපගේ ශාඛා ජාලය ඔස්සේ මිලියන 19 ක පමණ පාරිභෝගික පිරිසකට අපගේ සේවය සැලසේ. බැංකු ක්ෂේත්‍රයේ පවතින දැඩි තරඟකාරිත්වයක් තිබියදි වසර ගණනාවක් පුරා අපගේ පාරිභෝගික පදනම ධරණීය අයුරින් අප විසින් වර්ධනය කරගැනීමෙන් පාරිභෝගිකයන් තුළ අපගේ බැංකුව කෙරෙහි පවතින විශ්වාසය සහ ලැදියාව මෙන්ම අපගේ ශක්තිමත් සන්නාම කීර්තිනාමය ද විද්‍යාමාන වේ.සෑම වයස් කණ්ඩායම් මෙන්ම ආර්ථිකයේ සෑම අංශයන්ම ආවරණය කරමින් විවිධ වූ පාරිභෝගිකයන් කොටස් සඳහා අපි සේවය කරන්නෙමු. 2016 වසරේ පැවැති මිලියන 18 ක් වූ අපගේ පාරිභෝගික පදනම 4% කින් වර්ධනය වී 2017 වසරේ දී මිලියන 19 ක් විය. අපගේ පාරිභෝගික පදනමෙන් වැඩිම කොටසක් (52%) නිවාස සහ දේපළ සංවර්ධන ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන් වූ අතර කෘෂිකර්ම ක්ෂේත්‍රය දෙවැනි ස්ථානය වේ. භූගෝලීය ව්‍යාප්තියට අනුව අපගේ විශාලතම පාරිභෝගික සාන්ද්‍රනය කොළඹින් වාර්තා වේ.

ගනුදෙනුකාර ගිණුම් සංඛ්‍යාව



ආයතන පදනම් මත ගනුදෙනුකරුවන් - 2017



කර්මාන්ත මත පදනම් ව ගනුදෙනුකරුවන් - 2017



භූගෝලීය ව්‍යාප්තිය අනුව ගනුදෙනුකාර ගිණුම් - 2017



අපගේ නිමැවුම් සහ සේවා සැලසීම්

අපගේ පරිභෝගිකයන්ගේ එක් එක් ජීවන අවස්ථාවට අදාළ වන නව්‍යතාවයන් යුතු සුනම්‍ය සහ වියදම් පිරිමැස්මක් සහිත නිමැවුම් සහ සේවාවන් අපි සලස්සන්නෙමු. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනය බවට පත්වීමේ අධිෂ්ඨානය තිබෙන බැවින් පහත සංක්ෂිප්තකර තිබෙන පරිදි වූ සියලුම සහ විශිෂ්ඨ පරාසයේ නිමැවුම් සහ සේවාවන් අප විසින් සපයන්නෙමු.

අපගේ නිමැවුම් සහ සේවාවන්

පාරිභෝජික බැංකු කටයුතු

තැන්පත් නිමැවුම්

- ජංගම ගිණුම්
- ඉතිරි කිරීමේ ගිණුම්
  - *ඉසුරු උදාන*
  - *සිසු උදාන*
  - *යස් (Yes)*
  - *වනිතා වාසනා*
  - *ජනජය*
  - *අස්වැන්න*
  - *පරිනත*
  - පීපල්ස් රිලැක්ස්
  - සාමාන්‍ය ඉතිරිකිරීම්
- ස්ථාවර තැන්පතු
- ඇරයුම් තැන්පතු
- විදේශ මුදල් තැන්පතු

අත්තිකාරම්

- පෞද්ගලික ණය
- කාල ණය
- නිවාස ණය
- උකස් සේවා

වෙනත්

- හර/බැරපත්
- තෑගි වවුචර
- ජංගම බැංකු කටයුතු/SMS බැංකු කටයුතු
- අන්තර්ජාල බැංකු කටයුතු

ව්‍යවසාය බැංකු කටයුතු

- ජංගම ගිණුම්
- ඉතිරි කිරීමේ ගිණුම්
- ස්ථාවර තැන්පතු
- අයිරාවන්
- කාල ණය
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය
- සංවර්ධන සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය
- වෙළඳ මූල්‍ය

තොග බැංකු කටයුතු

- ජංගම ගිණුම්
- ඉතිරි කිරීමේ ගිණුම්
- ස්ථාවර තැන්පතු
- අයිරාවන්
- කාල ණය
- වෙළඳ මූල්‍ය
  - ආනයන/අපනයන මූල්‍ය සැපයුම්
  - නාවුක සහ බැංකු ඇපකාර
  - ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම්

භාණ්ඩාගාර සහ ආයෝජන බැංකු කටයුතු

- මූල්‍ය වෙළඳපල කටයුතු
- රජයේ සුරැකුම් වෙළඳාම
- රජයේ සුරැකුම් නැවත මිලදී ගැනීම් ගනුදෙනු
- විනිමය හුවමාරු ගනුදෙනු
- ව්‍යුත්පන්න ගනුදෙනු (විනිමය ගිවිසුම් සහ විදේශ විනිමය හුවමාරු)
- ආයෝජන බැංකු කටයුතු
  ණය ව්‍යුහගත කිරීම්, උපදේශන සේවා, භාරකාර සේවා

ජාත්‍යන්තර මෙහෙයුම්

- වෙළඳ සේවාවන්
- විදේශීය පරිභෝගික සේවා
- විදේශ මුදල් ප්‍රේශණයන්
- විදේශ මුදල් තැන්පතු
- ජත්‍යන්තර ගෙවීම් සහ බේරුම් කිරීම් සේවාවන්

වැඩි තොරතුරු දැන ගැනීමට අපගේ www.peopleshank.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

නිමැවුම් සහ සේවා ලේබල් කිරීම් සහ අලෙවිකරණ සන්නිවේදනයන්

සාධාරණ සහ නිවැරදි තොරතුරු දැන ගැනීමේ පාරිභෝගිකයන්ගේ අයිතින්ට අපි ගරු කරන්නෙමු. එබැවින් දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගැනීමට හැකිවන පරිදි අපගේ නිමැවුම් සහ සේවාවන් පිළිබඳව පැහැදිලි, නිවැරදි කාලීන සහ අදාළ සියලුම තොරතුරු අපි ලබා දෙන්නෙමු. ශ්‍රීලංකා මහා බැංකුවේ අවශ්‍යතාවයනට අනුකූලවන පරිදි අප විධිමත්ව බැංකුවේ පාරිභෝගික ප්‍රඥප්තිය සකස් කර තිබේ. අපගේ නිමැවුම් සහ සේවාවන්ට අදාළ වන සියලුම වගන්ති සහ කොන්දේසි සරළව සහ පහසුවෙන් අවබෝධකරගත හැකි පරිදි සකසා තිබෙන බවට ද අපි සහතික වන්නෙමු. තැන්පතු සහ අත්තිකාරම් මත ගෙවන පොළි අනුපාතයන් විනිමය අනුපාතයන් සහ අනෙකුත් අදාළ වන ගාස්තු ආදිය අපගේ සංස්ථාපිත වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කෙරෙන අතර ඒවා දෛනිකම යාවත්කාලීන කෙරේ. අපගේ නිමැවුම් සහ සේවාවන් සහ අදාළ වගන්ති සහ කොන්දේසි ආදිය පිළිබඳ භාෂා තුනෙන්ම (සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි) අපගේ විස්තර පත්‍රිකාවන්හි මුද්‍රණය කර තිබෙන අතර අපගේ සියලු ම ශාඛාවන් වෙතින් එම පත්‍රිකාවන් ලබාගත හැකිය. ඊට අමතරව අපගේ ඇමතුම් මධ්‍යස්ථානය මගින්ද අපගේ නිමැවුම් සහ සේවාවන් පිළිබඳව තොරතුරු පාරිභෝගිකයන්ට සපයනු ලැබේ. ප්‍රචාරණ සහ ප්‍රවර්ධනය ආදි වූ අපගේ වෙළඳ සන්නිවේදනයන් බැංකුවේ සංස්ථාපිත සන්නිවේදන ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි සැලසුම් කෙරේ.

අපගේ වෙළඳ සන්නිවේදනයන් භාෂා තුනෙන්ම පවත්වනු ලබන අතර අපගේ වෙළඳ සන්නිවේදන කාර්යන්හි පාරිභෝගිකයන් නොමග යවන සුළු තොරතුරු අඩංගු නොවන බවට අපි සහතික වන්නෙමු. අපගේ සියලුම සන්නිවේදනයන් බැංකුවේ සන්නාම මාර්ගෝපදේශකයන්ට අනුකූල වන සදාචාරාත්මක සහ වගකීමෙන් යුතු ප්‍රචාරණ නිරූපනයන් මත පදනම් ව තිබේ.ප්‍රකාශයට පත්කිරීමට පෙර විවිධ මට්ටමේ අනුමත කිරීම් ක්‍රියාවලියක් මගින් සිදු කෙරෙන දැඩි නිරීක්ෂණයකට යටත් කෙරේ.

සමාලෝචිත වර්ෂය තුළ දී අපගේ නිමැවුම් සහ සේවා ලේබල් කිරීම් සහ වෙළඳ සන්නිවේදනයන්ට හෝ වෙනත් කිසියම් ස්වේච්ඡා ආචාරධර්ම පද්ධතියකට හෝ මාර්ගෝපදේශනයන්ට අනුකූල නොවූ සිද්ධි කිසිවක් පිළිබඳව වාර්තා නොවිනි.

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන

ශ්‍රී ලංකාවේ විධාත්ම පැතිරුණු බැංකු ශාඛා ජාලය වූ අපගේ ශාඛා මගින් අපගේ පරිභෝගිකයන්ට පුළුල් පරාසයක මූල්‍ය සේවාවන් අප විසින් සලසනු ලැබේ. ඊට අමතරව අපගේ පාරිභෝගිකයන් සම්බන්ධ කරගැනීමේ විවිධාකාර මාර්ගයන් අප පිහිටුවා තිබේ. පාසල් ඉතුරුම් ඒකක 1,287ක් ද ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 572ක් ද කියොස්ක් යන්ත්‍ර 96ක් සහ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර 121ක් ද මීට අයත් වේ. වසර තුළදී අළුතින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 66ක් ද ස්වයං සේවා කියොස්ක් මධ්‍යස්ථාන 94ක් සහ මුදල් තැන්පතු යන්ත්‍ර 116ක් පිහිටුවමින් අපගේ ජාලයන් විස්තාරණය කරන ලදී. ආබාධිත පුද්ගලයන්ට ද ප්‍රවේශය සලසමින් පහසුවෙන් සමීප වියහැකි පහසුකම් සහිත නවීන බැංකු කටයුතු පරිසරයක් බිහිකිරීමත් නවත් අමතර පහසුකම් ද සමගින් බැංකුවේ නවීකරණ වැඩපිළිවෙල වසර තුළදී සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. වසර තුළ දී අපගේ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ජාලය ඔස්සේ රුපියල් මිලියන 396,518ක වටිනාකමින් යුතු ගනුදෙනු මිලියන 48ක් ක්‍රියාත්මක කර තිබේ.

ව්‍යාපාර ප්‍රවර්ධනය, පාරිභෝගික සේවා, ගතවන කාලය සහ අක්‍රිය ණය ආදිය ඇතුළත්වන මූලික කාර්යසාධන දර්ශක මත පදනම්ව අපගේ ශාඛාවන්හි කාර්යසාධනය බැංකු මෙහෙයුම් කළමනාකරණ අංශය මගින් නියාමනය කෙරේ. සෑම කාර්තුවක් පාසාම විශිෂ්ට කාර්යසාධනයක් සහිත ශාඛාව තෝරාගෙන ඊට අගැයීමක් සිදුකෙරෙන අතර එමගින් සේවක අභිප්‍රේරණය ඇති කිරීමට සහාය ලැබේ. ඊට අමතර වශයෙන් අභ්‍යන්තර පාලනයෙහි ඵලදායීතාවය සහ අවදානම් කළමනාකරණ තත්වයන් නිසි පරිදි ඉටුවේදැයි සහතික වීම සඳහා අපගේ අභ්‍යන්තර විගණන අංශය නිරීක්ෂණ චාරිකා සිදු කරයි.

පරිපූර්ණ බැංකු කටයුතු

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් අවාසි සහගත ප්‍රදේශ සඳහා දොරටු විවෘත කළ ශ්‍රී ලංකාවේ පළමු වැනි මූල්‍ය ආයතනය අප වේ. ජනවාර්ගික අර්බුදය අවසන් වීමට සහ අනෙකුත් මූල්‍ය ආයතනයන් ප්‍රවේශවීමට පුර්වයෙන් වසර 55 කට අධික කාලයක් උතුරු සහ නැගෙනහිර පළාත්වල අපගේ කාර්යයන් ක්‍රියාත්මකව පැවතියේ එබැවිනි.මෙම කලාපයන්හි සේවය කරන අපගේ කාර්ය මණ්ඩල සේවකයන් භාෂා තුනෙහිම ප්‍රවීනත්වයක් දරන අතරම සියලුම වෙළඳ සන්නිවේදනයන්ම භාෂා ත්‍රිත්වයෙන්ම ලබාදෙනු ලැබේ. ඊට අමතර වශයෙන්, අපගේ ශාඛා 138 ක් විශේෂ හැකියාවන් සහිත (ආබාධිත) පාරිභෝගිකයන්ට පහසු ප්‍රවේශයන් සහ සේවාවන් සලසනු ලැබේ.

අපගේ ජාතියේ අඩු සේවා පහසුකම් සහිත පාරිභෝගික භාණ්ඩවලට නිමැවුම් සහ සේවාවන් දියත් කිරීමට අපි විශේෂයෙන් වන්නෙමු. කාන්තාවන් සහ ළමයින්ට නිමැවුම් සහ සේවාවන් සැලසීමෙහි ලා අප පුරෝගාමීන් වේ. බොහෝ මූල්‍ය ආයතනයන් වර්තමානයේ දී මෙම ක්ෂේත්‍රයේ මෙහෙයුම් කාර්යයන්හි නියැලෙන නමුදු මෙම කණ්ඩායමේ සැලකියයුතු වෙළඳපල කොටසක් තවමත් අප සතුවේ.

විශේෂිත ඉතිරිකිරීම්



	සියලුම පළාත්	ආර්ථික වශයෙන් අඩු පහසුකම් සහිත පළාත්		
		උතුරු	නැගෙනහිර	ඌව
ශාඛා සංඛ්‍යාව	737	48	61	49
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	572	28	32	34
මුදල් නැන්පත් කිරීමේ යන්ත්‍ර	121	2	4	4
කියොස්ක් සංඛ්‍යාව	96	2	4	4
අත්තිකාරම් (රු. මිලියන)	1,074,248	25,852	44,950	23,382
තැන්පතු (රු. මිලියන)	1,244,003	44,107	40,572	40,696



වයඹ පළාත

	ශාඛා සංඛ්‍යාව
පුත්තලම	23
කුරුණෑගල	52

මධ්‍යම පළාත

	ශාඛා සංඛ්‍යාව
මහනුවර	50
මාතලේ	19
නුවරඑළිය	27

බස්නාහිර පළාත

	ශාඛා සංඛ්‍යාව
කොළඹ	122
ගම්පහ	59
කළුතර	35

සබරගමු පළාත

	ශාඛා සංඛ්‍යාව
කෑගල්ල	28
රත්නපුර	28

උතුරු පළාත

	ශාඛා සංඛ්‍යාව
යාපනය	29
වව්නි	19

උතුරු මැද පළාත

	ශාඛා සංඛ්‍යාව
අනුරාධපුර	32
පොළොන්නරුව	18

නැගෙනහිර පළාත

	ශාඛා සංඛ්‍යාව
අම්පාර	25
මඩකලපුව	19
ත්‍රිකුණාමලය	17

ඌව පළාත

	ශාඛා සංඛ්‍යාව
බදුල්ල	35
මොනරාගල	14

දකුණු පළාත

	ශාඛා සංඛ්‍යාව
ගාල්ල	36
මාතර	29
හම්බන්තොට	21

බහු චැනල බැංකු කටයුතු

අපගේ සංස්ථාපිත උපායමාර්ගයට අනුව අපගේ බැංකුව සමග කටයුතු කිරීම සඳහා පාරිභෝගිකයන්ට විවිධාකාර මාර්ගයන් අප විසින් සලසා තිබේ. අපගේ අන්තර්ජාල සහ ජංගම දුරකථන බැංකු කටයුතු ශක්තිමත් කරන අතරේ සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකේය මෙතෙක් දියත් කරන ලද පළමු ඩිජිටල් බැංකු කාර්යයන් ද අපි දියත් කළෙමු.

1. ඩිජිටල් බැංකු කටයුතු

නවතම පාරිභෝගික සහ වෙළඳපල ප්‍රවණතාවන්ට ගැලපෙන පරිදි ඩිජිටල්කරණ කටයුතු ආරම්භ කරමින් අපගේ නායකත්වය ශක්තිමත් කර ඇත. අධිවේගී බැංකුකරණ පහසුකම් සහිත ශ්‍රී ලංකාවේ ප්‍රථම ඩිජිටල් මධ්‍යස්ථානය විවෘත කිරීම මගින් ග්‍රාමීය ගොවි ජනතාවගේ සිට ප්‍රමුඛ සංස්ථාපිත ආයතනයන් දක්වා වූ අපගේ පුළුල් පාරිභෝගික පදනමක් සහිත වූ අපගේ සියලුම කොටස්කරුවන්ට ඩිජිටල් බැංකුකරණයේ පහසුකම් සැලසීමට අපට හැකි වී තිබේ. රටේ පළමුවන වරට ඩිජිටල්කරණය කළ රාජ්‍ය බැංකුව වශයෙන් ඩිජිටල් ආර්ථිකයක අනර්ඝ ලාභයන්හි ඵල නෙලාගැනීමට ශ්‍රී ලංකාවට හැකිවන බවට අපි විශ්වාස කරන්නෙමු.

අධිවේගී බැංකුකරණ ක්‍රමයේ වාසි සහගත ත්ත්වයන් වූ ගිණුමක් ආරම්භ කිරීමේ සිට e-ප්‍රකාශයක් මගින් ක්ෂණික ප්‍රවේශය ලබාගැනීම, සිහිකැඳවුම්, කෙටි පණිවුඩ, ඩෙබිට් කාඩ්පත්, මුදල් තැන්පත් කිරීම සහ ආපසු ගැනීම, අරමුදල් හුවමාරු කිරීම, ජංගම බිල්පත් ගෙවීම, අන්තර්ජාල බැංකු කටයුතු සහ කියෝස්ක් යන්ත්‍ර සහ තවත් බොහෝ පහසුකම් සහිත සේවාවන් ද ක්ෂණිව සිදුකරගැනීමේ සතුට භුක්තිවිඳීමට පාරිභෝගිකයන්ට හැකියාව ලැබේ.අපගේ සම්පූර්ණ ජාලයම පූර්ණ ක්‍රියාකාරී ත්තවයට පත්වීමෙන් පසුව දවසේ පැය 24 පුරාම තමන්ගේ ගනුදෙනු කටයුතු වේගවත්ව පහසුවෙන් නිවැරදිව සහ සකසුරුවම් අන්දමින් සිදු කරගැනීමට අපගේ පාරිභෝගිකයන්ට හැකියාව ලැබෙනු ඇත.

ඊට අමතරව අපගේ ග්‍රාමීය පාරිභෝගිකයන්ට තම ජංගම උපකරණ මගින් ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුකම් සලසාගැනීමට උපකාර කිරීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ දොරකඩට ඩිජිටල් බැංකු කටයුතු ගෙනයාමට යොදවා තිබේ. කාබන්ඩයොක්සයිඩ් විමෝචනයන් අවම කිරීමත් කඩදාසි භාවිතය රහිතව බැංකු කටයුතු කිරීමටත් වූ අපගේ පරිසරය සුරැකීමේ ප්‍රතිඥාව සමෘද්ධ කිරීම සඳහා මෙම වසරේ දී පූර්ණ ඩිජිටල් කළ ශාඛාවන් තවතවත් විවෘත කිරීමට අපි අදහස් කරන්නේමු. ඊට අමතර වශයෙන් ඩිජිටල් බැංකු කටයුතු මගින් වේගවත්ව සහ පහසුවෙන් ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුකම ලැබීමෙන් විශාල පිරිසක් පොදි ගැසීමෙන් පෝලිම් වල රැඳීසිටීමත් ඉතා අවම වීමෙන් අපගේ ශාඛාවන්හි ඵලදායීතාවය ද වර්ධනය වේ.

2. ජංගම බැංකුකරණය සහ අන්තර්ජාල බැංකුකරණය

අපගේ අන්තර්ජාල බැංකු පද්ධතිය පාරිභෝගිකයන්ට වඩාත් පහසුකම් ලැබෙන පරිදි උසස් තත්වයට පත්කරන ලද අතරම ගනුදෙනුවල සුරක්ෂිතතාවය ද ශක්තිමත් කර තිබේ. එසේම 2017 වසරේ දී අපගේ අන්තර්ජාල බැංකුකරණය උපයෝගී කරගන්නා පාරිභෝගික පිරිස ද සැලකිය යුතු අයුරින් වර්ධනය විය.

ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය උපයෝගී කරගන්නා ගනුදෙනුකරුවන්



මූල්‍ය ගනුදෙනු සංඛ්‍යාව







අපගේ බහුවිධ චැනලයන් පහත දැක්වේ.



අපගේ ඇමතුම් මධ්‍යස්ථාන

බැංකු කටයුතු පිළිබඳ අපගේ නවීකරණ ප්‍රවේශය අනුව, වර්ධනය කළ පහසුකම් අපගේ පාරිභෝගිකයන්ට සැලසීම සඳහා මේ දක්වා ශ්‍රී ලංකාවේ පැය 24 පුරා සේවය සහිත වූ පළමුවැනි ඇමතුම් මධ්‍යස්ථානය අපි විවෘත කළෙමු. 2017 මාර්තු මාසයේ දී විවෘත කළ මෙම ඇමතුම් මධ්‍යස්ථානය බැංකු කර්මාන්තයේ සියලුම පාරිභෝගික සේවා ප්‍රමිතීන් වඩාත් ඉහළ තත්වයකට නිරන්තරවම ඔසවා තැබීම මගින් කාලයක සිට තිබූ අවශ්‍යතාවයක් සැපිරීමත් අපගේ කැපවීමත් විද්‍යාමාන සිදුවිනි.

අපගේ පාරිභෝගිකයන්ට මෙන්ම මහජනතාවට ද 1961 අංකයට ඇමතීමෙන් දවසේ පැය 24 පුරාම අපගේ ඇමතුම් මධ්‍යස්ථානය සමග සම්බන්ධ වියහැකිවන අතර අපගේ නිමැවුම් සහ සේවාවන්, ක්‍රෙඩිට් කාඩ් සහ ඩෙබිට් කාඩ් ශේෂයන්, කාඩ්පත් සක්‍රිය කිරීම සහ අක්‍රිය කිරීම, ක්‍රෙඩිට් කාඩ් සීමාවන් වැඩිකරගැනීම, තෝරාගත් ශාඛාවන්හි විවෘත කිරීමේ සහ වැසීමේ කාලවේලාවන් ද ඒවායෙහි පිහිටීම ආදී වූ බැංකු කටයුතුවලට අදාළ පරාසයන්හි තොරතුරු දැනගැනීම සහ පාරිභෝගික පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය ඇමතීමට හැකිය. අපගේ සේවාවන් භාෂා තුනෙන්ම සැලසේ.

අපගේ බැංකුවේ අනේවාසික පාරිභෝගිකයන්ට ද +94 11 203 1001 අංකයට ඇමතීමෙන් අපගේ ඇමතුම් මධ්‍යස්ථානයේ සේවය ලබාගත හැකි වේ.

වසර තුළ දී අපගේ ඇමතුම් මධ්‍යස්ථානය සේවය ලබාදුන් ඇමතුම් සාමාන්‍යය දිනකට ඇමතුම් 2,000ක් වූ අතර එම එක් එක් ඇමතුමට පිළිතුරු දීමට ගත වූ කාලයේ සාමාන්‍යය තත්පර එකකි.

පාරිභෝගික අධ්‍යාපනය

ව්‍යුහගත කරන ලද පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන් සහ පාරිභෝගික සහභාගිත්ව ක්‍රියාකාරකම් ඔස්සේ බැංකු කටයුතු සඳහා පවතින සමාජීය සහ ඩිජිටල් කාර්යය බාධාවන් අවම කිරීමට අපි වෙහෙස දරන්නෙමු. ගත වූ වසර තුළ දී පහත වගුවේ විස්තර කෙරෙන පරිදි දිවයින පුරා 75,000 කට අධික පාරිභෝගික පමණ පිරිසකගේ වටිනාකම් වර්ධනය කිරීම පිණිස විවිධාකාර ක්‍රියාකාරකම් සහිත වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

වැඩසටහන්/ක්‍රියාකාරකම්	අරමුණ විස්තරය	කලාපය/දිස්ත්‍රික්කය	සහභාගි වූ සංඛ්‍යාව
කාන්තාවන්ගේ "වනිතා වාසනා" වැඩමුළුව	කාන්තා ආරක්ෂණය සහ ප්‍රවේශම පවුලේ පෝෂණය, මූල්‍ය විනය ආකල්ප සහ පෞරුෂත්ව වර්ධනය පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම	ගාල්ල, මහනුවර, කැගල්ල, අම්බලන්ගොඩ	1,000කට අධික
"සුජය" පුවත්පත සමගින් සිසු උදාන 5 වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන	5 වසර ශිෂ්‍යත්වය පිළිබඳව සිසුන් සහ ඔවුන්ගේ දෙමව්පියන්ව දැනුවත් කිරීම	දිවයින පුරා සම්මන්ත්‍රණ 84 ක්	සිසුන් 50,000ක් සහ මව්පියන් 25,000ක් පමණ
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පාරිභෝගිකයන් සඳහා "Enterpreneur Glory" වැඩසටහන	බැංකුකරණය, මූල්‍ය ගණකාධිකරණය මූල්‍ය කළමණාකරණ, අලෙවිකරණය, ව්‍යාපාරික උපායමාර්ග සහ බදුකරණය ආදි ක්ෂේත්‍රයන් පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම	පොළොන්නරුව, ගම්පහ මොනරාගල	පාරිභෝගිකයන් 525ක්

"සුජය" පුවත්පත සමගින් දිවයින පුරා සිසුන් සඳහා සිසු උදාන 5 වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ වැඩසටහන්

ගාල්ල මහනුවර කෑගල්ල සහ අම්බලන්ගොඩ දිස්ත්‍රික්කයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පාරිභෝගිකයන් සඳහා "Enterpreneur Glory" වැසටහන් මාලාව පැවැත්වීම.

පාරිභෝගික තෘප්තිය

බැංකුව පිළිබඳව පාරිභෝගිකයන්ගේ ආකල්පය සහ හැඟීම කෙබඳු දැයි සහමතික කරගනුවස් සමීක්ෂණයක් පැවැත්වීම සඳහා 2017 වසරේ දී ස්වාධීන වෙළඳපල සමීක්ෂණ සංවිධානයක සේවය ලබාගන්නා ලදී. මෙහි අරමුණු වුයේ බැංකුවේ සමස්ථ සන්නාම සාධාරණත්වය, අපගේ CSR ව්‍යාපෘති පිළිබඳව පාරිභෝගික අවබෝධතා මට්ටම්, අපගේ ශාඛාවන් වෙතින් ලැබුණු තෘප්තිමත් භාව මට්ටම් සහ අපගේ නිමැවුම් සහ සේවාවන් පරිහරණය පිළිබඳව තොරතුරු දැන ගැනිමයි. සමස්ථයක් වශයෙන් සන්නාම සාධාරණත්ව දර්ශකය 3.5ක් වූ අතර එමගින් මහජන බැංකුවේ ශක්තිමත් සන්නාම සාධාරණත්වය දැක්වේ. නිමැවුම් විශේෂිකරණය කිරීම්, විශේෂ පාරිභෝගික අවශ්‍යතාවයන්ට ගැලපෙන නිමැවුම්, මිත්‍රශ්‍රීලි සහ උපකාරී පාරිභෝගික සේවා, සුවපහසුව සහ ශාඛා සේවාවන් දියුණු කිරීම ආදී වූ සන්නාම සාධාරනත්වය ගොඩනැගීම සඳහා තවත් දියුණු විය යුතු අංශයන් මොනවාද යන්න සමීක්ෂණය මගින් හඳුනා ගැනිනි. ඊට අනුකූලව පාරිභෝගික අවශ්‍යතාවයන්හි හඳුනාගත් පරතරයන් අවම කිරීම සඳහා උචිත පියවරයන් ගන්නා ලදී.

පාරිභෝගික දුක්ගැනිවිලි විසඳීම

පාරිභෝගික තෘප්තිය වර්ධනය කිරීමට අවශ්‍ය වන පරිදි පාරිභෝගික පැමිණිලි සාධාරණ සහ ඵලදායී ලෙස ඉක්මනින් නිරාකරණය කිරීමට අප උත්සහ ගන්නෙමු. අපගේ ශාඛාවන් සහ වෙබ් අඩවිය ඔස්සේ පාරිභෝගිකයන්ට සන්නිවේදනය කරන ලද ව්‍යුහගත පාරිභෝගික පැමිණිලි සහ දුක් ගැනිවිලි නිරාකරණ ක්‍රියාවලියක් අප සතු වේ. කිසියම් දුක් ගැනවිල්ලක් විසඳිම සඳහා බැංකුව විසින් දරණ ලද ප්‍රයත්නයන් පිළිබඳව පාරිභෝගිකයා අතෘප්තිමත් වන අවස්ථාවක දී එම දුක් ගැනවිල්ල මුල්‍ය කටයුතු ඔම්බුඩ්ස්මන්වරයා වෙතට පැමිණිවීමට පාරිභෝගිකයාට හැකියාව තිබෙන අතර ඔහුගේ සම්බන්ධ කර ගැනිමේ තොරතුරු අපගේ සෑම ශාඛාවකම ප්‍රදර්ශණය කෙරේ.

මීට අමතර වශයෙන්, පැය 24 පුරාම ක්‍රියාත්මක වන හදිසි ඇමතුම් දුරකථන අංකයක් අප විසින් ක්‍රියාත්මක කර තිබෙන අතර සහ පාරිභෝගික පැමිණිලි මෙහෙයුම් ඒකකයක් ද එමගින් දුක් ගැනවිලි පටිගත කර ඒවාට ඉක්මනින් ප්‍රතිචාර නිශ්චිත කාල සිමාවක් තුළ ලබා දෙනු ලැබේ. පළමුවෙන් ම දුක් ගැනවිලි ආදාල කළාපීය කළමණාකරු වෙත යොමු කරනු ලබන අතර එම දුක් ගැනවිලි විමර්ශනය කිරිම සහ ප්‍රතිචාර දැක්වීමේ වගකිම හෙතෙම සතු වේ. සේවකයන් පිළිබඳව යලි යලිත් මතු වන පැමිණිලි සහ දුක් ගැනවිලි සමාලෝචනය කර ඒ පිළිබඳව කටයුතු කිරිම සඳහා බැංකුවේ අභ්‍යන්තර පරීක්ෂණ සහ විමර්ශන අංශයට යොමු කෙරේ. ශාඛා කළමනාකරුවන්ගේ මාසික රැස්වීම් පාරිභෝගික පැමිණිලි පිළිබඳව සේවකයන්ට තොරතුරු දන්වන අතර පෙත්සමක් ඉදිරිපත් වීම වැළැක්වීම සඳහා නිවැරදී කිරිමේ කටයුතු නිර්දේශ කරනු ලැබේ. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර අක්‍රිය වීම පිළිබඳව පැමිණිලි නියාමනය කිරිම සඳහා ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර පාලන මධ්‍යම අංශයක් ද අප විසින් ස්ථාපනය කර තිබේ. සෑම අක්‍රිය වීමක් ම අදාල ශාඛාවන්ට යොමු කිරිම හා ඒ සම්බන්ධයෙන් ක්ෂණිකව පියවර ගැනීමත් සහතික කරනු පිණිස ශක්තිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මකව පවතී. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ක්‍රියාත්මකව පවතින කාලයේ සාමාන්‍යය 99.9%ක් වේ.

2017 වසරේ දී ලැබුණු පාරිභෝගික පැමිණිලි පිළිබඳ තොරතුරු

විස්තරය	සංඛ්‍යාව
ලැබුණු පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව	251
විසඳන ලද පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව	214
විසඳුම් අපේක්ෂිත පැමිණිලි	
- විමර්ෂණය කිරීමට තිබෙන	17
- නෛතික කටයුතු කිරීමට තිබෙන	3
- දැනට කටයුතු කෙරෙමින් පවතින	17

පාරිභෝගික සෞඛ්‍යය සහ ආරක්ෂාව

අපගේ පාරිභෝගිකයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාවට සිදුවිය හැකි බලපෑම් අවම කිරීමට ඉවහල් වන පරිදි අපගේ නිමැවුම් සහ සේවාවන් සැලසුම් කිරීමේ දී උපරිම අවධානයක් යොමු කරන නමුත් අපගේ ව්‍යාපාර ස්වභාවය හේතුවෙන් එම බලපෑම් වල ස්වභාවය පහසුවෙන් අගැයීම් කළ නොහැක.

පාරිභෝගික පෞද්ගලිකත්වය

මූල්‍ය ආයතනයක් වශයෙන් පුළුල් පරාසයක් වූ බැංකු ගනුදෙනු පිළිබඳව සංවේදී තොරතුරු විශාල පරිමාවක් අප විසින් මෙහෙයවනු ලැබේ. එබැවින් අපගේ පාරිභෝගිකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන අතරම ඔවුන්ගේ රහස්‍යභාවය පිළිබඳව ඉතා ඉහළ ප්‍රමිතීන් ද අපි පවත්වා ගන්නෙමු.

තහනම් කළ සහ විවාදාත්මක නිමැවුම් අලෙවි කිරීම

අප කටයුතු කරන්නේ ශ්‍රී ලංකා මහා බැංකුවේ පාරිභෝගික ප්‍රඥප්තියට දැඩි අනුකූලත්වයෙන් යුතුවයි. එබැවින් වෙළඳපොලෙහි තහනමට ලක්ව තිබෙන හෝ කොටස්කරුවන් හෝ මහජනතාව අතර විවාදයට භාජනය විය හැකි නිපැයුම් අලෙවි කිරීම අපි සිදු කරනු නොලබයි. අපගේ ණය ප්‍රතිපත්තියෙහි නීති විරෝධී වශයෙන් සඳහන්ව තිබෙන කිසිදු නීති විරෝධී ව්‍යාපෘතියක් සඳහා අප විසින් මූල්‍ය සම්පාදනය නොකෙරේ.

නිමැවුම් වගකීමට අදාළ වන සියලුම කාර්යයන් කෙරෙහි පරිපූර්ණ අනුකූලතාවය

සමාලෝචිත වර්ෂය තුළ, නිමැවුම් සහ සේවා තොරතුරු, ලාංඡනයන්, නිමැවුම් සහ සේවාවන්හි යහපත් තත්වය සහ ආරක්ෂාවත්, අලෙවිකරණ සන්නිවේදනයන් සහ පාරිභෝගික පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම ආදිය පිළිබඳව අදාළවන සියලුම රෙගුලාසි සහ ස්වේච්ඡා ආචාරධර්මයන්ට ද බැංකුව අනුකූලතාවය දක්වා තිබේ.

එබැවින්, වසර තුළ දී බැංකුවට එරෙහිව කිසිදු අනතුරු ඇගවීමක් සහ/හෝ දඩ/වන්දි මුදලක් පැනවීමක් හෝ සිදු නොවිනි.

අනාගත දැක්ම

පාරිභෝගික අපේක්ෂාවන්ට ගැලපෙන අයුරින් අපගේ සේවාවන් විකාශනය කිරීම සඳහා අපගේ සේවා පරාසයන් පුළුල් කිරීමත් නවීකරණය කිරීමත් අප විසින් නිරන්තරව සහ අඛණ්ඩව සිදු කරන්නෙමු. ශ්‍රී ලංකාවේ විශාලතම පාරිභෝගික පදනම සහිත බැංකුව වශයෙන් අපගේ ජනගහනයෙන් විශාල බහුතරයකට මූල්‍යමය දැනුවත්භාවය සහ අපගේ ඩිජිටල් නාක්ෂණය සහිත මූල්‍ය සේවාවන් පිළිබඳව දැනුවත්භාවය ලබාදීමට කටයුතු කරන්නෙමු. සෑම අවස්ථාවක ම ඉතා සුවිශේෂී පාරිභෝගික සේවාවක් සලසමින් සේවා ප්‍රමිතීන් ඉහළ නැංවීමට අපි අනවරතව කටයුතු කරන්නෙමු.

ව්‍යාපාරික හවුල්කරුවන්

2017 වසරේ සුවිශේෂීතා

නියෝජිත බැංකු 26 ක් සමඟින්
වසර **20** කට අධික
සබඳතාවය

වරලත් නියෝජිතයන් සමඟ
වසර **20** කට අධික
සබඳතාවය

සැපයුම්කරුවන් සඳහා
රු. බිලියන **10.5** ක
වටිනාකම් ඇති කිරීම

සැපයුම්කරුවන් සැපයූ වටිනාකම්
22.2% කින්
වර්ධනය වීම

ව්‍යාපාරික හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සංඛ්‍යා දත්ත

	2017	2016	2015
ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව	**662**	363	217
නියෝජිත බැංකු සංඛ්‍යාව	**46**	49	49
වොස්ට්‍රෝ නියෝජිතයන්ගේ සංඛ්‍යාව	**72**	70	71
සැපයුම්කරුවන්ට කළ ගෙවීම් (රුපියල් බිලියන)	**10.5**	8.6	7.2

ගෝලීය හවුල්කාරත්වයන්

නියෝජිත බැංකු 46 සහ විනිමය හුවමාරු මධ්‍යස්ථාන 72 ක් ද සහිතව ජාතීන් 108 ක් ජාලයක් සමඟින් අප විසින් අපගේ ගෝලීය ප්‍රවේශ පහසුකම් සලසා තිබේ. අපගේ නියෝජිත බැංකු ලෝකයේ විශාලතම මුල්‍ය ආයතනයන් වන අතර අපගේ හුවමාරු මධ්‍යස්ථාන විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණයන් කිරීමට පහසුකම් සලසයි. හවුල්කරුවන් තෝරාගනු ලබන්නේ දැඩි ඇගැයීම් ක්‍රියාවලියක් මගිනි. අපගේ ගෝලීය හවුල්කරුවන් සමඟ පැහැදිලි ගිවිසුම්වලට එළඹ තිබෙන අතර එම ගිවිසුම් මත පදනම්ව අපගේ ගෝලීය මෙහෙයුම් කටයුතු සිදු කෙරේ.

ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය කළමනාකරණය

අපගේ ව්‍යාපාරය හවුල්කරුවන් සැපයුම්කරුවන්, නියෝජිත බැංකු සහ වරලත් නියෝජිත හවුල්කරුවන් ආදියෙන් සමන්විත වේ. අපගේ ව්‍යාපාර කාර්යයන්හි සුමට ක්‍රියාකාරිත්වය සඳහා අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් මහෝපකාරී වෙයි. ඒබැවින් අපගේ වටිනාකම් ක්‍රියාවලියෙහි වැදගත් භූමිකාවක් ඉටු කරන පුළුල් පරාසයක විසිරුණු අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ දිගු කාලීන සබඳතා අප විසින් සාර්ථකව ගොඩනගා ගෙන ඇත්තෙමු. අන්‍යෝන්‍ය ප්‍රතිලාභයන් සහිත සබඳතා අප විසින් ගොඩනගන අතරම අපි ව්‍යාපාරික ආචාරධර්ම ප්‍රතිපත්ති අනුගමනය කරන්නෙමු. අපගේ ශාඛාවන් පිහිටි ප්‍රදේශයන්ගෙන් ප්‍රාදේශීය සැපයුම් සහ සේවාවන් තෝරා ගැනීමට අප උත්සහ දරන අතරම ඔවුනට වැඩිදියුණු තත්ත්වයේ වටිනාකම් සැලසීමට අපි උත්සුක වන්නෙමු.



සැපයුම් දම කළමනාකරණය

සැපයුම්කරුවන් තෝරා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරන්නෙමු. සෑම විසරකම ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම සිදුකර ඉන් අනතුරුව ප්‍රමිති පරීමිතීන් මිල තත්ත්වයන් සහ පාරිසරික සහ කම්කරු රෙගුලාසීන්ට අනුකූල වන බව ආදී කරුණු අඩංගු වන ප්‍රබල අගැයීම් ක්‍රියාවලියක් මගින් නව සැපයුම්කරුවන් ලියාපදිංචි කෙරේ. විශ්වාසනීය මට්ටම සහ අපගේ උපායමාර්ග ඉලක්කයන් සපුරාගැනීමට අවශ්‍ය කෙරෙන අන්තර් ක්‍රියාකාරිත්ව මට්ටම ද මත පදනම්ව අපගේ සැපයුම්කරුවන් සමගින් විවිධ මට්ටමින් වූ සන්නිවේදනයන් අප විසින් පවත්වාගනු ලැබේ.

සැපයුම්කරුවන් ප්‍රමුඛගතකරණය කිරීමේ ක්‍රමවේදය



ව්‍යාපාරික හවුල්කරු සබඳතා

සබඳතා සහිත බැංකු 46ක් ද වරලත් නියෝජිතයන් 72ක් ද සමගින් අන්‍යෝන්‍ය වාසිදායක ශක්තිමත් සබඳතා අප විසින් පෝෂණය කර ඇත්තෙමු. විශේෂයෙන්ම සබඳතා සහිතව බැංකු 26ක් සහ වරලත් නියෝජිත පාර්ශවකරුවන් 45ක් ද සමගින් වසර 20කට වඩා දිගු කාලයක් තිස්සේ අප විසින් සබඳතා පවත්වාගෙන තිබේ.

	සබඳතා කාල පරාසය (අවුරුදු)				
	< 1	1 - 5	5-10	10-20	> 20
සබඳතා සහිත බැංකු සංඛ්‍යාව	0	2	9	9	26
වොස්ට්‍රෝ නියෝජිත (බැංකු/විනිමය සමාගම්) සංඛ්‍යාව	2	5	8	12	45



ක්ෂේත්‍රයේ සංගමයන්හි සාමාජිකත්වය

දේශීය මෙන්ම ජාත්‍යන්තර බැංකු ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම ව්‍යවහාරයන්ට අනුගත වීමට හැකිවන පරිදි විවිධ සංවිධානයන්හි සාමාජිකත්වයන් අප සතුවේ.

පහත දැක්වෙන සංවිධානයන්හි අපි සාමාජිකයන් වන්නෙමු.

- එෂියා පැසිපික් රූරල් ඇන්ඩ් ඇග්රිකල්චර් ක්‍රෙඩිට් ඇසෝසියේඑන්
- ද ඇසෝසියේෂන් ඔෆ් කම්ප්ලයන්ස් ඔෆිසර්ස් ඔෆ් ද බෑන්ක්, ශ්‍රී ලංකා
- ද ෆිනෑන්ෂල් ඩිම්බුඕස්මන් ශ්‍රී ලංකා (ගැරන්ටි) ලිමිටඩ්
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා බෑන්ක්ස් ඇසෝසියේෂන් (ගැරන්ටි) ලිමිටඩ්
- ද ඇසෝසියේෂන්ස් ඔෆ් බෑංකිං සෙක්ටර් රිස්ක් ප්‍රොෆෙෂනල්ස් ශ්‍රී ලංකා
- ක්ලියරිං ඇසෝසියේෂන් ඔෆ් බෑංක්ර්ස්
- ශ්‍රී ලංකා සේවයන්ගේ සම්මේලනය
- ප්‍රාථමික වෙළඳුන්ගේ සංගමය

ආචාරධර්මීය ව්‍යවහාරයන්

ප්‍රසම්පාදන කාර්යයන් සඳහා විනිවිදභාවයෙන් යුතු ටෙන්ඩර් පටිපාටියක් අපි අනුගමනය කරන්නෙමු. එසේම අපගේ සැපයුම්කරුවන්ගේ සියලුම තොරතුරු අපි රහස්‍යභාවයෙන් යුතුව සලකන්නෙමු. අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පාරිසරික සහ සමාජීය වැදගත්කම් අන්තර්ගතව තිබෙන අතර අපගේ සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයන් ඉහලම ආචාරධර්ම ප්‍රමිතීන් පවත්වාගත යුතු බව අපි අපේක්ෂා කරන්නෙමු. අපගේ දැනුවත් වීමට අනුව, අපගේ සැපයුම්කරුවන් බලහත්කාරයෙන් සේවයේ යෙදවීම හෝ ළමා ශ්‍රමිකයන් යොදවන ලදැයි යන කිසිදු සිද්ධියක් කරනු ලැබූ බවට ද අපි සහතික වන්නේමු.

ඉදිරි දැක්ම

අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ තිබෙන සබඳතාවයන් තවදුරටත් ශක්තිමත් කෙරෙන අතර ආචාරධර්මීය ව්‍යාපාරික ව්‍යවහාරයන් ද අපි අනුගමනය කරන්නෙමු.

ප්‍රජා ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂිතා

සංස්ථාපිත සමාජ වගකීම් (CSR) වෙනුවෙන්
රු. මිලියන **56.3** ක්
ආයෝජනය කළෙමු

ප්‍රජා පාදක සංවර්ධන ණය
51,375
ප්‍රධානය කරන ලදී

ප්‍රජා ප්‍රග්ධන සංඛ්‍යාදත්ත

	2017	2016	2015
සංස්ථාපිත සමාජ වගකීම් (CSR) ආයෝජනය (රු. මිලියන)	**56.3**	40.3	39.5
ප්‍රජා පාදක සංවර්ධන ණය (සංඛ්‍යාව)	**51,375**	62,943	61,879
ප්‍රජා පාදක සංවර්ධන ණය (රු. මිලියන)	**10,480**	13,169	12,399

ප්‍රජා ප්‍රාග්ධන කළමණාකරණය

වගකීමෙන් යුක්ත සංස්ථාපිත පුරවැසියකු වශයෙන් අප අවට සිටින ප්‍රජාවන් සඳහා ධනාත්මක වෙනසක් ඇතිකිරීම අපගේ වගකීමක් වශයෙන් අප සලකන්නෙමු. එබැවින් අපගේ මෙහෙයුම් කාර්යයන් ඔස්සේ පරිසරයට සහ ප්‍රජාවට සෘණාත්මක බලපෑමක් ඇති නොවන බවට අපි සහතික වන්නෙමු. ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනයක් අතුරින් එකක් වශයෙන්,ජනතාවගේ ජීවන තත්වයන් ඉහළ නැංවීමත් ව්‍යවසායකත්වයන් ප්‍රවර්ධනය කිරීමත් සඳහා මූල්‍ය පහසුකම් සැලසීමෙන් අපි ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන්නෙමු. දිවයින පුරා සිටින පුද්ගලයන්ට රැකියා පහසුකම් ද උත්පාදනය කර දෙමින් අපි පුහුණු කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ඔවුන්ගේ නිපුණත්වයන් සහ හැකියාවන් ද වර්ධනය කරන්නෙමු.

විශේෂයෙන්ම අපගේ දේශයේ අඩු පහසුකම් සහිත ප්‍රජාව සඳහා ඔවුන්ගේ කලා, සංස්කෘතික කටයුතු, සෞඛ්‍යාරක්ෂාව, අධ්‍යාපනික සහ අනෙකුත් සමාජයීය සේවා ද ඉහළ නැංවීම සඳහා වූ අපගේ කැපවීම අපගේ අවධානය යොමු වූ මූලික ක්ෂේත්‍රයකි.

සමාජීය වගකීම්

අප වටා සිටින ප්‍රජාවන්ගේ උන්නතිය සඳහා ව්‍යුහගත සංස්ථාපිත සමාජ වගකීම් වැඩසටහන් මත අපි කටයුතු කරන්නෙමු. වසර තුළ දී බැංකුවේ සංස්ථාපිත සමාජ වගකීම් ඇස්තමේන්තුව මගින් සුබසාධක කටයුතු සඳහා රුපියල් මිලියන 56.3 ක් අපි ආයෝජනය කළෙමු.මෙම කටයුතු කේන්ද්‍රීය වූයේ කලා ශිල්ප සහ සංස්කෘතිය, අධ්‍යාපනය,සෞඛ්‍ය සහ වෙනත් සමාජයීය කාර්යයන් මතය. මෙම තොරතුරු පහත වගුවේ දැක්වේ.

2017 වසරේ සංස්ථාපිත සමාජ වගකීම් ව්‍යාපෘතින්හි ආයෝජනයන්

බාණ්ඩය	විස්තරය	වටිනාකම රු. '000
කලාශිල්ප සහ සංස්කෘතික	මහනුවර ඇසළ මහ පෙරහැරේ ප්‍රධාන අනුගාහක, ප්‍රදේශයේ විවිධ ආගමික සහ සංස්කෘතික කටයුතු සඳහා දායකත්වය සහ අනුග්‍රහය දැක්වීම	**17,283**
සෞඛ්‍ය	ඩෙංගු රෝගය නිවාරණය	**282**
අධ්‍යාපන	පාසල් පොත් සහ ලිපි ද්‍රව්‍ය බෙදදීම, පාසල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ අඩුපහසුකම් සහිත පාසල්වලට අනුගාහකත්වය සහ පරිත්‍යාගයන්	**3,720**
වෙනත් සමාජයීය කටයුතු	නිවාස ව්‍යාපෘති සඳහා පරිත්‍යාග, ප්‍රජා මධ්‍යස්ථාන, ගංවතුර ආධාර සහ වෙනත් අනුග්‍රහකත්වය	**35,032**
එකතුව		**56,317**

ඓතිහාසික මහනුවර ඇසළ පෙරහරේ ප්‍රධාන අනුග්‍රාහකයා වශයෙන් මහජන බැංකුව පෙරමුණගෙන සිටී. පැරණි චාරිත්‍රයන් සහ සම්ප්‍රදායික නර්තන අංගයන්ගෙන් ද කුළුගැන්වෙන මෙම සංස්කෘතික සංදර්ශනය සඳහා මහජන බැංකුව අඛණ්ඩව අනුග්‍රහකත්වය සලසන ලදී.

මෑත කාලීනව ඇදහැලුණු ධාරාණිපාත වර්ෂාවෙන් පීඩාවට පත්වුණු දිස්ත්‍රික්ක 15ක ජනතාව වෙනුවෙන් මහජන බැංකුව ක්ෂණිකව ආධාර සපයන ලදී.

මහජන බැංකුවේ හින්දු සංගමය මගින් මන්නාරම, තිරුකෙතීස්වරම්හි ශිවපූරම් නැමැති ස්ථානයේ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම.

මහජන බැංකුවේ මුස්ලිම් මජ්ලිසය මගින් වරකාපොල ගණිතපුරයේ ඉදිකළ නිවසක් දුගී පවුලකට ලබාදෙන ලදී.

ප්‍රජාපාදක සංවර්ධන ණයදීම්

රාජ්‍යය නොවන සංවිධාන කිහිපයක් සහ රාජ්‍ය ආයතනයක් ද සමග හවුල්කාරිත්වයන් ඔස්සේ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයන් මගින් විශේෂිත කර්මාන්ත අංශයන් සඳහා මූල්‍ය උපකාර සපයමින් අපි සමාජ ප්‍රතිලාභයන් සලසන්නෙමු. මූලික වශයෙන් මෙම පහසුකම් ප්‍රදානය කරනු ලබන්නේ අපගේ බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ඒකකය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඒකකයන් මගිනි. වසර තුළ දී රැකියා උත්පාදනයට උපකාරවන, ගෘහ කර්මාන්තයට අනුබල සපයන සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය වර්ධනය කරන විවිධාකාර වූ කර්මාන්තයන් සඳහා 51,375ක් වූ ණය සංඛ්‍යාවක් අප විසින් ප්‍රදානය කරන ලදී. මෙම ණය ප්‍රමාණයෙන් 65% ක් ආර්ථික කාර්යයන් වෙනුවෙන් ප්‍රදානය කෙරිනි.

කර්මාන්ත ක්ෂේත්‍රය	2017 දෙසැම්බර් අවසන දී			
	බැංකුව මගින් අරමුදල් සපයන ලද		ප්‍රතිමූල්‍ය අරමුදල් යෝජනා ක්‍රම මගින් සපයන ලද	
	ණය සංඛ්‍යාව	ගෙවීමට තිබෙන ප්‍රමාණය රු. මිලියන	ණය සංඛ්‍යාව	ගෙවීමට තිබෙන ප්‍රමාණය රු. මිලියන
කෘෂිකර්ම	9,663	4,740.8	4,824	703.8
වාණිජ	14	2.4	928	236.9
පරිභෝගික	1	0.1	4	0.3
මූල්‍යමය	–	–	12	2.2
නිවාස සහ දේපළ සංවර්ධනය	2	0.1	8	0.7
කර්මාන්ත	803	22.7	1,006	198
වෙනත් ආර්ථික කටයුතු	29,661	4,178.8	3,849	280.4
සේවා	42	1.8	545	103.9
සංචාරක	2	0.1	11	6.3
මුළු එකතුව	**40,188**	**8,946.7**	**11,187**	**1,532.5**

අනාගත දැක්ම

ප්‍රජා සහ සමාජීය සංවර්ධන කාර්යයන්හි අප විසින් කරනු ලබන ආයෝජනයන් මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජීය සංවර්ධනය සඳහා අපි දායක වන්නෙමු.

ස්වභාවික ප්‍රාග්ධනය

2017 වසරේ සුවිශේෂීතා

YES ගිණුම්
342,327 ක
විවෘත කිරීම

හරිත ගොඩනැගිලි ප්‍රතිපත්තිය හඳුන්වාදෙන ලදී

2016 වසරට සාපේක්ෂව වායුසම්කරණ වායු නැවත පිරවීම්.
86% කින්
අවම කිරීම.

අපගේ ස්වභාවික ප්‍රාග්ධනය අගයන් ඇතිකිරීමේ ක්‍රියාවලිය



ස්වභාවික ප්‍රාග්ධනය කළමණාකරනය

මූල්‍ය සේවා ආයතනයක් වශයෙන් පරිසරයට අපගෙන් සිදුවන බලපෑම ඉතා අල්පයකි. කෙසේ වෙතත් පාරිසරික බලපෑම මැනීම, කළමණාකරනය කිරීම සහ අවම කිරීම සඳහා අප විසින් විස්තීර්ණ පාරිසරික ප්‍රතිපත්තියක් ආදේශකරගෙන තිබේ. වසර තුනක කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක වන සුවිශේෂී කාබන් කලමණාකරන වැඩසටහනක් ඔස්සේ හරිතාගාර වායු විමෝචනයන් අවම කිරීමේ කාර්යය අප විසින් කැපවීමෙන් ඉටුකරන්නෙමු. ගෝලීය චර්‍යා රටා සහ සම්මතයන්ට ගැළපෙන පරිදි ඇගයීම් සිදුකරනු ලදුව බලශක්ති සහ කැළිකසල සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් සේවා අගයන්, සේවාවන් සහ සම්පත්වල කාර්‍යක්ෂමතාවය වර්ධනය කරගන්නා ලදී. ඊට අමතර වශයෙන්, "පිපල්ස් ග්‍රීන් පල්ස්" නැමති අපගේ හරිත බැංකුකරණය සංකල්පය ඔස්සේ පරිසර හිතකාමී ව්‍යාපාරික ව්‍යාපෘතීන් සඳහා සහනශීලී ආකාරයේ ණය ප්‍රධානය කිරීම සහ ඩිජිටල් බැංකුකරණය කාර්යය ප්‍රවර්ධනය කිරීම ද අප විසින් සිදු කරනු ලබන්නෙමු.

කාබන්ඩයොක්සයිඩ් විමෝචනය

අපගේ මෙහෙයුම් මගින් හරිතාගාර වායු විමෝචනයන් සිදුවීම අවම කිරීමට අපි කැපවී සිටින්නෙමු. වසර 3ක් පුරා ක්‍රියාත්මක කිරීමට නියමිත, කාබන් ඩයොක්සයිඩ් විමෝචනය ඵලදායී ලෙස මැනීම, පාලනය කිරීම සහ අවම කිරීම සඳහා වූ කාබන් කළමණාකරණය පිණිස සුවිශේෂී වැඩසටහනක් 2016 වසරේ දී අප විසින් හඳුන්වා දෙනු ලදී. ප්‍රමුඛපෙළේ පාරිසරික සමතුලිතතා ආරක්ෂණය සත්‍යාපනය සහ සහතික කිරීම් සේවා සපයන්නකු වන "The Carbon Consulting Company" ආයතනය සමග අප මෙම වැඩසටහනේ දෙවන වසරේ පසුවෙයි. "CarbonConscious ® Bank" "ද සස්ටේනබල් ෆියුච ගෲප්" යන සහතික ලබා ගැනීම අරමුණු කර ගනිමින් අපගේ කටයුතු ප්‍රවර්ධනය කර තිබේ. එම සහතිකය පිළිබඳ අවශ්‍යතාවයන්ගේ කොටසක් වශයෙන් අපගේ සමස්ථ පාරිසරික බලපෑම අවම කිරීමට අවශ්‍ය කෙරෙන අරමුණු පිහිටු වීම සහ ක්‍රියාකරකම් හඳුනාගැනීම සඳහා විස්තීර්ණ කළමණාකරණ සැලැස්මක් අප විසින් ක්‍රියාත්මක කරන ලදී.

2017 වසර සඳහා අපගේ ප්‍රධාන කාර්යාලයේ කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අවකාශ 1 සහ අවකාශය 2 පහත දැක්වේ.

වාර්ථාකරණ අවකාශණය	විමෝචන ප්‍රභවය	විමෝචන උපකරණ	2017 විමෝචන සමස්ථය (tCO_2e)	2016 විමෝචන සමස්ථය (tCO_2e)
අවකාශය 1 - සෘජු විමෝචනයන්	ස්ථානී දහනය	පේනරේටර ඉන්ධන සහ LP ගෑස් පරිභෝජනය	**45.96**	65.19
	සංචල දහනය	බැංකුව සතු වාහන වල ඉන්ධන පරිභෝජනය	**437.30**	572.61
	ක්ෂණිකව ඉවත්වයන විමෝචනයන්	වායු සම්කරණ ශීතකරණයන් සහ කාන්දුවීම්	**83.01**	585.54
අවකාශය 1 - පූර්ණ විමෝචනයන්			**566.28**	1,223.34
අවකාශයක 2 - වක්‍ර විමෝචනයන්	මිලදී ගත් විදුලි බලය	විදුලිබල පරිභෝජනය	**1,075.06**	1,037.97
අවකාශය 2 - පූර්ණ විමෝචනය			**1,075.06**	1,037.97
මහජන බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ අවකාශය 1 සහ 2 මගින් සිදුවන පූර්ණ කාබන්ඩයොක්සයිඩ් විමෝචනය			**1,641.33**	2,261.31

ඉහත වගුවෙන් දැක්වෙන පරිදි පෙර වසරේ පැවැති තත්වය සමඟ සසඳන කල කාබන් ඩයොක්සයිඩ් විමෝචනය 620 tCO_2e ප්‍රමාණයකින් (27%කින්) අඩු වී තිබේ. මෙම සැලකිය යුතු අඩු වීමට හේතු වූ ප්‍රධාන කාරණය වූයේ ක්ෂණිකව ඉවත්ව යන විමෝචනයන් (ශීතකරණ වායු නැවත පිරවීම) 2016ට සාපේක්ෂව 502.5 tCO_2e (86%) කින් 2017 වසරේ දී අවම වීමයි.

කඩදාසි ප්‍රතිචක්‍රීකරණය

කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අවම කිරීම සඳහා වූ අපගේ උත්සාහය මගින් ප්‍රතිචක්‍රීකරණ ඒකකයන් ස්ථාපනය කරමින් අපගේ කාර්යාලයේ සහ ශාඛාවන් හි ඉවත ලන කඩදාසි කැලිකසල අවම කිරීම සහ කඩදාසි භාවිතා නොකරන කාර්යාලයන් සඳහා පෙළඹවීම කිරීමට අපි අනවරතව යෙදී සිටිමු. අපගේ ඩිජිටල්කරණ කාර්ය මගින් ඩිජිටල් පහසුකම් ශාඛාවන්, පැය 24ම ක්‍රියාත්මක ස්වයං සේවා බැංකු කටයුතු ශාඛාවන් සහ පිපල්ස් වේව් ජංගම බැංකු කටයුතු ඇප් මෘදුකාංගයද මගින් ඕනෑම වේලාවක දී ඕනෑම තැනකදී බැංකු කටයුතු කරගැනීම දිරිමත් කෙරේ.



කැලිකසල කළමණාකරණය

පසුගිය වසරේ අප විසින් ක්‍රියාත්මක කරන ලද කසල කළමණාකරණ ප්‍රතිපත්ති අපගේ සමස්ථ ශාඛා ජාලය පුරාම ව්‍යාප්ත ක්‍රියාවලියේහි අපි නිරතව සිටින්නෙමු. මධ්‍යම පරිසර අධිකාරිය මගින් ඇති කර තිබෙන නිර්ණායකයන්ට අනුව, පරිසරයට අවම බලපෑමක් ඇති වන ආකාරයෙන් කැලි කසළ වෙන් කර ඉවත් කරනු ලැබේ. මෙම නිර්ණායකයන් පිළිපැදීමෙන් කැලිකසල නියාමනය කරමින් ඒවා නැවත පාවිච්චි කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් ද උපරිම පල ලබා ගැනීමට හැකිවන අතර කාර්ය මණ්ඩලයේ සහ පාරිභෝගිකයන්ගේ ද ඵලදායි සහභාගිත්වය තුළින් කැලිකසල ප්‍රමාණය අවම කරගැනීමට ද අපට හැකිවනු ඇත. කඩදාසි සහ ප්ලාස්ටික් කැලිකසල මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා තිබෙන ප්‍රතිචක්‍රීකරණය කරන තුන්වන පාර්ශවයකට යවනු ලැබේ. හාරිතාගාර වායු ඇගයීමේ තුන් වැනි වසර අවසානයේ පහත දැක්වෙන කැලිකසල වෙන් කිරීමේ ක්‍රියාවලිය අපගේ ප්‍රධාන කාර්‍යාලයේ සහ සියලුම ශාඛාවන් හි ක්‍රියාත්මක කරන ලදී.

හරිත ගොඩනැගිලි සහ වටපිටාව

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය GreenSL® ඇගයුම් ක්‍රමවේදය අනුගමනය කරමින් CCC විසින් සංවර්ධනය කරන ලද පරිපූර්ණ හරිත ගොඩනැගිලි ප්‍රතිපත්තිය අපගේ දැනට තිබෙන ගොඩනැගිලි වල කෙරෙන නවීකරණයන්, අළුතින් සවිකිරීම සහ අළුතින් ඉදි කරන ගොඩනැගිලි සඳහා ද සාර්ථකව හඳුන්වා දෙන ලදී. අපගේ සියළුම ගොඩනැගිලි මෙම නව ප්‍රතිපත්තිය අනුකූල වන ආකාරයට පරිවර්ථනය කිරීමේ ක්‍රියාවලියෙහි මේ වන විට අප නිරතව සිටින අතර එමගින් බලශක්ති සහ ජල පරිභෝජනය/කළමණාකරණය කරමින් ඒවා අවම කිරීමට අපට පහසුකම් සැලසෙනු ඇත.

බලශක්ති සංරක්ෂණය සහ කාර්‍යක්ෂමතා ප්‍රවර්ධනයන්

අපගේ බැංකුවේ බලශක්ති අවශ්‍යතාවයන්ගේ ඉහළ ප්‍රතිශතයක් අප ලබන්නේ සිදු 45% ප්‍රතිශතයක් වූ ජාතික විදුලිබල පද්ධතියෙන් ලබාගන්නා විදුලි බලයෙනි. එබැවින් බලශක්ති කාර්‍යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අප විසින් අනවරතව උත්සහයෙන් ගන්නා අතරම බලශක්ති සංරක්ෂණය සඳහා ඵලදායි පියවරයන් ක්‍රියත්මක කරන්නෙමු. 2018 වසර තුළ දී අපගේ ශාඛා කාර්යාල 100ක් සූර්ය බලශක්ති පරිභෝජනයට පරිවර්ථනය කිරීමට ඉලක්ක කර තිබෙන අභ්‍යන්තර ආලෝකකරණය පද්ධතිය බලශක්ති ඉතිරි කරන LED බල්බ ක්‍රමයට මාරු කිරීමටත් ස්වාභාවික ආලෝක තත්වය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමටත් අපි ක්‍රියා කරන්නෙමු. ප්‍රධාන කාර්යාලයන්හි 2017 වසර තුළ පරිභෝජනය කරන ලද සම්පූර්ණ බලශක්ති පරිභෝජනය කිලෝවොට් 2,194,500ක් වශයෙන් වාර්තා විය.

ණය දීමේ සහ ආයෝජනය කිරීමේ ප්‍රතිපත්තීන්ට පාරිසරික බලපෑම් ගැලපීම

ණය මුදල් ප්‍රදානය කිරීමේ දී සහ ආයෝජනයන් කිරීමේ දී, කිසියම් පාරිසරික අහිතකර බලපෑමක් ඇතිවන කාර්යයක් දැයි සැකහැර දැන ගැනීම සඳහා, මධ්‍යම පරිසර අධිකාරිය මගින් අපගේ සේවා දායකයන්ට දෙන ලද බලපත්‍ර ඇතුළුව අදාල සියලුම පාරිසරික රෙගුලාසි වලට අනුකූල වන්නේ ද යන කරුණු පිළිබඳව නිසි අවධානය යොමු කිරීම මූල්‍යම ප්‍රතිලාභයන් පමණක් නොව දිගු කාලීන වාසි දායක තත්ත්වයන් ද ලඳ හැකි බව අපගේ විශ්වාසයයි. එබැවින් එවැනි ආයෝජනයන් තුළින් ධනාත්මක කරුණු පිළිබඳව අපි දිරිමත් කරන්නෙමු. ණය සීමාවන් අනුමත කිරීමේදී ද අපගේ ව්‍යාපාර මෙහෙයුම් මගින් පරිසරයට සිදු වන බලපෑම ද තත්සේරු කරන්නෙමු.

බැංකුව/කාර්‍යය මණ්ඩලය මගින් කරන පරිසර හිතකාමී කාර්‍යයන්

සූර්‍යය බලශක්ති පද්ධති සහ හයිබ්‍රිඩ් මෙන්ම විදුලියෙන් ක්‍රියාකරන මෝටර් රථ මිල දී ගැනීම සඳහා ද ණය ක්‍රමයන් ද පරිසර හිතකාමී ණය ප්‍රදානයන් අප විසින් හඳුන්වා දී තිබේ. එසේම කඩදාසි රහිත බැංකු ක්‍රමයන් ඇතුලත් "YES" ගිණුම ද අප විසින් ක්‍රියාත්මක කරන ලදී.

අනාගත දැක්ම

අපගේ හරිත බැංකුකරණ සංකල්පය සහ ඩිජිටල් බැංකුකරණ කාර්‍යයන් ඔස්සේ පාරිසරික සමතුලිත තාවය ඇති කිරීම සඳහා පරිසරික කරුණු ආදේශනය කර ගැනිමෙහි අප දිගටම නියැලි සිටින්නෙමු.

වසරේ වැදගත් සිදුවීම්

2006 වසරේ සිට නිදහස් අනුස්මරණ දිනයේ දී මහජන බැංකුව විසින් පවත්වනු ලබන "නිදහසේ උපත" වැඩසටහන මෙම වසරේ දී ද පැවැත්විණි. නිදහස් අනුස්මරණ සතිය තුළ මේ රටේ උපත ලබන සෑම දරුවකුටම "ඉසුරු උදැන" තිළිණ සහතිකයක් සහ වෙනත් තිළිණයන් ද ලබාදීමට මෙම සංකල්පය යටතේ මහජන බැංකුව කටයුතු සම්පාදනය කරන ලදී.

මෙම වැඩසටහන මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි එන්. වසන්ත කුමාර් මහතාගේ සහභාගිත්වයෙන් බොරැල්ලේ කාසල් වීදියේ කාන්තා රෝහලේ දී සහ ද සොයිසා කාන්තා රෝහලේ දී ද පවත්වන ලදී.

දුම්රිය ස්ථානයන්හි තම ස්වයං බැංකු ඒකක 300ක් පිහිටුවීම සඳහා මහජන බැංකුව සහ දුම්රිය දෙපාර්තමේන්තුව අතර ද්වි පාර්ශ්වික ගිවිසුමක් බත්තරමුල්ලේ පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේ දී අත්සන් කෙරිනි.මෙම උත්සවයට සහභාගී වීමෙන් ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාලඳ සිල්වා මහතා ප්‍රකාශ කර සිටියේ එම අවස්ථාව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහ මහජන බැංකුවේ ඓතිහාසික වාර්ථාවන්හි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරනු ඇති බවයි.

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා වූ විශේෂ උත්සවයක් උසස් නිලතල දරන කාන්තාවන් පිරිසක්, පාරිභෝගිකයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේද සහභාගිත්වය සහිතව මහජන බැංකුව විසින් ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි එන්. වසන්ත කුමාර් මහතාගේ අනුග්‍රාහකත්වය යටතේ මහජන බැංකුවේ මූලස්ථානයේදී පවත්වන ලදී. ඒ අතරම කාන්තා දින සැමරුම් උත්සවයන් දිවයින පුරා පිහිටි මහජන බැංකු ශාඛාවන්හිදී පවත්වන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ පරිසර විද්‍යාව සහ සත්ත්ව විද්‍යා ලෝලීන්ගේ පදනම යාපන විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා ශිෂ්‍ය සංගමය සමග එක්ව මෙම වසරේදි සංවිධානය කරන ලද රුක්රෝපණ ව්‍යාපාරයට මහජන බැංකුව අනුග්‍රහය දක්වන ලදී.

තම YES ගිණුම යටතේ මෙම ව්‍යාපාරයට අනුග්‍රහය ලබාදීමේ මහජන බැංකුවේ ඉලක්කය වූයේ රටේ පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීමට සහය දීමත් පරිසර සමතුලිතතාවය ආරක්ෂාවන අනාගතයක් සඳහා පදනමක් ස්ථාපිත කිරීමත්ය.

2017 SLIM නිල්සන් සම්මාන උළෙලේදී "වසරේ ජනතාවගේ සේවා සන්නාමය" සහ "වසරේ ජනතාවගේ බැංකුසේවා සපයන්නා" යන සම්මානයන් අඛණ්ඩව 11 වැනි වරටත් මහජන බැංකුව විසින් දිනා ගන්නා ලදී. මෙම ජනතා සම්මාන උළෙලට සත්කාරකත්වය ලබාදෙන ලද්දේ ලොව ප්‍රමුඛතම තොරතුරු මිනුම් සමාගම වූ නිල්සන් ආයතනය සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයයි.

ස්වශක්ති ණය ප්‍රධානය කිරීමේ සමාරම්භක උලෙළ මහජන බැංකුවේ සභාපති හේමසිරි ප්‍රනාන්දු මහතාගේ සහභාගිත්වයෙන් මහජන බැංකුවේ නුවරඑළිය ශාඛාවේදී පවත්වන ලදී. කෘෂිකර්මය, සත්ත්ව පාලනය, කර්මාන්ත සහ සේවා ක්ෂේත්‍රයන්හි බිම් මට්ටමින් ව්‍යාපාර වල අළුතින් යෙදෙන්නට අපේක්ෂිත මෙන්ම දැනටද නිරතව සිටින අයට ණය සහ මූලාශ්‍රාධාර සැලසීමේ අරමුණින් යුතුව ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්වශක්ති ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ ඓතිහාසික මං සලකුණක් තබමින් සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය කරන ලද බැංකු ශාඛාව ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා අතින් කොළඹ යෝක් වීදියේ විවෘත කිරීමත් සමගින් තම පූර්ණ පහසුකම් සහිත ඩිජිටල් මධ්‍යස්ථානය විවෘත කරමින් සිය ඩිජිටල්කරණ කාර්යයේ සුවිශේෂී සන්ධිස්ථානය මහජන බැංකුව විසින් සනිටුහන් කරන ලදී. තම ඩිජිටල්කරණ කාර්යය මගින් ගනුදෙනුකරුවන්ගේ මුල්‍ය කටයුතු කාර්යක්ෂමව සහ පහසුවෙන් කරගැනීමට හැකිවන පරිදි තම "අධිවේගී බැංකුකරණ" සේවාව ඒ සමගම බැංකුව අභිමානයෙන් යුතුව දියත්කරන ලදී.

මහජන බැංකුවේ 100 වැනි ස්වයං බැංකු ඒකකය මහජන බැංකුවේ නිකුණාමලය කළාපිය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී විවෘත කරන ලදී. බැංකු කටයුතුවල දී උපරිම පහසුව සැලසීම අරමුණු කරගත් ඩිජිටල්කරණ වැඩසටහන සමග සම්බන්ධ වෙමින් මහජන බැංකුව තම පළමුවන ස්වයං බැංකු ඒකකය වසර 2016 දී මහජන බැංකු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපනය කරන ලදී. ඉන් අනතුරුව දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්වයං බැංකු කටයුතු ඒකක රාශියක් මහජන බැංකුව විසින් ස්ථාපනය කරන ලද අතර ඉතිරි ප්‍රදේශවලට ද මෙම සේවය වේගයෙන් ව්‍යාප්ත කිරීමට අදහස් කරයි.

හින්දු බැතිමතුන්ගේ ආලෝක පූජා උත්සවය වූ දීපවාළි උත්සවය සමරනු වස් මහජන බැංකුව විසින් තම වැල්ලවත්ත ශාඛාවේ උත්සව කිහිපයක්ම සංවිධානය කරන ලදී. කාර්යය මණ්ඩල සාමාජික සාමාජිකාවන් පාරිභෝගිකයන්ට සහ සමස්ථ ජාතියටත් සෙත් පැතිම සඳහා විශේෂ හින්දු පූජාවක් පවත්වන ලදී.

මහජන බැංකුවේ නවෝත්පාදන මධ්‍යස්ථානය මහජන බැංකුවේ සභාපති හේමසිරි ප්‍රනාන්දු මහතාගේ සහභාගිත්වයෙන් යුතුව කොළඹ/යෝක් වීදියේ දී ආරම්භ කෙරෙණි. තම ඩිජිටල්කරණ ක්‍රියාවලිය සමගින් පූර්ණ පහසුකම් සහිත ඩිජිටල් කාර්යයන් සැලසීම සහ තම තොරතුරු තාක්ෂණ අංශයේ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීම අමරුණු කරමින් නවෝත්පාදන මධ්‍යස්ථානය විවෘත කිරීම මගින් ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රය තුළ ඓතිහාසික සන්ධිස්ථානයක් සලකුණු කරන ලදී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ස්ලිමි සන්නාම විශිෂ්ටතා 2017 සම්මාන උළෙලේ දී සංස්ථාපිත අංශයේ දැඩිව අපේක්ෂා කරන ගෞරවයන්ගෙන් එකක් වන වසරේ සේවා සන්නාමය සඳහා ලෝකඩ සම්මානය මහජන බැංකුවේ (YES) ඉතිරි කිරීමේ ගිණුමට පිරිනමන ලදී.

මහජන බැංකුවේ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශය කොළඹ 2 චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතේ අංක 91 දරන ස්ථානයේ පිහිටි සමස්ත ලංකා හින්දු කොංග්‍රස් ගොඩනැගිල්ලේ දී මහජන බැංකුවේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී කේ.ඩී. රජ්‍යක්ෂ මහතාගේ සහභාගිත්වයෙන් පසුගියද, විවෘත කරන ලදී.

කලින් කොළඹ ලේක්හවුස් ගොඩනැගිල්ලේ සිට ක්‍රියාත්මක වූ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශය ප්‍රතිස්ථාපිත කිරීමට මහජන බැංකුව පියවර ගත්තේ පාරිභෝගිකයන් හට වඩාත් පුළුල් පරාසයක බැංකු කටයුතු සේවාවන් සැලසීමේ අරමුණින් යුතුවය.

හරිත අනාගතයක් යන සංකල්පය යථාර්ථයක් කිරීමේ අරමුණින් යුතුව යාපනයේ ඉදිකිරීමට යෝජිත මහල් හතකින් යුක්ත පරිසර හිතකාමී හරිත ශාඛාව ඉදිකිරීම සඳහා මුල්ගල මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී එන්. වසන්ත කුමාර් මහකාගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී.

මහජන බැංකුවේ යාපනය කළාපීය කාර්යාලය ද ශාඛාව ද පූර්ණ නවීන පහසුකම් සහිත ශ්‍රවනාගාරයක්ද මෙම ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීමට අපේක්ෂිතය.

කොළඹ හිල්ටන් හෝටලයේ දී 2017 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලද ගෞරවනීය ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන 2017 උළෙලේ දී ප්‍රමුඛ සම්මාන දෙකක් මහජන බැංකුවට පිරිනමන ලදී. "ජයග්‍රාහකයා බැංකු ක්ෂේත්‍රය" සම්මානය මහජන බැංකුවට හිමිවූ අතරම "පරිසර තිරසාරත්ව ආරක්ෂා කිරීමේ විශිෂ්ඨත්වය පිළිබඳ කුසලතා සම්මානය" ද හිමිකරගන්නා ලදී. ව්‍යාපාර කාර්යයේ දී විශිෂ්ඨතා දක්වන ලද ව්‍යවසායයන් මෙම සම්මානයන් ඔස්සේ ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් පිළිගැනීමට ලක් කරන අතර එම ව්‍යවසායයන් රටේ ආර්ථික ප්‍රගමනයට දායකත්වය සපයයි.

මූල්‍ය වාර්තා

197 - මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

198 - මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපති වාර්තාව

199 - ආදායම් ප්‍රකාශය

200 - විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

201 - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

202 - ස්කන්ධ වෙනස්වීම ප්‍රකාශය - බැංකුව

204 - ස්කන්ධ වෙනස්වීම ප්‍රකාශය - සමූහය

206 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

207 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

බැංකුව සිය සියළු ගනුදෙනු සම්බන්ධයෙන් විධිමත් ආකාරයෙන් ගිණුම් පොත් පවත්වාගෙන යාම සහ අදාළ වර්ෂය තුළ බැංකුවේ කටයුතු වල තත්ත්වය සහ ලාභ/අලාභ පිළිබඳව සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම තහවුරු කිරීම පිළිබඳ වගකීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

ඒ අනුව නිතිපතා පවත්වනු ලබන ඔවුන්ගේ සමාලෝචන රැස්වීම් හා විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය වාර්තාකරණය සඳහා කළමනාකාරිත්වයෙහි වගකීම් අධීක්ෂණය කරයි. විගණන කමිටු වාර්තාව 56 වැනි පිටුවේ ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සඵලදායක හා විස්තීර්ණ අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර තිබේ. අභ්‍යන්තර පරීක්ෂාවන්, අභ්‍යන්තර විගණන හා බැංකුකරණ ව්‍යාපාරය විධිමත් ආකාරයෙන් සිදු කිරීම, එහි වත්කම් සුරක්ෂිත කිරීම හා වාර්තාවල නිරවද්‍යතාව හා විශ්වසනීය බව ප්‍රායෝගිකව හැකිනාක් දුරට තහවුරු කිරීම සඳහා අවශ්‍ය සම්පූර්ණ මූල්‍ය හා අනෙකුත් පාලන පද්ධතියම මෙයට ඇතුළත් වේ.

පිටු 199 සිට 292 දක්වා ඉදිරිපත් කර ඇති 2017 වර්ෂය වෙනුවෙන් වන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී තමන් සාධාරණ හා විචක්ෂණ විනිශ්චය සහ ඇස්තමේන්තු පදනම් කරගනිමින් යෝග්‍ය ගිණුම්කරන ප්‍රතිපත්ති ඒකාකාරී පදනමක් මත යොදාගත් බව අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

විචක්ෂණ අවශ්‍යතාවයන්, රෙගුලාසි, නීති රීති හා අභ්‍යන්තර පාලනයන් සමග අනුකූල බවටත්, ඕනෑම කරුණාක පවතින අනනුකූලතාවය නිවැරදි කිරීමට පියවර ගෙන තිබෙන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

මෙම වාර්තාවේ පිළියෙලකොට ඉදිරිපත් කර ඇති 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1988 අංක 30 දරණ බැංකු පනත හා ඊට අදාළ සංශෝධන සමග අනුකූල වේ. බාහිර විගණනකගේ වාර්තාව අනුව, මෙම මූල්‍ය ප්‍රකාශ එදිනට බැංකුවේ සහ සමූහයේ කටයුතු වල තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කරයි.

රොහාන් පතිරගේ
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2018 මාර්තු 27 වැනි දින

මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } BAF/D/PB/FA/2017

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 27 March 2018

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිගේ වාර්තාව

2017 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය හා එදිනට අවසන් වූ වර්ෂය වෙනුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වූ 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් මහජන බැංකුවේ ("බැංකුවේ") මූල්‍ය ප්‍රකාශන හා බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම් ("සමූහය") වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීම සඳහා මා හට ප්‍රසිද්ධ ආයතනයෙහි යෙදෙන වරලත් ගණකාධිකාරී සමාගමක සහාය ලැබිණි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් සැළකිය යුතු සාවද්‍ය ප්‍රකාශ වලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වීම පිණිස අවශ්‍ය වන්නේ යැයි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන පරිදි යම් අභ්‍යන්තර පාලන යෙදවීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) වගකීම උසුලයි.

විගණකගේ වගකීම

මාගේ වගකීම වන්නේ මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් පළ කිරීමයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුකූලව මම මාගේ විගණනය සිදු කළෙමි. එම ප්‍රමිති වලට අනුව මා සදාචාරාත්මක අවශ්‍යතාවන්ට අනුකූල වීම හා මූල්‍ය ප්‍රකාශන සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශ වලින් තොර වේද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර සිදු කිරීම අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගයන් හා අනාවරණයන් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ක්‍රියාපටිපාටි සිදු කිරීම විගණනයකට ඇතුළත්ය. වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සැලකිය යුතු සාවද්‍ය ප්‍රකාශ කිරීමේ අවදානම තක්සේරු කිරීම ඇතුළුව විගණනකගේ විනිශ්චය මත ක්‍රියාපටිපාටි තෝරා ගැනීම පදනම් වේ. මෙම අවදානම තක්සේරු කිරීම් වලදී බැංකුවේ අභ්‍යන්තර පාලනයෙහි සඵලදායකත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ කාර්යය සඳහා නොව පවතින තත්ත්වයන් තුළ යෝග්‍ය වන විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම පිණිස විගණනක බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය සලකා බලයි. යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍ය බව හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකසන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණ බව තක්සේරු කිරීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමක් විගණනයකට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය වන බව මම විශ්වාස කරමි.

මතය

මාගේ මතය අනුව මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2017 දෙසැම්බර් 31 වැනි දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවන් එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ලබා දෙයි.

නිදහස් කිරීම

1971 අංක 38 දරන මුදල් පනතේ 5 (1) වගන්තිය මඟින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එවකට සිටි මුදල් අමාත්‍යවරයා විසින් 1992 මැයි 14 වන දිනැති අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගයක් මඟින් එකී මුදල් පනතේ 11 වැනි කොටසේ විධිවිධාන වලින් බැංකුව නිදහස් කරනු ලැබ ඇත.

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි විධිවිධානයන්ට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	බැංකුව 2017 රු. '000	බැංකුව 2016 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2017 රු. '000	සමූහය 2016 රු. '000	සමූහය වෙනස %
දළ ආදායම	5	162,165,297	122,114,359	32.8	190,183,693	144,749,519	31.4
පොළී ආදායම		149,184,471	109,970,256	35.7	173,820,509	129,708,199	34.0
පොළී වියදම		(98,718,636)	(66,845,869)	47.7	(111,074,981)	(76,111,563)	45.9
ශුද්ධ පොළී ආදායම	6	50,465,835	43,124,387	17.0	62,745,528	53,596,636	17.1
ගාස්තු හා කොමිස් ආදායම්		5,132,907	3,948,052	30.0	5,769,244	4,365,052	32.2
ගාස්තු හා කොමිස් වියදම්		(260,773)	(208,912)	24.8	(260,773)	(208,912)	24.8
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම්	7	4,872,134	3,739,140	30.3	5,508,471	4,156,140	32.5
වෙළෙඳාම් කටයුතු වලින් ලද ශුද්ධ ලාභය	8	2,664,721	2,816,079	-5.4	2,697,941	2,801,632	-3.7
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	9	5,183,198	5,379,972	-3.7	7,895,999	7,874,636	0.3
මුළු මෙහෙයුම් ආදායම		63,185,888	55,059,578	14.8	78,847,939	68,429,044	15.2
මූල්‍ය වත්කම් මත ශුද්ධ හානිකරණ අලාභයන්	10	(2,678,366)	(1,246,748)	114.8	(4,379,767)	(1,362,253)	221.5
ශුද්ධ මෙහෙයුම් ආදායම		60,507,522	53,812,830	12.4	74,468,172	67,066,791	11.0
සේවක මණ්ඩල වියදම්	11	(15,914,505)	(17,475,442)	-8.9	(19,127,876)	(20,277,225)	-5.7
වෙනත් වියදම්	12	(12,407,346)	(10,093,258)	22.9	(18,081,580)	(15,207,929)	18.9
මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බද්ද, සහ ජාතිය ගොඩනැගීමේ බද්දට පෙර මෙහෙයුම් ලාභය (VAT)		32,185,671	26,244,130	22.6	37,258,716	31,581,637	18.0
මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බද්ද සහ ජාතික ගොඩනැගීමේ බද්ද		(6,272,565)	(5,430,470)	15.5	(7,390,285)	(6,148,315)	20.2
බදුවලට පෙර ලාභය		25,913,106	20,813,660	24.5	29,868,431	25,433,322	17.4
ආදායම් බදු වියදම්	13	(7,663,329)	(5,818,969)	31.7	(9,357,510)	(7,477,394)	25.1
වසර සඳහා ලාභය		18,249,777	14,994,691	21.7	20,510,921	17,955,928	14.2
ලාභය බෙදී යන ආකාරයෙ:							
බැංකුවේ ස්කන්ධ හිමියන්		18,249,777	14,994,691	21.7	19,295,734	16,721,972	15.4
පාලනයට යටත් නොවන හිමිකම්		–	–		1,215,187	1,233,956	-1.5
ලාභය මත කොටසකට අදාළ ඉපැයුම්	14						
සාමාන්‍ය කොටසකට අදාළ මූලික ඉපැයුම් (රු.)	14.1	18,250	14,995	21.7	19,296	16,722	15.4
සාමාන්‍ය කොටසකට අදාළ තනුක ඉපැයුම් (රු.)	14.2	75	104	-28.2	79	116	-32.2

පිටු අංක 207 සිට 292 ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් සේ සැලකේ.

විස්තීර්ණ ආදායම සම්බන්ධ ප්‍රකාශය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
අවසන් වූ වසර සඳහා ලාභය	18,249,777	14,994,691	20,510,921	17,955,928
බදු වලින් පසු වෙනත් විස්තීර්ණ ආදායම්				
ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන අයිතම				
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම මත ශුද්ධ ආයුගණක ලාභ හෝ අලාභ	(3,222,626)	3,386,550	(3,246,834)	3,362,348
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම මත විලම්බිත බදු බලපෑම	(41,067)	15,167	(35,060)	22,135
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය	6,568,522	–	7,749,055	25,000
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මත විලම්බිත බදු බලපෑම	(3,366,405)	–	(3,732,372)	–
වෙනත් විස්තීර්ණ ආදායම් සංරචක සහ සබැඳි බදු වියදම්	–	–	–	(754)
	(61,576)	3,401,717	734,789	3,408,729
ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කෙරෙන හෝ කළ හැකි අයිතම				
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් යළි මිනුම්කරණය මත ශුද්ධ ලාභ සහ අලාභ	(177,930)	(13,286)	(175,331)	(167,029)
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මත ලාභ සහ අලාභ	–	–	(15,715)	6,186
විකිණීම සඳහා පවතින ආයෝජන බැහැර කිරීම මත විකිණීම සඳහා පවතින සංචිතය ප්‍රතිවර්තනය	17,289	(9,315)	17,289	(9,315)
	(160,641)	(22,601)	(173,757)	(170,158)
වසර සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම්, බදු වලට පසු	(222,217)	3,379,116	561,032	3,238,571
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	18,027,560	18,373,807	21,071,953	21,194,499
බෙදී යන ආකාරය:				
බැංකුවේ ස්කන්ධ හිමියන්	18,027,560	18,373,807	19,788,396	19,997,591
පාලනයට යටත් නොවන හිමිකම්	–	–	1,283,557	1,196,908
	18,027,560	18,373,807	21,071,953	21,194,499

පිටු අංක 207 සිට 292 ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් සේ සැලකේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		බැංකුව			සමූහය		
දෙසැම්බර් 31 වැනි දිනට	සටහන	2017 රු. '000	2016 රු. '000	වෙනස %	2017 රු. '000	2016 රු. '000	වෙනස %
වත්කම්							
මුදල් හා මුදල් සමාන දෑ	16	68,958,012	64,008,639	7.7	69,675,003	66,408,702	4.9
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	17	65,689,278	63,049,516	4.2	65,689,278	63,049,516	4.2
බැංකුවල ඇති තැන්පතු	18	13,458,639	32,772,978	-58.9	18,944,087	34,059,860	-44.4
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	19	334,230	15,057	2,119.7	334,230	21,196	1,476.9
වෙනත් මූල්‍ය වත්කම් - වෙළඳාම පිණිස දරා සිටින	20	53,042,557	46,915,311	13.1	53,354,989	47,455,844	12.4
ණය හා ලැබිය යුතු දෑ - බැංකු	21	86,097,515	71,528,031	20.4	86,436,113	72,205,378	19.7
ණය හා ලැබිය යුතු දෑ - අනෙකුත් ගනුදෙනුකරුවන්	22	1,012,642,714	890,528,101	13.7	1,143,766,774	1,013,921,293	12.8
මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින	23	3,415,344	1,525,839	123.8	4,483,905	3,258,308	37.6
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	24	112,351,039	96,171,734	16.8	117,137,814	101,069,681	15.9
ප්‍රංගම නොවන වත්කම් විකිණීම සඳහා දරා සිටින	25	–	–		–	1,040,828	-100.0
පරිපාලිතයන්ගේ ආයෝජන	26	1,325,766	1,325,766	0.0	–	–	0.0
කීර්තිනාමය සහ අස්පෘශ්‍ය වත්කම්	27	225,058	110,514	103.6	679,663	438,323	55.1
දේපල, පිරියත හා උපකරණ	28	25,047,501	17,224,026	45.4	33,757,975	23,440,966	44.0
ආයෝජන දේපල	29	1,222,299	184,006	564.3	177,501	184,006	-3.5
පෙර ගෙවුම් කල්බදු	30	483,886	512,184	-5.5	483,886	512,184	-5.5
වෙනත් වත්කම්	32	22,805,270	16,176,745	41.0	24,157,374	17,331,932	39.4
මුළු වත්කම්		1,467,099,108	1,302,048,447	12.7	1,619,078,592	1,444,398,017	12.1
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	33	80,676,350	106,924,276	-24.5	100,628,552	130,122,246	-22.7
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර	34	273,975	72,182	279.6	273,975	72,182	279.6
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	35	1,244,002,768	1,077,812,127	15.4	1,305,625,750	1,119,753,182	16.6
වෙනත් ණය ගැනීම්	36	24,380,962	27,184,535	-10.3	33,634,482	42,296,376	-20.5
ප්‍රවර්තන බදු බැරකම්		4,064,907	2,432,266	67.1	4,367,318	3,000,249	45.6
ශුද්ධ විලම්බිත බදු බැරකම්	31	4,455,617	63,479	6,919.0	7,277,032	2,254,462	222.8
වෙනත් බැරකම්	37	19,256,075	15,378,998	25.2	28,380,411	25,182,416	12.7
යටත් කරන ලද කාල ණය	38	12,531,728	12,531,728	0.0	32,447,923	36,525,796	-11.2
මුළු වගකීම්		1,389,642,382	1,242,399,591	11.9	1,512,635,443	1,359,206,909	11.3
හිමිකම්							
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	39	12,201,998	7,201,998	69.4	12,201,998	7,201,998	69.4
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	40	5,814,744	4,902,255	18.6	5,814,744	4,902,255	18.6
වෙනත් සංචිත	41	25,117,785	21,195,855	18.5	26,913,806	22,269,995	20.9
රඳවා ගත් ඉපැයුම්	42	34,322,199	26,348,748	30.3	52,191,314	43,185,534	20.9
කොටස්හිමියන්ගේ මුළු හිමිකම්		77,456,726	59,648,856	29.9	97,121,862	77,559,782	25.2
පාලනයට යටත් නොවන හිමිකම්		–	–	–	9,321,287	7,631,326	22.1
මුළු හිමිකම්		77,456,726	59,648,856	29.9	106,443,149	85,191,108	24.9
මුළු හිමිකම් හා වගකීම්		1,467,099,108	1,302,048,447	12.7	1,619,078,592	1,444,398,017	12.1
අසම්භාව්‍ය බැරකම් හා බැඳීම්	43	303,344,150	226,429,659	34.0	304,101,876	226,442,491	34.3

පිටු අංක 207 සිට 292 ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ වල කොටසක් සේ සැලකේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් පහත අත්සන් යොදා ඇත.

අසාම් ඒ. අහමඩ්
මූල්‍ය ප්‍රධානී

එන්. වසන්ත කුමාර්
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

හේමසිරි ප්‍රනාන්දු
සභාපති

කොළඹ
2018 මාර්තු 19

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව

	ප්‍රකාශිත ප්‍රග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස්	පැවරූ ප්‍රාග්ධනය
	රු. '000	රු. '000
2016.01.01 දිනට ශේෂය	49,998	7,152,000
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තිර්ණ ආදායම්		
විකිණීම සඳහා පවතින ආයෝජන වල සාධාරණ අගයෙහි වෙනස්වීම්	–	–
විකිණීම සඳහා පවතින ආයෝජන බැහැර කිරීම මත විකිණීම සඳහා පවතින සංචිතයෙහි ප්‍රතිවර්තනය	–	–
ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ මත වගකීම්	–	–
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත විලම්බිත බදු බලපෑම	–	–
බැහැර කරන ලද දේපළ මත ප්‍රත්‍යාගණන ලාභය ප්‍රතිවර්තනය	–	–
මුළු වෙනත් විස්තිර්ණ ආදායම/(වියදම)	–	–
මුළු විස්තිර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධ තුළ සෘජුවම හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු		
වසර තුළ සංචිත වෙත මාරු කිරීම්	–	–
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ	–	–
ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු	–	–
2016.12.31 දිනට ශේෂය	49,998	7,152,000
2017.01.01 දිනට ශේෂය	49,998	7,152,000
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තිර්ණ ආදායම		
විකිණීම සඳහා පවතින ආයෝජන වල සාධාරණ අගයෙහි වෙනස්වීම්	–	–
විකිණීම සඳහා පවතින ආයෝජන බැහැර කිරීම මත විකිණීම සඳහා පවතින සංචිතයෙහි ප්‍රතිවර්තනය	–	–
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය	–	–
ප්‍රත්‍යාගණන අතිරික්තය මත විලම්බිත බදු බලපෑම	–	–
ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ මත වගකීම්	–	–
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත විලම්බිත බදු බලපෑම	–	–
මුළු වෙනත් විස්තිර්ණ ආදායම/(වියදම)	–	–
මුළු විස්තිර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධ තුළ සෘජුවම හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු		
පැවරූ ප්‍රාග්ධනය වැඩිවීම	–	5,000,000
වසර තුළ සංචිත වෙත මාරු කිරීම	–	–
වසර තුළ රදවාගත් ඉපයීම් මාරු කිරීම	–	–
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ (සටහන 41.6)	–	–
ස්කන්ධ හිමියන් සමග මුළු ගනුදෙනු	–	5,000,000
2017.12.31 දිනට ශේෂය	49,998	12,152,000

සංචිත					
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණිත සංචිතය රු. '000	වෙනත් සංචිත රු. '000	විකිණීම් සඳහා පවතින සංචිත රු. '000	රඳවාගත් ඉපයුම් රු. '000	මුළු ප්‍රමාණය රු. '000
4,152,518	10,846,499	10,703,873	296,379	16,293,472	49,494,739
–	–	–	–	14,994,691	14,994,691
–	–	–	(13,286)	–	(13,286)
–	–	–	(9,315)	–	(9,315)
–	–	–	–	3,386,550	3,386,550
–	–	–	–	15,167	15,167
–	(3,295)	–	–	3,295	–
–	(3,295)	–	(22,601)	3,405,012	3,379,116
–	(3,295)	–	(22,601)	18,399,703	18,373,807
749,737	–	(625,000)	–	(124,737)	–
–	–	–	–	(8,219,690)	(8,219,690)
749,737	–	(625,000)	–	(8,344,427)	(8,219,690)
4,902,255	10,843,204	10,078,873	273,778	26,348,748	59,648,856
4,902,255	10,843,204	10,078,873	273,778	26,348,748	59,648,856
–	–	–	–	18,249,777	18,249,777
–	–	–	(177,930)	–	(177,930)
–	–	–	17,289	–	17,289
–	6,568,522	–	–	–	6,568,522
–	(3,366,405)	–	–	–	(3,366,405)
–	–	–	–	(3,222,626)	(3,222,626)
–	–	–	–	(41,067)	(41,067)
–	3,202,117	–	(160,641)	(3,263,693)	(222,217)
–	3,202,117	–	(160,641)	14,986,084	18,027,560
–	–	–	–	–	5,000,000
912,489	–	873,864	–	(1,786,353)	–
–	6,590	–	–	(6,590)	–
–	–	–	–	(5,219,690)	(5,219,690)
912,489	6,590	873,864	–	(7,012,633)	(219,690)
5,814,744	14,051,911	10,952,737	113,137	34,322,199	77,456,726

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය - සමූහය

	ප්‍රකාශිත ප්‍රග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස් රු. '000	පැවරූ ප්‍රාග්ධනය රු. '000
2016.01.01 දිනට ශේෂය	49,998	7,152,000
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තීර්ණ ආදායම්		
විකිණීම සඳහා පවතින ආයෝජන වල සාධාරණ අගයෙහි වෙනස්වීම්	–	–
විකිණීම සඳහා පවතින ආයෝජන බැහැර කිරීම මත විකිණීම සඳහා පවතින සංචිතයෙහි ප්‍රතිවර්තනය	–	–
ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ මත වගකීම්	–	–
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය	–	–
බැහැර කරන ලද දේපල මත ප්‍රත්‍යාගණන ලාභය ප්‍රතිවර්තනය	–	–
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මත ලාභ සහ අලාභ	–	–
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත විලම්බිත බදු බලපෑම	–	–
වෙනත් විස්තීර්ණ ආදායම් මත බදු	–	–
මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධ තුළ සෘජුවම හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමඟ ගනුදෙනු		
කාලසීමාව තුළ සංචිත වෙත මාරු කිරීම්	–	–
කොටස් නිකුතුව	–	–
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ	–	–
ආශ්‍රිත දැරීමෙහි වෙනස් වීම්	–	–
ලාභාංශ ගෙවීම්	–	–
ස්කන්ධ හිමියන් සමඟ මුළු ගනුදෙනු	–	–
2016.12.31 දිනට ශේෂය	49,998	7,152,000
2017.01.01 දිනට ශේෂය	49,998	7,152,000
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තීර්ණ ආදායම		
විකිණීම සඳහා පවතින ආයෝජන වල සාධාරණ අගයෙහි වෙනස්වීම්	–	–
විකිණීම සඳහා පවතින ආයෝජන බැහැර කිරීම මත විකිණීම සඳහා පවතින සංචිතයෙහි ප්‍රතිවර්තනය	–	–
ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ මත වගකීම්	–	–
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අතිරික්තය	–	–
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත විලම්බිත බදු බලපෑම	–	–
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මත ලාභ සහ අලාභ	–	–
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත විලම්බිත බදු බලපෑම	–	–
මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධ තුළ සෘජුවම හඳුනාගත්, ස්කන්ධ හිමියන් සමඟ ගනුදෙනු		
පැවරූ ප්‍රාග්ධනය වැඩිවීම	–	5,000,000
කාලසීමාව තුළ සංචිත වෙත මාරු කිරීම (සටහන 40) සහ (සටහන 41.4)	–	–
වර්ෂය තුළ රද්දාගත් ඉපයීම් මාරු කිරීම	–	–
මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු විශේෂ බදු/ලාභාංශ (සටහන 41.6)	–	–
හිමිකාරිත්වයෙහි වෙනස්වීම් මත සංචලනය	–	–
ලාභාංශ ගෙවීම්	–	–
ස්කන්ධ හිමියන් සමඟ මුළු ගනුදෙනු	–	5,000,000
2017.12.31 දිනට ශේෂය	49,998	12,152,000

සංචිත								
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණිත සංචිතය රු. '000	වෙනත් සංචිත රු. '000	විකිණීම් සඳහා පවතින සංචිත රු. '000	මුදල් ප්‍රවාහ ඉදිරි රැකුම් සංචිත රු. '000	රඳවාගත් ඉපයුම් රු. '000	එකතුව රු. '000	පාලනයට හවුල් නොවන හිමිකම් රු. '000	මුළු ස්කන්ධ ප්‍රමාණය රු. '000
4,152,518	11,867,700	10,703,873	433,941	7,148	32,209,592	66,576,770	6,223,858	72,800,628
–	–	–	–	–	16,721,972	16,721,972	1,233,956	17,955,928
				–	–	–	–	–
–	–	–	(128,446)	–	–	(128,446)	(38,583)	(167,029)
–	–	–	(9,315)	–	–	(9,315)	–	(9,315)
–	–	–	–	–	3,370,185	3,370,185	(7,837)	3,362,348
–	18,750	–	–	–	–	18,750	6,250	25,000
–	(3,295)	–	–	–	3,295	–	–	–
–	–	–	–	4,639	–	4,639	1,547	6,186
–	–	–	–	–	20,393	20,393	1,742	22,135
–	–	–	–	–	(588)	(588)	(166)	(754)
–	15,455	–	(137,761)	4,639	3,393,285	3,275,618	(37,047)	3,238,571
–	15,455	–	(137,761)	4,639	20,115,257	19,997,590	1,196,909	21,194,499
749,737	–	(625,000)	–	–	(124,737)	–	–	–
–	–	–	–	–	(13,016)	(13,016)	(4,339)	(17,355)
–	–	–	–	–	(8,219,690)	(8,219,690)	–	(8,219,690)
–	–	–	–	–	(781,872)	(781,872)	776,130	(5,742)
–	–	–	–	–	–	–	(561,232)	(561,232)
749,737	–	(625,000)	–	–	(9,139,315)	(9,014,578)	210,559	(8,804,019)
4,902,255	11,883,155	10,078,873	296,180	11,787	43,185,534	77,559,782	7,631,326	85,191,108
4,902,255	11,883,155	10,078,873	296,180	11,787	43,185,534	77,559,782	7,631,326	85,191,108
–	–	–	–	–	19,295,734	19,295,734	1,215,187	20,510,921
–	–	–	(177,011)	–	–	(177,011)	1,680	(175,331)
–	–	–	17,289	–	–	17,289	–	17,289
–	–	–	–	–	(3,240,752)	(3,240,752)	(6,082)	(3,246,834)
–	7,582,372	–	–	–	–	7,582,372	166,683	7,749,055
–	(3,640,880)	–	–	–	–	(3,640,880)	(91,492)	(3,732,372)
–	–	–	–	(11,787)	–	(11,787)	(3,928)	(15,715)
–	–	–	–	–	(36,570)	(36,570)	1,510	(35,060)
–	3,941,492	–	(159,722)	(11,787)	(3,277,322)	492,661	68,371	561,032
–	3,941,492	–	(159,722)	(11,787)	16,018,412	19,788,395	1,283,558	21,071,954
–	–	–	–	–	–	5,000,000	–	5,000,000
912,489	–	873,864	–	–	(1,786,353)	–	–	–
–	6,590	–	–	–	(6,590)	–	–	–
–	–	–	–	–	(5,219,690)	(5,219,690)	–	(5,219,690)
–	–	(6,626)	–	–	–	(6,626)	987,624	980,998
–	–	–	–	–	–	–	(581,222)	(581,222)
912,489	6,590	867,238	–	–	(7,012,633)	(226,316)	406,403	180,086
5,814,744	15,831,237	10,946,111	136,458	–	52,191,314	97,121,862	9,321,287	106,443,149

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන්	බැංකුව 2017 රු.'000	බැංකුව 2016 රු.'000	සමූහය 2017 රු.'000	සමූහය 2016 රු.'000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්					
බදු පෙර ලාභය		25,913,106	20,813,660	29,868,431	25,433,322
ගැලපීම්:					
බදු පෙර ලාභ වල අඩංගු මුදල් නොවන අයිතමයන්	49	4,044,519	2,824,333	6,004,394	3,180,031
මෙහෙයුම් වත්කම්වල වෙනස්කම්	50	(137,084,970)	(83,928,201)	(147,647,369)	(106,039,634)
මෙහෙයුම් බැරකම් වල වෙනස්කම්	51	136,623,689	121,125,671	146,347,372	135,320,066
පරිපාලිත හා ආශ්‍රිතයන් හා වෙනත් ව්‍යාපාර වෙතින් ලාභාංශ ආදායම		(1,643,111)	(1,628,700)	(305,136)	(189,530)
යටත් කරන ලද ණය මත පොලි වියදම		1,612,500	1,987,500	1,612,500	1,987,500
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්/පාරිතෝෂික වෙනුවෙන් දායක මුදල් ගෙවීම		1,169,904	1,811,662	1,254,748	1,894,316
බදු ගෙවීම්		(5,046,022)	(7,514,644)	(6,735,303)	(9,639,397)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය කරන ලද ශුද්ධ මුදල්		25,589,615	55,491,281	30,399,636	51,946,673
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහයන්					
ආයෝජන දේපළ මිළදී ගැනීම		(1,040,000)	–	4,798	–
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම්		(2,805,073)	(1,942,542)	(3,328,075)	(3,020,288)
දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		27,306	98,471	46,041	131,611
මූල්‍ය ආයෝජන මිලදී ගැනීම්		(16,475,317)	(9,855,692)	(16,364,145)	(10,269,333)
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම්		(158,080)	(17,810)	(191,723)	(25,475)
පරිපාලිත සමාගම් වල වරණීය කොටස් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		–	150,000	–	–
පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ආයෝජන තුළින් ලද ලාභාංශ		1,643,111	1,628,700	305,136	189,530
පරිපාලිත සමාගමේ අත්පත්කර ගැනීම පිළිබඳ ශුද්ධ මුදල් හා සමාන දෑ		–	–	(1,114,082)	–
ආයෝජන ක්‍රියාකාරකම් (තුළ භාවිතා කළ) වෙතින් ශුද්ධ මුදල්		(18,808,053)	(9,938,873)	(20,642,050)	(12,993,955)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ					
පැවැරූ ප්‍රාග්ධනය ඉහළ යෑම		5,000,000	–	5,000,000	–
යටත් කරන ලද ණය නිකුතුව මගින් ලද ශුද්ධ මුදල්		–	–	–	5,618,556
යටත් කරන ලද ණය ආපසු ගෙවීම්		–	(2,500,814)	(4,077,873)	–
යටත් කරන ලද ණය මත පොලි ගෙවීම්		(1,612,500)	(1,987,500)	(1,612,500)	(1,987,500)
පාලනයට හවුල් නොවන හිමිකම් වෙත ලාභාංශ ගෙවීම්		–	–	(581,222)	(561,232)
වෙනත් ස්කන්ධ හිමියන් වෙත ගෙවූ විශේෂ බදු/ලාභාංශ		(5,219,690)	(8,219,690)	(5,219,690)	(8,219,690)
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්		(1,832,190)	(12,708,004)	(6,491,285)	(5,149,866)
මුදල් හා මුදල් සමානතා හි ශුද්ධ වැඩි වීම/(අඩු වීම)		4,949,373	32,844,404	3,266,301	33,802,852
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානතා		64,008,639	31,164,235	66,408,702	32,605,850
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමානතා		68,958,012	64,008,639	69,675,003	66,408,702

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

මහජන බැංකුව ("බැංකුව") යනු 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 1961 ජූලි 1 වැනි දින පිහිටුවන ලද එහි මූලස්ථානය ලංකාවේ පිහිටා ඇති රජය සතු බැංකුවකි. 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ, එහි පරිපාලිත සමාගම් වල (පොදුවේ "සමූහය" ලෙස සඳහන් වන) මූල්‍ය තොරතුරු හා ආශ්‍රිත සමාගම් වල ස්කන්ධ හිමිකම් තොරතුරු වලින් සමන්විත වේ.

මහජන බැංකුව සමූහයේ මව් සමාගමයි.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුව

බැංකුවේ කටයුතු, තැන්පතු භාරගැනීම, ණය පහසුකම් ලබා දීම, පුද්ගලික බැංකුකරණය, සංවර්ධන බැංකුකරණය, උකස් ගැනීම, ජාත්‍යන්තර වෙළඳාම, රජයේ සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු, ණය කාඩ්පත් මෙහෙයුම්, ආයෝජන බැංකුකරණය සහ විදේශ විනිමය බැංකුකරණය වෙනුවෙන් අක් වෙරළ බැංකු කරණ ඒකකය යනාදියෙන් සැදුම් ලබයි.

පරිපාලිත සමාගම්

බැංකුවේ සමාගම් වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී	මූල්‍ය කල්බදු ලබාදීම, කුලිපිට ගැනුම් වත්කම් මූල්‍යණය, කාලීන ණය ලබාදීම, ඉස්ලාමීය මූල්‍ය කටයුතු, ආන්තික වෙළඳාම, කොටස් වෙළඳාම, ණය සාධන පත්‍ර නිකුත් කිරීම සහ මහජන තැන්පතු ඒකරාශී කිරීම
සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම	සංචාර සංවිධානය කිරීම හා ගුවන් ටිකට්පත් වෙන් කර දීම (සංචාරක නියෝජිත)
පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පීඑල්සි	කල්බදු, කුලිපිට ගැනුම්, මූල්‍ය වෙළඳාම, නිශ්චල දේපළ, කෙටිකාලීන ආයෝජන, හා සංයුක්ත මූල්‍ය සේවා

උප පරිපාලිත සමාගම්

බැංකුවේ උප පරිපාලිත සමාගම්වල ප්‍රධාන කටයුතු පහත සඳහන් පරිදි වේ.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සීමාසහිත පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් සමාගම	වාහන කළමණාකරණ පද්ධතිය, වාහන තක්සේරු කිරීම සහ සේවාස්ථානයක මෙහෙයුම්
සීමාසහිත පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් සමාගම	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් පවත්වාගෙනයාම හා දේපළ සංවර්ධන ක්‍රියාකාරකම්
පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සිදුකිරීම.
සීමාසහිත පීපල්ස් මයික්‍රෝ ෆයිනෑන්ස් සමාගම	අඩු ආදායම්ලාභීන් සහ ක්ෂුද්‍ර ව්‍යාපාර බැංකුකරණය හැර අනෙකුත් මූල්‍ය සේවා සැපයීම
සීමාසහිත පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටිස් සමාගම	කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම හා පවත්වාගෙන යාම
සීමාසහිත ලංකන් ඒලායන්ස් ෆයිනෑන්ස් සමාගම	නිශ්චල සහ චංචල දේපළ කල්බදු සැපයීම සහ ණය සැපයීම

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වේ. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමද 1988 අංක 30 දරණ බැංකු පනතේ අවශ්‍යතාවන්ටද අනුකූල වේ.

2.2 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අවශ්‍යතාවන්ට ද 1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවන්ට ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ද (LKAS සහ SLFRS) අනුකූල ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

2.3 මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු 19 වැනි දින අනුමැතිය ලබා දෙන ලදී.

2.4 මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇති අතර පහත සඳහන් දේ හැර මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවකින් තොරව එය ඒකාකාර ලෙස ආදේශ කරගනු ලැබ ඇත.

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයක් ගන්නා ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම්කරණ කෙරේ.
- විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.
- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වෙනුවෙන් බැරකම ආයුගණක පදනමින් අගය කර සැලසුම් වත්කම් වල ශුද්ධ එකතුව අඩු කර නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්තන අගයට හඳුනාගැනේ.
- ඉඩම් හා ගොඩනැගිලි අත්පත් කරගන්නා අවස්ථාවේ පිරිවැයට මිනුම් කර පසුකාලීනව සමුච්චිත ක්ෂය සහ කවර හෝ හානිකරණ අලාභ අඩු කර ප්‍රත්‍යාගණිත අගයට මිනුම්කරණය කෙරේ.

2.5 ව්‍යවහාරික හා ඉදිරිපත් කරන මුදල් ඒකකය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ බැංකුවේ ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු, වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර ආසන්න දහසට වටයනු ලැබ ඇත.

2.6 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සමාන අයිතම් වල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

3. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනු ලැබ ඇති අගයන් නිශ්චය කිරීම පිණිස කළමනාකාරිත්වය විනිශ්චය, ඇස්තමේන්තු සමග උපකල්පන යොදා ගෙන ඇත. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස්වීමේ හැකියාව පවතී.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වූ උපකල්පන අඛණ්ඩව සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධන, ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කාලසීමාව තුළ හා බලපෑමට ලක් වන කවර හෝ ඉදිරි කාලසීමාවන් තුළදී හඳුනා ගැනේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබ ඇති අගයන් මත වඩාත්ම සැලකිය යුතු බලපෑම ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී යොදාගත් විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

3.1 අඛණ්ඩ පැවැත්ම

ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට බැංකුව සතු හැකියාව සම්බන්ධයෙන් බැංකුවේ කළමනාකාරිත්වය තක්සේරුවක් සිදු කර ඇති අතර කල්පනා දැකිය හැකි අනාගතය තුළ ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව සම්පත් එය සතුව පවතින බවට සෑහීමට පත්ව සිටී. තවද, ක්‍රියාකාරී ව්‍යාපාරයක් ලෙස ආරක්ෂාව පැවැත්ම සඳහා බැංකුව සතු හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැක ඉපිදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත්ව නොසිටී.

3.2 මූල්‍ය සාධනපත්‍රවල සාධාරණ අගයන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපොල වෙතින් ව්‍යුත්පන්න කරගත නොහැකි අවස්ථාවන්හිදී, ගණිතමය ආකෘති භාවිතය ඇතුළත් විවිධ තක්සේරු ශිල්පීය ක්‍රම ගණනාවක් භාවිතා කරමින් ඒවා නිශ්චය කරනු ලැබේ. හැකි සෑම අවස්ථාවකදීම මෙම ආකෘති වෙනුවෙන් යෙදවුම්, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොල දත්ත වෙතින් ව්‍යුත්පන්න කරගැනේ. කෙසේ වෙතත්, එබඳු දත්ත ලබා ගැනීමට නොමැති නම්, සාධාරණ අගයන් තහවුරු කර ගැනීම පිණිස විනිශ්චය අවශ්‍ය වේ. 46 වැනි සටහනේ මූල්‍ය උපකරණවල අගය නිශ්චය කිරීම සම්බන්ධව වඩාත් සවිස්තරාත්මකව පැහැදිලි කර ඇත.

3.3 ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ

ලාභයෙහි හෝ අලාභයෙහි හානිකරණ අලාභයක් වාර්තා කළ යුතුද යන්න තක්සේරු කිරීම සඳහා බැංකුව එක් එක් වාර්තාකරණ දිනට සිය සැලකිය යුතු ණය සහ අත්තිකාරම් වෙන වෙනම සමාලෝචනය කරයි. විශේෂයෙන්ම, හානිකරණ අලාභය තීරණය කිරීමේදී ප්‍රමාණය තක්සේරු කිරීම හා ඉදිරි මුදල් ප්‍රවාහවල කාල ගණනයේදී කළමනාකාරිත්වයෙහි විනිශ්චය අවශ්‍ය වේ. මෙම ඇස්තමේන්තු සාධක ගණනාවක් සම්බන්ධයෙන් වන උපකල්පන මත පදනම්ව ඇති අතර තථ්‍ය ප්‍රතිඵල වෙනස්වීමට ඉඩ ඇත.

වෙන් වෙන් තක්සේරු කිරීම මත හානිකරණය අවශ්‍ය නොවන්නේ නම්, එබඳු සැලකිය යුතු සියළු ණය සහ අත්තිකාරම් සමාන අවදානම් ගතිලක්ෂණ සහිත වත්කම් කාණ්ඩ වල සාමූහිකව තක්සේරු කරනු ලැබේ. අලාභ සිදු වූ බවට විෂය බද්ධ සාක්ෂි පවතින නමුත් බලපෑම් තවමත් ප්‍රකට නොවන අලාභ සිදුවීම් හේතුවෙන් ප්‍රතිපාදනයක් සැලැස්විය යුතුද යන්න තීරණය කිරීම සඳහා මෙය අවශ්‍ය වේ. සාමූහික තක්සේරු කිරීම, ණය කළඹ වෙතින් දත්ත (ණයහිමිකාරිත්ව වර්ග, නිශ්ක මට්ටම්, කර්මාන්ත යනාදිය) හා අවදානම සාන්ද්‍රණය වීමෙහි බලපෑම හා ආර්ථික දත්ත සැලකිල්ලට ගනී.

3.4 විකිණීම සඳහා පවතින ආයෝජනවල හානිකරණය

විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස කාණ්ඩගත කරන ලද සිය සුරැකුම් හානිකරණයට ලක්ව තිබේද යන්න තක්සේරු කිරීම පිණිස බැංකුව සෑම වාර්තාකරණ දිනයකටම ඒවා සමාලෝචනය කරයි. ණය හා අත්තිකාරම් වෙන් වෙන්ව තක්සේරු කිරීම පිණිස යොදා ගන්නා ලද ආකාරය හා සමානව විනිශ්චය මේ සඳහා අවශ්‍ය කෙරේ.

විකිණීම සඳහා පවතින ස්කන්ධ ආයෝජනවල සාධාරණ අගය කැපී පෙනෙන හා දීර්ඝකාලීන ලෙස ඒවායේ පිරිවැයට වඩා අඩුවීමක් පැවතී ඇති විටද බැංකුව ඒවා මත හානිකරණ ගාස්තු වාර්තා කරයි. "කැපී පෙනෙන" සහ "දීර්ඝ කාලීන" යන ලක්ෂණ අදාල වන්නේ කුමකටද යන්න නිශ්චය කිරීම පිණිස විනිශ්චය අවශ්‍ය කෙරේ.

3.5 බදුකරණය

විලම්බිත බදු ගණනය කිරීම සඳහා සමූහය විසින් 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතේ අවශ්‍යතාවයන් පිළිගෙන ඇත. මූල්‍ය කල්බදු ගනුදෙනු සහ නව ප්‍රාග්ධන දීමනා අනුපාත පිළිබඳ ඉදිරිපත් කිරීම් හැර, මෙම පනත වාර්තාකරන දිනට නිත්‍යවශයෙන් බලාත්මක විය. අදාළ සංක්‍රාන්තික විධිවිධානයන් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් එළිදක්වා නොමැත.

විලම්බිත බදු ගණනය කිරීම පිළිබඳ විස්තර මෙම මූල්‍ය ප්‍රකාශයේ 31 සටහනේ දක්වා ඇත.

3.6 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්

ආයුගණක ඇගයීම ශිල්පීය ක්‍රමය භාවිතා කරමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල අගය නිශ්චය කරනු ලැබේ. වට්ටම් අනුපාතික, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රමාණය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතික සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම්, පිළිබඳ උපකල්පනය ආයුගණක ඇගයීම හා සම්බන්ධ වේ. සියළු උපකල්පන සෑම වාර්තාකරන දිනකදීම සමාලෝචනය කරනු ලැබේ. මෙම සැලසුම්වල දීර්ඝකාලීන ස්වභාවය හේතුවෙන්, මෙබඳු ඇස්තමේන්තු කැපී පෙනෙන ලෙස අවිනිශ්චිතතාවට බඳුන් වීමට ඉඩ ඇත. භාවිතා කෙරෙන උපකල්පන සඳහා 37.1.5 සහ 37.2.1 සටහන් බලන්න.

3.7 දේපල, පිරියත සහ උපකරණ වල සාධාරණ අගය

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ බදු ඉඩම්වල පවතින ගොඩනැගිලි සාධාරණ අගයට පිළිබිඹු කර ඇත. එබඳු දේපලවල සාධාරණ අගය නිශ්චය කිරීම පිණිස සමූහය ස්වාධීන තක්සේරු විශේෂඥයන් යොදවා ගත්තේය. සමාන වත්කම්වල ප්‍රවර්තන වෙළඳපොල අගය පවතින විට, මෙම වත්කම්වල අගය තක්සේරු කිරීමේදී එබඳු සාක්ෂි සලකා බලනු ලැබේ.

3.8 දේපල. පිරියත සහ උපකරණ වල ප්‍රයෝජනවත් ජීව කාලය

සමූහය සෑම වාර්තාකරණ දිනකටම දේපල. පිරියත සහ උපකරණවල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවකාල සහ ක්ෂය සමාලෝචනය කරයි. මෙම වටිනාකම්, අනුපාතික හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයෙහි විනිශ්චය යොදා ගනු ලබන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවට යටත් වේ.

සමූහය ආදායම් බදුවලට යටත් වන අතර මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන අවස්ථාවේදී අදාළකරගත හැකි බදු නීති අර්ථකතනය කිරීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තන, විලම්බිත, සහ වෙනත් බදු සහ මුළු ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා විනිසුම අවශ්‍ය කෙරේ.

3.9 බැඳීම් හා අසම්භව්‍යතා

සම්පූර්ණ වශයෙන් පැහැදිලිව තිබෙන වගකීම් නිගමනය කිරීමේ දී ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා අවදානම්ද ඊට ගණනය කෙරේ. අසම්භව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය ආකාරය ට මිනුම් කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් වලින් පමණක් පැවැත්ම තහවුරු වන ඇති විය හැකි වගකීම් වේ .අසම්භව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගනු නොලබන අතර ඒවා දුරස්ථ වන්නේ නම් හැර හෙළිදරව් කරනු ලැබේ. බැඳීම් හා අසම්භව්‍යතා පිළිබඳ විස්තර 43 සටහනෙහි දැක්වේ.

3.10 ආයෝජන දේපළ වර්ගීකරණය කිරීම

දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් ලබනවා දැයි තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිසුම භාවිත කිරීමට අවශ්‍ය කෙරේ. සිය විනිසුම නිත්‍ය ලෙස ක්‍රියාත්මක කළහැකි පරිදි සමූහය විසින් මිනුම් දඩු සකස්කර ඇත. බදුකුළී උපයන හෝ ප්‍රාග්ධන අගය ඉහළ යාමෙන් ඉපයීම් දරන හෝ දේයාකාරයෙන්ම ඉපයීම් දරන දේපළක් ද සමූහයේ වෙනත් වත්කම් වලින් විශාලවශයෙන් ස්වාධීනව මූල්‍ය ගලන උත්පාදන ද ආයෝජන දේපළ ලෙස ගැනෙයි. වෙනත් ආකාරයකින් කිවහොත්, මෙහෙයුම් සඳහා හෝ සේවා සපයන ක්‍රියාවලියේදී හෝ පරිපාලනමය කාර්යයන් සඳහා භාවිත කළ දේපළක් ද තනි වත්කමක් ලෙස සෘජු මුදල් ගලනයක් නොකරන දේපළක් ද දේපළක්, පිරියතක් සහ උපකරණයක් ලෙස ගැනේ. මෙවැනි දේපළවල වර්තමාන භාවිතය සැලකිල්ලට ගනිමින් වාර්ෂික පදනමක් මත සමූහය විසින් එහි දේපළ වල ගිණුම්කරණ වර්ගීකරණය තක්සේරු කරයි.

4. වැදගත් ගිනුම්කරණ ප්‍රතිපත්ති

මෙම ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශ වල ඉදිරිපත් කර ඇති සියළු කාලපරිච්ඡේද වෙනුවෙන් සමූහය 4.1 සටහන් සිට 4.28 සටහන දක්වා ඉදිරිපත් කර ඇති ගිනුම්කරණ ප්‍රතිපත්ති ඒකාකාර ලෙස ආදේශ කර ඇත.

4.1 ඒකාබද්ධකරණ පදනම

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ, 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. ඒකාබද්ධකරණ කාර්යය සඳහා බැංකුවේ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ. ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරමින් මහජන බැංකුවේ වාර්තාකරණ වර්ෂ වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබේ.

4.1.1 ව්‍යාපාර සංයෝජන

අත්පත් කරගත් දිනට උදා: පාලනය සමූහය වෙත මාරු කරනු ලැබූ දිනට, අත්පත් කරගැනීම් ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජන වෙනුවෙන් ගණන් දෙනු ලැබේ. අත්පත් කරගැනීමේදී මාරු කරන ලද ප්‍රතිඵලාව මෙන්ම අත්පත් කරගත් හඳුනාගත හැකි ශුද්ධ වත්කම් ද සාමාන්‍යයෙන් සාධාරණ අගයට මිනුම්කරණය සිදු වේ. සම්පණ්‍යය මිලදී ගැනීමක් මත කවර හෝ ලාභය වහාම ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ. ගනුදෙනු පිරිවැය ණය හෝ ස්කන්ධ සුරැකුම් නිකුත් කිරීම හා සම්බන්ධව ඇත්නම් හැර, කරන ලද වියදමක් ලෙස සැලකේ.

පෙර සිට පවතින සබඳතා පියවීම හා සම්බන්ධ මුදල් ප්‍රමාණ මාරු කරන ලද ප්‍රතිඵලාවට ඇතුළත් නොවේ. එබඳු මුදල් ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනේ.

ගෙවිය යුතු කවර හෝ අසම්භව්‍ය ප්‍රතිඵලාවක් අත්පත් කරගත් දිනට සාධාරණ අගය අනුව මිනුම්කරණය සිදු කෙරේ. අසම්භව්‍ය ප්‍රතිඵලාව ස්කන්ධ ලෙස වර්ගීකරණය කෙරේ නම්, එය නැවත මිනුම්කරණය සිදු නොවන අතර ස්කන්ධ තුළ පියවීමට ගණන් දීම සිදු වේ. නැතහොත්, අසම්භව්‍ය ප්‍රතිඵලාවෙහි සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්කම් එහි ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ.

4.1.2 පාලනයට යටත් නොවන හිමිකම් (NCI)

අත්පත් කර ගැනීමේ දිනට අත්පත් කර ගන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම් තුළ පාලනයට මැදිහත් නොවන හිමිකම් වල සමානුපාතික කොටසට එම හිමිකම් මිනුම්කරණය සිදු වේ. පාලනය අහිමි වීමට හේතු නොවන ආකාරයෙන් පරිපාලිත සමාගමක සමූහය සතු හිමිකම් වෙනස්වීම් සම්බන්ධයෙන් ස්කන්ධ ගනුදෙනු ලෙස ගණන් දෙනු ලැබේ.

4.1.3 පරිපාලිත සමාගම්

"පරිපාලිත" සමාගම් යනු සමූහය විසින් පාලනය වනු ලබන ආයෝජිතයන් වේ. සමූහයට ආයෝජිතයා සමග මැදිහත් වීම හේතුවෙන් එය විචල්‍ය ප්‍රතිලාභ වලට නිරාවරණය වේ නම් හෝ විචල්‍ය ප්‍රතිලාභ වලට හිමිකම් ලැබේ නම් සහ ආයෝජිතයා මත සමූහය සතු බලතල හරහා එම ප්‍රතිලාභ කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ හැකියාව සමූහයට පවතී නම්, එවිට සමූහය ආයෝජිතයා පාලනය කරයි. පාලනය ආරම්භ වන දින සිට පාලනය අවසන් වන දින තෙක් පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කර තිබේ.

4.1.4 පාලනය අහිමි වීම

සමූහයට පරිපාලිත සමාගමක පාලනය අහිමිවූ විට, එය පරිපාලිත සමාගමෙහි වත්කම් හා බරකම් සහ ස්කන්ධ හා සබැඳි කවර හෝ පාලනයට මැදිහත් නොවන හිමිකම් සහ වෙනත් සංරචකයන් හඳුනාගැනීමෙන් ඉවත් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස අත්වන කවර හෝ ලාභය හෝ අලාභය, ලාභ සහ අලාභ තුළ හඳුනාගනේ. පාලනය අහිමි වූ විට, පෙර පැවති පරිපාලිත සමාගමෙහි රඳවාගනු ලැබූ කවර හෝ හිමිකමක් සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.

4.1.5 ඒකාබද්ධ කිරීමේදී ඉවත් කෙරෙන ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී අන්තර් සමූහ ශේෂ සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු තුළින් පැන නගින කවර හෝ උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් (විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ලාභ සහ අලාභ හැර) ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ ද උපලබ්ධි නොවූ ලාභ ඉවත් කෙරෙන ආකාරයට ම ඉවත් කෙරෙන නමුත් හානිකරණය පිළිබඳ සාක්ෂි කිසිවක් නොපවතිනතාක් දුරට එසේ කරනු ලැබේ.

4.2 විදේශීය මුදල් පරිවර්තනය

විදේශ මුදල් වලින් සිදුවන ගනුදෙනු එම ගනුදෙනුව සිදු වූ දිනට බලපැවැත් වූ විනිමය තත්කාලීන අනුපාතිකය අනුව මූලිකව වාර්තා කෙරේ. විදේශීය ව්‍යවහාර මුදලින් දක්වා ඇති මූල්‍යමය වත්කම් සහ බැරකම් වාර්තාකරණ දිනට විනිමය තත්කාලීන අනුපාතිකය අනුව නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙළඳ නොවන ක්‍රියාකාරකම් මත පැණනගින සියළු වෙනස්කම් ආදායම් ප්‍රකාශයෙහි වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ඉදිරිපත් කෙරේ.

විදේශීය ව්‍යවහාර මුදලින් ඓතිහාසික පිරිවැය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, ඒවා හඳුනාගැනීමේ දිනට තත්කාලීන විනිමය අනුපාතික භාවිතා කරමින් පරිවර්තනයකරනු ලැබේ. විදේශීය ව්‍යවහාර මුදලින් සාධාරණ අගයට මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, සාධාරණ අගය නිශ්චය කෙරෙන දිනයට පවතින තත්කාලීන විනිමය අනුපාතික භාවිතා කරමින් පරිවර්තනය කෙරේ.

4.3 මූල්‍ය උපකරණ මුල් වරට හඳුනාගැනීම, වර්ගීකරණය සහ පසුකාලීන මිනුම්කරණය

4.3.1 හඳුනාගැනීමේ දිනය

විධිමත් ලෙස වෙළඳාම් කෙරෙන මූල්‍ය වත්කම් වල මිලදී ගැනීම්, බේරුම් කිරීමේ දිනට ගිණුම්කරණය භාවිතා කරමින් හඳුනාගනු ලැබේ. බේරුම් කිරීමේ දිනය යනු වත්කමක් ආයතනයකට භාරදීමේ දිනයයි. බේරුම් කිරීමේ දින ගිණුම්කරණය යන්නෙන් වත්කමක් ආයතනයකට ලැබුණු දිනට එම වත්කම හඳුනාගැනීම අදහස් කෙරේ. බේරුම් කිරීමේ දිනට ගිණුම්කරණය යොදා ගන්නා විට ආයතනයක් වෙළඳාම් දිනයේ සිට බේරුම් කිරීමේ දිනය දක්වා ඒ අතරතුර කාලපරිච්ඡේදය තුළදී ලැබීමට ඇති වත්කම් වල සාධාරණ අගයෙහි යම් වෙනස්වීම් එම ආයතනය ගිණුම්ගත කරයි.

මූල්‍ය වත්කම් හා බැරකම් වල විධිමත් නොවන මිළදී ගැනීම් වෙළඳාම් දිනට එනම් සාධන පත්‍රයෙහි ගිවිසුම් විධිවිධාන වලට බැංකුව පාර්ශ්වයක් බවට පත්වන දිනට හඳුනා ගැනීමසිදුවේ.

විධිමත් මිළදී ගැනීමක් යනු අදාළ වෙළඳපොලෙහි නියමයක් හෝ ප්‍රඥප්තියක් මගින් පොදුවේ ස්ථාපනය කරන ලද කාලරාමුව තුළ වත්කම් භාරදීම අවශ්‍ය වන නියමයන් සහිත ගිවිසුමක් යටතේ මූල්‍ය වත්කමක් මිළදී ගැනීමකි.

4.3.2 මූල්‍ය උපකරණ මුල් අවස්ථා මිනුම්කරණය

මූල්‍ය උපකරණ මුල් අවස්ථා හඳුනාගැනීමේදී ඒවා වර්ගීකරණය, ඒවාගේ කාර්යය සහ ගනිලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේ දී කළමනාකාරිත්වය සතු අභිප්‍රාය මත පදනම් වේ. ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට වාර්තා කෙරෙන මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් සම්බන්ධයෙන් හැරුණු කොට සියළු මූල්‍ය සාධනපත්‍ර මුල් අවස්ථාවේදී ඒවායේ සාධාරණ අගයට සැළකිය යුතු ගනුදෙනු පිරිවැය එකතු කර මිනුම්කරණය කෙරේ.

4.3.3 මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වර්ගීකරණය සහ පසුකාලීන මිනුම්කරණය

මූල්‍ය වත්කම්

ආරම්භයේ දී මූල්‍ය වත්කමක් පහත සඳහන් කාණ්ඩ අතරින් එකකට වර්ගීකරණය කරනු ලැබේ.

- ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට වෙළඳාම සඳහා රඳවා ගත් හෝ ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට නියම කරන ලද
- විකිණීම සඳහා පවතින
- ණය සහ ලැබිය යුතු දෑ
- කල්පිරීම තෙක් රඳවාගත්

මූල්‍ය වත්කම් වල පසුකාලීන මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

මූල්‍ය බැරකම්

සමූහය සියළු මූල්‍ය බැරකම් ඒවා ආරම්භ වූදිනයේ දී මූලිකව හඳුනාගන්නා අතර සිය මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැයට හෝ ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට මිනුම්කරණය සිදු කරයි. මූල්‍ය බැරකම් වල පසුකාලීන මිනුම්කරණයඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

4.3.4 වෙළඳාම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම්

වෙළඳාම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ. සාධාරණ අගයේ වෙනස්වීම් ශුද්ධ වෙළඳ ආදායම් තුළ හඳුනාගැනේ. පොලි හා ලාභාංශ ආදායම හෝ වියදම ගිවිසුමෙහි නියමයන්ට අනුකූලව හෝ ගෙවීම ලැබීමට හිමිකම තහවුරු වූ විට ශුද්ධ වෙළඳ ආදායම තුළ වාර්තා කෙරේ. ප්‍රධාන වශයෙන්ම කෙටිකාලීන වෙළඳාම යන කාර්යය වෙනුවෙන් අත්පත් කරගත් ණය සුරැකුම්සහ ස්කන්ධ මෙම වර්ගීකරණයට ඇතුළත්ව ඇත.

4.3.5 ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට වාර්තා කෙරෙන ව්‍යුත්පන්න

බැංකුව ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න භාවිතා කරයි. ව්‍යුත්පන්න සාධාරණ අගයට වාර්තා කෙරෙන අතර ඒවායේ සාධාරණ අගය ධනාත්මක වූ විට වත්කම් ලෙස ද සාධාරණ අගය ඍණාත්මක වූ විට බැරකම් ලෙස ද ධාරණය කරනු ලැබේ. ව්‍යුත්පන්න වල සාධාරණ අගය වෙනස්වීම් ශුද්ධ වෙළඳ ආදායම් තුළ වාර්තා කෙරේ.

4.3.6 විකිණීම සඳහා පවතින මූල්‍ය සාධනපත්‍ර

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් යනු විකිණීම සඳහා පවතින යනුවෙන් නම් කරන ලද සහ අනෙකුත් කාණ්ඩ වලින් කවරක හෝ වර්ගීකරණය නොකරන ලද ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ.

ස්කන්ධ සුරැකුම් සහ ඇතැම් ණය සුරැකුම් තුල බැංකුවේ ආයෝජන විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් ලෙස කාණ්ඩගත කෙරේ. මූලික හඳුනාගැනීමට පසුකාලීනව, ඒවා සාධාරන අගයට සහ එහි වෙනස්වීම් වලට අනුව ගිණුම්කරණය කරනු ලැබේ.

උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනේ. එබඳු ආයෝජනයක් බැහැර කිරීමේ දී, එයට පෙර ස්කන්ධ තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශය තුළ වෙනත් මෙහෙයුම් ආදායම් තුළ හඳුනාගනු ලැබේ. විකිණීම සඳහා පවතින මූල්‍ය සාධනපත්‍ර දරා සිටින අතරතුර දී උපයන ලද ලාභාංශ ආයෝජනය කරන ලද බවට සමාගම විසින් ප්‍රකාශිත දිනට වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනේ. එබඳු ආයෝජන හානිකරණය මගින් පැනනගින අලාභ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආයෝජන වෙතින් ශුද්ධ ලාභ (අලාභ) තුළ හඳුනාගැනෙන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අදාළ වත්කම්/ආයෝජන ගිණුමෙන් ඉවත්කරනු ලැබේ.

4.3.7 කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන

කල්පිරීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන යනු කල්පිරීම තෙක් රඳවා ගැනීමට බැංකුවට අභිප්‍රාය සහ හැකියාව ඇති ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. එබඳු ආයෝජන ප්‍රධාන වශයෙන්ම භාණ්ඩාගාර බැඳුම්කර වේ. මුල් අවස්ථා මිනුම්කරණයට පසුකාලීනව, කල් පිරීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන සඵල පොළි අනුපාතික (EIR) භාවිතා කරමින් හානිකරණය අඩු කර ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කෙරේ. අත්පත් කරගැනීමේ දී වන යම් වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵලදායක පොළි අනුපාතිකයෙහි අවශ්‍ය කොටසක් වන සැළකිය යුතු ගාස්තු සැළකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි පොළි ආදායම් තුළ ක්‍රමක්ෂය ඇතුළත් කෙරේ. එබඳු ආයෝජන වල හානිකරණය මඟින් පැන නගින අලාභ ආදායම් ප්‍රකාශයෙහි මූල්‍ය ආයෝජන වෙතින් ශුද්ධ ලාභය/අලාභය තුළ හඳුනා ගනේ. බැංකුව කල්පිරීම තෙක් රඳවාගත් ආයෝජන වලින් සැළකිය යුතු ප්‍රමාණයක් කල් පිරීමට පෙර විකිණීම හෝ යළි වර්ගීකරණය සිදු කරන්නේ නම්, යම් නිශ්චිත තත්ත්වයන් තුළදී හැර, සම්පූර්ණ කාණ්ඩයම දෝෂ සහිත වන අතර ඒවා විකිණීම සඳහා පවතින ලෙස ප්‍රතිවර්ගීකරණය කළ යුතුය. මෙය සිදුවුවහොත්, ඉන් අනතුරුව එළඹෙන වර්ෂ දෙකක් සඳහා කවර හෝ මූල්‍ය වත්කමක් කල්පිරීම තෙක් රඳවාගත් ලෙස වර්ගීකරණය කිරීම බැංකුවට තහනම් වනු ඇත.

4.3.8 ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම්

පහත සඳහන් මූල්‍ය වත්කම් හැර, සක්‍රීය වෙළඳපල තුළ මිළ ප්‍රකාශිත නොවූ, ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්නයන් නොවන මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් අතරට අයත් වේ:

- වහාම හෝ නුදුරු කාලසීමා තුළ බැංකුව විකිණීමට අදහස් කරන මූල්‍ය වත්කම් සහ මුල් අවස්ථා හඳුනා ගැනීමේ දී බැංකුව ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගය ලෙස නම් කරන ලද මූල්‍ය වත්කම්
- මුල් අවස්ථා හඳුනා ගැනීමේ දී බැංකුව විකිණීම සඳහා පවතින ලෙස නම් කරන මූල්‍ය වත්කම්
- ණය පිරිහීමක් හේතුවෙන් හැර එහි මූලික ආයෝජනයෙන් සැළකිය යුතු ලෙස හෝ මුළු ප්‍රමාණයම අය කරගැනීමට බැංකුවට නොහැකි වීමට ඉඩ ඇති මූල්‍ය වත්කම්

මූලික මිනුම්කරණයට පසුව, බැංකු වෙතින් ලැබිය යුතු සහ ගනුදෙනුකරුවන් වෙත ණය හා අත්තිකාරම් මුදල් ප්‍රමාණ හානිකරණය වෙනුවෙන් දීමනා අඩු කර සඵල පොළි අනුපාතිකයට මිනුම්කරණය කෙරේ. අත්පත් කරගැනීමේ දී වූ කවර හෝ වට්ටමක් හෝ ආධික්‍යයක් සහ සඵල පොළි අනුපාතිකයෙහි අවශ්‍ය කොටසක් වන ගාස්තු සහ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය, ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයෙහි පොළි ආදායම් තුළ ක්‍රමක්ෂය ඇතුළත් කෙරේ. හානිකරණය තුළින් පැනනගින අලාභ ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ වියදම් යටතේ හඳුනාගනු ලැබ ඇත.

4.3.9 මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය

ප්‍රතිවර්ගීකරණය සිදුවන දිනයේ දී, ප්‍රතිවර්ගීකරණයත් සාධාරණ අගය මත වාර්තාගත කෙරෙන අතර, එය නව ක්‍රමක්ෂිත පිරිවැය බවට පත් වෙයි.

"විකිණීම සඳහා පවතින" ප්‍රවර්ගයේ ප්‍රතිවර්ගීකරණය කරන ලද මූල්‍යමය වත්කමක් සඳහා ස්කන්ධ තුළ හඳුනාගෙන ඇති, ඕනෑම පෙර ලද වාසිය හෝ අවාසිය සඵල පොළි අනුපාතිකය භාවිතා කරමින්, ආයෝජනයේ ඉදිරියට පවත්නා ජීව කාලය මත ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කෙරේ. නව ක්‍රමක්ෂිත කරනු ලැබූ අගයන්, අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අතර ඇති ඕනෑම වෙනසක් ද සඵල පොළි අනුපාතය යොදාගනිමින් වත්කමෙහි ඉතිරිව ඇති ජීව කාලය අනුව කපාහරිනු ලැබේ. වත්කම හානිකරණය වන බවට පසු කාලීනව නිගමනය කරනු ලබයි නම්, නිමිකම් තුළ වාර්තා වී ඇති ප්‍රමාණය ආදායම් ප්‍රකාශයට ප්‍රතිවක්‍රීය වෙයි.

"වෙළඳාම සඳහා රඳවා ගත්" ප්‍රවර්ගයේ ව්‍යුත්පන්න නොවන වත්කමක් ණය හා ලැබියයුතු දෑ යන නිර්වචනයට අනුකූල වේ නම් සහ පැහැදිලි අනාගතයක් හෝ පරිණතභාවය දක්වා එම මූල්‍ය වත්කම රඳවාගැනීමට බැංකුවට අභිමතය හා හැකියාව තිබේ නම්, වෙළඳාම සඳහා රඳවා ගත් වර්ගයේ සිට "ණය හා ලැබියයුතු" වර්ගයට බැංකුව විසින් එම වෙළඳ වත්කම ප්‍රතිවර්ගීකරණය කරනු ඇත. මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කර ඇත්නම් සහ මුදල් ලැබීම් නැවත අය කර ගැනීමේ හැකියාව වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව ඇස්තමේන්තුගත මුදල් ලැබීම් වැඩි කර ගනී නම් ඇස්තමේන්තුව වෙනස්වූ දිනයේ සිට වැඩිවීමේ බලපෑම සඵල පොළිඅනුපාතයට ගැලපීමක් ලෙස හඳුනාගනු ලබයි.

ප්‍රතිවර්ගීකරණය කිරීම කළමණාකාරිත්වයෙහි අභිමතය පරිදි තීරණය වන අතර, එය සාධන පතයෙන් සාධන පතයට යන පදනම මත නිගමනය වෙයි. මූලික හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ප්‍රවර්ගය ඔස්සේ බැංකුව ඕනෑම මූල්‍යමය උපකරණයක් සාධාරණ අගයට නැවත වර්ගීකරණය නොකරයි.

4.3.10 කාර්ය මණ්ඩල ණය සඳහා සංක්‍රමණික දින වෙනස

සියලු සේවක ණය ලබා දීම් වෙත, වෙළඳපොළ පොලි අනුපාතිකයට පහත අනුපාතිකයින් ප්‍රදානය කෙරෙන අතර, ඒවා සාධාරණ අගය පදනම් කරගෙන හඳුනාගනු ලැබේ. සාධාරණ අගය හා මුදල් වියදම් කළ ප්‍රමාණය අතර වෙනස සංක්‍රමණික දින වෙනස ලෙස සළකා සඵල පොලි අනුපාතිකය යොදාගෙන ණය මුදලේ ඉතිරි කාලයතුළ ආදායම් ප්‍රකාශයෙහි සේවක වැය ලෙස ක්‍රමක්ෂය කෙරේ. මෙම ප්‍රමාණය පොලි ආදායමක් ලෙස ද පෙන්වනු ලැබේ. එහෙයින් ආදායම් ප්‍රකාශයේ ශුද්ධ ප්‍රතිඵලය ශූන්‍ය වේ.

4.3.11 වෙනත් මූල්‍ය බැරකම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් නොකළ, බැංකුව විසින් නිකුත් කළ මූල්‍ය සාධනපත්‍ර වෙනත් මූල්‍ය බැරකම් ලෙස වර්ග කරනු ලබන අතර එහි දී ගිවිසුම්ගත විධිවිධානයන් අනුව දරන්නාට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් භාරදීමට හෝ තමන්ගේම ස්කන්ධවල නිශ්චිත සංඛ්‍යාවක් සඳහා ස්ථාවර මුදල් ප්‍රමාණයක් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් හෝ භාරදීම මඟින් හැර බැඳීම් ඉෂ්ට කිරීමට බැංකුව බැඳීමකට යටත් වෙයි. වෙනත් මූල්‍ය බැරකම් ලෙස ගනුදෙනුකරුවන්ගෙන් ලද තැන්පත් බැංකුවෙන් ගෙවීමට ඇති ප්‍රමාණයන් බැංකුවලින් හා වෙනත් අයගෙන් ලබාගත් ණය හා ණයකර ඇතුළත් වේ.

මූලික මිනුම්කරණයෙන් පසු වෙනත් මූල්‍ය බැරකම් සළුල පොලී අනුපාතිකය යොදාගෙන පසුව සිදුවන ලෙසට ක්‍රමක්ෂිත පිරිවැයට අගය කරනු ලබයි. සළුල පොලී අනුපාතිකයේ අවශ්‍ය කොටස්වන නිකුත් කිරීමේ වට්ටම් හෝ ආධික්‍ය සහ පිරිවැය, ක්‍රමක්ෂිත පිරිවැය ආගණනය කිරීමේ දී සැලකිල්ලට භාජනය කරනු ලැබේ.

4.4 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනා ගැනීම බැහැර කිරීම

4.4.1 මූල්‍ය වත්කම්

පහත සඳහන් තත්ත්වයන් යටතේ මූල්‍ය වත්කමක් (නැතහොත් අදාළ වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් වල එකතුවන කොටසක්) හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

- වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය අවසාන වූ විට
- වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය බැංකුව අන් අයට පවරා තිබීම, නැතහොත් පැවරීමේ විධිවිධාන යටතේ ලැබුණු මුදල් ප්‍රවාහයන් සෘජුකිය යුතු ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශ්වයකට සම්පූර්ණයෙන්ම ගෙවීමට බැඳීමක් අත් කරගෙන තිබීම. එසේත් නැතහොත්
  - බැංකුව වත්කමෙහි සියලු අවදානම් හා ප්‍රතිලාභයන් නිත්‍ය ලෙස අන් අයට පවරා තිබීම
  - බැංකුව වත්කමෙහි අවදානම් හා ප්‍රතිලාභයන්හි සැළකිය යුතු ප්‍රමාණයක් පවරා හෝ තමන් වෙත රඳවා ගෙන නොමැති වුවද වත්කමෙහි පාලනය අන්අයට පවරා තිබීම

4.4.2 මූල්‍ය බැරකම්

බැරකම යටතේ පවත්නා බැඳීම අත්හල විට හෝ අවලංගු වූ විට හෝ අදාළ කාලය අවසාන වූ විට මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

එකම ගැනුම්කාර පුද්ගලයෙකු සතුව පවත්නා මූල්‍ය බැරකමක්, සෘජුකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත හෝ පවත්නා බැරකමක බොහෝ සෙයින් නවීකරණය කරන ලද කොන්දේසි මත හෝ ආදේශ කරනු ලැබූ කල්හි, එවැනි හුවමාරු කිරීමක් හෝ නවීකරණය කිරීමක් නිසා මුල් බැරකම හඳුනා ගැනීම බැහැර කළ ලෙසටත් නව වගකීමක් හඳුනාගත් ලෙසටත් සැලකේ. මුල් මූල්‍ය බැරකමෙහි ධාරණ අගය හා ගෙවීම් කළ ප්‍රතිඵාව අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනෙයි.

4.5 ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවර්තිත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්

නිමිකාරිත්වයට අයත් සියලු අවදානම් හා ප්‍රතිලාභ බැංකුව නිත්‍ය ලෙස රඳවා ගන්නා බැවින් විශේෂිත අනාගත දිනයක දී ප්‍රතිමිල දී ගැනීමේ ගිවිසුම් යටතේ, විකුණන ලද සුරැකුම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් තුළ හඳුනාගැනීම බැහැර කිරීම සිදුනොවේ. ලැබී ඇති අනුරූප මුදල් ප්‍රතිමිල දී ගැනීමේ ගිවිසුම් තුළ බැරකමක් ලෙසින් උපචිත පොලියද ඇතුළත් කර ගනිමින් හා බැංකුවට ණයක් ලෙසින් ගනුදෙනුවේ ආර්ථික ප්‍රතිඵලය පිලිබිඹු කරමින් එකී මුදල් ආපසු දීමට අනුරූප වගකීමක් සමඟ වන වත්කමක් ලෙසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගනු ලබයි. විකුණුම් හා ප්‍රතිමිල දී ගැනීම් මිල අතර වෙනස පොලී වියදමක් ලෙස සැළකෙන අතර, එය සළුල පොලී අනුපාතිකය භාවිතා කරමින් ගිවිසුමෙහි පීව කාලය සඳහා එකතු කෙරේ.

ප්‍රතිලෝම වශයෙන් නිශ්චිත අනාගත දිනක දී ගිවිසුම යටතේ නැවත විකිණීමට මිල දී ගත් සුරැකුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනු නොලැබේ. ණයට ගන්නා ලද සුරැකුම්පත් මත තබා ඇති මුදල් ඇප ඇතුළත් සහ බැංකුවට ණයක් ලෙස, ගනුදෙනුවේ ආර්ථික ප්‍රතිඵලය නිරූපනය කරනු ලබන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් වලට, උපචිත පොළිද ඇතුළුව ගෙවන ලද ප්‍රතිඵාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කරනු ලැබේ. මිල දී ගැනුම් මිල සහ ප්‍රතිවිකුනුම් මිල අතර වෙනස ශුද්ධ පොලී ආදායම් ලෙස වාර්තා කර සළුල පොලී අනුපාතිකය භාවිතා කරමින් ගිවිසුමේ පීව කාලය තුළ උපචිත කරනු ලැබේ.

4.6 සාධාරණ අගය නිශ්චය කිරීම

සාධාරණ අගය යනු වත්කමක් විකිණීම සඳහා ලැබෙන හෝ වෙළඳපොළට සහභාගි වන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී බැරකමක් මාරු කිරීම සඳහා මුල් මුදල මිණුම්කරණ දිනට හෝ එසේ නොමැති නම් එම දිනට සමූහයට ප්‍රවේශය ඇති වඩාත්ම වාසිදායක වෙළඳපොළ අනුව ගෙවනු ලබන මිල වේ.

වාර්තාකරණ දිනයෙ දී සක්‍රිය වෙළඳපොළෙහි වෙළඳාම් කරනු ලබන මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය, ගනුදෙනුමය පිරිවැය සඳහා කිසිදු අඩු කිරීමක් නොමැතිව, වෙළඳපොළ අගය මත පදනම් වෙයි.

සක්‍රිය වෙළෙඳපොළෙහි වෙළඳාම් නොවන වෙනත් මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය, යෝග්‍ය තක්සේරු ශිල්පීය ක්‍රම භාවිතා කිරීම මගින් නිගමනය කෙරේ. වට්ටම් මුදල් ප්‍රවාහ ක්‍රමය, වෙළඳපොළ නිරීක්ෂණය කළ හැකි මිල ගණන් විද්‍යමාන වන සමාන සාධන පත්‍ර සමඟ සැසඳීම් හා වෙනත් අදාළ තක්සේරු ක්‍රම ආදිය සාධාරණ අගය ආගණනය සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රමවලට ඇතුළත් වේ.

වර්තමාන වෙළඳපොළ ගනුදෙනු හෝ නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ තොරතුරු නොමැති යම් යම් මූල්‍ය උපකරණ වාර්තා කර ඇත්තේ සාධාරණ අගය ශිල්පීය ක්‍රමය භාවිතා කරමිනි. මිල ගණන් හෝ යෙදවුම් සත්‍ය වෙළඳපොළ ගනුදෙනු වලට එරෙහිව පරීක්ෂා කරන ලද තක්සේරු ආකෘතියක් හා බැංකුවේ වඩාත් යෝග්‍ය ආකෘතිමය උපකල්පනයන්හි හොඳම ඇස්තමේන්තු භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගය නිශ්චය කරනු ලැබේ. මූල්‍යමය සාධන පත්‍ර වල සාධාරණ අගයන්ගේ විශ්ලේෂණයක් හා ඒවා මිනුම්කරණය කළේ කෙසේදැයි පැහැදිලි කෙරෙන වැඩිදුර විස්තර අංක 46 සටහනෙහි දක්වා ඇත.

4.7 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේ දැයි බැංකුව සෑම වාර්තාකරණ දිනයක දී තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වේ යැයි තීරණය කිරීමට වත්කම්වල මූලික හඳුනාගැනීමෙන් පසු සිදුවී ඇති සිදුවීම් එකක් හෝ ඊට වැඩි ගණනක ප්‍රතිඵලයක් සේ හානිකරණය සිදුව ඇති බවට (අලාභ සිදුවීම) විෂයානුබද්ධ සාක්ෂි තිබේ නම් හා එම අලාභ සිදුවීම (හෝ සිදුවීම්) මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන් කෙරෙහි විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි බලපෑමක් තිබේ නම්, එවැනි මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයව ඇතැයි නිගමනය කරනු ලැබේ.

හානිකරණය පිළිබඳ සාක්ෂිවලට ණයකරු හෝ ණයකරු සමූහය සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳිමින් සිටින්නේ යැයි ඇඟවීම්, ඔවුන් බංකලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට පිවිසෙනු ඇතැයි යන සම්භාවිතාවය පොලී හෝ මුල් මුදලේ ආපසු ගෙවීම් පැහැර හැරීම හෝ අතපසු කිරීම යනාදී කරුණු සහ එහි පැහැර හැරීම සමඟ සහ සම්බන්ධවන ආර්ථික තත්ත්වය හෝ නිඟ මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තු කළ අනාගත මුදල් පාලනයන්හි මැනිය හැකි අඩුවීමක් ඇතිබව නිරීක්ෂණය කළ දත්ත මඟින් පෙන්වාදීම ආදිය ද ඇතුළත් වේ.

4.7.1 ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ධාරණය කෙරෙන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ධාරණය කෙරෙන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් (බැංකු වෙතින් ලැබිය යුතු මුදල් සහ ගනුදෙනුකරුවන් වෙත ණය සහ අත්තිකාරම් වැනි), බැංකුව කේවල වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් වෙනුවෙන් හානිකරණය පිළිබඳ වාස්තවික සාක්ෂි පවතී ද යන්න කේවල වශයෙන් ද කේවල වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් වෙනුවෙන් සාමූහිකව ද තක්සේරු කරයි. යම් කේවල වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් වෙනුවෙන් හානිකරණය සම්බන්ධ වාස්තවික සාක්ෂි නොපවතින බවට බැංකුව නිශ්චය කරයි නම්, එය එම වත්කම සමාන ණය අවදානම් ගතිලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයකට ඇතුළත් කර හානිකරණය සම්බන්ධයෙන් ඒවා සාමූහිකව තක්සේරු කරයි. කේවල වශයෙන් හානිකරණය සම්බන්ධයෙන් තක්සේරු කරන ලදුව හානිකරණ අලාභයක් පවතින හා දිගින් දිගටම හඳුනාගනු ලබන වත්කම් හානිකරණය සම්බන්ධ සාමූහික තක්සේරුවකට ඇතුළත් නොකෙරේ.

හානිකරණ අලාභයක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂියක් පවතී නම්, වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය (මෙතෙක් සිදුවී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය අලාභ අත් හරිමින්) අතර වෙනස ලෙස අලාභ ප්‍රමාණය මිනුම්කරණය කෙරේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා වත්කමෙහි ධාරණ අගය අඩු කෙරෙන අතර අලාභයෙහි ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනීම කරනු ලැබේ. අඩු වූ ධාරණ අගයමත පොලී ආදායම තවදුරටත් උපචිත වන අතර හානිකරණ අලාභ මිනුම්කරණ කාර්යය වෙනුවෙන් අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම සඳහා භාවිතා කෙරෙන පොලී අනුපාතික භාවිතා කරමින් උපචිත කෙරේ.

අයකර ගැනීම සම්බන්ධ යථාර්ථවාදී අනාගත බලාපොරොත්තුවක් නොමැති විට සහ සියළු අතිරේක ඇප උපලබ්ධි වී හෝ බැංකුව වෙත මාරු කරනු ලැබ ඇති විට ආශ්‍රිත දීමනා හා සමඟ ණය කපාහරිනු ලැබේ. ඉන් පසුව එළඹෙන වර්ෂයේදී, හානිකරණය හඳුනාගැනීමෙන් පසුව ඇති වූ සිදුවීමක ප්‍රතිඵලයක් හේතුවෙන් ඇස්තමේන්තු කරන ලද හානිකරණ අලාභය වැඩි වෙයි නම් හෝ අඩු වෙයි නම් දීමනා ගිණුම ගැලපුම මඟින් එයට පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභය වැඩි කිරීම හෝ අඩු කිරීම සිදුකෙරේ. අනාගත කපා හැරීමක් පසුව අය කරගනු ලැබුවහොත්, අය කර ගැනීම ආදායමක් ලෙස බැර කරනු ලැබේ.

ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රවාහ වල වර්තමාන අගයන් මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. ණයක පොලී අනුපාතිකය විචල්‍ය වේ නම්, කවර හෝ හානිකරණ අලාභ මිනුම්කරණය සඳහා වට්ටම් අනුපාතිකය ප්‍රවර්තන සඵල පොලී අනුපාතිකය වේ. අතිරේක ඇප තබන ලද මූල්‍ය වත්කමක ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය ගණනය කිරීම, උකස බේරා ගැනීම සිදුවීමට ඉඩ පැවතියත් නැතත්, අතිරේක ඇපය ලබාගැනීමේ හා විකිණීමේ පිරිවැය අඩු කර උකස බේරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි මුදල් ප්‍රවාහ පිළිබිඹු කරයි.

සාමූහික හානිකරණ ඇගයුම් කාර්යයක් වෙනුවෙන්, වත්කම් වර්ගය, කර්මාන්තය, නිර්මාරිත්ව වර්ගය, ලැබිය යුතු කාලය ඉක්මගොස් තිබීමේ තත්ත්වය වැනි ණය අවදානම්ගති ලක්ෂණ සහ අනෙකුත් අදාළ සාධක පදනම්කරගෙන කාණ්ඩගත කරනු ලැබේ.

හානිකරණය සම්බන්ධයෙන් සාමූහිකව අගයනු ලබන මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත මුදල් ප්‍රවාහ, කාණ්ඩයෙහි වන වත්කම් වලට සමාන ණය අවදානම් ගතිලක්ෂණ සහිත වත්කම් වෙනුවෙන් ඓතිහාසික අලාභ අත්දැකීම මත පදනම්ව තක්සේරු කිරීම සිදු වේ. ඓතිහාසික අලාභ අත්දැකීම පදනම්ව ඇති ප්‍රවර්තන තත්ත්වයන්හි බලපෑම් පිළිබිඹු කිරීම පිණිස සහ ඓතිහාසික කාලපරිච්ඡේදය තුළ පැවති නමුත් ප්‍රවර්තනව නොපවතින තත්ත්වයන්හි බලපෑම ඉවත් කිරීම පිණිස ප්‍රවර්තන නිරීක්ෂණය කළ හැකි දත්ත මත පදනම්ව ඓතිහාසික අලාභ අත්දැකීම ගලපනු ලැබේ.

අලාභ ඇස්තමේන්තු සහ තථ්‍ය අලාභ අත්දැකීම අතර යම් වෙනස්කම් අඩු කිරීම සඳහා අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම පිණිස යොදාගනු ලබන ක්‍රමවේදය සහ උපකල්පන නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ.

4.7.2 විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

වාර්තාකරණ දිනට විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් වල හානිකරණයක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේ ද යන්න පිළිබඳ ඇගයීමක් බැංකුව විසින් කරනු ලැබේ.

"විකිණීම සඳහා පවතින ලෙස" වර්ගීකරණය කෙරෙන ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය ඒවායේ පිරිවැයට වඩා "සැළකිය යුතු ප්‍රමාණයක් හෝ කාලයක්" තුළ පහළ යමින් පවතින විට එවැන්නක් වාස්තවික සාක්ෂියක් සේ සැළකේ. එවැනි හානිකරණය පිළිබඳව සාක්ෂියක් ඇති විටෙක ඒවායේ වර්තමාන සාධාරණ අගය සහ අත්පත් කරගැනීමේ පිරිවැයෙන් මෙයට පෙර ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇති කිසියම් හානිකරණ අලාභයක් වේ නම් එය අඩු කළ පසු ලැබෙන අගය ආයෝජනයෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශයෙහි අලාභයක් සේ හඳුනා ගනී. ස්කන්ධ ආයෝජනයක් සඳහා වූ හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශයේ ප්‍රතිවර්ත්‍ය නොවන අතර, හානිකරණයෙන් පසු සාධාරණ අගයෙහි ඇතිවන වැඩිවීම් වෙනත් විස්තිර්ණ ආදායමෙහි ඇතුළත්කරනු ලැබේ.

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන මත හානිකරණ ආලභයන් පිළිබඳ විස්තර සඳහා අංක 23 දරන සටහන බලන්න.

4.7.3 ප්‍රතිකට්කාකරණය කළ ණය

හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප අත්පත් කරගැනීමට වඩා ණය ප්‍රතිව්‍යුහගත කිරීමට බලාපොරොත්තු වේ. මෙම ක්‍රියාවලියට දළ ගෙවීම් විධිවිධාන දීර්ඝ කිරීම හෝ නව අත්තිකාරම් කොන්දේසි ගිවිසුම ඇතුළත් වේ. කොන්දේසි පිළිබඳව නැවත එකඟත්වයකට එලඹීමෙන් පසු කොන්දේසි සංශෝධනයට පෙරාතුව පැවති මුල් සළුල පොලි අනුපාතිකය භාවිතා කර කිසියම් හානිකරණයක් වේනම් එය මිනුම්කරණය කෙරෙන අතර, තවදුරටත් එම ණය කල් පසුවූ ණයක් ලෙස සලකනු නොලැබේ. නැවත සළකා බැලූ ණය අනාගත ගෙවීම් ලැබෙතැයි විදහාපාන සියළු නිර්ණායකයන් සම්පූර්ණ කර ඇත්ද යන්න පිළිබඳව කළමනාකරණය විසින් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. මෙම ණය මුල් සළුල පොලි අනුපාතිකය මත අඛණ්ඩව කේවල හා සාමූහික හානිකරණ ඇගයීමට යටත් වේ.

4.7.4 ණය ඇප තක්සේරුව

හැකි සෑම අවස්ථාවකම මූල්‍ය වත්කම් මත අවදානම් අඩු කර ගැනීමට. බැංකුව අතිරේක ඇප භාවිතා කිරීමට බලාපොරොත්තු වේ. මුදල් සුරැකුම්පත්, ණයවර ලිපි, ඇප සහතික, දේපල, ලැබිය යුතු ගිණුම්, තොග, වෙනත් මූල්‍ය නොවන වත්කම් සහ ණය වැඩි කිරීම වැනි විවිධ ආකෘතිවලින් ඇප ඉදිරිපත් කෙරේ.

4.7.5 ප්‍රතිඋක්තිය ලැබූ ණය ඇප හෝ බැංකුවට දේපළ පවරා ඇති විට

ගෙවීම් පැහැර හැරි ගනුදෙනුකරුවන් වෙතින් ලද ඇප ආවරණය කිරීම මගින් අත්පත් කරගත් නිශ්චල දේපල නැතහොත් ණය පියවීමට කොටසක් ලෙසින් බැංකුවට පවරා ඇති එවැනි දේපළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති විධානයන් අනුව බැංකුවේ වත්කම්වල කොටසක් වශයෙන් හෝ ආයෝජන දේපළක් ලෙසින් ගිණුම්ගත කර නැත.

4.8 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලවිකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරන්නේ, හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට ප්‍රවර්තන ලෙස බලගැන්විය හැකි නීතිමය අයිතියක් ඇත්තේ නම් පමණක්ම වන අතර, ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කර ගැනීමට හා සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණි. මෙය සාමාන්‍යයෙන් හිලව් කිරීමේ දී අනුගමනය කරන සමස්ත පදනමක් නොවන නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනිකුත් සම්බන්ධිත වත්කම් හා බැරකම් දළ අගයට ඉදිරිපත් කෙරේ.

4.9 කල්බදු

4.9.1 මූල්‍ය කල්බදු ආදායම

නෛතික හිමිකම හැර හිමිකාරිත්වය හා සබැඳි සියළු අවදානම් සහ ප්‍රතිලාභ සමූහය විසින් සැළකිය යුතු ලෙස ගනුදෙනුකරුවන් වෙත මාරු කරමින් සමූහය ගනුදෙනුකරුවන් වෙත කල්බදු මත ලබා දී ඇති වත්කම් මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ. මූල්‍ය කල්බදු යටතේ ලැබිය යුතු මුදල් ලැබිය යුතු කල්බදු කුලිය යටතේ ඇතුළත් කර ඇත. ලැබුණු මූලික කුලිඅඩු කිරීමෙන් පසුව කල්බදු ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත්කර ඇත.

කල්බදු මත ලබා දී ඇති වත්කම් වල පිරිවැය ඉක්මවා ලැබිය යුතු සමාහාර තුළ අතිරික්තයෙන් මුළු නොපියවූ ආදායම සැදුම් ලබයි. කල්බදු දීම ක්‍රියාත්මක වූ මාසයෙන් ආරම්භ වී බදු කාලසීමාව පුරා නොඉපයූ ආදායම, බද්දේ ඉතිරිව පවතින ලැබිය යුතු ශේෂයට සමානුපාතිකව ආදායමට ඇතුළත් කරනු ලැබේ.

4.9.2 කල්බදු ගෙවීම්

ක්‍රියාත්මක කල්බදු යටතේ කරන ලද ගෙවීම්, කල්බදු කාලසීමාව තුළ සරල රේඛීය පදනමින් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ. ලද කල්බදු දිරි දීමනා කල්බදු කාලසීමාව තුළ මුළු කල්බදු වියදමේ අවශ්‍ය කොටසක් ලෙස හඳුනාගැනේ. මූල්‍ය කල්බදු යටතේ කරනු ලබන අවම කල්බදු ගෙවීම් මූල්‍ය වියදම සහ හිඟ බැරකම අඩුවීම අතර බෙදා වෙන් කරනු ලැබේ. බැරකමෙහි ඉතිරිව පවතින ශේෂය මත නියත ආවර්තික පොලි අනුපාතිකයක් නිපැයීම පිණිස මූල්‍ය වියදම කල්බදු කාලසීමාව තුළ එක් එක්කාල පරිච්ඡේදයට වෙන් කරනු ලැබේ. කල්බදු ගැලපීම නහවුරු කරනු ලැබූ විට, ඉතිරිව පවතින කල්බදු කාලසීමාව වෙනුවෙන් අවම කල්බදු ගෙවීම් ප්‍රතිශෝධනය කිරීම මගින් අසම්භව්‍ය කල්බදු ගෙවීම් ගිණුම්ගත කෙරේ.

4.10 මුදල් හා මුදල් සමානතා

අතැති මුදල්, බැංකුවල පවතින ශේෂයන්, බැංකුවල ස්ථාපන සහ ඒක්ෂණ මුදල් සහ කෙටිකාලීන දැන්වීම් මුදල්, මුදල් සහ මුදල් සමානතාවලට ඇතුලත් වේ. මූල්‍ය ප්‍රකාශවල 16 වැනි සටහනේ මුදල් සහ කෙටිකාලීන අරමුදල් පිළිබඳව විස්තර දක්වා ඇත.

4.11 අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න

වෙළඳ වත්කම් හෝ බැරකම් ලෙස වර්ගීකරණය නොකරන ලද සියළු ව්‍යුත්පන්න වත්කම් සහ බැරකම් අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න වලට අයත්වේ. අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශයෙහි සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.

4.12 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ, සමුච්චිත ක්ෂයවීම හා වටිනාකමෙහි හානිකරණයන් අඩුකොට දෙනිකව සේවා වියදම් බැහැර කරමින් ඒවායේ පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන අගයට වාර්තාකරණය කෙරේ. අපේක්ෂිත ඵලදායී ජීවිත කාලයෙහි වෙනස්වීම් යෝග්‍ය පරිදි ක්ෂයවීම් කාලසීමාව හෝ ක්‍රමය වෙනස් කරමින් හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ලෙස සලකමින් ගිණුම්ගත කිරීම සිදු කෙරේ.

පිරිවැය ආකෘතිය

දේපල, පිරියත හා උපකරණ දෙනික සේවා පිරිවැය හැර අනෙක් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභයන් අඩු කළ පසු අගයට මෙම ක්‍රමයේදී වාර්තාකරණය කෙරේ. එබඳු පිරිවැයට, හඳුනාගැනීමේ නිර්ණායක සම්පූර්ණ කෙරෙන්නේ නම් පිරියත හා උපකරණ කොටස් ප්‍රතිෂ්ඨාපන පිරිවැයද ඒවා දරනු ලැබූ විට අන්තර්ගත වේ.

ප්‍රත්‍යාගණන ආකෘතිය

බැංකුව, සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ගොඩනැගිලිවල සමස්ත වර්ගයන් සඳහාම ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරයි. ප්‍රත්‍යාගණනය කළ දිනට ඒවායේ සාධාරණ අගය නිරූපණය කරන ප්‍රත්‍යාගණන අගයෙන් පසුකාලීන සමුච්චිත ක්ෂය හා හානිකරණ අලාභයක් වේ නම් සමුච්චිත හානිකරණ අලාභය අඩු කළ පසු අගයට නිරූපණය කෙරේ.

වත්කම්වල ධාරණ අගය ඒවායේ සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වීම වැලැක්වීම සඳහා සෑම වර්ෂ 3කට වරක් ප්‍රත්‍යාගණන ක්‍රියාදාමය ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රත්‍යාගණන අතිරික්තයකින් මිට පෙර වත්කම් ප්‍රත්‍යාගණනයකින් ලද ලාභ හෝ අලාභ ගිණුමෙහි අලාභයක් සේ හඳුනාගන්නා ලද සංඛ්‍යාවක් ප්‍රතිවර්ත්‍ය කරන්නේ නම් එම ප්‍රමාණය හැර ඉතිරි ප්‍රත්‍යාගණන අතිරික්තය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ස්කන්ධ කොටසෙහි ඇතුළත් ප්‍රත්‍යාගණනය සංචිතයට බැර කෙරෙන අතර වැඩි වීම ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ. පෙර වර්ෂයක නිශ්චිත එම වත්කමම වත්කම් ප්‍රත්‍යාගණන සංචිත අතිරික්තයට සෘජුවම හිලවි කිරීමක් නොවන්නේ නම් ප්‍රත්‍යාගණනයෙන් ලද ඌනතාවය ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ.

පසුකාලීන පිරිවැය

දේපල, පිරියත හෝ උපකරණ අයිතමයක කොටසක් තුළ ගැබ් වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමට හැකියාවක් පවතීනම් හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් එබඳු කොටසක නැවත යෙදීමේ පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයට හඳුනා ගැනේ.

ප්‍රතිසංස්කරණ පිරිවැය

අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය හෝ නඩත්තු කිරීම පිණිස දේපල පිරියත හා උපකරණ අළුත්වැඩියා හෝ නඩත්තුව වෙනුවෙන් වියදම් දරන ලද වියදම් ලෙස වෙනත් විස්තිර්ණ ආදායම්තුළ ඉදිරිපත් කෙරේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ

මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂිත, ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රධාන පිරියත හා යන්ත්‍ර සූත්‍ර සහ පද්ධති සංවර්ධනය සඳහා සෘජුවම කරනලද වියදම් වේ. මෙම වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිරිවැයට දක්වා ඇත.

කල්බදු වත්කම්

සමූහය හිමිකාරිත්වය හා සබැඳි සියළු අවදානම් හා ප්‍රතිලාභ භාර ගන්නා කල්බදු මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කෙරේ. මූලික හඳුනාගැනීම මත එහි සාධාරණ අගය සහ මූලික හඳුනාගැනීමෙන් පසුකාලීනව අවම කල්බදු ගෙවීම් වල වර්තමාන අගය යන දෙකෙන් වඩාත් අඩු අගය හා සමාන අගයකට කල්බදු වත්කම මිනුම්කරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 17 කල්බදු සමඟ අනුකූලව වත්කම් ගිණුම්ගත කෙරේ.

ක්ෂය වීම

දේපල සහ උපකරණවල පිරිවැය, ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ඒවායේ ශේෂ අගයන්ට ලිවීම පිණිස සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ක්ෂය ගණනය කෙරේ. මූල්‍ය කල්බදු යටතේ කල්බදු වත්කම්, කල්බදු කල්සීමාව සහ උපරිම වසර 50ක කාලයක් වන එහි ප්‍රයෝජනවත් ආයුකාලය යන දෙකෙන් වඩාත් කෙටිකාල පරිච්ඡේදය පුරා ක්ෂය කෙරේ. සින්නක්කර ඉඩම් ක්ෂය නොකෙරේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	ක්ෂය කාලපරිච්ඡේදය
සින්නක්කර ගොඩනැගිලි	ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය
කල්බදු ගොඩනැගිලි	කල්බදු කාලසීමාව හෝ උපරිම වසර 50 ට සීමා වන එහි ප්‍රයෝජනවත් ආයුකාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලපරිච්ඡේදය
ලී බඩු, උපකරණ සහ යන්ත්‍රසූත්‍ර	වසරකට 20%
සින්නක්කර සහ කල්බදු මෝටර් වාහන	වසරකට 25%
පෙර ගෙවුම් කල්බදු	කල්බදු කාලසීමාව මුළුල්ලේ

හඳුනාගැනීම බැහැර කිරීම

දේපල, පිරියත සහ උපකරණ බැහැර කරනු ලැබූ විට හෝ භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නෙකෙරෙන විට හඳුනාගැනීම බැහැර කරනු ලැබේ. වත්කම හඳුනාගැනීම බැහැර කිරීම හේතුවෙන් සිදුවන කවර හෝ ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ උත්පාදන සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස ලෙස ආගණනය කරනු ලබන) එම වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කෙරෙන වර්ෂයෙහි ආදායම් ප්‍රකාශය තුළ "වෙනත් මෙහෙයුම් ආදායම්" හි හඳුනාගනු ලැබේ.

4.13 ආයෝජන දේපල

කුලී ආදායම ඉපයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු දෙකම වෙනුවෙන් දරා සිටින ඵනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළදී විකිණීම සඳහා නොපවතින දේපල ආයෝජන දේපල වේ. මේවා භාණ්ඩ හා සේවා නිපයුම හෝ සැපයුම හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපල හා සබැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ සම්භාවිතාවක් පවතී නම් හා ආයෝජන දේපලෙහි පිරිවැය විශ්වාසනීය ආකාරයෙන් මිනුම්කරණය කළ හැකිනම් ආයෝජන දේපල හඳුනාගැනීම සිදු වේ.

මිනුම්කරණය

ආයෝජන දේපලක් මුල් අවස්ථාවේදී එහි පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. මිළට ගත් ආයෝජන දේපලක පිරිවැය, එහි ගත් මිල සහ කවර හෝ සෘජුවම පැවරිය හැකි වියදම් වලින්සැදුම් ලබයි. ස්වයං නිර්මිත ආයෝජන දේපලවල පිරිවැය, ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම අවසන්කරන ලද දිනට එහි පිරිවැය වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 "ආයෝජන දේපල" සමඟ අනුකූලව සමූහය ආයෝජන දේපල සඳහා පිරිවැය ආකෘතිය ආදේශ කරයි. ඒ අනුව, ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කරන ලද ගොඩනැගිලි, කවර හෝ සමුච්චිත ක්ෂය හා කවර හෝ සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැය සඳහන් කරනු ලැබේ.

4.14 අස්පෘශ්‍ය වත්කම් සහ කීර්තිනාමය

4.14.1 කීර්තිනාමය

අත්පත් කර ගැනිමේ දිනට අත්පත් කරගත් පරිපාලිත සමාගමේ ශුද්ධ හඳුනා ගත හැකි වත්කම් වල සමූහයේ පංගුව සතු සාධාරණ අගය ඉක්මවන අත්පත් කරගැනීමේ පිරිවැයෙහි අතිරික්තය කීර්තිනාමය නියෝජනය කරයි. ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය හානිකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව හෝ සිදුවීම් හෝ පවතින තත්ත්වයන් වෙනස්වීම් එය හානි වී ඇති බව හඟවයි නම් එයටත් වඩා අඩු කාල රාමු තුළ පරීක්ෂා කර සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට ධාරණය කෙරේ. කීර්තිනාමය මත හානිකරන අලාභ ප්‍රතිවර්තනය කරනු නොලැබේ.

4.14.2 මෘදුකාංග

සමූහය විසින් අත්පත් කරගන්නා ලද මෘදුකාංග, සමුච්චිත ක්‍රමක්ෂය සහ කවර හෝ සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ.

අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංගවල ප්‍රාග්ධනිත පිරිවැයට එම මෘදුකාංගය සකස් කිරීම වෙත සෘජුවම පැවරිය හැකි සියළු පිරිවැය සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ඇතුළත් වේ. එම ප්‍රාග්ධනිත පිරිවැය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කෙරේ. සමුච්චිත ක්‍රමක්ෂය සහ කවර හෝ හානිකරණය අඩු කර ප්‍රාග්ධනිත පිරිවැයට මෙම අභ්‍යන්තර වශයෙන් සකස් කරනලද මෘදුකාංග සඳහන් කරනු ලැබේ.

මෘදුකාංග වත්කම් වෙනුවෙන් පසුකාලීනව කෙරෙන වියදම් ප්‍රාග්ධනායනය කරනු ලබන්නේ එය සම්බන්ධව ඇති නිශ්චිත වත්කමෙහි ගැබ් වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ එයින් වැඩි වනවිට පමණි. අනෙකුත් සියළු වියදම් ඒවා සිදු වූ ආකාරයට වියදම් ලෙස දැක්වේ.

4.14.3 ක්‍රම ක්ෂය

මෘදුකාංග භාවිතයට ලබා ගත හැකි දින සිට එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය මුළුල්ලේ ලාභය හෝ අලාභය තුළ සරල රේඛීය පදනමින් ක්‍රමක්ෂය කෙරේ. වර්තන හා සාපේක්ෂ නිපයුම්වලට අදාලව මෘදුකාංගවල ඵලදායී ජීවකාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායී ජීවකාල හා අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය නම් ගැලපීම් කරනුලැබේ.

4.15 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

හඳුනාගැනීමේ පදනම

වත්කමක් හානිකරණය පිළිබඳ ඇඟවීමක් තිබේද යන්න බැංකුව සෑම වාර්තාකරණ දිනටම තක්සේරු කරයි. යම් ඇඟවීමක් පවතියි නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂණය අවශ්‍ය වන්නේ නම් බැංකුව වත්කමෙහි නැවත අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වත්කමක නැවත අය කර ගත හැකි වටිනාකම වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක වත්කම හානිකරණය වූ ලෙස සැලකෙන අතර එහි නැවත අය කර ගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම් වල ප්‍රවර්තන වෙළඳපොල තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී, යෝග්‍ය ආගණන ක්‍රමයක් භාවිතා කෙරේ. ආගණන ගුණිත, ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන පරිපාලිත සමාගම් වල මිළ ප්‍රකාශිත කොටස් මිල ගණන් හෝ වෙනත් පවතින සාධාරණ අගය සුචක මඟින් මෙම ආගණනයන් තහවුරු කරනු ලැබේ.

මිනුම්කරණය

කීර්තිනාමය හැර වත්කම් වෙනුවෙන් පූර්වයෙන් හඳුනාගන්නා ලද හානිකරණ අලාභ තවදුරටත් නොපැවතීම නැතහොත් අඩු වීම පිළිබඳ ඇඟවීමක් තිබේද යන්න සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනටම තක්සේරුවක් කරනු ලැබේ. එබඳු ඇඟවීමක් පවතී නම්, බැංකුව වත්කමෙහි හෝ මුදල් ජනන ඒකකයෙහි නැවත අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි. අවසන් වරට හානිකරණ අලාභය හඳුනාගැනීමේ සිට වත්කමෙහි නැවත අය කර ගත හැකි වටිනාකම නිශ්චය කිරීම පිණිස භාවිතා කරන ලද උපකල්පනවල වල වෙනසක් සිදුවී තිබේ නම් පමණක් පූර්වයෙන් හඳුනාගනු ලැබූ හානිකරණයක් ප්‍රතිවර්තනය කෙරේ. පෙර වර්ෂයේදී වත්කම් වෙනුවෙන් කිසිදු හානිකරණයක් හඳුනාගෙන නොතිබිණි නම් වත්කමෙහි ධාරණ අගය එහි නැවත අය කරගතහැකි වටිනාකම නොඉක්මවන පරිදි ක්ෂය අඩුකළ නිශ්චය කරනු හැකිව තිබූ ධාරණ අගය නොඉක්මවන පරිදි ප්‍රතිවර්තනය සීමා කරනු ලැබේ. එබඳු ප්‍රතිවර්තන ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

කීර්තිනාමය හා සබැඳි හානිකරණ අලාභ, අනාගත කාල පරිච්ඡේද තුළ ප්‍රතිවර්තනය කරනු නොලැබේ.

කීර්තිනාමය හානිකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව සමාලෝචනය කෙරෙන අතර සිදුවීම් හෝ තත්ත්වයන්හි වෙනස්වීම් මගින් ධාරණ අගය හානිකරණය වී ඇති බව හැඟවේ නම් එයට වැඩි වාර ගණනක් සමාලෝචනය කරනු ලැබේ. හානිකරණ පරීක්ෂණය කිරීමේ කාර්යය වෙනුවෙන් ව්‍යාපාර සංයෝජනයක දී අත්පත් කරගත් කීර්ති නාමය එම අත්පත් කර ගැනීමේ දින සිට අත්පත් කර ගනු ලැබූ සමාගමෙහි අනෙකුත් වත්කම් හා බැරකම් බැංකුවේ මුදල් ජනන ඒකක හෝ මුදල් ජනන ඒකක කාණ්ඩවලට පවරනු ලැබ තිබේද යන්න නොසලකා එම සංයෝජනයෙහි සහ ක්‍රියාවන් වෙතින් ප්‍රතිලාභ ලැබීම අපේක්ෂිත එම එක් එක් ඒකකය වෙත පැවරීම සිදු වේ. කීර්තිනාමය පවරනු ලැබූ එක් එක් ඒකකය, අභ්‍යන්තර කළමනාකරණ කාර්යයන් වෙනුවෙන් කීර්තිනාමය අධීක්ෂණය කරනු ලබන අවම මට්ටම නියෝජනය කරන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 08 "මෙහෙයුම් බණ්ඩ" සමග අනුකූලව මෙහෙයුම් බණ්ඩයකට වඩා විශාල නොවේ.

කීර්තිනාමය මුදල් ජනන ඒකකයක (හෝ මුදල්ජනන ඒකක සමූහයක) කොටසක් සහ එම ඒකකය තුළ උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම් වල කොටසක් සාදන විට, එම මෙහෙයුම උපයෝජ්‍ය කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කිරීමේදී උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම හා සබැඳි කීර්තිනාමය මෙහෙයුමෙහි ධාරණ අගයට ඇතුළත් කරනු ලැබේ. මෙම තත්ත්වය තුළ උපයෝජ්‍ය කරනු ලබන කීර්තිනාමය, උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුමෙහි සහ රඳවා ගත් මුදල් ජනන ඒකකවල කොටසෙහි සාපේක්ෂ අගයන් මතපදනම්ව මිනුම්කරණය කෙරේ.

පරිපාලිත සමාගම් විකුණනු ලබන විට, විකුණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වෙනස සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් හා කීර්තිනාමය ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

4.16 මූල්‍ය ඇප

හඳුනාගැනීමේ පදනම

සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සිදු කිරීමේදී බැංකුව ණයවර ලිපි, ඇප හා ප්‍රතිග්‍රහණ වලින් සමන්විත මූල්‍ය ඇප ලබා දෙයි. ලද ආධික්‍ය වන සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශ තුළ මූල්‍ය ඇප මූලිකව හඳුනාගැනීම සිදු වේ. මූලික හඳුනාගැනීමට පසුකාලීනව, මූලිකව හඳුනාගත් අගයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ විට අගය හා ඇපය හේතුවෙන් පැන නගින කවර හෝ මූල්‍ය බැඳීමක් බේරුම් කිරීමට අවශ්‍ය වන වියදමෙහි හොඳම ඇස්තමේන්තුව යන දෙකෙන් වඩා ඉහළ අගයට එක් එක් ඇපය යටතේ බැංකුවේ බැරකම මිනුම්කරණය කෙරේ.

මිනුම්කරණය

මූල්‍ය ඇප හා සබැඳි වගවීමෙහි කවර හෝ වැඩිවීමක් මූල්‍ය ප්‍රකාශය තුළ "ණය අලාභ වියදම" තුළ වාර්තා කරනු ලැබේ. ලද ආධික්‍යය ඇපයෙහි ආයු කාලය මුළුල්ලේ සරල රේඛීය පදනමකින් ආදායම් ප්‍රකාශයෙහි "ශුද්ධ ගාස්තු සහ කොමිස් මුදල් ආදායම" තුළ හඳුනාගැනීම කෙරේ.

4.17 විශ්‍රාම වැටුප්

4.17.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම

4.17.1.1 1996 පෙර සේවයට බඳවාගත් සේවකයින් සඳහා විශ්‍රාම සැලැස්ම

1996 ජනවාරි 1 දිනට පෙර සේවයට බැඳුණු ස්ථිර සේවකයින් වෙනුවෙන් බැංකුව නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මක් ක්‍රියාත්මක කරයි. ඒ සඳහා වෙනමම පරිපාලනය කරනු ලබන අරමුදලකට මූල්‍ය දායකත්වය ලබා දීම අවශ්‍ය වේ. මෙම විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම යටතේ ප්‍රතිපාදනය කරනු ලබන ප්‍රතිපාදනවල වියදම, ප්‍රක්ෂේපිත ප්‍රතිලාභ ආයුගණනක ක්‍රමයක් භාවිතා කරමින් වෙනමම නිගමනය කරනු ලැබේ.

අඩුකිරීම් සහිතව මෙතෙක් හඳුනාගෙන නොමැති අතීත සේවා පිරිවැය, බැඳීම් සෘජුවම පියවීමට ඇති සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මෙතෙක් හඳුනාගෙන නැති ආයුගණනක අලාභ අඩු කළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයෙන් නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ බැරකම් සැදුම් ලබයි. කවර හෝ වත්කමක අගය මෙතෙක් හඳුනාගෙන නොමැති ආයුගණනක අලාභ හා අතීත සේවා පිරිවැය එකතුව සැලසුමෙන් ආපසු ගෙවීම් ආකාරයෙන් පවතින කවර හෝ ආර්ථික ප්‍රතිලාභ හෝ සැලසුම වෙත අනාගත දායකත්වයන්ගේ අඩුකිරීම් වලට සීමා වේ. අවසානවරට ආයුගණනක තක්සේරුව සිදු කර ඇත්තේ 2017 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ආයුගණනික ඇකඩමියේ සාමාජික හා ආයුගණනය පිලිබඳ උපදේශක පියල් එස්. ගුණතිලක මහතා විසිනි.

2017 දෙසැම්බර් 31 දිනට ආගණනයේදී භාවිතා කරන ලද මූලික මූල්‍ය උපකල්පනයන් පහත සඳහන් වේ:

වට්ටම් අනුපාතය	වසරකට 10.65%
ජීවන වියදම් දීමනාවේ වැඩි වීම	වසරකට 5%
සියලු ශ්‍රේණි සඳහා දළ වැටුප් වැඩිවීම	වසරකට 7%

විශ්‍රාම ගන්නා සේවකයින් සඳහා බැංකුව පහත දැක්වෙන පදනම මත විශ්‍රාම වැටුප් සම්පාදනය කරයි. සේවකයෙකු වසර 10 ක සේවය සම්පූර්ණ කළ පසු හා සාමාන්‍ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 සම්පූර්ණ කළ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබයි. ඒ සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප, සේවා කාලය මත පහත සඳහන් පරිදි ගණනය කෙරේ:

	සේවා කාලය	නියමිත විශ්‍රාම වැටුප
i.	වසර 10 සිට 20 දක්වා	අවසන් වරට ලද වැටුපෙන් 80%
ii.	වසර 21 සිට 29 දක්වා	අවසාන වරට ලත් වැටුපෙන් 80% ක් හා වසර 20 වැඩි එක් සේවා වසරක් සඳහා, 1% ක් බැගින්
iii.	වසර 30 සහ ඊට වැඩි	අවසන් වරට ලද වැටුපෙන් 90%

විශ්‍රාම වැටුප් අරමුදලේ ගිණුම් වෙනම පවත්වාගෙන යනු ලබන අතර, එය ස්වාධීන බාහිර විගණකයින් විසින් කරනු ලබන වාර්ෂික විගණනයට යටත් වේ. ගිණුම් ප්‍රකාශ මෙන්ම විගණක වාර්තා ද ඉදිරිපත් කරනු ලබන අතර භාරකාර මණ්ඩලය විසින් ඒවා සමාලෝචනය කරනු ලබයි. අපේක්ෂිත මට්ටම් වලට එහි අරමුදල් සැපයීම සහතික කිරීමේ බැඳීම බැංකුවට ඇති හෙයින් මෙම ගිණුම්වල ප්‍රකාශ හා විගණක වාර්තා බැංකුවේ නිරාවරණ සමාලෝචනය සඳහාද ඉදිරිපත් කරනු ලබයි. විශ්‍රාමිකයා ජීවත්වන තාක් විශ්‍රාම වැටුප් මාසිකව ගෙවීම ට නියමිතය.

4.17.1.2 1996 පසු සේවයට බඳවාගත් සේවකයින් සඳහා විශ්‍රාම සැලැස්ම

මුදල් අමාත්‍යාංශය විසින් අනුමත කල පරිදි 1996 ජනවාරි 1 දිනෙන් පසුව බැංකුව ට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමේ කටයුතු බැංකුව විසින් අවසන් කර තිබේ. බැංකුව විසින් මෙය නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් ලෙස නිගමනය කර තිබෙන බැවින්, අතිරික්තය/හිඟය LKAS – 19 පරිදි වාර්තා කර තිබේ.

අවසාන වරට ආයුගණක තක්සේරුව සිදු කර ඇත්තේ 2017 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා ආයුගණනය පිලිබඳ උපදේශක පියල් එස්. ගුණතිලක මහතා විසිනි.

2017 දෙසැම්බර් 31 දිනට ආගණනයේදී භාවිතාකරන ලද මූලික මූල්‍ය උපකල්පනයන් පහත සඳහන් වේ:

වට්ටම් අනුපාතය	වසරකට 10.7%
ජීවන වියදම් දීමනාවේ වැඩි වීම	වසරකට 5%
සියලු ශ්‍රේණි සඳහා දළ වැටුප් වැඩිවීම	වසරකට 7%

4.17.1.3 පාරිතෝෂිකය

1996 ජනවාරි 1 දිනෙන් පසුව බැංකුව ට බැඳුනු සේවකයින්, සේවයෙන් ඉවත් වූ පසු, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලැබීමට සුදුසුකම් ලබන අතර, එසේ නැතහොත් යෝජිත පශ්චාත් 1996 නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට එක්වීම ට මනාපය පළ කළ හැකි අතර, එසේ වූ විට පාරිතෝෂිකයට ඇති අයිතිය අහෝසි වෙයි.

විශ්‍රාම ගැනීම හැරුණු විට, අන් ආකාරයකින් සේවය අවසන් කළ සෙසු සේවකයින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ මාසයට අදාළ දළ වැටුපෙන් එක් අර්ධයක අනුපාතය මත, අඛණ්ඩව සේවය කළ සෑම වසරකට ම වසර 5 කට වැඩි කාලයක් සේවය කර ඇති සේවකයින් සඳහා වූ සමාජ්තික පාරිතෝෂිකය ලැබීමට සුදුසුකම් ලබයි.

බැංකුව එවැනි පාරිතෝෂික ගෙවීමේ බැරකම් වෙනුවෙන් මාසිකව වෙන් කිරීම් සිදු කරන අතර, මෙම වට්නාකම බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ පිලිබිඹු වෙයි. ආයුගණක තක්සේරුව මත පදනම්ව බැංකුව මගින් විධිවිධානයක් සැලසුවේය. එසේ වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව බැංකුව විසින් ආයුගණක තක්සේරුවක් මත පාරිතෝෂික බැරකම් වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කරනු ලැබ ඇත.

බැංකුවේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික වෙනුවෙන් මුදල් වෙන් කිරීම් කරයි. එම සමාගම්වල වසරකට වැඩි කාලයක් සේවය සම්පූර්ණ කළ සේවකයින් වෙනුවෙන් අවශ්‍ය පාරිතෝෂික වෙන් කිරීම් සිදු කරනු ලැබ නිබේ. මෙම බැරකම් වෙනුවෙන් බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

4.17.2 නිශ්චිත දායකත්ව සැලසුම්

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක් ද ක්‍රියාත්මක කරයි. මෙම සැලසුම ට කෙරෙන දායකත්වය සේවකයන් විසින් බැංකුවට ලබා දෙන සේවාවන් ට අනුව සිදු කෙරෙන අතර, පුද්ගල වියදම් යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කෙරේ. නොගෙවූ දායක මුදල් බැරකම් ලෙස සැලකෙන අතර, ඒ අනුව ගිණුම්ගත කෙරේ.

මේ යටතේ බැංකුව පහත සඳහන් යෝජනා ක්‍රම සඳහා දායකත්වය ලබා දෙයි:

4.17.2.1 සේවක අර්ථසාධක අරමුදල

සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැර) බැංකුව විසින් 12% ක් ද, සේවකයා විසින් 8% ක්ද වශයෙන් මෙම අරමුදලට දායකත්වය සපයනු ලැබේ. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලක් වන අතර එය අභ්‍යන්තර ලෙස පවත්වාගනු ලැබේ.

4.17.2.2 සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක භාරකාර අරමුදලට බැංකුව සේවකයාගේ මාසික දළ වැටුපෙන් (අතිකාල දීමනා හැර) 3% ක දායකත්වයක් සපයයි.

4.17.3 වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් සැලැස්ම (1996 ට පෙර/1996 ට පසු)

සුදුසුකම් ලත් ආයුගණකගේ උපදෙස් මත පදනම්ව මෙම යෝජනා ක්‍රමය යටතේ අනාගත බැඳීම් සපුරාගැනීම සඳහා බැංකුව විසින් වෙනම අරමුදලක් පවත්වාගෙන යයි.

4.18 ප්‍රතිපාදනය

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට සහ එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යාමේ ඉඩකඩ පවතින විට හා බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. කවර හෝ ප්‍රතිපාදනයක් හා සබැඳි වියදම, යම් ප්‍රතිපූරණයක් වේ නම් එය අඩු කර ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

4.19 බැඳීම් හා අසම්භව්‍යතා

සම්පූර්ණ වශයෙන් පැහැදිලිව තිබෙන වගකීම් නිගමනය කිරීමේ දී ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා අවදානමිද ඊට ගණනය කෙරේ. වෙන් වශයෙන් හෝ අන් ආකාරයකින් හෝ බැංකුවේ වගකීම් සහිත පරිපාලිත හෝ ආශ්‍රිත සමාගමක අවිනිශ්චිතතාවන්හි සහ ප්‍රාග්ධන වගකීම්වල බැංකුවේ කොටසට සමානුපාතික වන පරිදි යෝග්‍ය අනාවරණයන් තුළ අන්තර්ගත කර ඇත.

අසම්භව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය ආකාරය ට මිනුම් කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් වලින් පමණක් පැවැත්ම තහවුරු වන ඇති විය හැකි වගකීම් වේ. අසම්භව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගනු නොලබන අතර ඒවා දුරස්ථ වන්නේ නම් හැර හෙළිදරව් කරනු ලැබේ.

4.20 බදු

4.20.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු වත්කම් හෝ වගකීම්වල ට ඇතුළත් වනුයේ අදාළ මූල්‍ය වර්ෂය සහ පෙර වර්ෂ වෙනුවෙන් ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්ය. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැනෙනුයේ ශේෂපත්‍ර දිනට පෙර වර්ෂ වල පැවැත්වූ හෝ එම දිනට බලපැවැත්වෙන බදු නීතියයි. ඒ අනුව 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන හා ඒ හා අදාල ව සිදු කර ඇති සංශෝධන සමග අනුකූල වන පරිදි, බදුකරණ අරමුණු ගලපා, වර්ෂයේ ලාභ පදනම මත බදුකරණ ප්‍රතිපාදන සකස් කර ඇති අතර, නිශ්චිත අනුපාතිකයන් අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 13 යටතේ දක්වා ඇත.

4.20.2 විලම්බිත බදුකරණය

ශේෂ පත්‍ර දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් හා මූල්‍ය වාර්තාකරණ කාර්යයන් වෙනුවෙන් ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු ප්‍රතිපාදනය කෙරේ.

4.20.2.1 විලම්බිත බදු බැරකම

පහත සඳහන් අවස්ථාවන්හි දී හැර සියළු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලැබේ.

- ව්‍යාපාර සංයෝජනයක් නොවන හා ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයටද බදු අය කර ගත හැකි ලාභයට හෝ අලාභයට ද බලපෑමක් නොකරන ගනුදෙනුවක කීර්තිනාමය හෝ වත්කමක් හෝ බැරකමක් මූලික හඳුනාගැනීම තුළින් විලම්බිත බදු බැරකම පැන නගින විට; සහ
- පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන්හි ආයෝජන හා සබැඳි බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය සඳහා කාලය නියම කිරීම පාලනය කළ හැකි හා නුදුරු අනාගතයේදී එම තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොවීමේ සම්භාවිතාවක් පවතින විට.

4.20.2.2 විලම්බිත බදු වත්කම්

සියළු අඩු කළ හැකි වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. පහත සඳහන් අවස්ථාවල දී හැරුණු කොට භාවිතා නොකළ බදු ණය සහ භාවිතා නොකළ බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉදිරියට ගෙන යාම උපයෝජනය කිරීම සඳහා යොදාගැනීම ට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තාක් දුරට භාවිතා නොකළ බදු ණය හා භාවිතා නොකළ බදු අලාභ ඉදිරියට ගෙනයාමට හැකියාව ඇත.

- ව්‍යාපාර සංයෝජනයක් නොවන අවස්ථාවකදී සිදුවන ගනුදෙනුවක් තුළින් උද්ගත වන වත්කම් හෝ වගකීම් හා මූලිකව හඳුනාගත් කීර්තිනාමයක් නිසා එම ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකළ හැකි ලාභයට හෝ අලාභයට බලපෑමක් සිදු නොවන්නේ නම්, සහ
- පරිපාලිත සමාගම් සහ ආශ්‍රිතයන්හි ආයෝජන හා සබැඳි අඩු කළ හැකි තාවකාලික සම්බන්ධයෙන් තාවකාලික වෙනස නුදුරු අනාගතයේ දී ප්‍රතිවර්තනය වීමේ හැකියාව පවතින තාක් දුරට හා තාවකාලික වෙනස උපයෝජනය කිරීම පිණිස බදු අයකළ හැකි ලාභ පැවතිය හැකිතාක් දුරට විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

සෑම ශේෂපත්‍ර දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කර විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ එම වත්කම සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට අවස්ථාව සැලසීම පිණිස ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභ පැවතීමේ හැකියාවක් නොමැති තාක් දුරට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම ශේෂපත්‍ර දිනකටම යළි තක්සේරු කර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම ආපසු අය කර ගැනීමට අවස්ථාව සැලසීමට හැකියාව පවතින තාක් දුරට හඳුනාගනු ලැබේ.

ශේෂපත්‍ර දිනට බලාත්මක හෝ පසුකාලීනව බලාත්මක කෙරෙන බදු අනුපාතික සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි වීමට හෝ බැරකම් බේරුම් කිරීමට නියමිත වර්ෂයට අදාළ වනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාතිකවලට විලම්බිත බදු වත්කම් සහ බැරකම් මිනුම්කරණය කරනු ලැබේ.

4.20.3 මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බදු (FSVAT)

2002 අංක 14 දරන අගය එකතු කළ බදු පනතේ 25 අ වගන්තිය සහ එයට කරන ලද සංශෝධනවලට අනුකූලව සමාලෝචනයට ලක් කෙරෙන වර්ෂය තුළ බැංකුවේ මුළු අගය එකතු කිරීම 15% ක එකතු කළ අගය මත බද්දකට යටත් කරන ලදී.

4.20.4 එකතු කළ අගය මත බදු (VAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ පසුකාලීනව එයට කරන ලද සංශෝධනවලට අනුකූලව එකතු කළ අගය මත බදු ගණනය කෙරේ. 15% එකතු කළ අගය මත බදු ගෙවිය යුතුය.

4.20.5 ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ විධිවිධානයන්ට අනුකූලව නිශ්චිතව දක්වා ඇති අනුපාතිකවලට වගකීමට යටත් පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතුය. ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු ආදායම් බදු බැරකමින් අඩු කිරීමේ හැකියාව ඇත. හිමිකම් නොපෑ කවර හෝ බැරකමක් ඉදිරියට ගෙන ගොස් පසුව එළඹෙන වසර හතර තුළ ගෙවිය යුතු ආදායම් බදු වලට හිලව් කිරීමේ හැකියාව පවතී.

4.20.6 ලාභාංශ මත රඳවා ගැනීමේ බදු (WHT)

දේශීය පරිපාලිත සමාගම්වල බදු අය කළ හැකි ලාභයෙන් බෙදා හරිනු ලබන ලාභාංශ මුලාශ්‍රයේදී 10% ක අඩු කිරීමකට යටත් වන අතර බැංකුවේ බදු බැරකමට එරෙහිව පියවීම සඳහා යොදා ගත නොහැක. මෙලෙස මූලාශ්‍රයේදී අඩු කරනු ලබන රඳවාගැනීමේ බදු, ඒකාබද්ධ කිරීමේ ගැලපුමක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ පරිපාලිත සමාගම්වල බදු වියදම්වලට එකතු කරනු ලැබේ.

4.20.7 බෝග රක්ෂණ බදු (CIL)

2013 අංක 12 දරන මුදල් පනතේ 14 වැනි වගන්තියේ විධිවිධානය අනුව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බෝග රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලදී. ඒ අනුව එක් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් බැංකුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත බදුවලට පසු ලාභයෙන් 1% ක් ගෙවීම අවශ්‍ය වේ.

4.20.8 ජාතිය ගොඩනැගීමේ බදු (NBT)

2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ සහ පසුකාලීනව එයට කරන ලද සංශෝධන වල විධිවිධාන අනුව 2011 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වගකීමට යටත් පිරිවැටුමෙන් 2% ක අනුපාතිකයකින් ජාතිය ගොඩනැගීමේ බදු ගෙවිය යුතුය.

4.20.9 මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු

2014 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදී, 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතට කරන ලද සංශෝධන හරහා මූල්‍ය සේවා සැපයුම මත 2% ක ජාතිය ගොඩනැගීමේ බද්දක් හඳුන්වා දෙන ලදී.

4.21 ආදායම් සහ වියදම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමේ හැකියාව පවතින හා ආදායම විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි තෙක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ. ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායක වලට අනුකූලතා ව තිබිය යුතුය.

4.21.1 පොලිය සහ සමාන ආදායම සහ වියදම

ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට මිනුම් කෙරෙන මූල්‍ය උපකරණ, විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කරන ලද පොලි දරන මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට නම් කෙරෙන මූල්‍ය උපකරණ සියල්ලම වෙනුවෙන් පොලි ආදායම හෝ වියදම සළුල පොලි අනුපාතිකය භාවිතා කරමින් වාර්තා කෙරේ.සළුල පොලි අනුපාතිකය යනු මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ හෝ එයට වඩා කෙටි කාල පරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට තත්ත්වාකාරයෙන් වට්ටම් කරන අනුපාතික යයි. මෙම ආගණනය මූල්‍ය උපකරණයෙහි සියළු ගිවිසුම්ගත නියමයන් (උදාහරණයක් ලෙස කලින් ගෙවීමේ විකල්ප) සැලකිල්ලට ගන්නා අතර සාධනපත්‍රයට සෘජුවම පැවරිය හැකි සහ සළුල පොලි අනුපාතිකයෙහි අවශ්‍ය කොටසක් වන යම් ගාස්තු හෝ වර්ධනයේ පිරිවැය ඇතුළත් කර ගන්නා නමුත් අනාගත ණය අලාභ ඇතුළත් කර නොගනී.

හානිකරණ අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක වාර්තාගත අගය අඩු කරනු ලැබූ පසු, හානිකරණ අලාභය මිනුම්කරණය කිරීමේ කාර්යය වෙනුවෙන් අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස භාවිතා කරන ලද පොලි අනුපාතිකයම තවදුරටත් භාවිතා කරමින් පොලි ආදායම හඳුනාගැනීම සිදු වේ.

4.21.2 ගාස්තු සහ කොමිස් මුදල් ආදායම

බැංකුව සිය ගනුදෙනුකාර හවතුන් වෙත සපයන පුළුල් පරාසයක වන විවිධාකාර සේවාවන් වෙතින් ගාස්තු සහ කොමිස් මුදල් ආදායම් උපයයි. සේවය ඉටුකරනු ලැබූ විට ගාස්තු හා කොමිස් මුදල් හඳුනාගනු ලැබේ. යම් කාලපරිච්ඡේදයක් මුළුල්ලේ සේවා සැපයීම වෙනුවෙන් උපයන ලද ගාස්තු එම කාලපරිච්ඡේදය තුල උපචිත කෙරේ.

4.21.3 ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීම සඳහා බැංකුවේ හිමිකම තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

4.21.4 ශුද්ධ වෙළඳ ආදායම

"වෙළඳාම සඳහා දරා සිටින" මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් වෙනුවෙන් සාධාරණ අගයෙහි වෙනස්වීම් වෙතින් පැන නගින සියළු ලාභ සහ අලාභ හා ඒ හා සබැඳි පොළි ආදායම හෝ වියදම සහ ලාභාංශ සියල්ල වෙළඳ කටයුතුවලින් පැනනගින ප්‍රතිඵලවලට ඇතුළත් වේ.

4.21.5 දේපල, පිරියත සහ උපකරණ විකිණීම වෙතින් ලාභ/අලාභ

දේපල, පිරියත සහ උපකරණ විකිණීම වෙතින් ලාභ/අලාභ විකිණීම සිදු වූ කාලපරිච්ඡේදය තුළ හඳුනාගැනෙන අතර වෙනත් ආදායම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

4.21.6 රජයේ සුරැකුම්පත් හා ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් වෙතින් ආදායම

ඒකාකාර ආවර්තක ලාභ අනුපාතික පිලිබිඹු කිරීම උදෙසා භාණ්ඩාගාර බිල්පත් මත වට්ටම්/ආධික්‍යය අඳාළ කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාණ්ඩාගාර බැඳුම්කර මත කූපන් පොලිය උපචිත පදනමින් හඳුනා ගැනේ. ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් මත පොළී ආදායම, ගිවිසුමෙහි කාලපරිච්ඡේදය තුළ උපචිත පදනමින් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනීම සිදු වේ.

4.21.7 කුළී ආදායම

කල්බදු ක්‍රියාත්මක කිරීම මත පැනනගින කුළී ආදායම, මෙහෙයුම් කල්බදු මත කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමින් ගිණුම්ගත කෙරෙන අතර, ආදායම් ප්‍රකාශයෙහි "වෙනත් මෙහෙයුම් ආදායම්" තුළ වාර්තා කරනු ලැබේ.

4.22 බණ්ඩ වාර්තාකරණය

බැංකුවේ බණ්ඩ වාර්තාකරණය පහත සඳහන් මෙහෙයුම් බණ්ඩ මත පදනම් වේ. බැංකුකරණය, කල්බදු, සංචාර හා වෙනත්. ඉහත බණ්ඩ හා සම්බන්ධ තොරතුරු අංක 47 සටහනින් හෙළිදරව් කෙරේ.

4.23 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 7 "මුදල් ප්‍රවාහ ප්‍රකාශය' සමග අනුකූලව මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ "වක්‍ර ක්‍රමය" යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලැබ ඇත. දන්නා මුදල් ප්‍රමාණ වලට වහාම පරිවර්තනය කළ හැකි සහ අගයෙහි වෙනස්වීම් වල සැලකිය යුතු නොවන අවදානමකට පාත්‍ර වන කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වලින් මුදල් හා මුදල් සමානතා සැදුම් ලබයි. අතැති මුදල්, බැංකු වෙත ඇති ශේෂයන් හා ඒක්ෂණ හා කෙටි කාලීන දැනුම් දීම් මුදල්, මුදල් හා මුදල් සමානතා වලට අයත් වේ.

4.24 තැන්පතු ආරක්ෂණ යෝජනා ක්‍රමය

2010 සැප්තැම්බර් 27 වැනි දින නිකුත් කරන ලද 2010 අංක 5 දරන බැංකුකරණ පනත් නියමය "තැන්පතු බැරකම් රක්ෂණය" සහ පසුකාලීනව එයට කරන ලද සංශෝධන වලට අනුකූලව 2010 ඔක්තෝබර් මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් නීති පනතේ 32අ සිට 32ඉ වගන්ති යටතේ නිකුත් කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රම නියමයන්ට අනුකූලව මුදල් මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක සියළු බලපත්‍රලාභී වාණිජ බැංකු සිය තැන්පතු බැරකම් රක්ෂණය කිරීම අවශ්‍ය වේ. ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු බැරකම් රක්ෂණය කළ යුතු තැන්පතු අතර ට අයත් වන අතර, පහත සඳහන් ඒවා ඉන් බැහැර කරනු ලැබේ:

- සාමාජික ආයතන වෙත තැන්පතු බැරකම්
- ශ්‍රී ලංකා රජය වෙත තැන්පතු බැරකම්
- බලපත්‍රලාභී වාණිජ බැංකු වල ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකුකරණ පනත් නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් වෙත තැන්පතු බැරකම් ප්‍රදානය කරන ලද කවර හෝ පිළිසරණක් වෙනුවෙන් අතිරේක ඇප ලෙස රඳවාගත් තැන්පතු බැරකම්
- බැංකුකරණ පනත යටතේ අත්හැර දමන ලද මුදල යන අර්ථය යටතට ගැනෙන සහ මූල්‍ය සමාගම් පනත අනුව අක්‍රිය ගිණුම් ලෙස අර්ථකථනය කර ඒවායේ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරු කරනු ලැබ ඇති තැන්පතු බැරකම්

ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු 14% ක හෝ එයට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණවත් බව අනුපාතිකයක් පවත්වා ගන්නේ නම් බැංකුව සුදුසුකම් ලත් තැන්පතු බැරකම් මත 0.10% ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වන අතර, අනෙකුත් සියළු බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා (14% අඩු ප්‍රාග්ධන ප්‍රමාණවත් බව අනුපාතිකයක් සහිත) කාර්තුව අවසානයට පවතින සුදුසුකම් ලත් තැන්පතුවල මුළු අගය මත ගණනය කෙරෙන හා කාර්තුව අවසානවීමේ සිට දින 15ක කාලපරිච්ඡේදයක් තුළ ගෙවිය යුතු 0.125% ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වේ.

4.25 පසුකාලීන සිදුවීම්

වාර්තාකරණ දිනට පසුව සිදුවන සිදුවීම් ලෙස නම් කරනුයේ, වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දීමේ දිනය අතර, සිදුවන වාසිදායක සහ අවාසිදායක සිදුවීම් වේ. වාර්තාකරණ දිනට පසුව සිදුවන සියළු ප්‍රමාණාත්මක සහ වැදගත් සිදුවීම් සලකා බලා අඳාළ වන පරිදි ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් අංක 44 හි හෙළිදරව් කර තිබේ.

4.26 සංසන්දනාත්මක තොරතුරු

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් ලබා දීමේ අරමුණ ඇතිව ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම සමග අනුකූල වීම පිණිස අවශ්‍ය අවස්ථාවලදී සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

4.27 රක්ෂණ අංශයට විශේෂිත ප්‍රතිපත්ති

4.27.1 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් බැරකම්

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වෙනුවෙන්, වාර්තාකරණ දිනට වාර්තා වී ඇති හිමිකම් වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ හිමිකම් පෑම කර ඇති නමුත් වාර්තාකරණ දිනට වාර්තා වී නොමැති හිමිකම් වල අපේක්ෂිත අවසාන පිරිවැය යන දෙකටම ඇස්තමේන්තු සකස් කළ යුතු වේ. අවසාන හිමිකම් පිරිවැය නිශ්චිතව තහවුරු කළ හැකි වීමට සැලකිය යුතු කාලපරිච්ඡේදයක් ගත වීමට ඉඩ ඇති අතර, ඇතැම් වර්ගවල ඔප්පු වෙනුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි බැරකම් වලින් වැඩි කොටස සිදුවූ නමුත් වාර්තා නොවූ හිමිකම්පෑම් වලින් සැදුම් ලබයි.

චේන් ලැඩර් හා බෝන්හෙවුටර් - ෆර්ගසන් ක්‍රම සහ සංඛ්‍යාත/තීව්‍රතා ක්‍රම වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපණ ශිල්පීය ක්‍රම ගණනාවක් භාවිතා කරමින් නොගෙවූ හිමිකම්පෑම් වල අවසාන පිරිවැය ඇස්තමේන්තු කරනු ලැබේ.

මෙම ශිල්පීය ක්‍රමවලට පාදක වන ප්‍රධාන උපකල්පන වන්නේ සමාගමක අතීත හිමිකම්පෑම විකාශන අත්දැකීම්, අනාගත හිමිකම්පෑම් විකාශනය ප්‍රක්ෂේපණය කර භාවිතා කළ හැකි අතර, එබැවින් අවසාන හිමිකම් පිරිවැය ප්‍රක්ෂේපණයට භාවිතා කළ හැකි බවයි. එසේ හෙයින්, මෙම ක්‍රම පෙර වර්ෂවල නිරීක්ෂණය කරන ලද විකාශනය හා අපේක්ෂිත අලාභ අනුපාතික මත පදනම්ව ගෙවූ හා සිදුවූ අලාභ, එක හිමිකම්පෑමකට සාමාන්‍ය පිරිවැය හා හිමිකම්පෑම් සංඛ්‍යාව බහිර්නිර්වේෂණය කරයි. ඓතිහාසික හිමිකම්පෑම් විකාශනය ප්‍රධාන වශයෙන් ම අහඹු වර්ෂ මගින් විශ්ලේෂණය කෙරෙන නමුත් භූගෝලීය ප්‍රදේශය මෙන් ම වැදගත් ව්‍යාපාර රේඛා සහ හිමිකම් වර්ග අනුව තවදුරටත් විශ්ලේෂණය කිරීමේ හැකියාව ඇත. විශාල හිමිකම්පෑම් සාමාන්‍යයෙන් වෙනම ආමන්ත්‍රණය කෙරෙන්නේ අලාභ ගැලපුම් ඇස්තමේන්තු වල මුනුණාත අගයට පිරිසෙසින් කිරීමෙන් හෝ ඒවායේ අනාගත තත්ත්වය පිලිබිඹු කිරීම පිණිස වෙනම ප්‍රක්ෂේපණය කිරීමෙනි. බොහෝ අවස්ථාවලදී අනාගත හිමිකම්පෑම් උද්ධමන අනුපාතික හෝ අලාභ අනුපාතික සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ උපකල්පන සිදු නොකෙරේ. ඒ වෙනුවට භාවිතා කෙරෙන උපකල්පන වන්නේ ප්‍රක්ෂේපණ පදනම් වන ඓතිහාසික හිමිකම් විකාශනය දත්ත තුළ ගම්‍ය වන ඒවා වේ.

සම්බන්ධ වී ඇති සියලු අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින් ඇති විය හැකි පුළුල් පරාසයක වන ප්‍රතිඵලය ඉදිරිපත් කරන හිමිකම් පෑමේ ඇස්තමේන්තුගත අවසාන පිරිවැය තීරණය කිරීම පිණිස අතීත ප්‍රමාණතා අනාගතයේදී අදාළ නොවිය හැකි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අතිරේක ගුණාත්මක විනිශ්චය භාවිත කරනු ලැබේ. (උදාහරණයක් ලෙස එක් වරක් පමණක් වන සිදුවීම්, හිමිකම්පෑම් සම්බන්ධයෙන් ජනතා ආකල්ප වල වෙනස්කම්, ආර්ථික තත්ත්වයන්, උද්ධමන මට්ටම්, අධිකරණ තීන්දු හා නීති වැනි බාහිර හෝ වෙළඳපොල සාධක වල වෙනස්කම් මෙන්ම කළඹ මිශ්‍රණය ඔප්පු ලක්ෂණ හා හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි).

එවැනි අභ්‍යන්තර සාධක පිලිබිඹු කිරීමට නොඉපයූ ආධික්‍යය වෙනුවෙන් ප්‍රතිපාදනවල ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ දී සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගනු ලැබේ. ගිවිසුමක් මගින් සැපයෙන රක්ෂණ සේවා රටාවට, කාල බෙදා වෙන් කිරීම හැර වෙනත් පදනමකින් නොඉපයූ ආධික්‍යය ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීමේ දීද විනිශ්චය අවශ්‍ය වේ.

4.27.3 ආදායම් හඳුනාගැනීම

දළ ලිඛිත රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් මගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත රක්ෂණ වාරිකය සැදුම් ලබන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලැබේ.

ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් මගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත රක්ෂණ වාරිකය සැදුම් ලබන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලැබේ.පූර්ව ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ ආරම්භ වන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ පැහැනගින කවර හෝ ගැලපුම් රක්ෂණ වාරිකය ට අයත් වේ.

නොඉපයූ ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය වන්නේ වර්ෂයක වාර්තාකරණ දිනට පසුව අවදානම් කාලපරිච්ඡේද හා සබැඳි ලේඛනගත රක්ෂණ වාරිකය කොටසය. නොඉපයූ ප්‍රතිරක්ෂණ ආධික්‍යය එයට පාදක වන සෘජු රක්ෂණ ඔප්පු වල කාලසීමාව පුරා විලම්බනය කෙරේ.

4.28 නිකුත් කරන ලද නමුත් බලාත්මකව නොමැති නව ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය පහත දැක්වෙන නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කර ඇති අතර, ඒවා 2018 ජනවාරි 01 වැනි දිනෙන් ඇරඹෙන මූල්‍ය කාලපරිච්ඡේද වෙනුවෙන් අදාළ වනු ඇත. ඒ අනුව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සමූහය පහත දැක්වෙන මෙම නව ගිණුම්කරණ ප්‍රමිති ආදේශ කරගෙන නොමැත.

4.28.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 - මූල්‍ය උපකරණ SLFRS 9

2018 ජනවාරි 1 වැනි දිනෙන් හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 (SLFRS 39) වෙනුවට SLFRS 9 බලාත්මකව වනු ඇති අතර, එයට පෙර භාවිතා කිරීම ට ද අවසර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 (SLFRS 9) - මූල්‍ය උපකරණ සඳහා හඳුනාගැනීමේ අවධිය හා ක්‍රියාත්මක කිරීමේ අවධිය බැංකුව සිදුකළේය. බාහිර උපදේශක සහයෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 (SLFRS 9) පිළිගැනීම සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණකරණය සිදුකර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 (SLFRS 9) ක්‍රියාත්මක කලයුතු ආකාරය පිළිබඳ සැලකිය යුතු විශ්ලේෂණයක් බැංකුව සිදුකර තිබෙන අතර තාවකාලික ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණ ගෙන තිබේ.

වර්ගීකරණය සහ මිණුම්කරණය

ස්කන්ධ උපකරණ හා ව්‍යුත්පන්න හැර සියළුම මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේ දී ආයතනයේ වත්කම් කළමනාකරණය කිරීමේ ව්‍යාපාර ආකෘතිය සහ උපකරණයේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පදනම් කරගත් ඒකාබද්ධ පදනමක් යොදා ගැනීම අවශ්‍ය කෙරේ.

ව්‍යාපාර ආකෘති තක්සේරුකරණය

බැංකුවේ සිය අරමුණු ළඟාකර ගැනීම සඳහා මූල්‍ය වත්කම් කළමනාකරනය කිරීම වඩාත්ම හොඳින් ප්‍රත්‍යාවර්තනය මට්ටමේ ව්‍යාපාර ආකෘතියක් බැංකුව මගින් තීරණය කරයි. තනි තනි උපකරණය පදනම් කරගනිමින් බැංකුවේ ව්‍යාපාර ආකෘතිය තක්සේරු නොකරණ නමුත් සමූහ වත්කම් පදනම ද ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරිත්වයද ව්‍යාපාර ආකෘතිය තුළ දැරූ මූල්‍ය වත්කම් වැනි නිරීක්ෂණය කළහැකි කරුණු ද ආයතනයේ ප්‍රධාන කළමණාකාරිත්වය වෙත වාර්තාකර ඇගයීමට ලක් කරන කරුණු ද, ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ලකරන අවදානම් සහ එම අවදානම් කළමනාකරණය කිරීම ද, ව්‍යාපාර ආකෘතිය තුළ දැරූ මූල්‍ය වත්කම් ද ව්‍යාපාරයේ කළමනාකරුවන්ට වැටුප් ගෙවන අකාරය (උදා, කළමනාකරණය කරනු ලබන වත්කම් පිළිබඳ සාධාරණ වටිනාකමක් හෝ එක්රැස්කරගත් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත වැටුප් ගෙවීම පදනම් වෙනවාද යන්න) ද අපේක්ෂිත වාරගනන, වටිනාකම සහ අලවිකරන කාලය ආදිය ද බැංකු තක්සේරුකරණයේ දී වැදගත් ස්වරූපයන්ය.

"නරකතම සිද්ධිය" හෝ "පීඩිතම සිද්ධිය" ලෙස සිද්ධීන් සැලකිල්ලට නොගෙන ව්‍යාපාර ආකෘති තක්සේරුකරණය සඳහා සැලකිය යුතු ලෙස අපේක්ෂිත සිද්ධීන් පදනම් කරගනියි. මූලික හඳුනාගැනීම උපලබ්ධි වීමෙන් පසු, බැංකුවේ මුල් අපේක්ෂාවන්ට වෙනස් අකාරයෙන් මුදල් ප්‍රවාහය සිදුවේනම්, එම ව්‍යාපාර ආකෘතියේ දැරූ ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය බැංකුව වෙනස් නොකරන නමුත් අලුතින් උත්පාදනය වූ හෝ අලුතින් මිලදී ගත් මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේ දී එවැනි තොරතුරු ඇතුළත් කර ගනියි.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂණය ලෙස හුදෙක් ප්‍රාග්ධන හා පොලිය ගෙවීම ඔවුන් විසින් සපුරා තිබෙන බවට හඳුනාගැනීම සඳහා බැංකුව විසින් මූල්‍ය වත්කම් පිළිබඳ ගිවිසුම්ගත නියමයන් තක්සේරු කෙරේ.

මෙම පරීක්ෂණය සඳහා "ප්‍රාග්ධනය" යනුවෙන් මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස අර්ථකතනය කෙරේ. මෙය මූල්‍ය වත්කමෙහි පීවිත කාලය තුළ වෙනස් විය හැකිය. (උදාහරණයක් ලෙස, වාරිකයේ/වට්ටමේ ක්‍රමක්ෂය හෝ ප්‍රාග්ධනය නැවැත්ත ගෙවීමට තිබේනම්)

ණය දීමේ වැඩපිළිවෙලක් තුල වඩාත් වැදගත්ම පොලී මූලධර්මයන් ප්‍රධාන වශයෙන් මුදලේ කාල අගයන් හා බැර අවදානම් සඳහා සලකා බැලෙයි. හුදෙක් ප්‍රාග්ධන හා පොලිය ගෙවීමේ තක්සේරුවක් සිදුකිරීමේ දී, බැංකුව මගින් විනිසුම යොදවන අතර මූල්‍ය වත්කම් සඳහා නාමික වටිනාකම ලබා දුන් ව්‍යවහාර මුදල් සහ පොලී අනුපාතය පිහිටවන ලද කාලසීමාව වැනි අදාළ කරුණු සලකා බලයි.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයේ දී අවදානම හෝ වෙනස්වනභාවය සඳහා සුළු අනාවරණයකට වඩා හඳුන්වාදීමක් බවටත්, මූලික ණය වැඩපිළිවෙලක් මගින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයක් ඇති නොකරන බවටත්, හිඟ ප්‍රමාණය මත හුදෙක් ප්‍රාග්ධන හා පොලිය ගෙවන බවටත් ගිවිසුම්ගත හෙළදරව් පරස්පර වෙයි. එවැනි අවස්ථාවන් හිදී, ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් මැනදැක්වීම අවශ්‍ය කෙරේ.

මූල්‍ය වත්කම් හානිකරණය

අපේක්ෂිත බැරකම් අලාභ මූලධර්මය පිළිබඳ සමාලෝචනය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 09 මගින් මූලධර්මීය වශයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 බැහැර කරනු ලබන අතර පෙර පැවති "දරන ලද අලාභ" පදනම වෙනුවට "අපේක්ෂිත අලාභ" පදනම යොදා ගනු ලැබේ.

අලාභ දීමනාව මාස 12ක අපේක්ෂිත බැරකම් අලාභ (12mECL) ලෙස හඳුනාගන්නා අවස්ථාවක් බැවින් බැරකම් අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් නොතිබුණොත් මිස. අපේක්ෂිත බැරකම් අලාභ දීමනාව වත්කමේ ජීවකාලය මුළුල්ලේ පැහැනැගීමට අපේක්ෂිත බැරකම් අලාභ මත පදනම් වෙයි (ජීව කාලයේ අපේක්ෂිත බැරකම් අලාභ හෝ LTECL).

අලාභ දීමනාව මාස 12ක අපේක්ෂිත බැරකම් අලාභ (12mECL)ය යනු වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුලත විය හැකි මූල්‍ය උපකරණයක් මත පැහැරහරීමේ ප්‍රතිඵල අපේක්ෂිත බැරකම් අලාභ නියෝජනය කරන ජීව කාලයේ අපේක්ෂිත බැරකම් අලාභවල කොටසකි.

මූලික හඳුනාගැනීමේ පටන් මූල්‍ය උපකරණයක බැරකම් අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී තිබේද යන්න එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ දී තක්සේරුකරණයක් සිදුකිරීමට බැංකුව විසින් ප්‍රතිපත්තියක් පිහිටුවාගෙන තිබේ. එවැනි ක්‍රියාවලින් පදනම් කරගනිමින් බැංකු සමූහයන් පහත විස්තර කරන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 ආදි ලෙස ණය ලබා දෙයි.

- අදියර 1: ණය මුලින්ම හඳුනාගත් අවස්ථාවේ දී, අලාභ දීමනාව මාස 12ක අපේක්ෂිත බැරකම් අලාභ (12mECL) මත පදනම් ව බැංකුව විසින් දීමනාවක් හඳුනාගනියි. අදියර 1 ණය සඳහා ද බැරකම් අවදානම් වර්ධනය වී තිබෙන පහසුකම් ඇතුලත් අතර අදියර 2හි ණය ප්‍රතිවර්ගීකරණය කර තිබේ. අදියර 1 හි තක්සේරුකරණය සාමූහිකව සිදු කෙරේ.
- අදියර 2: ආරම්භයේ පටන් ණයක් සඳහා බැරකම් අවදානම තුල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම්කර තිබෙන අවස්ථාවක දී, ජීව කාලයේ අපේක්ෂිත බැරකම් අලාභ හෝ බඹෑඹ වෙනුවෙන් දීමනාවක් බැංකුව මගින් වාර්තා කරයි. අදියර 2 ණය සඳහා ද බැරකම් අවදානම් වර්ධනය වී තිබෙන පහසුකම් ඇතුලත් අතර අදියර 2හි ණය ප්‍රතිවර්ගීකරණය කර තිබේ. අදියර 2 හි තක්සේරුකරණය සාමූහිකව සිදු කෙරේ.
- අදියර 3: බැරකම් හානිකරණය වූ ලෙස සැලකූ ණය/ජීව කාලයේ අපේක්ෂිත බැරකම් අලාභ හෝ බඹෑඹ වෙනුවෙන් දීමනාවක්, අලාභ වාර්තා පිළිබඳ විෂය බද්ධ සාක්ෂි ඇතුලත් කෙරේ. අදියර 3 හි තක්සේරුකරණය සාමූහිකව/තනි තනිව සිදු කෙරේ.

බැරකම් අවදානමේ සැලකිය යුතු වැඩිවීම

උපකරණයක් හෝ උපකරණ කළඹක් අලාභ දීමනාව මාස 12 ක අපේක්ෂිත බැරකම් අලාභ (12mECL) හෝ, ජීව කාලයේ අපේක්ෂිත බැරකම් අලාභ (LTECL) යටත් දැයි තීරණය කිරීම පිණිස බැංකුව මගින් අඛණ්ඩව අපේක්ෂිත බැරකම් අලාභ (ECL) යට යටත්ව සියලුම වත්කම් අධීක්ෂණය කරයි. මූලික හඳුනාගැනීමේ පටන් බැරකම් අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් පවතිනවා දැයි බැංකුව තක්සේරු කරයි. පහසුකම් අතීත නියමිත දිනයේ සිට දින 30ක් වැඩි වූ අවස්ථාවක දී හෝ පහසුකම් ප්‍රතිව්‍යුහගත/ප්‍රතිඋපලේඛන ගත කළ අවස්ථාක දී බැරකම් අවදානමේ සැලකිය යුතු වැඩිවීම පවත්වාගැනීම සඳහා බැංකුව හෙළිදරව්වක් සලකාබලයි.

තනි තනි වශයෙන් වැදගත් තක්සේරුකරණය සහ තනි තනි වශයෙන් හානිකරණය නොවූ ණය සහ ලැබිය යුතු දෑ.

හැංකුව විසින් රු. මිලියන 25 ට වැඩිවන සියලුම පාරිභෝගික හෙළිදරව් කිරීම් තනි තනිව තක්සේරු කරයි. අලාභය පිළිබඳ විෂය බද්ධ සාක්ෂි සහිත සියලුම පාරිභෝගිකයන් වෙනුවෙන් තනි තනි තක්සේරුකරණ සිදු කෙරේ (අදියර 3 යටතේ). තනි තනිව සැලකිය යුතු නමුත් හානිකරණය නොවූ ණය, ආරම්භයේ පටන් සැලකිය යුතු බැරකම් ක්ෂයවීමක් පවතිනවා යැයි බවට නිර්ණායක පදනම් කරගෙන අදියර 1 හෝ අදියර 2 යටතේ හානිකරණය සඳහා සාමුහිකව තක්සේරු කෙරේ.

සැලකිය යුතු බැරකම් ක්ෂයවීම පිහිටුවන අතර පහත නිර්ණායකයන් බැංකුව මගින් සලකා බලයි;

- උපකරණය අළුතින්ම ප්‍රභවය වී නම් සැලකිය යුතු ලෙස පවතින මූල්‍ය උපකරණයක අනුපාත හෝ නියමයන්ගේ වෙනත් වෙනස්කම්.
- විශේෂිත මූල්‍ය උපකරණ හෝ සමාන මූල්‍ය උපකරණ සඳහා බැරකම් අවදානම් පිළිබඳ බාහිර වෙළඳපල දර්ශකයන්ගේ සැලකිය යුතු වෙනස්වීම්.
- ණයගැතියාගේ ණය/ස්කන්ධ උපකරණවල මිලෙහි වෙනස්කම් වැනි ණයගැතියා ආශ්‍රිත වෙනත් තොරතුරු.
- ණයගැතියා වෙනුවෙන් පහළ දමන ලද සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තරික බැරකම් අනුපාතය හෝ අභ්‍යන්තරිකව බැරකම් අවදානම තක්සේරු කිරීම සඳහා භාවිතකළ චර්යාත්මක අගයේ අඩුවීම.
- ණයගැතියාගේ බැඳීම සපුරාගැනීම සඳහා සිය හැකියාවේ සැලකිය යුතු වෙනස්වීම් නිසා සිදුවේ යැයි අපේක්ෂිත ව්‍යාපාර, මූල්‍ය හෝ ආර්ථික තත්වයේ පවතින හෝ පුරෝකථනය කළ අහිතකර වෙනස්වීම්.
- නත්‍ය හෝ අපේක්ෂිත ආදායම පහත වැටීම, මෙහෙයුම් අවදානම් ඉහළයෑම, කාර්යය ප්‍රාග්ධන හිඟය, වත්කම් ගුණාත්මක බව අඩුවීම, තෝලනය ඉහළ යෑම, ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රශ්න ආශ්‍රිතව ණයගැතියාගේ මෙහෙයුම් ප්‍රතිඵලයන්ගේ නත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු වෙනස්වීමක්.
- එකම ණයගැතියාගේ වෙනත් මූල්‍ය උපකරණ මත බැරකම් අවදානමේ සැලකිය යුතු ඉහළයෑම.
- ණයගැතියාගේ බැඳීම සපුරාගැනීම සඳහා සිය හැකියාවේ සැලකිය යුතු වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස ණයගැතියාගේ නියාමන, ආර්ථික හෝ නාක්ෂණික පරිසරයේ නත්‍ය හෝ අපේක්ෂිත අහිතකර වෙනස්වීම්.

සාමුහික පදනමක් මත මැණුම් සිදුකළ මූල්‍ය වත්කම් කාණ්ඩකරණය

ඉහත විස්තර කළ පරිදි සාමූහික හෝ තනි තනි පදනමින් බැංකුව විසින් අපේක්ෂිත බැරකම් අලාභ (ECL) ගණනය කෙරේ. තනි තනි පදනමින් බැංකුව විසින් අපේක්ෂිත බැරකම් අලාභ (ECL) ගණනය කරන වත්කම් පන්ති සඳහා අදියර 3 ට අයත් තනි තනි වශයෙන් සැලකිය යුතු සියලුම වත්කම් ඇතුලත් වෙයි. අදියර 1 සහ 2 කට අයත් සියලුම වත්කම් හානිකරණය සඳහා සාමුහිකව තක්සේරු කෙරේ.

නිපයුම් වර්ගය, සමාන වර්ග, අතීත නියමිත දිනයන්, කර්මාන්තය ආදිය වැනි ණයේ අභ්‍යන්තර හෝ බාහිර ලක්ෂණ සංයුක්ත කිරීම පදනම් කරගනිමින් කුඩා සජාතීය හෙළඳරව් කිරීම් සඳහා බැංකුව විසින් මෙම හෙළඳරව් කිරීම් කාණ්ඩ කරයි.

අපේක්ෂිත බැරකම් අලාභ (ECL) ගණනය කිරීම

සපල පොලි අනුපාතයට ආසන්නව වට්ටම් තැබූ අපේක්ෂිත මුදල් අඩුවීම මිණුම්කරණය සඳහා බරතැබූ සම්භව්‍යතා සිද්ධීන් තුනක් පදනම් කරගනිමින් අපේක්ෂිත බැරකම් අලාභ (ECL) ගණනය කෙරේ. මුදල් අඩුවීම යනු ආයතනය ලබාගැනීම අපේක්ෂාකරන ගිවිසුම සහ මුදල් ප්‍රවාහයන්ට අනුව ආයතනයට අය විය යුතු මුදල් ප්‍රවාහ අතර වෙනසයි.

අපේක්ෂිත බැරකම් අලාභ (ECL) ගණනය කිරීමේ යාන්ත්‍රණ පහතින් ලුහුඩින් දැක්වෙන අතර ප්‍රදාන මූලධර්යන් පහත පරිදි වෙයි:

- **පැහැර හැරීමේ සම්භව්‍යතාවය** (PD): යනු තිරස් කාලයක් මුළුල්ලේ වියහැකි පැහැරහැරීම තක්සේරු කිරීමයි. පහසුකම කළින් හඳුනාගෙන තිබේනම් සහ මෙතෙක් කළඹේ තිබේනම්, තක්සේරුගත කාලසීමාවක් මුළුල්ලේ එක්තරා අවස්ථාවක දී පමණක් පැහැර හැරීමක් සිදුවිය හැකිය.
- **පැහැර රහැරීම හෙළිදරව් කිරීම** (EAD): යනු ප්‍රාග්ධන සහ පොළිය ප්‍රතිගෙවීම, ගිවිසුමකින් හෝ වෙනත් අකාරයකින් උපලේඛනගත ද යන්න, බැඳීම් සිදුකරගත් පහසුකම් මත අපේක්ෂිත පහත වැටීම් ඇතුලුව වාර්තාකරණ දිනයෙන් පසු හෙළිදරව්ව තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, අනාගත පැහැරහැරීම් දිනයක අනාවරණය පිළිබඳ තක්සේරුවයි.
- **පැහැර හැරීම් අලාභ** (LGD) : යනු එක්තරා නිශ්චිත කාලයක දී පැහැරහැරීමක් සිදුවූ අවස්ථාවක දී පැහනගින අලාභ තක්සේරුවකි. එය කිසියම් සමාන්තර උපලබ්ධිවීම ඇතුලුව ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හා ණය හිමියන්ට ලැබීමට අපේක්ෂිත මුදල් අතර වෙනස මත පදනම් වෙයි. පැහැරහැරීම හෙළිදරව් කිරීමේ (EAD) ප්‍රතිශතයක් ලෙස සාමාන්‍යයෙන් ප්‍රකාශ කරනු ලබයි.

අපේක්ෂිත බැරකම් අලාභ (ECL) තක්සේරු කිරීමේ දී, බැංකුව විසින් සිද්ධීන් ත්‍රිත්වයක් (මූලික සිද්ධිය, හොඳම සිද්ධිය හා නරකතම සිද්ධිය) සලකා බලයි. මෙම එක් එක් සිද්ධීන් විවිධ අලාභ අනුපාත සමග ආශ්‍රිතව පවතියි. බැරකම් අලාභ පිළිබඳ බැංකු සලකා බලන උපරිම කාලසීමා තීරණය කිරීම සියලුම නිපයුම් සඳහා මූල්‍ය උපකරණයක ගිවිසුම්ගත පීව කාලයයි.

ඉදිරි දැක්මේ තොරතුරු

අපේක්ෂිත බැරකම් අලාභ (ECL) ආකෘතියේ දී බැංකුව විසින් ආර්ථික ආදායක ලෙස පුළුල් පරාසයක ගුණාත්මක/ප්‍රමාණාත්මක ඉදිරි දැක්මේ තොරතුරු මත විශ්වාසය තබයි. ප්‍රමාණාත්මක තොරතුරු සඳහා දළ දේශීය නිෂ්පාදන වර්ධනය, උද්ධමනය, සේවායුක්තිය, පොළි අනුපාත සහ විනිමය අනුපාත ඇතුලත් වන අතර ගුණාත්මක තොරතුරු සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති, කර්මාන්ත ව්‍යාපාරයේ තත්වය සහ නියාමන බලපෑම ඇතුළත්ය.

4.28.2 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 15 (SLFRS 15) ගනුදෙනුකාර ගිවිසුම් වෙතින් ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලාංකික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 15 -"ගනුදෙනුකරුවන් සමග ගිවිසුම් වෙතින් ආදායම්" ආදායම් හඳුනාගත යුත්තේ කොපමණ ප්‍රමාණයක් කවර අවස්ථාවක ද යන්න නිශ්චය කිරීම සඳහා පරිපූර්ණ රාමුවක් ස්ථාපනය කරයි. දැනට පවතින ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 18 ආදායම් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 11, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වෙනුව ට ආදේශ කරනු ලැබේ.

2018 ජනවාරි 1 වැනි දිනෙන් හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 (SLFRS 15) බලාත්මක වනු ඇති අතර, එයට පෙර භාවිතා කිරීමට ද අවසර ඇත.

4.28.3 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 (SLFRS 16) කල්බදු

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 ට අනුව බදු ගැනුම්කරු සියළු කල්බදු භාවිතය ට හිමිකම ඇති අනුරූප වත්කම් සමග සිය මූල්‍ය තත්වය ප්‍රකාශයෙහි කල්බදු බැරකම් ලෙස හඳුනාගැනීම අවශ්‍ය වේ.

හඳුනාගත් කල්බදු වෙනුවෙන් ලාභ හෝ අලාභ හඳුනාගැනීමේ රටාව, පොලි හා ක්ෂයවීම් අනුපාතික ලාභය හෝ අලාභය තුළ වෙන් වෙන්ව හඳුනාගන්නා දැනට පවතින මූල්‍ය කල්බදු ගිනුම්කරණය හා සමාන වනු ඇත.

2019 ජනවාරි 1 වැනි දිනෙන් හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද වෙනුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16 (SLFRS 16) බලාත්මක වනු ඇත.

ඉහත ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම මගින් ඇතිවන බලපෑම සමූහය විසින් මෙතෙක් ප්‍රමාණාකරණය කර නොමැත.

5. දළ ආදායම

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
පොලී ආදායම (සටහන 6.1)	149,184,471	109,970,256	173,820,509	129,708,199
ගාස්තු සහ කොමිස් ආදායම (සටහන 7.1)	5,132,907	3,948,052	5,769,244	4,365,052
වෙළඳාමෙන් ලැබෙන ශුද්ධ ලාභය (සටහන 8)	2,664,721	2,816,079	2,697,941	2,801,632
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) (සටහන 9)	5,183,198	5,379,972	7,895,999	7,874,636
මුළු දළ ආදායම	162,165,297	122,114,359	190,183,693	144,749,519

6. ශුද්ධ පොලී ආදායම

6.1 පොලී ආදායම

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
මුදල් සහ මුදල් සමානතා	238,338	233,527	627,723	1,020,892
බැංකු වෙත යෙදවුම්	195,443	542,475	195,509	542,475
ණය සහ ලැබිය යුතු දෑ - බැංකු	6,955,577	5,536,683	6,955,577	5,536,683
ණය සහ ලැබිය යුතු දෑ - වෙනත් ගනුදෙනුකරුවන්	118,727,914	86,653,415	142,974,501	105,603,533
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් රඳවාගත්	12,343,729	7,749,838	12,343,729	7,749,839
මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින	517,741	114,378	517,741	114,378
කාර්යමණ්ඩලය ණය මත සංක්‍රමණ වෙනස	982,045	867,111	982,045	867,570
	139,960,787	101,697,427	164,596,825	121,435,370
වෙළඳාම සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්	9,223,684	8,272,829	9,223,684	8,272,829
මුළු පොලී ආදායම	149,184,471	109,970,256	173,820,509	129,708,199

ද්විතියික වෙළඳපොළ ගනුදෙනු මත රජයේ සුරැකුම්පත් මත රඳවාගැනීමේ බදු වෙනුවෙන් නාමික බදු

රජයේ සුරැකුම්වල ද්විතියික වෙළඳපොළ ගනුදෙනුවලින් පොලී අදායමක් උපයාගන්නා සමාගමකට, ශුද්ධ පොලී ආදායමෙන් නවයෙන් එකක් වන නාමික බද්දකට,කෙසේවුවද එම පොලී අදායම, තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් වන්නේ නම් පමණක්, හිමිකමක් ලැබෙන බවට 2006 අංක 10 දරන දේශීය අදායම් (සංශෝධන) පනතේ විධිවිධාන සැලස්වේ. ඒ අනුව බැංකුව සහ සමූහය විසින් රජයේ සුරැකුම්පත්වල ද්විතියික වෙළඳපොළ ගනුදෙනු වලින් අදාල වර්ෂය සඳහා උපයාගනු ලබන ශුද්ධ පොලී ආදායම, මෙම මූල්‍ය ප්‍රකාශවල දළ අගයෙන් දක්වා ඇත. ඒ අනුව බැංකුව 2017 වර්ෂය සඳහා රු. මිලියන 2,302 ක් ගිණුම්ගතකර ඇත. (2016 වර්ෂය සඳහා එය රු. මිලියන 1,397ක් විය.)

6.2 පොළී වියදම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
බැංකුවලට ලැබිය යුතු	(4,195,944)	(3,628,098)	(6,750,915)	(7,710,119)
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	(90,447,630)	(57,400,369)	(95,895,830)	(60,254,871)
වෙනත් ණය ගැනීම්	(2,462,562)	(3,830,716)	(6,815,736)	(6,159,887)
නිකුත් කරන ලද ණය සුරැකුම්	(1,612,500)	(1,986,686)	(1,612,500)	(1,986,686)
මුලු පොලී වියදම	(98,718,636)	(66,845,869)	(111,074,981)	(76,111,563)
ශුද්ධ පොලී ආදායම	50,465,835	43,124,387	62,745,528	53,596,636

7. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

7.1 ගාස්තු සහ කොමිස් ආදායම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
ණය	193,300	104,401	193,300	104,401
කාඩ්පත්	443,999	344,779	443,999	344,779
වෙළඳ සහ ප්‍රේෂණ	1,328,049	1,289,999	1,328,049	1,289,999
ආයෝජන බැංකුකරණය	9,517	32,893	9,517	32,893
තැන්පතු	2,369,131	1,508,371	2,369,131	1,508,371
ඇපකර	656,400	525,072	656,400	525,072
වෙනත්	132,511	142,537	768,848	559,537
	5,132,907	3,948,052	5,769,244	4,365,052

7.2 ගාස්තු සහ කොමිස් වියදම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
ණය	–	–	–	–
කාඩ්පත්	(115,511)	(103,381)	(115,511)	(103,381)
වෙළඳ සහ ප්‍රේෂණ	(2,168)	(2,420)	(2,168)	(2,420)
ආයෝජන බැංකුකරණය	(4,559)	(3,099)	(4,559)	(3,099)
ඇපකර	(3,131)	(4,791)	(3,131)	(4,791)
වෙනත්	(135,404)	(95,221)	(135,404)	(95,221)
	(260,773)	(208,912)	(260,773)	(208,912)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	4,872,134	3,739,140	5,508,471	4,156,140

8. වෙළඳාමෙන් ශුද්ධ ලාභය

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
ස්කන්ධ	2,119,499	2,572,743	2,119,499	2,572,743
සාමාන්‍ය කොටස්	4,572	(142,797)	34,945	(145,509)
වෙනත්				
- ප්‍රාග්ධන ලාභ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර	125,763	531,921	125,763	531,921
- භාණ්ඩාගාර බිල්පත් සාධාරණ ආගණනයෙහි වෙනස්වීම්	84,799	77,658	84,799	77,658
- භාණ්ඩාගාර බැඳුම්කර සාධාරණ ආගණනයෙහි වෙනස්වීම්	330,088	(223,446)	332,935	(235,181)
මුළු ගණන	2,664,721	2,816,079	2,697,941	2,801,632

9. වෙනත් මෙහෙයුම් ආදායම (ශුද්ධ)

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
දේපල පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය	27,306	98,471	46,041	131,611
විදේශ විනිමය ප්‍රත්‍යාගණනය මත ලාභය/(අලාභය)	117,381	50,915	117,381	50,915
ආයෝජන වෙතින් ලාභාංශ				
මිල - ප්‍රකාශිත	54,537	59,640	198,921	189,530
මිල - ප්‍රකාශිත නොවූ	106,215	56,951	106,215	–
පරිපාලිත ආයතන	1,482,358	1,512,109	–	–
කපාහරින ලද බොල් ණය අයකර ගැනීම සහ ප්‍රතිපාදන ප්‍රතිවර්තනය	1,379,729	1,770,994	1,554,838	1,967,368
ශුද්ධ ඉපැයූ වාර මුදල්	–	–	3,777,037	3,551,235
වෙනත්	2,015,671	1,830,891	2,095,566	1,983,977
මුළු ගණන	5,183,198	5,379,972	7,895,999	7,874,636

10. ණය සහ වෙනත් අලාභ සඳහා හානිකරණය

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
ණය සහ ලැබිය යුතු දෑ				
වෙනත් ගනුදෙනුකරුවන් වෙත (සටහන 22.2.3)	2,678,366	1,246,748	4,191,907	692,083
- කේවල හානිකරණය	1,324,326	847,801	1,547,969	796,703
- සාමූහික හානිකරණය	1,354,040	398,947	2,643,938	(104,620)
වෙනත්	–	–	187,860	670,170
මුළු ගණන	2,678,366	1,246,748	4,379,767	1,362,253

11. සේවක මණ්ඩල වියදම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
වැටුප්, ප්‍රසාද දීමනා සහ ආශ්‍රිත වියදම්	9,807,288	9,121,658	12,935,207	11,840,789
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වය - 1996 ට පෙර විශ්‍රාම වැටුප් අරමුදල (සටහන 37.1.3)	1,095,455	1,758,314	1,095,455	1,758,314
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට දායකත්වය - පාරිතෝෂික (සටහන් 11.1)	74,449	53,348	159,293	136,000
පෙර ගෙවුම් කාර්යමණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය	982,045	867,111	982,653	867,111
වෙනත්	3,955,268	5,675,011	3,955,268	5,675,011
මුළු ගණන	15,914,505	17,475,442	19,127,876	20,277,225

11.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට දායකත්වය - පාරිතෝෂිකය (සටහන 37.2)

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
පරිවර්තන සේවා පිරිවැය	34,796	24,957	117,315	107,609
පොළී පිරිවැය	39,653	28,391	41,978	28,391
ශුද්ධ වියදම	74,449	53,348	159,293	136,000

12. වෙනත් වියදම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
අධ්‍යක්ෂකවරුන්ගේ සංවේතන	7,331	6,296	18,820	11,103
විගණකරුවන්ගේ පාරිශ්‍රමික	5,869	11,238	19,359	22,245
විගණකවරුවන් වෙත විගණන නොවන ගාස්තු	4,428	2,748	9,188	4,237
වෘත්තික සහ නෛතික වියදම්	136,172	95,617	156,162	118,777
දේපල පිරියත සහ උපකරණ අගය ක්ෂයවීම	1,081,440	955,723	1,352,823	1,192,618
බදු දේපළ ක්‍රමක්ෂය	94,989	66,542	94,989	66,866
ආයෝජන දේපළ අගය ක්ෂය වීම	1,707	1,707	1,707	1,707
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	43,536	34,187	58,937	49,508
පෙර ගෙවුම් කල්බදු ක්‍රමක්ෂය	30,856	24,136	30,856	24,136
කාර්යාල පරිපාලන සහ ආයතනික වියදම්	7,707,881	6,602,223	10,348,197	8,885,087
ප්‍රතිලාභ නිමිකම් සහ ප්‍රාරක්ෂණ වියදම්	–	–	2,713,961	2,503,035
තැන්පතු රක්ෂණය	1,395,878	1,174,690	1,395,878	1,174,690
වෙනත්	1,897,259	1,118,148	1,880,703	1,153,919
මුළු ගණන	12,407,346	10,093,258	18,081,580	15,207,929

13. ආදායම් බදු වියදම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
වර්තන වර්ෂයේ බදු වියදම්				
ආදායම් බදු වියදම් (සටහන 13.1)	7,724,267	6,089,336	9,225,208	8,120,960
- ලාභාංශ සේ සලකා අයකරන බදු	77,520	–	–	–
- පෙර වර්ෂයේ (අධි) ඌන ප්‍රතිපාදන	(1,123,123)	12,093	(1,123,123)	12,093
විලම්බිත බදු වියදම (සටහන 13.2)	984,666	(282,460)	1,255,425	(655,659)
මුළු බදු වියදම	7,663,329	5,818,969	9,357,510	7,477,394
සඵල බදු අනුපාතිකය (%)	29.9	29.3	31.3	31.9

13.1 බදු වියදම් සැසඳුම

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
බදු වලට පෙර ලාභය	25,913,106	20,813,660	29,868,431	25,433,322
කාල පරිච්ඡේදය සඳහා ආදායම් බදු (අදාල වන බදු අනුපාතිකයට ගිණුම්කරණ ලාභය)	7,255,670	5,827,825	8,363,161	7,121,330
එකතු කළා:				
බදු කාර්යයන් සඳහා අඩු කරනු ලැබිය නොහැකි වියදම්වල බදු බලපෑම	2,854,684	2,692,103	27,078,826	26,117,364
අඩුකළා:				
බදු කාර්යයන් සඳහා අඩු කරනු ලැබිය හැකි වියදම්වල බදු බලපෑම	(2,386,087)	(2,430,592)	(26,216,779)	(25,117,734)
වර්ෂය සඳහා ආදායම් බදු වියදම	7,724,267	6,089,336	9,225,208	8,120,960

13.2 විලම්බිත බදු (ලාභය/අලාභයට බැර/අයකිරීම්) පහත සඳහන් දෙයින් සමන්විත වේ

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
විලම්බිත බදු වත්කම්	847,909	(481,061)	912,080	(487,543)
විලම්බිත බදු බැරකම්	136,757	198,601	343,345	(168,116)
විලම්බිත බදු (ලාභය/අලාභයට බැර/අයකිරීම්)	984,666	(282,460)	1,255,425	(655,659)

13.3 වෙනත් විස්තීරණ ආදායම් තුල විලම්බිත බදු (බැර/අයකිරිය පහත සඳහන් දේ වලින් සමන්විත වේ.

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
විශ්‍රාම ප්‍රතිලාභ	41,067	(15,167)	35,060	(22,135)
වෙනත් තාවකාලික වෙනස - වත්කම් ප්‍රත්‍යාගණනය	3,366,405	–	3,732,371	–
විලම්බිත බදු (බැර/අයකිරීම්) වෙනත් විස්තීරණ ආදායම් තුල	3,407,472	(15,167)	3,767,431	(22,135)
වර්ෂය සඳහා ශුද්ධ විලම්බිත බදු	4,392,138	(297,627)	5,022,571	(677,794)

අදායම් බදු මත ප්‍රදානය කෙරෙන බැහැර කිරීම්, සහන හෝ විරාම සඳහා අදාළ වන අනුපාතික

	2017 %	2016 %
බැංකුවේ දේශීය මෙහෙයුම්	28	28
අක්වෙරළ බැංකුකරණ, එකකයෙහි දේශීය බැංකු මෙහෙයුම්	28	28
අක්වෙරල බැංකුකරණ, එකකයෙහි අක්වෙරල බැංකු මෙහෙයුම්	28	28
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	28	28
පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	15	12
පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී එල් සී	28	28

බැහැර කිරීම් සහ සහන අත් විඳින පහත සඳහන් සමාගම් හැරුණු කොට සමූහයේ බදු බැරකම් ගණන් බලනු ලබන්නේ ඉහත සඳහන් අනුපාත අනුවය.

සීමාසහිත පිපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවෙලොප්මන්ට්

මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් පිහිටුවීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ ව්‍යාපාරික කටයුතු සඳහා සී. පිපල්ස් ලීසිං ප්‍රොපටි ඩිවෙලොප්මන්ට් සමාගම විසින්, ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇතිකර ගන්නා ලද 2008 දෙසැම්බර් මස 3 වන දිනය දා ගිවිසුමට අනුව, ආදායම් බදු පැනවීම, ගෙවීම, සහ අයකර ගැනීම සම්බන්ධයෙන්, දේශීය ආදායම් පනත, සමාගම විසින් පොළියක් උපයාගන්නා වර්ෂයේ සිට ගණන් බලන ලද අවරුදු 5 ක කාලයක් හෝ සමාගමේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනයේ සිට ගණන් බලන ලද අවරුදු දෙකකට ඉකුත් නොවන යම් වර්ෂයක් යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා අදාළ නොවිය යුත්තේය. බදු වලින් නිදහස් වන කාල පරිච්ඡේදයේ අවසාන දිනය සමඟ එළඹෙන අවරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා 10%ක අනුග්‍රහ බදු අනුපාතයක්ද 10% ක අනුග්‍රහ බදු කාල පරිච්ඡේදය අවසන්වීමෙන් පසු, 20% ක අනුග්‍රහ බදු අනුපාතයක්ද ලැබීම සඳහා සමාගම සුදුසුකම් ලබන්නේය.

සීමාසහිත පිපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපටිස්

මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් පිහිටුවීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ ව්‍යාපාරික කටයුතු සඳහා සී. පිපල්ස් ලීසිං හැව්ලොක් දේපළ සමාගම විසින්, ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇතිකර ගන්නා ලද 2010 දෙසැම්බර් මස 3 වන දිනය දා ගිවිසුමට අනුව, ආදායම් බදු පැනවීම, ගෙවීම, සහ අයකර ගැනීම සම්බන්ධයෙන්, දේශීය ආදායම් පනත, සමාගම විසින් පොළියක් උපයාගන්නා වර්ෂයේ සිට ගණන් බලන ලද අවරුදු 5 ක කාලයක් හෝ සමාගමේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද දිනයේ සිට ගණන් බලන ලද අවරුදු දෙකක් ඉකුත් නොවන යම් තක්සේරු වර්ෂයක් යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා අදාළ නොවිය යුත්තේය. බදු වලින් නිදහස් වන කාල පරිච්ඡේදයේ අවසාන දිනය සමඟ එළඹෙන අවරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා 10% අනුග්‍රහ බදු අනුපාතයක්ද, 10% ක අනුග්‍රහ බදු කාල පරිච්ඡේදය අවසන්වීමෙන් පසු, 20% ක අනුග්‍රහ බදු අනුපාතයක්ද ලැබීම සඳහා සමාගම සුදුසුකම් ලබන්නේය.

14. කොටසකට ඉපැයීම්

14.1 කොටසකට මූලික ඉපැයීම්

සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන සහ වසර තුල හිඟ හිටි සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍යය පදනම්ව කොටසකට මූලික ඉපැයීම් ගණනය කර ඇත.

	බැංකුව		සමූහය	
	2017	2016	2017	2016
සමාන කොටස් හිමියන්ට පැවරිය හැකි ශුද්ධ ලාභය (රු. '000)	18,249,777	14,994,691	19,295,734	16,721,972
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් වල හරිත සාමාන්‍ය (රු. '000)	1,000	1,000	1,000	1,000
කොටසකට මූලික ඉපැයීම් (රු.)	18,250	14,995	19,296	16,722

14.2 කොටසකට තනුක ඉපැයීම්

සියළු තනුක විභවය සහිත සාමාන්‍ය කොටස් වල බලපෑම සඳහා ගැලපුම් කිරීමෙන් පසුව සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන සහ වසර තුල හිඟ හිටි සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍ය මත පදනම්ව කොටසකට තනුක ඉපැයීම් ගණනය කර ඇත.

	බැංකුව		සමූහය	
	2017	2016	2017	2016
සාමාන්‍ය කොටස් දරන්නන්ට ආරෝපණය කළහැකි ශුද්ධ ලාභය (රු. '000)	18,249,777	14,994,691	19,295,734	16,721,972
නිකුත් කර ඇති බැර තබන ලද සාමාන්‍ය කොටස් සාමාන්‍ය සංඛ්‍යාව ('000)	1,000	1,000	1,000	1,000
වෙන්කර දීමට තිබෙන ප්‍රාග්ධනයේ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව ('000)	243,040	143,040	244,040	143,040
නිකුත් කිරීමට තිබෙන කොටස් මුළු ගණන ('000)	244,040	144,040	245,040	144,040
එක කොටසක් සඳහා තනුක ඉපැයීම් (රු.)	75	104	79	116

15. මූල්‍ය උපකරණ මිනුම්කරණය

බැංකුව - 2017

	වෙළඳාම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම් රු.'000	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූලික වත්කම් රු.'000	කල් පිරීම තෙක් දරා සිටින වත්කම් රු.'000	ක්‍රමක්ෂය පිරිවැය රු.'000	විකිණීම් සඳහා පවතින මූල්‍ය වත්කම් රු.'000	මුළු ගණන රු.'000
වත්කම්						
මුදල් සහ මුදල් සමාන දෑ	–	–	–	68,958,012	–	68,958,012
මහ බැංකුව වෙත ඇති ශේෂ	–	–	–	65,689,278	–	65,689,278
බැංකු වෙත තැන්පතු	–	–	–	13,458,639	–	13,458,639
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	334,230	–	–	–	334,230
වෙළඳාම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්	53,042,557	–	–	–	–	53,042,557
බැංකු වෙත ණය සහ ලැබිය යුතු දෑ	–	–	–	86,097,515	–	86,097,515
අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ	–	–	–	1,012,642,714	–	1,012,642,714
මූල්‍ය ආයෝජන	–	–	112,351,039	–	3,415,344	115,766,383
මුළු මූල්‍ය වත්කම්	53,042,557	334,230	112,351,039	1,246,846,158	3,415,344	1,415,989,328

	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූලික වත්කම් රු.'000	ක්‍රමක්ෂය පිරිවැය රු.'000	මුළු ගණන රු.'000
බැරකම්			
බැංකුවෙත ගෙවිය යුතු දෑ	–	80,676,350	80,676,350
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර	273,975	–	273,975
වෙනත් ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	–	1,244,002,768	1,244,002,768
වෙනත් ණයට ගැනීම්	–	24,380,962	24,380,962
යටත් කරනලද කාල ණය	–	12,531,728	12,531,728
මුළු මූල්‍ය බැරකම්	273,975	1,361,591,808	1,361,865,783

බැංකුව - 2016

	වෙළඳාම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම් රු.'000	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූලික වත්කම් රු.'000	කල් පිරීම තෙක් දරා සිටින වත්කම් රු.'000	ණය සහ ලැබිය යුතු දෑ රු.'000	විකිණීම් සඳහා පවතින මූල්‍ය වත්කම් රු.'000	මුළු ගණන රු.'000
වත්කම්						
මුදල් සහ මුදල් සමාන දෑ	–	–	–	64,008,639	–	64,008,639
මහා බැංකුවේ ඇති ශේෂය	–	–	–	63,049,516	–	63,049,516
බැංකුවල තැබුම්	–	–	–	32,772,978	–	32,772,978
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර		15,057				15,057
වෙළඳාම සඳහා රඳවා ගන්න ලද මූල්‍ය වත්කම්	46,915,311	–	–	–	–	46,915,311
බැංකු වලට ලැබිය යුතු දෑ				71,528,031		71,528,031
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ වෙනත් ලැබිය යුතු දෑ	–	–	–	890,528,101	–	890,528,101
මූල්‍ය ආයෝජන	–	–	96,171,734	–	1,525,839	97,697,573
මුළු මූල්‍ය වත්කම්	46,915,311	15,057	96,171,734	1,121,887,265	1,525,839	1,266,515,206

	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූලික වත්කම් රු.'000	ණය සහ ලැබිය යුතු දෑ රු.'000	මුළු ගණන රු.'000
බැරකම්			
බැංකු වලට ගෙවිය යුතු දෑ	–	106,924,276	106,924,276
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර	72,182	–	72,182
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ	–	1,077,812,127	1,077,812,127
වෙනත් ණය ගැනීම්	–	27,184,535	27,184,535
අප්‍රධාන කරන ලද කාලීන ණය	–	12,531,728	12,531,728
මුළු මූල්‍ය බැරකම්	72,182	1,224,452,666	1,224,524,848

සමූහය - 2017

	වෙළඳාම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම් රු.'000	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූල්‍ය වත්කම් රු.'000	කල් පිරීම තෙක් දරා සිටින වත්කම් රු.'000	ණය සහ ලැබිය යුතු දෑ රු.'000	විකිණීම් සඳහා පවතින මූල්‍ය වත්කම් රු.'000	මුළු ගණන රු.'000
වත්කම්						
මුදල් සහ මුදල් සමානයන්	–	–	–	69,675,003	–	69,675,003
මහා බැංකුවේ ඇති ශේෂය	–	–	–	65,689,278	–	65,689,278
බැංකුවල තැබුම්	–	–	–	18,944,087	–	18,944,087
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර		334,230	–	–	–	334,230
වෙළඳාම සඳහා තබාගන්නා ලද මූල්‍ය සම්පත්	53,354,989	–	–	–	–	53,354,989
ණය සහ බැංකුවලට ලැබිය යුතු දෑ	–	–	–	86,436,113	–	86,436,113
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	–	–	–	1,143,766,774	–	1,143,766,774
මූල්‍ය ආයෝජන	–	–	117,137,814	–	4,483,905	121,621,719
මුළු මූල්‍ය වත්කම්	53,354,989	334,230	117,137,814	1,384,511,255	4,483,905	1,559,822,193

	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූල්‍ය වත්කම් රු.'000	ණය සහ ලැබිය යුතු දෑ රු.'000	මුළු ගණන රු.'000
බැරකම්			
බැංකුවට ලැබියයුතු	–	100,628,552	100,628,552
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර	273,975	–	273,975
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු දෑ	–	1,305,625,750	1,305,625,750
වෙනත් ණය ගැනුම්	–	33,634,482	33,634,482
අප්‍රධාන කරන ලද කාලීන ණය	–	32,447,923	32,447,923
මුළු මූල්‍ය බැරකම්	273,975	1,472,336,707	1,472,610,682

සමූහය - 2016

	වෙළඳාම සඳහා රඳවාගෙන ඇති මූල්‍ය වත්කම් රු.'000	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූල්‍ය වත්කම් රු.'000	කල් පිරීම තෙක් දරා සිටින වත්කම් රු.'000	ණය සහ ලැබිය යුතු දෑ රු.'000	විකිණීම් සඳහා පවතින මූල්‍ය වත්කම් රු.'000	මුළු ගණන රු.'000
වත්කම්						
මුදල් සහ මුදල් සමානයන්	–	–	–	66,408,702	–	66,408,702
මහා බැංකුවේ ඇති ශේෂය	–	–	–	63,049,516	–	63,049,516
බැංකුවල තැබීම්	–	–	–	34,059,860	–	34,059,860
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර	–	21,196	–	–	–	21,196
වෙළඳාම සඳහා රඳවාගන්නා ලද මූල්‍ය වත්කම්	47,455,844	–	–	–	–	47,455,844
බැංකුවලට ලැබිය යුතු ණය සහ ලැබිය යුතු දෑ	–	–	–	72,205,378	–	72,205,378
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබියුතු දෑ	–	–	–	1,013,921,293	–	1,013,921,293
මූල්‍ය ආයෝජන	–	–	101,069,681	–	3,258,308	104,327,989
මුළු මූල්‍ය වත්කම්	47,455,844	21,196	101,069,681	1,249,644,749	3,258,308	1,401,449,778

	සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශය හරහා ගලපනු ලබන මූල්‍ය වත්කම් රු.'000	ණය සහ ලැබිය යුතු දෑ රු.'000	මුළු ගණන රු.'000
බැරකම්			
බැංකුවලට ගෙවිය යුතු	–	130,122,246	130,122,246
ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍ර	72,182	–	72,182
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	–	1,119,753,182	1,119,753,182
වෙනත් ගැනීම්	–	42,296,376	42,296,376
කාලීන ණය	–	36,525,796	36,525,796
මුළු මූල්‍ය බැරකම්	72,182	1,328,697,600	1,328,769,782

16. මුදල් සහ මුදල් සමානතා

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
අතැති මුදල්	37,378,183	33,512,266	38,007,696	34,032,152
බැංකු වල තැන්පත් කර ඇති මුදල්	4,568,707	1,428,863	4,656,185	3,309,040
ඒඤණ මුදල් සහ කෙටි දැනුම් දීම් මුදල්	6,323,768	2,857,433	6,323,768	2,857,433
වෙනත්	20,687,354	26,210,077	20,687,354	26,210,077
	68,958,012	64,008,639	69,675,003	66,408,702

17. ශ්‍රී ලංකාවේ මහ බැංකුව සමග පවතින ශේෂ

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති ව්‍යවස්ථාපිත ශේෂ	65,689,278	63,049,516	65,689,278	63,049,516
	65,689,278	63,049,516	65,689,278	63,049,516

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ව්‍යවස්ථාපිත මුදල් සංචිතයේ ඇති ශේෂය රුපියල් තැන්පතු බැරකම් වලින් 7.5% (2016 දී එය 7.5%ක් විය) මෙය පොළි නොදරන නොලැබෙන ශේෂයකි. දේශීය බැංකු ඒකකයේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු බැරකම් සහ අක් වෙරළ බැංකු ඒකකයේ තැන්පතු බැරකම් සම්බන්ධයෙන් මේ හා සමාන සංචිතයක් අවශ්‍ය නොවේ.

18. බැංකු වල ඇති තැන්පතු

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
තැන්පතු	13,458,639	32,772,978	13,458,639	32,772,978
ස්ථාවර තැන්පතු	–	–	5,485,448	1,286,882
	13,458,639	32,772,978	18,944,087	34,059,860

19. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

	බැංකුව				සමූහය			
	2017		2016		2017		2016	
	වත්කම් රු. '000	නාමික මුදල රු. '000	වත්කම් රු. '000	නාමික මුදල රු. '000	වත්කම් රු. '000	නාමික මුදල රු. '000	වත්කම් රු. '000	නාමික මුදල රු. '000
විදේශ ව්‍යවහාර මුදල් ව්‍යුත්පන්න								
විදේශ විනිමය හුවමාරු ගිවිසුම								
විකුණුම්	325,846	18,224,912	6,884	949,100	325,846	18,224,912	13,023	955,239
මිලට ගැනීම්	4,231	2,422,890	2,667	245,370	4,231	2,422,890	2,667	245,370
ඉදිරි විදේශ විනිමය හුවමාරු ගිවිසුම්								
විකුණුම්	1,723	1,588,867	4,541	948,156	1,723	1,588,867	4,541	948,156
මිලට ගැනීම්	2,430	1,419,081	963	702,004	2,430	1,419,081	963	702,004
මුළු ගණන	334,230	20,647,802	15,057	2,844,630	334,230	20,647,802	21,196	2,850,769

20. වෙළඳාම සඳහා රඳවාගත් වෙනත් මූල්‍ය වත්කම්

	බැංකුව		සමූහය	
	2017 රු.'000	2016 රු.'000	2017 රු.'000	2016 රු.'000
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (සටහන 20.1)	50,133,681	44,183,629	50,133,681	44,183,629
ස්කන්ධ සුරැකුම්පත් (සටහන 20.2)	311,655	850,579	624,087	1,391,112
ඒකක භාර (සටහන 20.3)	2,519,075	176,696	2,519,075	176,696
ණය සුරැකුම්පත්	78,146	1,704,407	78,146	1,704,407
	53,042,557	46,915,311	53,354,989	47,455,844

20.1 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

භාණ්ඩාගාර බිල්පත්	45,991,016	35,695,820	45,991,016	35,695,820
භාණ්ඩාගාර බැඳුම්කර	4,142,665	8,487,809	4,142,665	8,487,809
	50,133,681	44,183,629	50,133,681	44,183,629

20.2 ස්කන්ධ සුරැකුම්පත්

20.2.1 ස්කන්ධ සුරැකුම්පත් - බැංකුව

	කොටස් සංඛ්‍යාව	පිරිවැය 2017 රු.'000	2017.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000	කොටස්/ඒකක සංඛ්‍යාව	පිරිවැය 2016 රු.'000	2016.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000
ඉඩම් හා දේපළ						
ඕවර්සීස් රියැලිටි (සිලෝන්)පිඑල්සී	–	–	–	21,813,003	341,046	436,260
සිටි ලෑන්ඩ් ඩිවෙලොප්මන්ට් පිඑල්සී	333	17	16	333	17	17
ප්‍රාග්ධන භාණ්ඩ						
ඇක්සෙස් ඉන්ජිනියරින් පිඑල්සී	2,000,000	54,545	47,000	1,900,000	51,985	47,120
කලම්බු ඩොක්යාඩ් පිඑල්සී	–	–	–	249,362	56,825	19,600
විදුලි සංදේශන සේවා						
ඩයලොග් අක්සියාටා පිඑල්සී	800,000	8,400	10,400	4,800,000	51,358	50,400
ඩයිවසිෆයිඩ් හෝල්ඩින්ස්						
එක්ස්පෝ ලංකා හෝල්ඩින්ස් පිඑල්සී	6,000,000	49,777	31,800	6,000,000	49,777	37,800
හේලිස් පිඑල්සී	40,679	11,800	9,804	40,679	11,800	10,983
ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පිඑල්සී	162,149	24,633	24,079	586,123	102,597	84,988
රිචඩ් පිරිස් සමාගම පිඑල්සී	–	–	–	1,672,197	13,982	13,378
බැංකු, මූල්‍ය සහ රක්ෂණ						
ජනශක්ති ඉන්ෂූවරන්ස් පිඑල්සී	1,375,257	21,438	21,592	–	–	–
ද ෆිනෑන්ස් සමාගම පිඑල්සී	–	–	–	2,080,400	83,400	13,731
බලය සහ බලශක්ති						
ලංකා අයිඕසී පිඑල්සී	640,250	22,873	17,927	640,250	22,873	20,296
එල්විඑල් එනර්ජි ෆන්ඩ්	1,561,600	15,616	15,616	–	–	–

	කොටස් සංඛ්‍යාව	පිරිවැය 2017 රු.'000	2017.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000	කොටස්/ඒකක සංඛ්‍යාව	පිරිවැය 2016 රු.'000	2016.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000
නිෂ්පාදන						
පැලවත්ත සුගර් පීඑල්සී	58,100	1,829	–	58,100	1,829	–
පිරමල් ග්ලාස් පීඑල්සී	5,900,066	38,240	34,220	5,900,066	38,240	31,270
ටීපේ ලංකා පීඑල්සී	100,000	3,510	3,400	–	–	–
ඇලූමෙක්ස් පීඑල්සී	1,498,732	29,969	27,727	–	–	–
චෙව්රොන් ලුබ්රිකන්ට්ස් ලංකා පීඑල්සී	399,998	59,655	47,600	299,998	54,405	47,130
ආහාර, පාන වර්ග සහ දුම්කොළ						
ටේණුකා ඇග්‍රි ෆුඩ්ස් පීඑල්සී	4,557,361	20,508	11,849	4,557,361	20,508	13,216
සී. මෙල්ස්ටාර් කෝප්	140,000	8,299	8,330	300,000	17,783	17,790
සිල්ලර වෙළඳ කටයුතු						
සිංගර් ශ්‍රී ලංකා පීඑල්සී	–	–	–	49,959	4,596	6,305
මෝටර්ස්						
යුනයිටඩ් මෝටර්ස්	3,426	305	296	3,426	305	295
මිල සඳහන් කරන ලද ස්කන්ධ සුරැකුම්වල මුළු වටිනාකම		371,412	311,655		923,325	850,579

20.2.2 ස්කන්ධ සුරැකුම්පත් - සමූහය

	කොටස් සංඛ්‍යාව	පිරිවැය 2017 රු.'000	2017.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000	කොටස්/ඒකක සංඛ්‍යාව	පිරිවැය 2016 රු.'000	2016.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000
ඉඩම් සහ දේපළ						
ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පීඑල්සී	101,594	2,257	1,788	21,885,571	318,729	437,711
සිටි ලෑන්ඩ් ඩිවලොප්මන්ට් පීඑල්සී	333	17	16	–	–	–
ප්‍රාග්ධන භාණ්ඩ						
ඇක්සෙස් ඉන්ජිනියරින් පීඑල්සී	2,137,620	58,077	50,234	1,900,000	51,985	47,120
කලම්බු ඩොක්යාඩ් පීඑල්සී	–	–	–	249,362	56,825	19,600
නිශ්පාදන						
ඇලූමෙක්ස් පීඑල්සී	1,498,732	29,969	27,727	–	–	–
ඒසිඑල් කේබල්ස් පීඑල්සී	9,400	451	398	4,700	452	568
චෙව්රොන් ලුබ්‍රිකන්ට්ස් ලංකා පීඑල්සී	399,998	59,655	47,600	299,998	54,405	47,130
කැළණි කේබල්ස් පීඑල්සී	20,000	2,522	1,808	20,000	2,522	2,600
පැලවත්ත ෂුගර් පීඑල්සී	58,100	1,829	–	58,100	1,829	–
පිරමල් ග්ලාස් පීඑල්සී	5,900,066	38,240	34,220	5,900,066	38,240	31,270
රෝයල් සෙරමික් ලංකා පීඑල්සී	30,000	3,750	3,435	–	–	–
ටෝකියෝ සිමෙන්ට් පීඑල්සී - ජන්දහිමි	50,000	3,605	3,300	–	–	–
ටෝකියෝ සිමෙන්ට් පීඑල්සී - ජන්ද අහිමි	132,000	5,926	7,788	11,000	4,650	5,665
ටීපේ ලංකා පීඑල්සී	100,000	3,510	3,400	–	–	–
ටෙක්ස්ටර්ඩ් ජර්සි පීඑල්සී	174,983	7,201	5,949	75,000	3,158	3,210

	කොටස් සංඛ්‍යාව	පිරිවැය 2017 රු.'000	2017.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000	කොටස්/එකක සංඛ්‍යාව	පිරිවැය 2016 රු.'000	2016.12.31 දිනට වෙළඳපොල වටිනාකම රු.'000
විදුලි සංදේශ සේවා						
ඩයලොග් අක්සියාටා පිඑල්සී	800,000	8,400	10,400	4,800,000	51,358	50,400
රසායන ද්‍රව්‍ය හා ඖෂධ						
සී අයි සී හෝල්ඩින්ස් පිඑල්සී	87,000	6,740	4,124	87,000	6,740	5,916
ඩයිවසි ෆයිඩ් හෝල්ඩින්ස්						
ඇට්කින් ස්පෙන්ස් පිඑල්සී	82,800	16,287	4,521	82,800	16,287	5,382
එක්ස්පොලංකා හෝල්ඩින්ස් පිඑල්සී	6,000,000	49,777	31,800	6,000,000	49,777	37,800
හේලිස් පිඑල්සී	44,479	13,049	10,720	44,479	13,049	12,009
ජෝන් කීල්ස් හෝල්ඩින්ස් පිඑල්සී	863,231	142,531	128,189	1,387,205	222,496	187,736
රිවඩ් පීරිස් සමාගම පිඑල්සී	–	–	–	1,672,197	13,982	13,378
සන්ෂයින් හෝල්ඩින්ස් පිඑල්සී	50,500	2,800	2,879	50,000	2,775	2,330
බැංකු, මූල්‍ය සහ රක්ෂණ						
කොමර්ෂල් බැන්ක් පිඑල්සී - ජන්ද හිමි	452,570	22,100	61,459	423,003	42,923	61,335
කොමර්ෂල් බැන්ක් පිඑල්සී - ජන්ද අහිමි	189,294	9,276	19,876	170,133	14,232	19,565
හැටන් නැෂනල් බැන්ක් පිඑල්සී - ජන්ද අහිමි	–	–	–	112,100	12,366	21,299
ජනශක්ති ඉන්ෂුවරන්ස් පිඑල්සී	1,375,257	21,438	21,592	–	–	–
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පිඑල්සී	63,176	9,006	8,617	60,855	8,651	9,493
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පිඑල්සී	395,871	26,091	30,878	464,871	27,333	33,213
සම්පත් බැන්ක් පිඑල්සී - ජන්ද හිමි	–	–	–	815,402	180,677	212,331
සෙලාන් බැන්ක් පිඑල්සී - ජන්ද හිමි	76,572	5,918	6,683	75,000	5,777	6,750
සෙලාන් බැන්ක් පිඑල්සී - ජන්ද අහිමි	113,674	3,746	6,366	165,000	5,292	9,735
ද ෆිනෑන්ස් කම්පැනි පිඑල්සී	–	–	–	2,080,400	83,400	13,736
පිපල්ස් ලිසිං ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සී	69,000	1,242	1,173	–	–	–
වනික් ඉන්කෝපරේෂන් පිඑල්සී	61	3	–	61	3	–
වැලිබල් වන් පිඑල්සී	350,000	8,769	6,195	350,000	8,769	6,510
වැවිලි						
හොරණ ප්ලාන්ටේෂන් පිඑල්සී	–	–	–	20,000	768	368
ආහාර, පාන වර්ග සහ දුම්කොළ						
සී. මෙල්ස්ටාර්කෝප්	440,000	17,751	26,180	700,000	30,620	41,510
රේණුකා ඇග්‍රි ෆුඩ්ස් පිඑල්සී	4,557,361	20,508	11,849	4,557,361	20,508	13,216
හෝටල් සහ සංචාර						
